218 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 218 - இல. 3
**Volume 218 - No. 3**

2013 ජූලි 11 වන බ්‍රහස්පතින්දා
2013 யூலை 11, வியாழக்கிழமை
**Thursday,11th July, 2013**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :**
අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 4/2013 දරන චක්‍රලේඛය

**පොහොර හිඟය හේතුවෙන් ගොවීන් මුහුණ දෙන දුෂ්කරතා :**
කෘෂිකර්ම අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**වරප්‍රසාද :**
"ලංකාදීප" සහ "අද" යන පුවත් පත්හි සහ "ඔත්තුකරු" වෙබ් අඩවියේ පළ වූ වාර්තා

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්**
ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) - [ගරු තිලංග සුමතිපාල මහතා] - පළමුවන වර කියවන ලදි

මර්කස් සකාෆතුල් ඉස්ලාමියා (සංස්ථාගත කිරීමේ) - [ගරු එම්.බී. ෆාරුක් මහතා] - පළමුවන වර කියවන ලදි

**පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත :**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි

**කල්තැබීමේ යෝජනාව :**
අ.පො.ස. (උසස් පෙළ) සඳහා තාක්ෂණ වේදය විෂය ධාරාව


---

# பிரதான உள்ளடக்கம்


**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல்மூல வினா:**
கல்வி அமைச்சின் 4/2013 ஆம் இலக்கச் சுற்றறிக்கை

**உரப் பற்றாக்குறையினால் விவசாயிகள் எதிர்நோக்கும் கஷ்டங்கள்:**
கமத்தொழில் அமைச்சரினது கூற்று

**சிறப்புரிமை:**
'லங்காதீப', 'அத' பத்திரிகைகள் மற்றும் 'ஒத்துகரு' இணையத்தளத்தில் வெளியான அறிக்கைகள்

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
இலங்கை நிர்மாணக் கைத்தொழில் சம்மேளனம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு திலங்க சுமதிபால] – முதன்முறை மதிப்பிடப்பட்டது

மர்கஸ் ஸக்காபதுல் இஸ்லாமிய்யா (கூட்டிணைத்தல்) - [மாண்புமிகு எம். பி. பாரூக்] – முதன்முறை மதிப்பிடப்பட்டது

**உள்ளூரதிகார சபைகள் வெற்றிடங்களை நிரப்புதல் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**
க.பொ.த (உயர்தர) தொழில்நுட்பப் பாடவிதானம்


---

# PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Circular No. 4/2013 of Education Ministry

DIFFICULTIES FACED BY FARMERS DUE TO FERTILIZER SHORTAGE:
Statement by Minister of Agriculture

PRIVILEGE:
Reports in "Lankadeepa" and "Ada" Newspapers and "Oththukaru" Website

PRIVATE MEMBERS' BILLS:
Chamber of Construction Industry of Sri Lanka (Incorporation) – [The Hon. Thilanga Sumathipala] – Read the First time

Markas Sakafathul Islamiyya (Incorporation) – [The Hon. M.B. Farook] - Read the First time

LOCAL AUTHORITIES FILLING OF VACANCIES (SPECIAL PROVISIONS) BILL:
Read a Second, and the Third time, and passed as amended

ADJOURNMENT MOTION:
Technology Stream for G.C.E. (A/L)

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2013 ජූලි 11 වන* බ්‍රහස්පතින්දා**
*2013 யூலை 11, வியாழக்கிழமை*
*Thursday,11th July, 2013*

***අ.භා 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.***
***නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.*
*பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,*
MR.. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2013 ජූලි මස 11වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පස් වරු 2.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් එයට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

(1) (52 වැනි අධිකාරය වන), සුරාබදු ආඥාපනතේ 22(1) වැනි වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2013 අප්‍රේල් 03 දිනැති අංක 1804/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය (අංක 957 දරන සුරාබදු නිවේදනය) ;

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2013 මැයි 10 දිනැති අංක 1809/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝගය; සහ

(3) 2012 වර්ෂය සඳහා වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව.-[අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2012 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්.- [රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009/2010 සහ 2010/2011 වර්ෂ සඳහා කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්හි වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010/2011 වර්ෂය සඳහා සී./ස. ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2012 වර්ෂය සඳහා ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව.- [වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍ය ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා (උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க - உயர் கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Nandimithra Ekanayake - Deputy Minister of Higher Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා]

(i) 2010 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(ii) 2010 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2010 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2010 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(v) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(vi) 2010 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යායනායතනයේ වාර්ෂික වාර්තාව;

(vii) 2009 සහ 2010 වර්ෂ සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තා; සහ

(viii) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2011 වර්ෂය සඳහා සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවයේ වාර්ෂික වාර්තාව;

(ii) 2010 වර්ෂය සඳහා ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව;

(iii) 2010 වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය - පැමිණ නැත.

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා - පැමිණ නැත.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බදුල්ල, කැප්පෙටිපොළ පාර, පළමු පටුමඟ, අංක 12/4 දරන ස්ථානයෙහි පදිංචි යූ.ආර්.සී දර්ශන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු රෝහණ දිසානායක මහතා - පැමිණ නැත.

ගරු වීරකුමාර දිසානායක මහතා - පැමිණ නැත.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - පැමිණ නැත.

ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා - පැමිණ නැත.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) ගාල්ල, වංචාවල, මැලෑගොඩ, කළුපහන වත්තෙහි පදිංචි ඩී.වී. සුමනසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මාතර, වෙහෙරහේන, විහාර මාවත, "ප්‍රබෝධ" නිවසෙහි පදිංචි එස්.කේ. දයානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) ගාල්ල උළුවිටකේ, කිතුලම්පිටිය, එදිරිසිංහ මාවත, අංක 184/1 දරන ස්ථානයෙහි පදිංචි ජී.ගොඩගේ මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ගුරු සහායකයන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම : ඌව පළාත
### ஆசிரிய உதவியாளர்களை ஆசிரிய சேவைக்கு உள்ளீர்த்தல் : ஊவா மாகாணம்
### ABSORPTION OF TEACHER ASSISTANTS TO TEACHER SERVICE : UVA PROVINCE

1938/'11

1. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) ඌව පළාතේ දුෂ්කර පාසල්වල වර්ෂ ගණනාවක් ස්වේච්ඡාවෙන් සේවය කරන ලද ගුරුවරුන් 780ක් 2007 වර්ෂයේදී ගුරු සහායකයන් ලෙස බඳවා ගනු ලැබූ බවත්;

(ii) බඳවා ගැනීමෙන් පසු මේ දක්වා එම එක් ගුරු සහායකයෙකුට මාසිකව ගෙවනු ලබන්නේ රුපියල් තුන්දහසක දීමනාවක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගුරු සහායකයන්ට දැනට ගෙවනු ලබන දීමනාව වැඩිකර, ඔවුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊவா மாகாணத்தில் பின்தங்கிய பாடசாலை களில் பல வருடங்களாக தொண்டர் ஆசிரியர் களாக பணிபுரிந்த 780 பேர் 2007ஆம் ஆண்டில் ஆசிரிய உதவியாளர்களாக சேர்த்துக்கொள்ளப் பட்டார்கள் என்பதையும்;

(ii) சேர்த்துக்கொள்ளப்பட்டதன் பின்னர் இன்று வரை மேற்படி ஆசிரிய உதவியாளர் ஒருவருக்கு மாதாந்தம் மூவாயிரம் ரூபா கொடுப்பனவு மாத்திரமே செலுத்தப்படுகின்றது என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி ஆசிரிய உதவியாளர்களுக்கு தற்போது செலுத்தப்படும் கொடுப்பனவை அதிகரித்து அவர்களை ஆசிரிய சேவைக்கு உள்ளீர்ப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அது எப்போது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) 780 teachers who had served for many years voluntarily in the rural schools of the Uva Province have been recruited as teacher assistants in the year 2007; and

(ii) a monthly allowance of only Rs.3.000/= is paid to a teacher assistant, since recruitment up to now?

(b) Will he inform this House -

(i) whether action will be taken to increase the present monthly allowance paid to the teacher assistants and absorb them to the teachers service; and

(ii) if so, when?

(c) If not, why?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) එවකට සිටි ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ අංක ඊඩී/2/29/4/1/47/උප හා 2007.02.04 දිනැතිව ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත එවා ඇති, දිවයිනේ විවිධ පළාත්වල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සහායකවරුන් ලෙස පත් කිරීම යටතේ මෙම පළාතට ගුරු සහායකයන් 780ක් බඳවා ගැනීමට අනුමත කර ඇති අතර, ඒ අනුව 2007/2008 වර්ෂවලදී ගුරු සහායකයන් ලෙස 776 දෙනෙක් ඌව පළාතට බඳවා ගෙන ඇත.

(ii) බඳවා ගැනීමෙන් පසු 2012.09.30 වන දින දක්වා රුපියල් 3,000ක් ගෙවනු ලැබූ අතර, මා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවකට අනුව නිකුත් කර ඇති 2012.08.30 දිනැති අංක 27/2012 චක්‍රලේඛයට අනුව 2012.10.01 වෙනි දින සිට මෙම අයගේ දීමනාව රුපියල් 3,000 සිට රුපියල් 6,000 දක්වා වැඩි කර ඇත. ඒ අනුව මෙම අයගේ දීමනාව රුපියල් 6,000 දක්වා වැඩි කර ඇත.

(ආ) (i) සහ (ii)

ඉහත (අ) (ii) ප්‍රශ්නයට දී ඇති පිළිතුර පරිදි ගුරු සහායකයන්ට ගෙවනු ලබන දීමනාව මා විසින් කැබිනට් අනුමැතිය යටතේ සියයට 100 කින් වැඩි කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ 2009/32 හි 03 වන ඡේදය ප්‍රකාර ගුරු සහායකවරුන් පුහුණු ගුරු සහතිකයක් හෝ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි සුවිශේෂී උපාධි සහතිකයක් ලබා තිබේ නම් එම සහතිකය වලංගු දිනය හා ගුරු සහායක පත්වීම අනුව වැඩ බාර ගත් දිනය යන දින දෙකෙන් පසුව එළබෙන දින සිට ශ්‍රී ලංකා ගුරු සේවයේ අදාළ පන්තියට හා / හෝ ශ්‍රේණියට පත් කළ යුතුය යන්න සඳහන්ව ඇත.

ඒ අනුව ගුරු පුහුණුව හෝ උපාධිය ලබා ඇති ගුරු සහායකවරුන් 162 දෙනෙකු පත්වීම් ලිපියේ 04 වන කොන්දේසිය හා ගුරු සේවා ව්‍යවස්ථාව අනුව සුදුසුකම් සපුරා ඇති බැවින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - 1 ශ්‍රේණියට පත් කර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 6/2006 (iv) අනුව 14135 - 180 x 9 - 240 x 6 - 330 x 5 - 400 x 7- 645 x 13 -33030/- වැටුප් පරිමාණයේ 15,395/-ක මාසික වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමාත් දන්නවා ඇති දැන් ස්වේච්ඡා ගුරු භවතුන් ගුරු සහායකයන් බවට පත් කරන බව. සමහර ප්‍රදේශවල ස්වේච්ඡා ගුරු භවතුන්ට කිසිම පත්වීමක් දීලා නැහැ. උදාහරණයක් විධියට කිව්වොත්, දකුණු පළාතේ. පළාත් අනුව මේ කටයුතුවල යම් යම් විෂමතා තිබෙනවා.

සමහර ස්වේච්ඡා ගුරුවරු සේවයේ ස්ථිර වෙනවා. තවත් සමහර අය ගුරු සහායකයන් වෙනවා. ඒ තත්ත්වය විෂමයි. ඒ නිසා ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේදී ගුරු සහායකයන් සහ ස්වේච්ඡා ගුරු භවතුන් බඳවා ගැනීමේ පොදු ප්‍රතිපත්තියක් සකස් කිරීමේ හැකියාවක් රේඛීය අමාත්‍යාංශයට සහ ඔබතුමාට තිබෙනවාද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

තිබෙනවා. මේ වන විට පොදු ප්‍රතිපත්තියක් සකස් කර තිබෙනවා. ගුරු ව්‍යවස්ථාවට අනුව ගුරු සහායකයන් කියලා පිරිසක් නැහැ. ගුරු ව්‍යවස්ථාවට අනුව, ලංකාවේ පාසලක ගුරුවරයෙක් වෙන්න කොන්දේසි දෙකක් සැපිරිය යුතුයි. පළමු වන කරුණ තමයි උපාධිධාරියකු වීම. දෙවන කරුණ තමයි, ගුරු විද්‍යාලයක හෝ විද්‍යා පීඨයක අවුරුදු තුනක ඩිප්ලෝමාධාරියෙක් වීම. ඊට අතිරේකව, සුවිශේෂ තත්ත්ව යටතේ කැබිනට් අනුමැතියක් ඇතිව ඇතැම් ප්‍රදේශ සඳහා ගුරු සහායකයන් බඳවා ගන්නවා. උතුරු නැඟෙනහිර පළාත්වලට දෙමළ මාධ්‍ය ගුරුවරුන් නැති නිසා පසු ගිය දා කැබිනට් මණ්ඩලය එවැනි තීරණයක් ගත්තා. ගුරු ව්‍යවස්ථාවට අනුව ගුරුවරුන් බඳවා ගැනීමට වෙනත් විකල්පයක් නැති නිසා, ඒ අන්දමට ගුරු සහායකයන් බඳවා ගෙන, මසකට රුපියල් 6000ක දීමනාවක් ගෙවා, ඔවුන් නිශ්චිත අධ්‍යාපන සුදුසුකම් සපුරා ගැනීමෙන් පසුව, පාසලක ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරන ක්‍රමවේදය මේ වන විට ඉතා පැහැදිලිව සකස් කර තිබෙනවා. ලබන වාරය වෙන විට කිසිදු හිඟතාවකින් තොරව සියලුම උසස් පෙළ පන්තිවලට ගුරුවරුන් ලබා දීම සඳහා පසු ගිය 6 වැනි දා විභාගයක් පැවැත්වුවා. ඒ විභාගයට 22,000ක් පෙනී සිට තිබෙනවා. ඒ අනුව මේ හැම දෙයකටම නිශ්චිත ජාතික ප්‍රතිපත්තියක් සකස් කර තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙ වන අතුරු ප්‍රශ්නය මෙයයි.

දැන් මේ ප්‍රශ්නයට අදාළ මූලික පිළිතුරේදී ගරු ඇමතිතුමා සඳහන් කරන්නට යෙදුණා, ගුරු සේවා ව්‍යවස්ථාව අනුව ගුරු සේවයට අන්තර් ග්‍රහණය කළ හැකි සුදුසුකම් තිබෙන අය එකසියහැටඅටක් වාගේ සංඛ්‍යාවක් අන්තර්ග්‍රහණය කළාය කියලා. නමුත් එහෙම අන්තර්ග්‍රහණය කළ නොහැකි පිරිසකුත් ඉන්නවා. අපි දන්නවා, එක්තරා වකවානුවක ජාතික අධ්‍යාපන ආයතනයෙන් දූරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථාන හරහා එවැනි ගුරුවරුන්ට සුදුසුකම් සම්පූර්ණ කිරීමේ වැඩ පිළිවෙළක් තිබුණා, අර 1989 වකවානුවේ බඳවා ගත්ත විසිපන්දහසක් අභ්‍යාසලාභී ගුරුවරුන්ට වාගේ.

ඒ වාගේම පූර්ණ කාලීන ගුරු විද්‍යාල ක්‍රමය දැන් වේගයෙන් හැකිළෙමින් යන තත්ත්වයක් යටතේ, අර ජාතික අධ්‍යාපන ආයතනයේ දූරස්ථ අධ්‍යාපන ක්‍රමය වැනි ක්‍රමවේදයක් හරහා මේ අයට සුදුසුකම් ටික ඇතුළත් කරලා මේ අය ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරන්න, මේ අයට යම් කිසි උපස්ථම්භනයක් ලබා දෙන්නට අමාත්‍යාංශයට බැරි ඇයි?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

එවැනි වැඩ පිළිවෙළක් තිබෙනවා. අපි තව මාස තුනක් ඇතුළත ව්‍යවසායකත්ව හා කළමනාකරණ ගුරු පුහුණුවට අලුතින් ගුරු විද්‍යාලයක්, ගුරු පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවනවා. ඒ වාගේම වෘත්තීය පුහුණුව සඳහා විද්‍යා පීඨයක් අලුතින් පිහිටුවනවා. ඊට අතිරේකව ජාතික අධ්‍යාපන ආයතනය හරහා, මේ ගුරු සහායකයන් ලෙස පත් වන අයට ඒ ඒ පළාතේ තිබෙන අවශ්‍යතාව අනුව ඒ ඒ ප්‍රදේශවලට ගිහිල්ලා පුහුණුවීමට හැකි පාඨමාලා; වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න, අතිගරු ජනාධිපතිතුමා විසින් මෙවර අය වැය ලේඛනයෙන් සුවිශේෂී මුදලක් වෙන් කර තිබෙනවා. ඒ කියන්නේ ගුරු පුහුණුව සඳහා පමණක්. ඒ නිසා මේ වර්ෂය අවසාන වන විට මේ ප්‍රශ්නයට ස්ථාවර විසඳුමක් ලැබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ අවසන් අතුරු ප්‍රශ්නය මෙයයි. මගේ දෙවන අතුරු ප්‍රශ්නයට දුන් පිළිතුරේදී ගරු ඇමතිතුමා සඳහන් කරන්නට යෙදුණා, තාක්ෂණවේදය වෙනුවෙන්ම වෙනම විද්‍යා පීඨයක් ඇති කරනවා කියලා.

දැන් රටේ පාසල්වල උපදේශනය සහ මාර්ගෝපදේශනය විෂයය සම්බන්ධයෙන්; ඒ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වැඩ කරන්නේ එකම ගුරු භවතෙක්. මෙය බොහෝ රටවල වෙන් වුණු අංශ දෙකක්. මේ විෂයයන් දෙක සහමුලින්ම වෙනස් අංශ දෙකක්. මාර්ගෝපදේශනය රැකියා ලෝකය වෙනුවෙනුත්, උපදේශනය දරුවන්ගේ ඇති වන මානසික සංකූලතාව වෙනුවෙනුත් තිබෙන්නේ.

දැන් බොහෝ විට පාසලේ ඉන්න ගුරුවරයෙකුමයි යම් කිසි පුහුණුවකින් පස්සේ උපදේශනය සහ මාර්ගෝපදේශනය විෂයය පිළිබඳ ගුරු භවතා බවට පත් වෙන්නේ. මේ තත්ත්වයෙන් එහා ගිහිල්ලා, උපදේශනය හා මාර්ගෝපදේශනය කියන විෂයයන් දෙක අංශ දෙකක් බවට වෙන් කරලා, රටේ සෑම පාසලකටම උපදේශනය සහ මාර්ගෝපදේශනය වෙනුවෙන් ගුරු භවතුන් දෙදෙනෙකු පත් කිරීම සඳහා විද්‍යා පීඨයක් ඇති කරන්නට අමාත්‍යාංශයට දැක්මක්, වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

පාර්ලිමේන්තුවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවක් පත් කරලා තිබෙනවා. ඒ උපදේශක කාරක සභාවේදී මේ සියලු අංශ සඳහා ඉතාම වටිනා අදහස්, යෝජනා රාශියක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ යෝජනා සියල්ල පිළිබඳව සිංහල, ඉංග්‍රීසි, දෙමළ මාධ්‍යයෙන් වාර්තාව දීලා, මා එම වාර්තාව කැබිනට් පත්‍රිකාවක් ලෙස කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ වහාම පාර්ලිමේන්තුවට පිළිගන්වනවා. ඒ අනුව අධ්‍යාපන ප්‍රතිපත්තියේ ඇති වන වෙනස්කම්වලට ඔය කියන කරුණු කාරණා ටික - තමුන්නාන්සේලා අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට දීපු කරුණු කාරණා ටික- ඇතුළත් කරලා තිබෙනවා. එවිට අපට මේ ප්‍රතිපත්තිය නිවැරැදි කර ගන්නට පුළුවන්කමක් ඇති වෙනවා.

## ජන සෙවණ වැඩසටහන : ග්‍රාමීය නිවාස
## ஜனசெவன நிகழ்ச்சித்திட்டம் : கிராமிய வீடுகள்
JANASEVANA PROGRAMME : VILLAGES HOUSES

2215/'12

3. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4):

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවණ වැඩසටහන යටතේ, සෑම ගමකටම වර්ෂයකට නිවාස 25 බැගින් ඉදි කිරීමට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වනවිට ඉදි කිරීම් අවසන් කර, ප්‍රතිලාභීන් පදිංචි කර ඇති සමස්ත නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස පිහිටි ගම්වල නම් කවරේද;

(iii) එක් නිවසක් ඉදිකිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) "மகிந்த சிந்தனை- இலங்கையை வெற்றிபெறச் செய்வோம்" கொள்கைகளில் ஜனசெவன நிகழ்ச்சித் திட்டத்தின் கீழ் ஒவ்வொரு கிராமத்திலும் வருட மொன்றில் தலா 25 வீடுகளை நிர்மாணிப்பதாக வாக்குறுதியளிக்கப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வாக்குறுதியின் பிரகாரம் தற்போது நிர்மாணப் பணிகள் பூர்த்தி செய்யப்பட்டு பயனாளிகள் குடியமர்த்தப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) மேற்படி வீடுகள் அமைந்துள்ள கிராமங்களின் பெயர்கள் யாதென்பதையும்;

(iii) வீடொன்றை நிர்மாணிப்பதற்காக செலவிடப் பட்ட தொகை யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Is he aware that a pledge was made under the Janasevana programme of the "Mahinda Chintana -Dinawamu Sri Lanka" manifesto that 25 houses would be built in each village every year?

(b) Will he inform this House -

(i) the total number of houses in which the construction work has been completed and the beneficiaries have been settled as per the above-mentioned pledge;

(ii) the names of the villages where the aforesaid houses have been built; and

(iii) the amount of money spent on the construction of one house?

(b) If not, why?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට මම පිළිතුරු දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) නිවාස 219,333යි.

(ii) දිවයිනේ පිහිටි සියලුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි නිවාස ඉදි කිරීම් සිදු කරනු ලැබ ඇත.

(iii) අවම - රුපියල් 50,000

උපරිමය - රුපියල් 863,207

(ඇ) අදාළ නොවේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, මා (ආ) (ii) කොටසෙන් අසා තිබෙන්නේ, "එම නිවාස පිහිටි ගම්වල නම් කවරේද?" කියලායි. එයට පිළිතුර සභාගත කරනවාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒ ලැයිස්තුව ඉදිරිපත් කරන්න මම ගෙනැල්ලා නැහැ. මොකද මම මේ පිළිතුරෙන් කියන්නේ "දිවයිනේ පිහිටි සියලුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි නිවාස ඉදි කිරීම් සිදු කරනු ලැබ ඇත." කියලායි. එතකොට ලැයිස්තුවක් අවශ්‍ය වන්නේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න කෙටියෙන් අහන්න. අද කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, සෑම ගමකටම වසරකට නිවාස 25 බැගින් ඉදි කෙරෙනු ඇත කියලා පොරොන්දුවක් දී තිබෙනවා. ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව අපේ රටේ ගම්මාන 35,440ක් තිබෙනවා. 2005 දී දුන් පොරොන්දුවට අනුව වසරකට නිවාස 25 ගණනේ වසර 5ක් ගතවන විට නිවාස 4,430,000ක් හැදිලා තිබෙන්න ඕනෑ.

ඔබතුමාගේ පිළිතුරේ සඳහන් කළා, ගෙවල් 219,033යි හැදිලා තිබෙන්නේ කියා. ඉතිරි නිවාස 41,00,000 ඉදි කරන්නට මහින්ද චින්තනය දියත් කරනවාය කියපු ආණ්ඩුව එය ඉටු කරන්න අපොහොසත් වෙලා තිබෙන්නේ ඇයි?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා මේ ප්‍රශ්නය මතු කරන්නේ 2005 කාලයේ සිට නිවාස ඉදි කිරීම සම්බන්ධවයි. විෂය භාර අමාත්‍යවරයා හැටියට මම මේ අමාත්‍යාංශය භාර ගත්තේ මීට අවුරුදු තුනකට කලිනුයි. ගරු මන්ත්‍රීතුමනි, එතකොට තමුන්නාන්සේට පිළිගන්න වෙනවා, ඊට පෙර කාලය පිළිබඳව විශාල වශයෙන් කරුණු ඉදිරිපත් කරන්න මට පුළුවන්කමක් නැහැ කියා. නමුත් අපට එක දෙයක් කියන්න පුළුවන්. අතිගරු ජනාධිපතිතුමන් මහින්ද චින්තන ඉදිරි දැක්මේ දෙන ලද නිවාසකරණයට අදාළ සියලු පොරොන්දු ඉටු කිරීම සඳහා අපි මේ වන විට ඉතාම කාර්යක්ෂම වැඩ පිළිවෙළක නියැලී සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, ඔබතුමා පළමුවන අතුරු ප්‍රශ්නයට උත්තරයක් දුන්නේ නැහැ. ඒ මොකද,-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය අහන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පළමුවන අතුරු ප්‍රශ්නය බොහොම පැහැදිලිව, බොහොම සරලවයි මම ඇහුවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා දෙන පිළිතුර තමයි පිළිතුර හැටියට සලකන්නේ. [බාධා කිරීමක්] ඔබතුමා දෙවන ප්‍රශ්නය අහනවාද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාට කිව්වේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මට කියන්න අවශ්‍යතාවක් නැහැ. කරුණාකර, දෙවන අතුරු ප්‍රශ්නය අහන්න. මම ඔබතුමාට කලින්ම කිව්වා, අද කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවාය කියා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගෙවල් 44,00,000ක් හදන්න ඕනෑ තැන ගෙවල් 2,19,000යි හදලා තිබෙන්නේ. ඒකයි මම ඇහුවේ. එතුමා ඒකට උත්තර දුන්නේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නයද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඇහුවේ පළමුවන අතුරු ප්‍රශ්නය.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර, දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේම අමාත්‍ය ප්‍රකාශනවල විවිධ කාලවල නිවාස නොමැති ජනතාව ගැන ඔබතුමා වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. මම මේ ගරු ඇමතිතුමාගේම පණිවුඩවලින් තොරතුරු ගත්තේ.

ඔබතුමා එක වෙලාවක කියනවා, මේ රටේ නිවාස නොමැති පවුල් ලක්ෂ 12ක් ඉන්නවා කියා. ඔබතුමා තවත් වෙලාවක කියනවා, නිවාස නොමැති පවුල් ලක්ෂ 15ක් ඉන්නවා කියා. ඔබතුමාගේ අලුත්ම තොරතුර තමයි නිවාස නොමැති පවුල් ලක්ෂ 7ක් ඉන්නවාය කියන එක. එතකොට ලක්ෂ 15 ලක්ෂ 12 වෙලා, දැන් ඒක ලක්ෂ 7ට බැහැලා. හැබැයි, ඔබතුමාගේ පිළිතුරේම තිබෙනවා, ගෙවල් 219,000යි හදලා තිබෙන්නේ කියලා.

ඒ නිසා මම නැවත වරක් ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. මහින්ද චින්තන වැඩසටහන යටතේ හැම අවුරුද්දකදීම එක ගමකට නිවාස 25 බැගින් හදලා දෙනවා කියලා තිබෙනවා. නිවාස 44,30,000ක් හදන්න ඕනෑකම තිබියදී හදලා තිබෙන්නේ ගෙවල් 219,000යි. කරුණාකරලා ඔබතුමා මට උත්තර දෙන්න, ඉතිරි නිවාස ලක්ෂ 41 හදන්නට ඔබතුමන්ලා කටයුතු කරන්නේ කවදාද කියා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
තමුන්නාන්සේ වැල්වටාරම් කියලා කලින් අහපු ප්‍රශ්නයමයි නැවතත් ඇහුවේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා උත්තර දුන්නේ නැති නිසයි මම නැවතත් ඇහුවේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම උත්තර දෙන්නම්. ඒ වැල්වටාරම් ඔක්කෝටම මම උත්තර දෙන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා දැන් කියනවා එක අවස්ථාවක මේ රටේ නිවාස හිඟය ලක්ෂ 15ක් කියලා අපි කිව්වාය, පසුව ලක්ෂ 12ක් කියලා කිව්වාය, දැන් ලක්ෂ 7ක් කියලා කියනවාය කියා. අපි හදලා තිබෙන්නේ නිවාස දෙලක්ෂ ගණනයි, ඒ නිසා මේ කියන ප්‍රමාණයට අඩු වෙන්න විධියක් නැහැ කියලාත් කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකෙන්ම පෙනෙනවා මෙතුමා මේ ප්‍රශ්නය දිහා බලන විධිය වැරැදියි කියලා.

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව තමන්ගේ ජන හා නිවාස සංගණන වාර්තාව නිකුත් කළාම තමයි අපි ස්ථිරව සහ විද්‍යානුකූලව කරුණු දැන ගන්නේ. ලංකාවේ සැබෑ ලෙසම අවිධිමත් නිවාසවල ජීවත් වන ජනතාව සහ නිවසක් නැති ජනතාව කියන දෙකොට්ඨාසයම ගත්තොත් ලක්ෂ 7කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා.

දැන් අපි පැහැදිලිවම දන්නවා ඒ සංඛ්‍යා ලේඛනය නිවැරදි බව. ඊට පෙර අවුරුදුවල ප්‍රාදේශීය ලේකම්තුමන්ලා මඟින්, නිවාස නිලධාරින් මඟින් කරන ලද සංගණන මඟින් ලැබුණු සංඛ්‍යා ලේඛන තමයි අපි ඒ පාවිච්චි කළේ. ඒ සංඛ්‍යා ලේඛන තමුන්නාන්සේත් ඕනෑ තරම් ඉදිරිපත් කර තිබෙනවා. හැබැයි අපි ළඟ තිබුණු ඒ සංඛ්‍යා ලේඛන නිවැරදි වන්නේ ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව කරපු ජන සංගණනයත් එක්ක.

ඊළඟට මෙතුමා අහනවා, ඒ කාලය තුළ අපි හදලා තිබෙන්නේ නිවාස දෙලක්ෂ ගණනක් නම් ඉතුරු ටිකට මොකක්ද වුණේ කියලා. ඒක ඉතාම පැහැදිලියි මන්ත්‍රීතුමනි. රජය විතරක් නොවෙයි ගෙවල් හදන්නේ. ගෙවල් හදන එක පෞද්ගලික කටයුත්තක්. මිනිස්සුත් තම තමන්ගේ ගෙවල් හදා ගන්නවා. මෙතුමා හිතන්නේ ලංකාවේ ගෙවල් හදන්නේ රජයෙන් විතරයි කියලා. නැහැ. රටේ සාමාන්‍ය ජනතාව රජයට වඩා විශාල වශයෙන් ගෙවල් හදා ගන්නවා. රජයම ගිහිල්ලා ගමේ නිවාස 25 හදනවා නොවෙයි. බැංකුවල ණය දීමේ ක්‍රම මඟින් උදවු කරලා, මිනිසුන්ව සවි බල ගන්වලා තමයි ඒවා හැදෙන්නේ.

තමුන්නාන්සේගේ අප්පච්චිගේ කාලයේ කෙරුණු ක්‍රමයයි මේ කාලයේ කෙරෙන ක්‍රමයයි අතර ලොකු වෙනසක් තිබෙනවා. අප්පච්චිගේ කාලයේ උළුවස්සටත් ගෙයක් කියලා නම දැම්මා. ජනෙල් පොල්ලටත් ගෙයක් කියලා නම දැම්මා. මේ කාලයේ එහෙම දාන්නේ නැහැ. ඒ නිසා අසත්‍ය ගණන් මේකේ නැහැ; මවපු ගණන් නැහැ. වැසිකිළි වළක් හදලා ඒකට ගෙයක් කියලා දාපු ගණන් මේකේ නැහැ. ඉතින් එහෙම ඕනෑ නම් තමුන්නාන්සේ කියන්න අපි ඒ විධියට වැහි පීල්ලක් දීපු එකටයි, වැසිකිළි වළක් හදලා දීපු එකටයි ගෙයක් කියලා දාලා මේ ගණන double, treble කරලා ගෙනැල්ලා දෙන්නම්. එහෙම දෙන්න පුළුවන්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්නට පෙර ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකර ප්‍රශ්නය කෙටියෙන් අහන්න. මා ඔබතුමාට මුලින්ම කිව්වා, වෙලාවේ ප්‍රශ්නයක් තිබෙනවා කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරි, හරි. මා තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්නට පෙර "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 21 වන පිටුවේ තිබෙන පොරොන්දුව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා සභාගත කරනවා. මොකද, මේගොල්ලන්ට තේරෙන්නේ නැහැ. තේරෙන්නේ නැති නිසා කියවලා තේරුම් ගන්න මා ඒක හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, what is your point of Order in brief?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
According to the Standing Orders, you can ask Supplementary Questions based on the reply given but nothing could be tabled.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That point is taken. Hon. Sajith Premadasa, you ask your next Supplementary Question.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
I want to know -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You do not have to reply now. You ask the Question.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොන රීතිය අනුවද, "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 21වැනි පිටුව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා සභාගත කරන්නට මට අවස්ථාව නැත්තේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I have given an Order. None of you could challenge it.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Under which Standing Order?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Please raise your third Supplementary Question.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Why do you not consult the Deputy Secretary-General? He will be able to tell you the correct position.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I have given an Order. You can raise your Supplementary Question.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Okay. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මම පෙර සඳහන් කරපු "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 21වැනි පිටුවේ "සෑම ගමකටම හැම අවුරුද්දකටම ගෙවල් 25ක් හදනවා" කියපු ඒ පිටුව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා සභාගත කරමින් මම මේ ප්‍රශ්නය අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය අහන්නේ ප්‍රකාශ කරන දේත්, කරන දේත් අතර පරස්පරයක් තිබෙන නිසායි. ගෙවල් හදනවාය කියලා කිව්වා හතළිස්හතර ලක්ෂ

---
**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

තිස්දාහක්. හැබැයි රජයෙන් හදලා තිබෙන්නේ දෙලක්ෂ දහනව දාහයි. මම විශ්වාස කරනවා, ඇමතිතුමා කියන දේ කරන, කරන දේ කියන පුද්ගලයෙක් කියලා. ඔබතුමා මැයි පළමුවැනි දා ප්‍රකාශ කර තිබෙනවා, "උතුරේ ඡන්දය සැප්තැම්බර්වල තිබ්බොත් වැඩේ ඉවරයි. මොන ඇමතිකම් දැරුවත් රට වෙනුවෙන් ඒ සියල්ලක්ම අත හැර යාමට අප සූදානම්" කියලා. එතුමා කියන විධියට, හරි නම් සැප්තැම්බර් මාසය වෙන්න ඉස්සෙල්ලා එතුමා ඇමතිකම අතහැරලා යන්න ඕනෑ. මොකද, උතුරු පළාත් සභාවේ ඡන්දය ප්‍රකාශයට පත් කරලා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පාර්ලිමේන්තුවේ කාලය කා දමමින් වැල්වටාරම් කියන්නේ නැතුව ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමා කියන දේ කරන, කරන දේ කියන ඇමතිවරයෙක්ද කියලා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ සතුට නේ. අපි එතුමාගේ සතුටට බාධා කරන්න නරකයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ සතුට ඔබගේ සත්‍යය.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා එක එක හීන බල බලා නේ ඉන්නේ. අර, විපක්ෂ නායකතුමා කිසි ප්‍රශ්නයක් නැතිව ඉන්නවා. නායකත්වය ගන්න අරගෙන ගිහිල්ලා අහිංසක දයාසිරිලා වාගේ මන්ත්‍රීවරුන් තමයි අන්තිමට අමාරුවේ දැම්මේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ප්‍රශ්නයට උත්තරය දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අන්තිමට අර දයාසිරිලා, බුද්ධිකලා ඉන්නවා හතර වරම් වැදිලා එලෝ පාතක් පෙනෙන්නේ නැතිව. තමුන්නාන්සේ ඒ වාගේ ඒවායි කළේ. එහෙම කෙනකු හැටියට තමුන්නාන්සේ මගෙන් එවැනි ප්‍රශ්නයක් ඇහුවාම මා ඒකට උත්තර දෙන එක හොඳ දෙයක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පිළිතුර දෙන්න ගරු ඇමතිතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අර අකිල මන්ත්‍රීතුමාත් හොඳ අවධානයෙන් ඉන්නවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )
වයඹ -කුරුණෑගල- නායකයා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! කරුණාකර පිළිතුර දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "සැප්තැම්බර්වල පළාත් සභා මැතිවරණය පැවැත්වුවොත්" කියා නොවෙයි අප කියලා තිබෙන්නේ. තමුන්නාන්සේ ඕක හොඳට කියවා බලන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ තිබෙන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඉතින් ඉන්න. අනේ, පොඩ්ඩක් ඉවසන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
විවාදයක් නැහැ. ගරු ඇමතිතුමා පිළිතුර දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නායකත්වය ගන්න ඉවසිල්ලක් නැහැ වාගේම මගෙන් අහපු ප්‍රශ්නයට උත්තරය දෙනකොට අහගෙන ඉන්නත් ඉවසිල්ලක් නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට හොඳ ඉවසීමක් තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඉවසීමක් තිබෙනවා නම් අර අහිංසකයන් ටික බිලි දුන්නේ ඇයි? ඉවසීමක් තිබෙනවා නම් ඒ අයටත් ඉවසන්න කියලා තියාගෙන ඉන්න තිබුණා නේ. ගරු මන්ත්‍රීතුමනි, අප ඔතැනදී පැහැදිලිවම කියලා තිබෙන්නේ උතුරු පළාත් සභා මැතිවරණය පැවැත්වීමට පෙර දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන බෙදුම්වාදයට උඩ ගෙඩි දෙන යම් යම් බලතල සංශෝධනය විය යුතුයි, එය එසේ කරලා තමයි පළාත් සභා මැතිවරණය පවත්වන්න ඕනෑ කියන එකයි. ඒ අනුව රජය දැන්

ඒකට අදාළ ක්‍රියා මාර්ග තෝරලා තිබෙනවා. තේරීම් කාරක සභාවක් පත් කරලා තිබෙනවා. කඩිනමින් ඒ සම්බන්ධ පියවර ගන්න රජය අවශ්‍ය කටයුතු කර තිබෙනවා. රජය ඒ ක්‍රියා මාර්ගවලට ඇවිල්ලා තියෙද්දී -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කොහේද යන්නේ - මල්ලේ පොල්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
තමුන්නාන්සේ කරුණාකර අහගෙන ඉන්න. රජය ඒ ක්‍රියා මාර්ගවලට අද ඇවිල්ලා තිබෙනවා. තමුන්නාන්සේලා මහ හැරලා තිබෙනවා. දෙමළ ජාතික සන්ධානය මහ හැරලා තිබෙනවා. පක්ෂ ඔක්කෝම එකට එකතු වෙලා එයින් රටට, ජාතික ආරක්ෂාවට-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතකොට, මුස්ලිම් කොංග්‍රසය? ඔබතුමාගේ එහා පැත්තේ ඉන්න පුද්ගලයා?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එතුමා එනවා; තේරීම් කාරක සභාවට එනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතකොට, මෙහා පැත්තේ ඉන්න ඩිව් ගුණසේකර ඇමතිතුමා?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
තේරීම් කාරක සභාවත් එක්ක එතුමන්ලාගේ ප්‍රශ්නයක් නැහැ. එතුමන්ලා තේරීම් කාරක සභාවේ ඉන්නවා. මේ, දේශපාලනය දන්නේ නැති තොත්ත බබෙක් නේ. තේරීම් කාරක සභාවේ එතුමාත් ඉන්නවා, මෙතුමන්ලාත් ඉන්නවා, අපි කවුරුත් ඉන්නවා. තේරීම් කාරක සභාවේ ඉඳලා මේ සම්බන්ධයෙන් අවශ්‍ය තීරණ අපි ගන්නවා. එම නිසා තමුන්නාන්සේ -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර පිළිතුර දෙන්න, ගරු ඇමතිතුමනි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එම නිසා තමුන්නාන්සේ කරුණාකරලා නොතේරෙන දේවල් ගැන අහන්න බලන්න යන්නේ නැතුව, ඔය තේරෙන මොකක් හෝ බලා ගෙන පොඩ්ඩක් ඉන්න, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇඟ පුරාම මොළේ තිබෙන - [බාධා කිරීමක්]

## තංගල්ල නිවාඩු නිකේතනයකදී ඇති වූ සිද්ධිය : විස්තර

### தங்காலை விடுமுறை விடுதியில் நடந்த சம்பவம் : விபரம்

### INCIDENT AT HOLIDAY RESORT IN TANGALLE : DETAILS

2271/'12

4. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2011 වර්ෂයේ නත්තල් දින හෝ ඊට ආසන්න දිනක තංගල්ල ප්‍රදේශයේ නිවාඩු නිකේතනයකදී විදේශිකයෙකු ඝාතනය කිරීමක් සිදුව ඇත්නම්, එසේ ඝාතනය වූ පුද්ගලයා සමඟ සිටි අනෙකුත් විදේශීය පුද්ගලයාගේ නම කවරේද;

(ii) ඔහුගේ හෝ ඇයගේ රට කුමක්ද;

(iii) එම පුද්ගලයා කාන්තාවක් නම්, ඇය දූෂණය කර හෝ අතවරයකට ලක් කර තිබේද;

(iv) මේ වන විට ඔහු හෝ ඇය ජීවත්ව සිටින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සිදු වීම හේතුවෙන් ශ්‍රී ලංකාවට අත් වූ අපකීර්තිය මකාලීම සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2011ஆம் ஆண்டில் நத்தார் தினத்தன்று அல்லது அதற்கு அண்மித்த தினமொன்றில் தங்காலை பிரதேசத்தின் விடுமுறை விடுதியொன்றில் வெளிநாட்டவரொருவர் படுகொலை செய்யப் பட்டிருப்பின், அவ்விதம் படுகொலை செய்யப் பட்டவருடன் இருந்த ஏனைய வெளிநாட்டவரது பெயர் யாது என்பதையும்;

(ii) இவரது நாடு யாது என்பதையும்;

(iii) அந்நபர் ஒரு பெண் எனில் இவர் பாலியல் வல்லுறவுக்கு அல்லது தொந்தரவுக்கு இலக்காகி யுள்ளாரா என்பதையும்;

(iv) தற்போது இவர் உயிருடன் இருக்கிறாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி சம்பவம் காரணமாக இலங்கைக்கு ஏற்பட்ட அபகீர்த்தியை இல்லாதொழிப்பதற்காக மேற் கொள்ளும் நடவடிக்கைகள் யாவையென்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House -

(i) if a murder of a foreigner had taken place in a holiday resort in Tangalle area on or

[ගරු දයාසිරි ජයසේකර මහතා]

around the Christmas day in 2011, the name of the other foreigner who was in the company of the person so murdered;

(ii) of his or her country;

(iii) if the aforesaid person is a female, whether she has been raped or harassed; and

(iv) whether he or she is alive at present?

(b) Will he state the remedial steps that will be taken with respect to the disgrace brought to Sri Lanka as a result of the aforesaid incident?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මෙම ප්‍රශ්නය ඊයේත් මගෙන් ඇහුවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. මෙම ප්‍රශ්නය එම ප්‍රශ්නයට වඩා පොඩ්ඩක් වෙනස් ප්‍රශ්නයක්. ඔබතුමා උත්තර දුන්නේ නැහැ නේ. ඒකයි වුණේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
උත්තරය දුන්නා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

මා දන්නේ නැහැ, මෙම නම නිවැරැදිද කියලා. මා මෙහි තිබෙන නම කියවනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මට වඩා හොඳට ඔබතුමා ඒ නම දන්නවා ඇති.

(අ) (i) ටෙකා ජෙවා වික්ටෝරියා ඇලෙක්ටෝව්නා නමැති වයස අවුරුදු 23ක රුසියානු කාන්තාවක්.

(ii) රුසියාව.

(iii) දූෂණයට හෝ අතවරයට ලක්ව නොමැති අතර ඇය පහර දීමකට ලක්ව ඇති බව වාර්තා වේ.

(iv) ජීවත්ව සිටියි. ඉහත සිද්ධියේදී එම කාන්තාව තුවාල ලබා ඇතත් මරණීය තුවාල සිදු වී නොමැත.

(ආ) ඉහත සිදු වීම පෞද්ගලික හේතුවක් මත ඇති වූවක් වන අතර අදාළ සැකකරුවන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.

(ඇ) අදාළ නැත.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, මා අහන්න කැමැතියි, කවුද ඔය උත්තරය දුන්නේ කියලා. ඇයව දූෂණය වෙලා තිබෙනවා.

ඇයගේ කට උත්තරය මා ළඟ තිබෙනවා. ඒකේ බොහොම පැහැදිලිව තිබෙනවා-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවන අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්. පළමුවන අතුරු ප්‍රශ්නය මම අහනවා. ඇය අවස්ථා ගණනාවකදී මේ පුද්ගලයන් විසින් දූෂණයට ලක් කළාය කියා ඇයගේ කට උත්තරයේ තිබෙනවා. දූෂණයට ලක් වෙලා නැහැ කියා ඔබතුමාට ඔය උත්තරය දුන්නේ කවුද කියා මා දන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයෙන් අදාළ පොලිස් බලධාරිගෙන් ලබා ගත් වාර්තාව අනුවයි මේ උත්තරය එවා තිබෙන්නේ. ඔබතුමාට වෙනම අමාත්‍යාංශයකින් එවා තිබෙනවා ද මා දන්නේ නැහැ. මෙය අධිකරණ පරීක්ෂණයකට ලක් කර තිබෙන කාරණාවක්. ඒ පිළිබඳ සාක්ෂි තිබෙනවා නම් අධිකරණයේදී ඒවා එළිදරවු වේවි. එහෙම නැතිව අපට නිගමනයකට එන්නට බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්. මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ළඟ ආරක්ෂක අමාත්‍යාංශයෙන් එවන ලද දේවල් තිබෙනවාද? ඒ තංගල්ලේ ප්‍රාදේශීය සභා සභාපතිවරයාට සහ ඒ අයට එරෙහිව තිබෙන චෝදනා මොනවාද කියා ඔබතුමා ළඟ තිබෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමාට මා ඊයේ ඒ පිළිබඳව සම්පූර්ණයෙන්ම උත්තරය දුන්නා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒකේ තමයි තිබෙන්නේ. ඒකයි මම කිව්වේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඊයේ උත්තර දුන්න එක අද යළිත් ඇහුවට, මෙතැන මට එය ප්‍රශ්නයක් වශයෙන් ඉදිරිපත් කරලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කිව්වේ ඊයේ දුන්න-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. පැහැදිලි කර ගැනීමක්. මම තුන්වන අතුරු ප්‍රශ්නය පසුව අහන්නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් ඇමතිතුමා උත්තරයක් දුන්නා නේ ගරු මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. මා මේක පැහැදිලි කර ගන්නයි යන්නේ. මොකද, එතුමා මේක හරියට කියන්නේ නැහැ නේ. ඊයේ දුන් පිළිතුරේ තිබෙනවා, මෙහෙම චෝදනා තිබෙනවාය කියා. අද කියනවා, එහෙම චෝදනාවක් නැහැ කියා. මා ඒකයි කල්පනා කළේ. හරි. කමක් නැහැ. මා තුන්වන අතුරු ප්‍රශ්නය අහන්නම්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පුද්ගලයන් දෙදෙනෙකු සම්බන්ධවයි මේ අහන්නේ. ඊයේ එක පුද්ගලයෙක් සම්බන්ධව ඇහුවා. අද වෙනත් කාන්තාවක් සම්බන්ධව අහනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දෙන්නා එකට ඉන්නකොට තමයි මැරුවේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම දන්නේ නැහැ, දෙන්නා කවදා එකට හිටියාද කියා. ඒවා ඔබතුමාට සහ අධිකරණයට අයිති දේවල්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එකට ඉන්නවත් දුන්නේ නැහැනේ. එක්කෙනෙක් මැරුවා. අනික් එක්කෙනා දූෂණය කළා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අධිකරණයේ නඩුවක් පවතිනවා. ඔබතුමා ඒ නඩුවේ තත්ත්වය අවුල් කරන්නට එපා. මම ඔබතුමාට කියන්නේ එච්චරයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. කිසිම අවුලක් නැහැ. රටේ නීතිය ක්‍රියාත්මක වෙනවා නම් ඇති. එච්චරයි අපි ඉල්ලන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඕනෑ කෙනකුට අධිකරණයට ගිහිල්ලා තිබෙන සාක්ෂි ඉදිරිපත් කරන්න පුළුවන්. ඔබතුමාට විශේෂ සාක්ෂියක් තිබෙනවා නම් එය ඉදිරිපත් කරන්න පුළුවන්. ඔබතුමා දක්ෂ නීතිඥයෙක්. ඒ නිසා තමයි අපිත් බොහොම උත්සාහ දරන්නේ, ඔබතුමාට විශේෂයෙන් සලකන්න. විශේෂ සාක්ෂියක් තිබෙනවා නම් අධිකරණයට ගිහින් ඒ සාක්ෂිය ඉදිරිපත් කරන්න ඕනෑම පුරවැසියෙකුට පුළුවන්, නිවැරදි සාක්ෂිය මේකයි කියා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට හරියට සලකනවා නම් කරන්න තිබෙන්නේ හරියට උත්තරය දෙන එකයි. එච්චරයි. වෙන සලකන්න දෙයක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න. අපි සලකන්න හදන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි කැමැතියි සලකන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ගිය සතිය වෙනකොට බ්‍රිතාන්‍යයෙන් travel ban එකක් -විදේශ සංචාර තහනමක්- ආවා. අද වෙනකොට ඕස්ට්‍රේලියාවෙන්, නවසීලන්තයෙන් travel bans දමා තිබෙනවා. ඒ පිළිබඳ විස්තර ටික මා සතුව තිබෙනවා. ඒ අනුව රාත්‍රී සමාජ ශාලාවලට - nightclubsවලට - යන එක නතර කරන්න; credit cardsවලින් ගනු දෙනු කිරීමේදී කල්පනාකාරී වෙන්න; දේශපාලන රැස්වීම් පැවැත්වෙන තැන්වලට ගිහින් බලාගෙන ඉන්න එපාය කියා තිබෙනවා. ජාතිවාදී සංවිධාන විශාල සංඛ්‍යාවක් තිබෙනවා; ඒවා අසලින් යාම නතර කරන්නය කියා තිබෙනවා. ලංකාවේ දේශීය ප්‍රවෘත්ති - local news - වැඩියෙන් බලන්න; උතුරට යනකොට බිම් බෝම්බ ආදියෙන් ප්‍රවේසම් වෙන්නය කියා තිබෙනවා. ඔබතුමන්ලා මේ අවුරුද්දේ විදේශ සංචාරකයන් ලක්ෂ 26ක් ගෙන්වන්න හදනවා. ඕස්ට්‍රේලියාවෙන්, නවසීලන්තයෙන්, බ්‍රිතාන්‍යයෙන් මේ විධියට සංචාරක බාධා කිරීම් - travel bans - තිබෙනවා නම් ඒවා අවසන් කරන්න ඔබතුමන්ලා ගන්න පියවර මොකක්ද කියා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අදාළ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපට අදාළයි. ඒකයි ඇහුවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 5 - 2997/'12 - (1), ගරු රෝසි සේනානායක මහත්මිය.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹக்கீம் - நீதி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Justice)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 7 - 3059/'12 - (1), ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜய தஹநாயக்க- பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් ඒ ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මධ්‍යම පළාත් සභාව : ප්‍රඥප්ති
### மத்திய மாகாண சபை : நியதிச்சட்டங்கள்
### CENTRAL PROVINCIAL COUNCIL : STATUTES

3066/'12

**8. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) මධ්‍යම පළාත් සභාව පිහිටුවා එහි කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) මධ්‍යම පළාත් සභාව විසින් මේ වන විට සම්මත කර ඇති ප්‍රඥප්ති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ප්‍රඥප්තියේ නම, අංකය සහ සම්මත කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පළාත් සභාව මගින් සම්මත කරන ලද,

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ Iවැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ IIIවැනි ලැයිස්තුවේ (සමගාමී ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පළාත් සභා වෙත විශේෂයෙන් පවරා ඇති විෂය සහ කාර්යයන්වලට අදාළව ප්‍රඥප්ති පැනවීම අවම වශයෙන් සිදුවන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට හේතුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மத்திய மாகாண சபையைத் தாபித்து அதன் நடவடிக்கைகள் ஆரம்பித்து வைக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) மத்திய மாகாண சபையினால் இதுவரை நிறைவேற்றப்பட்டுள்ள நியதிச்சட்டங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு நியதிச்சட்டத்தினதும் பெயர், இலக்கம் மற்றும் நிறைவேற்றப்பட்ட திகதி வெவ்வேறாக யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) மேற்படி மாகாண சபையினால் நிறைவேற்றப்பட்ட,

(i) அரசியலமைப்பின் ஒன்பதாம் அட்டவணையின் I ஆம் நிரலின் (மாகாண சபை நிரலின்) விடயங்களுக்குரிய நியதிச் சட்டங்கள்;

(ii) அரசியலமைப்பின் ஒன்பதாம் அட்டவணையின் III ஆம் நிரலின் (ஒருங்கியை நிரலின்) விடயங் களுக்குரிய நியதிச்சட்டங்கள் யாவையென்பதை

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) அரசியலமைப்பின் மூலம் மாகாண சபைகளுக்கு விசேடமாக ஒப்படைக்கப்பட்டுள்ள விடயங்கள் மற்றும் பணிகள் தொடர்பாக நியதிச் சட்டங் களை நிறைவேற்றுதல் குறைவாகவே நடை பெறுகின்றதென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை யென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Will he state -

(i) the date on which the Central Provincial Council was established and commenced its functions;

(ii) the number of statutes adopted by the Central Provincial Council by now; and

(iii) separately, the title, number and the date of adoption of each of the aforesaid statutes?

(b) Will he inform this House -

(i) the statutes relevant to the subjects in the List I of the Ninth Schedule of the Constitution (Provincial Councils List); and

(ii) the statutes relevant to the subjects in the List III of the Ninth Schedule of the Constitution (Concurrent List);

(iii) which have been adopted by the aforesaid Provincial Council?

(c) Will he also state -

(i) whether he admits that the imposition of statutes with regard to the subjects and the functions that have been specifically vested in the provincial councils by the Constitution is minimum; and

(ii) if so, the reason for that?

(d) If not why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 1988.07.14

(ii) 30කි.

(iii) ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) (i) ප්‍රඥප්ති 30කි. (ඇමුණුමෙහි දක්වා ඇති ප්‍රඥප්ති මෙයට අයත් වේ.)

(ii) නැත.

(ඇ) (i) නැත.

(ii) ප්‍රඥප්ති අනුමත කිරීමට දීර්ඝ කාලයක් ගත වීම.

(ඈ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

| අනු අංකය | ප්‍රඥප්තියේ නම | අංකය | සම්මත කල දිනය |
|---|---|---|---|
| 01 | ම/ප මුදල් ප්‍රඥප්තිය | 1990 අංක 01 | 1990.06.30 |
| 02 | ම/ප හදිසි අවස්ථා | 1990 අංක 02 | 1990.02.13 |
| 03 | ම/ප අධ්‍යාපන ප්‍රඥප්තිය | 1990 අංක 03 | 1990.02.27 |
| 04 | ම/ප සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු පරිපාලන අධීක්ෂණ ප්‍රඥප්තිය | 1990 අංක 06 | 1990.07.10 |
| 05 | ම/ප පළාත් පාලන ආයතන වලට අධිකාරී බලය පැවරීම හා එහි අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තිය | 1990 අංක 07 | 1990.07.10 |
| 06 | ම/ප පළාත් ක්‍රීඩා ප්‍රඥප්තිය | 1990 අංක 09 | 1991.037.26 |
| 07 | ම/ප පළාත් සමුපකාර ප්‍රඥප්තිය (සංශෝධන සහිත) | 1990 අංක 10 | 1992.05.06 |
| 08 | ම/ප පළාත් කෘෂිකර්ම ප්‍රඥප්තිය | 1990 අංක 11 | 1991.12.10 |
| 09 | ම/ප පළාත් සමුපකාර සේවක ප්‍රඥප්තිය | 1990 අංක 14 | 1991.11.26 |
| 10 | ම/ප පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය | 1990 අංක 015 | 1990.12.10 |
| 11 | ම/ප පළාත් මුදල් ප්‍රඥප්තිය | 1990 අංක 17 | 1990.09.25 |
| 12 | ම/ප පළාත් ආයුර්වේද ප්‍රඥප්තිය | 1990 අංක 18 | 1990.02.27 |
| 13 | ම/ප පළාත් මාර්ගස්ථ හා මගී ප්‍රවාහනය කිරීමේ ප්‍රඥප්තිය | 1990 අංක 20 | 1990.03.26 |
| 14 | ම/ප පළාත් පාලන කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය | 1991 අංක 01 | 1991.03.26 |
| 15 | ම/ප මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය | 1992 අංක 01 | 1991.03.26 |
| 16 | ම/ප මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ (සංශෝධිත ) ප්‍රඥප්තිය | 1992 අංක 01 | 1992.12.22 |
| 17 | ම/ප මුදල් සංශෝධන ප්‍රඥප්තිය | 1993 අංක 01 | 1993.08.18 |
| 18 | ම/ප මුද්දර බදු ප්‍රඥප්තිය | 1993 අංක 02 | 1993.08.18 |
| 19 | ම/පසමුපකාර සේවක කොමිෂන් සභා (සංශෝධන) ප්‍රඥප්තිය | 1993 අංක 03 | 1993.09.20 |
| 20 | ම/ප සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තිය | 1993 අංක 04 | 1993.09.20 |
| 21 | ම/ප නිවාස සංවර්ධන ප්‍රඥප්තිය | 1993 අංක 05 | 1994.04.20 |
| 22 | ම/ප පුස්ථකාල ප්‍රඥප්තිය | 1995 අංක 02 | 1995.08.25 |
| 23 | ම/ප මුදල්(අතිරේක විධිවිධාන) ප්‍රඥප්තිය | 1996 අංක 03 | 1996.10.11 |
| 24 | ම/ප වැටුප් හා දීමනා පිළිබද ප්‍රඥප්තිය (නියෝජ්‍ය සභාපති සදහා) | 1998 අංක 01 | 1998.08.09 |
| 25 | ම/ප මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තිය (සංශෝධන සහිත) | 2000අංක 01 | 2000.12.13 |
| 26 | ම/ප කර්මාන්ත සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය | 2001 අංක 01 | 2001.06.22 |
| 27 | ම/ප උසාවි දඩ මුදල් පළාත් පාලන ආයතන වලට හැරවීමට විධිවිධාන සැලසීමේ ප්‍රඥප්තිය | 2001 අංක 02 | 2001.07.22 |
| 28 | ම/ප සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය | 2006 අංක 01 | 2007.05.08 |
| 29 | ම/ප මාර්ග සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය (සංශෝධන සහිත) | 2006 අංක 02 | 2007.05.08 |
| 30 | ම/ප කලාපිය ආර්ථික සංවර්ධන ආයතන ප්‍රඥප්තිය | 2008අංක 01 | 2008.07.22 |

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, දැන් පළාත් සභා "සුදු අලියෙක්" කියලා කියනවා. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයෙන් පැවරිලා තිබෙන පළාත් සභාවල විෂයන්ට අදාළව ප්‍රඥප්ති ඒ ඒ පළාත් සභාව සකස් කර ගැනීම සහ ඒ ප්‍රඥප්ති සකස් කර ගැනීමේ ක්‍රියාවලියට මධ්‍යම ආණ්ඩුවෙන් ලැබෙන සහාය නැතිව මේ පළාත් සභා ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කරන්න හැකියාවක් නැහැ. මේ පිළිතුරෙන් පැහැදිලි වන්නේ ඒ බවද කියලා මා අහන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැහැ. මා හිතන හැටියට එහෙම නිගමනයකට පැමිණෙන්න බැහැ. පාර්ලිමේන්තුව 1989 විශේෂ විධිවිධාන යටතේ රජයේ නීති සියල්ලම පාහේ ගැන කටයුතු කිරීමට පවරන ලද විෂයයන් ගැන විශේෂ පනතක් සම්මත කර දීලා තිබෙනවා, පළාත් සභා තම ප්‍රඥප්ති සකස් කරන තුරු. පළාත් සභාව එය ප්‍රයෝජනයට නොගන්නවා නම් ඒක පළාත් සභාවේ ප්‍රශ්නයක්. මධ්‍යම ආණ්ඩුවේ ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමාගේ පිළිතුර අනුව කියන්නේ ඒ බලය පළාත් සභාව ප්‍රයෝජනයට නොගන්නවා නම් එය පළාත් සභාවේ ප්‍රශ්නයක් මිස මධ්‍යම ආණ්ඩුවේ ප්‍රශ්නයක් නොවෙයි කියලායි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔව්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

නමුත් පසු ගිය කාලය පුරාම මධ්‍යම ආණ්ඩුවේත්, පළාත් සභාවලත් වැඩි කාලයක් බලය දැරුවේ එකම පක්ෂයක්. එතකොට මධ්‍යම ආණ්ඩුවත්, පළාත් සභාත් අතර ඒ සුහදතාව සහ අවබෝධය මත සැබෑවට බලය විමධ්‍යගත කිරීම ගැන කැපවීමක් නැතිකමයි ඔබතුමාගේ පිළිතුරෙන් පෙන්නුම් කරන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමනි, 1987 දී තමයි පළාත් සභා ඇති කළේ. 1994 වන තුරු රජ කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි. ඒ නිසා ඔබතුමා එක පැත්තකට පමණක් ඇඟිල්ල දිගු කරන්න එපා. ඒ ආණ්ඩුව විසින්ම තමයි පළාත් සභාවනුත් පාලනය කළේ. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය මහ ඇමතිනිය වන තුරු, අමරසිරි දොඩංගොඩ මැතිතුමා මහ ඇමති වන තුරු ඔබතුමන්ලා පරාජයකට මුහුණ දුන්නේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලාගේම ආණ්ඩුව සහ තමුන්නාන්සේලාගේම පළාත් සභා මහ ඇමතිවරුන්ගේ ආණ්ඩු තිබෙන කාලයේවත් මේක කරලා නැහැ. ඒ නිසා තමයි අන්තර් සංශෝධනයක් ගෙනැල්ලා ඒ පාවිච්චි කළ යුතු අණපනත් පාවිච්චි කිරීමේ අවකාශය ලබා දුන්නේ.

ඉතින් ඒ නිසා අපේ ආණ්ඩුවට හෝ තවත් ආණ්ඩුවකට ඇඟිල්ල දිගු කරන්නට බැහැ. මේ ගැන මා සාධාරණව කියන්නට ඕනෑ. ආණ්ඩු ක්‍රමය පිළිබඳව ගැටලු ඇති වී තිබෙනවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පළාත් සභා පිළිබඳව ප්‍රශ්න තිබෙනවා. ඒවා ගැන සොයා බලන්නට කාටත් වගකීමක් තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. 1989 වසරේ සිට 1994 දක්වා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වී ආරම්භක අවුරුදු පහ තමයි එක්සත් ජාතික පක්ෂ රජය විසින් පාලනය කළේ. එදා ඉඳලා දැන් අවුරුදු 19කට ආසන්න කාලයක් එක දිගට -ඉතාම සීමිත කාලයකට පැවැති පාර්ලිමේන්තුවේ බලය මාරු වීම හැරෙන්නට- පුටුව ලකුණ දැරූ පොදු ජන එක්සත් පෙරමුණු රජයත්, ඊට පසුව බුලත් කොළය ලකුණ දරන එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයත් තමයි මේ රට පාලනය කරන්නේ. එතකොට ඒ පසු ගිය අවුරුදු 20 දිහා බැලුවාම එම වග කීම තිබෙන්නේ වර්තමාන ආණ්ඩුවටයි. එතකොට ඒ බලය විමධ්‍යගත කිරීම පිළිබඳව තිබෙන ප්‍රශ්න මේ කාලය තුළ විසඳා ගන්නේ නැතිව, රටේ ආර්ථික හා සමාජීය කරුණු විසඳා ගැනීම සඳහා තැබූ ඉදිරි පියවර ආපස්සට ගන්න දරන මේ උත්සාහය පසුගාමී පියවරක් කියලා ඔබතුමාට හිතෙන්නේ නැද්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

උතුරු - නැඟෙනහිර පළාත් සභාවේ වරදරාජා පෙරුමාල් පාලනය යටතේ වෙනම රාජ්‍යයක් ප්‍රකාශයට පත් කළ නිසා, රටේ ඇති වී තිබුණු ඒ ප්‍රශ්නය මත උතුරු නැඟෙනහිර පළාත් සභාව විසුරුවා හරින්නට සිදු වුණා. ඒ කවදාද? ඒ 1990 දීයි. අදට අවුරුදු 23ක් ගත වෙලා තිබෙනවා. දැන් උතුරු නැඟෙනහිර පළාත් සභා මැතිවරණය අපේ රජයෙන් ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒක දීර්ඝ කාලයක්. ඒ නිසා පළාත් සභා සියල්ලේම තිබෙන ගැටලු මොනවාද කියලා සොයා බලන්න පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් දැන් පත් කර තිබෙනවා. ඒකට ඇවිල්ලා ගරු මන්ත්‍රීතුමා සාක්ෂි දෙන්න. ඔබතුමා ඒ තොරතුරු දන්නවා. ඒ නිසා නායකතුමාගේ අවසරය ඇතිව ඇවිල්ලා එම කාරක සභාවේ සාක්ෂි දෙන්න. එහෙම කරනවා නම් වඩාත් ඵලදායී කියලා මා හිතනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

බොහොම ස්තුතියි.

## මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති : බැංකු ණය
### வீதி நிர்மாணக் கருத்திட்டங்கள் : வங்கிக் கடன்கள்
### ROAD CONSTRUCTION PROJECTS : BORROWINGS FROM BANKS

3442/'13

9. **ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) රජය මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා දේශීය වාණිජ බැංකු වෙතින් ණය ලබා ගැනීම ආරම්භකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) සියලුම දේශීය වාණිජ බැංකු වෙතින් ලබාගත් ණය මුදල් ප්‍රමාණයන්, ණය ආපසු ගෙවීමට ලබා දී ඇති කාලය, පොලී අනුපාත සහ වෙනත් කොන්දේසි සමඟ වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) வீதி நிர்மாணக் கருத்திட்டங்களுக்காக அரசாங்கம் உள்நாட்டு வர்த்தக வங்கிகளில் கடன்களை பெற்றுக்கொள்ள ஆரம்பித்திருக்கின்றது என்பதை அவர் அறிவாரா?

(ஆ) அனைத்து உள்நாட்டு வர்த்தக வங்கிகளிலும் பெற்றுக்கொள்ளப்பட்ட மொத்தக் கடன் தொகை, அவற்றிற்கான கால எல்லை, வட்டி வீதம் மற்றும் வேறு நிபந்தனைகள் என்பனவற்றை தனித்தனியாக அவர் கூறுவரா ?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Is he aware that the Government has begun to borrow from local commercial banks for road construction projects?

(b) Will he state all amounts borrowed from all local commercial banks separately identified with tenor, interest rates and other conditions?

(c) If not, why?

**ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Minister of Ports and Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

(ආ) ඇමුණුම බලන්න. ඇමුණුම **සභාගත*** කරමි.

(ඇ) පැන නොනඟී.

පිළිතුරේ "(ආ)" කොටස පිළිබඳව ඔබතුමාට පැහැදිලි කිරීමක් කරන්නම්. අදාළ පොලී අනුපාතය සියයට 9යි. ඒ වාගේම ණය මුදල ගෙවා නිම කිරීමට ඇති කාලය grace period එකත් එක්ක අවුරුදු දාහතරහමාරයි. අදාළ විස්තර සියල්ලම ඇමුණුමෙහි සඳහන් වනවා.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

**Local Banks Funded Project**

| NO | PROJECT NAME | BANK | AMOUNT (Rs) | INTEREST RATE | TENOR |
|---|---|---|---|---|---|
| 1 | Rehabilitation of Ambepussa - Kurunegala - Trincomalee Road (A0006) from Dambulla to Habarana | Commercial Bank Of Ceylon PLC | 1,534,000,000.00 | 9% p.a. (Fixed) | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 2 | Rehabilitation of Galigamuwa - Ruwanwella - Karawanella Road from 0+000 to 29+210 km | Bank Of Ceylon | 2,472,357,070.00 | 9% p.a. (Nine per centum per annum) (Fixed) | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 3 | Rehabilitation of Polonnaruwa-Thambala-Sungawila-Somawathiya Road from 0+000 to 33+000 km | Bank Of Ceylon | 2,750,000,000.00 | 9% p.a. (Nine per centum per annum) (Fixed) | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 4 | Rehabilitation of Katuwana-Alupothdeniya-Panamura Road (23km) | People's Bank | 2,328,364,568.44 | 9% p.a (Fixed) | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 5 | Rehabilitation of Ibbagamuwa-Kumbukgate-Madagalla Road (34.19km) | People's Bank | 2,861,809,006.59 | 9% p.a (Fixed) | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 6 | Rehabilitation of Anuradhapura-Trincomalee Road (97.1km) | People's Bank | 7,995,681,521.84 | 9% p.a (reviewed annually) | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 7 | Rehabilitation of Narammala-Giriulla Road (16.03km) | People's Bank | 1,400,000,000.00 | 9% p.a (Fixed) | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 8 | Rehabilitation of Tennakumbura - Kandehandiya Road (20.4km) and Kandehandiya-Randenigala Road (13.6) | Bank Of Ceylon | 2,647,635,497.07 | 9% p.a. (Nine per centum per annum) (Fixed) | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 9 | Rehabilitation of Kesbawa - Kindelpitiya - Bandaragama Road (0+000-11+780km) and Waskaduwa -Bandaragama Road (0+000-12+070km) | Bank Of Ceylon | 576,523,048.66 | 9% p.a(Nine per centum per annum)- 1st year and thereafter to be reprised annually based on the market rates | 14 1/2 years including a grace period of 2 1/2 years |
| | | | 1,527,200,000.00 | 9% p.a (Nine per centum per annum) (Fixed) | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 10 | Rehabilitation of Mahaoya - Aralaganwila Road (0+000-24+000km) | Bank Of Ceylon | 2,363,892,396.05 | AWPLR+ 2.5% p.a. (To be reset bi-annually) | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 11 | Rehabilitation of Anamaduwa - Uswewa - Galgamuwa Road(39.1km) | National Savings Bank | 2,561,638,611.00 | 9% p.a (Nine per centum per annum) (Fixed) | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 12 | Rehabilitation of Galagedara - Horana Road B(123) (0+000-19+050km) | Commercial Bank Of Ceylon PLC | 1,393,613,193.00 | 11% p.a (Fixed) | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 13 | Rehabilitation of Bangadeniya-Andigama-Anamaduwa Road (38km) | Bank Of Ceylon | 2,570,953,030.00 | 9% p.a for the 1st year and thereafter AWPLR+ 2.5% p.a, subject to reset bi-annually | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 14 | Rehabilitation of Bibile - Ptikumbura - Namaloya - Inginiyagala Road (0+000-60+310 km) | Bank Of Ceylon | 3,397,000,000.00 | AWPLR. (To be reviewed bi-annually) | 14 1/2 years including a grace period of 2 1/2 years |
| | | Bank Of Ceylon | 1,208,000,000.00 | 9% p.a (Nine per centum per annum) (Fixed) | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 15 | Rehabilitation of Matara-Hakmana Road (B 275) (0+000-24+140 km) | DFCC Bank | 577,376,618.00 | AWPLR (26 weeks) per annum revised every 6 months | 14 1/2 years including a grace period of 2 1/2 years |
| | | Commercial Bank Of Ceylon PLC | 1,400,000,000.00 | 6 months AWPLR (Avarage Weighted Prime Lending Rate) p.a To be reviewed bi-annually. | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 16 | Rehabilitation of Toppuwa-Dankotuwa-Nattandiya-Madampe Road (B 419) (0+000-26.65 km) | Hatton National Bank PLC | 2.060,849,267.00 | AWPLR+ 1.4% (6 months Avarage Weighted Prime Lending Rate)p.a. To be reviewed half yearly on 1st January and 1st July each year | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 17 | Rehabilitation of Ampara-Uhana-Mahaoya Road(13+000-30+000km) | National Savings Bank | 1,503,629,563.00 | 6 months Avarage Weighted Prime Lending Rate (AWPLR) plus 1.5% per annum | 14 1/2 years including a grace period of 2 1/2 years (30 months) |
| 18 | Rehabilitation of Pannala to Kuliyapitiya Road (B356) from 5+000 km to 16+280 km and Kuliyapitiya to Hettipola Road (B243) from 0+000-15+690 km with a total road length of 26.97 km | Bank Of Ceylon | 1,995,000,000.00 | AWPLR+ 1.5% p.a. | 14 1/2 years including a grace period of 2 1/2 years |
| 19 | Improments of 10.5km from 33.50 to 44.00km and 2km from 57.00km to 59.00km on Naula-Elahara-Laggala-Pallegama-Hettipola Road (B312) and 25km from 20.00 to 45.00km on Hasalaka-Hadungamuwa Road (B484) | Hatton National Bank PLC | 3,223,310,033.00 | AWPLR+ 1.5% (6 months Average Weighted Prime Lending Rate) p.a. To be reviewed bi-annually and payable bi-annually | 14 1/2 years including a grace period of 2 1/2 years |

***[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This annex is also placed in the Library.]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඔය දුන් පිළිතුර අනුව මට අතුරු ප්‍රශ්න අහන්න අපහසුයි. මොකද, මා අහලා තිබෙන ප්‍රශ්නයට පිළිතුර ඇමුණුමේ සඳහන් වනවා කියලා කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ප්‍රශ්නයට පිළිතුර දෙන්න කලින් ඒ පිළිතුරට අදාළ ඇමුණුම අපට ලබා දෙන්න එතුමාට හැකියාවක් තිබෙනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

එහෙම අවස්ථාවක් නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් අහන්නේ. මම කොහොමද දැන් අතුරු ප්‍රශ්න අහන්නේ? අතුරු ප්‍රශ්න අහන්න විධියක් නැහැ නේ.

එහෙම නම් ගරු ඇමතිතුමනි, ඔබතුමා දීපු පිළිතුරට අනුව මම ප්‍රශ්නයක් අහනවා. ඔබතුමා කිව්වා, සියයට 9ක පොලී අනුපාතයකට ණය අරගෙන තිබෙන්නේ කියලා. මා ළඟ තිබෙනවා, පාරවල් හදන්න RDA එක පෙබරවාරි මාසයේ දී HNB බැංකුවෙන් ගත්ත ණය සම්බන්ධ විස්තර. පොලිය සියයට 14.42කට කියලා තමයි ඒ ගොල්ලෝ කියන්නේ. විචල්‍ය පොලියකට මේ ණය ගන්නේ. එතකොට ඇමතිතුමා කියන එක පිළිගන්න බැහැ, කිසිසේත්ම.[බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්නකෝ මගේ ප්‍රශ්නය අහනතුරු. විචල්‍ය පොලියකට ණය ගන්න කොට පොලිය ඉහළ පහළ යනවා. දැන් තිබෙන විධියට ඒ පොලිය සියයට 14.42යි. ඒකට සියයට 1.5ක අවදානම් පොලියකුත් එකතු කළාම සියයට 15.92ක පොලියක් හැදෙනවා. එතකොට ඔබතුමා කොහොමද කියන්නේ සියයට 9ක පොලියකට ණය ගන්නවා කියලා?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ඔබතුමාගේ අතුරු ප්‍රශ්නයට මම පිළිතුර දෙන්නම්. ඔබතුමා සඳහන් කරපු හැටන් නැෂනල් බැංකුවෙන් ණය ලබා ගත් ව්‍යාපෘතියේ නම කියනවා නම් මට ඒ කරුණ පැහැදිලි කරන්න පුළුවන්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මධ්‍යම පළාතේ - Central Province එකේ - පාරවල් හදන්න.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු මන්ත්‍රීතුමා, ඒ පළාත මධ්‍යම පළාත වෙන්න පුළුවන්. මම පැහැදිලිව කිව්වා, සියලු ව්‍යාපෘති 19යි කියලා. ඒ විස්තර සභාගත කරන්න පුළුවන්. ඒ ව්‍යාපෘති දහනවය තුළ HNB එකෙන් ණය මුදල් අරගෙන තිබෙන ව්‍යාපෘතියේ නම මොකක්ද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

හරි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මම අහන්නද? එහෙම නම් ඔබතුමා මට කියන්න, HNB එකෙන් අරගෙන තිබෙන ණය මොනවාද කියලා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

HNB එකෙන් ණය අරගෙන තිබෙන්නේ එක ව්‍යාපෘතියකට. ඒ දංකොටුව-නාත්තන්ඩිය-මාදම්පේ පාර සඳහා. ඒ ව්‍යාපෘතියට ගත් ණය සඳහා ඔබතුමා ඔය කියන පොලී අනුපාතයක් නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඔබතුමා කියන දේ මට පිළිගන්න බැහැ. මොකද, අපි ළඟ තිබෙන HNB එකෙන් ලබා දී තිබෙන තොරතුරු අනුව, පෙබරවාරි මාසයේ 22 වන දින තමයි ණය ලබා දීමේ තීරණය අරගෙන තිබෙන්නේ. ණය දීලා තිබෙන්නේ මාර්ග කිලෝමීටර් 37.5කට. කිලෝමීටරයකට රුපියල් මිලියන 85 ගණනේ තමයි ඒ ගොල්ලෝ ණය දීලා තිබෙන්නේ. ඒ ණය මුදල සඳහා පොලී අනුපාතය සියයට 15.92ක් වෙනවා, විචල්‍ය පොලියක් එක්ක. සියයට නවයේ දෙගුණයකට විතර ආසන්න පොලියක්.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ගරු සභාවට වග කීමෙන් යුතුව ප්‍රකාශ කරන්නේ අමාත්‍යාංශයෙන් ලබා දුන්න පිළිතුර. ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඒ දෙන පිළිතුර ඒ විධියටම මේ ගරු සභාවට ප්‍රකාශ කරන්නේ නැතුව, මාත් අදාළ කරුණු අධ්‍යයනය කරලා තමයි ප්‍රකාශ කරන්නේ.

සමහර විට බැංකුවලින් විවිධ කොන්ත්‍රාත් සමාගම්වල තොරතුරු ඉදිරිපත් කරන්න පුළුවන්. මම මේ දෙන පිළිතුර සභාගත කළා. ඔබතුමාට ප්‍රශ්නයක් තිබෙනවා නම් නැවත මගෙන් මේ ප්‍රශ්නය අහන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඇත්ත වශයෙන්ම HNB එක-

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු මන්ත්‍රීතුමා, වග කීමෙන් කියන්නේ. මගේ පිළිතුරේ තිබෙනවා, මාදම්පේ මාර්ගය වෙනුවෙන් මුදල් ලබා දී තිබෙන්නේ කිලෝමීටර් 26.65ක දුරටකට බව. ඒකයි හැටන් නැෂනල් බැංකුවත් එක්ක දැනට අපි අත්සන් කරලා තිබෙන ව්‍යාපෘති ගිවිසුම.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේ හැටන් නැෂනල් බැංකුවෙන් ගත්ත තොරතුරක් නොවෙයි. හැටන් නැෂනල් බැංකුවෙන් ලබා ගත් තොරතුරු මාධ්‍යවල පළ වෙලා තිබුණා. මම මේ තොරතුරු ගන්නේ මාධ්‍යයෙන්. මධ්‍යම පළාතේ පාරවල් කිලෝමීටර් 37.5ක් හදන්න රුපියල් බිලියන 3.2ක ණයක් ගැනීම පිළිබඳවයි මේ අහන්නේ. ඔබතුමා කියනනේ වෙනත් දෙයක්.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ඒ මාර්ගයට දීලා තිබෙන්නේ රුපියල් බිලියන 2.06යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සමඟ මෙම

කාරණය සම්බන්ධයෙන් වචන හුවමාරුවක් අවශ්‍ය නැහැ. මම අදාළ වාර්තාව සභාගත කරනවා. ඔබතුමා අවශ්‍ය නම් නැවත සොයලා බලා ප්‍රශ්නයක් අහන්න. එහෙම නැත්නම් උපදේශක කාරක සභාවේදී ඒ කාරණය පැහැදිලි කරන්නම්. ගරු මන්ත්‍රීතුමා, මම මේ ප්‍රශ්නය නැවත අහන්න කියන්නේ වග කීමක් ඇතිව පිළිතුරු දිය යුතු නිසායි. ඔබතුමා ඒ ප්‍රශ්නය නැවත නිවැරදිව අහන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මීට කලිනුත් කියලා තිබෙනවා මේ ප්‍රශ්නවලට අදාළ පිළිතුරු දිග නම් අපට-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ පිළිබඳව ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරලා පියවරක් ගැනීමට කටයුතු කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 10-3513/'13 - (1), ගරු වසන්ත අලුවිහාරේ මහතා.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 12-2593/'12 - (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති හයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පිරිවෙන් අධ්‍යාපනය : නවීන පහසුකම්
### பிரிவேனாக் கல்வி : நவீன வசதிகள்
### PIRIVENA EDUCATION : MODERN FACILITIES

2705/'12

13. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) පිරිවෙන් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රමවත් වැඩපිළිවෙළක් නොමැති බවට පරිවෙණාධිපති ස්වාමීන්වහන්සේලා චෝදනා කරන බවත්;

(ii) පිරිවෙන් ගුරුවරුන් පුහුණු වැඩසටහන්වලට සහභාගි කරවා ගැනීම සඳහා ක්‍රියාත්මක ක්‍රමවත් වැඩපිළිවෙළක් නොමැති බවත්;

(iii) එම නිසා පිරිවෙන් අධ්‍යාපනය ලබන අයට නව දැනුම ලැබීමේ අවස්ථාව අහිමිවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මෙම තත්ත්වය මඟහැරවීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) භික්ෂු අධ්‍යාපනය නවීන ලෝකය සමඟ බද්ධ කිරීම සඳහා ඉංග්‍රීසි සහ පරිගණක දැනුම වැදගත්වන බවත්;

(ii) පිරිවෙන් තුළ දැනට මේ සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති බවත්;

(iii) එම තත්ත්වය යටතේ ගිහි සහ පැවිදි පිරිවෙන් සිසුන්ගේ දැනුම නූතන ලෝකයට ගැලපෙන ආකාරයට සංවර්ධනය නොවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) ගිහි සහ පැවිදි පිරිවෙන් සිසුන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා පරිගනක විද්‍යාගාර පහසුකම් ඉංග්‍රීසි භාෂා අධ්‍යයන පහසුකම් ලබාදීම සඳහා කඩිනමින් කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பிரிவேனாக்களுக்கு ஆசிரியர்களை ஆட்சேர்ப்பு செய்யும் முறைசார்ந்ததொரு வேலைத்திட்டம் இல்லையென பிரிவேனாக்களின் தலைமைத் தேரர்கள் குற்றஞ்சாட்டுகின்றார்கள் என்பதையும்;

(ii) பிரிவேனாக்களின் ஆசிரியர்களை பயிற்சி நிகழ்ச்சித்திட்டங்களில் பங்கேற்கச் செய்வதற்காக அமுல்படுத்தப்படுகின்ற முறைசார்ந்ததொரு திட்டம் இல்லையென்பதையும்;

(iii) ஆதலால், பிரிவேனாவில் கல்வி பெறுபவர்களுக்கு புதிய அறிவினை பெற்றுக்கொள்வதற்கான வாய்ப்புகள் கிடைக்காமல் போகின்றன என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், இந்நிலைமையைப் போக்குவதற்கு பொருத்தமான செயல்முறையொன்றை தயாரிப்பாரா என்பதை அவர் குறிப்பிடுவாரா?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(இ) (i) பிக்குமார் கல்வியை நவீன உலகுடன் இணைந்ததாக ஆக்குவதற்கு ஆங்கிலம் மற்றும் கணினிக் கல்வி முக்கியமானதென்பதையும்;

(ii) பிரிவேனாக்களில் தற்போது இதற்குப் போதியளவு வசதிகள் இல்லையென்பதையும்;

(iii) இந்நிலைமையின் கீழ் இல்லற மற்றும் துறவற மாணவர்களது அறிவு நவீன உலகிற்கு ஏற்றாற் போல் முன்னேற்றம் அடைவதில்லை என்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஈ) இல்லற மற்றும் துறவற பிரிவேனா மாணவர்களின் அறிவினை விருத்திசெய்யும்பொருட்டு கணினி ஆய்வு கூட வசதிகள் மற்றும் ஆங்கில மொழிக் கல்விக்கான வசதிகளைப் பெற்றுக்கொடுப்பதற்குத் துரிதமாக நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) allegations have been levelled by the Buddhist monks holding the principal posts of 'Pirivenas' to the effect that there is no systematic procedure for the recruitment of teachers for Pirivenas;

(ii) a systematic procedure has not been implemented to ensure participation of the Pirivena teachers in training programmes; and

(iii) as a result, those who are receiving education from the Pirivenas are losing their opportunity to obtain new knowledge?

(b) If so, will he state whether a suitable methodology to remedy this situation will be prepared?

(c) Will he admit that -

(i) knowledge of English and computer is necessary to connect bhikku education with the modern world;

(ii) Pirivenas do not have sufficient facilities for this purpose at present; and

(iii) under the aforesaid conditions, the knowledge of the clergy and lay students does not develop to suit the modern world?

(d) Will he inform this House whether action will be taken expeditiously to provide computer laboratory facilities and facilities to study English in order to enhance the knowledge of lay and bhikku pirivena students?

(e) If not, why?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට හා එහි නියෝග මාලාවන්ට අනුකූලව පරිවේණාචාර්යවරුන් සහ පරිවේණාචාර්ය පත්වීම් විධිමත් පරිදි සිදු කෙරේ.

අදාළ පිරිවෙන්හි කෘත්‍යාධිකාරි හිමියන් විසින් තම ඉල්ලීම ඇතුළත් ගුරු යෝජනාවක් ගුරු යෝජනා බාර ගන්නා කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ඉන්පසු අදාළ ගුරුවරයාගේ අධ්‍යාපන සුදුසුකම් හා අදාළ පිරිවෙනට ගුරුවරයකු ලබා දීමේදී පැවතිය යුතු සුදුසුකම් ද පරීක්ෂා කර එම සුදුසුකම් සම්පූර්ණ කොට ඇත්නම් අදාළ ගුරු යෝජනාව පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ. පිරිවෙන් අධ්‍යාපන මණ්ඩල සාමාජිකයන්ගේ අධීක්ෂණයෙන් පසුව අනුමත වූවන්ට පරිවේණාචාර්ය පත්වීම් ප්‍රදානය කෙරේ.

මේක තමයි පනතට අනුව තිබෙන වැඩ පිළිවෙළ.

(ii) පරිවේණාචාර්යවරුන් පුහුණු කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතී.

ඒ වැඩ පිළිවෙළ මේ වන විට ක්‍රියාත්මක වන්නේ පහත සඳහන් ආකාරයටයි.

* උපාධිධාරී ගුරුවරුන් සඳහා ලබා දෙන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පුහුණුව (බාහිර/ අභ්‍යන්තර)

* උපාධිධාරින් නොවන පරිවේණාචාර්යවරුන් සඳහා ලබා දෙන ගුරු අභ්‍යාස විද්‍යාල පුහුණුව (බාහිර/අභ්‍යන්තර)

* උපාධි/පශ්චාත් උපාධි, පුහුණු/ නුපුහුණු සියලු පරිවේණාචාර්යවරුන් සඳහා වාර්ෂිකව කොට්ඨාස මට්ටමින් පැවැත්වෙන විෂය පුහුණු, විෂය සමගාමී, විෂය බාහිර වැඩසටහන් ආදිය ඉන් කිහිපයකි.

(iii) උක්ත පුහුණු වැඩසටහන් හරහා වෘත්තීමය වශයෙන් ප්‍රවීණත්වය පත්වන පරිවේණාචාර්යවරයා ඒ ඔස්සේ තම ශිෂ්‍යයන් නවීන ලෝකයට ගැළපෙන පරිදි නව දැනුමෙන් සන්නද්ධ පිරිසක් බවට පත් කිරීමේ කාර්යයට උපකාරී වෙයි.

ඒ හැරුණු විට විශේෂයෙන් දෙමළ භාෂාවෙන් පත පොත ඉගැන්වීම් හා පුහුණුවීම් පාඨමාලා රාශියක් පිරිවෙන් අංශය තුළ අලුතින් ආරම්භ කර ඇති බවත් දන්වන්නට කැමැතියි.

(ආ) අදාළ නොවේ.

පිරිවෙන් අංශයම ප්‍රතිසංවිධානය කිරීම සඳහා ක්‍රමවේද රාශියක් සකසමින් තිබෙනවා.

(ඇ) (i), (ii), (iii)

ඔව්.

ප්‍රමාණවත් පහසුකම් ලබා දීම සඳහා අවශ්‍ය සියලු වැඩ පිළිවෙළවල් සකස් කරමින් සිටී.

(ඇ) පිරිවෙන් අධ්‍යාපන ආයතනය තුළ පරිගණක භාවිතය හා පිරිවෙන් ශිෂ්‍යයන් තුළ ඉංග්‍රීසි ඇතුළු විදේශ භාෂාවන්හි ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

(ඉ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය.

ගරු ඇමතිතුමා සඳහන් කරන්නට යෙදුණා, ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රමවත් වැඩ පිළිවෙළක් තිබෙනවා කියලා. ප්‍රශ්නය තිබෙන්නේ පරිවේණාධිපති ස්වාමීන්වහන්සේගේ මූලිකත්වයෙන් යම් ගුරුවරයෙක් ගත්තොත්, ඔබතුමා සඳහන් කරපු ක්‍රමවේදය ඔස්සේ යද්දී, ඒ ගුරුවරයා ස්ථිර ගුරුවරයකු බවට පත් වෙන්න සමහර වෙලාවට වසරකට ආසන්න කාලයක් ගත වෙනවා. සමහර වෙලාවට ඊටත් වඩා කාලයක් යනවා. ඒ තුළ ඒ ගුරුවරයාට වැටුප් ලැබීමේදී යම් අඩු පාඩුවක් සිදු වනවා. මොකද, arrears එක හැදිලා එන්න සෑහෙන්න කාලයක් යනවා. ඒ නිසා ඔය කියන සුදුසුකම් පරීක්ෂා කරන ගමන්, මේ ගුරුවරයා ස්ථිර කරන්නට ගන්නා කාලයේ යම් කිසි අඩු කිරීමක් කරන්නත්, ඒ කටයුත්ත කාර්යක්ෂම කරන්නත් රේඛීය අමාත්‍යාංශයට යමක් කරන්න බැරිද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරනවා වාගේම, ගිහියන් වන අප මේ පිරිවෙන් ක්‍රමය පිළිබඳව බොහොම වග කීමෙනුත්, අවබෝධයකිනුත් විවිධ ප්‍රශ්න නැඟිය යුතු වනවා. මොකද, පිරිවෙන් පාලක සභාවක් තිබෙනවා. කැලණිය විශ්වවිද්‍යාලයේ කුලපති අතිපූජ්‍ය ගෞරවාර්හ වැලමිටියාවේ අපේ කුසලධම්ම හාමුදුරුවෝත්, මහාචාර්යවරුන් සහ ඒ විෂයය පිළිබඳ ප්‍රවීණ අයගෙනුත් සමන්විත පිරිවෙන් පාලක සභාවක් තිබෙනවා. අධ්‍යාපන ඇමතිවරයා ඒ පාලක සභාවේ එක සාමාජිකයෙක් පමණයි. මා මේ අමාත්‍ය ධුරයට පත් වීමෙන් පසු සෑම පාලක සභා රැස්වීමකටම පෞද්ගලිකව සහභාගි වෙලා තිබෙනවා. අධ්‍යාපන ඉතිහාසයේදී මහා විහාරය, අභයගිරිය යනාදී පිරිවෙන් තමයි අපේ රටට දැනුම ලබා දීලා තිබෙන්නේ. මහ පිරිවෙන් දෙක වන විද්‍යෝදය පිරිවෙනටයි, විද්‍යාලංකාර පිරිවෙනටයි වග කීමක් පවරා තිබෙනවා, මේ පිරිවෙන් හත්සිය ගණනේම නායක ස්වාමීන් වහන්සේලා, පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා, කෘත්‍යාධිකාරි ස්වාමීන් වහන්සේලා කැඳවලා, අද්‍යතන ලෝකයට ගැළපෙන ලෙස පාලි, සංස්කෘත, බෞද්ධ දර්ශනය හා වෙනත් දේ හැදෑරීම පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කර දෙන්න කියලා. ඒ සකස් කරපු සමහර කරුණු අනුව පිරිවෙන් පනත වෙනස් කරන්න නීතිපතිතුමා වෙතට ඒ කෙටුම්පත යවලා තිබෙනවා. භික්ෂු අධ්‍යාපනයේ ඒ ක්‍රමවේදය කෙසේද යන්න අවශ්‍යයෙන්ම තීරණය කළ යුත්තේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නොවෙයි. ගෞරවනීය ස්වාමීන් වහන්සේලා හා පිරිවෙන් අංශය විසින් සකසා දෙන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ වග කීම අධ්‍යාපන අමාත්‍යාංශය දැරිය යුතුයි කියලා තමයි මා විශ්වාස කරන්නේ. ඒ නිසා අප ඒ වග කීම පවරා තිබෙනවා, මහා නායක හිමිවරු ඇතුළු පිරිවෙන් පාලක මණ්ඩලයට වඩාම උචිත දේ නිර්දේශ කරන්න. ඒ සඳහා අතිගරු ජනාධිපතිතුමා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා වශයෙන් මූල්‍යමය, භෞතික සම්පත් හා මානව සම්පත් නිර්මාණය කර ගැනීම සඳහා දෙන්න පුළුවන් උපරිම ශක්තිය ලබා දෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමාගෙන් මා මේ කාරණය පිළිබඳව දැන ගන්නට කැමැතියි. කිසිම සැකයක් හෝ තර්කයක් නැහැ, ධර්මය සහ විනය සම්බන්ධ භික්ෂු අධ්‍යාපනයේ පිරිවෙන්වල ඒ කාර්ය භාරය පිළිබඳව. හැබැයි ඔබතුමාත්, මමත්, අපි කවුරුත් දන්නා දෙයක් තමයි පිරිවෙන්වල ගිහි ශිෂ්‍යයෝත් සැලකිය යුතු ප්‍රමාණයක් සිටින බව. ඔබතුමාගේ නව අධ්‍යාපන ප්‍රතිපත්තිය යටතේ ඇති කරන මහින්දෝදය පාසල්වල ගණිතාගාර, පරිගණක විද්‍යාගාර, භාෂාගාර තිබෙනවා. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, බුද්ධ ශාසන හා ආගමික කටයුතු භාර අගමැතිතුමාත් මේ වෙලාවේ මේ සභාවේ සිටින නිසා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, දැන් පිරිවෙන්වල අධ්‍යාපනය ලබන පැවිදි භික්ෂූන් වහන්සේලා වාගේම ගිහි ශිෂ්‍යයන්ටත් ගණිතය, ඉංග්‍රීසි හා පරිගණක විෂය පිළිබඳව දැනුම ලබා ගන්නා ගණිතාගාර, ඒ වාගේම භාෂාගාරවල ආභාසයත්, ඒ පහසුකම් පරිහරණය කිරීමේ හැකියාවත් ලැබෙන ආකාරයට මේ සම්පත් පිරිවෙන්වලට ලබා දෙන්න අමාත්‍යාංශයට තිබෙන දැක්ම මොකක්ද කියලා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පිරිවෙන් පාලක සභාව තුළ ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයට තිබෙන දැක්ම පිළිබඳවත් සංවාදයක් තිබෙනවා. පරිගණක අධ්‍යාපනය, භාෂා අධ්‍යාපනය පිළිබඳව ලබා දෙන නිර්දේශ අනුව ඒ පහසුකම් ටික තිබෙන්නේ පිරිවෙන්වල නොවෙයි. පිරිවෙන් විද්‍යායතන තිබෙනවා. ඒ පිරිවෙන් විද්‍යායතනවල ගිහි ශිෂ්‍යයෝ ඉගෙනුම ලබනවා. විශාල සේවාවක් ඒවායෙන් වෙනවා. මොකද, පාසල් හැර යන ශිෂ්‍යයන්ට; ඒ වාගේම වෙනත් පාසල්වලට භාර නොගන්නා ශිෂ්‍යයන්ට යම් කිසි හොඳ අධ්‍යාපනයක් ලබා දීම සඳහා ඒ පිරිවෙන් විද්‍යායතන සෑහෙන කාර්ය භාරයක් ඉෂ්ට කරනවා. ඒක නිසා ඒ විද්‍යායතනවලටත් ඉහතින් සඳහන් කළ විෂය නිර්දේශ ලැබුණාට පස්සේ මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරවල තිබෙන පහසුකම් ලබා දීම සඳහා අපි කටයුතු කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

දැන් අපේ රටේ තිබෙනවා, ඉංග්‍රීසි මාධ්‍ය රජයේ පාසල්. ඇතැම් පිරිවෙන් විද්‍යායතන ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වා ගෙන යන්න ලැදියාව දක්වනවා. උදාහරණයක් විධියට මහනුවර, අස්ගිරි පිරිවෙන. ඔබතුමා එය දන්නවා. අස්ගිරි පිරිවෙනේ පූර්ණ කාලීන ඉංග්‍රීසි මාධ්‍ය පන්ති තිබෙනවා. ඒක හරිම වැදගත්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්න

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අපේ බුද්ධ ධර්මය ජාත්‍යන්තරයට ගෙන යාමට භික්ෂූන් වහන්සේලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගැනීම වැදගත්. මෙතැන ප්‍රශ්න දෙකක් තිබෙනවා. මේ ඉංග්‍රීසි මාධ්‍ය පිරිවෙන්වලට විෂය නිර්දේශ සහ ප්‍රශ්න පත්තර සකස් කර ගැනීමටත්, විභාගය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වීම පිළිබඳවත්, පෙළ පොත් ලබා ගැනීම පිළිබඳවත් ගැටලු තිබෙනවා. සමහර වෙලාවට ඉන්දියාවෙන් පොත් photocopy කරලා ගන්නේ. ඒ නිසා පිරිවෙන් සම්බන්ධ අනෙකුත් වගකීම් දරන අයත් එක්ක එකතු වෙලා අමාත්‍යාංශයට මේ සම්බන්ධයෙන් කරන්න පුළුවන් මැදිහත්වීම මොකක්ද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
අලුතෙන් ආරම්භ වන කොට ඒ ගැටලු තිබෙනවා. ඒවා ගෞරවනීය පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා විසින් බොහොම අපූරුවට විසඳා ගෙන තිබෙනවා. අස්ගිරියේ පමණක් නොවෙයි, කැලණිය රජමහා විහාරයේ නායක හාමුදුරුවෝත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිරිවෙනක් පටන් අරගෙන තිබෙනවා. ඉත්තෑපානේ ධම්මාලංකාර හාමුදුරුවෝ, සෝභිත හාමුදුරුවෝ ඇතුළු අනෙක් ගෞරවනීය ස්වාමීන් වහන්සේලාත් අප සමඟ මේ ගැන සාකච්ඡා කරනවා. තවම එකම ඉංග්‍රීසි මාධ්‍ය පිරිවෙනක්වත් රජයෙන් ආරම්භ කරලා නැහැ. දැනට අස්ගිරි විහාරය මඟිනුත්, කැලණිය රජමහා විහාරය මඟිනුත් ඉංග්‍රීසි මාධ්‍ය පිරිවෙනක් පටන් අරගෙන තිබෙනවා.

අපි බලාපොරොත්තු වෙනවා, රජය මඟිනුත් ඉංග්‍රීසි මාධ්‍ය පිරිවෙන් ආරම්භ කරන්න. එතකොට ඒ විෂය නිර්දේශ හා අනෙක් වගකීම් රජය දරනවා. දැනට පිරිවෙන විසින් ඒ වගකීම ඉෂ්ට කර ගෙන යනවා. ඒකට අපි සියලු දෙනාම ගරු කළ යුතුයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 14 -2872/'12- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නය මම අහනවා. [බාධා කිරීමක්] කඩුවෙල කොණ්ඩ කුරුල්ලා හිටියා නේ. කෝ, ගීත ගායනා කරන කුරුල්ලා?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන ඒවා මට තේරෙන්නේ නැහැ. ඔබතුමා මේ දවස්වල විවිධ දේවල් කියනවා. ඔබතුමාගේ ගී අහන්න අපි කැමැතියි. වටිනා කට හඬක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## හම්බන්තොට පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල : විස්තර

அம்பாந்தோட்டை பொதுநலவாய விளையாட்டுப் போட்டிகள்: விபரம்
COMMONWEALTH GAMES IN HAMBANTOTA : DETAILS

2143/'11

**2. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
( The Hon. John Amaratunga on behalf of the Hon. Ravi Karunanayake )
ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) හම්බන්තොට පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා මුදල් යෙදවීමට රජයට අරමුදල් ලබා දුන් පෞද්ගලික අංශයේ පුද්ගලයින්ගේ නම් කවරේද;

(ii) ඉහත ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට සහයෝගය ලබා ගැනීම සඳහා මෙරටට ගෙන්වා ගන්නා ලද පුද්ගලයින් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට සහයෝගය ඉල්ලා සිටීම සඳහා විදේශගතවූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඒ වෙනුවෙන් දරන ලද මුළු පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2011 නොවැම්බර් මාසයේ සෙන්ට් කිට්ස් නගරයට ගිය පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ ගිය පුද්ගලයින්ගේ නම් කවරේද;

(iii) එහි යාමට සහ ආපසු ඒමට දැරූ මුළු වියදම කොපමණද;

(iv) එම කණ්ඩායම සඳහා ලබා ගත් කුලී ගුවන් යානා සඳහා දැරූ වියදම කොපමණද;

(v) ජයග්‍රහණය පිළිබඳ එපමණ විශ්වාසය තබා තිබියදී ශ්‍රී ලංකාවට පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා සත්කාරක රට ලෙස කටයුතු කිරීමේ අවස්ථාව අහිමි වූයේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாந்தோட்டையில் பொதுநலவாய விளை யாட்டுப் போட்டிகளுக்கு நிதியிடுவதற்கு அரசாங்கத்திற்கு நிதிகள் வழங்கிய தனியார் துறை நபர்களின் பெயர்களையும்;

(ii) இலங்கையில் மேற்கூறப்பட்ட விளையாட்டுப் போட்டிகளை நடத்துவதற்கு அவர்களது

ஒத்துழைப்பினைப் பெற்றுக்கொள்வதற்கு இங்கு வரவழைக்கப்பட்ட நபர்களின் எண்ணிக்கை மற்றும் பெயர்களையும்

அவர் கூறுவாரா?

(ஆ) (i) இலங்கைக்கான அவர்களது ஒத்துழைப்பினைப் பெற்றுக்கொள்வதற்கு வெளிநாட்டிற்குச் சென்ற நபர்களின் எண்ணிக்கையையும்;

(ii) சென்றவர்களின் பெயர்களையும்;

(iii) ஏற்பட்ட மொத்தச் செலவினத்தையும்

அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(இ) (i) 2011 நவம்பர் மாதத்தில் புனித கிற்ஸ் நகரிற்குச் சென்ற நபர்களின் எண்ணிக்கையையும்;

(ii) சென்ற நபர்களின் பெயர்களையும்;

(iii) மீள்வருகைப் பயணத்திற்கான மொத்தச் செலவினத்தையும்;

(iv) குறிப்பிடப்பட்ட பிரத்தியேக வாடகைக்கு அமர்த்திய விமானத்திற்கான செலவினத்தையும்;

(v) இலங்கை பொதுநலவாய விளையாட்டுப் போட்டிகளை நடத்துவது தொடர்பில் வெற்றி பெறுவது நிச்சயம் என பெருமளவு நம்பிக்கை யுடன் காணப்பட்ட பின்னர், அதனை எவ்வாறு இழந்தது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Sports:

(a) Will he state -

(i) the names of the private sector people who gave funds to the Government to finance the Commonwealth Games in Hambantota; and

(ii) the number and the names of the persons who were brought here to solicit their support to hold the aforesaid Games in Sri Lanka?

(b) Will he inform this House -

(i) the number of persons went overseas to solicit their support to Sri Lanka;

(ii) the names of them; and

(iii) the total cost incurred?

(b) Will he also state -

(i) the number of persons went to St. Kitts in November 2011 ;

(ii) the names of the persons went;

(iii) the total cost for the return trip;

(iv) the cost of the charter flight mentioned; and

(v) as to how Sri Lanka lost the hosting of Commonwealth Games after being so confident of winning?

(c) If not, why?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අදාළ පිළිතුර වාචිකව ලබා දෙනු ඇත.

(ii) රටවල් 70 ක නියෝජිතයන් සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සංගමයෙන් පැමිණි ඇගයීම් කොමිසමේ සාමාජිකයන් ද ඇතුළුව පුද්ගලයින් 58 දෙනෙකුගෙන් සමන්විතය.

ඔවුන්ගේ නම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| Shared Rao, | George Belrose, | Fortuna Belrose, |
| Ian Emmerson OBE., | M Jegathesan, | John Hoskins, |
| Abdoulie Touray, | Louise Livingstone Martin, | Gideon Napoleon Sam, |
| Eraskine Sinclair Simsons, | Micheal Hooper, | Andrew Peter Ryan, |
| Mclatchey Craig Gordon, | Ioannis Minis, | Craig Arthur Penzler, |
| Holding Antony David, | Darren Hughes, | Justice Mokebe Maketela, |

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

| | | |
|---|---|---|
| Antonio Gopal, | Rajasingham Ratnasingam, | Eu Swee Lan (Catherine), |
| Mohammed Anisur Rahman, | Ibrahim Ismail, | Fathimath Rasheeda, |
| Syed Arif Hasan, | Rajeev Mahta, | Maru Talagi, |
| Don Stockins, | Rosie Blake, | Tebataua Karotu, |
| Alan Tano Puleosi, | Jonathan Snell, | Niko Palamo, |
| Teake Manatu, | Tapasu Leung Wai, | Pres-Nimes Ekwona, |
| Carmelita Donald, | Graham Osborne, | Bruce Robertson, |
| Brian Lewis, | Negroes Malealea Kgosietsile, | Ahosivi Kaitapu, |
| Soane Hupeto Kaitapu, | Robert Toller, | Fred Maetoloa, |
| Althea Hodge, | Joel Raynne, | Wilton Miller, |
| Steve Stoute, | Ephraim Penn, | John Charles, |
| Lucy Steele, | Neville McCook, | Bruce Farara, |
| James Hanley, | Teddy Matthews, | Trevor Bailey, |
| Rita Gardiner. | | |

(ආ) (i) 31 දෙනෙකි.

(ii) ඔවුන්ගේ නම් පහත පරිදි වේ.

එච්.ප්‍රනාන්දු, පී.පින්නවල, එම්.ද සිල්වා, බී.ජයසේකර,එච්.ද සිල්වා, ආර්.ජයමහ, ගරු එම්.අලුත්ගමගේ, ගරු කේ.රඹුක්වැල්ල, ගරු එන්.රාජපක්ෂ, ඒ.එන්.කබ්රාල්, ඒ.කොස්වත්ත, එන්.ආටිගල, ඒ.අමරසේකර, ජේ.රත්නායක, ඒ.ප්‍රනාන්දු, ටී.මුතලිෆ්, එස්.රත්නායක, ආර්.මීගස්මුල්ල, එන්.ගොඩහේවා, පී.ප්‍රනාන්දු, යූ.සෙනෙවිරත්න, ආර්. ද සිල්වා, ආර්. ද මෙල්, වී.වනිගසේකර, ඩී.පෙරේරා, එන්.සෙල්වනායගම්, ඊ ද සිල්වා, කේ.හීන්ගම, ඒ.සෙනෙවිරත්න, එම්.ප්‍රනාන්දු, එන්.තෙන්නකෝන්.

(iii) දරණ ලද මුළු පිරිවැය රුපියල් 40,222,516(රු.මිලියන 40.2)

(ඇ) (i) 148 දෙනෙකි.

(ii) ඔවුන්ගේ නම් පහත පරිදි වේ.

**කමිටු සාමාජිකයන් / නිලධාරින්**

ගරු එම්.අලුත්ගමගේ, ඒ.වී.අලුත්ගමගේ, ඒ.එන්.කබ්රාල්, ගරු එන්.රාජපක්ෂ, එන්.ආටිගල, යූ.සෙනෙවිරත්න, ආර් ද සිල්වා, එච්.ප්‍රනාන්දු, එම් ද සිල්වා, ආර්.ජයමහ, ජේ.රත්නායක, ඊ ද සිල්වා, ඒ.අමරසේකර, එච් ද සිල්වා, ආර්.එම්.බී.මීගස්මුල්ල, පී.ප්‍රනාන්දු, පී.පින්නවල, වී.වනිගසේකර, එන්.සෙල්වනායගම්, ඩී.අමරසිංහ, ඩී.පෙරේරා, ඒ.කොස්වත්ත, ආර් ද මෙල්, එස්.මුදලිගේ, පී.ජයවර්ධන, ඒ.ප්‍රනාන්දු, කේ.දසනායක, ටී.එම්.ඉසෙඩ්.මුතාලිෆ්, එම්.ප්‍රනාන්දු, කේ.අඹගහවිට, අයි.රූපසිංහ, පී.එස්.යාපා,ඒ.සෙනෙවිරත්න, ඒ.දේවසුරේන්ද්‍ර, ජේ.පෙරුමාල්, එන්.පෙරේරා, ජේ.අමරතුංග, ආර්.විජේරත්න.

**ක්‍රීඩා අමාත්‍යාංශ නිලධාරින්**

ආර්.ජයකොඩි, පී.ඩබ්.පී.සමරතුංග, ඒ.වීරසිංහ, එස්.ජයලාල්, ඒන්.මිත්‍රරත්න, අයි.පී.විජේරත්න, ඩී.සේනානායක, කේ.ජී.ඥාණපාල, බී.ඩී.එල්.කුලරත්න, එච්.අබේකෝන්.

**ජාතික ඔලිම්පික් කමිටු නිලධාරින්**

පී.දල්පදාදු, ආර්.ප්‍රනාන්දු, බී.ඉද්දමල්ගොඩ.

**අනෙකුත් රාජ්‍ය නිලධාරින්**

ඩී.පෙරේරා (EDB) , ඩබ්.මන්ත්‍රීපාල (EDB), එස්.කුමාර (ආගමන පාලක), එස්.ඩී.පී.ජේ.ධම්පේගම (නියෝජ්‍ය මිනුම්පති ), ජේ.බාලසූරිය(ප්‍රවාහන අමාත්‍යාංශය), එච්.රත්නවීර(සහකාර දිස්ත්‍රික් ලේකම්- හම්බන්තොට), එස්.රත්නායක (සම්බන්ධීකරණ නිලධාරි)

**ජාත්‍යන්තර උපදේශකවරුන්**

A Pascoe, P Mann, H Delany, M D Smith, M Munro.

**මළල ක්‍රීඩකයින් සහ වෙනත් ක්‍රීඩකයින්**

එස්.කුලවංශ, ඒ ද සිල්වා, එම්.මුරලිදරන්, ඒ.එන්.රත්නසිරි, එම්.අබේසිංහ, ඒ.චතුභාෂිණි, එන්.පෙරේරා.

**සිද්ධි සංවිධායකවරුන්**

ඒ.ආකර්ෂා, එස්.සිරිවර්ධන (සිද්ධි සම්ප්‍රධානී), වී.එම්.ජයතිලක, බී.බරකත්(Chaperones), ආර්.වීරරත්න, එන්.ජයසිරිය, ඒ ද ෆොන්සේකා, එන්.ජයසූරිය, ඩී.ගුණවර්ධන, එන්.පෙරේරා, එල්.පෙරේරා, කේ.අබේවික්‍රම, කේ.පෙරේරා, එච්.ජයතිලක, එම්.ආර්.කුමාර, එස්.සෙනරත්, ඩී.කල්දේරා, පී.පෙරේරා, කේ.දිලිප්, පී.බටන්ගල, ඒ.ජී.රුවිකා, පී.නලීන්, එච්.චාමර (රෙඩ් වෙරි පුද්ගලික සමාගම), අයි.එරන්දි, එස්.පෙරේරා, එම්.සෙනෙවිරත්න, ඉසෙඩ් මොහිදීන් (සිද්ධි සම්බන්ධීකාරක), කේ.බස්නායක (හම්බන්තොට 2018 පුද්ගලික සමාගම- කාර්ය මණ්ඩලය), ටී ද සිල්වා (තාක්ෂණික විශේෂඥ), කේ.ජයසේකර (තාක්ෂණික විශේෂඥ), Goh Hak Jim (සහකාර ගෘහනිර්මාණ ශිල්පී), Tey Kok Wing (සහකාර ගෘහනිර්මාණ ශිල්පී), ආර්.ලියනපතිරන (ඡායාරූප ශිල්පී), ඩබ්. වැලිවත්ත, එස්. දේශප්‍රිය (සැපයුම් සහායක ), කේ. චන්ද්‍රසේකර(ආරක්ෂක නිලධාරී).

**මාධ්‍ය නිලධාරීන්**

ඩී. වීරවංශ, එස්. එන්. ගනේවත්ත, එස්.සිරිමාන්න, පී.කේ. දොඩංගොඩගේ,ඩී.ගුණරත්න, එස්.ඩයස්, එම්.පී.එස්.දේශප්‍රිය, ඒ.ගුණතිලක.

**ශ්‍රී ලංකා එයාර්ලයින් ආයතන නිලධාරින්**

එස්.රත්නායක, යූ.වර්ණකුල, පී.ධර්මප්‍රිය, ජේ.කුරුනේරු, සී ද සිල්වා, සී. රොද්‍රිගු, එස්.කුලරත්න, ඒ.අබේතිස්ස, ටී.කොතලාවල.

**නර්තන කණ්ඩායම**

එන්.අමරසිංහ, ආර්.බුද්ධවත්ත, ඕ.රාජකරුණා, පී.අවන්ති, ඒ.කණිෂ්ක, වී.සිල්වා, ඒ.ශෂිකලා, එන්.ප්‍රසාදි, එම්.ප්‍රාර්ථනා, ඒ.සිරේකා, ටී.ඩයස්, සී.මහවත්තගේ, එස්.කරුණාරත්න, පී.රූපතිලක, එස්.රූපතිලක, එච්.මීතොටගේ, එස්.ප්‍රියදර්ශන, යූ.වීරසේකර.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

සිනමන් ග්‍රෑන්ඩ් ආයතනයේ සුපවේදී කණ්ඩායම

ශ්‍රී.නානායක්කාර, කේ.ඩී.ප්‍රියන්කර, එස්.වීරක්කොඩි, සී.දිසානායක, ආර්.බාලසූරිය, ජී.සමීර, එස්.පෙරේරා.

(iii) රුපියල් 57,954,118 (රු.මිලියන 57.9) කි. (ඊට අමතරව, සමහර ව්‍යාපාරිකයින් සහ රාජ්‍ය නිලධාරීන් රුපියල් 10,184,300 (රු.මිලියන 10.2) ක වියදම් තමන් විසින්ම දරා ගන්නා ලදී.)

(iv) කුලී ගුවන් යානා සඳහා දැරූ වියදම රුපියල් 58,105,625 (රු.මිලියන 58.1) කි.

(v) ගෝල්ඩ් කොස්ට් සහ හම්බන්තොට යන නගර දෙකම ඡන්ද හිමි රටවල නියෝජිතයින් හට කරුණු ඉදිරිපත් කරමින් ඔවුන් වෙත තම නගරවල පවතින සහ නිම කිරීමට යෝජිත පහසුකම් නිරීක්ෂණය කිරීමට ඉඩකඩ ලබා දෙමින් ඡන්දයට මුහුණ දුන්හ.

ශ්‍රී ලංකාව,2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල හම්බන්තොට පැවැත්වීම සඳහා ඉතා ඉහළ වෘත්තීය මට්ටමක පැවතුණු සත්කාරක ලංසු පොතක්ද ඉතා ඉහළ මට්ටමේ පරිමාණ ආකෘතියක්ද සකස් කරමින්, ඇගයීම් කමිටුවේ සෑම ප්‍රශ්නයකටම පිළිතුරු දෙන ආකාරයකින් කටයුතු කරන ලදී. තවද, පොදු රාජ්‍ය මණ්ඩලයේ ඇගයීම් කමිටු වාර්තාව අනුව, හම්බන්තොට නගරය එම සත්කාරක ලංසුවට අනුව යෝග්‍ය හා සුදුසු බව තීරණය කරන ලදී.

එසේ වුවත්, ඡන්දයේදී හම්බන්තොට නගරයට ඡන්ද 27 ක් ද, ඕස්ට්‍රේලියාවේ ඉතා ඉහළ පෙළේ නගරයක් වන ගෝල්ඩ් කොස්ට් සඳහා ඡන්ද 42 ක් ද ඡන්දදායකයන් ලබා දෙන ලදී.

(ඈ) පැන නොනඟී.

## ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය: අධ්‍යක්ෂ ජනරාල්වරයා

அகலவத்தை தேசிய மொழிக் கல்வி, பயிற்சி நிறுவகம் : பணிப்பாளர் நாயகம்

NATIONAL INSTITUTE OF LANGUAGE EDUCATION AND TRAINING : DIRECTOR-GENERAL

3019/'12

**6. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු තිස්ස අත්තනායක මහතා වෙනුවට)**

(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க சார்பாக)

(The Hon. John Amaratunga on behalf of The Hon. Tissa Attanayake)

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ අගලවත්තේ පිහිටුවා ඇති ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ,

(i) සම්පූර්ණ නම;

(ii) පත්වීම් දිනය;

(iii) මේ වන විට සේවා කාලය;

(iv) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

(v) වැටුප්, දීමනා හා අනෙකුත් වරප්‍රසාද;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ව්‍යාජ හැඳුනුම් පත් සහ උප්පැන්න සහතික ඉදිරිපත් කර අධ්‍යාපන සුදුසුකම් හා වර්තමාන තනතුර ලබා ගත් අයෙකු බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔහුට එරෙහිව ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சின் கீழ் அகலவத்தையில் தாபிக்கப்பட்டுள்ள தேசிய மொழிக் கல்வி, பயிற்சி நிறுவகத்தின் பணிப்பாளர் நாயகத்தின்,

(i) முழுப்பெயர்;

(ii) நியமனத் திகதி;

(iii) இற்றையாகின்றபோது சேவைக்காலம்;

(iv) கல்வி மற்றும் தொழில்சார் தகைமைகள்;

(v) சம்பளம், கொடுப்பனவுகள் மற்றும் ஏனைய சிறப்புரிமைகள்;

யாவையென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) தேசிய மொழிக் கல்வி, பயிற்சி நிறுவகத்தின் பணிப்பாளர் நாயகம் போலியான அடையாள அட்டைகளையும் பிறப்புச் சான்றிதழையும் சமர்ப்பித்து கல்வித் தகைமைகளையும் தற்போதைய பதவியையும் பெற்றுக்கொண்டவர் என்பதை அவர் அறிவாரா?

(இ) ஆமெனில், இவருக்கு எதிராக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவையென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of National Languages and Social Integration:

(a) Will he inform this House -

(i) the full name;

(ii) the date of appointment;

(iii) the period of service by now;

(iv) the educational and professional qualifications; and

(v) the salary, allowances and other privileges;

(vi) of the Director-General of National Institute of Language Education and Training established at Agalawatta under the Ministry of National Languages and Social Integration?

(b) Is he aware that the Director-General of National Institute of Language Education and Training is a person who has obtained educational qualifications and the current post by submitting forged identity cards and birth certificates?

(c) If so, will he state the action that will be taken against him?

(d) If not, why?

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ අගලවත්තේ පිහිටුවා ඇති ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ;

(i) සම්පූර්ණ නම; පතිරාජ හේරත්ගේ ප්‍රසාත් රණතුංග හේරත්

(ii) පත්වීම් දිනය; **2008.08.01**

(iii) මේ වනවිට සේවා කාලය; **අවුරුදු 04යි මාස 11යි (2013.07.01 දිනට)**

(iv) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

අධ්‍යාපන සුදුසුකම්

1. ශාස්ත්‍රවේදී උපාධිය - පේරාදෙණිය විශ්ව විද්‍යාලය
2. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමාව - පස්දුන් රට අධ්‍යාපන විද්‍යා පීඨය
3. අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - කොළඹ විශ්ව විද්‍යාලය
4. අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - පේරාදෙණිය විශ්ව විද්‍යාලය
5. අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - ජාතික අධ්‍යාපන ආයතනය
6. ජනමාධ්‍ය පිළිබඳ ඩිප්ලෝමාව
7. ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමාව
8. නීති පසුබිම පිළිබඳ ඩිප්ලෝමාව
9. පරිගණක අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව

වෘත්තීය සුදුසුකම්

1. ඉංග්‍රීසි ගුරුවරයෙකු ලෙස වසර 5ක පළපුරුද්ද
2. අධ්‍යාපන සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස වසර 12 පළපුරුද්ද
3. කාර්මික විද්‍යාලයේ අර්ධ කාලීන උපදේශක
4. ගුරුවරුන්ගේ උසස් අධ්‍යාපනය පිළිබඳ අර්ධ කාලීන ගුරු උපදේශක

(v) තනතුරට හිමි වැටුප - රු. 47245 – 12X1310 – 62965 (රා.පරි.ච. SL-3-2006)

දීමනා - තනතුරට හිමි නිල රථය සඳහා මසකට ලීටර් 180ක ඉන්ධන දීමනාවක්, දුරකථන ඇමතුම් වෙනුවෙන් මසකට රු.5000/-ක උපරිමයකට යටත්ව බිල්පත් ගෙවීමක් සහ නිල නිවසක්

(ආ) ඔව්,

මේ පිළිබඳව මා වෙත පැමිණිල්ලක් ලැබී ඒ අනුව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විනය පරීක්ෂණ ලැයිස්තුවෙහි නම සඳහන් නිලධාරියෙකු ලවා මූලික විමර්ශනයක් පවත්වා එම විමර්ශන වාර්තාව ආයතනයේ කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාවෙහි ඇතුළත් කරුණු සලකා බැලූ කළමනාකරණ මණ්ඩලය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උප්පැන්න සහතිකය පිළිබඳ ගැටලුව නිරාකරණය කරදීම පිණිස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදීමට තීරණය කරන ලදී. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා උප්පැන්න සහතිකය පිළිබඳව ගැටලුවක් නොමැති බව අප වෙත දන්වා ඇත.

(ඇ) පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

***[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This annex is also placed in the Library.]*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 11 -3536/'13- (1), ගරු ඒ. විනායගමූර්ති මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඒ. විනායගමූර්ති මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ශීර්ෂ අංක 240 - ජාතික අය වැය දෙපාර්තමේන්තුව : වෙනස්කම්
## செலவுத் தலைப்பு 240 - தேசிய வரவு செலவுத் திட்டத் திணைக்களம் : மாற்றங்கள்
## HEAD 240 - DEPARTMENT OF NATIONAL BUDGET : CHANGES

2885/'12

15. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. John Amaratunga on behalf of The Hon. Ravi Karunanayake)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ ශීර්ෂ අංක 240 යටතේ වෙනත් විවිධ ශීර්ෂයන් හට සිදු කර ඇති වෙනස්කම් කවරේද;

(ii) 2012 වර්ෂය තුළදී ශීර්ෂ අංක 240 හරහා සිදු කර ඇති යළි වෙන් කිරීම්වල මුළු අගය කවරේද;

(iii) මුල් අමාත්‍යාංශ වැය විෂය සහ එහි වෙනසද දක්වමින් එවන් යළි වෙන් කිරීම් සිදු කර ඇති ප්‍රධාන ශීර්ෂයන් 15 කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) උචිත නොවන මූල්‍ය වෙන් කිරීම් මගින් මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණ කටයුතු පිරිහීමට ලක්විය හැකි බැවින්, අය වැය ඉදිරිපත් කරන අවස්ථාවේදී මෙම කටයුතු නිසි පරිදි සැලසුම් කර ගැනීමට නොහැකිවීමට හේතුව කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய வரவுசெலவுத் திட்ட திணைக்களத்தின் 240ஆம் செலவுத் தலைப்பின் கீழ், வேறு பல செலவுத் தலைப்புகளில் ஏற்படுத்தப்பட்ட மாற்றங்களையும்;

(ii) 2012ஆம் ஆண்டில் 240ஆம் செலவுத் தலைப்பினூடாக மேற்கொள்ளப்பட்ட மீளொதுக்கத்தின் மொத்தப் பெறுமதியையும்;

(iii) அமைச்சுக்கான ஆரம்ப ஒதுக்கீட்டையும் வேறுபாட்டையும் குறிப்பிட்டு அத்தகைய மீளொதுக்கங்கள் மேற்கொள்ளப்பட்ட 15 பிரதான செலவுத் தலைப்புக்களையும்

அவர் கூறுவாரா?

(ஆ) பொருத்தமற்ற நிதி ஒதுக்கங்கள், நிதி அமைச்சின் நிதி முகாமைத்துவத்தின் தரத்தைக் குன்றியுரச் செய்வதால் இது வரவுசெலவுத் திட்டம் சமர்ப்பிக்கப்பட்டபோது ஏன் திட்டமிடப்பட்டிருக்கவில்லை எனவும் அவர் கூறுவாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) the changes made under Head 240 of Department of National Budget to various other Heads;

(ii) the total value of the reallocation made through Head 240 during the year 2012; and

(iii) the main 15 Heads to which such reallocations were made indicating the original ministry vote and the difference?

(b) Will he also state as to why it was not possible to plan out at the time the Budget was being presented since inappropriate financial allocations may lead to an erosion of financial management in the Finance Ministry?

(c) If not, why?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ශීර්ෂ අංක 240 යටතේ විවිධ ශීර්ෂයන් හට 2012 සිදුකර ඇති වෙනස්කම් 2012 මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තාවේ පිටු අංක 123 සිට 132 දක්වා විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

(ii) 2012 වර්ෂය තුළ ශීර්ෂ අංක 240 යටතේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු. මිලියන 38,706 ක් හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු. මිලියන 32,750 ක් වශයෙන් වෙන්කර දී ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 71,456 කි.

(iii) ප්‍රධාන වැය ශීර්ෂ 15 පහත පරිදි වේ. විස්තර ඇමුණුමෙහි දක්වා ඇත.

| අනු අංකය | වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය |
|---|---|---|
| 01 | 103 | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන |
| 02 | 102 | මුදල් හා ක්‍රමසම්පාදන |
| 03 | 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු |
| 04 | 130 | පළාත් පාලන හා පළාත් සභා |
| 05 | 111 | සෞඛ්‍ය |
| 06 | 117 | වරාය හා මහා මාර්ග |

| | | |
|---|---|---|
| 07 | 114 | ප්‍රවාහන |
| 08 | 179 | ගොවිජන සේවා හා වනජීවී |
| 09 | 105 | ආර්ථික සංවර්ධන |
| 10 | 176 | සිවිල් ගුවන් සේවා |
| 11 | 166 | ජලසම්පාදන හා ජලාපවහන |
| 12 | 126 | අධ්‍යාපන |
| 13 | 1-22 | විශේෂ වියදම් ඒකක |
| 14 | 112 | විදේශ කටයුතු |
| 15 | 152 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ |

(ආ) මේ සඳහා පදනම් කරගනු ලබන නිර්ණායකයන් ද පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇති අයවැය ඇස්තමේන්තුවල, අයවැය ඇස්තමේන්තු පිළිබඳ පැහැදිලි කිරීමේ සටහනේ, 2.1 ලෙස සඳහන් කර ඇත. එසේම, විසර්ජන පනතේ 6 (1) වගන්තිය පරිදි මෙම වෙන්කිරීම් සිදුකර මාස දෙකක් ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

*ඇමුණුම:*
** இணைப்பு:*
** Annex:*

**Main 15 Heads which supplementary allocations were made in 2012**

Rs.Million

| Serial No. | Head No. | Ministry | Estimate 2012 | | Supplementary Allocation from Head 240 | | Revised Estimate | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | Recurrent | Capital | Recurrent | Capital | Recurrent | Capital |
| 1 | 103 | Ministry of Defence and Urban Development | 215,427 | 15,816 | 6,596 | 6,447 | 222,023 | 22,263 |
| 2 | 102 | Ministry of Finance and Planning | 11,132 | 9,624 | 4,449 | 5,505 | 15,581 | 15,129 |
| 3 | 121 | Ministry of Public Administration and Home Affairs | 135,954 | 2,000 | 4,944 | 876 | 140,898 | 2,876 |
| 4 | 130 | Ministry of Local Government and Provincial Councils | 95,059 | 34,714 | 1,149 | 4,330 | 96,208 | 39,044 |
| 5 | 111 | Ministry of Health | 55,000 | 19,500 | 4,258 | 121 | 59,258 | 19,621 |
| 6 | 117 | Ministry of Ports & Highways | 200 | 144,367 | 0 | 3,396 | 200 | 147,763 |
| 7 | 114 | Ministry of Transport | 13,540 | 40,000 | 2,734 | 385 | 16,274 | 40,385 |
| 8 | 179 | Ministry of Agrarian Services & Wildlife | 37,541 | 1,437 | 2,779 | 275 | 40,320 | 1,712 |
| 9 | 105 | Ministry of Economic Development | 18,547 | 86,024 | 2,798 | 140 | 21,345 | 86,164 |
| 10 | 176 | Ministry of Civil Aviation | 87 | 12,007 | 0 | 2,822 | 87 | 14,829 |
| 11 | 166 | Ministry of Water Supply and Drainage | 156 | 33,000 | 16 | 2,480 | 172 | 35,480 |
| 12 | 126 | Ministry of Education | 27,250 | 6,016 | 1,790 | 551 | 29,040 | 6,567 |
| 13 | 1-22 | Special Spending Units | 7,464 | 4,300 | 1,694 | 529 | 9,158 | 4,829 |
| 14 | 112 | Ministry of External Affairs | 5,700 | 940 | 1,630 | 264 | 7,330 | 1,204 |
| 15 | 152 | Ministry of Irrigation and Water Resources Management | 3,335 | 32,500 | 75 | 1,000 | 3,410 | 33,500 |

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මහතා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විසින් ලබා දී ඇති ප්‍රකාශය පමණක් කියවන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බොහොම ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග අංක 5ට මා ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. මේ වන විට ලංගම ඩිපෝ 73ක සේවකයින් 25,000කට මාස දෙකක පඩි ගෙවලා නැහැ. මෙතැන ගරු ඇමතිතුමාත් සිටිනවා. ගරු ඇමතිතුමා, කරුණාකර, ඔබතුමා මේ ප්‍රශ්නයෙන් මඟ හැර යන්නේ නැතුව කටයුතු කරන්න. ඩිපෝ 73ක සේවකයින් 25,000කට මාස දෙකක පඩි ගෙවලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමා ගිහින් -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මෙය ඊට අවස්ථාවක් නොවෙයි. ඔබතුමාගේ ප්‍රශ්නය අවශ්‍ය වෙලාවට අහන්න. මේ පාර්ලිමේන්තුවේ කාලය කා දමන්න එපා. ඔබතුමාගේ ප්‍රශ්නයට විනාඩි 20ක් ගියා. ගරු අනුර දිසානායක මහතා. [බාධා කිරීමක්] ඔබතුමාට පුහුණු පාඨමාලාවක් තියන්න වෙනවා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 4/2013 දරන චක්‍රලේඛය
### கல்வி அமைச்சின் 4/2013ஆம் இலக்கச் சுற்றறிக்கை
### CIRCULAR NO. 4/2013 OF EDUCATION MINISTRY

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය උසස් ලෙස සමත්ව අ.පො.ස.උසස් පෙළ හැදෑරීම සඳහා සුදුසුකම් ඇති නමුත් ජාතික පාසලකට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වීම නිසා පාසල් දරුවන් විශාල පිරිසකට මුහුණ පෑමට සිදු වී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මම මෙම ගරු සභාවේ අවධානය යොමු කරවමි.

දිවයිනේ සියලුම පාසල්වල සමාන පහසුකම් නොමැති බැවින් ඊට පිළියම් ලෙස 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළින්ම සමත් වන සිසුන්ට ලබා ගත් ලකුණු අනුව උසස් පාසලකට ඇතුළත් වීමට අවස්ථාව ලබා දීම මෙතෙක් අනුගමනය කළ වැඩ පිළිවෙළයි. එසේ 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වී උසස් පාසලකට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වූ දරුවන්ගේ දෙවැනි කඩුල්ල වන්නේ අ.පො.ස. සාමාන්‍ය පෙළ භාගයයි. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉහළින්ම සමත් වන දරුවන්ට ලබා ගත් සාමාර්ථයන්ට අනුව සුදුසු උසස් පාසලකට ඇතුළත් වීමට වරම් ලැබී තිබුණා. මෙම ක්‍රමවේදය තුළින් දිවයිනේ ඉතා දුෂ්කර පාසල්වල සිටින දක්ෂ දරු දැරියන් විශාල ප්‍රමාණයකට නගරයේ පහසුකම් සහිත උසස් පාසල්වලට ඇතුළත් වී අ.පො.ස.උසස් පෙළ විභාගය හොඳින් සමත් වී සරසවි ප්‍රවේශය ලබා ගැනීමට වාර්ෂිකව අවස්ථාව ලැබී තිබුණා.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 2013.04.06 දාතමින් සහ අංක 4/2013 දරන චක්‍රලේඛය අනුව, කෙතරම් ඉහළින් අ.පො.ස.සාමාන්‍ය පෙළ විභාගය සමත් වුවද, තමන් ඉගෙන ගන්නා පාසලේ අදාළ උසස් පෙළ විෂයයන් සඳහා පහසුකම් පවතින්නේ නම් එම පාසලෙන් ඉවත් වීමට දක්ෂ සිසු දරු දැරියන්ට තහනම් කෙරුණා. අදාළ විෂයයන්ට ගුරුවරුන් හිඟ වුවද විද්‍යාගාර ආදී අනෙකුත් පහසුකම් අවම වුවද එම දරුවන් එම පාසලේම රැඳී සිටිය යුතු වුණා.

අදාළ විෂයයන් ඉගැන්වුවද, දිවයිනේ සියලු පාසල්වල සමාන පහසුකම් නොමැති බව අද ඕනෑම අයෙකු පිළිගන්නා සත්‍යයක්. එසේ සමාන පහසුකම් තිබේ නම් අනේක දුක් විඳ තම දරුවන් නගරයේ උසස් පාසල්වලට ඇතුළත් කිරීමට දෙමාපියන් පෙළඹෙන්නේ නැහැ. නගරයේ ඇතැම් පාසල්වල පිහිණුම් තටාක පවතිද්දී අවම පහසුකමක් හෝ වැසිකිළි, ජලය, විදුලිය වැනි පහසුකම් හෝ නොමැති පාසල් අපේ රටේ පවතිනවා. මෙවැනි තත්ත්වයක් තුළ සියලුම පාසල්වලට සමාන පහසුකම් සැපයීමට අසමත් වන ආණ්ඩුව මෙවැනි චක්‍රලේඛ නිකුත් කර දක්ෂ සිසු සිසුවියන්ට උසස් පාසල්වලට ඇතුළත් වීමට ඇති ඉඩකඩ ඇහිරීම ඉතාම අමානුෂික පියවරක්. අධ්‍යාපනයට වෙන් කරන ලද මුදල් දිනෙන් දින කප්පාදු කරන තත්ත්වයක් යටතේ දිවයිනේ සියලුම පාසල්වල තත්ත්වය සමාන කරනවා යැයි පැවසීමද, කඩිනමින් පාසල්වලට අවශ්‍ය වන පහසුකම් සලසනවා යැයි කියන බලධාරින්ගේ ප්‍රකාශද විහිළුවක් වී තිබෙනවා.

මේ පිළිබඳව අවංක වුවමනාවක් තිබුණේ නම් පළමුව කළ යුතුව තිබුණේ පාසල්වල තත්ත්වය උසස් කිරීමයි. එසේ වූයේ නම් චක්‍රලේඛ නිකුත් කර සිසුන්ව බලෙන් එම පාසල්වලම නතර කර ගැනීමට අවශ්‍ය වන්නේ නැහැ. සෑම සිසුවෙක්ම සිසුවියක්ම කැමැති වන්නේ, තමන් මෙතෙක් ඉගෙනුම ලැබූ පාසලේම උසස් පෙළ හැදෑරීමටයි. අලුත් පාසලකට ගිය විට අලුත් පරිසරයක් යටතේ මුල් කාලයේ ඇති වන මානසික පසුබෑම ඔවුන් හොඳින් දන්නවා. එහෙත් ඒ සියල්ල දරා ගෙන වෙනත් පාසැලකට ඇතුළත් වීමට ඔවුන් උත්සාහ කරන්නේ හොඳ විද්‍යාගාර පහසුකම් සහිතව වඩා හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීමටයි.

කවර හේතු ඉදිරිපත් කළද එකී චක්‍රලේඛය මඟින් සියලුම උසස් පෙළ සිසු සිසුවියන්ට බලවත් අසාධාරණයක් විශාල ලෙස සිදු වුණා. ඊට අමතරව පහත අක්‍රමිකතාවන්ටද මෙම චක්‍රලේඛය මඟ පෑදීය. එනම් මෙම චක්‍රලේඛය පෞද්ගලික හා ජාත්‍යන්තර පාසැල් සඳහා බල නොපෑමයි. ඒවාට අදාළ වන්නේ නැහැ. මෙමඟින් ජාත්‍යන්තර සහ පෞද්ගලික පාසල් සඳහා විශේෂ

වරප්‍රසාදයක් ලැබී තිබෙනවා. මේ තත්ත්වය තුළ ඉදිරියේදී දෙමව්පියන් අ.පො.ස. සාමාන්‍ය පෙළ සඳහා තම දරුවන් පෞද්ගලික පාසල්වලට ඇතුළත් කිරීමට වැඩි නැඹුරුතාවක් දක්වන්න ඉඩ තිබෙනවා. එය දිරිගන්වනු ඇත්තේ ඇති හැකි පවුල්වල දරුවන් පෞද්ගලික පාසල්වලට ඇතුළත් කරවීමටයි. එවිට එම පාසැල්වල අ.පො.ස. සාමාන්‍ය පෙළ පන්ති සිසුන්ගෙන් පිරෙන අතර රජයේ පාසල් සිසුන් නොමැතිකමින් අපහසුතාවටද පත් විය හැකියි.

මෙම චක්‍රලේඛය ගෙන ආ පිළිවෙළෙහිද පැවතියේ අතිශය දෝෂ සහගත තත්ත්වයකි. 2012 අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල නිකුත් වූයේ 2013 අප්‍රේල් 04 වැනිදායි. සමහර උසස් පාසල් එදිනම අන්තර්ජාලය මඟින් අයදුම්පත් කැඳවා අප්‍රේල් 22 නව පාසල් වාරය ආරම්භ වන විට සිසුන් තෝරා ගෙන අවසන් කර තිබුණා. ඒ කටයුත්ත අවසන් කරමින් තිබුණා. අප්‍රේල් 29 මෙම චක්‍රලේඛය නිකුත් වන විට එම පාසල් පළාත් සභා පාසල්වලින් සිසුන් ඇතුළත් කර ගෙන අවසාන වී තිබුණා. තවත් පාසල්වලට සිසුන් තෝරා ගත් බව දන්වා ඔවුන්ට ලිපිද නිකුත් කර තිබුණා. එම සිසුන් තමන් මෙතෙක් ඉගෙන ගත් පාසල්වලින් අස්වී නව පාසල්වලට ඇතුළත්වීමට යන විට මෙම චක්‍රලේඛය නිකුත්වී තිබූ බැවින් එම සිසුන් පාසලට ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කෙරුණා. මෙතෙක් ඉගෙන ගත් පාසලත්, ඇතුළත්වීමට බලාපොරොත්තු වූ නව පාසලත් යන දෙකම අහිමි වීමෙන් දරුවන් සහ ඔවුන්ගේ දෙමාපියන් දැඩි අපහසුතාවට පත් වුණා.

කෙසේ වුවද මෙම ගැටලුව දැඩි උත්සාහයකින් පසු මෑතකදී විසඳා ගනු ලැබුවා. මෙම කරුණුවලින් පෙන්වා දෙන්නේ, මෙම චක්‍රලේඛය මඟින් දිවයිනේ සියලුම පාසල්වල උසස් පෙළ පන්තිවල අධ්‍යාපන කටයුතු අවුල් කර ඇති බවයි. කෙසේ නමුත් අධ්‍යාපන ඇමතිවරයා පවසන්නේ, ගම්බද පාසල්වල උසස් පෙළ පන්ති ආරක්ෂා කිරීම සඳහා මෙම චක්‍රලේඛය ගෙන ආ බවයි. පාසැලේ සිටින දක්ෂ දරුවන් පාසැලේම රැඳී සිටීමෙන් උසස් පෙළ පන්ති සාර්ථකව පවත්වා ගත හැකි බවයි. නමුත් නව සංශෝධනය මඟින් අමාත්‍යවරයාගේ තීරණය වැරදි බව පෙන්නුම් කර තිබෙනවා. එතුමා විසින්ම මෙම චක්‍රලේඛයට නැවත සංශෝධන ඇති කොට තිබෙනවා.

අධ්‍යාපන ඇමතිවරයාගේ මෙම අසාධාරණ, අදූරදර්ශී චක්‍රලේඛයට එරෙහිව දෙමව්පියෝ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවිධාන අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපිට මීට විරෝධතා දක්වමින් සිටියා. එහි බලපෑම මත ඉහත 4/2013 චක්‍රලේඛය සඳහා 27/2013 චක්‍රලේඛය මඟින් පසු ගිය ජූනි 28වැනි දා යම් සංශෝධන ගෙන එනු ලැබ තිබුණද ගැටලුව මුළුමනින්ම අවසන් වී නැහැ.

ප්‍රධානම ගැටලුව වී තිබෙන්නේ, නව සංශෝධන අනුව අ.පො.ස සාමාන්‍ය පෙළ උසස් ලෙස සමත් වූ දරු දැරියන්ට ජාතික පාසල්වලට ඇතුළත්වීමේ අවස්ථාව ලැබෙන විට එම පාසල්වල අ.පො.ස. උසස් පෙළ පන්තිවල ඉඩකඩ නොමැති වීමයි. දැන් ඒවායේ ඉඩකඩ නැහැ. තමුන්නාන්සේ චක්‍රලේඛය සංශෝධනය කරන කොට ළමයින් අරගෙන ඉවරයි. අත්තනෝමතික පූර්ව චක්‍රලේඛය සංශෝධනය විය හැකි බවට උපකල්පනය කළ ඇතැම් පාසලක් ඒ මත පැමිණෙන සිසුන් වෙනුවෙන් ඉඩකඩ වෙන්කර ගෙන සිටියද බොහෝ පාසල් ප්‍රමාණයක් එසේ ඉඩකඩ වෙන් කරගෙන සිටියේ නැහැ. විශේෂයෙන්ම කොළඹ ආශ්‍රිත බාලිකා විද්‍යාලවල ඒ ඉඩකඩ වෙන් කරගෙන තිබුණේ නැහැ. එම නිසා අ.පො.ස. සාමාන්‍ය පෙළ උසස් ලෙස සමත් සිසු සිසුවියන් රැසකට පහසුකම් සහිත පාසලකට ඇතුළත් වීම සඳහා ලැබිය යුතු වූ අවස්ථාව අහිමි වී ගොස් තිබෙනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අමාත්‍යවරයා විසින් මෙම සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

01. 2013/4 චක්‍රලේඛය හදිසියේ නිකුත් කරන ලද්දේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ කුමන විශේෂඥයින්ගේ, කුමන නිර්දේශ අනුවද?

02. එම චක්‍රලේඛය මඟින් පෞද්ගලික පාසල් පවත්වාගෙන යන ඇතැමුන්ට විශේෂ වාසි සැලසීමට අදහස් කෙරුණාද? මා දන්නේ නැහැ, එහෙම දෙයක් කරන්න ඔබතුමාට අපේක්ෂාවක් තිබුණාද කියලා.

03. එම චක්‍රලේඛයේ සංශෝධන ප්‍රමාදවීම නිසා උසස් ලෙස අ.පො.ස සාමාන්‍ය පෙළ සමත් සිසු සිසුවියන්ට නව පාසලකට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

04. එම අසාධාරණයට ලක් වූ සිසු සිසුවියන්ට ලබා දෙනු ලබන සහනය කුමක්ද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු අනුර දිසානායක ගුරින් ඉතා වැදගත් කරුණක් පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කළා.

මෙතෙක් කල් පාසල්වල පළමුවන ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීම පිළිබඳව ප්‍රශ්න තිබුණු රටේ ඉතාම පටු පෞද්ගලික න්‍යාය පත්‍ර තිබෙන යම් යම් අය උසස් පෙළට දරුවන් ඇතුළත් කිරීම පිළිබඳවත් දේශපාලන හා රාජ්‍ය මැදිහත් වීම් ඇති කරන්න උත්සාහ දැරීම ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. මා මේ ගරු සභාවේදී විශේෂයෙන් අපේ මාධ්‍ය හිතවතුන්ගේ දැන ගැනීම සඳහා, උසස් පෙළට දරුවන් ඇතුළත් කර ගැනීම පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය සඳහන් සියලු නිල චක්‍රලේඛන ඔබතුමාගේ අනුමැතිය ඇතිව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ, අධ්‍යයනය කරන කෙනකුට ඉතාම නිවැරැදිව තමා කියන කරුණ පිළිබඳව හොඳ අධ්‍යයනයක් කරන්න ඉඩකඩ ලබා දීම සඳහායි. 1975 දී ගරු ආචාර්ය බදිඋද්දීන් මහමූද් මැතිතුමා අධ්‍යාපන අමාත්‍ය ධුරය දරද්දී, ආචාර්ය ප්‍රේමදාස උඩගම ලේකම්වරයාගේ අත්සනින් ජා.උ.අ.ස. පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳ චක්‍රලේඛනය; 1977 දී දිවංගත ගරු නිශ්ශංක විජයරත්න අධ්‍යාපන ඇමතිතුමාගේ අවධියේදී, ඩී.එම්.පී.බී. දිසානායක ලේකම්වරයාගේ අත්සනින්, ජා.උ.අ.ස. පන්තියට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳ චක්‍රලේඛනය; 1995 දී ගරු ආචාර්ය රිචර්ඩ් පතිරණ අධ්‍යාපන ඇමතිතුමාගේ අවධියේදී, එම්.ඩී.ඩී. පීරිස් ලේකම්තුමාගේ අත්සනින් නිකුත් කොට ඇති චක්‍රලේඛනය; 1999 දී ගරු ආචාර්ය රිචර්ඩ් පතිරණ අධ්‍යාපන ඇමතිතුමාගේ අවධියේදී, ඒ. ඇන්ඩෲ ද සිල්වා ලේකම්වරයාගේ අත්සනින් නිකුත් කොට තිබෙන චක්‍රලේඛනය; 2001 දී ගරු සුසිල් ප්‍රේමජයන්ත අධ්‍යාපන ඇමතිවරයාගේ යුගයේදී, වෛද්‍ය ටාරා ද මැල් මැතිනියගේ අත්සනින් නිකුත් කොට ඇති චක්‍රලේඛනය; 2003 දී එක්සත් ජාතික පක්ෂ රජය යටතේ ගරු ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු අධ්‍යාපන ඇමතිවරයාගේ අවධියේදී, වී.කේ. නානායක්කාර ලේකම්තුමා නිකුත් කොට ඇති චක්‍රලේඛනය; 2006 දී ගරු සුසිල් ප්‍රේමජයන්ත අධ්‍යාපන ඇමතිතුමාගේ යුගයේදී, ආරියරත්න හේවගේ ලේකම්වරයාගේ අත්සනින් නිකුත් කොට තිබෙන චක්‍රලේඛනය ඇතුළුව උසස් පෙළ පන්තියට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳ සියලු චක්‍රලේඛන **සභාගත*** කරන අතර, රටටත්, රටේ ජනතාවටත්, මාධ්‍ය ආයතනවලටත් අවබෝධ කර ගැනීම සඳහා මේ පැහැදිලි කිරීමේ කොටසක් වශයෙන් හැන්සාඩ්

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

වාර්තාවේ මුද්‍රණය කරන ලෙසට ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්] ඉන්න පොඩ්ඩක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් තිබුණු චක්‍රලේඛවල ඉතා පැහැදිලිව දක්වා තිබෙනවා, ජාතික පාසලක සිටින දරුවකුට, තම පාසලේ අදාළ විෂය ධාරාව නැත්නම්, අදාළ මාධ්‍යය නැත්නම් හැර කිසිම වෙලාවක වෙනත් ජාතික පාසලකට උසස් පෙළ හැදෑරීම සඳහා ඇතුළු වන්න බැහැයි කියලා. එය විපක්ෂ නායකතුමා අධ්‍යාපන අමාත්‍යතුමා වශයෙන් සිටියදීත් එලෙසයි; ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මැතිතුමා සිටියදීත් එලෙසයි; නිශ්ශංක විජයරත්න මැතිතුමා සිටියදීත් එලෙසයි. අනික් යුගවලදී තිබුණු තත්ත්වයත් ඒකයි. ඒ යුග ගණනාව තුළත් අධ්‍යාපනයේ අසමානතා, සම්පත් බෙදී යාමේ විෂමතා යන සියල්ල තිබුණා. පසු ගිය කාලය තුළ අපේ ඇති හැකි අය විසින් අලුත් මානසික තත්ත්වයන් නිර්මාණය කර ගත්තා. අනගාරික ධර්මපාලතුමා තමන්ගේ පෞද්ගලික දේපොළ යොදා හදා තිබෙන, විශිෂ්ට ප්‍රතිඵල ලත් වියතුන් රාශියක් මේ සමාජයට දායාද කළ, සියලුම විද්‍යාගාර පහසුකම් සහිත පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ ඉගෙන ගෙන "A" සාමාර්ථ 8ක්, "A" සාමාර්ථ 9ක් තිබෙනවාය කියලා කොළඹ පාසලකට එන්න ඕනෑය කියනවා. මේ රටේ විවිධ ක්ෂේත්‍රවලට ඉහළම පුද්ගලයනුත්, වෛද්‍ය විශේෂඥයන් වැනි අයත් බිහි කළ කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයෙන් ඉගෙන ගෙන එවැනි සාමාර්ථ ලබා ගත් අයත් කොළඹ පාසලකට එන්න ඕනෑය කියනවා. දුර දක්නා, නුත් කල් දක්නා අධ්‍යාපනඥයෝ, ජාති හිතෛෂියෝ, දරුවන්ට ආදරය කරන මිනිස්සු, එකම 1 AB පාසලක්වත් නැති ප්‍රදේශවල ගම්බද පාසල්වල ඉගෙන ගන්නා අන්ත අසරණ දරුවන්ට නේවාසිකාගාර හදලා මේ පාසල් නිර්මාණය කළේ ඇයි? ආනන්ද විද්‍යාලයේ නේවාසිකාගාරය, රාජකීය විද්‍යාලයේ නේවාසිකාගාරය හැදුවේ ඇයි? නාලන්දා විද්‍යාලයේ හිටපු විදුහල්පති මහාචාර්ය ගුණපාල මලලසේකර මැතිතුමන්ලා, මෙත්තානන්ද මැතිතුමන්ලා යටතේ විවිධ ප්‍රදේශවල නේවාසිකාගාර හැදුවේ ඇයි? එකම 1 AB පාසලක්වත් නැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 72ක් තිබෙනවා, මේ රටේ. එකම 1 AB පාසලක්වත් නැහැයි කියන්නේ, ඒ පාසල්වල විද්‍යා අංශයක් නැහැ; විද්‍යාගාර නැහැ; විද්‍යා ගුරුවරු නැහැ. එවැනි පාසල්වල දරුවන් "A" සාමාර්ථ 8ක් හෝ 9ක් ගත්තාම කැපකරු පියවරුන්, කැපකරු මව්වරුන් ලෙස ඒ දරුවන්ගේ භාරකාරත්වය භාර ගන්නා මානව හිතවාදී මිනිස්සු මේ රටේ ඉන්නවා. උදාහරණයක් ලෙස කිව්වොත් විශිෂ්ට ලෙස සමත් වුණු නිවුන් දරුවන්ගේ අම්මා, තාත්තා දෙදෙනාම අහිමි වුණාම ටොයොටා ලංකා සමාගමේ ගණකාධිකාරිතුමා කිව්වා, ආනන්ද විද්‍යාලයේ නේවාසිකාගාරයේ දරුවන් දෙදෙනා නතර කරන්න, සියලුම වියදම් දරනවාය කියලා. හැබැයි ඒ ඔහුගේ ළමයි නොවෙයි; මේ රටේ අසරණ ළමයි.

අපි එහෙම කරන්න ඉඩ දුන්නා. මොකද, මේ දරුවන්ව මෙහෙම භාර ගන්න අය ඉන්නවා නම්, තමාගේ ඥාති මිත්‍රාදීන් උදවු කරනවා නම් බදුල්ල, බණ්ඩාරවෙල, මොනරාගල වැනි ප්‍රදේශවල දරුවන්ට පහසුකම් තිබෙන අපේ පාසලක -රාජකීය විද්‍යාලය, ආනන්ද විද්‍යාලය, නාලන්ද විද්‍යාලය, විශාඛා විද්‍යාලය, දේවි බාලිකා විද්‍යාලය වාගේ එකක- අපි ඉඩ දෙන්නේ නැත්නම්, වරප්‍රසාද ලත් අපි දන්නා හඳුනන හිතවතුන්ට පමණක් මේ පාසල් ටික බෙදා ගන්න යනවා නම් - [බාධා කිරීමක්] මම නිකුත් කරලා තිබෙන චක්‍රලේඛය මම ඔබතුමාට කියවනවා. ඊට කලින් මම කියවනවා -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කොයි චක්‍රලේඛයද ගරු ඇමතිතුමනි?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
2013 පළමුවන චක්‍රලේඛය. [බාධා කිරීමක්] ඉන්න. මම ඔබතුමාට බාධා කළේ නැහැ නේ. ඇමතිවරයා ප්‍රකාශය කරලා ඉවර වෙන තෙක් ඉන්න.

චක්‍රලේඛ අංක 2013/4 හි 03 (අ) වගන්තිය යටතේ මෙසේ සඳහන් වනවා:

"(අ) එම පාසලේ අපේක්ෂකයන් ලෙස විභාගයට පෙනී සිටි සිසුන් (චක්‍රලේඛයේ 2.0 වගන්තිය යටතේ සඳහන් එක් එක් විෂය ධාරාවට තිබිය යුතු අවම සුදුසුකම් සපුරා ගෙන ඔවුන් එම විෂය ධාරාව හැදෑරීම සඳහා ඉල්ලුම් කළ හොත් එය අනිවාර්යයෙන්ම ලබාදිය යුතුය.) "

එතකොට ඒ පාසලේ ඉන්න සියලුම ශිෂ්‍යයන්ට උසස් පෙළ කරන්නට සුදුසුකම තිබෙනවා නම් පළමුවන අවස්ථාව ඒ දරුවන්ට දෙන්න ඕනෑ. එහි (ආ) වගන්තිය යටතේ මෙලෙස සඳහන් වනවා:

"(ආ) එකම 1 AB (උසස් පෙළ විද්‍යා, කලා, වාණිජ්‍ය) පාසලක් හෝ නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි පාසල්වලින් අතිවිශිෂ්ඨ ලෙස සාමාන්‍ය පෙළ ප්‍රතිඵල ලබා ඇති ග්‍රාමීය පාසල්වල සිසුන්"

මම මේකේ ශුද්ධ සිංහලෙන් කියලා තිබෙනවා 1 AB පාසල් එකක්වත් නැති ප්‍රදේශ ගැන. මහියංගනයේ, ආඳාඋල්පතේ එහෙම තිබුණේ නැහැ. අනුර දිසානායක මන්ත්‍රීතුමා දන්නවා. මොනරාගල, ඇතිමලේ එහෙම තිබුණේ නැහැ. මේ වාගේ පළාත්වල දරුවන් අතිවිශිෂ්ට ලෙස සමත් වෙලා තිබෙනවා නම්, තම පාසලේ දරුවෝ ටික ගත්තාට පසුව ඒ අයට ඊළඟ අවස්ථාව දෙන්න කියලා (ආ) වගන්තිය යටතේ කියා තිබෙනවා.

ඊළඟට (ඇ) වගන්තිය යටතේ මෙහෙම කියනවා:

"(ඇ) ඉහත (අ) හා (ආ) යන වගන්තිවලට අනුව සිසුන් ඇතුළත් කිරීමෙන් පසු තවදුරටත් පුරප්පාඩු පවතී නම් පාසල පිහිටි දිස්ත්‍රික්කයේ 1 AB නොවන පාසල්වලින් විශිෂ්ඨ ලෙස සමත් වූ සිසුන්"

දැන් කොළඹ දිස්ත්‍රික්කය ඇතුළෙත් මේ 1 AB පාසලක් නොමැතිව පළාත් සභා පාසල්වල "A" සාමාර්ථ 9ක් ලබා ගෙන විශිෂ්ට ලෙස සමත් වන සිසුන් ඉන්නවා. තුන්වෙනුව ඒ අයට ඒ අවස්ථාව දෙන්න.

පළමුව තමන්ගේ පාසලේ අයට අවස්ථාව දෙන්න. ඊට පසුව ඈත ගම්වල අහිංසකම දරුවන්ට ඉඩ දෙන්න. ඊට පස්සේ තම පාසල පිහිටි දිස්ත්‍රික්කය තුළ විද්‍යාගාර පහසුකම් එහෙම නැති පාසල්වල ළමයින්ට ඉඩ දෙන්න. මේ කරුණු ටික තමයි මම නිකුත් කළ චක්‍රලේඛයේ අඩංගුව තිබුණේ.

මේ උද්ඝෝෂණ කිසි දෙයක් අපි සතයකට ගණන් ගන්නේ නැහැ. මොකද, හේතුව? තමන්ගේ පෞද්ගලික පටු අරමුණු සඳහා මේ උද්ඝෝෂණ මෙහෙයවන්නේ කවුද? මම, මේ රටේ ගමේ පාසලේ නිදහස් අධ්‍යාපනය ලබා ගත්ත දරුවෙක් ලෙස මේ වරප්‍රසාද ලත් අයට ඕනෑ විධියට පාසල් අධ්‍යාපනය නටවන්න දෙන්නේ නැහැ. හඬක් නඟන්න බැරි ලක්ෂ ගණන් ළමයි වෙනුවෙන් තමයි මේ අවස්ථාව අපි හදලා දීලා තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි ගරු ඇමතිතුමා. දැන් ගරු මහින්ද යාපා අබේවර්ධන අමාත්‍යතුමා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

පොඩ්ඩක් ඉන්න නියෝජ්‍ය කථානායකතුමනි. අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, මේක ඉතා අමානුෂික ක්‍රියාවක් කියලා. ගමේ ළමයින්ට මේ වරප්‍රසාදය ලබා දෙන ක්‍රියාව ඉතාම අමානුෂික නම් මම අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් ඒ අමානුෂික ක්‍රියාව දිගටම කරනවාය කියන එක මම මේ සභාවේදී සඳහන් කරන්නට කැමැතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

හරි, බොහොම ස්තුතියි. ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඉවර නැහැ. පොඩ්ඩක් ඉන්න. අනුර දිසානායක මන්ත්‍රීතුමා කියනවා, ජාත්‍යන්තර පාසල්වලට විශේෂ අනුග්‍රහයක් දුන්නා කියලා. මේ බලන්න, ආරියරත්න හේවගේ ලේකම්තුමාගේ කාලයේ ජාත්‍යන්තර පාසල් ගැන මොකක්ද කියලා තිබෙන්නේ කියලා. මේ බලන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

"අ.පො.ස.(සා.පෙ.) විභාගයට සමාන්තර සුදුසුකම් සහිත ප්‍රතිඵල ලබා ඇති විදේශගතව සිට පැමිණෙන අ.පො.ස. (උ.පෙ.) පන්ති නොමැති හෝ අදාළ විෂයධාරා නොමැති ජාත්‍යන්තර පාසල්වල හා පෞද්ගලික පාසල්වල සිසුන් ඇතුළු කර ගත යුතුයි" කියලා තියෙන එක මම අයින් කළා. අයින් කළාම කියනවා, මම ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්වලට විශේෂ වරප්‍රසාද දුන්නා කියලා.

මම දන්නවා, අනුර දිසානායක මන්ත්‍රීතුමා ගමේ ළමයින්ට ආදරෙයි කියලා. හැබැයි, සල්ලි තිබෙන අය අටවලා ඉංග්‍රීසි පත්තරයේ පළමුවන පිටුවේ පිකටින් එක දමපුවාම ඉංග්‍රීසි පත්තරයට පිකටින් එක යන්න හදන අය පැත්තේ ඔබතුමා හිට ගන්න එපා. පැරණි කාලයේ හිට ගත්තා වාගේ ගමේම ළමයින්ගේ පැත්තේ හිට ගන්නය කියන ටික කියමින් මගේ කථාව අවසන් කරනවා.

චක්‍ර. අං. 32/75
1975. 07. 31

III වැනි කොටස

මහා විද්‍යාලයවල 10 වැනි ශ්‍රේණියට ශිෂ්‍යයන් ඇතුළු කිරීම—

(1) ජා.උ.අ.ස. (10, 11) පන්තිවලට ශිෂ්‍යයන් ඇතුළත් කිරීමේ කාර්යයේදී 1962 වර්ෂයේ අංක 9 දරණ චක්‍රලේඛයේ 16 වැනි වගන්තියේ සඳහන් ප්‍රමුඛත්වයන් තරයේ පිළිපැදිය යුතුයි. එම ප්‍රමුඛත්වය මෙසේයි :—

(අ) පළමුව, කිසිම විශේෂයක් නො කොට එම පාසැලේම සියලුම ශිෂ්‍යයෝ.

(ආ) දෙවනුව, ජා.උ.අ.ස. (10, 11) පන්ති නොමැති අනිකුත් පාසල්වල මැයි මස 1 දිනට වයස අවුරුදු දහ අටට අඩු සියලුම ශිෂ්‍යයෝ.

(ඉ) තෙවනුව, ජා.උ.අ.ස. (10, 11) පන්ති නොමැති අනිකුත් පාසල්වල මැයි මස 1 දිනට වයස අවුරුදු දහ අටට වැඩි සියලුම ශිෂ්‍යයෝ.

(ඊ) සිව්වනුව, ශාස්ත්‍රීය සුදුසුකම ඇත්නම් මැයි මස 1 දිනට වයස අවුරුදු දහ අටට අඩු අනිකුත් සියලුම ශිෂ්‍යයෝ.

ආචාර්ය ප්‍රේමදාස උඩගම
ලේකම්.

ගරු බදියුදීන් මහ්මූද් මැතිතුමා
අධ්‍යාපන අමාත්‍ය.

චක්‍ර. අං. 144/77
1977. 10. 04

III වැනි කොටස

මහා විද්‍යාලවල 10 වැනි ශ්‍රේණියට ශිෂ්‍යයින් ඇතුලු කිරීම.

(i) ජා. උ. අ. ස. (10, 11) පන්තියට ශිෂ්‍යයින් ඇතුලත් කිරීමේ කාර්යයෘ මගේ අංක ජා. ස. 6/285 සහ 1976. 03. 04 දිනැති චක්‍රලේඛ ලිපියේ සඳහ ප්‍රමුඛත්වයන් පහත සංශෝධනය කර ඇති පරිදි තරයේ පිළිපැදිය යුතුය.

එම ප්‍රමුඛත්වයන් මෙසේයි :—

(අ) පළමුව කිසිම විශේෂයක් නොකොට එම පාසලේම සියලුම ශිෂ්‍යයි

(ආ) අමාත්‍යාංශය ප්‍රා. අධ්‍යා. අ./ප්‍ර. අධ්‍යා. නි. විසින් යොමු කරන ලබ ජා. උ. අ. ස. සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යත්වධාරීන්.

(ඉ) ජා. උ. අ. ස. (10, 11) පන්ති නොමැති පහසුකම් අතින් දුෂ්කර ගනයේ සැලකෙන පාසල්වල මැයි මස 1 දිනට වයස අවුරුදු 17 අඩු ශිෂ්‍යයි (පාසල්වල දුෂ්කරතාවය පිළිබඳ ප්‍රා. අ. අ./ප්‍ර. අ. නි. ගෙන් උපදෙ ලබාගත යුතුය.)

(ඊ) ජා. උ. අ. ස. (10, 11) පන්ති නොමැති අනිකුත් පාසල්වල ජා. පො. අ. විභාගයේ දී ලබා ඇති ශ්‍රේණි අනුව වැඩි සැලකිල්ලක් දක්වමින්, මැ මස 1 දිනට වයස අවුරුදු 17 ට වැඩි සියලුම ශිෂ්‍යයින්.

(උ) ශාස්ත්‍රීය සුදුසුකම ඇත්නම්, ජා. පො. අ. ස. විභාගයේ දී ලබා ඇති ශ්‍රේ අනුව මැයි මස 01 දිනට වයස අවුරුදු 17 ට අඩු අනිකුත් සියලුම ශිෂ්‍යයි

10 වන ශ්‍රේණියේ එක් විෂයධාරාවක් සඳහා ඉහත සඳහන් පදනම මත ඇතුල වීමෙන් පසුව, ඇතුලත්වීමට නොහැකි වූ විෂයධාරාවක් හැදෑරීමට ඉඩ නොදිය යුතු

ඩී. එම්. ජී. බී. දිසානායක.
ලේකම්.

ගරු නිශ්ශංක විජේරත්න මැතිතුමා
අධ්‍යාපන අමාත්‍ය.

චක්‍ර. අං. 1995/09
1995. 05. 15

11

(උ) ඉහත දක්වා ඇති සුදුසුකම් නියමකර ඇත්තේ අ.පො.ස. (උ.පෙ.) පන්තිවලට ඇතුළත් කිරීම සඳහා පමණක් බව පාසල් ප්‍රධානීන් මතක තබා ගත යුතුය. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින්, විශ්ව විද්‍යාලයන්හි විවිධ අධ්‍යයන පීඨයන්ට ඇතුළුවීම සඳහා නියම කර ඇති අවශ්‍යතා සළකා බලා සිය ශිෂ්‍යයන්ට උපදෙස් දීම පාසල් ප්‍රධානීන්ගේ වගකීම වේ.

18. අ.පො.ස. (උ.පෙ.) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාවඃ-

අ.පො.ස. (උ.පෙ.) පන්තිවල සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාවය පහත දැක්වෙන අයුරුවේ.

(අ) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන්,

(ආ) අ. පො. ස. (උ. පෙ.) පන්ති නොමැති පාසල් වලින් හෝ අදාළ විෂය ධාරාව නොමැති පාසල්වලින් පැමිණෙන සිසුන්,

(ඇ) උසස් පෙළ පන්තියට ඇතුළත්වීමට සුදුසුකම් ලබා ඇති මැයි මස 1 වැනි දිනට වයස අවුරුදු 18ට අඩු වෙනත් සිසුන්,

(ඈ) ඉහත (ආ) හා (ඇ) යටතේ අ. පො. ස. (උ. පෙ.) පන්තියට ඇතුළුවීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම අයදුම්පත් ලේඛනගතකොට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අනුමත ලකුණු දීමේ ක්‍රමයක් යටතේ තෝරා ගැනීම කළ යුතුය. ලකුණු දීමේ ක්‍රමය අ. පො. ස. (සා. පෙ.) ප්‍රතිඵල හා විෂයානුබද්ධ ක්‍රියාකාරකම් පදනම් කරගෙන සකස් කර ගත යුතුය.

(ඉ) අ. පො. ස. (උ. පෙ.) පන්ති නොමැති පාසල්වලින් සුදුසුකම් ලත් සියළුම සිසුන්ට අ. පො. ස. (උ. පෙ.) පන්ති ඇති පාසල්වලට ඇතුළුවීමට ඉඩ සලසාදීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වේ.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

19. අ. පො. ස. (උ. පෙ.) පන්තිවල අධ්‍යයනය කළ හැකි කාලසීමාව :-

(අ) අ. පො. ස. (උ. පෙ.) පාඨමාලාව 12 වන වසර සහ 13 වසර යනුවෙන් දෑඅවුරුදු කාලසීමාවකට සාමාන්‍යයෙන් සීමාවේ.

(ආ) ශිෂ්‍යයෙකු 12 වන වසර සම්පූර්ණ කළවිට 13 වසරට උසස් කළ යුතුවේ.

(ඇ) දහතුන්වන වසරේ සෑම ශිෂ්‍යයෙකුම එම වසර අවසානයේදී නියම කර ඇති මූලික අවශ්‍යතා සපුරා ඇත්නම් අ. පො. ස. (උ. පෙ.) විභාගයට ඉදිරිපත් කළ යුතුය.

(ඈ) ශිෂ්‍යයෙකු තමා විශ්ව විද්‍යාලයේදී හැදෑරීමට බලාපොරොත්තුවන පාඨමාලාව සඳහා තෝරා නොගතහොත් දහතුන්වන වසරේ පාඨමාලාව නැවත එක්වරක් පමණක් හැදෑරීමට අවසර දිය හැකිය.

20. පොදු කරුණු :

(අ) පිළිගත හැකි හේතුවක් නොමැතිව ජාතික පාසලකින්, ජාතික පාසලකට ළමුන් ඇතුළත් නොකළ යුතුය. එවැනි අවස්ථාවල මෙම අමාත්‍යාංශයේ ජාතික පාසල් ශාඛාවට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගත යුතුය.

එම් . ඩී . ඩී . පීරිස්
ලේකම්
ගරු ආචාර්ය රිචඩ් පතිරණ මැති
අධ්‍යාපන අමාත්‍ය

චක්‍ර . අං. 1999 /14
1999. 05. 20

(ඇ) විද්‍යා අංශය :

නියමිත සම්මාන තුනෙන් එකක් විද්‍යාවට හෝ ගණිතයට හෝ විය යුතු ය. තවද විද්‍යාව හා ගණිතය විෂයයන් දෙකෙන්ම සමත් වී තිබිය යුතු ය.

(i) භෞතිය විද්‍යා විෂය ධාරාව හැදෑරීම සඳහා ගණිතය II විෂයයට සම්මාන සාමාර්ථයක් තිබිය යුතු අතර ඊට අමතරව විද්‍යාව I හෝ විද්‍යාව II හෝ විෂයය සමත් විය යුතු ය.

(ii) ජෛවීය විද්‍යා විෂය ධාරාව හැදෑරීම සඳහා විද්‍යාව II විෂයයට සම්මාන සාමාර්ථයක් තිබිය යුතු අතර ඊට අමතරව ගණිතය I හෝ ගණිතය II හෝ විෂයය සමත් විය යුතු ය.

(ඉ) දොළොස්වැනි ශ්‍රේණියට ඇතුළත් වීමෙන් පසුව තමන් තෝරාගත් විෂය ධාරාව වෙනස් කිරීමට ඉල්ලා සිටින ශිෂ්‍යයකුට එම වර්ෂය තුළ දී අවශ්‍ය සුදුසුකම් තිබේ නම් එසේ කිරීමට ඉඩ දිය හැකිය. එසේ ඉඩ දෙනු ලබන්නේ අ. පො. ස. (උ. පෙ.) පන්තිවල රැඳී සිටීමට උපරිම වශයෙන් ශිෂ්‍යයකුට ලැබෙන කාල සීමාව වර්ෂ තුනක් පමණක් ය යන කොන්දේසිය මතය. අනතුරුව පැවැත්වූ අ. පො. ස. (සා. පෙ.) විභාගයක ප්‍රතිඵල මත විෂය ධාරාව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ඊ) ඉහත දක්වා ඇති සුදුසුකම් නියම කර ඇත්තේ අ. පො. ස. (උ. පෙ.) පන්තිවලට ඇතුළත් කිරීම සඳහා පමණක් බව පාසල් ප්‍රධානීන් මතක තබා ගත යුතුය. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින්, විශ්ව විද්‍යාලයන්හි විවිධ අධ්‍යයන පීඨයන්ට ඇතුළු වීම සඳහා නියම කර ඇති අවශ්‍යතා සලකා බලා සිය ශිෂ්‍යන්ට උපදෙස් දීම පාසල් ප්‍රධානීන්ගේ වගකීම වේ.

18.0 අ. පො. ස. (උ. පෙ.) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාව :

18.1 අ. පො. ස. (උ. පෙ.) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාව පහත දැක්වෙන අයුරු වේ.

(අ) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන්;

(ආ) අ. පො. ස. (උ. පෙ.) පන්ති නොමැති පාසල් වලින් හෝ අදාළ විෂය ධාරා නොමැති පාසල්වලින් පැමිණෙන සිසුන්;

(ඇ) උසස් පෙළ පන්තියට ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇති මැයි මස 01 වැනි දිනට වයස අවුරුදු 18ට අඩු වෙනත් සිසුන්.

16

ඒ. ඇන්ඩෲ ද සිල්වා
ලේකම්
ගරු ආචාර්ය රිචඩ් පතිරණ මැතිතුමා
අධ්‍යාපන අමාත්‍ය .

චක්‍ර . අං. 2001 /15
2001 . 05 . 29

18.0 අ.පො.ස. (උ.පෙ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාව

18.1 අ.පො.ස. (උ.පෙ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාව පහත දැක්වෙන අයුරු වේ.

(අ) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන්

(ආ) අ.පො.ස (උ.පෙ) පන්ති නොමැති පාසල්වලින් හෝ අදාළ විෂය ධාරා නොමැති පාසල්වලින් පැමිණෙන සිසුන්

(ඇ) උසස් පෙළ පන්තියට ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇති මස 01 වැනි දිනට වයස අවුරුදු 18ට අඩු වෙනත් සිසුන්

(ඈ) අ.පො.ස. ( සා. පෙළ. ) විභාගයට සමාන්තර සුදුසුකම් සහිත ප්‍රතිඵල ලබා ඇති ( අපගේ විෂය සංයෝජනයට අනුකූල වන පරිදි) වයස අවු. 18 ට අඩු විදේශගතව සිට පැමිණෙන සිසුන් (සහතික වල සමාන්තර භාවය පැහැදිලි නොවන විට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතුයි.)

පොදු කරුණු

20.0 (අ) පිළිගත හැකි හේතුවක් නොමැති ව ජාතික පාසලකින් ජාතික [illegible] ළමයින් ඇතුළත් නොකළ යුතු ය. මේ සම්බන්ධයෙන් යම්කිසි [illegible] හිංසාවකට හෝ හිංසයකුට හෝ අසාධාරණයක් වන්නේ යැයි [illegible] අමාත්‍යාංශයේ ලේකම් තීගමනය කළ අවස්ථාවක දී ඒ පිළිබඳ වි [illegible] පරිදි තීරණයක් ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා [illegible] ය.

(ආ) විදේශගත ව සිට පැමිණෙන ළමයකු ඒ රටේ අධ්‍යාපනය ලැබූ [illegible] [illegible]

වෛද්‍ය තාරා ද මැල්
ලේකම් .
ගරු ඒ. ඩී . සුසිල් ප්‍රේමජයන්ත් මැතිතුමා
අධ්‍යාපන අමාත්‍ය .

චක්‍ර. අං. 2003/23

2003.05.23

**18.0 අ.පො.ස. (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාව**

18.1 අ.පො.ස. (උ.පෙ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාව පහත දැක්වෙන අයුරු වේ.

(අ) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන් (චක්‍රලේඛයේ 17 වගන්තිය පරිදි සුදුසුකම් සපුරා ඇති සිසුන්)

(ආ) අ.පො.ස (උ.පෙ) පන්ති නොමැති පාසල්වලින් හෝ අදාළ විෂය ධාරා නොමැති පාසල්වලින් පැමිණෙන සිසුන්

(ඇ) උසස් පෙළ පන්තියට ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇති මැයි මස 01 වැනි දිනට වයස අවුරුදු 18ට අඩු වෙනත් සිසුන්

(ඈ) අ.පො.ස. (සා. පෙළ) විභාගයට සමාන්තර සුදුසුකම් සහිත ප්‍රතිඵල ලබා ඇති (අපගේ විෂය සංයෝජනයට අනුකූල වන පරිදි) වයස අවු. 18 ට අඩු විදේශගත ව සිට පැමිණෙන සිසුන් (සහතිකවල සමාන්තර භාවය පැහැදිලි නොවන විට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතු යි.)

**20.0 පොදු කරුණු**

(අ) පිළිගත හැකි හේතුවක් නොමැති ව ජාතික පාසලකින් ජාතික පාසලකට ළමයින් ඇතුළත් නොකළ යුතු ය. තවද එකම නගරයක තිබෙන ජාතික පාසලකින් තවත් ජාතික පාසලකට (අ.පො.ස (උ.පෙ) විෂය ධාරාව නොමැතිවීම නිසා වෙනත් පාසලකට යාම හැර) කිසිසේත් ම යාමට අවසරයක් නොමැත. මේ සම්බන්ධයෙන් යම්කිසි පාසලක ශිෂ්‍යයකුට හෝ ශිෂ්‍යාවකට හෝ අසාධාරණයක් වන්නේ යැයි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිගමනය කළ අවස්ථාවක දී ඒ පිළිබඳ ව සුදුසු පරිදි තීරණයක් ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

වී. කේ. නානායක්කාර

ලේකම්

ගරු ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මැතිතුමා

අධ්‍යාපන අමාත්‍ය.

චක්‍ර. අං. 2006/20

2006.05.23

**19.0 අ.පො.ස. (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාව**

19.1 අ.පො.ස. (උ.පෙ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාව පහත දැක්වෙන අයුරු වේ.

(අ) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන් (චක්‍රලේඛයේ 18.0 වගන්තිය යටතේ සඳහන් එක් එක් විෂයධාරාවට තිබිය යුතු අවම සුදුසුකම් සපුරා තිබේ නම් ඔවුන් එම විෂයධාරාව ඉල්ලුම් කළහොත් එය අනිවාර්යයෙන් ම ලබාදිය යුතු ය.)

(ආ) අ.පො.ස (උ.පෙ) පන්ති නොමැති රජයේ පාසල්වලින් හෝ අදාළ විෂය ධාරා නොමැති රජයේ පාසල්වලින් පැමිණෙන සිසුන්

(ඇ) උසස් පෙළ පන්තියට ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇති මැයි මස 01 වැනි දිනට වයස අවුරුදු 18ට අඩු වෙනත් සිසුන්

(ඈ) පිළිගත හැකි සාධාරණ හේතු ඉදිරිපත් කරන විෂයධාරා තිබෙන රජයේ පාසල්වල සිසුන්

(ඉ) අ.පො.ස. (සා. පෙළ) විභාගයට සමාන්තර සුදුසුකම් සහිත ප්‍රතිඵල ලබා ඇති (අපගේ විෂය සංයෝජනයට අනුකූල වන පරිදි) වයස අවු. 18 ට අඩු විදේශගත ව සිට පැමිණෙන සිසුන් (සහතිකවල සමාන්තර භාවය පැහැදිලි නොවන විට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතු යි.) අ.පො.ස. (උ.පෙ) පංති නොමැති හෝ අදාළ විෂයධාරා නොමැති ජාත්‍යන්තර පාසල්, පෞද්ගලික පාසල් සිසුන්.

ආරියරත්න හේවගේ

ලේකම්.

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත් මැතිතුමා

අධ්‍යාපන අමාත්‍ය.

**23.0 පොදු කරුණු**

(අ) පිළිගත හැකි හේතුවක් නොමැති ව ජාතික පාසලකින් ජාතික පාසලකට ළමයින් ඇතුළත් නොකළ යුතු ය. (5 ශ්‍රේණී ශිෂ්‍යත්වධාරීන් හැර) මේ සම්බන්ධයෙන් යම්කිසි පාසලක ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යාවකට හෝ අසාධාරණයක් වන්නේ යැයි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිගමනය කළ අවස්ථාවක දී ඒ පිළිබඳ ව සුදුසු පරිදි තීරණයක් ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

චක්‍ර. අං. 2008/17

2008.04.30

**4.0. 12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාව**

4.1 අ.පො.ස. (උ.පෙ) (12 ශ්‍රේණි) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාව පහත දැක්වෙන පරිදි විය යුතු ය.

(අ) එම පාසල් අපේක්ෂකයන් ලෙස විභාගයට පෙනී සිටි සිසුන් (චක්‍රලේඛයේ 2.0 වගන්තිය යටතේ සඳහන් එක් එක් විෂය ධාරාවට තිබිය යුතු අවම සුදුසුකම් සපුරා ගෙන ඔවුන් එම විෂයධාරාව ඉල්ලුම් කළහොත් එය අනිවාර්යයෙන් ම ලබාදිය යුතු ය).

(ආ) අ.පො.ස. (උ.පෙ.) පන්ති නොමැති රජයේ පාසල්වලින් හෝ අදාළ විෂයධාරා නොමැති රජයේ පාසල්වල සිසුන් (ජාතික පාසලකට සිසුන් ඇතුළත් කිරීමේ දී එම පාසල අයත් කලාපය තුළ උසස් පෙළ පන්ති නොමැති හෝ අදාළ විෂය ධාරාව හෝ ශිෂ්‍යා/ශිෂ්‍යාව ඉල්ලුම් කරන විෂය සංයෝජනය හෝ නොමැති ජාතික පාසල් නොවන පාසල්වලින් අයදුම් කරන සිසුන්ට ප්‍රමුඛතාව ලබා දිය යුතු ය).

(ඇ) පිළිගත හැකි සාධාරණ හේතු ඉදිරිපත් කරන විෂය ධාරා තිබෙන වෙනත් රජයේ පාසල්වල සිසුන්

(ඈ) අ.පො.ස. (සා.පෙ.) විභාගයට සමාන්තර සුදුසුකම් සහිත ප්‍රතිඵල ලබා ඇති (අපගේ විෂය සංයෝජනවලට අනුකූල වන පරිදි) විදේශගත ව සිට පැමිණෙන සිසුන් (සහතිකවල සමාන්තර භාවය පැහැදිලි නොවන විට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතු යි).

(ඉ) අ.පො.ස.(උ.පෙ.) පන්ති නොමැති හෝ අදාළ විෂයධාරා නොමැති ජාතික විෂය මාලාව උගන්වන පෞද්ගලික පාසල්වල සිසුන්. (අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් ඉල්ලුම් කළ යුතු ය.)

**9.0 පොදු කරුණු**

9.1 අ.පො.ස.(උසස් පෙළ) පන්තියකට ඇතුළත්වූ ශිෂ්‍යයෙක්/ශිෂ්‍යාවක් පිළිගත හැකි සාධාරණ හේතු ඉදිරිපත් කරන්නේ නම් පමණක් එක් පාසලකින් තවත් පාසලකට ඇතුළත් වීමට අනුමැතිය ලබා දිය හැකි ය. එසේ දිස්ත්‍රික්කයෙන් වෙනත් දිස්ත්‍රික්කයක පාසලකට ඇතුළත් වීමට බලාපොරොත්තු වන්නේ නම් සැබෑ වශයෙන්ම පදිංචිය වෙනස් කළ හා 6.0 වගන්තියේ සඳහන් කරුණුවලට පටහැනි නොවන්නේ ද යන්න පරීක්ෂා කර බලා අනුමැතිය ලබා දිය යුතුය. මෙහි දී ඇතුළත්වීමට බලාපොරොත්තු වන පාසලේ විදුහල්පතිගේ නිර්දේශය මත ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ ද අනුමැතිය දෙමව්පියන් විසින් ලබා ගත යුතුය.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර.

ලේකම්

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත්. මැතිතුමා

අධ්‍යාපන අමාත්‍ය

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

**චක්‍ර. අං. 1986 /2**

**1986 . 01 . 02**

4.2.5 සිංහල, දෙමළ, ඉංග්‍රීසි හෝ බුද්ධ ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය, ක්‍රිස්තු ධර්මය (රෝ.ක.) ක්‍රිස්තු ධර්මය (රෝ. ක. නොවන) යන කවර හෝ විෂයයක් ඉහත සඳහන් විෂය ධාරාවන් යටතේ හැදෑරීමට බලාපොරොත්තු වන ශිෂ්‍යයෙකු අ. පො. ස. (සා.පෙ.) විභාග යේදී එම විෂයයෙන් සම්මාන සමාර්ථයක් ලබා තිබිය යුතුය.

4.2.6 විද්‍යා විෂයධාරාව : නියමිත සම්මාන සාමාර්ථ තුනෙන් එකක් විද්‍යාවට හෝ ගණිතයට හෝ විය යුතුය. තවද, විද්‍යාව හා ගණිතය යන විෂයයන් දෙකෙන්ම සමත්වී තිබිය යුතුය.

4.2.7 දොළොස්වන වසරට ඇතුලත්වීමෙන් පසුව තමන් තෝරාගත් විෂයධාරාව වෙනස් කිරීමට ඉල්ලා සිටින ශිෂ්‍යයෙකුට එම වර්ෂය තුළදී අවශ්‍ය සුදුසුකම් ලබා තිබේනම්, එසේ කිරීමට ඉඩදිය හැකිය. මෙසේ ඉඩ දෙනු ලබන්නේ අ.පො,ස. (උ.පෙ.) පන්තිවල රැඳී සිටීමට උපරිම වශයෙන් ශිෂ්‍යයෙකුට ලැබෙන කාල සීමාව වර්ෂ තුනක් පමණක්ය යන කොන්දේසිය මතය. අනතුරුව පැවැත්වූ අ.පො.ස. (සා.පෙ.) විභාගයක ප්‍රතිඵල මත විෂයධාරාව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4.2.8. ඉහත දක්වා ඇති සුදුසුකම් නියමකර ඇත්තේ අ.පො.ස.(උ.පෙ.)පන්තිවලට ඇතුළත් කිරීම සඳහා පමණක් බව පාසල් ප්‍රධානීන් මතක තබා ගත යුතුය. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින්, විශ්ව විද්‍යාලයන්හි විවිධ අධ්‍යයන පීඨයන්ට ඇතුළුවීම සඳහා නියම කර ඇති අවශ්‍යතා සලකා බලා සිය ශිෂ්‍යයන්ට උපදෙස් දීම පාසල් ප්‍රධානීන්ගේ වගකීම වේ.

4.3 අ.පො.ස. (උ.පෙ.) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාවය

4.3.1. අ. පො.ස. (උ.පෙ.) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරාගැනීමේ ප්‍රමුඛ තාවය පහත දැක්වෙන අයුරු වේ:—

(අ) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන්;

(ආ) අ.පො.ස. (උ.පෙ. )පන්ති නොමැති පාසල් වලින් හෝ අදාල විෂයධාරාව නොමැති පාසල්වලින් පැමිණෙන සිසුන්;

(ඇ) උසස් පෙළ පන්තියට ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇති මැයි මස පළමුවැනි දිනට වයස අවුරුදු 18ට අඩු වෙනත් සිසුන්.

4.3.2 ඉහත 4.3.1 (ආ) හා (ඇ) යටතේ අ.පො.ස. (උ.පෙ.) පන්තියට ඇතුළුවීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම අයදුම්පත් ලේඛණගත කොට ප්‍රා.අ. අ. විසින් අනුමත ලකුණු දීමේ ක්‍රමයක් යටතේ තෝරා ගැනීම කළයුතුය. ලකුණු දීමේ ක්‍රමය අ.පො.ස. (සා.පෙ.) ප්‍රතිඵල හා විෂයානු බද්ධ ක්‍රියාකාරකම් පදනම් කරගෙන සකස් කර ගත යුතුය.

4.3.3 අ.පො.ස. (උ.පෙ. ) පන්ති නොමැති පාසල්වලින් සුදුසුකම් ලත් සියළුම සිසුන්ට අ.පො.ස. (උ. පෙ.) පන්ති ඇති පාසල්වලට ඇතුළුවීමට සලසාදීම ප්‍රා. අ. අ. ගේ. වගකීම වෙ.

4.4 අ.පො.ස. (උ.පෙ. )පන්තිවල අධ්‍යයනය කළ හැකි කාල සීමාව

4.4.1 අ. පො.ස. (උ.පෙ.) පාඨමාලාව 12 වන වසර 13 වන වසර යනුවෙන් දෑඅවුරුදු කාලසීමාවකට සාමාන්‍යයෙන් සීමා වේ.

4.4.2 ශිෂ්‍යයෙකු 12 වන වසර සම්පූර්ණ කළවිට 13 වන වසරට උසස් කළ යුතුවේ.

4.4.3 දහතුන්වන වසරේ සෑම ශිෂ්‍යයෙකුම එම වසර අවසානයේදී අ.පො.ස. (උ.පෙ.) විභාගයට ඉදිරිපත් කළ යුතුය.

ආර්. එල්. විජේමාන්න
ලේකම්

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා

---

දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary — 2784811

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ..............................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
"இசுருபாய" ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எமது இல: / My No. — ED/01/12/02/06/01

දිනය / திகதி / Date — 2012.05.03

චක්‍රලේඛ අංක 2012/14

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
රජයේ පාසල්වල හා අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන් වෙත.

**අ.පො.ස. (උසස් පෙල) පන්ති වලට සිසුන් ඇතුලත් කිරීම.**

අ.පො.ස. (උසස් පෙල) පංතිවලට සිසුන් ඇතුලත් කිරීම පිළිබඳව මීට පෙර නිකුත් කර ඇති 2008.04.30 දිනැති අංක 2008/17 දරණ චක්‍රලේඛයට හා 2008.12.31 දිනැති අංක 2008 /17(1) හා 2009.06.02 දිනැති අංක 2008/17(II) මගින් නිකුත් කරන ලද සංශෝධනයන්ට අමතර වශයෙන් පහත සඳහන් සංශෝධන ද ඇතුලත් කරමි.

02. අංක 2008/17 චක්‍රලේඛයේ 4.0 හි 12 ශ්‍රේණියට සිසුන් ඇතුලත් කිරීමේ ප්‍රමුඛතාවය පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

4.0 12 ශ්‍රේණියට සිසුන් ඇතුලත් කිරීමේ ප්‍රමුඛතාවය

4.1 අ.පො.ස (උසස් පෙල) (12 ශ්‍රේණි) පන්තිවලට සිසුන් ඇතුලත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාවය පහත දැක්වෙන පරිදි විය යුතුය.

(අ) එම පාසලේ අපේක්ෂකයන් ලෙස විභාගයට පෙනී සිටි සිසුන් (චක්‍රලේඛයේ 2.0 වගන්තිය යටතේ සඳහන් එක් එක් විෂයධාරාවට තිබිය යුතු අවම සුදුසුකම් සපුරා ගෙන ඔවුන් එම විෂයධාරාව හැදෑරීම සඳහා ඉල්ලුම් කලහොත් එය අනිවාර්යයෙන් ම ලබාදිය යුතුය.)

(ආ) අ.පො.ස. (උසස් පෙල) පන්ති නොමැති රජයේ පාසල්වල හෝ අදාල විෂයධාරාව නොමැති රජයේ පාසල්වල හෝ අදාල මාධ්‍ය නොමැති රජයේ පාසල්වල සිසුන්

(ඇ) අ.පො.ස.(සාමාන්‍ය පෙල) විභාගයට සමාන්තර සුදුසුකම් සහිත ප්‍රතිඵල ලබා ඇති (අපගේ විෂය සංයෝජනවලට අනුකූල වන පරිදි) විදේශගතව සිට පැමිණෙන සිසුන් (සහතික වල සමාන්තරතාවය පැහැදිලි නොවන විට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කල යුතුය)

(ඈ) අ.පො.ස. (උසස් පෙල) පන්ති නොමැති හෝ අදාල විෂයධාරා නොමැති ජාතික විෂය මාලාව උගන්වන පෞද්ගලික පාසල්වල සිසුන් (අදාල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ඉල්ලුම් කල යුතුය.)

(ඉ) ඉගෙනුම ලබන පාසලේ ඉල්ලුම් කරන විෂය ධාරාව හා මාධ්‍ය පවත්නා අවස්ථාවක වෙනත් පාසලක එම විෂය ධාරාවට හෝ මාධ්‍යය සඳහා සිසුවකු ඉල්ලුම් කරන්නේ නම් එම සිසුන් ඇතුලත් නොකල යුතුය. එහෙත් තම පාසල්වල තව දුරටත් පුරප්පාඩු පවතින්නේ නම් දුෂ්කර ප්‍රදේශ වලින් අයදුම් කරන විශේෂ දක්ෂතා ඇති සිසුන් හා ස්ථාන මාරුවීම් ලැබ පදිංචිය වෙනස් කරන රජයේ නිලධරයන්ගේ දරුවන් ඇතුලත් කර ගත හැකිය.

එසේම 4.2, 4.3, 4.4 හා 4.5 නොවෙනස්ව පවතින අතර 4.5 ට පහතින් සඳහන් සැ.යු. යනුවෙන් සඳහන් ජේදය ඉවත් කරනු ලැබේ.

ඉහත සඳහන් කරන ලද සංශෝධනයන්ට අනුව අංක 2008/17 චක්‍රලේඛය මින් ඉදිරියට ක්‍රියාත්මක කල යුතු අතර එම චක්‍රලේඛයේ හා පලමු ජේදයේ සඳහන් සංශෝධනයන්හි අඩංගු අනෙකුත් කරුණු සියල්ල එලෙසම බලපැවැත්වෙන බව අවධාරණය කරමි. තව ද මෙම චක්‍රලේඛ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන විදුහල්පතිවරුන්ට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගනු ලබන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

එච්. එම්. ගුණසේකර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:
1.ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
2.ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3.විභාග කොමසාරිස් ජනරාල්
4.අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
5.විගණකාධිපති
6.අධ්‍යාපන අමාත්‍යාශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්
7.අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම ශාඛා ප්‍රධානීන්
8.රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන්

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා
අධ්‍යාපන අමාත්‍ය

දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
Minister 2784832 Fax: 2784825
Secretary 2784812
Office 2785141-50 Fax: 2784846
E-mail: isurupaya@moe.gov.lk
Your No. ..................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය" Battaramulla
My No. ED/01/12/02/06/0
Date 2013.04.29

චක්‍ර ලේඛ අංක 2013/4

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාශ භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
රජයේ පාසල් වල හා අනුමත පෞද්ගලික පාසල් වල ප්‍රධානීන් වෙත.

<u>අ.පො.ස.(උසස් පෙළ) පන්ති වලට සිසුන් ඇතුළත් කිරීම</u>

01. අ.පො.ස.(උසස් පෙළ) පංතිවලට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳව මීට පෙර නිකුත් කර ඇති, 2008.04.30 දිනැති අංක 2008/17 දරණ චක්‍රලේඛය හා එයට අදාළව නිකුත් කර ඇති 2008.12.31 දිනැති අංක 2008/17 (1) හා 2009.06.02 දිනැති අංක 2008/17 (11) දරණ සංශෝධනයන්ට අමතරව 2012.05.03 දිනැති 2012/14 දරණ චක්‍රලේඛයෙ හි 4.0 වගන්තියේ 12 වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාවය සඳහන් 4.1 උපවගන්තිවල (ආ), (ඇ), (ඈ) හා (ඉ) යන උපවගන්ති පහත සඳහන් අයුරින් සංශෝධනය කරමි.

02. ඒ අනුව අ.පො.ස. (උසස් පෙළ) පන්ති වලට සිසුන් ඇතුළත් කිරීම පහත පරිදි සිදු කළ යුතුය.

03. 2012/14 චක්‍රලේඛයේ 4.0 වගන්තියට අනුව 12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාවය පහත පරිදි විය යුතුය.

(අ) එම පාසලේ අපේක්ෂකයන් ලෙස විභාගයට පෙනී සිටි සිසුන් (චක්‍රලේඛයේ 2.0 වගන්තිය යටතේ සඳහන් එක් එක් විෂය ධාරාවට තිබිය යුතු අවම සුදුසුකම් සපුරා ගෙන ඔවුන් එම විෂය ධාරාව හැදෑරීම සඳහා ඉල්ලුම් කළහොත් එය අනිවාර්යයෙන්ම ලබාදිය යුතුය.)

(ආ) එකම 1 AB (උසස් පෙළ විද්‍යා, කලා, වාණිජ්‍ය) පාසලක් හෝ නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල පිහිටි පාසල් වලින් අතිවිශිෂ්ඨ ලෙස සාමාන්‍ය පෙළ ප්‍රතිඵල ලබා ඇති ග්‍රාමීය පාසල් වල සිසුන්

(ඇ) (අ) හා (ආ) යන වගන්ති වලට අනුව සිසුන් ඇතුළත් කිරීමෙන් පසු තවදුරටත් පුරප්පාඩු පවතී නම් පාසල පිහිටි දිස්ත්‍රික්කයේ 1 AB නොවන පාසල් වලින් විශිෂ්ඨ ලෙස සමත් වූ සිසුන්

(ඉ) මෙම අනුපිළිවෙලට සිසුන් ඇතුළත් කිරීමෙන් පසු උසස් පෙළ සියළු විෂය ධාරා යටතේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව හා උසස් පෙළ ගුරුභවතුන් පංති වලට අනුයුක්ත කිරීම පිළිබද පූර්ණ වාර්තාවක් විදුහල්පතිගේ අත්සනින් අගෝස්තු 31 වන දිනට ප්‍රථම පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන ලේකම් වෙත ද/ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යක්ෂක වෙත ද වාර්තා කළ යුතුය.

04. ඒ අනුව උසස් පෙළ පංතිවලට සිසුන් ඇතුළත් කිරීමට අදාළව නිකුත් කර ඇති 2008/17, 2008/17(1) හා 2008/17(11) හා 2012/14 යන චක්‍රලේඛයන් හි අන් උපදෙස් නොවෙනස්ව එලෙසින්ම පවතින බව වැඩි දුරටත් දන්වමි. මෙම චක්‍රලේඛ විධි විධාන උල්ලංඝනය කරනු ලබන විදුහල්පතිවරුන්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියාමාර්ග ගනු ලබන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්. එම්. ගෝඨාභය ජයරත්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා
අධ්‍යාපන අමාත්‍ය.

***[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This annex is also placed in the Library.]*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා.

## පොහොර හිඟය හේතුවෙන් ගොවීන් මුහුණදෙන දුෂ්කරතා : කෘෂිකර්ම අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## உரம் பற்றாக்குறையினால் விவசாயிகள் எதிர்நோக்கும் கஷ்டங்கள் : கமத்தொழில் அமைச்சரினது கூற்று
## DIFFICULTIES FACED BY FARMERS DUE TO FERTILIZER SHORTAGE : STATEMENT BY MINISTER OF AGRICULTURE

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා 2013.07.09වන දින පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නයට මා පිළිතුර දෙනවා.

එතුමා අසා තිබුණු පළමුවන ප්‍රශ්නය මෙයයි. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පොහොර ආනයනය සැලැස්ම සංශෝධනය කිරීමට තීරණය කරන ලද්දේ කවර විද්‍යාත්මක නිර්ණායක උපයෝගී කර ගනිමින්ද?

එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනතේ 3වන වගන්තියට අනුව ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයාට තාක්ෂණික වශයෙන් උපදෙස් ලබා දීමට පොහොර උපදේශන කමිටුව පිහිටුවා ඇති අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බතලගොඩ වී පර්යේෂණ ආයතනයේ වී සම්බන්ධ විශේෂඥයින් විසින් කරන ලද පර්යේෂණවල ප්‍රතිඵල පාදක කර ගනිමින් පොහොර උපදේශන කමිටුව විසින් වී සඳහා පොහොර නිර්දේශය සංශෝධනය කරන ලදි. මෙතෙක් භාවිතා කළ පොහොර නිර්දේශය 2005 වර්ෂයේ සකසන ලද අතර, ඊට ප්‍රධානම සාධකය ලෙස සලකන ලද්දේ ශ්‍රී ලංකාව සහල්වලින් ස්වංපෝෂිත කිරීම සහ උපරිම අස්වැන්න ලබා ගැනීමය. එහෙත් නව නිර්දේශය සඳහා පාදක කර ගනු ලැබුවේ ගොවියාගේ ලාභාංශය අඩු නොකර, පාරිසරික හා සෞඛ්‍ය හිතකර ලෙස උපරිම අස්වැන්න ලබා ගැනීමය. ලංකාවේ ඇති රජරට වකුගඩු රෝගය හා අනෙකුත් රෝගාබාධවලට කෘෂි රසායනික ද බලපාන බවට සැක සහිත බවට ලෝක සෞඛ්‍ය සංවිධානය අදහස් දක්වා ඇත. නව නිර්දේශය රසායනික පොහොරවල කාර්ක්ෂමතාවය ඉහළ නංවා ගැනීම සඳහා අවධානය යොමු කර ඇති බැවින් යොදන පොහොර ප්‍රමාණවල වෙනසක් සිදු වී ඇතත්, අස්වැන්න අඩු නොවන බවට පර්යේෂණාත්මක දත්ත මගින් ඔප්පු කර ඇත. මෙම නිගමනය සඳහා දිවයින පුරා පවත්වන පර්යේෂණවල දත්ත පාදක කර ගන්නා ලදි. මේ සඳහා පත්‍ර වර්ණ දර්ශකය ද , ඒකාබද්ධ පෝෂණ මාධ්‍යය ද, කාබනික පොහොර භාවිතය ද, උනන්දු කරවීමේ තාක්ෂණය ද ඇතුළත් කර ඇත. එසේම නව පොහොර අවශ්‍යතාවය පවතින පොහොර තොග ප්‍රමාණයන් ද සැලකිල්ලට ගනිමින් පොහොර ආනයනික සැලැස්ම සංශෝධනය කරන ලදි.

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

එතුමාගේ දෙවන ප්‍රශ්නය මෙයයි. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් පොහොර ආනයනය කප්පාදු කිරීමට නිර්දේශ කිරීමේදී සලකා බලා ඇති නිර්ණායකයන් කවරේ ද?

එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් පොහොර ආනයනය කප්පාදු කිරීමක් සිදු කර නොමැත.

එතුමාගේ 3වන ප්‍රශ්නය මෙයයි. පෙබරවාරි සහ මාර්තු මාසවලදී සිදු කළ යුතු වූ ණයවර ලිපි විවෘත කිරීම ජූනි මාසය දක්වා කල්යාමට හේතු කවරේද?

එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. රාජ්‍ය පොහොර සමාගම සතු ප්‍රමාණවත් පොහොර තොග පැවතීම මත පොහොර ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීම ජූනි මස දී සිදු කරන ලදි. තවද, නියමිත කාලයට පෙර පොහොර තොග ආනයනය කිරීම තුළින් රටේ විදේශ විනිමය සැලකිය යුතු ප්‍රමාණයක් අනවශ්‍ය ලෙස අහුරා තැබීමට සිදු වෙයි.

එතුමාගේ 4වන ප්‍රශ්නය මෙයයි. 2013 වර්ෂය සඳහා ක්වෝටාවලට නියමිත පොහොර ලංකාවට ආනයනය සහතික කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?

එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. දැනටමත් 2013 ඉදිරි පොහොර අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා පෞද්ගලික සමාගම්වලට අවශ්‍ය ක්වෝටා ලබා දීම සිදු කර ඇත. ක්වෝටා ප්‍රමාණයන් දීමට අවශ්‍ය වන්නේ, දේශීය අවශ්‍යතාවය නිර්ණය කර ගැනීම -වැව්ලි සහ අනෙකුත් භෝග සඳහා- සහ නිසි පාලනයක් සිදු කර ගැනීම යන කරුණු සඳහා ය. දැනට ලබා දුන් ක්වෝටා ප්‍රමාණය තීරණය කරන ලද්දේ ඉහත කරුණු හා එම ආයතනය විසින් 2012 වර්ෂයේ ආනයනය කරන ලද පොහොර ප්‍රමාණයන් ද සැලකිල්ලට ගනිමිනි. කෙසේ නමුත් අදාළ පෞද්ගලික සමාගම්වලට ආනයනික සැලැස්ම ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇති අතර, ඒ අනුව පොහොර ආනයනය සිදුවේ ද යන්න සනාථ කර ගැනීම සඳහා ප්‍රගති සමාලෝචන සැම කාර්තුවකදීම සිදු කිරීමට කටයුතු යොදා ඇත. දෙවන කාර්තුවේ රැස්වීම ජූලි 15වන දින පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර ඒ අනුව පොහොර නියමිත පරිදි ආනයනය සහතික වීම සඳහා අවශ්‍ය සංශෝධන සිදු කරනු ඇත. ඒ අනුව වර්ෂයට අදාළ පොහොර ප්‍රමාණය නියමිත කාල සීමාවන්වලදී ආනයනය කිරීම සහතික කෙරේ.

එතුමාගේ 5 වන ප්‍රශ්නය මෙයයි. ලෝක වෙළඳ පොළේ පොහොර මිල ගණන් වෙනස් වීමට අනුව සමාගම් වෙත සහනාධාර ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රමවේදයක් සැකසිය නොහැක්කේ මන්ද?

එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. භාණ්ඩාගාරයේ ප්‍රධානත්වයෙන් අදාළ සියලු පාර්ශ්ව නියෝජනය වන පරිදි පෞද්ගලික අංශයේ පොහොර ආනයනය කරන සමාගම්වල පොහොර ආනයනය සහ බෙදා හැරීමේ වියදම ප්‍රතිපූර්ණය කිරීමේ ප්‍රමාණය තීරණය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. මෙම කමිටුව මඟින් පොහොර ආනයනය කරනු ලබන විදේශ විනිමය ප්‍රමාණය මෙන්ම දේශීය වියදම් ප්‍රමාණය ද තීරණය කරනු ලබයි. අදාළ ආනයනික වියදම තීරණය කිරීමේදී ඔවුන් විසින් දරන ලද ආනයනය කිරීමේදී වැය වූ මුදල ද ලෝක වෙළඳපොළේ පොහොර මිල ගණන් උච්චාවචනයන් හා රාජ්‍ය පොහොර සමාගම් ආනයනය සඳහා වැය වන මිල ගණන් ද සැලකිල්ලට ගනු ලබයි.

එතුමාගේ 6වන ප්‍රශ්නය මෙයයි. පොහොර හිඟය සහ එම ප්‍රමාදය හේතුවෙන් ගොවීන්ගේ අස්වැන්නට ඇති වන අහිතකර බලපෑමට වගකීම භාර ගන්නේ කවුරුන් විසින් ද ? අස්වනු හානි වී ඇත්නම් ගොවීන්ට හානිපූර්ණ වන්දි ප්‍රදානයක් සිදු වනු ඇත්ද?

එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. අස්වැන්නේ කිසිම අඩු වීමක් හෝ ප්‍රමාදයක් හෝ සිදු වන්නේ නැති බවට සහතික වෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා.

## වරප්‍රසාද : "ලංකාදීප" සහ "අද" යන පුවත් පත්හි සහ "ඔත්තුකරු" වෙබ් අඩවියේ පළ වූ වාර්තා
## சிறப்புரிமை : 'லங்காதீப' மற்றும் 'அத' பத்திரிகைகள் மற்றும் 'ஒத்துகரு' இணையத் தளத்தில் வெளியான அறிக்கைகள்
## PRIVILEGE: REPORTS IN "LANKADEEPA" AND "ADA" NEWSPAPERS AND "OTHTHUKARU" WEBSITE

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා ( ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத் துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මස 09වන දින සහ 10වන දින "ලංකාදීප" සහ "අද" කියන පුවත් පත් දෙකේත් ඒ වාගේම "ඔත්තුකරු" නම් වෙබ් අඩවියේත් සඳහන් වුණු ප්‍රවෘත්තියක් පිළිබඳව මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ අමාත්‍යවරයෙකුගේ සහෝදරයෙක් පොලීසියේ අණ නොතකා රිය ධාවනය කළාය කියාත්, ඉහළ බලපෑමකින් ඔහුව නිදහස් කළාය කියාත් මේ පුවත් පත් දෙකේ සඳහන් කර තිබුණා. ඒකට මගේ නම සඳහන් කර තිබුණා. මේ පිළිබඳව "අද"පත්තරයේ ප්‍රධාන කර්තෘ චමින්ද කියා මහත්මයෙක් මට දුරකථනයෙන් කථා කර කිව්වා, ගම්පහ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා විසින් දෙන ලද දුරකථන ඇමතුමක් පදනම් කර ගෙන තමයි මෙසේ සඳහන් කළේ කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ සහෝදරයා ඉන්නේ විදේශ ගත වෙලායි. ඒ නිසා මෙය සම්පූර්ණ අසත්‍ය තොරතුරක්. පළමුවන කාරණය, පොලිස් නිලධාරියෙකුට මාධ්‍යයකට එවැනි ප්‍රකාශයක් කරන්නට බැහැ.

දෙවැනි කාරණය මෙයයි. මෑත කාලයේදී මාධ්‍ය විසින් සංවිධානාත්මකව රජයේ අමාත්‍යවරුන්ට විරුද්ධව යම් යම් ප්‍රචාර කළ ආකාරය අප දැක්කා. මේවා අභූත චෝදනායි. ඔවුන් පොඩි සිද්ධියක් මුල් කරගෙන එය මහා ලොකුවට පෙන්වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රවෘත්තිය වැරැදියි කියලා මම "අද" පුවත් පතේ කර්තෘවරයාට කියද්දිත් ඔහු මෙය පළ කර තිබුණා. ඒ නිසා මෙය සම්පූර්ණ වැරැදි දෙයක්. මගේ සහෝදරයෙක් ලංකාවේත් නැහැ. එවැනි සිද්ධියක් වෙලාත් නැහැ.

පසු ගිය කාලයේ දිගින් දිගටම මේ විදියට සුළු සිද්ධීන් මුල් කරගෙන අමාත්‍යවරුන්ට චෝදනා එල්ල කරමින්, මහා ලොකුවට ඒවා මාධ්‍යවලින් හුවා දක්වපු ආකාරය අප දැක්කා. එපමණක් නොවෙයි, මාධ්‍ය විසින් අසත්‍ය ප්‍රවෘත්ති හදලා රජය අපහසුතාවට පත් කරන්න කටයුතු කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ පිළිබඳව පොලිස්පතිතුමාට පැමිණිල්ලක් කළා. ඒ වාගේම මාධ්‍යයත් මේ පිළිබඳව දැනුවත් කරන මෙන් මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මේ කාරණය ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කොට වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කිරීමට කටයුතු කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය කුමක්ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා එතුමා පිළිබඳව මාධ්‍යයක පළ වූ ප්‍රවෘත්තියක් ගැන තමයි මේ කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් මේ කාරණය අහනවා. අප කවුරු හෝ කෙනෙක් පිළිබඳව, මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ වේවා විපක්ෂයේ වේවා යම් මන්ත්‍රීවරයකු හෝ ඇමතිවරයකු පිළිබඳව කවර හෝ මාධ්‍යයක යමක් කියනවා නම් ඒ පිළිබඳ අපට පාර්ලිමේන්තුවේ මතු කළ හැකිද? එසේ නම් ගරු ඇමතිතුමනි-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එය point of Order එකක් නොවෙයි ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එහෙමනම් අපටත් දෙන්න ඕනෑ-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට මූලාසනයෙන් ප්‍රශ්න කළ නොහැකියි. ඒ සම්බන්ධව පක්ෂ නායක රැස්වීමේදී ප්‍රශ්න කිරීමට කටයුතු කරන ලෙස මා ඔබතුමාට දැනුම් දෙනවා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 5.30 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## උපදේශක කාරක සභා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEES

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2013 පෙබරවාරි මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 'තාක්ෂණ, පර්යේෂණ හා පරමාණු බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව', 'තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව' යනුවෙන් හැඳින්විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### இலங்கை நிர்மாணக் கைத்தொழில் சம்மேளனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### CHAMBER OF CONSTRUCTION INDUSTRY OF SRI LANKA (INCORPORATION) BILL

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු ජානක බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஜானக பண்டார)
(The Hon. Janaka Bandara)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.*

*වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙත පවරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள்*

*அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Construction, Engineering Services,*

*Housing and Common Amenities for report.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
යෝජනා අංක 4. ගරු රෝසි සේනානායක මහත්මිය පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රෝසි සේනානායක මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරන එම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ස්ථාවර නියෝග ප්‍රකාරව සිදු විය යුතුයි. එනම්, පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් පනතක් සංශෝධනය කිරීමට හෝ අලුතින් පනතක් හැටියට ගෙනෙන විට එය Attorney -General විසින් පරීක්ෂණයට ලක් කළ යුතුය කියන කාරණය අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77වැනි ව්‍යවස්ථාවේ ඉතා පැහැදිලිව සඳහන් වෙනවා. එය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලත් අඩංගුයි, පනතක් එසේ සංශෝධනය කරන්නේ නම් එසේ සිදු විය යුතුය කියලා. අප දන්නා ආකාරයට මේ පනත් කෙටුම්පත පිළිබඳව නීතිපතිතුමාගේ observation එකක් හෝ අනුමැතියක් සහිත ලිපියක් ලැබිලා නැහැ. එවැනි තත්ත්වයක් තුළ මේ පනත් කෙටුම්පත අද දිනයේ ඉදිරිපත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරවත්, පාර්ලිමේන්තුව අනුගමනය කරන සම්ප්‍රදාය ප්‍රකාරවත් වැරැදියි.

අප පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනෙන විට නීතිපතිතුමාගේ සහතිකයක් සහිතව තමයි පාර්ලිමේන්තුවට එවනු ලබන්නේ. ඒක අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව අප අනුගමනය කරන පිළිවෙතයි. එසේ නොමැතිව නීතියක් සකස් කිරීමට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට හෝ එයට ආනුෂංගික වගන්තියක් සංශෝධනය කිරීමට මේ ගරු සභාවට ඉදිරිපත් කළ නොහැකියි. ඒ නිසා මේ රීතිමය ප්‍රශ්නය මා මතු කරන්න කැමැතියි. එතුමිය ගේන අදහස ගැන නොවෙයි, Attorney-Generalවරයාගේ පරීක්ෂණය හෝ නිරීක්ෂණ වාර්තාවක් නොමැතිව මේ පනත් කෙටුම්පත අද දිනයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට යෝජනාවක් තමයි මේ ගෙනැවිත් තිබෙන්නේ. ඒ නිසා දැන් මෙය නීතිපතිතුමාට යොමු කරන්නට පුළුවන්. එතුමාගේත් අදහස් ලබා ගෙන, එය දෙවැනි වර කියැවීම කරනවාද, නැද්ද කියන එක තීරණය කරන්නට පුළුවන්. ඒක ප්‍රශ්නයක් නොවෙයි නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා විසින් පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කරුණු ගණනාවක් සඳහන් කළා. හැබැයි, පාර්ලිමේන්තු රැස්වීම් පැවැති පසු ගිය දිනක ගරු අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ලෙස "විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත" මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එම පනත් කෙටුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදීත් නීතිපතිවරයාගේ එවැනි අනුමැතියක් හෝ ලියැවිල්ලක් තිබුණු බවක් අපට දැන ගන්නට නැහැ. එහෙම තිබුණාද කියලා මා දැන ගන්න කැමැතියි. ඒ නිසා කරුණාකරලා ඒ අවස්ථාවේ දී එහෙම අනුමැතියක් තිබුණාද කියන එකත් කියන්න. එසේ නැතිව විපක්ෂයේ මන්ත්‍රීතුමියක් හෝ මන්ත්‍රීතුමෙක් -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක මගෙන් නොවෙයි අහන්න ඕනෑ. ඒ අයගෙන් අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, ඒ අයගෙන් තමයි අහන්නේ. ඔබතුමා අද වාගේම ඒ වෙලාවේ ඒ ප්‍රශ්නය ඇහුවේ නැත්තේ ඇයි? එහෙම නම් ඒ වෙලාවේත් අහන්න එපායැ මෙහෙම අනුමැතියක් තිබෙනවාද කියලා. එහෙම නම් ඔබතුමා මොකක්ද මේ කරන්නේ? මේ කරන දේ සාධාරණ නැහැ නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා මගෙන් නම් ඒ ප්‍රශ්නය අහන්නේ, මම ඒකට උත්තර දෙන්නම්. එවැනි ප්‍රශ්නයක් තිබේ නම් යොමු කළ යුත්තේ ගරු කථානායකතුමාට හෝ මූලාසනයට.[බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න. මන්ත්‍රීවරයකු අතින් වැරැද්දක් සිදුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය හරියාකාර නීති උපදෙස්

ලැබෙන්න ඕනෑ. ඒ අනුව මන්ත්‍රීවරයෙකුට කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. හුඟක් වැරැදි දේවල් පාර්ලිමේන්තුවෙන් කරලා තිබෙනවා. ඒ කරපු හැම වැරැද්දක්ම ඒවා හරි කියලා කියන්න බැහැ. [බාධා කිරීමක්] ඔව්, ඒක තමයි තමුන්නාන්සේට දෙන උත්තරය. [බාධා කිරීමක්]

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීමට යෝජනා කරන්නේ, සියයට 30කින් පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය වැඩි කරන්න කියලා යි. සියයට 20ක අපේක්ෂකත්වය තරුණයන්ට ලබා දෙන්න කියලායි. කාන්තා නියෝජනය වැඩි කරන්න කියලා ඉල්ලන නිසාද මට මේ සඳහා නීතිපතිගෙන් අවසර ලබා ගෙන එන්න කියන්නේ? මා දැන් දැනුවත් වුණු ආකාරයට පසු ගිය පාර්ලිමේන්තු රැස්වීම් පැවැති සතියේ ගරු අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් ගෙන ඒම සඳහා ඉදිරිපත් කළ පනත් කෙටුම්පත පිළිගත්තා නම්, මේක පිළිගන්න බැරි ඇයි? කාන්තා නියෝජනය සියයට 30කින් වැඩි කරන්නට ඉල්ලන නිසාද මෙය ඉදිරිපත් කරන්න බැහැ කියන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉදිරිපත් කළ කාරණාව නීතිමය කාරණාවක්. මම ඉතාම ගෞරවයෙන් ගරු මන්ත්‍රීතුමියට කිව්වා, එතුමිය ඉදිරිපත් කරන කාරණාව පිළිබඳව නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ කියලා. ඔබතුමියට ඒ පිළිබඳව ඕනෑකමක් තිබුණා නම්, අපේ විශේෂ කාරක සභාවෙන් පනත සංශෝධනය කර එවපු අවස්ථාවේ, ඔබතුමියටත්, එක්සත් ජාතික පක්ෂයටත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න හැකියාව තිබුණා. මොකද, අපි ඒ අවස්ථාවේ ඇහුවා, සියයට කීයක කාන්තා නියෝජනයක්ද මෙයට ඇතුළත් කළ යුත්තේ කියලා. එදා එක්සත් ජාතික පක්ෂය එක වචනයක් නොවෙයි, වචන පහක් දුන්නා. ඒ නිසා ඒ වගන්තිය ඇතුළත් කර ගන්න බැරි වුණා. අද සියයට 30කින් කාන්තා නියෝජනය වැඩි කරන්නය කියලා කරන ඉල්ලීම අපි තවම දැකලා නැහැ. මේ පනත් කෙටුම්පත ගැන නොවෙයි මා කථා කරන්නේ. මේ පාර්ලිමේන්තුවේ අනුගමනය කළ යුතු පිළිවෙත උල්ලංඝනය කරනවා නම්, ඒ පිළිබඳව ගරු කථානායකතුමා යම් කිසි අර්ථ නිරූපණයක් කළ යුතුයි. ඊට පස්සේ ඕනෑ දෙයක් කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 47 වැනි ස්ථාවර නියෝගය කෙරෙහි මා ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ස්ථාවර නියෝග අනුව මේ පාර්ලිමේන්තුවේ කටයුතු මෙහෙයවන්න අපි බැඳී සිටිනවා. එතකොට, සම්ප්‍රදායක් ලෙස ස්ථාවර නියෝග උපයෝගී කර ගන්නවා නම්, තමන් කැමැති ක්‍රියාවලියක දී ඒ ස්ථාවර නියෝග ප්‍රශ්නයක් කර නොගන්නත්, තමන් අකමැති ක්‍රියාවලියක දී ඒ ස්ථාවර නියෝග ප්‍රශ්නයක් කර ගන්නත් තිබෙන සම්ප්‍රදාය හොඳ නැහැ. මෙම සම්ප්‍රදාය සකස් විය යුත්තේ තමන්ගේ කැමැත්ත, අකැමැත්ත අනුව නොවෙයි. තමන් එකඟද, එකඟ නොවනවාද කියන තත්ත්වය මත නොවෙයි. ඒ සඳහා පොදු සම්ප්‍රදායක් තිබිය යුතුයි; පොදු රීති පද්ධතියක් තිබිය යුතුයි. එක පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනකොට එවැනි ප්‍රශ්නයක් පැන නොනැඟීමත්, තවත් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ දී එවැනි ප්‍රශ්නයක් පැන නැඟීමත් කිසිසේත්ම සාධාරණීකරණය කළ නොහැකියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමා ඒ පිළිබඳව සැලකිල්ලට ලක් කරන්න. එහෙම නැතිව තමන්ට කන්න හිතෙනකොට කබරගොයත් තලගොයා කර ගැනීමේ න්‍යාය සාධාරණ නැහැ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Yes, Hon. Azwer.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Deputy Speaker, this is a very serious matter because this Bill is with regard to Constitutional provisions of this Legislature. The Local Authorities Elections Ordinance is already there in the Legislative Enactments. This is very important. The Legislative Enactments of the Democratic Socialist Republic of Sri Lanka, Volume -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

What is the point you are raising, Hon. Azwer?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

The point I am raising is, this Ordinance is already there in the Legislative Enactments. Give me one moment, Sir, I will substantiate my point. What is there in the Legislative Enactments cannot be repealed or amended through a Private Member's Bill in the House. No Private Member has that right, whether the Hon. (Mrs.) Rosy Senanayake is rosy, pink or reddish is not the problem. I am only pointing out that you cannot bring in a Private Member's Bill before the House to amend the Legislative Enactments because those are already in books.

Sir, this is what Article 78 (2) of the Constitution states in this regard. Let this be included in Hansard so that people will know it. I quote:

> "The passing of a Bill or a resolution by Parliament shall be in accordance with the Constitution and the Standing Orders of Parliament. Any one or more of the Standing Orders may be suspended …"

That is required at a later stage.

Now, this Ordinance is already there in the Legislative Enactments. So, how can you amend a Legislative Enactment which is printed and distributed to all the Members? If you want to do so, it will be a Constitutional amendment and that has to be moved in a separate way. There is a procedure to be followed. Sir, even the authority on Parliamentary Practice and Procedure, Erskine May, himself has distinguished very clearly the

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

positions with regard to Bills presented by Government, Bills regarding Constitutional amendments and also Legislative Enactments. My submission is, Sir -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Your point is taken.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Thank you very much.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැන ගැනීමට කැමැතියි මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ අවසරය මට තිබෙනවාද නැද්ද කියලා. විශේෂයෙන්ම දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ කථාවට මම කාරණයක් එකතු කරන්නට කැමැතියි. එතුමා කිව්වා, මෙම පනත් කෙටුම්පත සංශෝධනය වන අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂය කාන්තා නියෝජනය පිළිබඳව කථා කළේ නැහැ කියලා. පක්ෂ නායකයන්ගේ රැස්වීමට මාත් ගියා. ඒ අවස්ථාවේදී බැසිල් රාජපක්ෂ මැතිතුමාත් කථා කළා. ඒ අවස්ථාවේදී මමත්, සජිත් ප්‍රේමදාස මැතිතුමාත් කාන්තා නියෝජනය වැඩි කරන්න, තරුණ නියෝජනය වැඩි කරන්න කථා කළාම කිව්වා, "අපි දැන් මේ තිබෙන විධියට සංශෝධනය කරමු. පසුව ඒකට සංශෝධන ඇතුළත් කරන්න පුළුවන්" කියලා. ඒ මතය තමයි එදා තිබුණේ. ඒ හේතුව නිසායි මම මේ සංශෝධනය ගෙනාවේ. මට මෙය ඉදිරිපත් කරන්නට අවසර තිබෙනවාද, නැද්ද කියලා දැනගන්න කැමැතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමිය, මේ සම්බන්ධයෙන් විරෝධතාවක් පැන නැඟී ඇති බැවින්, ඒ පිළිබඳව පරීක්ෂා කර බලා මීළඟ පාර්ලිමේන්තු සතියේ මෙය ඉදිරිපත් කිරීමට ඔබතුමියට අවස්ථාව ලබා දෙනවා.

## මර්කස් සකාෆතුල් ඉස්ලාමියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### மர்கஸ் ஸக்காபதுல் இஸ்லாமிய்யா (கூட்டிணைத்தல்) சட்டமூலம்
### MARKAS SAKAFATHUL ISLAMIYYA (INCORPORATION) BILL

**ගරු එම්.බී. ෆාරුක් මහතා**
(மாண்புமிகு எம்.பி. பாறூக்)
(The Hon. M.B. Farook)
Hon. Deputy Speaker, I move,

"That leave be granted to introduce a Bill to incorporate the Markas Sakafathul Islamiyya".

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and Religious Affairs for report.*

## පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත
### உள்ளூரதிகாரசபைகள் வெற்றிடங்களை நிரப்புதல் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்
### LOCAL AUTHORITIES FILLING OF VACANCIES (SPECIAL PROVISIONS) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ.භා. 2.39]

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා (පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா - உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சர்)
(The Hon. A.L.M. Athaulla - Minister of Local Government and Provincial Councils)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார் ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළාත් පාලන ආයතන ඡන්ද ක්‍රමය වෙනස් කිරීම සඳහා අපි පනත් කෙටුම්පතක්

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මම බොහොම ආඩම්බරයෙන් මෙතැනදී ප්‍රකාශ කරන්න ඕනෑ, පක්ෂ, විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවේ එකතු වෙලා ඒක සම්මත කළ බව. ඇත්තටම ඒ සංශෝධනය ඉල්ලුවේ එක්සත් ජාතික පක්ෂයයි. එතුමන්ලාගේ ඉල්ලීම උඩ අපි ඒක සම්මත කරලා දුන්නා.

ඒ අනුව අපි දැන් සීමා නිර්ණය කමිටු දිස්ත්‍රික් මට්ටමින් පත් කළා. ඒ වාගේම ජාතික මට්ටමිනුත් පත් කරලා, දැන් ඒ කටයුතු ඒ කමිටු හරහා කර ගෙන යනවා. අපි බලාපොරොත්තු වුණා මාස 6ක කාලයක් තුළ ඒ වැඩ අවසන් කරන්න පුළුවන් වෙයි කියලා. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයෙන් ඉල්ලා සිටියා, දිස්ත්‍රික් මට්ටමින් ඒ කමිටු හමු වෙලා ඒ අයගේ අදහස් ප්‍රකාශ කරන්න ඕනෑ කියලා. ඒ නිසා අපි මේ අවුරුද්දේ දෙසැම්බර් වන තුරු, තව මාස 6ක් කල් දීලා තිබෙනවා. මේ අවුරුද්ද ඇතුළත ඒ කටයුතු ඉවර කරලා අලුතින් ඡන්ද පවත්වන්න අපි බලාපොරොත්තු වනවා. අපි බලාපොරොත්තු වුණේ මාස 6කින් ඒ කටයුතු ඉවර වුණාම අවුරුද්දක් ඇතුළත මේ ඡන්ද පවත්වලා ඉවර කරන්නයි. නමුත් මාස 6ක් වැඩිපුර ගිය නිසා, දැන් පවතින පළාත් පාලන ආයතනවල මන්ත්‍රී පුරප්පාඩු වුණාම, ඒවා පිරවීම සම්බන්ධව පොඩි ප්‍රශ්නයක් ආවා. Interpretation Ordinance එකෙන් ඒ පුරප්පාඩු පුරවන්න පුළුවන් කියලා, අපි ඒ අනුව පිරෙව්වා. පසුව ඡන්ද කොමසාරිස්තුමා අපට ප්‍රකාශ කළා, පුළුවන් නම් මේ සඳහා වෙනම පනතක් ගෙනෙන්න කියලා. ඒ අනුව අපි දැන් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා තිබෙනවා. සියලුම පක්ෂවල මන්ත්‍රී පුරප්පාඩු එන විට, ඒවා පිරවීම සඳහා මේ නීති අත්‍යවශ්‍යයි. ඒ අනුව මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා අපි සියලු දෙනාම මේකට සහයෝගය දෙන්න ඕනෑ කියා මා ඉල්ලා සිටිනවා.

පසුව මම තවත් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ. භා. 2.43]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුලින්ම මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, ගරු රෝසි සේනානායක මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ යෝජනාවට -සියයට 25ක කාන්තා නියෝජනයක් දෙන එකට- එතුමා විරුද්ධද කියා. [බාධා කිරීමක්] ඒකත් අපි බේරා ගන්න එපායැ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
අපි මේ ගැන වෙනම කථා කළා. ඒ පනත සම්මත කළ දවසේ අපි එකඟ වුණු කරුණු කිහිපයක් තිබෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒක හරි.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
සීමා නිර්ණය පිළිබඳ කටයුතු අවසන් වුණායින් පසුව අප පාර්ලිමේන්තුවට ඇවිල්ලා එතැන තිබෙන අඩු පාඩු ටික පුරවනවා. හැබැයි මේකට අපි එකඟ වුණේ එදා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, නැහැ. ඒ ගැන තීරණයක් වුණේ නැහැ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඒක අපි වෙනම බලමු. දැන් අපේ නියෝජ්‍ය කථානායකතුමාත් කිව්වා නේ. දැන් මේක ඉවර කර ගනිමු.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේක වැදගත් ප්‍රශ්නයක්. කාන්තාවන් බාල්දු කරන්න හොඳ නැහැ නේ. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. John Amaratunga, you carry on.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් කර තිබෙන මේ පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතට අපේ විරුද්ධත්වයක් නැහැ. ප්‍රමාද වී හෝ එය ඉදිරිපත් කිරීම ගැන මා සන්තෝෂ වෙනවා. නමුත් මෙහිදී පළාත් පාලන නීති සහ ඒවායේ ඡන්ද විමසීම පිළිබඳව විශේෂයෙන් විපක්ෂයට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒක අද අපි මේ සභාවේදී කියන්න ඕනෑ. මොන සංශෝධන ගෙනාවත් සාධාරණයක් ඉටු වන බවක් අපි දකින්නේ නැහැ. එකක් තමයි කොට්ඨාස නිර්ණය කිරීම. තමුන්නාන්සේලා මොනවා කිව්වත් අද එය ඒකපාර්ශ්විකව ක්‍රියාත්මක වෙනවා. කොට්ඨාස වෙන් කරන්නේ කොයි විධියටද කියන එක ගැන අපේ මන්ත්‍රීවරුන්ට හරි හැටි දැනුම් දීමක් කරලා නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අපටවත් දැනුම් දීලා නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අපේ මන්ත්‍රීවරුන්ගෙන් අහන්න. අපේ මන්ත්‍රීවරුන්ම කියනවා, ඒ අයට දැනුම් දීලා නැහැ කියා. ඇයි, තමුන්නාන්සේලා එහෙම කරන්නේ? මේකද ප්‍රජාතන්ත්‍රවාදය? [බාධා කිරීමක්]

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
එහෙම තිබෙනවා නම් ඒ ගොල්ලන්ව ජාතික කමිටුවට ගෙන්වලා කථා කරනවා. ඒකට වෙලාව තිබෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එහෙම කරලා නැහැ. එහෙම කරලා නැති එක ගැනයි මම කියන්නේ. මම තනියම කියන්නේ නැහැ. මේ මන්ත්‍රීවරු ඔක්කොම කියනවා.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඒකට වෙලාව තිබෙනවා. ඒ නිසා ඒ ගැන හදිසි වෙන්න එපා. කලබල වෙන්න එපා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ අද පොරොන්දුවක් දෙනවාද මේ සැලැස්ම අපේ හැම මන්ත්‍රීවරයෙකුටම ලැබෙන්න සලස්වනවාය කියලා?

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
නැහැ, නැහැ. එහෙම හැම මන්ත්‍රීවරයෙකුටම දෙන්න බැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඇයි? එහෙම නම් අපි දැන ගන්නේ කොහොමද? අපි විරුද්ධ වෙන්නේ කොහොමද? අපේ අදහස් දෙන්නේ කොහොමද?

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
තමුන්නාන්සේලාගේ ඉල්ලීම සලකා බලා අවශ්‍යතාවක් තිබෙනවා නම් ජාතික කමිටුවේදී ඒක පරීක්ෂා කරනවා. මම නොවෙයි ඒක කරන්නේ. ජාතික කමිටුව විසිනුයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
පරීක්ෂා කරන්න. ඒකේ වැරැද්දක් නැහැ. නමුත් අවසාන තීරණයක් ගන්න ඉස්සෙල්ලා අපටත් අවස්ථාවක් ලබා දෙන්න, ඒවායේ අඩු පාඩු පෙන්වා දෙන්න.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ජාතික කමිටුවට මේක ලියන්න. ජාතික කමිටුව තමුන්නාන්සේලාව ගෙන්වලා කථා කරාවි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ජාතික කමිටුව තමුන්නාන්සේලාගේ ජාතිය ගැන විතරයි කථා කරන්නේ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
නැහැ, නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
බහු ජාතික බහු කොට්ඨාසවලට කඩා තිබෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට පොඩි කාරණයක් පැහැදිලි කර ගැනීමට තිබෙනවා. කුලියාපිටිය ආසනයේ මුස්ලිම් ප්‍රදේශ බහු මන්ත්‍රී ආසන කියා කඩා තිබෙනවා. ඒ මන්ත්‍රී ආසන කැඩීම තුළ ලොකු අසාධාරණයක් වෙලා තිබෙනවා. ඒක අපට දැනුම් දෙන්න ඕනෑ. ඒකේ අදහස හරි අපට දැනුම් දෙන්න.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඒක කරගෙන යනවා. ඔබතුමන්ලාට මොනවා හරි ප්‍රශ්න තිබෙනවා නම් ජාතික කමිටුවට ලියන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු ඇමතිතුමනි, මෙතැනදී අපට කිසිම සාධාරණයක් පෙනෙන්නේ නැහැ. ඒකයි තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළ ගැන මම කිව්වේ. [බාධා කිරීම්] ඔය බලන්න මන්ත්‍රීවරු කියන ඒවා. තමුන්නාන්සේලා අද මේ පනත් කෙටුම්පතට සංශෝධන ගෙනෙනවා. විවිධාකාරයේ යෝජනා ගෙනෙනවා.නමුත් සාධාරණ, අපක්ෂපාත පළාත් පාලන ඡන්දයක් තියාවිද කියා මම අහනවා. [බාධා කිරීමක්] කොහේද තියන්නේ? එහෙම නම් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන විධිවිධාන නැවත ක්‍රියාත්මක කරන්න. ඒවා කරන්නේ නැහැ. ඒක කරන්නේ නැත්තේ උවමනාවෙන්මයි.දැන් බලන්න, එදා ඉඳලා තමුන්නාන්සේලාගේ- [බාධා කිරීමක්]

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ තමුන්නාන්සේලාට ඕනෑ එක කළානේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මොකක්ද කළේ?

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඉන්දු - ලංකා- [බාධා කිරීම්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අපි තමයි ස්වාධීන පොලිස් කොමිසම ඇති කළේ; ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම ඇති කළේ. ඔය හැම එකක්ම ක්‍රියාත්මක කළා. තමුන්නාන්සේලා ඇවිල්ලා දහහටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා ඒවා ඔක්කෝම අහෝසි කරලා දැම්මා. [බාධා කිරීම්]

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ අවශ්‍යතාවන් ඔක්කෝටම ඔබතුමන්ලා අත ඉස්සුවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, නැහැ. [බාධා කිරීම්] අපි අද ඉල්ලන්නේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය හරියාකාරව ස්ථාපිත කරන්න නම් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ස්වාධීන මැතිවරණ කොමිසම, ස්වාධීන පොලිස් කොමිසම, ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම ස්ථාපිත කරන්න ඕනෑ කියලයි. එතකොට තමයි ඔය සම්මත කර ගත්ත පනතේ අර්ථයක් ඇති වෙන්නේ.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)
එහෙනම් අපි පනත අයින් කර ගන්නම්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒකට කමක් නැහැ. තමුන්නාන්සේලාට තුනෙන් දෙකේ බලයක් තිබෙනවා කියලා ඔය ඔක්කෝම කර ගන්න පුළුවන්. අපි "බැහැ" කියන්නේ නැහැ. නමුත් ජනතාව අනුමත කරන්නේ නැහැ. වෙනස ඒකයි.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඒක අයින් කර ගන්නම්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම දන්නේ නැහැ, කැමැති දෙයක් කර ගන්න. දැන් මේ කියාපු කරුණු හේතු කොටගෙන අපට කවදාවත් බලාපොරොත්තු වන්න බැහැ, තමුන්නාන්සේලාගේ පාලන තන්ත්‍රය තුළ සාධාරණ, අපක්ෂපාතී ඡන්දයක්. ඒකයි මේකේ තිබෙන ප්‍රශ්නය. මේ මොන නීති-රීති ගෙනාවත් වැඩක් නැහැ. අපට පෙනෙනවා දූෂිත මැතිවරණයකටයි ආයෙත් මේ සූදානම් වෙන්නේ කියලා. දැන් තමුන්නාන්සේලා පළාත් සභා- [බාධා කිරීමක්] ඒ ගැන තමයි කථා කරන්නේ. පළාත් පාලනය ගැන; පළාත් පාලන විෂයය ගැන තමයි කථා කරන්නේ. කවදා හරි තමුන්නාන්සේට වග කියන්න වෙනවා. තමුන්නාන්සේ ඔහොම කිව්වාට, තමුන්නාන්සේලාගේ සෞඛ්‍ය ඇමතිවරයා මොකක්ද කියා තිබෙන්නේ? පළාත් පාලන ඇමතිවරයා දන්නේ නැහැයි කියනවා, ඔහුගේ විෂයය ගැන; ඩෙංගු මර්දන ව්‍යාපාරය ගැන. තමුන්නාන්සේ ගැන කියා තිබෙන්නේ එහෙමයි.මම නම් එහෙම කියන්නේ නැහැ. මම තමුන්නාන්සේගේ මිත්‍රයා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. පත්තරේ තිබුණා. කැබිනට් එකේදියි කියා තිබෙන්නේ. කැබිනට් එකේදී මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා කියා තිබෙනවා, මේ පළාත් පාලන ඇමතිවරයා ඔහුගේ විෂයය ගැන දන්නේ නැහැ කියලා. ඔන්න බලන්න, තමුන්නාන්සේට සලකන හැටි. තමුන්නාන්සේව බාල්දු කර තිබෙන හැටි බලන්න. ඒ අනුව බලපුවාම සෞඛ්‍ය ඇමතිතුමා කියන දෙයෙහි ඇත්තකුත් තිබෙනවා වාගෙයි අපට පෙනෙන්නේ. තරහා වෙන්න එපා. තමුන්නාන්සේ මගේ හොඳ මිත්‍රයා. නමුත් කරන්න දෙයක් නැහැ. තමුන්නාන්සේලාගේ පක්ෂය ඇතුළේ ඇන කොටා ගැනීම්වලදී ඕවාත් කියැවිලා තිබෙනවා. දැන් බොහොම සරලව කියනවා නම් ගරු ඇමතිතුමනි, අද මිනිස්සු කියනවා, පළාත් පාලනය බල්ලට ගිහිල්ලා කියලා. මේක තමුන්නාන්සේට කියන දෙයක් නොවෙයි. The Local Government has gone to the dogs. See the way Chairmen, Vice-Chairmen and Members are behaving.

ඒක මම නොකිව්වාට මා දන්නවා තමුන්නාන්සේත් ඒක අනුමත කරනවා කියලා. පාලනය කර ගන්න අමාරුයි. පසු ගියදා පත්තරවල පළ වී තිබුණු ප්‍රවෘත්ති දිහා බැලුවාම මේ පළාත් පාලන ක්ෂේත්‍රය තුළ ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ ක්‍රියාකලාපය අතිශයින්ම නින්දිතයි කියා පෙනෙනවා. ඒ කාලයේ ගම් සභාවල සිටියේ, ගම් සභා නියෝජනය කළේ ගම්වල ඉතාමත්ම වැදගත් උදවිය. අද කවුද ඉන්නේ? අද මොකද වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේට කෙසේ වෙතත්, අද තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමාටත් මේ උදවිය පාලනය කර ගන්න බැහැ. ජනාධිපතිවරයාටත් නවත්වා ගන්න බැහැ. එතුමා මේවා අනුමත කරන්නෙත් නැහැ. එතුමාගේ ආශ්චර්යය විනාශ කරනවා. මහින්ද චින්තනය කුඩුපට්ටම් කරනවා. මේක තමයි අද ඇති වෙලා තිබෙන තත්ත්වය. මා ඒ ගැන තව ටිකක් විස්තර කියන්නම්. මේ බලන්න, මේ ලැයිස්තුව. මා ඒවා වෙන් කරගෙන ඉන්නවා. මේකේ තිබෙනවා- [බාධා කිරීම්] ඒ මිනිහාගේ ඇති වරදක් නැහැ. ඒ මිනිහාට බොරු චෝදනාවක් ආලා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

බෝම්බ ගහලා ඒ මිනිහාව අමාරුවේ දැම්මා. බැසිල් රාජපක්ෂ මැතිතුමා දන්නවා ඒක. ඒ මිනිහා අතිශයින්ම අවංක මනුෂ්‍යයෙක්. මම භය නැතිව කියන්නම්. අද ඉන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කරන ඒවා ඇහුවොත් තමුන්නාන්සේ පුදුම වෙයි. මා දන්නේ නැහැ, මේ පළාත් පාලන හා පළාත් සභා ඇමතිවරයා නිකම් ඉන්නේ ඇයි කියලා. ඉඩම් විකුණනවා; සභාවේ තිබෙන යකඩ විකුණනවා; ඒ වාගේම අනුමැතියක් නැතිව ගෙවල් හදනවා. තමුන්නාන්සේලා යවනවා, විමර්ශන කණ්ඩායම්. ඒවා එතැනින් ඉවරයි.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ බලතල ඔක්කොම පළාත් සභාවලට දීලා තිබෙන බව. ඔබතුමන්ලා තමයි ඒක ගෙනාවේ. Indo-Sri Lanka Peace Accord එක ගෙනැවිත් දහතුන්වන -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඉතින්, තමුන්නාන්සේගෙන් වැඩක් නැහැ නේ. තමුන්නාන්සේ නිකම් ඉන්න ඕනෑ. තමුන්නාන්සේ මධ්‍යම රජයේ පළාත් පාලනය භාරව ඉන්න ඇමතිවරයා.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - சீனிக் கைத்தொழில் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Sugar Industry Development)
හැම දාම පළාත් පාලන ඇමති සිටියේ මේ යෝජනා ගෙන එන්න පමණයි. පළාත් සභාවලටයි අපි දුන්නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ. නැහැ. එහෙම කියලා බේරෙන්න බැහැ. මේ පාර්ලිමේන්තුව උත්තරීතරයි. මේක උත්තරීතර පාර්ලිමේන්තුවක්. තමුන්නාන්සේලාට ඡන්දය දීලා, ජනාධිපතිවරයා මේ ඇමතිකම දීලා පාර්ලිමේන්තුවට එව්වේ මේ ආයතනවල පාලනය ගැන බලන්න. [බාධා කිරීමක්]

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
අද අලුත් පනතක් සංශෝධනය කරනවා නේ. ඒ වාගේ වැඩ තමයි දැන් මධ්‍යම රජයේ තිබෙන්නේ. ඔක්කොම පළාත් සභාවලට දීලා තිබෙන්නේ. ඒක දැන ගන්න ඕනෑ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මොකක තිබුණත් කමක් නැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව. තමුන්නාන්සේලා මේ රට පාලනය කරන්නේ. අද මොනවාද වාර්තා වෙලා තිබෙන්නේ? මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ, මං කොල්ලකෑම්, පොලිස් නිලධාරින්ට පහර දීම, අල්ලස් දූෂණවලට සම්බන්ධ වීම, පැහැර ගෙන යාම.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
යූඑන්පී කාලයේත් තිබුණා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඉතින් ඒ තිබුණයි කියා දැනුත් තියෙන්න ඕනෑද? තමුන්නාන්සේලා ඒවා කියලා තමයි බලය අරගත්තේ. අහිංසක පුරවැසියන්ට පහර දීම, නොයෙකුත් නීති විරෝධී කටයුතු අද මේ රටේ සිද්ධ වෙනවා. [බාධා කිරීමක්] මේ ආණ්ඩුව වග කියන්න ඕනෑ. වෙන කාටවත් පවරා හරියන්නේ නැහැ. පළාත් සභාවත් තමුන්නාන්සේලාගේ. බස්නාහිර පළාත් සභාව ඇතුළු ඔක්කොම පළාත් සභා තමුන්නාන්සේලාගේ. [බාධා කිරීමක්] එහෙම කියන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාරණා කිහිපයක් මම සඳහන් කරන්න කැමැතියි. මම මේවා බැලුවා. වාර්තා වුණු මිනීමැරුම් තිබෙනවා. වාර්තා නොවුණු ඒවා තව විශාල සංඛ්‍යාවක් ඇති. මේවා කියවන්න ඕනෑ. මේවා කියවන විට හිතට අමාරුයි.

මාර්තු මාසයේ කහවත්තේ සිද්ධිය පිළිබඳව බලමු. 2013 රත්නපුර, වැලිගෙපොල මිනීමැරුම. ඒ වාගේම 2013 ජූලි මාසයේ ගම්පහ, කැලණිය, හසිත මඩවල නමැති ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා මරා දැමීම. ඒ වාගේම 2013 ජූලි මාසයේ කෑගල්ල, මාවනැල්ල මිනීමැරුම ; ඔය වාගේ මිනීමැරුම් අටක් සම්බන්ධ විස්තර මා ළඟ තිබෙනවා. මේ ඔක්කොම ප්‍රාදේශීය සභා, නගර සභා මන්ත්‍රීවරුන්ගේ වැඩ.

ඊළඟට පොලීසිවලට පහර දීම බලමු. මේක අලුත් පුරුද්දක්. මේ අය මිනීමරනවා පමණක් නොවෙයි. නීතිය රකින පොලිස් නිලධාරින්ටත් පහර දෙනවා. ඒ සම්බන්ධව මා ළඟ ලැයිස්තුවක් තිබෙනවා. 2013 අප්‍රේල් මාසයේ මොණරාගල සිද්ධියක් වුණා. 2013 අප්‍රේල් මාසයේ ගම්පහ පොලීසියේ නිලධාරින්ට පහර දීම; 2013 අප්‍රේල් මාසයේ රත්නපුර පොලීසියේ නිලධාරින්ට පහර දීම; ඒ වාගේම මැයි මාසයේ කළුතර, බුලත්සිංහල පොලීසියේ නිලධාරින්ට පහර දීම. ඔය වාර්තා වුණු දේවල්. මේවාට සම්බන්ධ ඔක්කොම අය රජයේ දේශපාලනඥයෝ. තමුන්නාන්සේලාගෙන් නාම යෝජනා අරගෙන ජනතාවගේ ඡන්දය අරගෙන සභාපති ධුර අරගෙන, මන්ත්‍රී ධුර අරගෙන අද පොලීසියටත් පහර දෙනවා. මිනීමරනවා පමණක් නොවෙයි. රටේ නීතිය රකින ජනතාවට ආරක්ෂාව දෙන නිලධාරින්ටත් පහර දෙන කොටසක් බවට පත් වෙලා තිබෙනවා.

ඊළඟට බොහොම ලස්සන කථාවක් තිබෙනවා. ස්ත්‍රී දූෂණ. මම නොකිව්වාට පසු ගිය දවස්වල සිදු වුණු ස්ත්‍රී දූෂණ සම්බන්ධව පත්තරවල ශීර්ෂ පාඨ ලොකු කළු අකුරින් පළ වුණා. 2012 මාර්තු මාසයේ රත්නපුර, කහවත්ත කාන්තාවන් මරා දැමීම පිළිබඳ සිද්ධිය විශාල ආන්දෝලනයකට ලක් වුණා. 2013 පෙබරවාරි මාසයේ කෑගල්ල, අරනායකදී ස්ත්‍රී දූෂණ කිරීම පිළිබඳව, 2013 මාර්තු කොළඹ මහරගම කාන්තාවන් දූෂණය කිරීම පිළිබඳව, 2013 අප්‍රේල් මාතර, අකුරැස්ස බාල වයස්කාර දැරියක දූෂණය කිරීම, 2013 මැයි ගාල්ල, කරන්දෙණිය දෙදරු මවකට ලිංගික අතවර කිරීම; මේ අප දන්නා තරමට වාර්තා වුණු දේවල් පමණයි. තව නොදන්නා ඒවා කොච්චර ඇද්ද? මේවා ඔක්කොම තමුන්නාන්සේලාගේ මහජන නියෝජිතයින්ගේ වැඩ. මේ මිනිස්සු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ශ්‍රී නාමය විනාශ කරනවා.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
ආසියාවේ ආශ්චර්ය.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේකද ආශ්චර්ය? මේවා නිවැරදි කරන්න ඕනෑ. පළාත් පාලන හා පළාත් සභා ඇමතිවරයා හැටියට ඒ වගකීම තමුන්නාන්සේටයි අයිති. පළාත් සභාවට අයිති දෙයක් කියලා තමුන්නාන්සේට ඒකෙන් ගැලවෙන්න බැහැ. තමුන්නාන්සේ කැබිනට් ඇමතිවරයෙක්. තමුන්නාන්සේ හොඳ පුද්ගලයෙක්. හොඳ මුහුණක් තිබෙනවා, හිනාවෙනවා, ලස්සනයි. කිසිම අඩු පාඩුවක් නැහැ, අපේ මිත්‍රයා. අපව දැක්කාම අපිත් එක්ක හොඳට කථා කරනවා. නමුත් තමුන්නාන්සේගේ විෂයයට අදාළ, ඒ යටතේ ඉන්න දේශපාලනඥයෝ තමුන්නාන්සේගේ ශ්‍රී නාමයත් විනාශ කරනවා.

අල්ලස් හා දූෂණ ගැනත් කථා කරන්න ඕනෑ. මම දැක්කා ඊයේ පෙරේදා පත්තරේක තිබෙනවා, අල්ලස් හා දූෂණවලට සම්බන්ධ 36 දෙනෙකුට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම දැනට පරීක්ෂණ කටයුතු ආරම්භ කරලා තිබෙනවා කියලා. ඒ, පැමිණිලි ලැබුණු ඒවා විතරයි. තව සිය ගණනක් ඇති. මේ ලැයිස්තුව මට කියවන්න පුළුවන්. සභාපතිවරුන් අතරත් අල්ලස් දීලා තිබෙනවා.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
වලල්ලාවිට එක්කෙනා අල්ලස් ගන්නේ බෙන්තර එක්කෙනාගෙන්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔය කියන්නේ මෙතුමාගේ කොට්ඨාසයේ වැඩ. මේවා හිනා යන වැඩ. අපි කවදාවත් මේ වාගේ දේවල් අහලා තිබුණේ නැහැ. ඒවා හාස්‍යජනකයි. [බාධා කිරීමක්] අල්ලනවා තමයි, වලිගය අල්ලන්නේ. අපි දැක්කානේ DIG මහත්මයාව අල්ලලා තිබෙන හැටි. ඔහුගේ පුතා අල්ලනවා කිය කියා ඉඳලා පුතා රට යන කල්

ඉඳලා දැන් අල්ලන්න හොයනවා. [බාධා කිරීමක්] වලිගය තමයි අල්ලන්න වෙන්නේ. මොනවාද ඇමතිතුමා, ඔය වගේ විහිළු කරන්න එපා. මේවා සෙල්ලම් වැඩනේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
සරත් ෆොන්සේකා මැතිතුමාගේ බෑනා කෝ? තමුන්නාන්සේ ඒක ගැන කියන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
තමුන්නාන්සේ වාඩි වෙන්න. තමුන්නාන්සේ දන්න දෙයක් නැහැ. මේ පැත්තේ ඉඳලා ඔය පැත්තට ගිය කෙනානේ. වාඩි වෙන්න. [බාධා කිරීමක්] රට ඉඳි වාගේ නෙමෙයි ඕවා. ඔය රට ඉඳි කථාව කියන්න ඕනෑ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලා ඝාතනය කිරීම. මේවා ප්‍රාදේශීය සභාවල, පළාත් සභාවල ඉන්න මන්ත්‍රීවරුන්ගේ වැඩ. එවැනි සිද්ධීන් කිහිපයකුත් තිබෙනවා. මිහින්තලය රජමහා විහාරස්ථානයට අයත් ඉඩ කඩම් පැහැරගෙන තිබෙනවා. ඒ වාගේම 2003 පෙබරවාරි මාසයේ කොළඹ මොරටුව එගොඩ උයන සුනන්දෝපනන්ද විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ ඝාතනය කිරීම. මේවා අපි මීට පෙර අහලා තිබෙනවාද? ආගමික නායකයන් ඝාතනය කිරීම වාගේ ඒවාට ඇයි ඉඩ හරින්නේ? ගරු ඇමතිතුමනි, මොනවාද තමුන්නාන්සේ කරන්නේ?

ඊළඟට සංචාරකයන්ට පහර දී මරා දැමීම. පසු ගිය දවස්වල සිද්ධිය වුණේ කලුතර නේද?

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
නැහැ ගරු මන්ත්‍රීතුමා, හම්බන්තොට.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
හම්බන්තොට. ජනාධිපතිතුමාගේ දිස්ත්‍රික්කයේ; බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ දිස්ත්‍රික්කයේ සංචාරකයෝ මරා දමනවා. ඒක හරි අපරාධයක්. මෙහෙම කළාම කොහොමද සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නේ?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have one more minute left.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේවා ගැන කියලා ඉවරයක් කරන්න බැහැ. අද දවසම තිබුණත් මදි මේ ලැයිස්තුව කියවන්න. Give me another two or three minutes.

ඊළඟට මං කොල්ල කෑම ගැන කථා කරන්න ඕනෑ. පුදුමාකාර මං කොල්ල කෑමේ ක්‍රමයක් තිබෙන්නේ. ඊටත් වඩා අපේ විපක්ෂ නායකතුමාගේ වාහනයටත් පහර දුන්නා. මෙහෙමද ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නේ? මේ වාගේ දේවල් ඉවරයක් වෙන්නේ නැහැ.

ඊළඟට අහිංසක පුරවැසියන්ට පහර දීම. මා ළඟ තිබෙන මේ ලේඛනයේ 10කට වැඩිය සිද්ධි වාර්තා වෙලා තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, now wind up please.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා කියනවා මට ලබා දී තිබෙන කාලය ඉවරයි කියලා. ඉතින් ඒ වාගේ දේවල් ගැන අපි කාටද කියන්නේ? අද ඇමතිවරුන්ටත් වඩා බලය අතට අරගෙන කටයුතු කරන්නේ පළාත් පාලන නියෝජිතයෝ. මම තව උදාහරණයක් කියන්නම්. මගේ මැතිවරණ කොට්ඨාසයේ තමුන්නාන්සේලා හොඳයි කියලා පත් කරලා තිබෙන සභාපතිවරු කරන දේවල්. බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි, තමුන්නාන්සේ ජාතික සංවිධායකවරයා හැටියට පත් වෙලා සිටියදීත් මේවා ගැන බලන්නේ නැත්තේ ඇයි? අද කිසිම විනයක් නැහැ. මූල්‍ය විනය බින්දුවයි. ඒ මිනිස්සුන්ට ඕනෑ දේ තමයි කරන්නේ. අද audit එකක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒවායින් අහලා එවන ප්‍රශ්නවලට උත්තර ලියන්නේ නැහැ. ඉතින්, මේක මෙහෙම ගෙනියන්න පුළුවන්ද?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, now wind up please.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේක මහා භයානක කාරණයක්. අපේ රටේ පළාත් පාලන ක්ෂේත්‍රය මේ තත්ත්වයට වැටීම ගැන මා කනගාටු වෙනවා. මේ වාගේ දේවල් ගරු ඇමතිතුමාටත් හොඳ නැහැ. මේවා නිසා එතුමාගේ ශ්‍රී නාමයටත් අවනම්බුවක් වෙයි. ඒ ඔක්කෝටමත් වඩා ජනාධිපතිතුමාගේ ආසියාවේ ආශ්චර්ය සහ මහින්ද චින්තන ඉදිරි දැක්ම පිළිබඳ සංඛ්‍යා ලේඛන කිහිපයක් තමයි මම මේ කියෙව්වේ. ඉතින්, මේ තරම් මහන්සි වෙලා ගොඩ නඟපු මේ රටටත්, මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් කරන විශාල අගෞරවයක් තමයි පළාත් පාලන ක්ෂේත්‍රයේ ඉන්න අය කරන්නේ. [බාධා කිරීමක්]

මා මේ කියන්නේ තමුන්නාන්සේලාගේ හොඳටයි. මා ඉල්ලීමක් කරනවා, කරුණාකරලා ඒ ක්ෂේත්‍රය තුළ විනයක් ඇති කරන්න කියලා. එහෙම නැති වුණොත් මේ මිනිසුන් යන පිළිවෙළට මේ ගම් නියම් ගම් විනාශ වනවා. හොරකම් කරනවා; මං කොල්ල කනවා; ස්ත්‍රී දූෂණ කරනවා; මිනී මරනවා; නොකරන දෙයක් නැහැ. අපි ඒ ගැන කනගාටුව ප්‍රකාශ කරනවා. හරියාකාරව ඒ ක්ෂේත්‍රය පාලනය කළේ නැත්නම් මොන නීති රීති ගෙනාවත් වැඩක් නැහැයි කියමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[பி.ப. 3.04]

**ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவூப் ஹகீம் - நீதி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Justice)
*பிஸ்மில்லாஹிர் றஹ்மானிர் றஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சர் அவர்கள் உள்ளூரதிகாரசபைகள் வெற்றிடங்களை நிரப்புதல் (விசேட

[ගරු රවුෆ් හකීම් මහතා]

ஏற்பாடுகள்) சட்டமூலத்தை இங்கே சமர்ப்பித்திருக்கிறார். முன்னைய சட்டத்தின்படி, தெரிவுசெய்யப்பட்ட உறுப் பினர்களை மீண்டும் நியமிப்பதுகுறித்து ஒரு சட்டச் சிக்கல் ஏற்பட்டிருக்கின்ற ஒரு சூழலில் இந்தப் புதிய சட்டமூலம் சமர்ப்பிக்கப்பட்டிருக்கிறது. இது பாராளுமன்றத்தில் அங்கம் வகிக்கின்ற எல்லாக் கட்சிகளும் எதிர்நோக்குகின்ற ஒரு பிரச்சினையாக இருப்பதால், இச்சட்டமூலத்தை எந்தப் பிரச்சினையும் இல்லாமல் ஏகமனதாக நிறைவேற்றக்கூடிய ஒரு சூழல் இருக்கிறது. எனவே, மேற்குறிப்பிட்ட பிரச்சினையை விட, முக்கியமாக இன்று உள்ளூராட்சிச் சபைகளுக்கான தேர்தல் தொடர்பில் புதியதொரு நடைமுறையொன்றை அறிமுகப்படுத்தியிருப்பதாகவும் அதற்கான ஆரம்பக்கட்ட வேலைகளை ஆரம்பித்திருப்பதாகவும் கௌரவ அமைச்சர் அவர்கள் குறிப்பிட்டார். அத்துடன், அவர் இந்த எல்லை நிர்ணயக் குழுவின் நடவடிக்கைகள் சம்பந்தமாக ஒரு சில விடயங்களை மேலோட்டமாகவும் இங்கு குறிப்பிட்டார்.

இன்று பாராளுமன்றத்தில் இருக்கின்ற - நாட்டில் இருக்கின்ற பிரதான கட்சிகளுக்கு இடையிலே ஆளும் கட்சியாக இருக்கின்ற ஐக்கிய மக்கள் சுதந்திரக் கூட்டமைப்பு, ஐக்கிய தேசியக்கட்சி, தமிழ் தேசியக் கூட்டமைப்பு போன்ற கட்சிகளுக்குப் புறம்பாக, ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸும் இந்த எல்லை நிர்ணய குழுவுக்கு இந்த நாட்டில் இருக்கின்ற எல்லா உள்ளூராட்சிச் சபைகள் சம்பந்தமாகவும் சிபாரி சுகளைச் சமர்ப்பித்திருக்கின்றது. இக்குழுவின் நடவடிக்கைகள் தொடர்பில் வெளிப்படைத் தன்மை பேணப்படவது தொடர்பாக இன்று எதிர்க்கட்சியில் இருக்கின்ற ஒரு சிலர் கேள்வி எழுப்பினார்கள். எங்களைப் பொறுத்தமட்டில், நாங்கள் எல்லை நிர்ணயக் குழுவின் தேசிய மட்டத் தலைமையோடு ஒருசில சந்திப்புக்களை நடத்தி, இது சம்பந்தமாக எங்களுக்கு இருக்கின்ற சந்தேகங்களை நிவர்த்தி செய்துள்ளபோதிலும் கூட, சில விஷயங்களில் இன்னும் பூரண உடன்பாடு காண முடியாத ஒரு நிலைமை இருக்கின்றது என்பதை நான் இங்கு சுட்டிக்காட்ட வேண்டும். இவ்விடயம் சம்பந்தமாக நான் சிங்களத்திலே குறிப்பிடலாமென நினைக்கின்றேன்.

බහු මන්ත්‍රී ආසන සම්බන්ධයෙන්, ඒ නිර්ණායකයන් සම්බන්ධයෙන්, ජාතික මට්ටමේ සීමා නිර්ණය කොමිසමේ ක්‍රියා පටිපාටිය පිළිබඳව අපට පැහැදිලි උත්තරයක් අවශ්‍ය වී තිබෙනවා. මොකද බහු මන්ත්‍රී ආසන ක්‍රමය අපට යෝජනා කරන්න සිදු වුණේ, සමානුපාතික ඡන්ද ක්‍රමය ඉදිරිපත් වී තිබියදී ඒකට විකල්ප ක්‍රමයක් හැටියටයි. දැන් අපි මිශ්‍ර ක්‍රමයක් හඳුන්වා දී තිබෙනවා. මේ මිශ්‍ර ක්‍රමය අනුව පළාත් පාලන සභා තුළ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේදී ඒ ඒ සභාව තුළ ඉන්නා ජාතීන් පිළිබඳව අවධානය යොමු කරලා, ඒ ඒ කොට්ඨාස සීමා නිර්ණය කර ගැනීමට අවශ්‍ය වූ ප්‍රතිපාදන මේ අලුත් පනත් කෙටුම්පතින් අපි හඳුන්වා දුන්නා. නමුත් ඒ කොට්ඨාස සීමා නිර්ණය කිරීම සඳහා අවශ්‍ය අවම ඡන්ද ප්‍රමාණය පිළිබඳව තීරණය ගත්තාට පස්සේ ඒක රාශිත්වයෙන් ජීවත් වන යම් ජන කොටසකට ඒ ඡන්ද ප්‍රමාණය -ඒ අවම ඡන්ද ප්‍රමාණය- මදි නම්, මේ පළාත් පාලන ආයතනවල එවැනි ඡන්ද කොට්ඨාසයක් ඇති කිරීම සඳහා කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කොමිසම ගන්නා පියවර මොකක්ද කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා. මා ඒක ඉංග්‍රීසි භාෂාවෙන් කියන්නම්.

In setting up multi-member constituencies, the rule must be to create a certain number of constituencies for a particular minority if you find that there is a concentration of that particular minority within a local authority area. But, what we find is that the National Delimitation Commission is following this only as an exception. What I would say is that the rule must be to create a ward even with a lesser number of Members if it is to provide for a particular community, their ward. Now, what happens is, it has been turned the other way and the National Delimitation Commission, only in exceptional circumstances, is creating wards for minorities within a local authority. This must be the other way about. In my opinion, multi-member constituencies should be created only as an exception. The rule must be to create as many wards as possible to accommodate minorities who are living within a local authority. For instance, if you take the Hon. Joseph Michael Perera's Negombo Municipality, there are particular areas like Periyamulla and various other places where Muslims are living in large numbers. Those areas are known and those wards have existed even in the past. So, in trying to create a ward in the Negombo or Colombo Municipalities, there may not be a greater difficulty. In certain other areas where there may not be sufficient numbers, the exception could be to create a multi-member ward. But, what is happening is, everywhere, the National Delimitation Commission is moving to create multi-member wards to accommodate minorities. That should not be the attitude. The attitude should be to have that as an exceptional rule and, as much as possible, to accommodate minority interests within a ward and allow them to have a majority within that ward so that they would be able to return a member from their own ethnicity or community. This is not being followed in a right manner, in my opinion. In my discussion with the Chairman of the National Delimitation Commission, I pointed this out. This has to be clarified and I hope the Hon. Minister would give us a clear indication as to what is the criteria the National Delimitation Commission would follow. I would be meeting the Chairman and Members of the National Delimitation Commission soon to discuss this matter further.

In the meantime, the Hon. Minister must also facilitate the political parties that have submitted proposals to the District Delimitation Committees to meet them at district level. What I see is that the National Delimitation Commission is taking the recommendation by the respective District Secretaries as the main proposal and is not paying serious attention to the proposals submitted by political parties. There again, an accusation has come from the Opposition that only the political parties represented in the Government are having the advantage of their proposals being considered by the National Delimitation Commission. I do not think that is a correct assumption. But, from my experience, what I feel is that we must be invited by the district level Delimitation Committee to present our proposals before them so that they would be able to incorporate our suggestions before they send it up to the National Delimitation Commission. So, this is the issue that we face. In fact, as a party, we have made it a point to submit our proposals at both levels: at the district level as well as the national level. This issue represents the need to see

that justice and fair play prevails finally in allocating and demarcating wards since we are doing away with the Proportional Representation System and are introducing a mixed system. There again, there was a request made even by the United National Party at the time we agreed to support this Bill in the Select Committee, that the portion of Proportional Representation be increased from 30 to 40 per cent, that the wards be carved out only for 60 per cent of members and the rest of the 40 per cent be by Proportional Representation. There was some undertaking given on the Floor of the House by the Hon. Minister at that time that they will introduce amendments later to consider that issue.

That, in fact, came as a proposal from the United National Party in principal and we too concurred with the same suggestion. But, after you have carved out the wards at national level and district level, once again to change this criteria would create problems. That change may not be able to be accommodated even if you bring that in and that process might take even a longer period to once again review the entire process altogether after the National Delimitation Commission has approved the suggestions from the District Delimitation Committees. So, that is why I suggest that, if at all, there is an intention to change the equation, the proportion of 30 per cent on Proportional Representation to 40 per cent, it must be indicated to the National Delimitation Commission right away. After they finish re-demarcation of all the wards, if we are to tell them that we are now going to change it, then that process of having to change the ward system again to accommodate those numbers might take a further period of time. Since the Hon. Minister has now got Cabinet approval to extend the time period for another six months towards the end of the year to allow the National Delimitation Commission to finish or complete its task and since there has been an agreement for the proportionally elected members to be increased from 30 to 40 per cent, it would be advisable to move that amendment early so that the National Delimitation Commission would be possessed of that and they would adjust their recommendations accordingly. I thought I would bring this matter to the attention of the Hon. Minister.

I must also say that the new Bill would certainly resolve many problems for political parties which are either controlling local authorities or having members in those because discipline in those has become a real problem for party leadership in various local authorities since collective decisions by a ruling party in a local authority are sometimes hampered by dictatorial decisions by its chairman or the mayor.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Sir, I am winding up.

As it stands today, once there is disagreement between members of a local authority even at a Budget, after the Budget had been rejected twice, on the third time he can always have it passed even though he has not got the sufficient number of votes in favour of the Budget. This enables a tendency towards some dictatorial attitude by the chairman and members of the local authority .

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
What about the Minister?

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
The Minister, I hope, is not a dictator but in terms of politics between him and me, perhaps, sometimes he may be behaving in a very dictatorial manner. But, that of course, is a matter that we always take with a pinch of salt because in politics, you may be a friend today and an enemy tomorrow and politics sometimes makes strange bedfellows. That is how both of us have become bedfellows in the same Government though we have been in different camps.

Thank you very much, Sir.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. M. Joseph Michael Perera. Before he starts, will an Hon. Member propose the Hon. Shantha Bandara to take the Chair?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
I propose that the Hon. Shantha Bandara do now take the Chair.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. SHANTHA BANDARA *took the Chair.*

[අ.භා. 3.19]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම අමාරුවෙන්, වේදනාවෙන් මන්ත්‍රී ධුරයක් ලබා ගැනීමට බලාපොරොත්තුවෙන් හිටපු මන්ත්‍රීවරුන්ට ඇතිවන අසහනය නිරවුල් කිරීමට මේ පනතට ගෙන එන සංශෝධන යටතේ ඉඩප්‍රස්ථාව ලැබෙනවා. මැතිවරණ කොමසාරිස්තුමා සමඟ සාකච්ඡා කළ අවස්ථාවලදී මෙය මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි, සභාපතිවරුන්ටත් ඉතාමත්ම බරපතළ ප්‍රශ්නයක් වුණා. නැවත පත් කිරීමේදී ගත යුතු නීතිමය පියවර මොකක්ද කියලා මේ පනත් කෙටුම්පත තුළ ඇතුළත් වෙලා නැහැ. පනත් දෙකක් එක්ක තමයි මැතිවරණ කොමසාරිස්තුමාට වැඩ කරන්න පුළුවන් වුණේ. මීට ඉස්සෙල්ලා තිබුණු පනතත්, දැන් තිබෙන අලුත් පනතත් කියන මේ පනත් දෙකම ගත්තාම ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඉදිරියටත් ඒ ප්‍රශ්නය තියේවි. මේ අද ගෙනෙන සංශෝධන පිළිබඳව අපේ එකඟතාවක් තිබෙනවා. ඒක අපි පළමුවෙන්ම මතක් කරන්නට ඕනෑ. එතකොට මැතිවරණ කොමසාරිස්තුමාට ඒ අනුව වැඩ කටයුතු කරන්නට පුළුවන්.

මට තිබෙන ප්‍රශ්නය ඒකම නොවෙයි. මේ පනත් කෙටුම්පත හදද්දි අපි විවිධ අදහස් ප්‍රකාශ කළා. ඒ විවිධ අදහස් ප්‍රකාශ කළාම සමහර ඒවාවලදී ගරු ඇමතිතුමා කාරක සභාවේදී පොරොන්දු වුණා, "අපි මොනවා හරි තිබෙනවා නම් ඒක බේරා ගනිමු, මේක හදිසියි" කියලා. ඒ නිසා අපි එකඟ වුණා. දැන් තමුන්නාන්සේගේ යුතුකම තමයි මේ ගෙනෙන ප්‍රශ්නවලට අහුම්කන් දීම. මේ අපට පෙනෙන්නේ එක ප්‍රශ්නයක්. මේක එකඟතාවක් නොවෙයි. මේක නීතියේ අඩු පාඩුවක්. මේ පනත් හදද්දී පාර්ලිමේන්තුව පැත්තෙනුත්, ඒ වාගේම නීතිපතිතුමා පැත්තෙනුත්, මේ පනත් පිළිබඳව නීත්‍යනුකූලභාවය සොයා බලන ඒ නිලධාරින් පැත්තෙනුත් යම් අඩුවක් සිදු වෙලා තිබෙන බව අපට දැනට පෙනෙනවා. ඒක තමයි අද අපි මේ නිවැරැදි කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන කොට පාර්ලිමේන්තුවට ඒ සම්බන්ධ නීති උපදෙස් නොයෙක් ආකාරයෙන් ලැබෙනවා. එහෙම නම් නීති උපදෙස් ලැබිලා නැහැ. මේක බරපතළ ප්‍රශ්නයක්. තුනෙන් දෙකේ බලය තිබෙනවා කියලා, අපට ඕනෑ දෙයක් සම්මත කර ගන්න පුළුවන් කියලා, හදිසියේ පනත් කෙටුම්පතක් ගෙනාවා. එහෙම කරන්න පුළුවන්. ඒක නීතියක් බවටත් පත් වෙනවා. නමුත් ක්‍රියාත්මක කරන්න බැරි තැන්වලදී ඒක හිර වෙනවා. ඒ සම්බන්ධයෙන් එක උදාහරණයක් තමයි මේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොට්ඨාස බෙදීම පිළිබඳව - delimitation පිළිබඳව - වචන ස්වල්පයක් කථා කරන්නම්, මේ ප්‍රධාන කරුණට පස්සේ. මේ නීතියේ තිබෙන ප්‍රශ්නය පිළිබඳව කථා කළාට පස්සේ මම ඒ ගැන කථා කරන්නම්. ඔබතුමන්ලා යෝජනාවක් ගෙනාවා. අද රටේ ඇති වෙලා තිබෙන ජන වාර්ගික ප්‍රශ්නයට විසඳුමක් ගෙනෙන්න විශේෂ කාරක සභාවක් පත් කරන්නයි ඒ යෝජනාව ගෙනාවේ. ඒකට සියලුම දේශපාලන පක්ෂවල සහභාගිත්වය අවශ්‍යයි කියලා කිව්වා. අපි එක්සත් ජාතික පක්ෂය හැටියට මේ පිළිබඳව බොහොම පැහැදිලි ප්‍රකාශයක් කරනවා. මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න අවස්ථා කිහිපයකදී එක එක කොමිෂන් පත් කරලා තිබෙනවා. රජය හැටියට එක එක ප්‍රතිඥා දීලා තිබෙනවා. අද මේවා ඔක්කෝම බැහැර කරලා වෙනත් කතන්දරයකට ගිහිල්ලායි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට ස්වෛරී රාජ්‍යයක්. තීන්දු තීරණ ගැනීමේදී ඒ අනුව කටයුතු කරන්න අපට බලය තිබෙනවා. ඒක ඇත්ත. ඒ වාගේම ජාත්‍යන්තරය එක්ක කටයුතු කිරීමේදී අපට ලොකු බැඳීමක් තිබෙනවා. ඒක කාටවත් නැහැයි කියන්න බැහැ.

ඒ බැඳීම අනුව, මේ ජනවාර්ගික ප්‍රශ්නය විසඳීම සඳහා ගත යුතු පියවර ගන්නට ඉතිහාසයේ ඉඳලා රජයයන් හුඟක් අවස්ථාවල ලෑස්ති වෙලා යම් යම් ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. යුද්ධයෙන් පස්සේ අද අප අලුත් තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. අද අප අතේ තිබෙනවා ප්‍රධාන කරුණු කීපයක්. ඒ ප්‍රධාන කරුණු කීපය තමයි, මේ ප්‍රශ්නය විසඳන්න දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීම පිළිබඳව යම් යම් කරුණු සාකච්ඡා කරලා -ජාත්‍යන්තර වශයෙන්- එක්සත් ජාතීන්ගේ මහ ලේකම්තුමා සමඟ අපේ ජනාධිපතිතුමා අත්සන් කරපු අවබෝධතා ගිවිසුම; ඒ වාගේම, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ඇති කර තිබෙන පළාත් සභා ක්‍රමය ඉදිරියට ගෙන යන්නට, ඒ කියන්නේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට තවත් බලතල ලබා දෙන්නට අපේ ජනාධිපතිතුමා ඉන්දියානු අගමැතිතුමා සමඟ වූ එකඟතාව; ඒ වාගේම, තිස්ස විතාරණ කමිටුව බොහෝ කාලයක් සාකච්ඡා කරලා සියලු දෙනාගේ එකඟතාවෙන් ගත් තීන්දුව සහ අප ජාත්‍යන්තරයට වෙච්ච පොරොන්දුව අනුව පත් කරන ලද LLRC එකේ වාර්තාවෙන් මේ ප්‍රශ්නය පිළිබඳව අපට දීලා තිබෙන නිර්දේශ. මේ සියල්ලම අහකට දමලා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන්, බලය බෙදීම සම්බන්ධයෙන් අද හිතුවක්කාර ගමනක් යන්න ආණ්ඩුව ලෑස්ති වෙලා තිබෙනවා. ඒ අතර තමයි විශේෂ කාරක සභාවක් පත් කිරීමේ යෝජනාව ගෙනාවේ. මේ යෝජනාවේ බොහොම පැහැදිලිව තිබෙනවා මේ සඳහා 31දෙනකුගෙන් යුතු විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා. මේ යෝජනාවට අත්සන් කරලා තිබෙනවා රවුෆ් හකීම් මැතිතුමා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, වාසුදේව නානායක්කාර මැතිතුමා වාගේ විශාල පිරිසක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරක සභාවට දැන් පත් කරලා තිබෙනවා මන්ත්‍රීවරුන් පිරිසක්. ගරු කථානායකතුමා මන්ත්‍රීවරුන් 19දෙනකු විතරයි ඒ කමිටුවට නම් කළේ. මේක රජයෙන් අහලා කළාද, එහෙම නැත්නම් ගරු කථානායකතුමාගේ වුවමනාවට කළාද, එහෙමත් නැත්නම් සාකච්ඡාවකින් වූ එකඟතාවකින් කළාද කියලා මම දන්නේ නැහැ. කොහොම වුණත්, 19දෙනායි ඉන්නේ මේ කාරක සභාවේ. මේ කාරක සභාව දැන් වැඩ කටයුතු කරනවා. මේ විධියේ කාරක සභාවක් පත් කරන කොට, ඒ කාරක සභාවට විපක්ෂයේ නියෝජිතයන් නම් කරන්නේ නැත්නම් මොකක්ද කරන්න ඕනෑ? මා දන්නා පිළිවෙළට ආණ්ඩු පක්ෂයට පුළුවන් පත් කරන්න, දැන් පත් කරලා තිබෙනවා වාගේ. ජනවාර්ගික ප්‍රශ්නය සම්බන්ධයෙන් මූලික වෙලා කටයුතු කරන, මේ යෝජනාවට අත්සන් කරපු ආණ්ඩුවේ ඉන්න ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් කථානායකතුමා නම් කරපු මේ 19දෙනා අතර නැහැ. ඉතින්, කොහොමද ප්‍රශ්නය විසඳන්නේ? මේක නීතිය පිළිබඳ ප්‍රශ්නයක් හැටියට දකිනවා කියලා මා කියන්න හේතුව මේකයි. මේ යෝජනාවේ තිබෙන්නේ 31දෙනකු පත් කරන්න කියලායි. දැන් පත් කරලා තිබෙන්නේ 19දෙනායි. දැන් ඒ 19දෙනා රැස් වෙනවා. මම ඔබතුමාගෙන් අහනවා, කොහොමද එහෙම වෙන්නේ කියලා ගරු ඇමතිතුමනි. පාර්ලිමේන්තුවේ යෝජනාව වෙලා තිබෙන්නේ 31දෙනකු පත් කරන්න කියලායි. නමුත් ගරු කථානායකතුමා පත් කරලා තිබෙන්නේ 19දෙනායි. ඉතිරි පිරිස නම් කරන කල් ඉන්න පුළුවන්. ඒකට ප්‍රශ්නයක් නැහැ. ආණ්ඩුවේ ඉන්නවා නම් මේ සඳහා මැදිහත් වෙලා සාකච්ඡා කරන්න කැමැති අය, ඒ අයගෙන් පත් කරන්නත් පුළුවන්. මගේ තර්කය වන්නේ, පාර්ලිමේන්තුවේ යෝජනාව වුණේ 31දෙනකු පත් කරන්න වුණත් 19දෙනකු පමණක් පත් කර තිබීම ගැනයි. දැන් ඒ විශේෂ කාරක සභාව රැස් වෙනවා. දැනට එක වරක් රැස් වුණා. කොහොමද එහෙම රැස් වෙන්නේ? මම මේ සඳහා තමුන්නාන්සේගෙන් පිළිතුරක්

බලාපොරොත්තු වනවා, ගරු ඇමතිතුමනි. දැන් නොවෙයි, තමුන්නාන්සේගේ කථාවේදී.

පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේදී නීති විරෝධි විධියට, නීතිය නොදන්නාකමට වැඩ කටයුතු කළා. පළමුවැනි කාරණය ඒකයි.

දෙවන කාරණය වශයෙන් මා කියන්නේ මේකයි. පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කිරීමේදී ඒ සඳහා 31දෙනකු පත් කරන්න කියා ගෙනාපු යෝජනාව පැත්තකට දමලා, 19දෙනකු පත් කර තිබෙන එකයි. මෙම ප්‍රශ්නයට සම්බන්ධ, ඒක විසඳන්න ඕනෑය කියා කැමැත්තක් තිබෙන ආණ්ඩුවේ ප්‍රධාන අය -විශේෂයෙන් දෙදෙනකු- ඒකෙන් අයින් කරලා තිබෙනවා. රවුෆ් හකීම් ඇමතිතුමාත්, ඒ වාගේම පක්ෂ සියල්ලම එක්ක මේ ප්‍රශ්නය පිළිබඳව පුළුල් සාකච්ඡාවක් මෙහෙයවූ කමිටුවක සභාපතිවරයා හැටියට කටයුතු කරපු තිස්ස විතාරණ ඇමතිතුමාත් මෙම විශේෂ කාරක සභාවට පත් කරලා නැහැ. එහෙම නම් මා කියනවා, මෙයත් නීතියට පිටස්තරව, තුනෙන් දෙකක බලයක් තිබෙනවාය කියලා, වැඩි බලයක් තිබෙනවාය කියලා හිතුවක්කාර ලෙස මෙම පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු මෙහෙයවන කොමිටියක් කියලා.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඇයි යූඑන්පී එක -

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මගේ ප්‍රශ්නය ඒක නොවෙයි නේ. ඒකට මා වෙනම උත්තර දෙන්නම්. මගේ ප්‍රශ්නය තේරුම් ගන්න. 31දෙනකු පත් කරන්න ඕනෑ එකට 19දෙනකු පත් කරලා, ඉතිහාසයේ සිට මෙම ප්‍රශ්නයට මැදි වෙලා හිටපු ආණ්ඩුවේ රවුෆ් හකීම් ඇමතිතුමාත්, තිස්ස විතාරණ ඇමතිතුමාත් ඇයි පත් නොකළේ? මගේ ප්‍රශ්නය ඒකයි. යූඑන්පී එක ගැන වෙනම කථා කරමු. [බාධා කිරීමක්] කරුණාකරලා තමුන්නාන්සේ ඔහොම ඉඳ ගෙන කථා කරන්නත් එපා; හිට ගෙන කථා කරන්නත් එපා. හොඳට ඇහුම් කන් දෙන්න. මා මතු කරන්නේ නීති ප්‍රශ්නයක්. [බාධා කිරීමක්] එය කාගෙන්වත් අහන දෙයක් නොවෙයි. මා අහන්නේ පාර්ලිමේන්තුවෙන්.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඒක අවශ්‍ය නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මා අහන්නේ පාර්ලිමේන්තුවෙන්. මා අහනවා, හෙට ඉඳලා මේ විශේෂ කාරක සභාවට රැස් වෙන්න පුළුවන්ද? මේ විශේෂ කාරක සභාවට රැස් වෙන්න බැහැ. එහෙම නම් මේ විශේෂ කාරක සභාව රැස් වීමත් නීතියට පටහැනිව කෙරෙන වැඩක් හැටියටයි මා දකින්නේ.

ඊළඟ කාරණාව කොට්ඨාස බෙදීම පිළිබඳවයි. මා ඒ ගැන විශේෂයෙන් මතක් කරනවා. රවුෆ් හකීම් ඇමතිතුමාත් ඒ සම්බන්ධයෙන් මතක් කළා. කොට්ඨාස බෙදීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගෙන් අහන්න පුළුවන් නේ. අපි බලාපොරොත්තු වුණු විධියට නොවෙයි ඒ වැඩේ කෙරිලා තිබෙන්නේ. අපි එකඟතාවක් ඇති කර ගත්තා, බොහොම සාධාරණ විධියට මේ දේ කරන්න. අද ආණ්ඩුවේ මන්ත්‍රීවරු, ඇමතිවරු මා එක්ක කියලා තිබෙනවා, කොට්ඨාස බෙදීම කරලා තිබෙන්නේ නිවැරදි ක්‍රමයට නොවෙයි කියලා. එක් එක් කෙනාට තමන්ගේ පුද්ගලයන් පත් කර ගන්න පුළුවන් ආකාරයට කිසිම පදනමක් නැතුවයි මේ කොට්ඨාස බෙදීම කරලා තිබෙන්නේ. ජා-ඇලත් එක කොට්ඨාසයක් තිබෙනවා. ඒ ගැන මා තමුන්නාන්සේට කියන්නම්.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
තවම finalize කරලා නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හදන්න ඕනෑ නිසායි මේ කියන්නේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ කියන්න යන දේ මා දන්නවා. දෙසැම්බර් මාසය දක්වා කල් දමා තිබෙනවා; අපට කරුණු ඉදිරිපත් කරන්න පුළුවන් - [බාධා කිරීමක්]

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
මඩ ගහන්න බැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මඩ ගැහුවේ නැහැ නේ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
විශේෂයෙන් කොමිටි පත් කර තිබෙනවා. ඒ එක් එක් මන්ත්‍රීවරුන්ගේ -

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාවයි මෙතුමා ගන්නේ. [බාධා කිරීමක්] මා දන්නවා. කරුණාකරලා මගේ වෙලාව ගන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාව ගන්න එපා කියන්න. මට disturb කරන්නත් එපා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා, එතුමාගේ කථාවේදී එතුමා පැහැදිලි කරයි. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
වැදගත් කරුණක් කියන කොට, තමුන්නාන්සේලා කෑ ගහලා ඒක යටපත් කරන්න එපා. [බාධා කිරීමක්] ඒක හරි නේ. අපි එකඟ වුණා නේ. [බාධා කිරීමක්] දැන් මා කථා කරනවා. ගරු ඇමතිතුමාට වෙලාව තිබෙනවා, මේවාට උත්තර දෙන්න. කරුණු පැහැදිලි කර දෙන්න ඔබතුමාට වෙලාව දෙන්න මගේ කැමැත්ත ඕනෑ. ගරු ඇමතිතුමනි, මගේ කැමැත්ත නැතුව පැහැදිලි කරන්න බැහැ. ඒ පැහැදිලි කිරීම කරන්න ඔබතුමාට වෙලාවක් තිබෙනවා.

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

මා පැහැදිලි කළේ මෙයයි. තමන්ගේ මිනිසුන් පත් කරන්න පුළුවන් විධියට ඉතාම වැරදි පිළිවෙළට රජයේ මන්ත්‍රීවරු, සංවිධායකවරු ලැයිස්තුව හදලා දුන්නා, මෙහෙමයි කරන්න ඕනෑ කියලා. අන්න ඒ විධියේ වැඩක් සිද්ධ වෙලා තමයි ජාතික කමිටුවට ගිහින් තිබෙන්නේ. අපි ඒකයි ගරු ඇමතිතුමා දැනුවත් කරන්නේ. අපි දන්නවා, රජයම මැදිහත් වෙලා ඒ ගැටලුව විසඳන්න තවත් කල් දුන්නා කියලා. ඒ ගැන අපි ස්තුතිවන්ත වනවා. ඇමතිතුමනි, මෙය නිවැරැදියි කියන්න එපා. අපි අහන්නේ, ඒවා නිවැරැදි කර ගන්නේ කොහොමද කියලායි. දැන් යම්කිසි තීරණයක් අරගෙන තිබෙනවා නම්, ඒ තීරණය සම්බන්ධයෙන් තමුන්නාන්සේලා අප දැනුවත් කරන්න, මෙන්න මේකයි කොට්ඨාස බෙදීමේ ක්‍රමය කියලා. මේ රටේ ජනතාව කවුරුත් දන්නේ නැහැ, කොහොම කොට්ඨාස බෙදනවාද කියලා. ඇමතිතුමාට ඒ නිර්දේශය ලැබුණාම එය හරි හෝ වැරැදි හෝ චේවා ජනාධිපතිතුමාට යවනවා. ඊට පස්සේ එතුමාටත් මේ සම්බන්ධයෙන් සොයන්න ක්‍රමයක් නැහැ. ඊට පස්සේ ගැසට් කරනවා. මෙහෙම තමයි කොට්ඨාස බෙදීමේ නීතිය අනුව කොට්ඨාස පිහිටු වන්නේ.

මා ඔබතුමාට යෝජනා කරන්නේ, මේ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්නය කියායි. "මෙන්න මෙහෙමයි අප කරන්න යන්නේ." කියා දැනුවත් කරන්න. "ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, පළාත් පලන ආයතන මට්ටමින් මේ ජාතික කමිටුවට ලැබී තිබෙන තොරතුරු අනුව, අප නිර්දේශ කර තිබෙන්නේ මේ ආකාරයටයි, මේකට විරුද්ධත්වයක් තිබෙනවා නම්, ඒක ඉදිරිපත් කරන්න." කියා ජනතාව දැනුවත් කරන්න. මේක අපට දෙන දෙයක් නොවෙයි. මේක මහජනයාට දෙන දෙයක්. මේක කරලා ඉවර වුණායින් පස්සේ තමයි, ඒක නිවැරදි කරන්න ආපසු පාර්ලිමේන්තුවට ගේන්න වෙන්නේ. මා කියන්නේ, ඊට ඉස්සෙල්ලා අපට මේක නිවැරදි කරන්න පුළුවන්ය කියායි. දැනට හදලා තිබෙන ලැයිස්තු ටික තීරණ ටික අනුව, මෙන්න මෙහෙමයි කොට්ඨාස ටික බෙදෙන්නේ, මෙන්න මෙහෙමයි බහු ආසන හැදෙන්නේ කියා පෙන්නුවාම ජනතාව දැනුවත් වෙනවා. ජනතාව ඒ ගැන කථා කරාවි. [බාධා කිරීමක්] ඒක වැරදි නම් පස්සේ කියන්න. ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] මම මෙය කියන්නේ, මඩ ගහන්නට නොවෙයි. මෙය මා දන්නා දෙයක්.

ජා ඇල මැතිවරණ කොට්ඨාසයයි, නාගොඩ මැතිවරණ කොට්ඨාසයයි බහු කොට්ඨාසයක් කරලා. කිසිම පදනමක් නැහැ. ප්‍රධාන පාර දෙපැත්තේ තිබෙන කොට්ඨාස දෙකක් අර ගෙන එකට ඈඳලා බහු කොට්ඨාසයක් කරලා. මම මේ කියන්නේ දන්නා දෙයක්. ඔබතුමා මේ ගැන සොයා බලන්න. [බාධා කිරීමක්] මොකක්ද අප මේ කථා කරන්නේ? මගේ මතය තමයි මා කියන්නේ. ඒක වැරදියි කියලා තමුන්නාන්සේ කියනවා නම්, ඒක තමුන්නාන්සේගේ වැඩක්. [බාධා කිරීමක්] මට තේරෙනවා නේ. මා කියන්නේ, ඒ අරගෙන තිබෙන තීරණ ටික ගැසට් කරන්නට පෙර මහජනතාව දැනුවත් කරන ක්‍රමවේදයක් හදන්න කියලායි. ඔබතුමා පිළිගත්තා නේ. [බාධා කිරීමක්] "බලමු" නොවෙයි කරමු. දැන් එහතාවක් තිබෙනවා නේ. මේ අනුව බලන විට අපට කොට්ඨාස බෙදීම පිළිබඳව නිවැරදි වැඩ පිළිවෙළකට යන්නට පුළුවන්.

විශේෂයෙන් සැලකිල්ලට ගත යුතු අනෙක් කාරණය තමයි ජන පදනම. සමහර කොට්ඨාසවල තිබෙන්නේ ඡන්ද 2,000 යි. සමහර කොට්ඨාසවල තිබෙන්නේ ඡන්ද 5,000 යි. කොහොමත් එහෙම වෙන්න බැහැ, භූමියේ වෙනස්කම් ගත්තත්. ළඟ තිබෙන කොට්ඨාසයේ ඡන්ද 2,000කට කැඩෙනවා. ඊළඟට අල්ලපු කොට්ඨාසයේ ඡන්ද 5,000කට කැඩෙනවා. මේ විධියට වැරදි ක්‍රියා කලාප කිහිපයක් ඇති කරලා, මේවා මතු වෙනකොට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ලියුම් එවා තිබෙනවා ඇවිල්ලා මේ ගැන බලන්න කියා. අපට එහෙම ලියුම් එව්වේත් නැහැ, අපි බලන්න ගියේත් නැහැ. කරුණාකර, දැනට සකස් කර තිබෙන වැඩ පිළිවෙළ ගැන අපව දැනුවත් කරන්නය කියා මේ ඉන්න මන්ත්‍රීවරුන්ට කියන්න. "අප ගත්ත පදනම මෙන්න මේකයි, ඒ පදනම උඩ මේ කොට්ඨාසවල තිබෙන විශාලත්වය අප සොයා බැලුවා. ජාතීන් අනුව ලැබෙන්නට තිබෙන අයිතිවාසිකම් පිළිබඳව අප සොයා බැලුවා. ආගම් අනුව සොයා බැලුවා." කියා ඒ පිළිබඳව පැහැදිලි කරන්න.

උදාහරණයකට කිව්වොත්, අපේ ගම් හැදිලා තිබෙන ක්‍රමය බලමු. පන්සලක් තිබෙනවා නම් ඒ පන්සල අවට එක ජන කොට්ඨාසයක් තමයි ජීවත් වෙන්නේ. ඒ බෞද්ධ ජනතාවයි. මීගමුවේ බැලුවොත් ගරු හකීම් ඇමතිතුමා කිව්වා වාගේ, මුස්ලිම් පල්ලිය වටා ප්‍රදේශයේ තමයි මුස්ලිම් ජනතාව ජීවත් වෙන්නේ. ඒ වාගේම කතෝලික අයටත්, ක්‍රිස්තියානි අයටත් පල්ලියක් තිබෙනවා. ඒ පල්ලිය අවට තමයි ඒ ජනතාව ජීවත් වන්නේ. ඒ පරීක්ෂණය කළාම, මේ කාරණය මා තමුන්නාන්සේට සනාථ කරන්නම්. පල්ලියට තිබෙන ගම් දෙකක් දෙපැත්තට බෙදලා. එකක් ඈඳලා බෞද්ධ පළාතට; පන්සලට. අනෙක් එක තවත් තැනකට ඈඳලා. පල්ලියත් බෙදෙනවා. පන්සලත් බෙදෙනවා. මේ කාරණා සියල්ලම අද සිද්ධ වෙලායි තිබෙන්නේ. එම නිසා මා මේ කාරණය ගැන ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේක අපට විතරක් නොවෙයි, තමුන්නාන්සේලාගේ පැත්තේ සිටින මන්ත්‍රීවරුන්ටත් තිබෙන ප්‍රශ්නයක්. ඒ අයත් අප එක්ක කිව්වා,"අපට කථා කරන්නට විධියක් නැහැ. තමුන්නාන්සේලාවත් මේ ගැන කථා කරන්න" කියා. එම නිසායි මා මේ කාරණා ගැන සඳහන් කළේ.

විශේෂයෙන්ම මම මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. මේ කොට්ඨාස බෙදන කොට ඒ ඒ මන්ත්‍රීවරුන්ට රාජකාරිය කරන ක්‍රම පිළිබඳව මීට වඩා විධිමත් වැඩ පිළිවෙළක් හදලා දෙන්න; බලයක් දෙන්න. ඒ අය හැම තිස්සේම කියන දෙයක් තමයි, අප අත් දැකපු දෙයක් තමයි, පළාත් පාලන ආයතනවලට ඔප්පු, මුද්දර ගාස්තු, දඩ මුදල් ආදිය ලැබෙන කොට, ඒවා පළාත් සභාව තියා ගන්නවාය කියන එක. නමුත් ඒවායේ අයිතිය තිබෙන්නේ පළාත් පාලන ආයතනයටයි. නමුත් ඒවාට දෙන්නේ නැහැ. මේ ප්‍රශ්නය හරියට තිබෙනවා.

අද හිතුවක්කාර ආකාරයට ගෙවල් හදනවා. සැලැස්මක් අනුමත කරන්නේ නැහැ. මේ වාගේ වෙලාවකදී ක්‍රියා කරන ආකාරයක් අපට පේන්නේ නැහැ. ඉදිරියේදී එක තැනක පාරේ පළල අඩි 20ක් වෙයි, තව තැනක අඩි 10ක් වෙයි කියලා. අනාගතයේ එහෙම වෙයි කියලා අපට හිතෙනවා. මේ අත්දැකපු දේවල් අප මේ කියන්නේ. වාහන මෙපමණ සංඛ්‍යාවක් මේ පාරේ යයි, විදුලි බලය එයි, අප ජලය දෙන්න ඕනෑ, කානු දමන්න ඕනෑ, ඒ නිසා මෙන්න මේ පළලත් තිබෙන්න ඕනෑය කියා කියනවා. මේවා නීතියෙන් කියා තිබෙනවා. නමුත් ක්‍රියාත්මක වන්නේ නැහැ. මම කියන්නේ නැහැ කොයි දේශපාලන පක්ෂයද කියලා. ඉස්සර එහෙත් වුණා. දැන් මෙහෙත් වෙනවා. මෙයින් සිදු වන්නේ සැලසුම් සහගත නොවන අවිධිමත් පාලනයක් මේ කොට්ඨාස තුළ ඇති වීමයි. ඊට පසුව සැලසුම් හදන්න යන කොට ගෙවල් කඩන්න වෙනවා. විශාල වශයෙන් වන්දි ගෙවන්න වෙනවා.

අනික් කාරණය මෙයයි. සමහර පළාත් පාලන ආයතන නාගරික සංවර්ධන අධිකාරියත් සමඟ සම්බන්ධීකරණයක් කළා. එහෙම සම්බන්ධීකරණය කළාම විවිධ කටයුතුවලදී බදු ගෙවන්නන්ට නාගරික සංවර්ධන අධිකාරියට විශාල මුදලක් ගෙවන්න සිද්ධ වෙනවා. මේක ලොකු ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමනි, ඒ කෙරෙහි මා තමුන්නාන්සේගේ විශේෂ අවධානය යොමු කරවනවා. මෙය මැතිවරණ -ඡන්ද විමසීම්- හා සම්බන්ධ පනත් කෙටුම්පතක් වුණත්, මේ ක්‍රියාකාරීත්වය පිළිබඳව වෙනම කථාවක් ඇති කරන්න වෙනවා. එසේ කරලා මීට වඩා බලතල එම ආයතනවලට දෙන්න.

මම උදාහරණයක් කියන්නම්. බොහෝ දුරට රජයේ මුදල් වෙන් කරන කොට ඒ මුදල් නියමාකාරයෙන් දෙන්න ඕනෑ ඒ පළාත් පාලන ආයතනයටයි. මොකද, ඒ පාර කැඩුණොත් නඩත්තු කරන්නේ ඒ පළාත් පාලන ආයතනයයි. දැන් ඒක තමයි වෙනස් වෙලා තිබෙන්නේ. අපේ මහ ආණ්ඩුව, පළාත් සභාව හිතුවක්කාර විධියට ගිහින් ප්‍රාදේශීය සභාවට, නගර සභාවට අයිති ප්‍රදේශයක පාරක් හදනවා. ඇමතිවරයෙක් යනවා නම් ඒ පාර හදනවා. අර අහිංසක මන්ත්‍රීවරු දන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ පැත්තෙ මන්ත්‍රීවරු දන්නෙත් නැහැ. කවුද මේවා නඩත්තු කරන්නේ? නඩත්තු කරන්න කෙනෙක් නැහැ. පාර හැදුවා, ගියා. ඒ නඩත්තු කරන කොටත් ඒ වියදම් කරන මුදලින් සියයට 50ක්වත් එතැනට වියදම් වන්නේ නැහැ. දැන් ඒ පාරවල් යන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා පළාත් පාලන ආයතනවල බලය ස්ථාවර කරන්න. ඒක වැදගත්.

ඉස්සර මෙන්න මේ විධියේ ක්‍රමයක් තිබුණා. මමත් පළාත් පාලන ආයතනවල වැඩ කර තිබෙන නිසා මේ ගැන දන්නවා. ඒ කාලයේ ලියා පදිංචි නැති පාරකට අපට වැඩ කරන්න බැහැ. එය සංවර්ධනය කරන්නත් බැහැ. පාර දෙපස පදිංචි වෙලා ඉන්න අයගෙන් අවසර ගන්න ඕනෑ. ඊට පසුව එය කරන්න ඕනෑ. ඒක තමයි පොදු පාරක් වන්නේ. දැන් ඒ කිසි දෙයක් නැහැ. එක්කෙනෙකුගේ ගෙදරට පාරක් තිබෙනවා. ඔන්න ගිහින් ඒ පාරට තාර දමනවා; කොන්ක්‍රීට් කරනවා. මේ විධියේ විධිමත් නොවන සංවර්ධනයක් මේ පළාත් පාලන ආයතන හරහා සිදු වෙනවා නම් ඒක මේ රටට හොඳ දෙයක් නොවෙයි. එය ක්ෂණිකව කවුරු හරි සතුටු කරන්න පුළුවන් ක්‍රමයක් විතරයි. ඒ නිසා මේ පනත් ගැන කථා කරන කොට විශේෂයෙන්ම මේ කිව්ව කරුණුවලට මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු ඇමතිතුමනි, ජන වාර්ගික ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කරන්න දැන් පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක වන විශේෂ කාරක සභාව ගැනත් මා යමක් කිව යුතුයි. එම යෝජනාවේ තිබෙන්නේ එම විශේෂ කාරක සභාවට සාමාජිකයන් තිස්එක්දෙනෙකු පත් කරන්න කියලායි. නමුත් දැන් එම කාරක සභාවේ සාමාජිකයන් තිස්එක්දෙනෙකු නැහැ. දැන් එම කාරක සභාවේ ඉන්නේ සාමාජිකයන් දහනවදෙනායි. ඒකට කමක් නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හොඳයි.

එතකොට සාමාජිකයන් තිස්එක්දෙනෙකු පත් කරන තුරු මේ කාරක සභාව ක්‍රියාත්මක වෙන්න බැහැ. [බාධා කිරීමක්] ඒක නොවෙයි. ඔබතුමන්ලාගේ පැත්තේ ඉන්නවා නේ. ඒ අය පත් කරන්නකෝ, අපෙන් අහන්නේ නැතිව. රවුෆ් හකීම්, මහාචාර්ය තිස්ස විතාරණ වැනි ඇමතිවරු ඉන්නවා නේ. තව කොච්චර අය ඉන්නවාද? පත් කරන්නකෝ. අප එපා කිව්වාද? එතකොට නේ ආණ්ඩුව ඇතුළේ එකඟතාවත් ඇති වන්නේ? ආණ්ඩුව ඇතුළේ එකඟතාවක් නැතිව අපට කියනවා. මේක වැරදියි. මම මේ කියන්නේ නීතියේ පැත්ත ගැනයි. සාමාජිකයන් තිස්එක්දෙනෙකු පත් කරන්න කියලා ගෙනාපු යෝජනාව සම්මත වෙලා ඒ අනුව ගරු කථානායකතුමා පත් කර තිබෙන්නේ සාමාජිකයන් දහනවදෙනෙක් විතරයි. ඒ දහනවදෙනා තමයි මේ කාරක සභාව ආරම්භ කරලා වැඩ කටයුතු කරගෙන යන්නේ. මම කියන්නේ මේක වැරදියි කියලායි.

ඉතිරි අයවත් පත් කරන්න. 31 දෙනාවම පත් කරන්න. අපි ඉදිරිපත් වන්නේ නැත්නම්, පාර්ලිමේන්තුවේ තවත් මන්ත්‍රීවරුන් ඉන්නවා නේ. තමුන්නාන්සේලාගේ පැත්තේ මේ ප්‍රශ්නයට මැදිවුණු මන්ත්‍රීවරුන් ඉන්නවා නේ. ඒ අයව පත් කරන්න. ඒ අයව පත් කරලා නීත්‍යනුකූල විධියට මේක කරන්න. මේ විශේෂ කාරක සභාවට සහභාගි වන්න නම් මෙන්න මේ කාරණා ඉෂ්ට කළ යුතුයි කියලා අපි රජයට දැනුම් දීලා තිබෙනවා. අපේ නායකතුමා විසින් ජනාධිපතිතුමාට දැනුම් දීලා තිබෙනවා, මෙන්න මේ කාරණා ඉෂ්ට කරනවා නම් අපි මෙම විශේෂ කාරක සභාවට සහභාගි වනවා කියලා. එය ලිඛිතව දැනුම් දුන්නා. නමුත් අද වන තුරු ජනාධිපතිතුමා එයට පිළිතුරක් එවලා නැහැ. පිළිතුරක් එවනවා නම්, අපි මේ විශේෂ කාරක සභාවට සහභාගි වනවාද, නැද්ද කියන එක ගැන අපිට තීරණයක් ගන්න පුළුවන්. ඒ යවපු ලිපියට පිළිතුරක් එවන්නේ නැත්නම්, අපි ස්ථිර වශයෙන්ම එයට සහභාගි වන්නේ නැහැ. ඒක බොහොම පැහැදිලියි. ඒ නිසා අපි ගැන බලාපොරොත්තුවක් තබන්නට එපා. අලුත් ව්‍යවස්ථාවක් පිළිබඳව යෝජනාවක් අපි ඉදිරිපත් කරනවා. අන්න ඒක සාකච්ඡා කරලා අපි එකඟතාවකට එමු. එතැන තිබෙනවා, මේ ප්‍රශ්නයට විසඳුමක්. මීට වඩා මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. ඔබතුමාට ස්තුතියි.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaulla)
Question and Answer දෙකම එතුමා කළා. පළාත් පාලන ආයතනයට බලයක් නැහැ, පළාත් සභාවට බලයක් තිබෙනවා, පළාත් සභාවෙන් ගිහිල්ලා ඒ පළාතේ මන්ත්‍රීවරුන් දන්නේත් නැතිව පාරවල් හදනවා කියලා කිව්වා. හරි. පළාත් පාලන ආයතන ශක්තිමත් කරනවා නම්, දැන් අපි ඒ සඳහා අනුමැතිය ගන්නට ඕනෑ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභාවෙනුයි. අපේ අතිගරු ජනාධිපතිතුමා දැන් කියන්නේ ඒකයි. මේ පළාත් පාලන ආයතන ශක්තිමත් කරනවා නම්, අපි ඒ සඳහා පළාත් සභාවෙන්ම අනුමැතිය ඉල්ලන්නට ඕනෑ. පළාත් සභාව ඒ අනුමැතිය දෙයිද? තමන්ගේ බලය නැති කර ගන්න ඒගොල්ලන් කැමැති වෙයිද? [බාධා කිරීමක්] ඒ වාගේම මුද්දර ගාස්තු ගැන සඳහන් කරන්නේ මොකක්ද? මුද්දර ගාස්තු අයිති වන්නේ පළාත් සභාවට කියලා ඔබතුමන්ලා තමයි කියලා තිබුණේ. එදා Indo-Sri Lanka Peace Accord එක අත්සන් කරලා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙල්ලා, එක්සත් ජාතික පක්ෂයෙන් තමයි ඒ බලය පළාත් සභාවට දුන්නේ. [බාධා කිරීමක්] ඔව්, ඔව්. ඒක වෙනස් කරනවා නම් පළාත් සභාවෙන් අනුමැතිය දෙන්න ඕනෑ නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, බොහොම ස්තුතියි. ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාවේ දී තවදුරටත් පැහැදිලි කරන්න. මීළඟට, ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා.

[අ.භා. 3.45]

**ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! කරුණාකර මේ අවස්ථාවේ දී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මොහාන් ප්‍රියදර්ශනද සිල්වා මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SHANTHA BANDARA *left the Chair, and* THE HON. MOHAN PRIYADARSHANA DE SILVA *took the Chair.*

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුවිශේෂ සාකච්ඡාවක් සිදු වන මේ අවස්ථාවේ දී පළමුවෙන්ම ජෝශප් මයිකල් පෙරේරා, අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා - [බාධා කිරීමක්] ආ, සමාවෙන්න. දැන් ඒ තනතුර ඔබතුමාගෙන් මාරු වෙලානේ. ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා කියපු කාරණා කිහිපයක් පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වනවා. එතුමා කියපු එක කරුණක් තමයි, මේ මන්ත්‍රීවරුන් පත් කිරීම සඳහා වන කොට්ඨාස ක්‍රමය ප්‍රායෝගික නැති විධියට සකස් කරලා ඉවරයි; අවසානයි කියලා. එතුමන්ලා ඒ පිළිබඳව අදහස් දරනවා කියලා කිව්වා. නමුත් මා පැහැදිලිව සඳහන් කරන්නට කැමැතියි, ඒ පිළිබඳව මේ වනවිට සාකච්ඡා සිදු වෙමින් පවතින බව. ඒ පිළිබඳව අදහස් දැක්වීමේ හැකියාව එතුමන්ලාටත් තිබෙනවා. ඒ වාගේම එතුමන්ලාගේ පක්ෂයේ පළාත් පාලන මන්ත්‍රීවරුන්ටත් ඒ පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීමේ හැකියාව තිබෙනවා. ඊට පසුව තමයි අවසාන තීන්දුව ගනු ලබන්නේ. හැබැයි ඒකෙදී පල්ලියට එක කොටසයි, පන්සලට එක කොටසයි, කියලා එහෙම වෙන් කරන්නට අවශ්‍ය වන්නේ නැහැ. ඒක වෙන් කරන ක්‍රමවේදයක් තිබෙනවා. බොහෝවිට ජන වාර්ගික පදනම පිළිබඳව සැලකිලිමත් වෙනවා. ඒ වාගේම ජනගහනය, ප්‍රදේශයේ පිහිටීම ගැන තමයි ප්‍රධාන වශයෙන්ම සැලකිලිමත් වන්නේ. ඒ නිසා අවසාන තීන්දුවක් ගෙන නැහැ. හොඳම දේ තමයි ඔබතුමන්ලාගේ තිබෙන යෝජනාවලිය අනුව ඒ සංශෝධන ඉදිරිපත් කරන්න. අදහස් ඉදිරිපත් කළාම හොඳ දෙයක් සිදු වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පළමුවෙන්ම කියන්න කැමැතියි, එය ඉතිහාසගත පනතක් බව. මනාප ඡන්ද ක්‍රමය, ඒ වාගේම එයින් ඇති වුණු ගැටුම් පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් අනතුරුවයි එම පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ. රටේ ජන මතයක් ඇති වෙලා තිබුණා; ඡන්ද දායකයන්ගේ මතයක් නිර්මාණය වෙලා තිබුණා, මේ පළාත් පාලන ඡන්ද ක්‍රමය විතරක් නොවෙයි, සියලුම මැතිවරණ ක්‍රම සංශෝධනය කරන්නට ඕනෑ යි කියලා. ඒ අනුව ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් එයට පත් කළා. මටත් එහි සාමාජිකයකු වශයෙන් සම්බන්ධ වන්නට අවකාශ ලැබුණා.

මෙහි බොහෝ මන්ත්‍රීවරු සම්බන්ධ වුණා. එතැනදී ගත්ත තීන්දු අනුව එක ස්ථානයක මේක පටන් ගත්තා. පළාත් පාලන මැතිවරණ ක්‍රමය සංශෝධනය තමයි පළමුව ආරම්භ කළේ. ඒක අද සාර්ථක විධියට ඉස්සරහට යනවා. පොඩි පොඩි අඩු පාඩු ඇති වෙන්න පුළුවන්. මේක සියයට 100ක් සාර්ථක කර ගන්න ටිකක් අමාරු වෙනවා. මොකද, අලුත්ම ක්‍රමයක් තමයි මෙතැනින් හඳුන්වා දීම සිද්ධ වන්නේ. හැබැයි ඒක එක්ක හොඳ දෙයක් වෙනවා. මන්ත්‍රීවරයාට කොට්ඨාසයක් තිබෙනවා, කොට්ඨාසයකට නිශ්චිත වූ මන්ත්‍රීවරයෙක් ඉන්නවා.

අද පළාත් පාලන ආයතනවල විතරක් නොවෙයි, මුළු පාර්ලිමේන්තුවේම වේවා, පළාත් සභාවල වේවා, ඡන්දය දෙන්න ගියාම ජනතාවට විශාල ගැටලුවලට මුහුණ පාන්නට සිද්ධ වෙනවා. සමහර වෙලාවට තමාගේ ඡන්දය තම පක්ෂයේ කෙනෙකුට පාවිච්චි කළත්, තමා එම පක්ෂයේ ක්‍රියාකාරී දේශපාලනයේ යෙදුණත්, එම පක්ෂයේම තවත් කෙනෙකුගෙන් අවශ්‍ය සහයෝගය නොලැබෙන්නට ඕනෑ තරම් අවකාශ තිබෙනවා. ඒ වාගේම විවිධ ගැටුම් පවා නිර්මාණය වී තිබෙනවා. ඒ වාගේම සමහර ගම්වලට සංවර්ධන වැඩ බෙදී යාමේ අඩු පාඩු පවා මේ තුළ ඇති වෙලා තිබෙන බව ඉතාමත්ම පැහැදිලියි.

මේ කරුණු වටහා ගෙන අතිගරු ජනාධිපතිතුමාත්, ඒ වාගේම රජයක් විධියට අපත් තීන්දු කළා, පළාත් පාලන මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන්න. ඒ අනුව ආරම්භයක් විධියට තමයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන්නේ. මේක ඉතාමත් හොඳ වැඩ පිළිවෙළක්.

ප්‍රායෝගිකව විවිධ අත් දැකීම් අපට තිබෙනවා. දැන් පවතින සමහර පළාත් පාලන ආයතන බැලුවොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -ඒ ආයතනයේ පාලනය ආණ්ඩු පක්ෂයේද විරුද්ධ පාර්ශ්වයේද කියන එක නොවෙයි- ඒවා නිකම් පෞද්ගලික කොම්පැනි වාගේ වෙලා තිබෙනවා. හැබැයි එක් කාරණයක් කිය යුතුව තිබෙනවා. පෞද්ගලික කොම්පැනියක් නම් අධ්‍යක්ෂ මණ්ඩලයත් එක්ක නේ තීන්දු ගන්නේ. එහෙම නොවෙයි, සභාපතිවරයා විතරක් තීන්දු ගන්නා බොහෝ කොම්පැනිවල තත්ත්වයට මේ ආයතන පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පත ඉතාමත් ඉක්මනින් ඉදිරිපත් වීම ගැන අපි සතුටු වෙනවා. ඒ වැඩ පිළිවෙළත් එක්ක ජනතාවට වැඩි සේවාවක් සිදු වෙයි කියලා අපි හිතනවා.

සමහර වෙලාවට අපට ආරංචි ලැබෙනවා; අපට තොරතුරු ලැබෙනවා, අල්ලස්වලට සම්බන්ධ වුණු පළාත් පාලන ආයතන ප්‍රධානීන්, ඒ වාගේම ජනතාවට අවහිර කරන ප්‍රධානීන් පිළිබඳව පවා. ඒවා එච්චර හොඳ තත්ත්ව නොවෙයි. මේ තත්ත්ව දැන් වහාම වෙනස් වෙන්න ඕනෑ. නව ඡන්ද ක්‍රමයත් එක්ක එන කොට අඩුම ගණනේ කණ්ඩායමක් එකතු වෙලා වැඩ කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. එතකොට සභාපතිවරයාට විතරක් හිතුමතේට වැඩ කරන්න පුළුවන්කමක් නැහැ. ඔහුට මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අවශ්‍ය වෙනවා. අවම වශයෙන් තමන්ගේ පක්ෂයේවත්, තමන්ගේ කණ්ඩායමේවත් සහයෝගය ඇතිව තමයි පළාත් පාලන ආයතන පවත්වා ගෙන යන්න පුළුවන් වන්නේ කියන එක පිළිබඳව අපි ඉතාමත් පැහැදිලිව සඳහන් කරන්නට කැමැතියි.

ගරු ජෝශප් මයිකල් මන්ත්‍රීතුමා බොහෝ කාරණා කියලා එක් ප්‍රධාන කාරණයක් ගැනත් කිව්වා. ඒ තමයි දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව. ඒ සම්බන්ධයෙන් මේ දිනවල පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් රැස් වෙනවා. ඒ පිළිබඳව විවිධ මත එතුමා ඉදිරිපත් කරන්නට වුණා. ඒ කාරක සභාව වලංගු නැති බව කියන්න ගත්තා, ඒ කාරක සභාවට සාමාජිකයෝ 31 දෙනෙක් ඉන්න ඕනෑ, පත් වෙලා ඉන්නේ 19 දෙනායි කියලා. මේ 31දෙනාගෙන් 19 දෙනෙක් පත් වෙලා නම් කවුද ඉතුරු සාමාජිකයෝ? ඉතුරු සාමාජිකයන් විධියට නම් කරන්න ඉන්නේ

වෙන කවුරුවත් නොවෙයි, ඒකේ යුතුකම පැහැර හැර තිබෙන්නේ කවුරුවත් නොවෙයි, එක්සත් ජාතික පක්ෂය, ඒ වාගේම ටීඑන්ඒ එක ඇතුළු ඒ කණ්ඩායමට තමයි ඒ කොටස වෙන් වෙලා තිබෙන්නේ. ඒ අයගේ යුතුකම තමයි ඒකට ඇතුළු වීම. ඒ ගොල්ලෝ ආවේ නැහැයි කියලා මේ කාරක සභාව නීති විරෝධී කාරක සභාවක් බවට පත් කරන්න පුළුවන්කමක් නැහැ.

දැන් එතුමා ගෙනෙන තර්කය තමයි, මේ කාරක සභාවේ සාමාජිකයෝ 31 දෙනෙක් නැහැ, 19 දෙනායි ඉන්නේ, ඒ නිසා මේ කාරක සභාව නීත්‍යානුකූල නැහැයි කියන එක. ඒක පදනම් විරහිත ප්‍රකාශයක් කියන එක අපි පැහැදිලිව සඳහන් කරන්න කැමැතියි.

කමිටුවට සාමාජිකයෝ පත් කරන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදයට අනුව කථානායකතුමා ආණ්ඩුව නියෝජනය කරන්නත්, පක්ෂ ගණනාවක් නියෝජනය කරන්නත් පිරිසක් නම් කරලා තිබෙනවා. සාමාජිකයෝ ගණනකට අවස්ථාව ඉතිරි කරලා තිබෙනවා, ඒ අයට ඇවිල්ලා එහි සාමාජිකත්වය අරගෙන කටයුතු කිරීමේ හැකියාව තිබෙනවා.

මේ වාගේ ජාතික ප්‍රශ්නයකදී මඟ හැරලා යන එක නොවෙයි කාර්ය භාරය වෙන්නේ. මේ වාගේ ජාතික ප්‍රශ්නයකදී රට විතරක් නොවෙයි, ලෝකයම බලාගෙන ඉන්න කාරණයක් පිළිබඳව සාකච්ඡා වෙන කොට, විශේෂ කාරක සභාවක් පාර්ලිමේන්තුවේ තිබෙන කොට විරුද්ධ පක්ෂයේ යුතුකම තමයි සියලුම දෙනා ඇවිල්ලා එතැනට සම්බන්ධ වීම. ඒ කටයුතු පිළිබඳව සෑහීමකට පත් වෙන්නේ නැත්නම් නැඟිටලා යන එක වෙනම දෙයක්. නමුත් මේ කාරක සභාවට එන්නත් ඉස්සෙල්ලාම කියනවා,"අපි සම්බන්ධ වෙන්නේ නැහැ"යි කියලා. එන්න ඉස්සෙල්ලා කියනවා. ඒ කියන්නේ පාර්ලිමේන්තුවේ ඉන්න ගමන් කියනවා, මේ පාර්ලිමේන්තු කටයුත්ත පිළිබඳව විශ්වාසයක් නැහැයි කියලා. ඒක බරපතළ කාරණයක්. පාර්ලිමේන්තුවේ මේ කමිටුවට සම්බන්ධ වෙන්න බැරි නම් මම හිතන හැටියට පාර්ලිමේන්තුවට එන එකේ තේරුමකුත් නැහැ. එතැනට ඇවිල්ලා තමන්ගේ පක්ෂයේ අදහස, තමන්ගේ ජන කොට්ඨාසයේ අදහස ප්‍රකාශ කරන්නට ඕනෑ. ප්‍රකාශ කරලා ඒකේ වැරැද්දක් තිබෙනවා නම්, අඩු පාඩුවක් තිබෙනවා නම් ඒක වෙනම කථා කරන්නට ඕනෑ. එක්සත් ජාතික පක්ෂය ඇතුළු මේ තේරීම් කාරක සභාවට සහභාගි නොවන සියලු පක්ෂවලට කවදා හෝ දවසක ඉතිහාසයේ වුණු මේ වැරැද්ද පිළිබඳව ජනතාවගෙන් සමාව ගන්නට වෙයි. මම එය පැහැදිලිව කියනවා. ඒ නිසා හැම කෙනෙකුගේම යුතුකම තමයි මේ වෙලාවේ මේ කාරක සභාවට ඇවිල්ලා අදහස් ඉදිරිපත් කිරීම; යෝජනා ඉදිරිපත් කිරීම. ඉන් පසුව තමයි තීන්දු ගන්නේ. ඒ යෝජනා පිළිගන්නේ නැත්නම්, එහෙම නැත්නම් ඒ මතය අහන්නේ නැත්නම් නැඟිටලා ගියත් කමක් නැහැ කියලා මම හිතනවා. එන්නේම නැතිව මේක පැත්තකට දාලා සිටීම තමන් නියෝජනය කරන ජන කොට්ඨාසවලට සහ තමන්ට ඡන්දය දුන්නු ජනතාවට කරන ද්‍රෝහීකමක් විධියට තමයි මම නම් පැහැදිලිව දකින්නේ. රටක් විධියට ගත්තොත් මේක අපට ලැබෙන හොඳම අවස්ථාව මේ ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කරන්න. මේ ප්‍රශ්නය පිළිබඳව අපි කොපමණ මාධ්‍ය හමු පැවැත්වුවත් වැඩක් නැහැ. සමහර කණ්ඩායම් මේවා කථා කරන්නේ මාධ්‍යයට විතරයි; ප්‍රවෘත්ති සාකච්ඡාවලදී විතරයි. නමුත් මේ ගැන කථා කරන්නට හොඳම තැන තමයි මේ පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාව. එතැනට ඇවිල්ලායි කථා කරන්නට ඕනෑ. එතැනින් සාධාරණයක් ඉෂ්ට නොවෙනවා නම් එළියට ගිහින් කථා කළාට කමක් නැහැ. එහෙම නැතිව දේශපාලන සන්දර්ශන පැවැත්වීමේ ප්‍රතිඵලයක් නැහැයි කියන එක මම එතුමා සඳහන් කළ කාරණයට එකතු කරන්නට කැමැතියි.

මේ ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් පිළිබඳව සාකච්ඡා වන මොහොතක්. මේ පනත තුළින්, විශේෂයෙන් මේ ඡන්ද ක්‍රමය තුළින් මේ රටේ ජනතාවට විශාල සෙතක් සැලසෙයි කියන විශ්වාසය තබමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොපමණ කාලයක් තිබෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔබතුමාට විනාඩි 25ක කාලයක් ලබා දීලා තිබෙනවා.

[අ.භා. 3.55]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

බොහොම ස්තුතියි මූලාසනයේ සිටින ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන් මෙම පනත් කෙටුම්පත ගැන කථා කරන්නට කලින් ගරු මහින්ද අමරවීර ඇමතිතුමා කථාව අවසන් කළ තැනින් කථාව පටන් ගන්න එක හොඳයි. එතුමා අර්ථ කථනය කරන්නට උත්සාහ කරන්නේ මේ විශේෂ කාරක සභාව ජාතික වශයෙන් අතිශයින් වැදගත් ස්ථානයකයි තිබෙන්නේ, ඒ සඳහා විපක්ෂයේ මන්ත්‍රීවරුන් සහභාගි නොවීම අනාගතයේ ජාතියෙන් සමාව ගැනීම දක්වා වූ ගමනකට ඉඩ කඩ හැදෙයි කියලායි. නමුත් එහෙම නොවෙයි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය පිළිබඳව වර්තමාන ආණ්ඩුව -රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව- සාකච්ඡා වට කීයක් පැවැත්වූවාද? සර්ව පාක්ෂික සාකච්ඡා තිබුණා; සර්ව පාක්ෂික නියෝජිත සාකච්ඡා තිබුණා. මට මතකයි, තිස්ස විතාරණ අමාත්‍යතුමා සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ සභාපතිවරයා හැටියට ප්‍රකාශ කළා ටයිප් කළ පිටු 11,000ක වාර්තාවක් සකස් කළා කියලා. මහින්ද අමරවීර ඇමතිතුමාත් හිටියා, මමත් මුල් කාලයේ ඒකට සහභාගි වුණා. සර්ව පාක්ෂික සාකච්ඡා පැවැත්වූවා; සර්ව පාක්ෂික නියෝජිත සාකච්ඡා පැවැත්වූවා; ඉන් පසුව උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිසම තිබුණා. ඒ කොමිසමටත් අගතියට පත් වුණු විවිධ පාර්ශ්වයන් කරුණු ඉදිරිපත් කළා. ඒ කොමිසමත් වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඉන් අනතුරුව ආණ්ඩුව සහ TNA එක අතර ද්විපාර්ශ්වික සාකච්ඡා පැවතුණා. මම හිතන්නේ සාකච්ඡා වට ගණනාවක් පැවැත්වුණා. TNA එකේ මන්ත්‍රීවරුන් පවසන පරිදි අවසානයේ එය ආණ්ඩුව දින නියමයකින් තොරව ඔහේ අත් හැරලා දාපු සාකච්ඡාවක් බවට පත් වුණා. ඒ අනුව තමුන්නාන්සේලා මේ ප්‍රශ්නය පිළිබඳව ඇති තරමට විවිධ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. තවදුරටත් සාකච්ඡා කරනවා කියන්නේ මේ ප්‍රශ්නයෙන් මඟ හැර යන්න, සැබෑ ප්‍රශ්නයට පිළිතුරු සොයනවා වෙනුවට කල් මරන්න සහ සැබෑ ප්‍රශ්නය යට ගැසීම සඳහා දරන ප්‍රයත්නයක්. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි ප්‍රයත්නයකට හවුල් වෙන්න අපි සූදානම් නැහැ. ඒක පළමුවෙනි කරුණ.

දෙවෙනි කරුණ තමයි, මේ ප්‍රශ්නය ගැන ආණ්ඩුවේ පාර්ශ්වයන් අතර යම් එකඟතාවකට එන එක. දැන් ප්‍රශ්නය තිබෙන්නේ ආණ්ඩුව ඇතුළේ. කැබිනට් මණ්ඩලය ඇතුළේ ගහ මරා ගන්න ගියා කියලා තමයි මාධ්‍ය වාර්තා කරලා තිබුණේ. එය ලංකා ඉතිහාසයේ පැවතුණු උණුසුම්ම කැබිනට් මණ්ඩල සාකච්ඡාව කියලා තිබෙනවා. අරයාගේ කොලර් එකෙන් ඇල්ලුවා කියනවා, මෙයාගේ කනට ගැහුවා කියනවා. මම දන්නේ නැහැ. මාධ්‍යවල තිබෙන දේවල්. [බාධා කිරීමක්] හරි, මම තිබෙන දේ තේ කියන්නේ. එතකොට දැන් ප්‍රශ්නය තිබෙන්නේ කොතැනද? ප්‍රශ්නය තිබෙන්නේ ආණ්ඩුව ඇතුළේ. එහෙම නම් පළමු කොටම ආණ්ඩුව ඇතුළේ එකඟතාවක් ඇති කර ගෙන විශේෂ කාරක

[ගරු අනුර දිසානායක මහතා]

සභාවට එන්න. ආණ්ඩුවේ තිබෙන අර්බුදය පාර්ලිමේන්තුවට ගේන්න එපා. මේ කරන්න හදන්නේ මොකක්ද? කැබිනට් මණ්ඩලය ඇතුළේ එකඟතාවකට එන්න බැරිව, ආණ්ඩුවට පක්ෂ හැටියට එකඟතාවකට එන්න බැරිව ඒක පාර්ලිමේන්තුවට ගෙනැවිත් අතහරිනවා.

ආණ්ඩුව ඇතුළේ තිබෙන අර්බුදය පාර්ලිමේන්තුවට ගෙනෙන එකට සම්මාදම් වෙන්න අපි සූදානම් නැහැ. ඒක තමයි දෙවන කාරණය. [බාධා කිරීමක්] ඒක ඔබතුමාගේ අදහස නේ. මා කීවාට පසුව ඔබතුමා පිළිතුරු දෙන්න.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaulla)

ඒක ආණ්ඩුව පිට දමන්න එපා. එකම පක්ෂයේ - [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

හරි, හරි. ආණ්ඩුව කියන්නේ මෙතැන ඉන්න කට්ටියට නේ. කැබිනට් මණ්ඩලය කියන්නේ ආණ්ඩුව. ඒ නිසා ආණ්ඩුව තුළ එකඟතාවක් තිබෙන්න ඕනෑ. විවිධ වලිග කොට, කන් අල්ලා ගෙන හදපු ආණ්ඩුවක් තිබෙනවා. ඒ ආණ්ඩුව තුළ එකඟතාවක් තිබෙන්න ඕනෑ. ආණ්ඩුව ඇතුළේ එකඟතාවක් ඇති කර ගෙන අපට කියන්න, මේක තමයි කරන්නේ කියලා. ඒක සාකච්ඡා කරන්න අපි ලෑස්තියි. [බාධා කිරීමක්] ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමාගේ වෙලාවේදී උත්තර දෙන්න. බාධා කරන්න එපා.

තුන්වන කාරණය මේකයි. විශේෂ කාරක සභාව පිළිබඳව තමුන්නාන්සේලාට තිබෙන අත් දැකීම මොකක්ද? තමුන්නාන්සේලාගේ භාවිතය මොකක්ද? ශිරානි බණ්ඩාරනායක මැතිතුමිය වෙනුවෙනුත් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළා. ඒ විශේෂ කාරක සභාවේ නියෝජිතයන් හැටියට අපි සහභාගි වුණා. ඒ විශේෂ කාරක සභාවේ සභාපති වශයෙන් හිටියේ ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා. ඒකත් විශේෂ කාරක සභාවක්. ඒ විශේෂ කාරක සභාවේ හැසිරීමෙන් පෙන්නුම් කළේ කුමක්ද? විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අදහස් දක්වන්න ඉඩ නොදී, ඒ අදහස් කිසිසේත් සැලකිල්ලට ලක් නොකොට, දවල් 12.00ට නඩුව අහන්න පටන් අරගෙන, ප. 12.00 වෙනකම් නඩුව අහලා, ප. 2.00ට වාර්තා හදලා, පසුවදා උදේ 10.00ට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. විශේෂ කාරක සභාවක් තුළින් තමුන්නාන්සේලා දී තිබෙන්නේ සාධාරණ අත් දැකීමක් නොවෙයි. විශේෂ කාරක සභාවක අත් දැකීම හැටියට තමුන්නාන්සේලා ඔප්පු කර තිබෙන්නේ අනික් පාර්ශ්වයන්ට ඉඩකඩ දෙන, සාකච්ඡාවට විවෘත කරන සාකච්ඡා මේසයක් නොවෙයි. තමුන්නාන්සේලාගේ විශේෂ කාරක සභාව මොකක්ද? අනිකාගේ මත යටපත් කරන, අනිකාගේ මතවලට ඉඩ නොදෙන, තමුන්නාන්සේලා තීරණය කර තිබෙන මතය හිතුවක්කාර ලෙස, තක්කඩි ලෙස ඉටු කර ගැනීම සඳහා වන වුවමනාවක්. ඒ වුවමනාවට හවුල් වෙන්න අපි ලෑස්ති නැහැ. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව, හැම පක්ෂවලම අදහස් ගැනීම පිළිබඳව, විවෘත මනසකින් රටේ ජාතික ප්‍රශ්නයක් පිළිබඳව හැම කෙනෙකුගේම අදහස්වලට ඇහුම් කන් දීම සඳහා වූ මහා ඉහළ ගුණාංගයකින් යුතු තේරීම් කාරක සභාවක් නොවෙයි මේ. ඉතාමත්ම පහත් තත්ත්වයකට ඇද දමා තිබෙන විශේෂ කාරක සභාවකට සහභාගි වෙන්න අපි සූදානම් නැහැ. එම නිසා සමාව ගන්නට සිදු වන්නේ කාටද කියන එක අනාගතය තීරණය කරාවි.

ඊළඟට, මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දක්වන්නට කැමැතියි. මෙම පනත් කෙටුම්පත සකස් කිරීමේදී අවශ්‍ය සංශෝධන ඇතුළත් කිරීම ගැන ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වනවා. සාමාන්‍යයෙන් එක පනතක් වෙනස් කොට අනික් පනත දක්වා යනකොට කලින් පනත විසින් ඇති කර තිබෙන ආයතනවලට අනික් පනතින් බලපෑම් ඇති වෙනවා. ඒ නිසා ඇත්තෙන්ම ඒ පනතට අන්තර්කාලීන විධිවිධාන ඇතුළත් විය යුතුව තිබුණා. තිබෙන පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ට සිද්ධ වෙන්නේ මොකක්ද කියන එක ඊට ඇතුළත් විය යුතුයි. මා දන්නේ නැහැ, නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඇයි ඒ ගැන උපදෙස් නොදුන්නේ කියලා. මා දන්නේ නැහැ, ඇමතිතුමාට ඇයි ඒ සිතිවිල්ල ආවේ නැත්තේ කියලා. මොකද, කලින් තිබුණු පනතින් ස්ථාපිත කරන ලද පළාත් පාලන ආයතනයක් තිබෙනවා. ඒකේ මන්ත්‍රී ධුර තිබෙනවා. නව පනතක් නීතිය බවට පත් වෙනවා. එතකොට කලින් පනතින් නව පනත දක්වා එන්න අන්තර් කාලයක් අවශ්‍යයි. ඒ නිසා ඒ අන්තර්කාලීන යෝජනාවලියක් ඒ පනතට ඇතුළත් කළ යුතුව තිබුණා. නමුත් තමුන්නාන්සේලාට තිබුණේ වෙනත් වුවමනාවක්. ලොකු කලබලයක් තිබුණා; කඩිමුඩියක් තිබුණා. ඒ කඩිමුඩිය නිසා මේ සංශෝධනය අමතක කළා. පූර්වයේ තිබුණු පනත් ගැන කල්පනා කර බැලුවා නම් ඕනෑම කෙනෙකුට තේරෙනවා අන්තර්කාලීන විධිවිධාන ඒ පනත් කෙටුම්පතට එන්න ඕනෑය කියලා. ඒ අමතක වෙච්ච සංශෝධනය අද හරි ඔබතුමා මේ පාර්ලිමේන්තුවට ගෙනාපු එක ගැන අපි සන්තෝෂ වෙනවා. මේක එදා ඉදිරිපත් කළ යුතුව තිබුණු සංශෝධනයක්. හැබැයි වැදගත් දෙය ඒක නොවෙයි, ගරු ඇමතිතුමනි. මේ පනත් කෙටුම්පත සම්මත කිරීමේදී මේ පාර්ලිමේන්තුව තුළ තමුන්නාන්සේ එකඟ වෙච්ච සංශෝධන ගණනාවක් තිබුණා. ඒක තමයි වැදගත් විය යුත්තේ. සීමා නිර්ණය කොමිෂන් සභාවක් පත් කර ගන්න තිබෙනවාය, සීමා නිර්ණය කිරීමේ කාර්යයක් තිබෙනවාය, ඒ නිසා මේක සම්මත කර ගන්න උදවු වෙන්නය කියා මේ පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටියා. අපි විටින් විට ප්‍රශ්න ඇහුවා. ඔබතුමා දිගින් දිගටම ප්‍රකාශ කළා මේ පනතට ඇතුළත් කළ යුතු තවත් සංශෝධන තිබෙනවාය; ඉතා ඉක්මනින් ඒවා ගෙනෙනවාය කියා. තමුන්නාන්සේ ඒවා ගෙනාවාද? කවදාද ඒවා ඉදිරිපත් කරන්නේ කියා මා තමුන්නාන්සේගෙන් අහනවා.

විශේෂයෙන්ම මෙහිදී සමානුපාතික නියෝජනය වැඩි කළ යුතුයි කියන එක ගැන සාකච්ඡා වුණා. ඒ සාකච්ඡාවට සහභාගි වුණු අපේ පක්ෂයේ විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් ඒ පිළිබඳ ලිඛිත සංශෝධන ඉදිරිපත් කර තිබුණා. ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු ලබා දීමේදී කිව්වේ ඒ සංශෝධන කඩිනමින් ගෙනෙනවාය කියායි. නමුත් මේ වනකොට සැලකිය යුතු කාලයක් ගත වෙලා තිබෙනවා. තවම ඒ සංශෝධන ගෙනල්ලා නැහැ. තමුන්නාන්සේලා මේ පනතට ඉක්මනින් ඇතුළත් කළ යුතු සංශෝධන පසෙකට දමා තිබෙනවා.

තවත් වැදගත් කාරණයක් එතැන මතු වුණා, පළාත් පාලන මන්ත්‍රීවරයකුට අපේක්ෂකත්වය සඳහා රුපියල් 5000ක් ඇප බැඳිය යුතුයි කියා. මේ හදා තිබෙන නව ක්‍රමය අනුව ආසන්න වශයෙන් පළාත් පාලන අපේක්ෂකයන් 5000ක්වත් එන එක වළක්වන්න බැහැ. එතකොට 5000X5000. ඒ කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් දේශපාලන ව්‍යාපාරයකට ඇප තැන්පත් කිරීමට විතරක් රුපියල් මිලියන 25ක් -රුපියල් ලක්ෂ 250ක්- අවශ්‍ය වෙනවා.

ලක්ෂ 250ක් තමන්ගේ අපේක්ෂකත්වය වෙනුවෙන් තැන්පත් කරන්න පුළුවන් වන්නේ කවර දේශපාලන පක්ෂයකටද? කුඩු ව්‍යාපාරවල යෙදෙන, ගණිකා මඩම් පවත්වා ගෙන යන, පාතාලය හරහා කප්පම් ගන්න, රටේ ඉඩම් විකුණා කොමිස් ගන්න, ඒ කොමිස්වලින් තමන්ගේ දේශපාලනය ශක්තිමත් කර ගෙන තිබෙන දේශපාලන ව්‍යාපාරවලට පුළුවන් වේවි, යම් මැතිවරණයක් වෙනුවෙන් ලක්ෂ 250ක් ඇප ලෙස තැන්පත් කරන්න. අපට බැහැ ඒක කරන්න. ඒ නිසා කළ යුතු සංශෝධන ඒවායි.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

ගරු මන්ත්‍රීතුමනි, අපේක්ෂකවරයකුට ඡන්දය ඉල්ලන්න පුළුවන් නම් එයාට රුපියල් 5,000 ගෙවන්න -[බාධා කිරීමක්] නැහැ. ඒ තර්කය වැරදියි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේක්ෂකවරයා තමයි ඡන්දය ඉල්ලන්නේ. හැබැයි පක්ෂයක් ලෙස හිතන්න. පක්ෂයක් ලෙස කල්පනා කර බැලුවොත්, ලක්ෂ 250ක් එක පක්ෂයකට ඇප මුදල් තැන්පත් කරන්න සිද්ධ වෙනවා. ඒක සාධාරණ තත්ත්වයක් නොවෙයි. ඒක කරන්න පුළුවන්කම තිබෙන්නේ -[බාධා කිරීමක්]

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

ගරු මන්ත්‍රීතුමනි, -[බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔබතුමාගේ පිළිතුරු කථාවේදී කියන්න. මට බාධා කරන්න එපා. ඒ නිසා කරන්න ඕනෑ මේ සංශෝධනය ගෙනෙන එකයි.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

අද අදාළ වෙන්නේ-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අද අදාළ දේ තමයි මේ කථා කරන්නේ. තමුන්නාන්සේ කළ යුතු සංශෝධන ගැනයි මේ කියන්නේ. මේවා පිළිබඳව තමයි පාර්ලිමේන්තුවේ කරුණු ඉදිරිපත් කළේ. මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ අපි දිගින් දිගටම බලාගෙන හිටියා; දිගින් දිගටම මේ පාර්ලිමේන්තුවේ අදහස් ඉදිරිපත් කරමින්ද අපි මේ ගැන කියා සිටියා. මේ සංශෝධන ගෙනෙන්නේ කවදාද කියා කරුණාකර කියන්න. සංශෝධන තබා ඔබතුමා පාර්ලිමේන්තුවේදී දකින්නේත් බොහොම කලාතුරකිනුයි. ඉතින් අඩුම තරමින් මේක ගැන අහන්නත් විධියක් නැහැ. ඔබතුමා බොහොම කාලයකින් හෝ අද දකින්න ලැබුණු එකත් සතුටක්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත් මට විටින් විට කියනවා, "පළාත් පාලන හා පළාත් සභා ඇමතිවරයකු ඉන්නවා, කොහෙද කියලා හොයා ගන්න බැහැ, පළාත් පාලන ආයතනවල ප්‍රශ්න තිබෙනවා" කියලා. ඒ නිසා අද ඔබතුමාව දකින්න හෝ ලැබුණු එක ගැන සතුටුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කළ යුතුව තිබුණේ මොකක්ද? මේ පනත්වලට සංශෝධන ගෙන ආ යුතුව තිබුණා. ඒක තමයි එදා මේ පනත් කෙටුම්පත සම්මත කිරීමේදී පාර්ලිමේන්තුව ආපු එකඟතාව. පාර්ලිමේන්තුවෙන් පිටතත් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යවරයාත්, ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යවරයාත්, අපත් අතර සාකච්ඡාවේදීත් එකඟ වුණා ඉක්මනින් මේවා ගෙනෙනවා කියලා. නමුත් සැලකිය යුතු කාලයක් පමා කර තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමාට කියන්නේ, ඉතා ඉක්මනින් ඒ සංශෝධන මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කරුණ තමයි සීමා නිර්ණය හරහා මතු වී තිබෙන ගැටලු. ගරු හකීම් අමාත්‍යතුමාත් විශේෂයෙන් ඒ පැත්ත ඉලක්ක කරලා ද දන්නේ නැහැ, මේ සීමා නිර්ණය පිළිබඳව ඇති වී තිබෙන ගැටලුව ගැන විශේෂ අවධානයක් යොමු කළා.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

අද හොඳයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැහැ, අඩු තරමින් ආණ්ඩුවේ ඉඳගෙන ආණ්ඩුව ගැන එහෙම කිව්ව එක හොඳයි. ගොඩාක් නරක දේවල් කරන අතරේ එක හොඳක් හෝ කළොත් ඒක කියන්න එපායැ. ඒ ගුණවත්භාවය තිබෙන්න ඕනෑනේ. ඉතින් ගරු හකීම් අමාත්‍යවරයාත් පෙන්වා දුන්නේ මොකක්ද? මේ සීමා නිර්ණ කොමිෂන් සභාව හරහා සීමා බෙදීම් අතරේ අද සිද්ධ වෙමින් තිබෙන්නේ මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක රටක්. මේ රටේ අපි සීමා නිර්ණ ගැන සැලකිල්ලට ලක් කරන කොට සැලකිල්ලට භාජනය කළ යුතු කරුණු ගණනාවක් තිබෙනවා. එක පැත්තකින් අපේ රට සිංහල, දෙමළ, මුස්ලිම් කියලා ප්‍රධාන ජාතිකත්වයන් තුනක් ජීවත් වන රටක්. ආවේ කොහෙන්ද, ආවේ කවදා ද, ඒවා අදාළ නැහැ. අද මේ රටේ ඉපදෙන, මේ රටේ ආර්ථිකයට හවුල් වෙන, මේ රටට පොහොර වෙන ප්‍රධාන ජන කොට්ඨාස තුනක් ඉන්නවා සිංහල, දෙමළ, මුස්ලිම් කියලා. එතකොට ඒ අය රටේ විවිධ ස්ථානවල විසිරිලා ජීවත් වෙනවා. ඒකයි අපේ රටේ තිබෙන වැදගත්කම. එක් එක් ප්‍රදේශවලට සීමා වෙලා නොවෙයි, රට පුරා විසිරිලා ජීවත් වෙනවා. එතකොට සීමා නිර්ණ සකස් කිරීමේදී ඒ ඒ ජන ප්‍රජාවන්ගේ නියෝජනයන් ඇති විය හැක්කේ කෙසේද කියන එක ගැන අපි කල්පනා කරන්න ඕනෑ, සැලකිල්ලට ලක් කරන්න ඕනෑ. ඒ වාගේම අපේ සංවර්ධනයේ විවිධත්වයන් තිබෙනවා. අපේ රට ග්‍රාමීය වශයෙන් අතිශය විශාල සංවර්ධන පරතරයක් තිබෙන රටක්. නගරය සහ ගම අතර විශාල පරතරයක් තිබෙනවා. ඒ නිසා ඒ ග්‍රාමීය සංවර්ධනය ඉලක්ක කොට ගෙන වේගවත් ලෙස සංවර්ධනය කරගත යුතු ප්‍රදේශ ගැන ඉලක්කයක් සැලකිය යුතු වෙනවා. ඒ වාගේම එම ප්‍රදේශවල සිටින ජනතාව, ජන සංයුතිය, භූමිය යන මේවා පිළිබඳව සැලකිල්ලක් දැක්විය යුතුයි. මේ පළාත් පාලන ආයතනවල අදාළ භූමිය, කේවල කොට්ඨාසය තීරණය කිරීමේදීඑහෙම විද්‍යාත්මක ක්‍රමවේදයක් අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අද සිද්ධ වෙමින් තිබෙන්නේ මේකේ ඉතා හොඳ තත්ත්වයක් නොවෙයි. ගරු ඇමතිතුමනි, කැමැති නම් අපටත් ඇවිල්ලා අදහස් කියන්නය කියලා ඔබතුමා කිව්වා. අපි අදහස් කියනවානේ. ඒවා අදහස් විතරයි. මේ මොහොතේදී සැබවින්ම මේවා යම් දේශපාලන අධිකාරියක ආධිපත්‍යයට යටත් වෙලා තිබෙනවා. දේශපාලන අධිකාරිත්වය විසින් තමයි අද මේ සීමා නිර්ණ කරන්න හදන්නේ. ප්‍රාදේශීය සභාවේ ඉන්න සභාපතිවරයා කල්පනා කරනවා තමන්ගේ සභාපති පුටුව ආරක්ෂා කර ගන්න තමන් කොහොමද සීමාව හදා ගන්නේ කියලා. ඒ නිසා තමන්ගේ ඥාති ගණය, තමන්ගේ කුල ගණය, තමන්ගේ ජාතිකත්වයේ ගණය, තමන්ගේ වෙන වෙන සම්බන්ධකම් තිබෙන ගණය එක තැනකට කොටු වෙන පරිදි සීමාවක් නිර්ණය කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර ඒකක මුළු පහේ තරු වාගෙයි. එක තැනකට යනවා කුලය හොයා ගෙන. තවත් තැනකට යනවා ජාතිකත්වය හොයා ගෙන. තව තැනකට යනවා ඥාතිකම හොයා ගෙන. තව තැනකට යනවා පරම්පරාව හොයා ගෙන. මෙන්න මේ විධියට මුළු පහේ තරු වාගෙයි මේ කොට්ඨාස හදලා තිබෙන්නේ. ඒක තමයි කරලා තිබෙන්නේ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
නැහැ, නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා නැහැ කිව්වාට වැඩක් නැහැනේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු බලය හොබවන පක්ෂය තමන්ගේ දේශපාලන ව්‍යාපෘතියක කොටසක් බවට මේ සීමා නිර්ණය පත් කර ගෙන තිබෙනවා. ඒක ඔබතුමා තේරුම් ගන්න. ඔබතුමා අක්කරපත්තුව ගැන විතරක් හිතන්න එපා; රට ගැන හිතන්න. ඔබතුමාට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය දීලා තිබෙන්නේ අක්කරපත්තුවේ සීමා නිර්ණය කරන්න නොවෙයි. අක්කරපත්තුව ගැන විතරක් හිතමින් සීමා නිර්ණය කරන්න එපා. රට ගැන හිතලා කරන්න. අපි දන්නවා, අපේ රටේ සම්ප්‍රදායික ලෙස එක්සත් ජාතික පක්ෂයේ වැඩි ජන සනත්වයක් සිටින ගම් තිබෙන බව; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් එහෙම තිබෙනවා; අපේ පක්ෂයේත් එහෙම තිබෙනවා. තමුන්නාන්සේලා කරන දේ තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වැඩි සනත්වයක් තිබෙන භූමිය ඒ විධියටම ආරක්ෂා වෙන පරිදි අනෙක් පක්ෂවලට වැඩි සනත්වයක් තිබෙනවා යැයි කියා මතයක් තිබෙන ගම් තුනට හතරට කඩනවා; කැලිවලට කඩ කඩා අමුණනවා. මේ දිය කර හැරීම කරන්නේ. මේක තමයි කරන්නේ. [බාධා කිරීමක්] ඔබතුමා නැහැ කිව්වාට වැඩක් නැහැ. මේක කරනවා.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
කවදාවත් හොඳ දේවල් කියන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේක කරනවා. හොඳ දේවල් කියන්න ඔබතුමා ඉන්නවා නේ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
හැම දාම ගහන්නේ මඩ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳ දේවල් කියන්න ඔබතුමා ඉන්නවා. හොඳ දේවල් මම කියන්න ඕනෑ නැහැ. මම කියන්න ඕනෑ වැරැදි දේවල්. [බාධා කිරීමක්]හොඳ දේවල් කියන්න ඔබතුමා සිටිනවා නේ. බාධා කරන්න එපා, ගරු ඇමතිතුමා. හොඳ මනුෂ්‍යයෙක්. මට බාධා කරනවා නේ. කල්පනා කර බලන්න. නැවත ජාතිකත්වයන් අතර ගම් ඇතුළත යම් ගැටුම්කාරී තත්ත්වයක් නිර්මාණය වීමේ අනතුරක් තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමා තමයි කිව්වේ මේ දෙක එකතු කරන්න හොඳ නැහැ කියා. [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. ඒවා හොඳයි නේ. ඒ විතරක්ද? මෙතුමා තවත් දේවල් අපිත් එක්ක කියලා තිබෙනවා. ඒවා මේ ගරු සභාවේ කියන එක හොඳ නැති නිසා මම කියන්න යන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමනි, මේ සීමා නිර්ණය ඔබතුමා සැලකිල්ලට ලක් කරන්න. ඔබතුමා නැහැ කියන මතයේම ඉන්න එපා. දැන් භූමියේ සිද්ධ වෙමින් තිබෙන දේ ගම්වල සිද්ධ වෙමින් තිබෙන දේ ඔබතුමා තිබෙනවාද නැද්ද කියා පරීක්ෂා කරන්න. ඒච්චරයි තිබෙන්නේ. කෑ ගහන්න ඕනෑ නැහැ. ඔබතුමා ඇමතිවරයෙක් නේ. සාමාන්‍ය අමාත්‍යවරයෙක් නොවෙයි නේ. පළාත් පාලන ඇමතිවරයා නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පතට තවත් සංශෝධනයක් ගෙනෙන්න යෝජනා කරනවා. ඒ සංශෝධනය ගෙනෙන්න කියලා කියන්නේ ඇත්තෙන්ම පළාත් පාලන මට්ටමින් එන දේශපාලන අධිකාරිත්වයේ හැසිරීම් ගැනයි. සෘජුවම මේ පනතට සම්බන්ධ නොවුණත් මේවා ග්‍රාමීය රාජ්‍යයන් වාගෙයි. මේක ග්‍රාමීය රාජ්‍යයක්. ඒ රාජ්‍යයේ ඔටුන්න සභාපතිවරයා පළඳාගෙන සිටිනවා. ඒ අස්සේ ඒකේ කටු ඔටුන්න දමා ගත් අයත් සිටිනවා. හැබැයි, පළාත් පාලන ආයතනවල යුව රජවරු කියලාත් සිටිනවා. ඒ නිසා මුළු ගමේම සියලු ක්‍රියාකාරකම් මෙම දේශපාලන ආධිපත්‍යයට යටත් කර තිබෙනවා. මේක ඉතා නරක දෙයක්. ගමේ නිදහස්භාවය, ගමේ ස්වාධීනත්වය, ගමේ කෙනෙකුට ස්වේච්ඡා සංවිධානවල ක්‍රියාත්මක වෙන්න තිබෙන අයිතිය, යම් දේශපාලන පක්ෂයකට රැස්වීමකට සම්බන්ධ වෙන්න තිබෙන අයිතිය, මේ ඔක්කොම බලහත්කාරී ව්‍යූහයක් ලෙසට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

ප්‍රාදේශීය සංවර්ධනය සම්බන්ධයෙන් මේවායෙන් කෙරෙන හොඳ කාර්යයන් තිබෙන අතර දේශපාලනික වශයෙන් ගත්තොත් ග්‍රාමීය වශයෙන් තමන්ගේ ආධිපත්‍ය තහවුරු කිරීම සඳහා මේ ආයතනවල නියෝජිතයින් ක්‍රියාත්මක වෙමින් ඉන්නවා. ඒක හොඳ තත්ත්වයක් නොවෙයි. ඒක නිසා පළාත් පාලන ආයතන බිහි කිරීමේදී තිබුණු අරමුණුයි සැබැවින්ම දැන් එහි සිටින සභිකයන්ගේ ක්‍රියාකාරිත්වයයි අතර විශාල පරස්පරතාවයක් මතු වෙලා තිබෙනවා. මා දන්නේ නැහැ, මේකට මොකක්ද කරන්නේ කියා. ඔබතුමා උදාහරණයක් හැටියට පසු ගිය කාලයේ ප්‍රදේශීය දේශපාලනඥයන් සම්බන්ධයෙන් තිබෙන වාර්තාව අරගෙන බලන්න. ඒ වාර්තාව දැන් මා ළඟ තිබෙනවා. කවුද? එල්.එච්. ධර්මසිරි, ප්‍රාදේශීය සභා මන්ත්‍රී. මොකක්ද තිබෙන්නේ? ස්ත්‍රී දූෂණයක් සහ නයනා නිල්මිණි හා ඇයගේ දියණිය ඝාතනය කිරීම සම්බන්ධයෙන් මිනීමැරුම් චෝදනා. 2012 මාර්තු. මැතිවරණ කොට්ඨාසය නිවිතිගල, රත්නපුර. දැන් මෙහෙම සිදුවීම්වලට ඔවුන් සම්බන්ධ වෙලා තිබෙනවා. මේ, පාර්ලිමේන්තුවේ Research Unit එකෙන් මා ලබා ගත් තොරතුරුයි. ඒ වාගේම ඔබ දකින්න ඇති, ස්ටැන්ලි තිලරත්න සම්බන්ධ කාරණය. ස්ටැන්ලි තිලකරත්න කියලා කියන්නේ අරනායක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයායි. තුන් දෙනෙකුට පහර දෙන්නත් ඒ වාගේම power plant එකක් damage කරන්නත් ඔහු සම්බන්ධ වෙලා තිබෙනවා. මේ අරනායක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයායි. ඊළඟට එම්.ඒ. චන්ද්‍රසිරි, උප සභාපති, ඇඹිලිපිටිය. එයා ප්‍රසිද්ධියේ බීමත්ව හැසිරිලා මිනිසුන්ට හිංසා වන විධියට කටයුතු කර තිබෙනවා. ඊළඟට මධ්‍යම පළාතේ සාලිය දිසානායක. එයා නම් ටිකක් උඩ කෙනෙක් නේ. අපේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මල්ලි. එයා පළාත් සභාවේ. ඒක ඕනෑ නැහැ.

ඊළඟට සම්පත් චන්ද්‍ර පුෂ්ප විදානපතිරණ. ඔහු තංගල්ල ප්‍රාදේශීය සභාවේ Chairman. ගරු අතාවුල්ලා ඇමතිතුමනි, සම්පත් ගැන ඔබතුමා දන්නවා ඇතිනේ. දැන් ඔහු ලොකු ආන්දෝලනයකට තුඩු දීලා තිබෙනවා. එංගලන්ත පුරවැසියකු ඝාතනය කිරීම පිළිබඳව ඔහුට විරුද්ධව නඩුවක් පැවරිලා තිබෙනවා.

ඊළඟට ජයන්ත සුරවීර. කරන්දෙනිය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී. අම්මා කෙනෙකු දූෂණය කිරීම පිළිබඳ චෝදනාවක් ඔහුටත් තිබෙනවා. ඊළඟට සුරවීර ලියනගේ සුනිල්. අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපති. එතුමාටත් තිබෙනවා කාන්තාවන් දූෂණය කිරීම පිළිබඳ චෝදනා. ඊට පස්සේ කැලණිය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු ඝාතනය කිරීම පිළිබඳ චෝදනාවක් එතුමාට තිබෙනවා. ඔහු තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ කැලණිය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම රුක්මන් කොළඹගේ. ඔහු වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක්. ඔහුට තිබෙනවා, කාන්තාවකට තර්ජනය කිරීම සහ හිරිහැර කිරීම පිළිබඳ චෝදනා. තමුන්නාන්සේලා ප්‍රාදේශීය සභා හරහා මේ ක්‍රියාත්මක කරන්නේ, "එක ගමකට එක වැඩක්" කියන වැඩසටහන කියලායි මට හිතෙන්නේ. මේ ඒ ව්‍යාපෘතිද කියලා මට සැකයක් තිබෙනවා. එක ගමකට එක වැඩක් කියන්නේ, එක්කෝ එක ගමක මන්ත්‍රීවරයකු විසින් ස්ත්‍රියක් දූෂණය කරනවා; නැත්නම් මිනිහෙක් මරණවා. ඒකද ඒ ව්‍යාපෘතිය? අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා එක ගමකට එක වැඩක් නොවෙයි, එක ගමකට වැඩ 100ක් කරනවා කියලයි මට හිතෙන්නේ. ඒක සාධාරණ නැහැ. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමා කලබල වෙන්න එපා. අක්කරපත්තුවේ ඒ.එල්.එම්. අතාවුල්ලා කියලා නමක් මේ ලැයිස්තුවේ නැහැ. ඒ නිසා කලබල වෙන්න එපා. [බාධා කිරීමක්] ඒක හොඳයි. ඒ නම මේ ලැයිස්තුවේ සඳහන් වෙලා නැහැ. නමුත් ඔබතුමා කලබල වන විදිය දැක්කාම හරියට හොයලා බලන්න ඕනෑ.

ඊට පස්සේ එම්.කේ. අමිල. ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා සභාපති. අපි දැක්කා පොලිස් නිලධාරින් දෙදෙනෙකුට පහර දීලා අත් අඩංගුවට ගන්නවා.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඔබතුමාගේ යෝජනාව කියන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මගේ යෝජනාව මේකයි. [බාධා කිරීමක්] නැහැ, මේවා හරිම වැදගත්. ඔබතුමා කලබල වෙනවානේ. මේ ලැයිස්තුවේ දහවැනියාගේ නම කියන කොට මෙතුමා කල්පනා කරනවා, තමන් ඉන්නේ එකොළොස්වැනියාටද කියලා. කලබල වෙන්න එපා, එකොළොස්වැනියාත් ඔබතුමා නොවෙයි. [බාධා කිරීමක්] ඊට පස්සේ, අරණායක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඔබතුමාගේ යෝජනාව කියන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
යෝජනාව කියන්නම්. පොඩ්ඩක් ඉන්නකෝ. අරණායක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා මිනිස්සු දෙදෙනෙක් ඝාතනය කළා. ඒ වාගේම කරු වීරරත්න. ඔහු රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා. හිංසා කිරීම පිළිබඳව ඔහුටත් චෝදනා ගණනාවක් තිබෙනවා. ඒ නිසා මේ ලැයිස්තුව හැන්සාඩ්ගත කිරීම සඳහා මම **සභාගත*** කරනවා.

මගේ යෝජනාව මේකයි. දැන් මේ සඳහා නීතියක් සම්පාදනය කරන්න බැරිද? තමුන්නාන්සේ යටතේ තිබෙන පළාත් පාලන ආයතනවල අරමුණ මොකක්ද? අරමුණ වෙන්නේ ස්ත්‍රීන් දූෂණය කිරීම හෝ මිනී මැරීම හෝ පොලීසියට ගැසීම හෝ කොටන් කැපීම හෝ නිදන් හැරීම හෝ නොවෙයිනේ. ඔබතුමා මේ පනතින් ඒ බලතල දීලා නැහැනේ. හැබැයි, දැන් සිද්ධ වෙලා තිබෙන්නේ, මේ පනතින් ලබා නොදී තිබෙන බලතල ඒ මන්ත්‍රීවරු ක්‍රියාත්මක කරන එක. අපි කරන යෝජනාවක් තමයි මේ බලතල මේ පනතට ඇතුළු කරන්න කියන එක. එතකොට කියන්න පුළුවන්, "ඒවා නීත්‍යානුකූලයි" කියලා. එතකොට ගරු ඇමතිතුමනි, පළාත් පාලන පනත අනුවම ඉඩ දීලා තිබෙනවා නිදන් කඩන්න; පනත අනුවම ඉඩ දීලා තිබෙනවා ස්ත්‍රීන් දූෂණය කරන්න; පනත අනුවම ඉඩ දීලා තිබෙනවා කොටන් කපන්න; පනත අනුවම ඉඩ දීලා තිබෙනවා කාන්තාවන් ඝාතනය කරන්න; පනත අනුවම ඉඩ දීලා තිබෙනවා කුඩු business කරන්න; පනත අනුවම ඉඩ දීලා තිබෙනවා කප්පම් ගන්න. එහෙම නැත්නම් වලල්ලාවිට ප්‍රාදේශීය සභා සභාපතිවරයා අත් අඩංගුවට පත් වෙන්නේ නැහැනේ. ඒ නිසා ඔබතුමා පනතට සංශෝධනයක් ගෙනෙන්න, මේවා තමයි පළාත් පාලන මන්ත්‍රීවරුන්ගේ කාර්යභාරය කියලා. ඔන්න එක යෝජනාවක්. [බාධා කිරීමක්] ඔබතුමා අහපු යෝජනා ගැන මම කියන්නේ. ඔබතුමා විශේෂ කාරක සභාවක් පත් කරලා හෝ කමක් නැහැ,- [බාධා කිරීමක්] ඔබතුමා අහපු නිසා මම එක යෝජනාවක් කළේ. ඔබතුමා දැන් අහනවානේ යෝජනා මොනවාද කියලා. දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. දැනට තිබෙන පළාත් පාලන පනතේ අරමුණු තිබෙනවානේ. දැන් තමුන්නාන්සේ මේ සංශෝධන ගෙනෙන්නේ මොකටද? පළාත් පාලන ආයතන පිහිටුවන්න, ඒ පිහිටුවන ආයතන අරමුණු අනුව මෙහෙයවන්න. නමුත් දැන් ඒ අරමුණු නොවෙයි, වෙනත් අරමුණු තමයි ක්‍රියාත්මක වෙන්නේ. එක්කෝ දැන් පනතට සංශෝධනයක් ගෙනෙන්න ඕනෑ, අරමුණ තමයි, "එක ගමකට එක වැඩක්" කියලා. හැබැයි සමහර අය වැඩ දෙක තුනක් කරලා තිබෙනවා. හැබැයි, ප්‍රවේශමෙන්. එක්කෝ ඒ සංශෝධන ගෙනෙන්න ඕනෑ. එහෙම නැත්නම් කරන්න ඕනෑ මොකක්ද? පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන් මෙවැනි ක්‍රියාමාර්ගවල නිරත වූ වහාම ඔහුගේ මන්ත්‍රීධුරය අහෝසි වීමට අදාළ වන පරිදි සංශෝධන ගෙනෙන්න ඕනෑ. ඔන්න කරනවා නම් වැඩේ. නමුත් ඔබතුමා ඒක කරන්නේ නැහැ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඒක කරන්න පුළුවන්. හැබැයි, ඒවා පළාත් සභාවෙන් අනුමත කරන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමා කියනවා ඒ සංශෝධනය ගෙනෙනවා කියලා. බොහොම හොඳයි, ස්තුතියි. ගරු අතාවුල්ලා ඇමතිතුමා කියනවා, ඒ පනතට සංශෝධන ගෙනෙනවා, හැබැයි පළාත් සභාවලින් අනුමත වෙන්න ඕනෑලු. දැන් මෙතුමා බයයි. මොකද, පළාත් සභාවල ඉන්නේත් ඒ ජාතියේ අයියලානේ. ඒත්, අනුමත කරයි.

දැන් මෙතුමා බය වන්නේ ඇයි? පළාත් සභාවල ඉන්නේ කවුද? ගුරුවරියන් දණ ගස්වන අය ඉන්නවා. ඒ වාගේ තවත් වැඩ කරන අය මධ්‍යම පළාත් සභාවේත් ඉන්නවා. මධ්‍යම පළාත් සභාවේ සභාපතිවරයාගේ වැඩ කටයුතු බලන්න. ඒ වුණත්, පළාත් සභාවලින් මේ යෝජනා අනුමත වෙයි.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඒ ප්‍රශ්න බලා ගන්න වෙනම ආයතන තිබෙනවා. කප්පම් ගන්නවා නම් ඒවා බලන්න පොලීසිය ඉන්නවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒකත් හොඳයි.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
හරි නේද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හරි, හරි.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
Commission to Investigate Allegations of Bribery or Corruption එක ඉන්නවා. ඒවා බලන්න අය ඉන්නවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් ගරු ඇමතිතුමා කියන්නේ, ඒ කටයුතු ගැන හොයා බලන්න වෙනම ආයතන හදලා තිබෙනවා. ඒ ආයතනයෙන් තමයි ඒ වැඩේ කෙරෙන්නේ කියලා. නමුත් දැන් තිබෙන ප්‍රශ්නය තමයි ගරු ඇමතිතුමනි,- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. දැන් ඔබතුමා කිව්වානේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්නකෝ. එවැනි වැරදි කරන අයට දඬුවම් දෙන්න ආයතන තිබෙන බව ඇමතිතුමා කියනවා. එවැනි ආයතනයක් තමයි පොලීසිය. ඒත් ඇඹිලිපිටියේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ගහන්නේ පොලීසියටනේ! එතකොට කවුද ඒ ගැන හොයා බලන්නේ? දැන් ගහන්නේ වැරදි හොයන්න තිබෙන ඒ ආයතනවල අයටනේ. ඒ ආයතනවල අයනේ නීතිය ක්‍රියාත්මක කරන්න ඉන්නේ. නීතිය ක්‍රියාත්මක කරන්න ඉන්න අයටත් ගහන කොට මොකද කරන්නේ? ඒ නිසා තමයි දැන් වෙන නීතියක් ඕනෑ වෙලා තිබෙන්නේ. ඔබතුමා කියන එක ඇත්ත. ඒ වැරදි ගැන සොයා බලන්න පිහිටුවන ලද ආයතන තිබෙනවා. හැබැයි, දැන් ගහන්නේ ඒ ආයතනවලට. ඒකයි මේ ප්‍රශ්නය මතු වලා තිබෙන්නේ. ඒ නිසා තමයි නව නීතියක් අවශ්‍ය වෙලා තිබෙන්නේ. පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යවරයා හැටියට, මේ පනතේ අරමුණු අනුව ඒ පළාත් පාලන ආයතන මෙහෙය වීම ඔබතුමාගේ කාර්ය භාරය. ඒක තමයි ඔබතුමාට පැවරිලා තිබෙන්නේ. එහෙම නැතුව ඔබතුමාට පැවරිලා තිබෙන්නේ, ඉඳ හිට පාර්ලිමේන්තුවට ඇවිල්ලා පනතක් ඉදිරිපත් කරලා තියලා යන එක නොවෙයිනේ. පනතේ තිබෙන අරමුණුවලට අනුව ඒ පළාත් පාලන ආයතන කටයුතු කරනවාද නැද්ද, කටයුතු කරන්නේ නැත්නම්, ඒ කටයුතු කරවීම සඳහා අදාළ වූ වගකීමක් ඔබතුමාට පැවරී තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා මේ වැදගත් සංශෝධන මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරනු ඇතැයි කියා බලාපොරොත්තු වෙමින්, ගරු ඇමතිතුමා ඒ පිළිබඳව යමක් කරනු ඇතැයි අපේක්ෂා කරමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම, කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව* ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා *මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* ගරු ජානක බණ්ඩාර මහතා *මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. MOHAN PRIYADARSHANA DE SILVA *left the Chair, and* THE HON. JANAKA BANDARA *took the Chair.*

[අ.භා. 4.20]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් ක්ෂේත්‍රයක් වූ පළාත් පාලන ක්ෂේත්‍රයට අදාළ වැදගත් සංශෝධනයක් ගරු විෂය භාර අමාත්‍යතුමා ඉදිරිපත් කර තිබෙන වෙලාවේ ඒ සම්බන්ධව අදහස් ප්‍රකාශ කරන්න ලැබීම පිළිබඳව මා සතුටු වනවා. ඇත්තෙන්ම සමානුපාතික මැතිවරණ ක්‍රමය ක්‍රියාත්මක කර ගෙන යන අවස්ථාවකදී, දීර්ඝ කාලයක් සාකච්ඡාවට බඳුන් වුණු කොට්ඨාස මැතිවරණ ක්‍රමය පිළිබඳව මේ ගරු සභාවේදී ඉදිරිපත් වුණු කරුණුත් එක්ක මා කරුණු කීපයක් කථා කරන්න බලාපොරොත්තු වනවා.

සමානුපාතික මැතිවරණ ක්‍රමය සම්පූර්ණයෙන්ම ඉවත් කරලා කොට්ඨාස ක්‍රමය සහ සමානුපාතික ක්‍රමය කියන ක්‍රමය හඳුන්වා දුන්නාට පස්සේ අද ජනතාව තුළ නැවත විශාල ප්‍රබෝධයක් තිබෙනවා මේ පළාත් පාලනය පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එයට හේතුව තමයි දැන් පවතින මනාප ක්‍රමයත් එක්ක සමහර ප්‍රදේශවලට වග කියන මන්ත්‍රීවරයෙකු නැති එක. ඒ නිසා පළාත් පාලන ආයතනයකින් කර ගන්න ඕනෑ වැඩ ටික සාකච්ඡා කර ගන්න මන්ත්‍රීවරයෙකු නැතිව සමහර ප්‍රදේශවල ජනතාව දැඩි පීඩාවකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ කොට්ඨාස ක්‍රමයේ තිබෙන අපි දකින හොඳම දේ තමයි, සෑම කොට්ඨාසයකටම වග කියන නියෝජිතයෙක් සිටින එක. සභිකයකු නැත්නම් මන්ත්‍රීවරයකු තමන් නියෝජනය කරන බල ප්‍රදේශයට, කොට්ඨාසයට වග කියනවා. ඒ නිසා ප්‍රථම වතාවට මැතිවරණ ක්‍රමය සංශෝධනය කරමින් මේ ක්‍රමය හඳුන්වා දෙන්න කටයුතු කිරීම අපි අගය කරනවා.

දැන් ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමාත්, ඒ වාගේම අපේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාත් යන දෙදෙනාම කොට්ඨාස නිර්ණය කිරීමේදී ඇති වන ගැටලු පිළිබඳව විශේෂයෙන්ම කථා කළා. අපි කවුරුත් දන්නවා කොට්ඨාස නිර්ණය කරන්න දේශපාලන මැදිහත් වීමකට, නැත්නම් ඒ ඒ ආසනවල සංවිධායකවරුන්ට, එහෙම නැත්නම් පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාට, එහෙමත් නැත්නම් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාට අවස්ථාවක් නැහැ කියලා. ඒකට පැහැදිලි ක්‍රමවේදයක් සකස් කරලා තිබෙනවා. දිස්ත්‍රික් සීමා නිර්ණය කිරීමේ කමිටුවක් තිබෙනවා. දිස්ත්‍රික් සීමා නිර්ණය කිරීමේ කමිටුවේ සභාපතිවරයා හැටියට දිස්ත්‍රික් ලේකම්වරයා කටයුතු කරනවා. ඒකට නිල බලයෙන් පත් කරපු තවත් නිලධාරි කණ්ඩායමක් ඉන්නවා. අපේ ප්‍රදේශවලත් ඒ කටයුතු කෙරුණේ ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් තොරතුරු අරගෙන. ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් තොරතුරු ගනිද්දී, කොට්ඨාසයේ ඉන්න ග්‍රාම නිලධාරින් කැඳවලා, කාලයක් ලබා දීලා ජනතාවගේ විවෘත අදහස් ලබාගෙන, කොට්ඨාසවල ඉන්න අපේ රජයේ නිලධාරිනුත් එක්ක අදහස් හුවමාරු කර ගෙන තමයි මේ යෝජනා දිස්ත්‍රික් කමිටුවට ඉදිරිපත් කරන්නේ. එහිදී විශේෂයෙන්ම ඒ ප්‍රදේශවල සිටින ජන වර්ගය, භූගෝලීය පිහිටීම, සමහර ප්‍රදේශවල තිබෙන සමාජ ආර්ථික දියුණුව යන ඒ සියල්ල සැලකිල්ලට ගන්නවා. මොකද, සමහර ඡන්ද කොට්ඨාස තිබෙනවා -අපේ පළාත්වලත් තිබෙනවා.- ඡන්දය ප්‍රකාශ කරන ඡන්ද පොළට යන්න ගම්මාන තුන හතරක් පසු කර ගෙන යන්න වන. එවැනි අවස්ථාවලදී ජනතාව විශාල අපහසුතාවකට පත් වනවා. දැන් මේ ක්‍රමයේදී එසේ වන්නේ නැහැ. දැන් අපේ රටේ සංවර්ධන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන්නේ ග්‍රාම සේවා වසම් පදනම් කර ගෙනයි. ග්‍රාම සේවා වසම දෙකට කැඩිලා තිබුණොත් එතැන ප්‍රශ්නයක්.

ඒ නිසා ඒ ග්‍රාම නිලධාරී වසම් බෙදන්නේ නැතුවා වාගේම ඒ ඡන්ද පොළවල්, ඒ භූ විෂමතාව, භූ ගෝලීය පිහිටීම, ජන වර්ග ඒ සියල්ලම ගැන සලකලායි මේ ක්‍රමය හදන්නේ. සමහර ප්‍රදේශවල මුස්ලිම් ජනතාව ඉන්නවා. ඒ වාගේම සිංහල ජනතාව ඉන්නවා. ඒ වාගේම දෙමළ ජනතාව ඉන්නවා. මේ අය මිශ්‍ර වෙලා ඉන්න ප්‍රදේශ තිබෙනවා. ඒ නිසා තමයි මේ ක්‍රමය තුළ පැහැදිලිවම බහු කොට්ඨාස ක්‍රමය අනුගමනය කරන්නේ. ඒ බහු කොට්ඨාස ක්‍රමය අනුගමනය කිරීමත් එක්ක මුස්ලිම් නියෝජනය වැඩිපුර තිබෙනවා නම් මුස්ලිම් නියෝජිතයෙක් පත් වෙන්න පුළුවන්. සිංහල අය ඉන්නවා නම් සිංහල නියෝජිතයෙක් පත් වෙන්න පුළුවන්. ඒ වාගේම දෙමළ සහ වෙනත් ජන වර්ග ඉන්නවා නම් ඒ අයට පත් වෙන්න පුළුවන්. ඒ විධියට සාධාරණ වැඩ පිළිවෙළක් තමයි ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. විපක්ෂය හැම දාම හුරුවෙලා තිබෙන්නේ මොනවා හරි ක්‍රමයක් තිබෙනවා නම් ඒකට හොඳයි කියලා ඊට පස්සේ මොනවා හරි අඩු පාඩුවක් කියන්නයි. ඒක විපක්ෂය හැම දාම හුරුවෙලා තිබෙන ක්‍රමය.

අපි ඉතාම පැහැදිලිව කියනවා, මේවා දේශපාලන වුවමනාවට වඩා විශේෂයෙන් ඒ ප්‍රදේශවල තිබෙන මම ඒ මුලින් සඳහන් කරපු ලක්ෂණ අනුව ඒ ඒ ප්‍රදේශවලට, ඒ ඒ කොට්ඨාස නිර්ණය කිරීමේ කටයුතු කරලා දිස්ත්‍රික් සීමා නිර්ණය කිරීමෙන් පස්සේ ඒක ජාතික කමිටුවට ඉදිරිපත් කරලා නිල වශයෙන් ගැසට් කරන්නයි අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා බලාපොරොත්තු වෙන්නේ කියලා. තරුණ හා කාන්තා නියෝජනය පිළිබඳව යමක් කියන්න ඕනෑ. ඇත්තෙන්ම හැම දේශපාලන පක්ෂයක්ම බලන්නේ ඒ කොට්ඨාසයේ ජයග්‍රහණයයි. අපි දන්නවා, ගොඩාක් වෙලාවට තරුණයන්ට තිබෙන ආකර්ෂණය වැඩියි කියලා. තරුණයන්ට යමක් කිරීමේ වුවමනාව වැඩියි. තරුණයෝ ඉදිරියට එනවා වැඩියි. කැපවෙනවා වැඩියි. ඒ නිසා ගොඩාක් වෙලාවට ඒ ප්‍රදේශවලින් තරුණයින් එයි. සියයට 25ක් වෙන්න පුළුවන්. සමහර දේශපාලන පක්ෂයක ඒක සියයට 50ක් වෙන්න පුළුවන්. සමහර දේශපාලන පක්ෂයක ඒක සියයට 100 දක්වා වුණත් යන්න පුළුවන්. මේකේ සීමාවක් දාන්න අවශ්‍ය වෙන්නේ නැති තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා.

පාර්ලිමේන්තුව දිහා බලන්න. අද තරුණ මන්ත්‍රීවරු විශාල පිරිසක් ඉන්නවා. විපක්ෂයේත් ඉන්නවා. ආණ්ඩු පක්ෂයේත් විශාල පිරිසක් ඉන්නවා. එතකොට ඒ අය පාර්ලිමේන්තු මහ මැතිවරණයට තරග කරද්දී කොයි වෙලාවකවත් කියා තිබුණේ නැහැ, සියයට මෙපමණ ප්‍රමාණයක් තරුණයන් පාර්ලිමේන්තු මහා මැතිවරණයට ඉදිරිපත් කරන්න ඕනෑ කියලා. නමුත් එහෙම තිබුණේ නැති වුණාට අද පාර්ලිමේන්තුවේ විපක්ෂය පැත්තේ වාඩි වෙලා ඉන්න ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් 40ක් විතර ඉන්නේ තරුණ මන්ත්‍රීවරුන්. එතකොට ඒ අවස්ථාව, ඒ හැකියාව දක්ෂතාවත් එක්ක ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා මේ පළාත් පාලන ඉදිරි මැතිවරණවලදීත් දක්ෂතාව, හැකියාව තිබෙන තරුණයාට ඉදිරියට එන්න පුළුවන්. ඒ වාගේම හොඳ කාන්තා නායකත්වයක් තිබෙනවා නම්, ඒ කාන්තා නායකත්වය තිබෙන කෙනාටත් තරග කරලා ඒ කොට්ඨාසයෙන් ඉදිරියට එන්න පුළුවන් ක්‍රමවේදය මේ තුළ හැදිලා තිබෙනවා. සීමාවන් දාන්න අවශ්‍ය වෙන්නේ නැති විධියටයි මේ පනත ක්‍රියාත්මක වෙන්නේ.

අපේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කියනවා, මේ ආණ්ඩුව ඇතුළේ කචල් තිබෙනවා කියලා. ආණ්ඩුව ඇතුළේ කචල් නැහැ. ඒ පක්ෂවල තමයි කචල් තිබෙන්නේ. ඒ නිසා තමයි එක එක කොටස් කඩා ගෙන ගිහිල්ලා වෙන වෙන පක්ෂ හදාගෙන තිබෙන්නේ. ඒ පක්ෂයෙන් පාර්ලිමේන්තුවේ ඉන්නෙත් මන්ත්‍රීවරු දෙතුන් දෙනයි. ඒ දෙතුන් දෙනාත් කඩාගෙන ගිහිල්ලා වෙන පක්ෂ ගොඩ නඟා ගෙන අද රට තුළ කටයුතු කරනවා. හැබැයි අපි එකක් කියන්න ඕනෑ. අපේ මේ ආණ්ඩුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේම ආණ්ඩුවක් නොවෙයි. සන්ධානයක් හැටියට අපි විවිධ පක්ෂවලින් එකතු වුණු ආණ්ඩුවක්. ඒ නිසා විවිධ මත කියන්න අවස්ථාව තිබෙන්න ඕනෑ. විවිධ අදහස් කියන්න අවස්ථාව තිබෙන්න ඕනෑ. ඒ අවස්ථාව අතිගරු ජනාධිපතිතුමා දීලා තිබෙනවා. සමහර කාලවලදී ආණ්ඩු පාලනය කළේ හිස් කොළවලට අත්සන් කරලා. හිස් කොළවල අත්සන් අරගෙන තමයි මේ රටේ සමහර නායකයෝ ආණ්ඩු පාලනය කළේ. හැබැයි අද එහෙම නැහැ. හැමෝටම ප්‍රජාතන්ත්‍රවාදීව තමන්ගේ අදහස්, මත කියන්න අවස්ථාව දීලා තිබෙනවා.

විශේෂ කාරක සභාවලට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතය කියලා තිබෙනවා. ඒ වාගේම සන්ධානයක් හැටියට තීන්දු ගන්න, විපක්ෂයටත් ඇවිල්ලා අදහස් කියන්න පුළුවන්. අපි මේ ගැන මරණාධාර සමිතියේ කථා කරලා වැඩක් නැහැ. ග්‍රාම සංවර්ධන සමිතියේ කථා කරලා වැඩක් නැහැ. ළිඳ ළඟ කථා කරලා වැඩක් නැහැ. මාධ්‍ය සන්දර්ශන තියලා වැඩක් නැහැ. ඒ නිසා රටේ පවතින උත්තරීතර ආයතනය වුණු මේ පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කරලා තිබෙනවා. ඒ විශේෂ කාරක සභාවට විපක්ෂයට ඇවිල්ලා, ආණ්ඩු පක්ෂයේ ඉන්න සන්ධානයේ

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

අනෙකුත් දේශපාලන පක්ෂවලට ඇවිල්ලා තමන්ගේ අදහස් කියන්න පුළුවන්. ඊට වඩා ප්‍රජාතන්ත්‍රවාදය කියලා කියන්නේ මොකක්ද?

අර කථාවක් තිබෙනවා, "නොකෙරන වෙදකමට කෝඳුරු තෙල් හත් පට්ටයකුත් තවත් පොඩ්ඩක් ඕනෑය" කියලා. "තවත් පොඩ්ඩ" තමයි අර නොකෙරෙන ටික. මේ විශේෂ කාරක සභාව පත් කළේ නැත්නම් කියනවා, "මේ ගැන අපට කියන්න තැනක් නැහැ, අපට අදහස් දිරිපත් කරන්න තැනක් නැහැ, අපට මේ ගැන කථා කරන්න නීත්‍යනුකූල ස්ථානයක් හදලා දෙන්න." කියලා. හැබැයි විශේෂ කාරක සභාවක් පත් කළාට පස්සේ, "නැහැ, නැහැ අපි ඕකට එන්නේ නැහැ කියලා අපි කලින්ම කියලා අයින් වෙනවා." කියලා කියනවා. මේ ප්‍රශ්න විසඳෙනවාට විපක්ෂය කැමැති නැහැ. ඒක තමයි මේකේ යථාර්ථය.

ඊ ළඟට විශේෂයෙන්ම අපි මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපේ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මේ ප්‍රාදේශීය නායකයන් පිළිබඳව, ඔවුන්ගේ වැරදි අඩුපාඩුකම් පිළිබඳව කථා කළා. ප්‍රාදේශීය සභාවල වේවා, පළාත් සභාවල වේවා, පාර්ලිමේන්තුවේ වේවා මහජන නියෝජිතයන් කාගෙන් හරි අඩු පාඩුවක් වෙනවා නම් ඒක වැරැදියි. අපි ඔවුන් සුද්ද කරන්න හදන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කියන ගොඩාක් කරුණු විමර්ශනය කරගෙන යන කොට ඔය මුලින් කියන දේ නොවෙයි තිබෙන්නේ. සැබවුණු වෙනත් අරමුණුත් එක්ක ආපු දේවලුත් ගොඩාක් එහි තිබෙනවා. කවුරු හරි වැරැද්දක් කරනවා නම් ඒක වැරැදියි.

ඒ අය මේ මේ දේවල් කළා, අතන මේ ප්‍රශ්නය ඇති කළා කියන මේ කට්ටිය කවුද? 1988-1989 කාලයේ transformers ගිනි තියලා, ගොවිජන සේවා මධ්‍යස්ථාන ගිනි තියලා, විශාල වශයෙන් පොදු ආයතන ගිනි තියලා, බස් ඩිපෝ ගිනි තියලා ඒ වාගේ විශාල හානි සිද්ධ කරපු අය තමයි අද සුද්දවන්තයෝ හැටියට ඇවිල්ලා කථා කරන්නේ, මේවා කරන එක වැරැදියි කියලා.

මේවාත් වැරැදි තමයි. අපි ඒක පිළිගන්නවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ -1988, 1989 කාලයේ- කොහොමද හිංසා පීඩා කළේ කියලා අපි දන්නවා. ඒක පැත්තකට දමමු. 2001 බලයට පත් වුණාට පස්සේ මොකද කළේ? 2001 බලයට පත් වුණාට පස්සේත් අපේ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් 56 දෙනකු මරලා දැම්මා. කවුද ඒ ගැන හෙව්වේ? මොනවාද හෙව්වේ? මගේ මැතිවරණ කොට්ඨාසයේ එක පුද්ගලයකුගේ කකුල තුන් පොළකින් කඩලා තිබුණා. මම ඔහු අරගෙන ගියා නාරම්මල පොලිසියට. පැමිණිල්ලවත් ලියා ගත්තේ නැහැ. ඒ කාලයේ එවැනි තත්ත්වයකුයි තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. යම් කෙනෙකු වැරැද්දක් කරනවා නම් එය වැරැද්දම තමයි. හැබැයි අද ඒවා එකක්වත් අතිගරු ජනාධිපතිතුමාවත්, එහෙම නැත්නම් මේ ආණ්ඩුවේ බලය පාවිච්චි කරලාවත් හංගලා නැහැ. පොලීසියේ නිලධාරීන් සම්බන්ධයෙන් අද නීතිය ක්‍රියාත්මක කරනවා. මේ රටේ හිටපු අග විනිසුරුවරිය සම්බන්ධයෙන්, එතුමියගේ ස්වාමිපුරුෂයා සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කළා. ඒ වාගේම, කැබිනට් ඇමතිවරුත් සමහර වැරදිවලට අද උසාවිය ඉදිරියට යනවා. ඒ වාගේම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ඇතුළු කිසි කෙනකුගේ වැරැදි සඟවලා නැහැ. සියලුම වැරදිකරුවන් අධිකරණයට යොමු කරලා යුක්තිය පසිඳීම සඳහා අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා කියන එක අප කියන්න ඕනෑ.

[අ.භා. 4.30]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බ්‍රිතාන්‍ය පාලන යුගයේ තමයි පළාත් පාලනය සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් ආරම්භ කළේ. 1833 වර්ෂයේ සිට 1931 වර්ෂය දක්වා ව්‍යුහාත්මක වෙනස්කම් රැසක් පළාත් පාලන ක්‍රමය තුළ සංවර්ධනය වුණා. විශේෂයෙන් එය කළේ ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් කියන එක අපි කවුරුත් දන්නවා. පාරවල් සුද්ද කිරීම, කැළි කසළ අපහරණය, ජල ව්‍යාපෘති වාගේ විශේෂ ව්‍යාපෘති සම්බන්ධයෙන් එදා පැවැති ගම් සභා ක්‍රමය ක්‍රියාත්මක වුණා. අපි දැක්කා, එදා තිබුණු ගම් සභා ඡන්දවලදී ඡන්ද ගණන් කළේත් අදාළ polling booth එකේදී බව. ඒ නිසා කාටවත් මොකවත් කියන්න බැහැ. එහෙම තමයි එදා සිද්ධ වුණේ. එහෙම නොවුණා නම්, පැරදුණාට පස්සේ කියනවා, "හොර ඡන්ද දැම්මා, අරක දැම්මා, මේක දැම්මා." කියලා. නඩු 500ක් විතර වැටෙනවා.

ඒ කාලයේ පැවැති ක්‍රමය අනුව ගමට නායකයෙක් පත් වුණා. දැන් ඒ ක්‍රමය වෙනස් වෙලා තිබෙනවා. ව්‍යවස්ථාව වෙනස් වුණාට පස්සේ වෙනසක් ඇති වෙලා තිබෙනවා. එය නැවත වරක් පෙර පැවැති පැරණි ක්‍රමයට ගෙන යෑම සඳහා, යථාවත් කිරීම සඳහා මේ ආණ්ඩුව කටයුතු කරලා තිබෙනවා. නමුත් ඒ වැඩ පිළිවෙළ තවම ක්‍රියාත්මක නොවන නිසා මේ විශේෂ විධිවිධාන පනත් කෙටුම්පත අද ගෙනැල්ලා තිබෙනවා. පැරණි ක්‍රමයට යෑම සඳහා වූ සංශෝධනය ගෙනෙන තුරු, පළාත් පාලන ආයතනවල පත් කිරීම් යනාදිය මෙම පනත් කෙටුම්පත සම්මත කිරීම තුළින් කරන්න බලාපොරොත්තු වනවා. මා මේ ගැන දීර්ඝව විස්තර කරන්නේ නැහැ. මොකද, බොහොම සුළු කාල සීමාවක් මට තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නයක් තිබෙනවා මේ පළාත් සභාවල. ඔබතුමා දන්නවා නේ, ඊයේ පෙරේදා බුද්ධගයාවේ ඇති වූ සිද්ධිය. බිහාර් ප්‍රාන්තයේ, බුද්ධ ගයාවේ ඇති වූ සිද්ධිය පිළිබඳව BJP පක්ෂය චෝදනා කළා. ඒ පක්ෂය චෝදනා කළා විතරක් නොවෙයි. ඒ අය කිව්වා, ප්‍රමාණවත් ආරක්ෂාවක් දුන්නේ නැහැ කියලා. අපේ රටේ යුද්ධය කරපු කාලයේ පළාත් සභාවලට ඕනෑවට වඩා බලතල; පොලිස් බලතල, ඉඩම් බලතල දීලා තිබුණා නම් කවදාවත් ඒ යුද්ධය ජයග්‍රහණය කරන්න ලැබෙන්නේ නැහැ. ඉන්දියාවේ අගමැතිතුමා වන මන්මෝහන් සිං මහත්මයා කිව්වේ, අපේ ප්‍රධාන අපේක්ෂාව සාමය සහ ආරක්ෂාව කියලායි. ඉතින් අද සාමය සහ ආරක්ෂාව පවත්වාගෙන යන්න නම් පළාත් සභාවලට පොලිස් බලතල සහ ඉඩම් බලතල දිය යුතුයි කියලා මම නම් විශ්වාස කරන්නේ නැහැ. පුද්ගලිකව නම් මා ඒ නිගමනයේ ඉන්නේ නැහැ. ඒක තමයි මගේ මතය. ඒ මතය සනාථ කරන්න ඕනෑ තරම් කරුණු තිබෙනවා. ගරු ඇමතිතුමනි, පළාත් සභා ක්‍රමය විගණනය වෙනවාද කියලා මම දන්නේ නැහැ. COPE එකට කැඳවනවාද? ඒක කරන්නේ පළාත් පාලන ආයතනවලින්. වියදම රුපියල් බිලියන 150යි. ඒ රුපියල් බිලියන 150න් 100ක්ම දෙන්නේ මධ්‍යම ආණ්ඩුවයි. ඒ අය පිට රට යනවා; සල්ලි නාස්ති කරනවා; විශාල වශයෙන් වියදම් කරනවා. නමුත් ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයට බලතල තිබෙනවාද ඒවා විගණනය කරන්න? ඒවා විගණනය කරනවාද? ඒවා පරීක්ෂා කරනවාද? මේවා තමයි ප්‍රශ්න. එම නිසා අප මේවා සියල්ල ගැන අලුතින් සිතා බලන්න ඕනෑ කාලය දැන් ඇවිල්ලා තිබෙනවා. පසු ගිය කාලයේ වූ සිද්ධීන් අනුසාරයෙන් අපට කියන්න පුළුවන්, විශාල ප්‍රමාණයේ මුදල් නාස්තියක් පළාත් සභා හරහා සිදු වනවා කියලා.

උදාහරණයක් වශයෙන් පාසල්වලට ළමයින් ඇතුළත් කර ගැනීම ගනිමු. රණ විරුවන්ට අවස්ථාවක් දීලා තිබුණා, එක

පන්තියකට ඒ අයගේ ළමයින් 7දෙනකු ඇතුළත් කරන්න. නමුත් සමහර විට රණ විරුවන්ගේ ළමයින් එතරම් ප්‍රමාණයක් නැහැ. ඉතින් කාටද මේ quota එක හිමි වන්නේ? Quota එක හිමි වන්නේත් පළාත් සභා මන්ත්‍රීවරුන්ටයි.අවසානයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට පාසලකට ළමයකු ඇතුළත් කර ගන්න ලැබෙන්නේ නැහැ. නමුත් පාසල්වලට ළමයින් ඇතුළත් කරනවා. ඇතුළත් කළේ කවුරුන් විසින්ද කියලා දන්නේත් නැහැ. "අපි වෙනත් මාර්ගයකින් පාසලට ඇතුළත් වුණා"යි කියලා පාසලේ ළමයි කියනවා. මොකක්ද, මේ මාර්ගය? අයථා ක්‍රමවේද තුළින් ඇතුළත් කළාය කියන එක අද මා මෙම ගරු සභාවේදී ප්‍රසිද්ධියේ කියන්න ඕනෑ. අපි මේවා කළමනාකරණය කරන්න ඕනෑ.

ඊළඟට නීති රීති ගැන බලමු. විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවල මාරු කිරීම් රාශියක් සිද්ධ වනවා. කවුරුන් හෝ සභාපතිවරයෙක් පත් වුණාම විෂයට අදාළ කෙනාව එහාට මාරු කරනවා, මෙහාට මාරු කරනවා. ක්‍රමවත් පරිපාලනයක් පළාත් පාලන ආයතන තුළ සිද්ධ වන්නේ නැහැ. එවැනි ප්‍රශ්නවලට අපිත් මුහුණ දීලා තිබෙනවා. පළාත් පාලන ආයතනවල මෙම ක්‍රියාදාමය පිළිබඳව ප්‍රධාන අමාත්‍යතුමාට හෝ ඉන්න කවුරුන් හෝ වෙනත් කෙනෙකුට බලපෑමක් කරලා එම නීති රීති පොඩ්ඩක් යටපත් කරන්න පුළුවන්. එවැනි සිද්ධීන් රැසක් වෙලා තිබෙනවා. එම නිසා මගේ කථාවේදී මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේවා ගැන ගැඹුරින් සිතා බලා නිවැරැදි කරන්න කියලා.

ඊළඟට මුද්දර ගාස්තු, උසාවි ගාස්තු සහ දඩ මුදල් ගැන බලමු. උදාහරණයක් වශයෙන් අපේ ආසනය ගත්තොත්, 1995 ඉඳලා රුපියල් ලක්ෂ 1,600ක් පමණ ලැබෙන්න තිබෙනවා. අද වන කල් ලැබිලා නැහැ. ඒ මොකද? නීති ප්‍රශ්න, අර ප්‍රශ්න, මේ ප්‍රශ්න කියලා කල් දමනවා. ඉතින් කොහොමද පාරවල් සංවර්ධනය කරන්නේ? උසාවියේ දඩයක් ගැහුවාම, ඔප්පුවක් ලිව්වාම කෙළින්ම පළාත් සභාවට ගිහින් පළාත් සභාව හරහා තමයි ඒ මුදල් ටික මෙහාට එන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ ගැන බලන්න. එම මුදල් පළාත් සභා හරහා ඒමේදී පළාත් පාලන ආයතනයට බලපෑම් කරන්න බැහැ, අපට මේ මුදල් ටික ඉක්මනට ඕනෑය කියලා. අර උසාවියේ, මේ උසාවියේ රස්තියාදු වෙලා, දීර්ඝ කාලයක් ගිහින් ටික ටික තමයි ඒ මුදල් ගන්නේ. එතකොට ගම්වල පුංචි පුංචි පාරවල් හදන්න ප්‍රමාද වනවා. ගම්පහ දිස්ත්‍රික්කයට නම් ප්‍රශ්නයක් නැහැ, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා ඉන්න නිසා. එතුමා ඒ අඩු පාඩු සොයා බලා කරනවා. නමුත් සමස්තයක් වශයෙන් මේ රටේ ඒක සිද්ධ වන්නේ කොහොමද? උසාවි දඩ මුදල්, මුද්දර ගාස්තු, අනිකුත් දේවල් පළාත් සභාවට ගිහිල්ලායි මෙහාට එන්නේ. මේ ක්‍රමවේදය අපි වෙනස් කරන්න ඕනෑ.

බලන්න, පළාත් සභාවක් අල්ලා ගෙන අද මේ අය කෑ ගහනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

මා අවසන් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මා කියන්නේ අපි මේ ගැන කල්පනා කරන්න ඕනෑය කියලායි. ඊළඟ සංශෝධන ගෙන ඒමේදී විශේෂයෙන්ම මේ ගැන ක්‍රියා කරන්න ඕනෑ. පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීම වැනි කටයුතු කිරීමේදී පළාත් සභාව විසින් ගෙන යන ක්‍රියාදාමය ගැන මීට වඩා සැලකිලිමත්ව බලන්න ඕනෑ. එහි මූල්‍ය විනයක් තිබෙනවාද කියා බලන්න. කොපමණ සල්ලි නාස්ති කරනවාද කියා බලන්න. මේවාට උත්තර කෝ? අද උත්තර නැහැ. මෙයින් ජීවන වියදම වැඩි වනවා.

සමහර විට හිතෙනවා, පළාත් සභා ඇත්තටම සුදු අලියෙක් කියලා. මමත් ඒ ගැන කනගාටු වනවා. 1988 දී මමත් පළාත් සභා මන්ත්‍රීවරයකු වශයෙන් පත් වුණා. එදා මෙයට විසඳුමක් දෙන්න ඉන්දියාවෙන් ආවා. ඒ විසඳුම අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිළිගත්තේත් නැහැ; ජේවීපී එක පිළිගත්තේත් නැහැ; එල්ටීටීඊ එක පිළිගත්තේත් නැහැ. අවසානයේදී වියට්නාමයට සිද්ධ වුණු දේ රාජීව් ගාන්ධිට සිද්ධ වුණා. මැදිහත් වුණු කෙනා දෙපැත්තෙන්ම තැළෙන්න, මිරිකෙන්න පටන් ගත්තා. අවසානයේදී දමලා යන්න ගියා. එම නිසා ඒ ගැන නැවත වරක් කල්පනා කරන්න කියා මා කියනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

හොඳයි, ගරු අමාත්‍යතුමනි. දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

අපේ ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වනවා. එල්ටීටීඊ කාලයේ මේ ගරු සභාවේ ඉඳ ගෙන කිව්වා, උතුරු හා නැඟෙනහිර පළාත් සභා දෙක එකතු කරනවාට එතුමා අකැමැතියි කියලා. නැඟෙනහිර පළාතේ ඉඳ ගෙනත් ඒ කථාන්දරය කිව්වා. එවිට මා කිව්වා, "ඔබතුමා මෙහෙම කිව්ව නිසා හෙට ඔබතුමාට ගහලා ඔබතුමාගේ body එක ගෙනෙන්න වෙයිද දන්නේත් නැහැ"යි කියලා. එදා මා එහෙම කිව්වා. මා කියන්න කැමැතියි, පළාත් සභා ගැන මීට වඩා අවදියෙන් ඉන්න කියලා.

විශේෂයෙන් ඊයේ පෙරේදා පත්‍රවල පළ වෙලා තිබුණා, මේ ගොල්ලෝ ස්විට්සර්ලන්තයට, ජර්මනියට, ඇමෙරිකාවට, කැනඩාවට, ප්‍රංශයට model බලන්න යනවාය කියලා. ඒවා කරලා ජාතික ධනය නාස්ති කරන්න එපා. මෙතැන මොනවා හෝ කළොත් අපව COPE එකට ගෙනෙනවා. ඒ ගැන සම්පූර්ණයෙන් සොයා බලනවා. නමුත් මේවා සොයා බලන්න කවුරුත් නැහැ. බොහොම ස්තුතියි.

[4.39 p.m.]

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Thank you, Sir, for giving me an opportunity to speak today on an issue regarding the filling of vacancies in Local Authorities. The Hon. Felix Perera who spoke before me was commending the Hon. Minister of Local Government and Provincial Councils for having always stood against the merger of provinces and his opposition to the merging of the North and the East. But, the Hon. Athaullah will remember that his mentor who brought him to this Parliament asking Asitha Perera to resign at that time wanted the Hon. Athaulla personally to be in this Parliament to carry on his political work as a strength to the SLMC. But, the late Hon. M.H.M. Ashraff agreed to the merger of the North and the East and he signed an MoU with the late Hon. S. Thondaman with whom I worked for a long period.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

That is conditional.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Yes, conditional. I have the whole document, Hon. Minister. I can send the document to you. [*Interruption.*] We are not just going to merge. If the Muslim Members of the Eastern Provincial Council are going to agree, then it can come only after they are satisfied that they have a fair deal. The Hon. Ashraff said that there should be a Territorial Council. The Chairman of the Territorial Council should be the Deputy Chief Minister and the Chairman of the Territorial Council can name two more Ministers to the Cabinet of that merged Provincial Council. So many matters such as police powers and how they are to work together have been discussed in that document. I have the full document. I will forward it to you. Just look at it; consider it. [*Interruption.*] You are entitled to your opinion, Hon. Minister. But, at the same time, your mentor thought it fit that the North and the East should be merged. Look at it; consider it.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

No, you opposed it.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

You have nothing to do with this; please sit down.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

What have you got to do with the North?

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

I have everything to do with the North. [*Interruption.*]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Azwer, please do not disturb the Hon. Member.

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Hon. Minister, it is left to you to consider it. That is all. I will send you the full document. It is available with me.

Meanwhile, I want to refer to the Hon. Mahinda Amaraweera who spoke before, who was saying that we must join the Parliamentary Select Committee that has been appointed now with 18 Members, all from the Government. The Terms of Reference of this Select Committee and the Terms of Reference of the All-Party Representative Committee - APRC - on which one of your Members served are the same. You were represented on that Committee by Dr. Uthumalebbe. He was a signatory to the document that was finally produced and there was a consensus among 13 political parties: 11 parties from the Government and two parties from the Opposition. This document was presented by the Hon. (Prof.) Tissa Vitarana to His Excellency the President and this was never published. It was hidden by His Excellency the President. However, Mr. Nizam Kariapper, the Deputy Mayor for Kalmunai and I, published this document with the blessings of the Hon. (Prof.) Tissa Vitarana and it is in the public domain. If the Terms of Reference of that Committee as well as the present Parliamentary Select Committee is the same, why not take this document? Do not accept it as it is. If the Government appointed a Committee of their partner political parties and they came up with a proposal, why do you not make it the basic document to start the discussions at the Parliamentary Select Committee?

Then, maybe, the UNP and the TNA can consider joining and working with you. You want to give a blank slate. As the Hon. Anura Kumara Dissanayake said, you yourself have not decided what the future is and you are just passing the buck to a Parliamentary Select Committee. I can remember very well during the war whenever a foreign dignitary visited this country, one person who always met that foreign dignitary was the Hon.(Prof.) Tissa Vitarana. An appointment was arranged for him to meet the dignitary; that is to show the world that while the war is going on, this Government is attempting to bring in a political solution. So, this was a bluff. That is the reason we do not believe that this Government is sincere in appointing this Parliamentary Select Committee and we doubt your motives and refused to participate in the Parliamentary Select Committee.

Hon. Minister, today we are debating this Bill because you rushed through the Local Authorities Elections (Amendment) Act. You did not think of the consequences of the current Members, you did not think of the transitional provisions, so now you are bringing up this Bill. Similarly, there are so many other things in the Bill that we criticized. We told you at that time that the Local Authorities Elections (Amendment) Act should have sufficient powers to create delimitation on the basis that the ethnic ratio within any local authority will be maintained in the representation that would result after the election.

Unfortunately, today we see the delimitation committees functioning. We understand that the delimitation committees have been given documents prepared by the Sri Lanka Freedom Party Organizers. This was discussed and concluded at the Presidential Secretariat under the supervision of the Hon. Basil Rajapaksa. We are told that these are SLFP proposals which have become the basis for the delimitation to take place because since then, none of the district secretaries have consulted any political party or any political authority in the districts.

You know, we have another delimitation committee that is functioning today, which has not yet submitted the report. That is about the Delimitation of Divisional Secretaries' Divisions. In that committee also at the district level, the Chairman is the District Secretary. But, on every occasion, the District Secretary has summoned political parties, political representatives within the district and discuss how the delimitation of Divisional Secretaries Divisions should be done. So, when one Ministry, the Ministry of Public Administration and Home Affairs which is involved in the delimitation of Divisional Secretaries' Divisions is following such a procedure, why is it your Delimitation Commission which has a bigger role to play, does not follow that procedure? How you delimit the wards is going to be very decisive and how representation in these local authorities would come is more important than dividing Divisional Secretaries' Divisions which are larger bodies, which are only an administrative unit for the Government to function. But here, it is people's representation. People's representation is supreme compared to Divisional Secretaries' Divisions where an officer of the Government is appointed to do the administrative work, carry out the policies of the Central Government and the Provincial Councils.

But here, it is representation of people. You see, when this Bill was brought in initially, political parties of minority people all objected because they thought the representation that they have achieved through the Proportional Representation System will be diluted and their representation will be wiped out in the Local Authorities.

You would not believe, there are Tamil representatives in the Kalutara District - in the Horana and Walallawita Pradeshiya Sabhas - under the PR system. But, in the future, are they going to have that representation? If you take the Kandy Municipal Council, where 25 per cent of the population is Tamil, it has 20 Tamil members. According to the latest delimitation that has been done, there is only one ward - the Mahaiyawa Ward - from where a Tamil could be elected to that Municipal Council. Is it fair? This is what we told you at the time you brought that Bill, that it would be eliminating the representation of the minorities and to be careful. Hon. Minister, though you are a minority Member of Parliament, though you represent a Muslim Party, you have, knowingly or unknowingly, collaborated to eliminate the representation of minorities, which is very detrimental to national unity and democracy in this country.

So, I would make a suggestion. I appeared on behalf of the up-country political parties jointly before the District Delimitation Committee. I met the Chairman and the Board; four members were present. We asked them whether once they finalize the District Committee recommendations and before they make a decision and gazette those, those could be reviewed by public consultation. If that could be done, maybe some of the defects that have taken place in the process of delimitation so far could be corrected. [*Interruption.*] You could. The Committee has the authority to decide on its procedure. Therefore, under those circumstances, they are entitled to call for consultations once the preliminary draft proposals are made so that everyone, not only the Government's main political party, the SLFP, but also Hon. Minister, your political party, the National Congress, the CWC, the UNP or maybe, I, who is within the UNP representing the people of Indian origin, will have an opportunity to sit with your officials and see whether a fair delimitation has been done.

During this delimitation process, you have taken the Grama Niladhari division as the base. If you are going to do that, then all the Grama Niladhari divisions themselves all over the country should have been delimited in a fair manner. If there is a 1,000 persons population, there is a Grama Niladhari division. But, in the plantation areas, a population of every 4,000 or 5,000 people have one Grama Niladhari division. So, when you take the Grama Niladhari division as the base, could it be fair? There are two Pradheshiya Sabhas - the Ambagamuwa Pradeshiya Sabha and the Nuwara-Eliya Pradeshiya Sabha - each of which has a population of over 210,000 persons. When you allocate funds for a pradeshiya sabha, you do not look at the population. You say, "Ok each pradeshiya sabha gets one, two or three million rupees". So, a pradeshiya sabha with a 210,000 population may get a certain amount and a Pradeshiya Sabha like Walallawita, which has only a 25,000 population, also gets the same amount. Up to date, no attempts have been made to delimit those two Pradeshiya Sabhas. We should have eight pradeshiya sabhas within these two divisions, which has not happened. It did not happen in the past; it has not happened even during your period. We have brought up this issue with you so many times in this House and outside. Even your predecessors, as local government ministers, never attempted to attend to that.

So, this is very unfortunate. Is this country going to discriminate against one group of people just because they lived in the plantations? Actually, they should be given a special status.

These are people who worked in this country for 180 years, for six generations and they contributed to the economy of this country. Until, maybe, 20 to 30 years ago, 70 per cent of the foreign exchange to this country was earned by these people and all the facilities to everyone in this country were given by the Government from those earnings. But, even today these people are being discriminated. Please, Hon. Minister, at least during your period, take this as a special issue and try to do something to give them a fair share in local governments.

[ගරු ආර්. යෝගරාජන් මහතා]

Hon. Minister, there is one more issue that I wish to point out to you. I have already spoken to you at your Consultative Committee and also personally regarding the spending of pradeshiya sabha funds on estates. - [*Interruption*.] Yes, to spend funds. I have already given you a draft of an amendment to the Pradeshiya Sabhas Act so that the pradeshiya sabhas can serve the people who are living within the estates. They are constituents of these pradeshiya sabhas; they are voters of the pradeshiya sabhas. But, today, the pradeshiya sabhas cannot legally spend their funds on estates. Just because the Udapalatha Pradeshiya Sabha spent some funds on New Peacock Estate to construct some roads and water supply schemes, the whole Pradeshiya Sabha was dismissed, which is very unfortunate. To correct this situation, you have to act, Hon. Minister. Please do this as you have agreed.

Thank you very much.

[4.56 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

*Bismillahir Rahmanir Raheem.*

Mr. Presiding Member, this is a simple Amendment before the House and there is consensus or approval from both sides of the House to it. But, when the Debate dragged on, it has taken several routes, which will not be considered as relevant to the Amendment before the House.

Sir, I have a document here with me in Tamil, which I will read out:

"2013.01.01ஆம் திகதிக்கு முன்னர் சட்டப்படி இடம்பெற்றுவந்த தேர்தல்கள் உள்ளூராட்சி சபைகளின் தேர்தல் கட்டளைச் சட்டத்தின் விதிமுறைகளுக்கு அமைய தெரிவுசெய்யப்பட்டுள்ள உள்ளூராட்சிச் சபைகளின் உறுப்பினர்கள்/தவிசாளர்கள்/உப தவிசாளர்கள்/பிரதி நகர சபை முதல்வர்கள் ஆகியோரின் பதவி வெற்றிடங்களை நிரப்புவதற்கும் அதற்கேற்ற நடவடிக்கைகளை மேற்கொள்வதற்குமாக இந்நகல் சட்ட மூலமானது புதிய வழிவகைகளை அறிமுகம் செய்துள்ளது"

அதனை எல்லோரும் ஏற்றுக்கொள்கின்றோம்.

My good Friend, the Hon. R. Yogarajan, brought up a canard in this House to say that the mentor of the Hon. A.L.M. Athaullah, the late Hon. M.H.M. Ashraff, was for the merger of the Northern and the Eastern Provinces, but I know for one thing that he opposed the merger. That is why he faced death threats. - [*Interruption*.] I will tell you what he told us. - [*Interruption*.] You listen to me. Where were you? Hon. Yogarajan, you do not belong to the North or the East. - [*Interruption*.] You keep your mouth shut. So, that is a canard, I would say. - [*Interruption*.]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. R. Yogarajan, please do not disturb the Hon. Member.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, he cannot disturb me. He must go back to his estate, train himself and come.

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

What is your point of Order?

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

When he mentions my name and says something, I have the right to reply him.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

So, Sir, there was a death threat to the late Hon. M.H.M. Ashraff's life. He was in Maruthamunai at that time. He, of course, had a pact with the late Hon. A. Amirthalingam. The Hon. A. Amirthalingam had the TULF; the Hon. M.H.M. Ashraff formed the MUF, the Muslim United Front and they had a very good understanding, but when the issue of the merger came up, the Hon. Ashraff said, “I cannot”. So, there was a threat to his life. He left his gracious mother, the late good lady, Madheena Umma, behind in Maruthamunai - we know the whole story - and came to Colombo picking up his trunk. That is the story. You wanted the Muslims to help you to merge the provinces. Nonsense! Without giving police powers to the Northern Province, what happened to the Muslims? When the Centre had power without giving them police powers, they took up arms and drew away the Muslims, the young and old people carrying children in their arms. Muslims numbering 100,000 got driven away overnight. Will you guarantee their safety? That is why we say that police powers should not be given to any province, for that matter. Sir, for example, if somebody commits an offence in your province, he can escape to another province and he would not be apprehended by the so-called "police".

"அமைச்சர் அவர்கள் நல்ல முகத்தோற்றத்தையுடைய நல்ல மனிதர்" என மாண்புமிகு ஜோன் அமரதுங்க அவர்கள் சொன்னார். நானும் அவரைப் பற்றி ஓரிரு வார்த்தைகள் சொல்ல விரும்புகிறேன். அவர் நல்ல முகத்தோற்றத் தையுடையவர் மட்டுமன்றி நல்ல வசீகரமானவர். He is called

the "singing Minister". அவர் மிக அழகாகப் பாடக்கூடியவர். அவரும் அக்கரைப்பற்றைச் சேர்ந்த இன்னொருவரும் சேர்ந்து அண்மையில் தொலைக்காட்சி நிகழ்ச்சியொன்றில் திரு.ரி.எம்.சௌந்தரராஜன் அவர்கள் பாடிய பாடல்களை அழகாகப் பாடியதை நாங்கள் பார்த்தோம்.

I think the whole country must salute the Hon. A.L.M. Athaullah. From the beginning, despite all the threats against him by the LTTE at that time, he was for demerger of the two provinces. What more? Do you know what the late President J.R. Jayewardene said - this is not something new - after the sanction of the Thirteenth Amendment was approved? He said that his Ministers went and worked against him. That was the leader of the UNP, the party you are now in, Hon. Yogarajan. You have only sacrificed your principles as far as the Hon. S.A.R. Thondaman is concerned. Therefore, you have no right to talk about the North and the East.

வட மாகாண முதலமைச்சர் பதவிக்கு யாரை நிறுத்துவது என்ற பெரியதொரு இக்கட்டான பிரச்சினை TNA க்கு ஏற்பட்டுள்ளது. அப்பதவிக்கு எத்தனை பேர் போட்டியிடு கிறார்கள் என்று இங்கே பாருங்கள்! அரசாங்கத்தைப் பொறுத்தவரையில் அரசாங்கத்துக்கு எந்தவொரு பிரச்சினை யும் கிடையாது. சரியாக - நேராக - எல்லை நிர்ணயம் செய்து அவர்கள் போராடுவதற்கு வந்திருக்கிறார்கள்.

"உயர் நீதிமன்ற நீதியரசர் விக்னேஸ்வரன் அவர்களுடைய அறிவிப்பானது தமிழ் இன அரசியல் வரலாற்றில் ஒரு திருப்புமுனை."

- இந்து மாமன்றத்தின் தலைவர் கந்தையா நீலகண்டன் தெரிவிப்பதாக இன்றைய 'வீரகேசரி' பத்திரிகையின் 21ஆம் பக்கத்திலே குறிப்பிடப்பட்டுள்ளது.

இதேவேளையில் இன்றைய தின "சுடர் ஒளி" பத்திரிகை யின் முதல் பக்கத்திலே அருமையான மிகவும் சுவையான இரண்டு செய்திகள் வெளிவந்துள்ளன.

"முதலமைச்சர் வேட்பாளராக களத்தில் குதிக்க நான் தயார்"

என TNA கட்சியின் செயலாளர் மாண்புமிகு மாவை சேனாதிராஜா அவர்கள் தெரிவித்திருப்பதாகச் செய்தி வெளிவந்துள்ளது. இதற்கிடையில், மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன் அவர்களும், தான் போட்டியிடப்போவதாகக் கூறுகிறார். இருவரும் TNA கட்சியைச் சேர்ந்தவர்கள். இந்தத் தமிழ்த் தேசியக் கூட்டமைப்பினருக்கு என்ன நடந்திருக் கிறதென்பதைப் பாருங்கள்! இப்பொழுது வடக்கிலே அவர்கள் இரண்டுங்கெட்டான் நிலையைத்தான் எதிர் கொள்ளப் போகின்றார்கள். அதேவேளையில் திரு. வீ. ஆனந்தசங்கரி அவர்கள், தான் எல்லோருக்கும் சாதாரணமாக நடந்தவர் என்றும் அப்படியிருக்க ஏன் தன்னை எல்லோரும் கோபித்துக்கொள்கின்றார்கள் எனவும் தெரிவிப்பதாக இன்றையதின 'தினக்குரல்' பத்திரிகையிலே குறிப்பிடப் பட்டிருக்கிறது. அவர் தமிழர் விடுதலைக் கூட்டணியைச் சார்ந்தவர். அவர் வீட்டுச் சின்னத்தில்தான் போட்டியிட்டார். இப்பொழுது குத்துவெட்டு யாவும் தமிழ் இனத்துக்குள் புகுந்துவிட்டது என்றே நாங்கள் குறிப்பிடவேண்டும். அவர்களின் ஆரம்பப் பாதையும் இப்பொழுது பயணிக்கின்ற பாதையும் முறைகேடானதாகவே இருக்கின்றது. இப்பொழுது கொழும்பிலிருந்து உயர் நீதிமன்ற நீதியரசரை வட மாகாண சபைக்கு முதலமைச்சர் வேட்பாளராகக் கொண்டுவரப் பார்க்கிறார்கள். நீங்கள் வேட்பாளராக யாரையாவது கொண்டுவாருங்கள். எங்களுக்கு அது பற்றிப் பிரச்சினை யில்லை.

What is the stand of the United National Party? The Chief Opposition Whip, the Hon. John Amaratunga and the Hon. Joseph Michael Perera - Joseph, John, both names start with "J"- said today that they would not come to the Select Committee. So, this is the game that is going on. They do not want to have anything good done for the country. They want to have 'ඌරුමස්" in Parliament together with Rosy. That is all they want.

Yesterday, the Hon. Ranjan Ramanayake criticized and condemned the Shariah law as a *jada* law. I raised an objection and asked the Hon. Leader of the Opposition who was seated there at that time whether he agreed on that, whether it is the policy of the UNP and if so, we will go and tell that to the Muslims in this country. He slowly got up and went. This is the position of the UNP. They are neither here nor there. They do not know where they are going. All the doors are closed for them and the rooms behind them are darkened.

I ask them why they cannot attend the Select Committee. අර අපේ පැත්තේ ගරු මන්ත්‍රීතුමාත් ඇහුවා වාගේ, මේ විශේෂ කාරක සභාවට සහභාගි වන්නේ නැත්තේ ඇයි? එතුමන්ලාගේ තිබෙනවා ලු, විකල්ප ව්‍යවස්ථාවක්; Constitution එකක්. ඒකත් ගෙනැල්ලා ඒ විශේෂ කාරක සභාවට ඉදිරිපත් කරන්න කෝ. මේ පාර්ලිමේන්තුවේ පැවැත්වෙන ඒ විශේෂ කාරක සභාවට සහභාගි වන්නේ නැත්නම්, if they do not come to that Select Committee appointed by Parliament, are they going to Norway, are they going to Germany, are they going to Israel or any other country to attend a Select Committee? ආණ්ඩුවත් සමඟ ඉඳගෙන ජාතික ප්‍රශ්නය විසඳුවේ නැත්නම් කාටද පාඩු වන්නේ? ඒගොල්ලන්ටමයි පාඩු වන්නේ කියන එක හිතන්නේ නැහැ. ජාතිය වෙනුවෙන් ඒක හිතන්න. එහෙම තමයි එදාත් කටයුතු කළේ. සියලුම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ඉදිරිපත් කළ අවස්ථාවලදී, ඒ කාලයේත් සෑම පක්ෂයකම විවිධ මත තිබුණා. නමුත් ඒ සියලුම පක්ෂ ඒ සාකච්ඡාවලට සහභාගි වුණා. ස්ටැන්ලි තිලකරත්න මැතිතුමාගේ නායකත්වයෙන් එතුමාගේ පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත්, අනෙක් පක්ෂත් එදා එයට සහභාගි වුණා. සියලුම පක්ෂ සහභාගි වෙලා තමයි 1972 දී ඒ අලුත් ව්‍යවස්ථාව සම්පාදනය කළේ. There is a problem of representation of minorities in Local Authorities as mentioned here. The same thing happened under the Soulbury Constitution of 1947**.** Thereafter, there were 151 elected Parliamentary Members, 145 electoral districts and six nominated Members.

There were multimember constituencies. There were 3 Members for Colombo Central, 2 Members for Beruwala, 2 Members for Harispattuwa, 3 Members for Nuwara Eliya-Maskeliya; 2 Members for Batticaloa and 2 Members for Pottuvil. It was extended to other electorates such as Ambalangoda-Balapitiya, Kadugannawa, Muttur, Badulla and later Beruwala. This is what the constitutional experts named as "unrepresented interests to be represented in Parliament". Therefore, in the later amendments to the Local Authorities Elections Bill, if there could be a scheme

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

evolved as was in 1947- even today we have this system - it would be good.

We are called "National List Members". No. The Constitution provides for 29 Members representing national constituencies. Before an election, there is a list of Members - like the name of your good self, Sir, - contesting from each electorate or electoral district published, and people look at that list also when voting. Therefore, if they want you, me or anybody else in Parliament, they will vote for the party that we belong to. As a result, now all of us are named as Representatives of a National Constituency. It is a misnomer to call us "National List Members".

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Therefore, Sir, I would applaud the Hon. Minister for bringing an amendment to this Bill before Parliament. According to the "Mahinda Chintana" - I have no time to quote the relevant section - there will be a very strong, vibrant Local Government System presently in our country. The Hon. A.L.M. Athaullah is steering this Ministry well. I wish him all good luck! I think he can sing a song too for us!

Thank you.

[අ.භා. 5.07]

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා (පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா - உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சர்)
(The Hon. A.L.M. Athaulla - Minister of Local Government and Provincial Councils)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත අද ඉදිරිපත් කර තිබෙනවා. සියලුම පක්ෂවලට ඒක අත්‍යවශ්‍යයි. සියලුම පක්ෂවලට මේ පළාත් පාලන ආයතනවල තිබෙන පුරප්පාඩු පිරවීමේ ප්‍රශ්නය තිබෙනවා. නමුත් මෙහි සිටින නොයෙකුත් පක්ෂවල සමහර මන්ත්‍රීවරු ඒ ගැන කථා කරන්න නොවෙයි, ආණ්ඩුවට මඩ ගසන්නයි මේ අවස්ථාව පාවිච්චි කළේ. සාමාන්‍යයෙන් හොඳ අදහස් ප්‍රකාශ කරනවා නම් අපි කවුරුත් පිළිගන්නවා. පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්, පළාත් පාලන මන්ත්‍රීවරුන් කරන දූෂණ සම්බන්ධව, මිනී මැරුම් සම්බන්ධව මේ අවස්ථාවේ දී කථා කළ අය පිරිසිදුව කටයුතු කරපු මන්ත්‍රීතුමන්ලා වෙන්න ඕනෑ. ජේවීපී මන්ත්‍රීතුමන්ලාත් ඒ සම්බන්ධව කථා කළා. හැබැයි ඒවා සම්බන්ධයෙන් කටයුතු කරන්න වෙනම ආයතන තිබෙනවා. පොලීසිය තිබෙනවා, Commission to Investigate Allegations of Bribery or Corruption එක තිබෙනවා, disciplinary action ගන්න පුළුවන් ආයතන තිබෙනවා. ඒ වාගේම පළාත් සභාවටත් ඒ ගැන කටයුතු කරන්න අයිතිය තිබෙනවා. අපට කියන්න බැහැනේ, රටේ ජීවත් වන හැම ජනතාවම එකම විධියකට ජීවත් වනවා කියලා. මිනිස්සු එක එක විධියට ජීවත් වනවා. සොරු ඉන්නවා, මිනීමරුවන් ඉන්නවා. ඒවා හැම එකක්ම අපට බලන්න බැහැ. නමුත් ඒවා තහනම් කරන්න ක්‍රමයක් තිබෙනවා; මේ රටේ නීතියක් තිබෙනවා. ඒ වාගේ නීති තියෙද්දී නිකම් ආණ්ඩුවට මඩ ගහන විධියට මෙතැන ප්‍රකාශ කළා. ඇත්තටම ඒවා අදහස් ප්‍රකාශ කිරීමක් නොවෙයි. මොනවා හරි අදහසක් ඉදිරිපත් කරනවා නම්, ඒක පිළිගෙන මේ රටේ නීතිය අනුව සලකා බලා කටයුතු කරන්නට අපට පුළුවන්. ඒත්, එහෙම අදහසක් ඉදිරිපත් වන්නේ නැහැ.

අපි අද delimitation සම්බන්ධව කථා කළා. Delimitation සම්බන්ධ දිස්ත්‍රික් කමිටුවට අපි පත් කර තිබෙන්නේ පක්ෂ සාමාජිකයන් නොවෙයි. හැම දිස්ත්‍රික්කයේම GAsලා අපි පත් කර තිබෙනවා. එතුමා තමයි ඒ දිස්ත්‍රික් කමිටුවට නායකත්වය දෙන ප්‍රධානියා. දෙවැනියට එහේ ඉන්න Assistant Commissioner of Elections. ඒ වාගේ තවත් නිලධාරින් තමයි ඒ කමිටුවේ ඉන්නේ. භූගෝලීය පැත්තත්, ආර්ථික පැත්තත් කියන සියලුම දේවල් බලලා decisions ගන්න පුළුවන් විධියට අපි ඒ අය කරලා තිබෙනවා. තවම ඒ වැඩ පිළිවෙළ ඉවර කරලා නැහැ. නමුත් මෙතැනට ඇවිල්ලා සමහර මන්ත්‍රීවරුන් කියන්නේ මොකක්ද? ඒ මන්ත්‍රීවරුන්ගේ, සභාපතිවරුන්ගේ වුවමනාව අනුව දැන් මේ කොට්ඨාස වෙන් කරගෙන යනවා කියලා නිකම් බොරුවට කථා කරනවා. ඒ වැඩ පිළිවෙළ ඉවර වුණාට පස්සේ කථා කළා නම් අපිට ඒවා පිළිගන්න ඉඩ තිබුණා. නමුත් එහෙම එකක් නැහැ. මේ ආණ්ඩුව, අපේ අමාත්‍යාංශය ඒ වැඩ පිළිවෙළ ලස්සනට කරගෙන යනවා. අපි ඒ වැඩවලට තව මාස හයක් කල් දීලා තිබෙන්නේ,"අපට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව දෙන්න" කියලා මේ Opposition මන්ත්‍රීවරුන් ඉල්ලා හිටපු නිසායි. ඒ අනුව අප ඒ සඳහා මාස හයක් කල් දීලා තිබෙනවා. ඒ නිසා අප සුහදව, ලස්සනට මේ ක්‍රමය හරහා ඡන්ද තියන්න සූදානම් වෙන්න ඕනෑ. ඒ කියන්නේ අප සියලු දෙනාම-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න පුළුවන්ද?

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
මම කිව්ව ආකාරය ඔබතුමාට පැහැදිලි මදිද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වුණාට අප දන්නේ නැහැ මේ කටයුත්ත කොහොමද කරන්නේ කියලා.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඔබතුමා ක්‍රමවේදය දන්නේ නැද්ද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඒ ඒ පළාත් සීමා නිර්ණය කොමිෂන් සභාව යටතේ කොට්ඨාසවලට කඩලා තිබෙන්නේ කොහොමද කියන කාරණය

ගැන අපව දැනුවත් කරන්න. ඒ තොරතුරු අපට එවන්න. ඊට පසුව අප ඒවා අධ්‍යයනය කරලා -

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

අප කඩලා නොවෙයි එවලා තිබෙන්නේ. දැන් කමිටු පත් කර තිබෙනවා. එතැන සභා කීපයක් තිබෙනවා, හැම දිස්ත්‍රික්කයකටම.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඒක තමයි. ඒ කමිටු නිර්දේශ අපට එවන්නකෝ. ඔබතුමන්ලාගේ මොකක් හරි වැඩ පිළිවෙළක් ඇති නේ. ඒ ගැන අප දැනුවත් නැහැ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

ඒ කමිටු පිළිවෙළට තමයි කර ගෙන යන්නේ. කමිටුව දැන් තමයි ඒවා කර ගෙන යන්නේ. ඔබතුමාටත් පුළුවන් අදහස් ප්‍රකාශ කරන්න. ඒකට අවස්ථාවක් දී තිබුණා. ඔබතුමා අදහස් දුන්නාද දන්නේ නැහැ. [බාධා කිරීමක්] ඇයි? කියන්න එපා යැ. අපි පත්තරෙන් ප්‍රසිද්ධ කළා නේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

කියන්න බැරි වුණු නිසා නේ දැන් මේ කියන්නේ, ගරු ඇමතිතුමනි. තමුන්නාන්සේලා ඔය කමිටු පත් කරලා ඒ වැඩ කටයුතු කරන ක්‍රමවේදය ගැන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට අපව දැනුවත් කරන්න.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

මේ කමිටුව-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මේක අහන්නකෝ. මගේ ආසනය වන කුලියාපිටියේ, සියඹලාගස්කොටුව ප්‍රදේශයේ ගැටලු කීපයක්ම තිබෙනවා. ඉතාම අසාධාරණ විධියට තමයි දැනට නිර්දේශ වෙලා තිබෙන්නේ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

ඔබතුමාට දිසාපතිතුමා හම්බ වෙලා කථා කරන්න පුළුවන් නේ. කමිටුවට officially කියන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

දිසාපතිතුමා සමඟ මම මේ ගැන කථා කළා.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

එතුමා ඒකට ඇහුම්කන් දුන්නා නේ?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඒ ගැන බලන්නම් කියලා කිව්වා. මම දන්නේ නැහැ, ඊට පස්සේ මොනවා වුණාද කියලා.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

ඔබතුමාගේ අදහසකට පමණක් වැඩ කරන්න බැහැ. අපට අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්. සාමාන්‍ය විධියට තමයි ඒ අය තීන්දුවක් ගන්නේ. ඒ නිසා අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්. අපත් තවම කියලා නැහැ, මෙන්න මෙහෙම කරන්න කියලා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(Te Hon. Akila Viraj Kariyawasam)

ගරු ඇමතිතුමනි, අප කියන්නේ සාධාරණ ක්‍රමවේදයක් අනුගමනය කරන්න කියලායි, කාගේවත් අදහසට නොවෙයි. කාටවත් අසාධාරණයක් නොවන විධියට කටයුතු කරන්න.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

එහෙම තමයි කරන්නේ. එතැන අසාධාරණයක් වෙන්නේ කොහොමද? හැබැයි එක ප්‍රශ්නයක් තිබෙනවා. අර ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ විධියට පල්ලිය අවට ඉන්න ජනතාව දෙකට වෙන් කළා කියන එක. ඒවා බලන්න පුළුවන්. ඒ පනතේ ඒ ගැන තිබෙනවා. ඒ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළේ ජීවත් වන ඒ minoritiesවල percentage එක බලලා ඒ අනුව කොට්ඨාස වෙන් කරන්න ඕනෑ කියලා, කියා තිබෙනවා. දැන් රවුෆ් හකීම් ඇමතිතුමාත් කිව්වා, minority representation එක වැඩි කර ගන්නට multi-member ward system එක ඇති කරනවාය කියලා. එහෙම නොවෙයි නම් single-member ward system එක අනුව ඒ ගොල්ලෝ වෙන් කරනවා. අවශ්‍ය වුණොත් multi-member wards create කරලා හරි minoritiesලාගේ representation එක අප දෙන්න ඕනෑ. අන්න ඒකයි කියන්න තිබෙන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, පොඩි කාරණයක් කියන්නද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා මොකක්ද කියන්නේ?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අද කොළඹ මහ නගර සභාවේ මන්ත්‍රීවරු කැඳවා තිබුණා, මේ කොට්ඨාස නිර්ණය පිළිබඳ ඔවුන්ගේ අදහස් දක්වන්න කියලා. එහෙම අදහස් දක්වන්නය කියලා ඔවුන් කැඳෙව්වාට, දැනට තිබෙන යෝජනාව ගැන ඔවුන්ව දැනුවත් කිරීමක් කර නැහැ කියලායි කොළඹ මහ නගර සභාවේ සන්තියාගු මන්ත්‍රීතුමා සඳහන් කළේ. අපට සියල්ලම ගැන කථා කරන්න බැහැ නේ. මේ යෝජනාව පිළිබඳ පදනම අපට දැනුම් දුන්නා නම්, ඒ පදනම මත ඉඳගෙන එහි හොඳ - නරක ගැන අපට කථා කරන්න පුළුවන්. ඒ වාගේම බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මගේ පක්ෂයේ

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මන්ත්‍රීවරුන්ට දැනුම් දීමක් කර තිබෙනවා, ඉදිරි දිනකදී මැතිවරණ කොමසාරිස්තුමාව මුණ ගැහෙන්නය කියලා. ඔවුන් දන්නේ නැහැ, නිලධාරින් විසින් දැනට කර තිබෙන පදනම් යෝජනාව ගැන . ඒක අපට කිව්වොත් අපට අදහස් දෙන්න පුළුවන්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. ගරු අමාත්‍යතුමාට අවස්ථාව දෙන්න. කාල වේලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
මේ සම්බන්ධව කථා කරන්න තව ගොඩක් කරුණු තිබෙනවා. මේක විතරක් නොවෙයි. ඉදිරියට තව කථා කරන්න වෙනවා. අනික් කාරණය මේකයි. ඒ පනත් කෙටුම්පත සම්මත කරපු දවසේ මම පිළිගත්තා, අප මේ delimitation එක ඉවර වුණාට පස්සේ එහි තිබෙන අඩුපාඩු ටික සකස් කරනවාය කියලා. ඒක අප පිළිගත්තා. අප එය කිව්වා. පනතක් සංශෝධනය කරලා, මේ ක්‍රමය හදන කොට එක පාරටම ඒක හරියට කරන්න බැරි වෙයි. බලන්න, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තිබුණු Parliamentary system එක වෙනස් කරලා ඒ Constitution එක amend කර ගත්තා. හැබැයි අදත් දවසින් දවස ඒ පනත අප සංශෝධනය කරනවා නේ. දවසින් දවස හැම ආයතනයක්ම ඒ පනත වෙනස් කරනවා. පළාත් පාලන ආයතනය ඒ පනත වෙනස් කරනවා. Constitution එක වෙනස් කරනවා. දහඅට වෙනස් කරනවා. දහතුන වෙනස් කරනවා. දහහත වෙනස් කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දහතුන?

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
දහතුනත් වෙනස් කළා. වෙනස් කරනවා නේ. හැම වෙලාවේම වෙනස් කරනවා. ඒ කියන්නේ, මොකක්ද හේතුව? ඒකට හොඳ advice එකක් තිබුණේ නැහැයි කියා අපට කියන්නට පුළුවන් ද? කියන්නට බැහැ නේ. දැන් අර ගරු මන්ත්‍රීතුමා කියනවා, "බලන්න ඒක ඔයගොල්ලො හරියට කරලා නැහැ නේ. නැත්නම් මේ ප්‍රශ්නය එන්නේ නැහැ නේ. නැත්නම් මේ amendment එක ගේන්න ඕනෑ නැහැ නේ." කියා. ඒක වැරදියි. අපට මාස හයක් ඇතුළත මේක කරන්නට පුළුවන්කමක් තිබුණා නම්, මේ amendment අපට ඕනෑ නැහැ. Interpretation Ordinance එකට අනුව අපට පත් කරන්නට පුළුවන්. දැනුත් පුළුවන්. හැබැයි මැතිවරණ කොමසාරිස්තුමා ඉල්ලුව නිසා තමයි අප මේක කරන්නේ. එම නිසා පුළුවන් තරම් අපේ අමාත්‍යාංශයයි, Attorney-General's Department එකයි එකතුවෙලා මේ පනත් කෙටුම්පත හරිගස්සා තිබෙනවා. නමුත් ඒවා බලන්නේ නැහැ. ඒවා හරියි කියා කියන්නේ නැහැ. "හොඳයි "කියා කියන්නේ නැහැ, කවදාවත්. Opposition එක කවදාවත් "හොඳයි" කියා කියන්නේ නැහැ. "නරකයි" කියන එක තමයි කියන්නේ.

තමුන්නාන්සේලා අදහස් ඉදිරිපත් කිරීම ගැන මා බොහොම සන්තෝෂ වෙනවා. ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා මේ මට්ටමට කථා කරාවිය කියා මා නම් බලාපොරොත්තු වුණේ නැහැ. [බාධා කිරීම්] නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔබතුමා නළවන්න ද?

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
නළවන්නට ඕනෑ නැහැ. මන්ත්‍රීවරුන්ගේ, සභාපතිවරුන්ගේ ප්‍රශ්න තමුන්නාන්සේලාගේ කාලයේ තිබිලා නැද්ද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
UNP ආණ්ඩුව කාලයේ එහෙම තිබිලා නැද්ද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔය තරම් නැහැ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඇමතිවරු , මන්ත්‍රීවරු එහෙම කරලා නැද්ද? කොච්චර දූෂණ තිබුණා ද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
එහෙම නැහැයි කියලා කියන්න එපා. ඒවා අපට කරන්නට බැහැ නේ. ඒකට වෙනම ආයතනයක් තිබෙනවා. මන්ත්‍රීවරු වේවා, පළාත් සභා මන්ත්‍රීවරු වේවා, CJ වේවා දඬුවම් දෙන්න ක්‍රමයක් තිබෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
The responsibility must be taken by the Government.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
හරි. Government එක වුණත් කෙලින්ම, නිකම් ම කරන්නේ නැහැනේ. ඒකට ක්‍රමයක් තිබෙනවා නේ. ඔබතුමා පොඩි ළමයෙක් වාගේ කථා කරන එක මට පිළිගන්නට බැහැ. අනෙක් අය කථා කළා නම් ඒක පිළිගන්නට පුළුවන්. අර JVP මන්ත්‍රීතුමා හැම දාම කථා කරනවා විතරයිනේ. ඔබතුමා senior politician කෙනෙක්. You have a responsibility.[බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමාට බාධා කරන්න එපා. කාලවේලාව පිළිබඳ ගැටලුවක් තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අපිත් අපේ රටට ආදරෙයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා කථා කරන්න. කාලවේලාව සම්බන්ධ ගැටලුවක් තිබෙනවා.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
හොඳ අදහස් ඉදිරිපත් කළ මන්ත්‍රීතුමන්ලාට අප ස්තුතිවන්ත වෙනවා. හැබැයි අප මේ delimitation එක ඉවර කරලා පළාත් පාලන ආයතනවලට නව ඡන්ද පවත්වා, මේවා වෙනස් කරනකොට මොකක් ද අප කරලා තිබෙන්නේ කියා මේ රටට පැහැදිලි වෙයි. මොකක් ද අප කළ වෙනස කියා රට දැන ගනීවි. ඒ වෙනතුරු තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. තව මාස හයයි තිබෙන්නේ මේක ඉවර කරන්න.. [බාධා කිරීම්]

நான் தமிழிலே சில விடயங்களைச் சொல்ல வேண்டும். இச்சபையிலே வடக்கு, கிழக்கு மாகாணங்கள் தொடர்பான பிரச்சினை பற்றிப் பேசப்பட்டது. குறிப்பாக மாண்புமிகு யோகராஜன் அவர்கள் இதைப்பற்றிப் புரிந்துகொள்ள வேண்டும். வடக்கு மாகாணம், கிழக்கு மாகாணம் என்பன இரண்டு வெவ்வேறு மாகாணங்கள். இவ்விரு மாகாணங் களையும் இணைப்பதானது, நாடு ஏற்றுக்கொண்டு ஒரு பேச்சு வார்த்தைமூலம் செய்திருக்க வேண்டிய விடயம். ஆனால், இலங்கை - இந்திய ஒப்பந்தத்தின் பிரகாரம், கிழக்கு மாகாணத் திலுள்ள தமிழ் மக்களுடனோ, முஸ்லிம் மக்களுடனோ எவ்விதத்திலும் ஆலோசிக்கப்படாமல் கபடத்தனமாக கிழக்கு மாகாணம் வட மாகாணத்துடன் இணைக்கப்பட்டது. அவ்வாறு இணைத்த காலத்தில் வடக்கு, கிழக்கு மாகாணத்தில் வாழ்ந்த முஸ்லிம் மக்களுடைய பிரதிநிதிகள் இல்லாமலேயே வடக்கு, கிழக்கு மாகாண சபை கூடியது. அங்கு 17 முஸ்லிம் அங்கத்தவர்கள் இருந்தார்கள். அந்தப் 17 முஸ்லிம் அங்கத்தவர் களுடைய பிரசன்னம் இல்லாமலேயே அம்மாகாண சபையைக் கூட்டக்கூடியதாக இருந்தது. இதனால், அவர்களுடைய அரசியல் பலம் பாதிக்கப்பட்டிருந்தது. இந்தச் சூழ்நிலையிலே தமிழர் விடுதலைக் கூட்டணியின் பெரும்பெருந் தலைவர்கள் எல்லோரும் "நாங்கள் பிரிக்காமல் சேர்ந்திருப்பதற்கு வழிவகை களைச் செய்வோம்" என எமது தலைவர் மாண்புமிகு அஷ்ரஃப் அவர்களிடம் கேட்டுக்கொண்டதற்கிணங்க அவர், "நிபந்தனை களுடன் இணைவதற்குப் பேசுவோம்" என்று சொன்னார். அவ்வாறு அந்தக் காலத்தில் நிபந்தனைகள் தொடர்பாகப் பல பேச்சுவார்த்தை நடைபெற்றபொழுதிலும் ஒருபொழுதும் தமிழர் விடுதலைக் கூட்டணியினரோ, புலிகளோ எந்த நிபந்தனையையும் ஏற்றுக்கொள்ளவில்லை. மாறாக, பேச்சு வார்த்தை மேசைக்குப் போகும்பொழுது "போராடாத முஸ்லிம் மக்களுக்கு என்ன பேச்சு வேண்டிக்கிடக்கிறது" என்று கூறிய வசனங்களைத்தான் கேட்கக்கூடியதாக இருந்தது.

இவை ஒருபுறமிருக்க, தலைவர் அஷ்ரஃப் அவர்கள் கடைசியாக பாராளுமன்றத்தில் ஆற்றிய உரை அடங்கிய *ஹன்சாட்* என்னிடம் இருக்கிறது. அவர் தனது உரையிலே "வட கிழக்கு தமிழ் பேசும் மாநிலம் என்று இணைந்திருப்பதற் கான ஓர் ஒழுங்கு சம்பந்தமாகப் பேசுகின்ற கடைசிக் குரல் இந்த அஷ்ரஃப்பினுடையதாகத்தான் இருக்கும். இந்த நிபந்தனைகள் தொடர்பாக, முஸ்லிம் மக்களுடைய பிரச்சினை களுக்கு நீங்கள் காது கொடுக்கவில்லையென்றால், என்னு டைய சமூகம் வடக்கு, கிழக்கைப் பிரிக்கக் கோரும்" எனக் குறிப்பிட்டிருக்கிறார். அதன் பின்னர் அவர் மரணித்துவிட்டார். அதன் பிரகாரம் கிழக்கிலிருந்து எழுந்த குரலாக முதலாவதாக நான்தான் வடக்கு, கிழக்கைப் பிரிக்கக் கோரினேன் என நினைக்கிறேன். ஏனெனில் அதைத் தவிர வேறு வழியில்லை. கிழக்கில் வாழ்கின்ற தமிழ் மக்களும் முஸ்லிம் மக்களும் ஒரு தாய் வயிற்றுப் பிள்ளைகள். ஒரு காலத்திலும் கிழக்கு மாகாணத்தில் வாழ்ந்த தமிழர்கள் வட மாகாணத்தில் வாழ்ந்த தமிழர்களை ஏற்றுக்கொள்ளவில்லை. அன்றைய காலத்திலே கிழக்கு மாகாணத்தில் வாழ்ந்த தமிழர்கள் மட்டக்களப்பிலே "யாழ் ஓட்டிக் கழகம்" என்று ஒரு கழகத்தை ஸ்தாபித் திருந்தார்கள். ஏதோ ஒரு காரணத்துக்காக கிழக்கு மாகாணத் திலுள்ள தமிழர்கள் வட மாகாணத்திலுள்ள தமிழர்களின் பிடிக்குள் மாட்டி, பாதிக்கப்பட்டு அந்தப் பிடியிலிருந்து மீள முடியாத நிலை ஏற்பட்டது எங்களுக்கு ஞாபகமிருக்கிறது.

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
அது ஒரு பிரச்சினையல்ல.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, please wind up now.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
Please give me one more minute.

இலங்கையைப் பொறுத்தவரையில் இரண்டு தமிழ் பேசும் மாநிலம் இருப்பதையிட்டு நாம் ஏன் கவலைப்பட வேண்டும்? தமிழ் பேசும் மாநிலங்கள் இரண்டு இருக்கட்டும்! வடக்கு மாகாணத்தில் தமிழர் ஒருவர் முதலமைச்சராக இருக்கட்டும்; கிழக்கு மாகாணத்திலே தமிழரோ, முஸ்லிமோ, சிங்களவரோ முதலமைச்சராக இருக்கட்டும். "இனங்களுக்கிடையில் அதிகாரப் பகிர்வு" என்பதை நாங்கள் "மாநிலங்களுக்கிடையில் அதிகாரப் பகிர்வு" என மாற்றுவோம். கிழக்கு மாகாணத்தி லுள்ள அனைத்து மக்களுக்கும் நாங்கள் அதிகாரப் பகிர்வைக் கொடுப்போம். கிழக்கு மாகாணத்திலுள்ள தமிழர்கள், முஸ்லிம்கள், சிங்களவர்கள் அனைவருக்கும் அதிகாரம் கிடைக்கட்டும். அதுபோல வட மாநிலத்துக்கும் அந்த அதிகா ரங்கள் கிடைக்கட்டும். அப்படி அதிகாரப் பகிர்வை மேற்கொள்வதன்மூலம்தான் இந்தச் சிறிய நாட்டிலே சிங்கள, தமிழ், முஸ்லிம் இனப்பாகுபாடுகள் இல்லாமல் எம்மால் வாழ முடியும். இந்த நாடு அவ்வாறு கூறுபோடப்பட்டால், அங்கு தொடர்ச்சியாக மக்கள் வாழ்வதற்குரிய ஆரோக்கியமான சூழ்நிலை இருக்காது என்பதை எமது நீண்டகால அனுப வத்தின் பிரகாரம் அறிந்துகொண்டோம். இன்றைக்குக்கூடப் பாருங்கள்! அண்மையில் நியமிக்கப்பட்ட பாராளுமன்றத் தெரிவுக்குழுவுக்கு எதிர்க்கட்சிகள் சார்பாக அங்கத்தவர்களை நியமிப்பது சம்பந்தமாகப் பேசினார்கள்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, please wind up.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
මට විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රටේ ප්‍රශ්න විසඳන්න ඕනෑ කියන මතය එක්සත් ජාතික පක්ෂයට කවදාවත් නැහැ. අනිවාර්යයෙන්ම මම කියනවා, කවදාවත් ඒ ගොල්ලෝ එය කරන්නේ නැහැ කියා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒ මොකක්ද?

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
දැන් බලන්න, Parliamentary Select Committee එක පත් කරලා තිබෙනවා නම්, තමුන්නාන්සේලාට පක්ෂයක් තිබෙනවා නම්, තමුන්නාන්සේලාගේ නියෝජිතයෝ ඇවිල්ලා එහි වාඩි වෙන්න ඕනෑ. තමුන්නාන්සේලා රවුෆ් හකීම් ගැනයි, අනෙක් අය ගැනයි කථා කරන්න ඕනෑ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමාට බාධා කරන්න එපා.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
රවුෆ් හකීම් ගැනයි අනෙක් අය ගැනයි කථා කරන්න ඕනෑ නැහැ. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමාට බාධා කරන්න එපා.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
තමුන්නාන්සේලා හිතන්න ඕනෑ. කවදාවත් තමුන්නාන්සේලා හිතලා නැහැ. ඒ වාගේම තමයි එදා ප්‍රභාකරන්ව ගෙන්වලා ගිවිසුම් අත්සන් කළේ ප්‍රශ්න විසඳන්නටද? නැහැ, එහෙම නොවෙයි. කන්න; නැත්නම් කන ගොනාට දෙන්න. කන්නෙත් නැහැ, කන ගොනාට දෙන්නෙත් නැහැ. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. A.L.M. Athaullah]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[MR. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 3 දක්වා වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

## 4 වන වගන්තිය.- (වලංගු කිරීම.)
வாசகம் 4.- (செல்லுபடியாக்குதல்.)
CLAUSE 4. - (*Validation*)

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
I move,

"In page 1, leave out all words in line 26 and insert:

'of this Act in terms of the provisions of the Local Authorities Elections Ordinance (Chapter 262) which were in operation on the date immediately preceding the date of coming into operation of the Local Authorities Elections (Amendment) Act, No. 22 of 2012 shall be deemed to have been validly filled.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***4වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 4, as amended, ordered to stand part of the Bill.*

***5 සහ 6 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*5ஆம், 6ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 5 and 6 ordered to stand part of the Bill.*

***දීර්ඝ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*விரிவுப் பெயர் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Long Title ordered to stand part of the Bill.*

*ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*පනත් කෙටුම්පත, සංශෝධනය සහිතව වාර්තා කරන ලදී.*
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தத்துடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendment.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන්, දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.*
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## අ.පො.ස. (උසස් පෙළ) සඳහා තාක්ෂණ වේදය විෂය ධාරාව
## க.பொ.த (உயர்தர) தொழில்நுட்பப் பாடவிதானம்
## TECHNOLOGY STREAM FOR G.C.E. (A/L)

**ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා**
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"සෑම වර්ෂයකම අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිට උසස් පෙළ හැදෑරීමට ප්‍රමාණවත් ප්‍රතිඵල නොලැබූ විශාල පිරිසක්ද, අ.පො.ස. (උ.පෙළ) තරගකාරී විභාගයට පෙනී සිට සරසවි වරම් නොලබන විශාල පිරිසක්ද, සමාජයට එකතු වේ. එසේම කලා විෂය ධාරාව යටතේ උපාධිය ලබන බොහෝ තරුණයින්ට රැකියා සොයා ගැනීමේදී දුෂ්කරතාවන්ට මුහුණ දීමට ද සිදුව ඇත.

මේ තත්ත්වය මැඩලීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය එක්ව පාසල් සඳහා තාක්ෂණික විෂය ධාරාවක් හඳුන්වා දීම නියමිතව ඇති බව දැනගන්නට ඇත. එවැනි නව විෂය නිර්දේශයක් හඳුන්වා දෙන්නේ නම් එම කාල වකවානුව කුමක්ද යන්න මෙම ගරු සභාව දැනුවත් කරන ලෙසත්, එසේ නොමැති නම්, ඒ වෙනුවට ඉහත අමාත්‍යාංශ එකතු වී විකල්ප වැඩසටහනක් හඳුන්වා දිය යුතු බවත් මම මේ ගරු සභාවට යෝජනා කරමි. "

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, යුද්ධයෙන් තොර මේ රටේ ජනතාව මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩ පිළිවෙළ අනුමත කරමින් ශක්තිමත් පාර්ලිමේන්තුවක් 2010 මැතිවරණයෙන් පස්සේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ බිහි කළා. අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ, යුද්ධයෙන් තොර රටක පාර්ලිමේන්තුවේ 161 දෙනෙකුගේ ශක්තිමත් ස්ථාවරභාවයක් එක්ක, මැතිවරණයට විතරක් සීමා කරන්නේ නැතුව අපි හැමදාම කියවන, හැම අමාත්‍යාංශයක්ම ඒ අනුව කටයුතු කරන මහින්ද චින්තන ඉදිරි දැක්ම කියන ඒ වැඩ පිළිවෙළ ඔස්සේ ශක්තිමත් ආර්ථිකයක් කරා, ආසියාවේ ආශ්චර්යය කරා යන මොහොතකයි අපි සියලු දෙනාම සිටින්නේ.

අනාගතයේදී මේ නිදහස්, සාමකාමී රටේ ආර්ථිකයට ගැළපෙන ශක්තිමත් ශ්‍රම බලකායක් බිහි කිරීම හැමෝම ඉදිරියේ තිබෙන අභියෝගයක්. ඒ ශ්‍රම බලකාය බිහි කිරීම පිළිබඳව 2010 මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩ පිළිවෙළ තුළත් නොයෙක් තැන්වල සඳහන් වුණා.

මේ වැඩ පිළිවෙළ සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉතාමත්ම වැදගත් වෙනවා. පසු ගිය කාලයේ අධ්‍යාපන අමාත්‍යාංශය තුළ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය තුළ සහ යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය තුළ -අධ්‍යාපනයට සම්බන්ධ අමාත්‍යාංශ තුළ- විශේෂ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක වන බව අපිට දකින්නට ලැබුණා. පසු ගිය කාලයේ ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාගේ සභාපතිත්වය යටතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ උපදේශක කාරක සභාව මාස ගණනාවක් තිස්සේ රැස් වෙලා මේ පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබා ගෙන, මහාචාර්යවරු ආචාර්යවරු විදුහල්පතිවරු ඇතුළු රටේ විද්වතුන් කැඳවලා ඔවුන්ගේ අදහස් ලබා ගෙන සුවිශේෂී වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා. ඇත්තටම ඒ වැඩ පිළිවෙළ පොතකට විතරක් සීමා වෙන්නේ නැතිව 2012 ජනවාරි 01 වැනි දා සිට ක්‍රියාත්මක වුණු බව අපට දකින්නට ලැබෙනවා. පාසල් 350කට අධික ප්‍රමාණයක ප්‍රාථමික අංශය ඉවත් වෙලා නව වැඩ පිළිවෙළ පටන් ගෙන තිබෙනවා. ඒ වාගේම උසස් පෙළ දරුවන්ට ඉගැන්වීම සඳහා අලුත් ගුරුවරුන් බඳවා ගෙන තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ, මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 409ක් අද ලංකාව පුරා ඉදි වෙනවාය කියන එක. මහනුවර දිස්ත්‍රික්කයේ මගේ ආසනය තුළ පාසල් 3ක දැනටමත් ඒ තාක්ෂණික විද්‍යාගාර හදලා ඉවරයි. මේ වාගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් ඒ කථා කළ කරුණු, ඉදිරිපත් කළ කරුණු එකින් එක, එකින් එක යථාර්ථයක් බවට පත් වන බව අපට දකින්නට ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ වෙලාවේ ශ්‍රම බලකාය ගැන සඳහන් කරන්නට ඕනෑ. ලංකාවේ බොහෝ ආයතන -රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන- රැකියා සඳහා කැඳවීම් කරනවා. රැකියා සඳහා තරුණ තරුණියන් අවශ්‍යයි කියලා කියනවා. ඒ වාගේම ලෝක රැකියා වෙළෙඳ පොළ තුළත් විශාල ක්ෂේත්‍රයක රැකියා සඳහා තරුණයින්ට අවස්ථාව තිබෙනවා. අනෙක් පැත්තෙන් ගත්තාම උසස් පෙළ, සාමාන්‍ය පෙළ කරලා රැකියා විරහිත යම් තරුණ පිරිසකුත් රට තුළ සිටිනවා. මේ දෙක ගළපන්නේ කොහොමද කියන අභියෝගයත් අනිවාර්යයෙන්ම රට හමුවේ තිබෙනවා. තාක්ෂණික විෂය ධාරාවක් හඳුන්වලා දීලා, පළමුව පාසල් 200ක පමණක් එය ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබෙන බව අපට අහන්නට ලැබුණා. අපි බලාපොරොත්තු වනවා මේ තුළින් ඉදිරියේදී රැකියා ඉල්ලුම සහ රැකියා නැතිකම අතර සම්බන්ධීකරණයක් ඇති වෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පසු ගිය දවස්වල පත්තරවල දකින්නට ලැබුණා ගරු ඩලස් අලහප්පෙරුම අමාත්‍යතුමා ගරු විමල් වීරවංශ අමාත්‍යතුමා සමඟ ගිවිසුමක්

[ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා]

අත්සන් කරනවා කියලා university colleges 9ක් ලංකාව තුළ ඇති කරන්නට. නමුත් ගරු ඇමතිතුමනි, දැනටත් ලංකාවේ තිබෙන විශ්වවිද්‍යාල පද්ධතිය තුළින්, උසස් අධ්‍යාපන පද්ධතිය තුළින් එළියට එන බොහෝ තරුණ තරුණියන්ට -විශේෂයෙන් කලා මාධ්‍ය හදාරා ඇති අයට- රැකියා නොමැතිකමේ ප්‍රශ්නයකට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා. අපි දැන ගන්නට කැමැතියි, ඔබතුමා බිහි කරන්නට යන විශ්වවිද්‍යාල පද්ධතිය තුළින් අප හමුවේ තිබෙන අභියෝගවලට උත්තර දෙන්නේ කොහොමද කියලා. ඒ වාගේම ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, මේ වැඩ පිළිවෙළ අදාළ වන්නේ පාසල් 200කට පමණක්ද? පාසල් 1,000 වැඩ පිළිවෙළ තුළ ඉතිරි පාසල්වලට මේ වැඩ පිළිවෙළ හඳුන්වා දෙන්නේ නැද්ද? අපේ හාරිස්පත්තුව ආසනයේ 150,000ක් පමණ ජනතාව සිටිනවා. නමුත් එක පාසලකට පමණයි මේ තාක්ෂණික විෂය ධාරාව හඳුන්වලා දීලා තිබෙන්නේ. අනෙක් පාසලුත් මේකට ඇතුළත් කර ගන්න කියලා අපි යෝජනා කරනවා. එහෙම කරනවා නම් කොයි කාලයේ වාගේද වෙන්නේ කියන කාරණයත් අපි දැන ගන්නට කැමැතියි.

හෙද වෘත්තිය - nursing - සඳහා ලංකාවේ රාජ්‍ය සෞඛ්‍ය සේවයේත්, පෞද්ගලික සෞඛ්‍ය සේවයේත්, ඒ වාගේම විදේශ රැකියා වෙළෙඳ පොළේත් විශාල ඉල්ලුමක් තිබෙනවා.

එවැනි වැඩ පිළිවෙළක් තුළින් අපේ රටේ තරුණ තරුණියන්ට අවස්ථාවක් ලැබෙනවාද කියන කාරණය දැන ගන්න කැමැතියි. ඒ වාගේම ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමනි, විශේෂයෙන් මෙහිදී සඳහන් කරන්න ඕනෑ, බොහෝ අය රක්ෂාවලට ගිහින් තිබෙන්නේ රක්ෂාවක් කරන්න ඕනෑ නිසා මිසක් ඒ රක්ෂාවට තිබෙන කැමැත්ත නිසා නොවෙයි කියන එක. උදාහරණයක් විධියට විශ්වවිද්‍යාලවලට තේරුණේ නැති අය විද්‍යා පීඨවලට යනවා. ඒ අය විශ්වවිද්‍යාලයට යන්න බැරි වුණු නිසා විද්‍යා පීඨවලට යනවා මිසක් උගන්වන්න තිබෙන ආශාව නිසා ඒ අය ඒ වෘත්තිය තෝරා ගත්තාය කියා අපට පෙනෙන්නේ නැහැ. මේක බොහෝ ක්ෂේත්‍රවල තිබෙන ගැටලුවක්. Nursing ගැන බැලුවත් එහෙමයි. වෛද්‍ය විද්‍යාලයට ගිහින් ඩොක්ටර් කෙනෙක් වෙන්න බැරි වුණාම තමයි ඒ වෘත්තිය තෝරා ගන්නේ. ඒ නිසා තමුන්නාන්සේලාගේ මේ වැඩ පිළිවෙළ තුළින් තරුණයෙකුට, තරුණියකට එහෙම නැත්නම් ශිෂ්‍යයෙකුට, ශිෂ්‍යාවකට තමන් කැමැති ක්ෂේත්‍රය මුල පටන්ම හඳුනා ගෙන ඒ ඔස්සේ ඉදිරියට ගිය හැකි වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන එකත් දැන ගන්න කැමැතියි. O/L, A/L සමත් වෙච්ච අයට තමයි තමුන්නාන්සේලා මේ තාක්ෂණ විෂය ධාරාව හඳුන්වා දෙන්නේ. නමුත් O/L විභාගය fail වෙන විශාල පිරිසක් මේ රටේ සිටිනවා. ඒ අයගේ අනාගතය සම්බන්ධයෙන් මොන වාගේ වැඩ පිළිවෙළක්ද තිබෙන්නේ කියන එකත් මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. ඒ වාගේම, චීනය වැනි රටක 9 වසරෙන් පසුව තමන් academic field එකෙන් ඉදිරියට යනවාද, එහෙම නැත්නම් වෘත්තිය පුහුණු ක්ෂෙත්‍රය තුළින් ඉදිරියට යනවාද කියන එක ගැන තීරණය කරන්න ශිෂ්‍යයින්ට අවස්ථාව තිබෙනවා. අපේ රටටත් එවැනි වැඩ පිළිවෙළක් ඉතාමත් යෝග්‍යයි කියා මා ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. මොකද, අපේ රටේ විශාල පිරිසක් O/L අසමත් වන නිසා 9 වසරේදීම තමන් කැමැති ක්ෂේත්‍රයකින් ඉදිරියට යන්න අවස්ථාවක් ලැබෙනවා නම් ඒකත් ඉතාමත් යෝග්‍යයි කියා මා ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් වූ කාලෝචිත යෝජනාවක් හැටියට ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව මා ඉතා ඕනෑකමින් ස්ථිර කරනවා.

රටක දියුණුවට බලපාන සාධකවලින් ප්‍රධානම සාධකය තමයි අධ්‍යාපනය. අධ්‍යාපනය සම්බන්ධයෙන් කවුරු මොනවා කිව්වත් නිදහස් අධ්‍යාපනය අපේ රට තුළ ස්ථාපිත වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් ඇප කැප වුණු විවිධ දේශපාලන පක්ෂවල නායකයින් ඉන්නවා. නිදහස් අධ්‍යාපනය අඛණ්ඩව ඉදිරියට ගෙන යන්න ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා කරපු ඒ උදාර මෙහෙවර, නිදහස් අධ්‍යාපනය ලබපු අය හැටියට අපි මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී කෘතවේදීව සිහිපත් කරන්න ඕනෑ. නිදහස් අධ්‍යාපනය පියවරෙන් පියවර ඉදිරියට ගලා ගෙන ආවත් ඒ අධ්‍යාපනය කාලීනව වෙනස් වෙන්න ඕනෑය කියා හෝ එහෙම නැත්නම් එහි ප්‍රතිසංස්කරණ සිදු විය යුතුය කියා හෝ මේ රටේ හිටපු නායකයින්, පාලකයින් අවධානය යොමු කළේ නැහැ. එහෙම අවධානය යොමු කළත් එවැනි වෙනස්කම් කරන්න බැරි ආකාරයේ විවිධාකාර බලවේගයනුත් ක්‍රියාත්මක වුණා. ඒ නිසාම කුමන හෝ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයකට යනකොට හුඟාක් වෙලාවට කියපු සරල සහ සංවේදී දෙය වුණේ නිදහස් අධ්‍යාපනයට අත තියන්න යනවාය කියන එකයි. නිදහස් අධ්‍යාපනය කඩාප්පල් කරන්න යනවාය කියා සියලුම හොඳ දේවල් වසා දමා සමහර අවස්ථාවලදී දේශපාලනමය වශයෙන් යම් යම් අය වාසි ලබා ගත් බව අපි දැක්කා. නමුත් අතිගරු ජනාධිපතිතුමා තිස් අවුරුදු යුද්ධයෙන් මේ රට නිදහස් කර ගෙන, මේ රට ශීඝ්‍ර සංවර්ධනයක් කරා යොමු කර, පංච මහා බල කේන්ද්‍රස්ථානයක් බවට මේ රට පත් කරන විට දැනුම එක් කේන්ද්‍රස්ථානයක් විය යුතුය කියන සංකල්පයේ ඉඳගෙන මේ රටේ වැදගත්ම ක්ෂේත්‍රය වන අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනසක් ඇති කරන්න විෂය භාර ඇමතිතුමන්ලාට අවශ්‍ය උපදේශකත්වය ලබා දීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ අනුව ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාගේ අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යන මේ සියල්ලම ඒකාබද්ධ වෙලා ඉතාම හොඳ ආදර්ශයක් ලබා දෙමින් අද නව ප්‍රවේශයකට ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක මීට අවුරුදු 30කට ඉස්සරින් විය යුතුව තිබුණු දෙයක්. මේ රටේ තරුණ අසහනයට පිළියමක් වශයෙන් මීට අවුරුදු 30කට කලින්වත් මේ වාගේ වැඩ පිළිවෙළක් ආරම්භ කළා නම් අතීතයේ මේ රටේ ඇති වුණු තරුණ ව්‍යසන, ලේ වැගිරීම් වැනි ඒ අමිහිරි අත් දැකීම් පිළිබඳව කවදාවත් අපට කථා කරන්න සිදු වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද හාරලක්ෂ හැටදහසක් ශිෂ්‍ය ශිෂ්‍යාවන් උසස් පෙළ විභාගයට වාඩි වුණාම ඒ අතරින් විසිතුන්දහසකුයි විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගන්නේ. ඒ වාගේම කලා විෂය ධාරාව හදාරන දෙලක්ෂ තිස්පන්දහසක් දරුවන් අතරින් අටදහසයි විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වෙන්නේ. ඒ වාගේම ඉතාම සීමිත කොටසක් එනම්, එක්ලක්ෂ විසිදෙදහසක් වැනි ප්‍රමාණයක් වාණිජ විෂය ධාරාවත්, එක්ලක්ෂ තුන්දහසක් වැනි ප්‍රමාණයක් විද්‍යා විෂය ධාරාවත් හදාරන කොට විශාල පිරිසක් ආපසු හැරෙනවා. ඒ අය මහජන දිනයේදී අපි හමු වෙන්න එනවා. ඒ හැම කෙනාටම හොඳ අධ්‍යාපන සුදුසුකම් තිබෙනවා. විශ්වවිද්‍යාල ප්‍රවේශයට Z-score එක දශමයයි, දෙකයි අඩු වෙලා තිබෙන්නේ. හැබැයි යන්න මාවතක් නැහැ. යමක් කරන්න ඔවුන්ට නිපුණතාවක් නැහැ. ඒ නිසා මේ රටේ පාසල් දෙසිය තිස්දෙකක තාක්ෂණ විද්‍යාල ආරම්භ කරන මේ වැඩ පිළිවෙළ මේ රටේ ආර්ථිකමය වශයෙනුත්,සමාජමය වශයෙනුත්, දේශපාලනික වශයෙනුත් විශාල හැරවුම් ලක්ෂ්‍යයක් හැටියටයි අපි දකින්නේ. ඒ නිසා අපේ අතිගරු ජනාධිපතිතුමාටත්, මෙයට නායකත්වය දෙන ගරු අධ්‍යාපන ඇමතිතුමා, ගරු යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා, ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා සහ මේ සම්බන්ධව කටයුතු කරන අනෙකුත් මහජන නියෝජිතයන් ඇතුළු සියලු දෙනාටම අපි මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට අපි පසු ගිය කාලයේ දිගටම සම්බන්ධ වුණා. එහිදී අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ නිලධාරින් විශාල කැප කිරීමක් කරමින්, විවිධ අයගේ අදහස්, යෝජනා ගනිමින් ක්‍රියා කළා. නව අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කරන වෙලාවේ මේ ක්ෂේත්‍රය කෙරෙහියි මහජන නියෝජිතයින් වැඩි දෙනකුගේ අවධානය යොමු වුණේ. එනම්, තාක්ෂණ දැනුම අපේ දරුවන්ට ලබා දීම සම්බන්ධයෙනුයි. ඒ නිසා අධ්‍යාපන පනත එහෙම නැත්නම් ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරන්නත් පෙර, මහජන නියෝජිතයන් බහුතරයකගේ ඉල්ලීම සහ අවධානය යොමු වුණු, මේ වැඩ පිළිවෙළේ ප්‍රථම පියවරේදී තාක්ෂණ පාසල් 232ක් ආරම්භ කරන්න ගත්තු පියවර මේ රටේ අධ්‍යාපනයේ නොමැකෙන සලකුණ හැටියට නැත්නම් තීන්දුව හැටියට සනිටුහන් වෙනවායි කියන එක මතක් කරමින්, ඒ වෙනුවෙන් නායකත්වය දෙන අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ රජයට, අධ්‍යාපනයට ආදරය කරන හැම කෙනාගේම ගෞරවය ස්තුතිය නැවත වාරයක් පළ කරමින් මා නිහඬ වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
**(The Presiding Member)**

බොහොම ස්තුතියි. මීළඟට ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
**(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)**
**(The Hon. Akila Viraj Kariyawasam)**

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ කල් තැබීමේ විවාදය අවස්ථාවේ මෙම යෝජනාව ගෙනාව අපේ ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මන්ත්‍රීතුමාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. විශේෂයෙන් මේ රටට අවශ්‍ය, ඒ වාගේම රටේ අනාගත සංවර්ධනය තීරණය කරන්න ගත්තා වූ ප්‍රගතිශීලී ක්‍රියා මාර්ගය පිළිබඳවත් අපි ඇත්ත වශයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒකේ කිසිම තර්කයක් නැහැ. මොකද, ජපානය වාගේ රටවල් 1868 දී මේජි ප්‍රතිසංස්කරණ ආරම්භ කරලා 1912 වන තුරු ඒ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වෙලා ඒවා තවත් දියුණු වුණා. මා දන්නා විධියට ජපානයේ මේ වන විට කාර්මික විශ්වවිද්‍යාල නැත්නම් තාක්ෂණික විද්‍යාල 63කට වැඩි ප්‍රමාණයක් පවත්වා ගෙන යනවා. ඒ තුළින් ජපානය වාගේ රටවල් ඉදිරියට ආපු පිම්ම එහෙම නැත්නම් ජපානය කාර්මික අංශයෙන් කොතරම් දියුණු වුණාද කියන එක අපි සැලකිල්ලට ගන්න ඕනෑ. දැන් ඒක චීනයට turn වුණත් එහෙම නැත්නම් චීනය ඒක අත්පත් කර ගනිමින් ගියත් තවමත් ජපානයේ නිෂ්පාදන උසස් තත්ත්වයේ ඒවා - quality ඒවා - බව පිළිගන්නවා. ජපානයේ වාහන ගත්තත් එහෙමයි. ඒ නිෂ්පාදනවල "Made in Japan" කියලා සඳහන් කර තිබෙනවා නම් ලෝකයේ හැමෝම අතර තවමත් ලොකු විශ්වාසයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතින් පහු වෙලා හෝ ලංකාවේ මේ තාක්ෂණික විෂයයන් හඳුන්වා දීමට ගත්ත ක්‍රියාමාර්ගය පිළිබඳව විපක්ෂය විධියට අපි සතුටු වෙනවා. හැබැයි සමීක්ෂණ කරලා, පර්යේෂණ කරලා මීට වැඩිය හොඳට මේවා කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා. නැත්නම් අපි මේක කරන්නත් වාලේ කළා වෙනවා. මා දන්නා විධියට මේ කටයුත්ත කිරීම සඳහා කාර්මික විද්‍යාලවල - Technical Collegesවල- ගුරුවරු 300ක් තමයි දැන් අධ්‍යාපන අමාත්‍යාංශයට අරගෙන තිබෙන්නේ.

එතකොට ඒ කාර්මික විද්‍යාල ටික පවත්වාගෙන යන්නේ කොහොමද කියන ප්‍රශ්නය එනවා. ඒ වාගේම මේ ගුරුවරු 300 ගත්තාම -ඒක කරන්න ඕනෑ- කඩිනමින් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න ඕනෑ. තාක්ෂණික විෂයය ඇතුළත් කරනවාත් සමඟම, විද්‍යාලවලින් මේ කාර්ය භාරය ආරම්භ කරනවාත් සමඟම ආපහු මේ විෂයය උපාධිය දක්වා - විශ්වවිද්‍යාල දක්වා- ගෙන යන්නේ කොහොමද, මේ සඳහා අවශ්‍ය කථිකාචාර්යවරු, මේ සඳහා අවශ්‍ය නිපුණයන් හොයා ගන්නේ කොහොමද, රටට අවශ්‍ය ප්‍රමාණය කොපමණද යනාදී කාරණා කෙරෙහි අපේ අවධානය යොමු කළ යුතුයි කියා මම විශ්වාස කරනවා. එතකොට තමයි තාක්ෂණික විෂය හදාරන ශිෂ්‍යයා පරිපූර්ණ වෙලා විශ්වවිද්‍යාලයෙන් උපාධියක් අරගෙන එතැනින් එහාට යන්නේ. ජර්මානු තාක්ෂණික ආයතනය වාගේ ආයතන ලෝකයේ ඕනෑම රටක් පිළිගන්නවා. එවැනි තත්ත්වයට මේ විද්‍යාල ගෙනෙන්නේ කොහොමද කියා කල්පනා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් මම අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. එතුමාගේ සම්මුඛ සාකච්ඡාවක් ITN එකේ නැත්නම් රූපවාහිනියේ ප්‍රචාරය වෙනවා මා දුටුවා. ඒ වැඩසටහනට දෙමවුපියෝ දුරකථනයෙන් සම්බන්ධ වෙලා ප්‍රශ්න ඇහුවාම එතුමා ප්‍රකාශ කළා, තාක්ෂණික විෂයයන් හැදෑරූ ලක්ෂයක් දරු දැරියෝ ඉදිරි කාලය තුළදී ඉතා ඉක්මනින් බිහි කරනවාය කියා. මට මතක විධියට එක දෙමවුපියෙක් ඇහුවා, මේ ගොල්ලන්ට රැකියා අවස්ථා ඇති කරන්නේ කොහොමද කියා. එතුමා ඊට දුන්න පිළිතුරේදී කිව්වා, Mattala Airport එක ආරම්භ කරද්දී ගුවන් යානය අරගෙන ආවේ කාන්තාවක්. ඒ වාගේම හම්බන්තොට වරායේ රැකියා බිහි වෙනවා ආදී වශයෙන්. නමුත් මම නම් එයින් කොහොමටවත් සෑහීමට පත් වන්නේ නැහැ. මොකද, මත්තල වෙන්න පුළුවන්; කොළඹ වරාය වෙන්න පුළුවන්; හම්බන්තොට වරාය වෙන්න පුළුවන්; මෙවැනි ස්ථානවල දැනටත් ඒ තනතුරු පුරවා ඉවරයි. නමුත් තාක්ෂණික ශිල්පීය දැනුම තිබෙන පුද්ගලයින් ලක්ෂයක් බිහි කරන්න ඉන්නවා නම් ඒ ලක්ෂයට කොතරම් ප්‍රමාණයක් විදේශ රැකියා ඉලක්ක කරනවාද, කොතරම් ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ රැකියා දෙන්න අපේක්ෂා කරනවාද, ඒකේ වැඩ පිළිවෙළ මොකක්ද, රැකියා බිහි කිරීමේ වැඩ පිළිවෙළ මොකක්ද යනාදී කාරණා රජයක් විධියට ආර්ථිකය සංවර්ධනය කර පුළුල්ව සැලසුම් කළ යුතුයි කියා මම විශ්වාස කරනවා. එහෙම නැතුව අපි එක තැනකින් අල්ලා ඉවර වෙලා එතැන ඒ කාර්ය භාරය කරද්දී ඉගෙන ගන්නා ළමයි ඊට පසු විශ්වවිද්‍යාලවල හිර වෙනවා. ඊට පසු එළියට ගියාම ආපසු හිර වෙනවා. මේ වැඩසටහන කොච්චර promote කළත් මේ වැඩසටහන කොච්චර රටට ගෙනෙන්න හැදුවත් අවසානයේ හිරවීම නම් කරන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක වතාවක් 6 වසරේ ඉඳලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන්න පටන් ගත්තා මට මතකයි. ඒ කාලයේ ඇමතිතුමා නොවෙයි හිටියේ. ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය දීලා ඉවර වෙලා O/Lවලින් පසු A/L කරන්න මේ පාසල්වල ගුරුවරු මේ වන විට පුහුණු -train - කරනවාද කියා අපි දිගින් දිගටම ඇහුවා. අධ්‍යාපන අමාත්‍යාංශයට හරි වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. O/L කර ඒ ළමයි නන්නත්තාර වුණා. A/L විෂයන් හදාරන්න විද්‍යා අංශය ආදී එක එක අංශවලින් අවශ්‍ය දැනුම තිබෙන ගුරුවරු නැහැ කියා අපිටත් ඇවිත් කිව්වා. අන්තිමට ඒ ළමයින්ගෙන් ඇති හැකි අය ජාත්‍යන්තර පාසල්වලට ගියා. අනෙක් අය නැවත සිංහලෙන් කරන්න ගිහින් පටලැවිල්ලක් කර ගත්තා. ඒ නිසා මෙහෙම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරද්දී අවුරුදු 5, 10, 15, 20, 30, 40 ආදී වශයෙන් සැලැස්මක් ඕනෑ; ඉදිරි දැක්මක් ඕනෑ. නැත්නම් එච්චර දමනවා මෙච්චර දමනවා කියා කියන්නේ නැතුව පුළුල් වශයෙන් පියවරෙන් පියවර පර්යේෂණ කරන්න ඕනෑ කියා මා විශ්වාස කරනවා. අපේ විශ්වවිද්‍යාලවලට වර්ෂයකට 23,000ක් විතර ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ඇතුළත් වෙනවා. එයින් සියයට 51ක් විතර ගන්නේ කලා අංශයෙන්. ඉතුරු සියයට 49 ගන්නේ විද්‍යා, වාණිජ, ගණිත අංශවලින්.

දැන් මම දන්නා විධියට මේ රටේ තිබෙන තත්ත්වය අනුව විද්‍යා අංශයට අදාළවත් රැකියා නැහැ. එහෙම නැත්නම් විද්‍යාව හැදෑරූ අයටත් රුපියල් 10,000ක වැටුපක් ලැබෙන පත්වීම්වලට

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

ගුරුවරුන් වශයෙන් යන්න සිද්ධ වෙලා තිබෙනවා. සියයට 51ක් කලා උපාධිධාරීන් වශයෙන් බිහි වෙලා ඒ සියයට 51 එළියට ගියාම ඔවුන් මොකක්ද කරන්නේ? දැන් බලන්න, දෙයියනේ මේ වැය කරන්නේ රජයේ මුදල්නේ. කලා උපාධිධාරියෙක් වෙන්න පුළුවන්, වාණිජ උපාධිධාරියෙක් වෙන්න පුළුවන්, විද්‍යා උපාධිධාරියෙක් වෙන්න පුළුවන්, රජයක් වශයෙන් ඕනෑම රජයකට ඒ එක් අයෙක් වෙනුවෙන් විශාල මුදලක් වෙන් කරන්න සිද්ධ වෙනවා. පුස්තකාල පහසුකම් වෙනුවෙන්, එතකොට ශිෂ්‍යාධාර වෙනුවෙන්, ඒ වාගේම hostelsවලට, ඒ සියල්ලම ගත්තාම රුපියල් ලක්ෂ 10ක්, ලක්ෂ 15ක්, ලක්ෂ 20ක් එක් අයෙකු වෙනුවෙන් වෙන් කරන්න සිද්ධ වෙනවා. වෛද්‍ය සිසුවෙකුට නම් රුපියල් ලක්ෂ 25ක්, ලක්ෂ 30ක් වාගේ විවිධ ගණන්වලින් වෙන් කරන්න වෙනවා. හැබැයි අ.පො.ස.(උ.පෙළ)ට ඉස්සෙල්ලා භූගෝල විද්‍යා අංශයෙන් වෙන්න පුළුවන්, ආර්ථික විද්‍යා අංශයෙන් වෙන්න පුළුවන්, සමාජ විද්‍යා අංශයෙන් වෙන්න පුළුවන් මේ රටට අවශ්‍ය ප්‍රමාණය කොච්චරද කියලා අපි බලන්න ඕනෑ. ආර්ථික විද්‍යාඥයෝ කොච්චර ඕනෑද, Central Bank එකට කොච්චර ඕනෑද, පාසල්වල උගන්වන්න කොච්චර ඕනෑද, වෙනත් ආයතනවලට කොච්චර ඕනෑද, භූගෝල විද්‍යාඥයෝ කොච්චර ඕනෑද කියා බලන්න ඕනෑ. අපට තවම එවැනි තක්සේරුවක් නැහැ. ඊට පස්සේ මොකද වෙන්නේ? උපාධිය හදාරලා එළියට ගියාම කිසිසේත්ම හැදෑරුවේ නැති විෂයයක් තමයි ඔහුට රැකියාව වශයෙන් කරන්න වෙන්නේ. එක්කෝ පාසල්වලට ගිහින් උගන්වනවා. එහෙම නැත්නම් උපාධිය අරගෙන ගිහින් ගමේ කඩයක් දමා ගන්නවා. එහෙමත් නැත්නම් lathe machine එකක් ගන්නවා. උපාධියට අදාළ output එකක් නැහැ.

සිය දහස් ගණනක් දෙනා තමන් ඉගෙන ගත් විෂයයට, හැදෑරූ උපාධියට හාත් පසින්ම වෙනස් වූ දෙයක් තමයි ගම්වලට ගිහින් කරන්නේ. විශ්වවිද්‍යාලයට තෝරා ගන්න ඉස්සෙල්ලා මුලදීම අපට ඒ පිළිබඳව නිවැරදි තක්සේරුවකට එන්න පුළුවන් නම් හොඳයි. ඒ වාගේම "කලා විෂයයෙන් තේරුණාම රජයෙන් මෙච්චර වියදමක් -ලක්ෂ 15ක් වෙන්න පුළුවන්, ලක්ෂ 20ක් වෙන්න පුළුවන්- දරනවා" කියලා නිවැරදි තක්සේරුවකට එන්න පුළුවන් නම් හොඳයි. විශ්වවිද්‍යාලයට තේරුණත්, "මේ විෂයයෙන් උපාධිය හදාරලා ඒ මාර්ගයෙන් ඉදිරියට යන්න ඕනෑ" කියලා ඒ ශිෂ්‍යයා හිතනවා නම් අපි ඒ ශිෂ්‍යයාට ඒ අවස්ථාව දෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඉන්දියාවට යන්න, වෙන රටකට යන්න, පරිගණක විද්‍යාව ඉගෙන ගන්න බැංගලෝර්වලට යන්න ඒ ශිෂ්‍යයා කැමති නම්, voucher system එකකට හෝ මොකක් හරි ක්‍රමවේදයකට ඒ මුදල් ටික දුන්නොත් ඔහුට ගිහින් ඉගෙන ගෙන එන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙමත් නැත්නම් ඇත්තටම ඒ සල්ලි ටික දීලා business එකක් හරි පටන් ගන්න පුළුවන්. එතකොට රජයෙන් වියදම් කරන මුදල්වලට වටිනාකමක් ලැබෙනවා. එතකොට ඒ මුදල් රජයෙන් දුන්නත් කිසිම තේරුමක් නැති මුදලක් බවට පත් වෙන්නේ නැහැ. අන්න ඒ වාගේ මීට වඩා දීර්ඝ කාලීනව, මීට වඩා ගැඹුරින් හිතලා මේ පිළිබඳ දත්ත සකසන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්නකෝ අපේ තිබෙන යල් පැන ගිය අධ්‍යාපන පද්ධතියේ තිබෙන පාඨමාලා පිළිබඳව. පාසල්වල ගත්තත්, විශ්වවිද්‍යාලවල ගත්තත් එහෙමයි. අපි කොළඹ විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්න කොට මට මතකයි ඒ lecturersලාගේ -කථිකාචාර්යවරුන්ගේ- notes දිය වෙලා තිබුණා. දශක ගණනක් තිස්සේ එක්කෙනාගෙන් එක්කෙනාට එකම note එක - ඒ ටිකම - උගන්වනවා. ඒවා යාවත්කාලීන වෙන්නේ නැහැ. ගොඩක් විෂයයන් පිළිබඳව එහෙමයි. ඒ නිසා ඒ දේවල් කෙරෙහිත් අවධානය යොමු කරන්නය කියලා අපි කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම හොඳ කාර්ය භාරයක් කරන්න පුළුවන් ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාත් බොහොම නිර්මාණශීලීව බලන නිසා මේ බිහි කරන්න හදන තාක්ෂණික විෂය ධාරාවන් ඇති කිරීම පහසු වෙයි. මේ කටයුත්ත කරන්න අධ්‍යාපන ඇමතිතුමාටත් වුවමනාවක් තිබෙනවා. තමුන්නාන්සේලා ඔක්කෝම එකතු වෙලා මේ කාර්යය මීට වැඩිය යථාර්ථයක් බවට පත් කරන්න පුළුවන් විධියට කටයුතු කළොත් හොඳයි කියලා මම විශ්වාස කරනවා. මොකද, මම දැක්කා කවුරු හෝ කෙනෙක් කියනවා "අපට දැන් වාහන නිෂ්පාදනයත් පටන් ගන්න පුළුවන්" කියලා. මේ වාගේ කථාත් සමහර ඇමතිවරු කියනවා. මේවා විහිළුනේ. අපේ රටේ වාහනවලට තිබෙන market එක මොකක්ද? අපේ රටේ තිබෙන්නේ පුංචි market එකක්. වාහන නිෂ්පාදන තාක්ෂණය පුහුණු කරලා මේ වෙළෙඳ පොළට වාහන නිෂ්පාදනය කරලා කාට විකුණන්න පුළුවන් වෙයිද කියලා මම දන්නේ නැහැ. ඉන්දියාවයි, චීනයයි ඊට වඩා අඩු මුදලකට - අඩු පිරිවැයකට- වාහන නිෂ්පාදනය කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

මෙහේ නිෂ්පාදනය කරන්න පුළුවන් නම් ආනයනය කරන ඒවා නවත්වන්න පුළුවන්නේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මෙහේ කරන්න පුළුවන් කියලාද ඔබතුමා හිතන්නේ? ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා හිතන්නේ මෙහේ වාහන කර්මාන්තශාලාවක් දාලා අපට අපනයනය කරන්න පුළුවන් කියලාද? [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

තමුන්නාන්සේ හැමදාම පිට රටට සල්ලි යවන්නද කැමැති?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු අස්වර් මන්ත්‍රීතුමාට ඒ පිළිබඳව දැනුමක් නොතිබීම පිළිබඳව මම කනගාටු වෙනවා. මොකද, අපේ රටේ වාහන කර්මාන්තශාලාවක් හදලා මේ වාගේ පොඩි වෙළෙඳ පොළක් වෙනුවෙන් ඒක පවත්වාගෙන යන්න පුළුවන් වෙයිද කියලා මම නම් දන්නේ නැහැ. ඊට වැඩිය ඉන්දියාව, චීනය වාගේ රටවල් එක්ක තරගයක් දෙන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. ඔන්න ඔය වාගේ දේශපාලනඥයෝ ඔය වාගේ අදහස් දැක්වූවාම තමයි මේ රටේ සංවර්ධනයට බාධා ඇති වෙන්නේ. මොකද, හැම එකක් දිහාම බලන්නේ දේශපාලන කෝණයකින්. මට තේරෙන විධියට මම පැහැදිලිව කිව්වේ, මේ රට සංවර්ධනය කරා ළඟා කර ගන්න නම් අපි මීට වැඩිය ගැඹුරින් මේ ප්‍රශ්න ගැන සෙවිය යුතුයි කියන එකයි.

මොකද, රැකියා බිහි කිරීමේ වැඩ පිළිවෙළක් අපට නැහැ. අද අපේ රටේ ප්‍රධානම ආදායම් මාර්ගය වෙලා තිබෙන්නේ ගම්වල ඉන්න අහිංසක කාන්තාවන් මැද පෙරදිග ගිහින් දුක් විඳලා හම්බ කරන මුදල. ඒ මුදල්වලින් තමයි සමහර වෙලාවට මේ සෙල්ලම් දමන්නේ. එහෙම නැත්නම් වෙනත් විදේශීය රටවලට ගිහින් සීතලේ ගැහි ගැහී දුක් විඳලා තමයි අපේ අය මේ මුදල් උපයන්නේ. අපි යුරෝපයේ රටවලට ගියාම දැකලා තිබෙනවා ඒ වැඩ කරන අය සීතලේ වෙව්ලන හැටි. ඒ රටවලදී කරන්නේ

අමාරුම රස්සා. එහෙම වැඩ කරලා ටික කාලයක් ගියාම එක එක ලෙඩ හැදෙනවා. වැඩි කල් ජීවත් වන්නත් බැහැ. මේ රටේදී කරන්නේ නැති රස්සා ඒ රටවල්වලදී කරලා තමයි Euroවලින්, Dollarsවලින් ආදී එක එක විදේශ මුදල්වලින් මේ රටට ආදායම් අරගෙන එන්නේ. අපි ජාතියක් විධියට ඉස්සරහට යනවා නම්, දියුණු වනවා නම් ඉතාම සැලසුම් සහගතව ගමන් කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා. මා මේ ඔවුන්ගේ සේවය අගයමින් කථා කරන්නේ. අපි ඒවා විවේචනය කරනවා නොවෙයි. අපි ඔවුන්ගේ සේවය බොහොම අගය කරන අතර ඒ අය ගැන තව ටිකක් හිතන්න කියලායි කියන්නේ.

තව කරුණක් තිබෙනවා ගරු ඇමතිතුමනි. අපේ මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමාත් දැන් ගරු සභාවේ ඉන්නවා. මේ ප්‍රශ්නය එතුමාගේ පාසල්වල නැහැ. දැන් බලන්න, හතු පිපෙන්නා වාගේ ජාත්‍යන්තර පාසල් බිහි වනවා; පෞද්ගලික විශ්වවිද්‍යාල ඇති වනවා. හැබැයි, අපේ අධ්‍යාපන අමාත්‍යාංශයට තවමත් බැරි වුණා ඒවාට බලපත්‍රයක් දෙන තත්ත්වයක් ඇති කරන්න. සමහර පාසල්වල ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වූවාට එහි ගුණාත්මකභාවය ඉතාම අඩුයි. Ordinary Level විභාගයවත් සමත් නැති ගුරුවරු ඒවායේ ඉන්නවා. ඉංග්‍රීසි පොඩ්ඩක් දැන ගත්තාම ඒ අයට දෙනවා උගන්වන්න. මා මීට පෙරත් කියා තිබෙනවා මේ කාරණය. මාත් එක්ක ඉගෙන ගත්ත සහෝදරියක් හිටියා. ඇයට උපාධියක් තිබෙනවා, ඉංග්‍රීසි මාධ්‍යයෙන්. ඇය එක්තරා ජාත්‍යන්තර පාසලකට උගන්වන්න ගියා. ඒ පාසලේ නම කියන්න හොඳ නැහැ. ගරු ග්‍රේරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ජාත්‍යන්තර පාසලක නොවෙයි. උගන්වන්න ගියාම කිව්වාලු, විද්‍යාව උගන්වන්න කියලා. ඇය කිව්වාලු, "මම කළේ විද්‍යාව නොවෙයි. මම English Literature කළේ. මට විද්‍යාව උගන්වන්න දැනුමක් නැහැ" කියලා. එතකොට කිව්වාලු, "පොත තිබෙනවා, ඒ අනුව උගන්වන්න" කියලා. මේක සත්‍ය කථාවක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඒ නිසා, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඒ සියලුම ජාත්‍යන්තර පාසල් අධීක්ෂණය කරන්න. ඔබතුමාට ඒ ගැන ලොකු වග කීමක් තිබෙනවා. ඒ ගැන සොයන්න Committee එකක් පත් කරන්න. ඒ පාසල්වල ඉන්න ගුරුවරු කවුද, ඒ ගුරුවරුන්ගේ සුදුසුකම් මොනවාද, ඒ පාසල්වල උගන්වන විෂය ධාරා මොනවාද, ඒ පාසල්වල විෂය ධාරාවට අපේ ආගම, අපේ සදාචාරාත්මක කරුණුවලට අදාළ පාඩම් ඇතුළු කරලා තිබෙනවාද කියලා අධීක්ෂණය කරන්න. ඒ සියල්ලම ගැන හිතලා ඒවා පිළිබඳව අධීක්ණයක් කරන්න ඒ ජාත්‍යන්තර පාසල්වල ප්‍රශ්න තිබෙන නිසායි මම මෙහෙම කියන්නේ.

මට ගොඩක් දේවල් කියන්න තිබුණත් වෙලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් මා අධ්‍යාපන ඇමතිතුමාට නැවත මේ කාරණය කියනවා. වයඹ පළාත් සභා මැතිවරණයත් එනවා. වයඹ පළාත් සභාවේ සිටින අධ්‍යාපන ඇමතිවරයාත්, මහ ඇමතිවරයාත් දෙදෙනාම එක්කෙනෙක්. අද ඒ පාසල් පද්ධතිය ඉතාම නරක විධියට විනාශ කරලායි තිබෙන්නේ. කොටින්ම කියනවා නම්, පත්වීම් දෙන්නේ විවිධ වර්ගයේ අල්ලස් අරගෙන. මාරු වීම් දෙන්නේ, විදුහල්පතිනියන් පත් කරන්නේ විවිධ මාර්ගවලින්. වෙන පළාත් සභාවල සිදු නොවන මට්ටමින් මහ ඇමතිවරයා ඇතුළු අදාළ පුද්ගලයන් ඒ වයඹ පළාත් සභාවේ පාසල් පද්ධතිය විනාශ කරමින් යනවා.

ඒ විතරක් නොවෙයි. අපි පසු ගිය කාලයේ තවත් සිදු වීමක් දැක්කා. අපි වෙනදා කියන්නේ, මුළු ජාතියම ගුරුවරුන්ට දණ නමස්කාර කරනවා කියලායි. දැන් අට පාස් නැති දේශපාලනඥයන් ඉදිරියේ දණ නමස්කාර කරන්න වෙලා තිබෙන්නේ ගුරුවරුන්ටයි. අද ඒ තැනට පිරිහිලා. ඒ පිරිහීම පිළිබඳව ගැඹුරට හිතලා ඒ සම්බන්ධයෙන් තීරණ ගන්න කියලා මා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
*Bismillahir Rahmanir Raheem.*

Hon. Presiding Member, two Ministers who have geared themselves to mobilize the students and youths of this country to create a new world order for them, are brought into focus today by this Adjournment Motion by my young Friend, the Hon. Eric Prasanna Weerawardhana.

Sir, a large group of individuals who are unable to obtain the opportunity to enter the university after sitting for the competitive GCE (Advanced Level) Examination join the society every year. When we travel in the European countries and even the United States, we find there is nothing called "People who are sent out of the schools". They are sometimes termed as "dropouts", and various institutions are opened for them in order to advance their different aptitude and engage them in various vocations. Most of the youths who have read for their degrees under the Art stream have to face difficulties when finding employments. What the Hon. Weerawardhana proposes is exactly what the advanced countries are doing. We are trying to create such a society in this country. A stream of technical subjects is due to be introduced to schools by the Ministry of Higher Education, the Ministry of Education and the Ministry of Youth Affairs and Skills Development in order to control the situation.

Therefore, it is moved in this august Assembly that people must be made known of the facts and the inherent value of this new revolutionary change in education in this country.

His Excellency the President quite rightly said the other day, "දක්ෂ ශිෂ්‍යයන්, අදක්ෂ ශිෂ්‍යයන් කියලා මේ රටේ කවුරුවත් නැහැ." The concept that there are clever students and non-clever or weak students cannot be accepted in this country. His Excellency the President has quite rightly emphasized this. In his "Mahinda Chintana" - this is the Magna Carta of this Government - mention has been made on every field of activity in detail what the Government proposes to do, what the real intention of

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

"Mahinda Chintana" is.

Page 68 of the "Mahinda Chintana" states, I quote:

"Priority for Youth

In recent history we have witnessed several incidents of the violent destruction of our energetic youth. This is the reason why I decided to allocate more space for young people in the Mahinda Chintana."

Also, on page 75 of the "Mahinda Chintana" it states, I quote:

"University education for knowledge

....I believe it is necessary to create a new educational framework that will provide liberal thinking, broad dialogue and opportunities for entertainment instead of the present system that confines the undergraduate to lectures, assignments and examinations."

There are three Ministers, the Hon. Bandula Gunawardane, the Hon. Dullas Alahapperuma and the Hon. S.B. Dissanayake, to carry forward these laudable intentions of His Excellency the President. They are all working ceaselessly day and night adding much weight and importance to the Mahinda Rajapaksa regime. They are the Ministers who could be marketed to other parts of the country saying, "Look! Because of these Ministers the youth of this country, the school-going population of this country and generally the educational setup are made very vibrant and strong.

Sir, look at the Minister of Youth Affairs. What a novel scheme he has introduced! For instance, take the Youth Parliament. Take note of it, which we could not find in so many other parts of the world. There are 332 Members in that Parliament. "Catch them young", as it is called. They are given training in good governance, in administration, in public speaking which would serve them as a ladder to come into the mainstream of politics through this main Legislature later.

In that Youth Parliament, there are 332 Members. In the Senate, there are 50 Members and all communities are represented. Earlier in the First Youth Parliament, there was a Deputy Prime Minister. She was from Thunukkai in the North. She was made Deputy Prime Minister of that Youth Parliament. Who was she? She was the sister of a very strong LTTE cadre. She reformed herself. Today, in the present Youth Parliament, the Deputy Prime Minister is a Tamil. There are two Muslim Ministers. I think, this must be told to India, to Jayalalithaa Jayaram and to M. Karunanidhi as well.

See what happened this afternoon at Temple trees. More than 15,000 people including LTTE cadres who have been rehabilitated are being looked after by the Ministry of Rehabilitation and Prison Reforms. The Hon. Chandrasiri Gajadeera, Minister of Rehabilitation and Prison Reforms introduced that scheme. The President gave compensation to LTTE cadres who have lost their limbs; lost their lives; lost their belongings and everything. Where is LTTE women's political wing leader, Thamilini today? She is now a reformed, civilized lady, in the civilized Sri Lankan society. Who made this transformation? Is it not our President His Excellency Mahinda Rajapaksa under the "Mahinda Chintana?" Like her, there are thousands of people who have been transformed today. I spoke to Mr. Shathish Kumar, Senior Consultant of the Ministry of Rehabilitation and Prison Reforms, a clever officer that he is, gave me detailed information. Now, this is the way that this Government is moving forward, Sir.

A news item appeared in the "Daily News" of 21st June, 2013 states, I quote:

"A technology stream was introduced to the Advanced Level curriculum by the President. The President added aesthetic subjects and other subjects as well, play a pivotal role in moulding young minds."

This is what the three Ministers are proposing to do and are trying to achieve for the good of the future generation of our country.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Okay, Sir. It further states, I quote:

"Each year, around 350,000 students sit the Advanced Level examination and out of them 25,000 qualify to enter universities. Around 300,000 youths, who sit the examination following the four streams enter ……."

I wish all three Ministers good luck and Godspeed so that we will have a peaceful Sri Lanka with flowering youthfulness all around us.

Thank you.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම ගරු ඇමතිතුමාටත් ස්තුතිවන්ත වනවා, මේ රටේ අධ්‍යාපනය කඩා වැටිලා තිබෙනවාය කියලා දැනගෙන, ඊට පිළිතුරක් දෙන්න ඕනෑ කියා හිතලා තාක්ෂණවේදය විෂයය ධාරාව පාසල් අධ්‍යාපන පද්ධතියට එකතු කිරීමට කටයුතු කිරීම පිළිබඳව.

අනිවාර්යයෙන්ම, අධ්‍යාපන ක්‍රමය මේ තිබෙන විධියට කරගෙන ගියොත්, අපට මේක කරන්න වෙන්නේ නැහැයි කියලා පැහැදිලිව පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තිබෙන පහසුකම් එක්ක මේ කාර්යය කරන්න බැහැ. වර්තමානය දිහා බැලුවාම පෙනෙනවා, දැනට Advanced Level අධ්‍යාපනය පාසල්වල අසාර්ථක වෙලා තිබෙන බව. ගරු ඇමතිතුමන්ලා, විවිධ දේශපාලනඥයෝ සඳහන් කරනවා, පහේ ශිෂ්‍යත්ව විභාගයෙන් මෙපමණ සිසුන් සංඛ්‍යාවක් pass වෙලා තිබෙනවාය, Advanced Level විභාගයෙන් මෙපමණ සිසුන් සංඛ්‍යාවක් pass වෙලා තිබෙනවාය, Ordinary Level විභාගයෙන් මෙපමණ සිසුන් සංඛ්‍යාවක් pass වෙලා තිබෙනවාය කියලා. නමුත් මොවුන් මේ විභාග pass වෙලා තිබෙන්නේ ඉස්කෝලේ ගිහිල්ලාද, නැත්නම් tuition පන්ති ගිහිල්ලාද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. අප මොන දේ කළත් මේ තිබෙන පහසුකම් යටතේ අධ්‍යාපනය නංවන්න බැහැ. මේ තිබෙන පාසල් පද්ධතිය යටතේ නිදහස් අධ්‍යාපනයක් ජනතාවට දීලා නැහැ. වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බිහි වන්නේ උගත් මිනිස්සු නොව, දැනුම තිබෙන මිනිස්සුය කියලා අප දන්නවා. උගත් මිනිහෙකු බිහි වෙන්න නම්, දැනුම, කුසලතා, ආකල්ප කියන මේ කාරණා තුනම එකතු වෙන්න ඕනෑ. නමුත් මේ පාසල් හිහය තුළ හයේ පන්තියේ අධ්‍යාපනය කරන්න ඉස්කෝල නැහැ. ඒ නිසා ශිෂ්‍යත්වය pass වෙන්නම ඕනෑ වෙලා තිබෙනවා. ඒ නිසා පළමුවැනි ශ්‍රේණියේ ඉඳලාම අම්මලා චූටි දූවලා, පුතාලා tuition පන්ති ඇදගෙන යන කාලයක් උදා වෙලා තිබෙනවා. එයින් විභාග pass කිරීම මිසක් උගත් පුද්ගලයෙකු බිහි වෙන්න තිබෙන ඉඩකඩ, අවස්ථා අඩු වෙලා යනවා. ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මන්ත්‍රීතුමා ඒ ගැන ප්‍රශ්න කළා. දැනටත් ඒ සඳහා ළමයින් බඳවාගෙන අවසානයි. මේ මාසයේ 15 වැනිදා වන කොට මේ තාක්ෂණ විෂයය පාසල්වල උගන්වන්න පටන් ගනීවි. සමහර විට ඇමතිවරු එයි; මල් මාලා දමයි; නටයි; බෙර ගහයි; පත්තරවල යයි; TVවල යයි, අලුත් දෙයක් පටන් ගත්තා කියලා. මේ අලුත් දේ පටන් ගන්න සද්ද දාලා කෑ ගැහුවත් තව වන තුරු මේ සඳහා පුහුණු ගුරුවරු බඳවාගෙන නැහැ. නමුත් කියනවා, විශ්වවිද්‍යාලයෙන් තාක්ෂණ විෂයය සඳහා පුහුණු ගුරුවරු ගන්නවාය කියලා. එහෙම නැත්නම් කියනවා, Technical Collegeවලින් ගන්නවා කියලා.

අප දන්නවා, ඒ Technical Collegeවලත්, විශ්වවිද්‍යාලවලත් මේ තාක්ෂණ විෂයය උගන්වන ආචාර්යවරුන් -lecturers- හිඟ බව. ඒ විතරක් නොවෙයි, ඒ අය පඩි මදියි කියලා එක පැත්තකින් කෑ ගහන කොට මේ දෙන දීමනාව තුළ ඒ ගොල්ලන් උගන්වන්න ගම්වලට එයිද? ආණ්ඩුව ඇයි මෙහෙම සැලසුම් නැතිව මේ විෂයය ධාරාව උගන්වන්න පටන් ගන්නේ? අනිවාර්යයෙන්ම මේක කෙරෙන්න ඕනෑ දෙයක්. මේක අප හෙළා දකින්නේ නැහැ. මොකද තාක්ෂණ විෂයය ධාරාව අධ්‍යාපනයට එකතු කරපු එක ලොකු දෙයක්. නමුත් අපට තිබෙන ප්‍රශ්නය තමයි, ආණ්ඩුව මේ කටයුත්ත පටන් ගන්නේ යම් ක්‍රමවේදයක් ඇතිවද, එහෙම නැත්නම් කරන්නන් වාලේ මේ කටයුත්ත කරනවාද කියන කාරණය. නුදුරු අනාගතයේදී මේ විෂයය පාසල්වල උගන්වන්න පටන් ගන්නවා නම් මේ දරුවන්ට ඇවිල්ලා අධ්‍යාපන කටයුතු කරන්න තාක්ෂණ විද්‍යාගාර පාසල්වල තිබෙන්න ඕනෑ. මේවා හදලා අවසානද? අඩු ගණනේ මේවාට සැලැස්මවල් තිබෙනවාද? සැලැස්මවල් තිබිලා බැහැ. තාක්ෂණ විෂයය ධාරාව පාසල්වල උගන්වන්න පටන් ගන්නවා නම් දැන් ඒ තාක්ෂණ විද්‍යාගාර පාසල් තුළ හැදිලා තිබෙන්න ඕනෑ. රජය ගුරුවරු බඳවාගෙන තිබෙන්න ඕනෑ. පුහුණු ගුරුවරු ඇති කරලා තිබෙන්න ඕනෑ. නමුත් එහෙම පිළිගත හැකි සැලැස්මක් ඉදිරිපත් වෙලා නැහැ. අනිවාර්යයෙන්ම තාක්ෂණ විෂයය ධාරාව පාසල් පද්ධතියට එකතු කරන එක හොඳයි. නමුත් මේ ආණ්ඩුව කරන්න ගිය දේවල් ඔක්කොම මහ දී ඇන ගත්තා. GCE (A/L) විභාගය කරන්න ගියාම ප්‍රශ්න පත්‍ර පිට වුණා. GCE (O/L) විභාගයේ ප්‍රශ්න පත්‍ර පිට වුණා. පහේ ශිෂ්‍යත්වය විභාගය කර ගන්නත් බැරි වුණා; ප්‍රශ්න පත්‍ර පිට වුණා. අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. දරුවන් අතරමං නොකර මේ තාක්ෂණ විෂයය ධාරාව නිවැරදිව ඉදිරියට පවත්වාගෙන යන්න පුළුවන්ද? ඒක මේ ආණ්ඩුව කරන වැඩ පිළිවෙළ දිහා බැලුවාම පෙනෙනවා.

අප දන්නවා, "ඉසුරු පාසල්" කියලා පාසල් පද්ධතියක් පටන් ගත්ත බව. නමුත් ඒ ඉසුරු පාසල් සාර්ථකද? ඉසුරු පාසල් දැන් සපිරි පාසල් දාහට එකතු වෙලා. Advanced Level පන්තියේදී Physics විෂයය උගන්වපු මගේ ගුරුතුමා -මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමා- මේ සපිරි පාසල් ටික ශක්තිමත් කරන්න කියලා අපේ පක්ෂයෙන් මාරු වෙලා ආණ්ඩුව පැත්තට ගියා. නමුත් එතුමාත් හෘදය සාක්ෂියට එකඟව හිතනවා ඇති, අද එතුමාගේ කාර්ය භාරය හරියට ඉෂ්ට කරන්න පුළුවන් වුණාද කියලා. එතුමා ලොකු බලාපොරොත්තුවකින් තමයි අපේ පක්ෂයේ ඉඳලා ආණ්ඩුව පැත්තට ගියේ. ඒ ගියේ සපිරි පාසල් ටික ශක්තිමත් කරන්නයි. නමුත් ඒ වැඩේ කරන්න පුළුවන් වුණාද? අද අප දකිනවා, IT ගුරුවරුවත් මේ සපිරි පාසල් දාහට සොයා ගන්න විධියක් නැතිව ඉන්නවා. ගුරුවරු බඳවා ගෙන නැහැ. IT ගුරුවරු ටික සපිරි පාසල්වලට හොයා ගන්න බැරිව තිබියදී මේ තාක්ෂණ විෂයය උගන්වන්න ගුරුවරුන් විශ්වවිද්‍යාලවලින් ඒවිද? IT කරපු අය ලංකාවේ ඕනෑ තරම් හිටියත් මේ ගෙවන පඩියට එන්න කැමැත්තක් දක්වන අය අඩුයි.

සමහර ඉස්කෝල තිබෙනවා, IT ගුරුවරයෙක්, ඉංග්‍රීසි ගුරුවරයෙක් හොයා ගන්න නැහැ. සපිරි පාසල්වල ගොඩනැඟිලි හදාගෙන යන එකත් යන්නේ ඉබි ගමනින්. කිව්ව වේගයෙන් ඒවා ඉදි වෙන්නේ නැහැ. කිව්වේ, "චීනයෙන් ආධාර හම්බ වෙනවා, නැත්නම් තව කොහෙන් හරි ආධාර හම්බ වෙනවා, ඒ ආධාරවලින් මේ තෝරා ගත්තු පාසල්වල භෞතික පද්ධතිය දියුණු කරනවා, ඒ වාගේම මානව සම්පත දියුණු කරනවා" කියලායි. නමුත් ඒක සාර්ථකභාවයට පත් වෙලා තිබෙන බවක් අපට පෙනෙන්නේ නැහැ. බොහොම ඉබි ගමිනින් යන ගමනකුයි පෙනෙන්නේ. ඒක තමයි අපට සැකයක් තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි. "දිවි නැගුම" වැඩසටහන පටන් ගත්තා. ඇට බෙදන්න පටන් ගත්තා. ඒ ඇට පැළ වෙන්නේ නැහැ. පොහොර සහනාධාරය දෙන්න පටන් ගත්තා. අද බෙහෙතකටවත් පොහොර ටිකක් හොයා ගන්න බැරි තත්ත්වයට රට පත් වෙලා. ගුවන් තොටුපොළවල් හදන්න පටන් ගත්තා. වරායවල් හදන්න පටන් ගත්තා. නමුත් මේවායින් සාර්ථක ප්‍රතිඵල ලැබෙන බවක් පෙනෙන්නේ නැහැ. රටේ සල්ලි නාස්ති වුණු එක විතරයි වුණේ.

2013 ජූලි මාසයේ තාක්ෂණ විෂය ධාරාව පාසල්වල පටන් ගන්නවා. 2016 වෙන කොට විශ්වවිද්‍යාලවල හරි, කාර්මික විද්‍යාලවල හරි මේ දරුවන්ට ඒ තාක්ෂණය විෂය වැඩි දුර ඉගෙන ගන්න අවශ්‍ය පහසුකම් හරිගස්සලා තිබෙන්න ඕනෑ . 2020 වෙන කොට මේ අය තාක්ෂණික අධ්‍යාපනයක් ලබාගෙන උපාධියක් හෝ ඩිප්ලෝමාවක් හෝ අරගෙන සමාජගත වෙනවා. මේ අයට සුදුසු වැඩ පිළිවෙළක් නිර්මාණය කරලා තිබෙනවාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. අපි දන්නවා, මේ රජය ගෙන යන්නේ "එදා වේල ටුවර්ස්" වැඩ පිළිවෙළක් කියලා. ඒ වෙලාවට තමයි පිළිතුරු හොයන්නේ. ඉතින් ඒක මේකට හරි යන්නේ නැහැ. "එදා වේල ටුවර්ස්" යන ආණ්ඩුවක් වුණත් අද මේ තිබෙන ප්‍රශ්නයට උත්තර දෙන්න ඕනෑ. මේ විෂය උගන්වන්න පුහුණු ගුරුවරු අධ්‍යාපන අමාත්‍යාංශය සතුව ඉන්නවාද? අදාළ තාක්ෂණ විෂය පටන් ගන්න කොට ඒ අයට අදාළ පරීක්ෂණ කරන්න අදාළ පාසල් පද්ධතිය තුළ විද්‍යාගාර හදලා තිබෙනවාද? "එදා වේල ටුවර්ස්" යන ආණ්ඩුවක් වුණත් අඩු ගණනේ ඔය ටිකවත් සම්පූර්ණ කරන්න ඕනෑ. අපට සමහර අයගේ කථාවලින් ඇහුණා, මේකෙන් ලෝකයේ රැකියා වෙළෙඳ පොළට තරුණයන් බිහි වෙනවා, ලෝකයේ රැකියා වෙළෙඳ පොළට යන්න පුළුවන් පුද්ගලයන් බිහි වෙනවා කියලා.

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගුරුවරයාට ගුරු වෘත්තිය සඳහා විදේශ රැකියා තිබෙනවා. ඕස්ට්‍රේලියාවේ ලංකාවේ සල්ලිවලින් රුපියල් ලක්ෂ 8ක් ගෙවන රක්ෂා තිබෙනවා. නමුත් අපේ ගුරුවරයා ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල වන ගුරුවරයකු කරන්නට තවම රජය සමත් වෙලා නැහැ. ගුරු විද්‍යාල තිබුණාට, විද්‍යා පීඨ තිබුණාට එහෙම නැත්නම් ජාතික අධ්‍යාපන ආයතන තිබුණාට මේවායින් ජාත්‍යන්තර ප්‍රමිතියේ ඉන්න පුද්ගලයෙකු - ගුරුවරයෙකු- පුහුණු කරන්නට රජය සමත් වෙලා නැහැ. ඒ නිසා අපේ අධ්‍යාපනය ජාත්‍යන්තර ප්‍රමිති මට්ටමට ගිහිල්ලා නැහැ.

විදේශ රැකියාවලට අපේ ශ්‍රමිකයන් යවන්න එහෙම නැත්නම් අපේ උගත් පිරිස විදේශ රැකියාවලට යවන්න මේ තාක්ෂණික විෂයම පටන් ගන්න ඕනෑ නැහැ. ජාත්‍යන්තර මට්ටමට ගැළපෙන්න හෙදිය හරියට පුහුණු කරන්න පහසුකම් තිබුණා නම්, හරියට පුහුණු කළා නම්, ජාත්‍යන්තර මට්මට ගැළපෙන්න පාසලේ ගුරුවරයා පුහුණු කළා නම් අපට විදේශ රැකියාව කියන එක ලොකු ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඒ අවස්ථා තිබෙනවා. නමුත් මේකෙන් ඒකට උත්තර හොයන්න හම්බ වෙන්නේ නැහැ. අපි දන්නවා, මේක කොහොමත් කරන්න ලෙහෙසි නැහැය කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තවත් සැකයක් තිබෙනවා. නූගත් දේශපාලනඥයා උගත් ගුරුවරයා දණ ගස්වද්දී මෙවැනි සමාජ පෙරළියක් අධ්‍යාපනය තුළින් කරන්න පුළුවන් දේශපාලන වාතාවරණයක් මේ රටේ තිබෙනවාද කියලා විශේෂයෙන්ම හිතන්න වෙලා තිබෙනවා. මේවා ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියලා හිතන්න වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට තේරෙනවා, අධ්‍යාපනය කඩාගෙන වැටිලා තිබෙන බව. ඒක රජය දන්නවා. මේ සඳහා යම් වැඩ පිළිවෙළක් කරන්න ඕනෑය කියලා රජය පිළිඅරගෙන තිබෙනවා. ආණ්ඩුව දන්නවා, රටේ නිදහස් අධ්‍යාපනය දැන් අවුල් ජාලාවක් වෙලා තිබෙනවා කියලා. හැබැයි ඒකෙන් ආණ්ඩුව ලිස්සන්න හදනවා. ඒකට ප්ලාස්ටර් අලවන්න හදනවා. එහෙම කරලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ.

අධ්‍යාපනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු විශේෂ උපදේශක කාරක සභාවක් 2010 දී පත් කළා. මේ නිදහස් අධ්‍යාපනය රැකගෙන, අධ්‍යාපනය නිවැරදි කරන්න ඕනෑය කියන අදහස තුළ ඉඳලා තමයි 2010 වර්ෂයේදී පාර්ලිමේන්තු විශේෂ උපදේශක කාරක සභාව පත් කළේ. නමුත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය කරන්න යෝජනා ලබා ගෙන කෙටුම්පත් හදලා ඉවරයි. අඩු ගණනේ මේවා පාර්ලිමේන්තුවටවත් ගෙනෙන්න බැරි තත්ත්වයක් තවම උදා වෙලා තිබෙනවා. තවම මේවා පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සාකච්ඡා කරන්න පටන් අරගෙන නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තාක්ෂණික විෂය නැවත පටන් අරගෙන තිබෙන එක හොඳ වැඩක්. ඒකේ වචන දෙකක් නැහැ. තාක්ෂණ විද්‍යාව පාසල් අධ්‍යාපනයේ පටන් අරගෙන ඒක ඉස්සරහට අරගෙන යන්න ඕනෑ. මොකද අපට ඕනෑ වෙන්නේ එහෙම සමාජයක් නිසා. විභාග pass කරපු සමාජයක් විතරක් අපට ඕනෑ නැහැ. අපට ඕනෑ උගත් මිනිස්සු. අපට නවලෝක මුදලාලි වාගේ මිනිස්සු හැදුණොත් ඇති. විභාග pass කරපු වෛද්‍යවරුන්ට ලංකාවේ පළමුවැනි පෞද්ගලික ඉස්පිරිතාලය හදන්න බැරි වුණා. නමුත් නවලෝක මුදලාලි වෛද්‍ය විද්‍යා විභාගය pass නොකළත් ඉස්පිරිතාලයක් නිර්මාණය කළා. අන්න ඒ වාගේ පුද්ගලයෝ අපට ඕනෑ.

මේ තාක්ෂණ විෂය හැදෑරීමට අවශ්‍ය වාතාවරණය නිර්මාණය නොකර, අවශ්‍ය ගුරුවරු පුහුණු නොකර, අවශ්‍ය තාක්ෂණික විද්‍යාගාර හදන්නේ නැතුව මේක පටන් ගත්තාට වැඩක් නැහැ. එහෙම නොකළොත් අන්තිමට සිදු වන්නේ මේ තාක්ෂණික පාඨ මාලාවත් tuition පන්තිවලට භාර දෙන්නයි. එහෙම වුණොත් tuition පන්තිවලින් ළමයි හදන ව්‍යාපාරයක් තමයි නිර්මාණය වෙන්නේ. තවම අධ්‍යාපන අමාත්‍යාංශය මේ සඳහා සියයට සියයක් ලෑස්ති වෙලා නැහැ. ගරු අධ්‍යාපන ඇමතිවරයා උගත් ඇමතිවරයෙක්. එතුමාට වැඩ කරන්න පුළුවන්. එතුමාට මේ සම්බන්ධයෙන් ඕනෑකම ඇති. මේ වැඩ කරන්න නම්, අය වැයෙන් සියයට හයක මුදලක් අධ්‍යාපනයට වෙන් කරන්න අවශ්‍ය බවයි උගතුන් ප්‍රකාශ කළේ. නැතිව මේ කියන දේවල් කරන්න බැහැ. අය වැයෙන් සියයට හයක මුදලක් අධ්‍යාපනයට වෙන් කරන්නේ නැතිව තාක්ෂණය හදන්න බැහැ; ගුරුවරු පුහුණු කරන්න බැහැ. ගරු ඇමතිවරු කොපමණ දැඟලුවත් එහෙම කරන්නේ නැතිව මේවා ක්‍රියාත්මක කරන්න බැහැ. මේ තත්ත්වය යටතේ ඒ දේවල් ක්‍රියාත්මක කළොත් එය අසාර්ථක වනවා.

ඒ නිසා මම විශේෂයෙන්ම අවධාරණය කරනවා, මේ ළමයි ටික අරගෙන ගිහිල්ලා අතර මං කරන්න එපා; මේ අහිංසක ළමයින්ගේ බලාපොරොත්තු අතර මං කරන්න එපා; මේ අහිංසක දෙමව්පියන්ගේ බලාපොරොත්තු අතර මං කරන්න එපා; මේවා පටන් අරගෙන tuition පන්තිවලට භාර දෙන්න එපා කියලා. මොකද අද දෙමව්පියන්ට වැඩිම මුදලක් වියදම් වන්නේ දරුවන්ට උගන්වන්නටයි. Tuition පන්තිවලට මුදල් දෙන්න ඕනෑ; වෑන්වලට මුදල් දෙන්න ඕනෑ. මේ වැඩ පිළිවෙළ තුළිනුත් එහෙම වෙන්න ඉඩ තියන්න එපාය කියලා ඉල්ලමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා (යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும - இளைஞர் அலுவல்கள், திறன் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dullas Alahapperuma - Minister of Youth Affairs and Skills Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැදගත් ඓතිහාසික හැරවුම් ලකුණ පිළිබඳව මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ අවධානය යොමු කිරීම පිළිබඳවත්; ඒ හරහා මේ සම්බන්ධයෙන් රටේ ජනතාවට යම් ප්‍රමාණයකින් හෝ කරුණු ඉදිරිපත් කරන්න අපට අවස්ථාව සලසා දීම පිළිබඳවත් අපේ තරුණ, ජව සම්පන්න මන්ත්‍රීතුමෙකු වන එරික් ප්‍රසන්න වීරවර්ධන මැතිතුමාට මම පළමුවෙන්ම ස්තුතිවන්ත වනවා. ඒ වාගේම විවේචනාත්මක වූ නමුත් ධනාත්මකව මේ විවාදයට සම්බන්ධ වෙලා තමන්ගේ විවාදය ආයෝජනයක් විධියට පාවිච්චි කරන්න උත්සාහ ගැනීම පිළිබඳව විපක්ෂය වෙනුවෙන් මේ විවාදයේ ආරම්භක කථිකයා විධියට ඉදිරිපත් වුණු අකිල විරාජ් කාරියවසම් මැතිතුමාටත් මගේ ස්තුතිය ලෝභ නැතිව ප්‍රදානය කරන්න ඕනෑ. මොකද දේශපාලන ගොහොරුවල ලැගලා ජාතික ප්‍රශ්න දිහා බලන්න උත්සාහ ගන්න අවස්ථා සමහර වෙලාවට අපි දකිනවා. ඒ වාගේම අපට ඒ සම්බන්ධයෙන් අත් දැකීම් ද තිබෙනවා. එතැනින් මිදීම පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කරපු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු සමහර කාරණා පිළිබඳව සිතා බැලුවාම, බන්දුල ගුණවර්ධන ඇමතිතුමාත්, අප සියලු දෙනා අතිනුත් යම් කිසි අඩු පාඩුවක් වුණාද කියලා මම කනගාටු වුණා. මොකද මේ වැඩ පිළිවෙළ පිළිබඳව; මෙහි තිබෙන සැලසුම් සහගතභාවය පිළිබඳව; අනාගත ඉලක්ක පිළිබඳව මීට කලින් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීතුමන්ලා දැනුවත් කිරීමට අපට අවස්ථාවක් නොලැබුණු නිසා. නමුත් එතුමා මතු කරපු සමහර කාරණා මම මුළුමනින්ම ප්‍රතික්ෂේප කරනවා. මෙය සැලසුම් සහගතයි. මෙහි වැඩ පිළිවෙළක් තිබෙනවා. මෙහි විධිමත්භාවයක් තිබෙනවා. මෙය ඉලක්ක හඹා ගෙන යනවා. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා හොඳ ගුරුවරයෙක්. ගරු මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමා කියන්නේ ඔබතුමා කිව්ව විධියට ඔබතුමාගේ වාගේම භෞතික විද්‍යාව පිළිබඳ මගේත් ගුරුවරයා. ඒ නිසා ඒ දෙපළ කථා කරන කාල සීමාව තුළ මේ ගැන යම් දැනුවත් කිරීමක් කරන්න උත්සාහ ගනීවි කියලා මා හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මගේ විනාඩි 15 ඇතුළේ ඒ කොටස් ස්පර්ශ කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන විෂය භාර ඇමතිවරයා විධියට මම අතිගරු ජනාධිපතිතුමාට මේ රාජ්‍යයේ දරුවන් වෙනුවෙන් කෘතවේදීත්වය ප්‍රකාශ කරන්න මේ අවස්ථාව පාවිච්චි කරන්න කැමැතියි. ඇයි මම එහෙම කියන්නේ? මම එතුමා සභාපතිත්වය දරන පක්ෂයේ භාණ්ඩාගාරික නිසාවෙන් හෝ එතුමාගේ කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෙක් නිසාවෙන් හෝ නොව, පියෙක් විධියට එතුමා තමයි මේ තාක්ෂණ විෂය ධාරාව ශ්‍රී ලාංකීය අධ්‍යාපන සැලැස්ම ඇතුළට ගෙනෙන්න කියන තෙරපීම කළේ; බල කිරීම කළේ. 1994 කාලයේ පැවැති ආණ්ඩුවේ කම්කරු හා වෘත්තීය පුහුණු ඇමතිවරයා විධියට පළමුවැනි වතාවට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත ඉදිරිපත් කරලා නගර කේන්ද්‍රීයව තිබුණු කාර්මික අධ්‍යාපනය ගමට ගෙන යන්න වෘත්තීය පුහුණු අධිකාරිය ආරම්භ කිරීම පමණක් නොවෙයි, මේ රටේ වෘත්තීය අධ්‍යාපනයේ තීරණාත්මක ලක්ෂ්‍යයන් කීපයක්ම නිර්මාණය කළේ එතුමායි. ජාතික වෘත්තීය සුදුසුකම - NVQ - සහ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය - UNIVOTEC - කියන මේ සියල්ලම නිර්මාණය වුණේ එතුමාගේ නායකත්වයෙනුයි.

තාක්ෂණ විෂයය ධාරාව මේ රටේ ජාතියේ දරුවන්ට තිළිණ කරන්න අතිගරු ජනාධිපතිතුමා ගනු ලැබූ තීන්දුව අනුව තමයි ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා, ඒ අමාත්‍යාංශය, නිලධාරින්, මේ රටේ බුද්ධිමතුන්, විශ්වවිද්‍යාල ප්‍රජාව, ගරු එස්.බී. දිසානායක ඇමතිතුමා, අපේ අමාත්‍යාංශය ඒ කටයුත්ත වෙනුවෙන් ඒක රාශි වුණේ. අපි විශේෂයෙන් කෘතවේදිව කියන්න ඕනෑ ගරු මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමා ගැන. අපේ අමාත්‍යාංශ දෙකේ අධීක්ෂණ මන්ත්‍රීවරයා විධියට එතුමා තිරයෙන් පිටු පස දැවැන්ත කාර්ය භාරයක් කළා. රටේ ජනතාව ඒක දැන ගන්න ඕනෑ. ඉහත කී සියලු දෙනාට අපි ජාතියක් විධියට කෘතවේදී වන්නට ඕනෑ, මේ තීරණාත්මක හැරවුම වෙනුවෙන් කරනු ලැබූ කැපකිරීම් සහ දායකත්වය සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මෙය හඳුන්වන්නේ ඉතිහාසයේ වරදක් නිවැරැදි කිරීමක් විධියටයි. ඒ වැරැද්ද ඓතිහාසික වැරැද්දක්. මේ රටේ කාර්මික අධ්‍යාපනය, මේ රටේ වෘත්තීය අධ්‍යාපනය ආරම්භ වන්නේ 1893 දීයි ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමනි. ඒ, මරදාන කාර්මික විද්‍යාලයෙන්. ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ රජ දරුවන්ගේ කාලයේ ඉඳලාම මේ රටේ, ශ්‍රී ලාංකීය සංස්කෘතිය ඇතුළේ සැලසුම්සහගත අධ්‍යාපනය තුළ නිපුණතා සංවර්ධනය තිබුණා. සැලසුම්සහගත අධ්‍යාපන ක්‍රමය ඇතුළේ වෘත්තීය අධ්‍යාපනය, කාර්මික අධ්‍යාපනය මේ රටට දායක වන්නේ සුදු අධිරාජ්‍යවාදීන් අතින් 1893 දීයි. හැබැයි අවාසනාවට ඒ වෘත්තීය අධ්‍යාපනය පාසල් පද්ධතියට, ද්විතීයික අධ්‍යාපනයට සම්බන්ධ කරන්න 1893 ඉඳලා අවුරුදු 120ක් අපට බලා ඉන්න සිද්ධ වුණා. අපට අවුරුදු 120ක් බලා ඉන්න සිද්ධ වුණා ගරු මන්ත්‍රීතුමනි. මීට ඉස්සර වෙලා ආණ්ඩු ඒ සඳහා උත්සාහ ගත්තා; නොයෙක් යෝජනා කළා; සැලසුම් සකස් කළා; ඒවා ක්‍රියාත්මක කළා. නමුත් ඒ ඉලක්කයට යන්න, ඒ අභියෝගය ජයග්‍රහණය කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප පාසල් ගිය කාලයේ පැවැති තත්ත්වය මොකක්ද? මම ගරු පුෂ්පකුමාර ඇමතිතුමාගෙන් ඒ ගැන ඇහුවාම, එතුමාත් කිව්වා, "මමත් වඩු වැඩ කළා" කියලා. ඒ කාලයේ ප්‍රාග් වෘත්තීය විෂයයන් ආවා. අපි ලෝහ වැඩ, වඩු වැඩ, කෘෂිකර්මය ඇතුළු තාක්ෂණික විෂයයන් හැදෑරුවා. නමුත් එය විධිමත් විෂයය ධාරාවක් විධියට උසස් පෙළට එකතු කරලා උසස් පෙළ පාසල් පද්ධතිය සහ වෘත්තීය අධ්‍යාපනය අතර පාලම නිර්මාණය කරන්න ඉතිහාසයේ හිටපු හැම නායකයකුම, හැම ආණ්ඩුවක්ම, හැම අධ්‍යාපන ඇමතිවරයකුම අසමතුන් වූ බව මේ සභාවට වාර්තා කළ යුතුව තිබෙනවා. ඒ, කාටවත් ඇඟිල්ල දිගු කරන්න නොවෙයි. ඉතිහාසයේ ඒ අසමතුන්ගේ ගොඩේ අපිත් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය ඓතිහාසික අවස්ථාවක්. මේ දිහා දේශපාලන මල පුවුවේ හිර වෙලා බලන්න හොඳ නැහැ ගරු මන්ත්‍රීතුමනි. කාගේ අතින් වුණත්, කවුරුන් මේකට නායකත්වය දුන්නත් කමක් නැහැ. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට ජාතියේ ගෞරවය හිමි වෙනවා. ඒ ගැන තර්කයක් නැහැ. නමුත්, අපි මෙතෙක් ගත්ත උත්සාහය මොකක්ද? මොකක්ද, අධ්‍යාපනය කියලා මේ රටේ අප කල්පනා කළේ? මොනවාද, අධ්‍යාපන ක්‍රමය ගැන තිබුණු සංකල්ප? අම්මා තාත්තා අධ්‍යාපන ක්‍රමය ගැන කොහොමද හිතුවේ? ගුරුවරයා කොහොමද අධ්‍යාපන ක්‍රමය ගැන හිතුවේ? දේශපාලකයන් වන අපි කොහොමද ඒ ගැන හිතුවේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අම්මා තාත්තා හිතුවා, වේවැලෙන් තළලා හරි කමක් නැහැ කොල්ලා කෙල්ල අරගෙන ගිහිල්ලා ඉස්කෝලේ වැටෙන් ඇතුළට දාලා ආවොත් ප්‍රශ්නය ඉවරයි කියලා. ඒක තමයි අම්මා තාත්තා හිතපු විධිය. ගුරුවරයා කොහොමද හිතුවේ? ගුරුවරයා හිතුවා, තනි රූල් ටික පිරෙන්න වචන ලිව්වොත්, කොටු රූල් ටික පිරෙන්න ඉලක්කම් ලිව්වොත් ප්‍රශ්නය ඉවරයි කියලා. දේශපාලකයන් වන අපි හිතුවා, ඡන්දය කාලයේ පස්සෙන් ආපු, "පෝස්ටර්" අලවපු, "බැනර්" දාපු, "කැන්වසින්" ගිය කොල්ලන් කෙල්ලන් ටික දෙනාට රස්සාවල් ටිකක් දුන්නොත් ප්‍රශ්නය ඉවරයි කියලා. අකමැත්තෙන් වුණත් කියන්න ඕනෑ, මේ රටේ අධ්‍යාපනය දිහා දෙමව්පියන්, ගුරුවරුන්, දේශපාලකයන් ඉතිහාසයේ බැලුවේ එහෙමයි කියලා. තරුණයන් අතරේ එයට විරෝධය මතු වෙන කොට අපි හෞතීස්ම කළා වචනයක්, 'තරුණ අසහනය' කියලා. මේ රටේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන ඇමතිවරයා විධියට මම මෙය මුළුමනින්ම ප්‍රතික්ෂේප කරනවා. ශ්‍රී ලාංකීය තරුණයා අසහනකාරයෙක් කියලා මම පිළිගන්නේ නැහැ. ශ්‍රී ලාංකීය තරුණයා අසහනකාරයෙක් නොවෙයි. තරුණ අසහනය සම්බන්ධයෙන් කියලා කොමිෂන් සභා දෙකක් ඉතිහාසයේ පත් කෙරුණා.

ඒ නිර්දේශ අරගෙන බලන්න. මොකක්ද තිබුණු ප්‍රශ්නය? හඳුනා ගන්න බැරි වුණු ප්‍රශ්නය මොකක්ද? තිබුණේ තරුණ අසහනයද, තරුණ විරැකියාවද? මොකක්ද ප්‍රශ්නය? අසහනයෙන් පෙළෙනවාය කියන ඕනෑම කෙනකුට රැකියාවක් දීලා බලන්න, ඒ මොහොතේ ඉඳලා අසහනය තිබෙනවාද කියලා. නැහැ. අපි ගල් අච්චුවේ හරි හතරැස්, අවිද්‍යාත්මක, අතාර්කික වචනයක් හදා ගත්තා "තරුණ අසහනය" කියලා. තරුණ අසහනයක් නොවෙයි තිබුණේ. මොන ආණ්ඩුව යටතේ වුණත් ඒවාට ටයර්වලින් උත්තර දෙන්න, ඊයම් බරුවලින් උත්තර දෙන්න ඇතැම් විට අපි උත්සාහ ගත්තා. රටක් විධියට බැලුවොත් ඒක අපේ උත්සාහයක්.

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

ප්‍රශ්නය තිබුණේ විරැකියාවේ; තරුණ විරැකියාවේ. ඒක තමයි ජනාධිපතිතුමා තේරුම් ගත්තේ.

අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා ජපානයේ උදාහරණයක් කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවන ලෝක යුද්ධයෙන් පස්සේ ජපානය නැඟිට්ටේ කාර්මික අධ්‍යාපනයෙන්; තරුණයන්ගේ උරහිස් මතින්. කාර්මික විප්ලවයෙන් පස්සේ යුරෝපය නැඟිට්ටේ තරුණයින්ගේ උරහිස් මතින්. සිවිල් යුද්ධයෙන් පස්සේ ඇමෙරිකාව නැඟිට්ටේ තරුණයන්ගේ උරහිස් මතින්; කාර්මික අධ්‍යාපනයෙන්; තාක්ෂණයේ දියුණුව හරහා. ඒක තමයි අද අපේ රටේ රාජ්‍ය නායකයා මේ රටේ -ජාතියේ- දරුවන්ට ලබා දෙන්න උත්සාහ ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මේ දිහා පාට කණ්ණාඩි දමා ගෙන බලන්න එපාය කියා මා ඉතාම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. පටන් ගන්න අවස්ථාවේ අඩු පාඩු තිබෙන්න පුළුවන්. ඒකයි අපි මැතිවරණ කොට්ඨාසයකින් එක පාසලක් බැගින් තෝරා ගෙන පාසල් 230කින් පමණ අඩු ප්‍රමාණයකින් මේක ආරම්භ කරන්නේ. දේශපාලන ඉලක්කයක් තිබුණා නම්, පාසල් දහසකින්, දෙදහසකින්, සියලුම මහා විද්‍යාලවලින් මේක ආරම්භ කරන්න තිබුණා. එවැනි ප්‍රාථමික දේශපාලන න්‍යාය පත්‍රයක් අතට අරගෙන නොවෙයි මේ වැඩ පිළිවෙළට ආණ්ඩුව එකතු වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට තුළ තිබෙන රැකියා අවස්ථා ගැන විතරක් නොවෙයි, මා කියන්නේ. ඩිලාන් පෙරේරා ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ තොරතුරු වාර්තා අරගෙන බලන්න. 2010 වර්ෂයේදී 2,60,000ක් පුහුණු ශ්‍රමිකයන්ට - skilled labourersලාට- රැකියා අවස්ථාවන් මේ රටට ආවා. නමුත් ඒ සඳහා රට තුළ සිටියේ කී දෙනාද? 61,000යි. සේවකයන් 2,60,000ක් ඉල්ලුවා. නමුත් අපට 1,99,000ක් යවන්න බැරි වුණා. අපේ විදේශ ශ්‍රම බල කාය ලක්ෂ 18යි; 1.8 million. ඒ ලක්ෂ 18 ඇතුළේ බහුතරය ඉන්නේ නුපුහුණු ශ්‍රමිකයෝ. සියයට 70ක පමණ ප්‍රමාණයෙන් සියයට 44ක් ගෘහ සේවිකාවෝ; නුපුහුණු ශ්‍රමය. දේශීය වෙළෙඳ පොළ විතරක් නොවෙයි, අපට ජාත්‍යන්තර වෙළෙඳ පොළත් තිබෙනවා. එම නිසා මේ රටේ අනාගතය වෙනුවෙන් කරනු ලබන ආයෝජනයක් විධියට සැලසුමක් ඇතුවයි අපි මේ තාක්ෂණ විෂය ධාරාව පාසල් පද්ධතියට එකතු කර තිබෙන්නේ. ඒ වෙනුවෙන් ලැබෙන සාධාරණ විවේචනත් එක්ක ගනුදෙනු කරන්න අපි කැමැතියි. එම අඩු පාඩු හදා ගන්න අපි සූදානම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම මේ සභාව හරහා අපි රටට කියන්නට ඕනෑ, -මා මුලිනුත් සඳහන් කරපු විධියටම- පාසල් පද්ධතිය හා වෘත්තීය අධ්‍යාපනය අතර සම්බන්ධතාව ගොඩ නැඟීම සඳහා වූ ඒ පෙකණි වැල, ඒ පාලම ඉදි කිරීම සඳහා වූ කටයුත්ත දිහා කරුණාකරලා ප්‍රාථමික තර්කවලින්, දේශපාලන තර්කවලින් තොරව, එහෙම නැත්නම් පළාත් සභාව ගැන හෝ වෙනත් තර්කයක් ගැන හෝ හරස් කර ගන්නේ නැතුව බලන්න කියලා. තමුන්නාන්සේලා විපක්ෂය විධියට හෝ වෙනත් පක්ෂ විධියට හෝ බෙදෙන්නේ නැතුව මෙයට ඒ සම්මාදම දෙන්න. අපි ජාතියක් විධියට ලෝක දේශපාලන සිතියමේ අපේ අනන්‍යතාව සොයා ගෙන යන ගමනකයි ඉන්නේ; අපි ලකුණු සොයා ගෙන යන ගමනකයි ඉන්නේ.

ඒ ලකුණට යන්න පුළුවන් දොරක් තිබෙනවා. ඒ දොර තමයි වෘත්තීය අධ්‍යාපනය සංඛ්‍යාත්මකව ඉහළ ගෙනියන එක. මට පෙර කථා කළ මන්ත්‍රීවරුන් සියලු දෙනාම මේ ගැන කිව්වා. තුන් ලක්ෂ හතළිස් දෙදාහක් දරුවන් අවුරුද්දකට පාසල් පද්ධතියට ඇතුළු වෙනවා. එයින් විසිතුන් දාහක් හෝ විසිපන් දාහක් රටේ සරසවි පද්ධතියට යනවා. තව නව දාහක් විදේශ සරසවිවලට ඇතුළු වෙනවා. ගිය අවුරුද්දේ එක් ලක්ෂ විසිහය දාහක් වෘත්තීය අධ්‍යාපනය, කාර්මික අධ්‍යාපනය ලැබුවා. හැබැයි විසඳුමක් නැති එක් ලක්ෂ පණස්දාහක් ඉතිරි වෙනවා. ඒ අය වෙනුවෙනුයි මේ ව්‍යායාමය. ගරු ජනාධිපතිතුමා මේ තාක්ෂණ විෂය ධාරාව එළිදක්වන දවසේ කිව්වා, "මේ රටේ දක්ෂ දරුවෝ, අදක්ෂ දරුවෝ කියා දෙපැත්තක් නැහැ"කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පිළිගන්නවා ඇති, මේ රටේ මෙතෙක් වෘත්තීය අධ්‍යාපනය, කාර්මික අධ්‍යාපනය ලබා දුන්නේ පාසල් හැර යන දරුවන්ට, විභාගය අසමත් වන දරුවන්ට කියන එක. "F" තුනේ දරුවන්ට කථා කළා, Technical College එක. පාසල් හැර යන දරුවා ඉලක්ක කර ගෙන වෘත්තීය අධ්‍යාපනය නිර්මාණය කළා. ඒකම තමයි වැරැද්ද. ඒකයි අප කිව්වේ, අද, පාසල් පද්ධතිය ඇතුළේ ඒ අධ්‍යාපන ක්‍රම සැලසුම්සහගතව නිර්මාණය වන අවස්ථාව කියා. මේ පිළිබඳව බුද්ධිමත්ව අනාගතවාදී සංවාදයකට යන්නටයි අවශ්‍ය වෙන්නේ. අපේ අමාත්‍යාංශය විශ්වාස කරන විධියට මේ වෙනුවෙන් ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක -ගරු මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමා ඒ මැදිහත්වීම කරමින්- එසේම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක මේ විෂය ධාරාවට ඇතුළු වන කිසිම දරුවෙකුට අසාධාරණයක්, අගතියක් නොවෙන්න ඔවුන්ගේ අනාගතය සාර්ථක කරන්නට පුළුවන් වන විධියට ඒ පසුබිම හදා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාල විද්‍යායතන - university colleges - නවයක් මේ අවුරුද්දේ අප ආරම්භ කරනවා. ඒ university colleges නවයට එන දරුවෝ එන්නේ මේ තාක්ෂණ විෂය ධාරාව හරහායි. ඉංජිනේරු තාක්ෂණය වේවා, ජෛව පද්ධති තාක්ෂණය වේවා, තාක්ෂණය සඳහා විද්‍යාව වේවා මේ කුමන හෝ විෂයක් ජූලි මාසයේ 15වෙනි දායින් පස්සේ තමන්ගේ පන්ති කාමරය ඇතුළේ දරුවන් ඉගෙන ගන්නවා. ඒ ඉගෙන ගන්නා දරුවන්ගෙන් එක් දහසක් 2016 වර්ෂයේ විශ්වවිද්‍යාලයට යනකොට, හය දහසකට විශ්වවිද්‍යාල විද්‍යායතන - university colleges - වෙත එන්න පුළුවන්කම ලැබෙය කියා අප බලාපොරොත්තු වෙනවා. සමහරු NVQ සුදුසුකම් මට්ටම් හරහා එතැනට ඒවි. ඒ වාගේම Z-score එක හරහාත් 2016 වර්ෂයේ දී university collegesවලට එන ළමයින්ගේ සංඛ්‍යාව පන්දහසකට අධික වේය කියා අප විශ්වාස කරනවා. ඒ හැම දරුවෙක්ම B.Tec උපාධියේ පළමුවන අවුරුදු දෙක university college එකේදී සම්පූර්ණ කරාවි. මේ අනුව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අනාගතය වෙනුවෙන් ඉතාම නිවැරදි, ඉතාම දියුණු විද්‍යාත්මක ආයෝජනයක් අධ්‍යාපනයට සිද්ධ වෙලා තිබෙනවාය කියා මේ අවස්ථාවේදී අප විශ්වාස කරනවා. ඔබතුමා මට නියෝග කරන්න මොහොතකට පෙර මා මගේ කථාව අවසාන කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මගේ කථාව අවසාන කරන්නට මොහොතකට පෙර නැවත ඉල්ලන්නේ මෙයයි. මෙවැනි ජාතික ප්‍රතිපත්ති මීට පෙර මේ සභාව හමුවට ඇවිත් තිබෙනවා; නිල්පාටින් වාගේම කොළපාටින් මේ ගරු සභාවට ඇවිත් තිබෙනවා. හැබැයි, අප ප්‍රාථමිකව ඒවා දිහා බලා, දේශපාලන න්‍යාය පත්‍රය ඉස්සරහින් තියාගෙන ඒවා දිහා බලා, අප නූගතුන් විධියට හැසිරිලා, අප මන්ද බුද්ධිකයන් විධියට හැසිරිලා ඒ ජාතික ප්‍රතිපත්ති ජාතික දේශපාලන වේදිකාවෙන් එළියට ඇද දමා තිබෙනවා. මේ ඉතිහාසයේ ඇත්ත කථාව නීරස වුණත් ගරු සහෝදර මන්ත්‍රීවරුන් සියලු දෙනාගෙන්ම නැවත මා ඉල්ලන්නේ මෙන්න මේ කාරණයයි. මේ දෙස අන්ධානුකරණ දේශපාලනය තුළ ඉඳගෙන බලන්න එපා. ප්‍රාථමික දේශපාලනය තුළ ඉඳගෙන මේ දෙස බලන්න එපා. සහෝදරාත්මකව විවේචන කරන්න. හැබැයි ජාතියේ දරුවන් වෙනුවෙන් අනාගතවාදීව, බුද්ධිවාදීව මේ විෂය ධාරාව යථාර්ථයක් කර ගන්නට තමුන්නාන්සේලාගේ

මැදිහත් වීම සිද්ධ කර, ඒ හරහා මේ රටේ අනාගතය වෙනුවෙන් ඒ කැප කිරීම කරන්නය කියන ඉල්ලීම කරමින් ඔබතුමාට විශේෂයෙන් ස්තුති කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

හොඳයි. බොහොම ස්තුතියි. මීළඟට ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්ධකාරය පවතිනකොට වැදගත් දේවලුත් යටපත් වෙනවා. වැදගත් දේවලටත් වැරදි අර්ථ නිරූපණ ලැබෙනවා. හොඳම හොඳ දෙය දෙසත් සැක සංකාසහිතව බලන්නට සිද්ධ වෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා සඳහන් කළ පරිදිම මේ නොම්මර එකේ වැඩේ -තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීම කියන ඉතාම ඉස්තරම් වැඩේ- පිළිබඳව විපක්ෂයේ අප තුළ යම් යම් සැක සංකා මතු වන්නේ ඔබතුමන්ලා අපත්, රටත් අන්ධකාරයේ තබා ඇති නිසායි. මෙම අලුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අලුතින් යෙදිය යුතු ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද, ඒ ප්‍රාග්ධනය සොයා ගන්නේ කෙසේද කියලා මේ රජය, විෂය භාර අමාත්‍යවරු පැහැදිලි කරනවා නම් අපට ඒ ගැන එකඟ වන්නට පුළුවන්. නමුත් අද වන තුරු -ඔබතුමාගේ කථාවේම සඳහන් කළ පරිදි- මේ ගෞරවනීය පාර්ලිමේන්තුව ඒ ආයෝජනය ගැන දැනුවත් කර නැහැ. මොකද මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් කරන ආයෝජනය යුද්ධයෙන් පස්සේ දළ ජාතික නිෂ්පාදනයට සාපේක්ෂව එන්න එන්නම අඩු වෙලා තිබෙනවා. 2012 දී ඒ ප්‍රමාණය දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 1.8ක් පමණයි. 2013 වසරේ ඇස්තමේන්තු අනුව එය සියයට 1.6ක් බවට පත් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගිය අවුරුද්දේ සියයට 1.8ක් ආයෝජනය කරලා, මේ අවුරුද්දේ සියයට 1.6ක් ආයෝජනය කරලා මෙවැනි දැවැන්ත වැඩ පිළිවෙළකට අවශ්‍ය කරන මූල්‍ය සම්පත් හොයා ගන්නේ කොහෙන්ද කියන සැකය අපට ඇති වෙනවා. එතකොට තමයි අප කියන්නේ මේ වැඩ පිළිවෙළ ප්‍රමාණවත් ලෙස සූදානම් නොවූ වැඩ පිළිවෙළක්දෝ යැයි අපට සිතෙනවා කියලා. අවසානයේ මේ ගරු සභාව අමතන ගරු ඇමතිවරයා කවුරුන් හෝ වේවා ඒ වැය වන අතිරේක මුදල් ප්‍රමාණය කොපමණද, ඒවා සොයා ගන්නේ කෙසේද කියන කාරණය ගැනත් අපව දැනුවත් කළොත් මේ වටිනා වැඩ පිළිවෙළ ගැන අපේ සිත තවත් සතුටු වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපොස උසස් පෙළ විභාගයට ගණිත විෂයයන් හැදෑරූ, විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා විෂයන් හැදෑරූ කෙනෙක් හැටියට මේ වැඩ පිළිවෙළ ගැන මගේ ලොකු සතුටක් තිබෙනවා. කර්මාන්ත සහ ඒ කර්මාන්ත හරහා ගොඩනැඟෙන අනිකුත් සේවා සැපයීම් මත රටට වැඩිපුර ලැබෙන ලාභය තමයි අනික් රටවලට සාපේක්ෂව ඒ රට දියුණු වීම කියලා කියන්නේ. ජපානයේ කර්මාන්ත දියුණු වෙලා, ඒ නිෂ්පාදනවල අතිරික්තය ලෝකයේ වෙනත් රටවලට විකුණලා ලබා ගන්නා ලාභය තමයි ජපානයේ පොහොසත් වීම කියලා කියන්නේ. දකුණු කොරියාව 1948 දී අපේ රටටත් වඩා පහළ තත්ත්වයක තිබිලා අද දකුණු කොරියාව ලෝකයේ පොහොසත්ම රාජ්‍යයක් වන්නේ දකුණු කොරියාවේ නිෂ්පාදන එම රටේම නිෂ්පාදනය කරලා, ඒ නිෂ්පාදන හරහා ලැබෙන අතිරික්ත ධනය රට තුළ ඉතිරි වෙන කොටයි. මලයාසියාව ගැනත්, වේගයෙන් දියුණු වන ඉන්දියාව ගැනත් දියුණු වූ අනික් ඕනෑම ජාතියක් ගැනත් මේ තර්කය පොදුයි. ඒ නිසා අපේ රට ලෝකයේ දියුණුව කරා ගෙන යන්න නම් එක අතකින් කර්මාන්ත, තවත් අතකින් කෘෂි කර්මාන්තය හා සම්බන්ධ කර්මාන්ත, ඒ වාගේම ඒ හා සම්බන්ධ අනිකුත් සේවා දියුණු තලයකට යා යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප අද කරන්නේ අපේ නුපුහුණු ශ්‍රමිකයන් අතිවිශාල ප්‍රමාණයක් මැද පෙරදිග රටවලට දුක් විඳින්නට යවන එකයි. අපේ නුපුහුණු ශ්‍රමිකයන් විශාල ප්‍රමාණයක් ඉතාලියට, ජපානයට හොර රහසේ යවන එකයි. ඒ අයගෙන් වසරකට ලැබෙන ඩොලර් බිලියන 7ක විතර මහා ධනස්කන්ධය මත තමයි අද අපේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ. මොකද අපේ රටේ ඇඟලුම් කර්මාන්තය හැර වෙනත් කිසිදු නිෂ්පාදනයක් සැලකිය යුතු තරම් රටේ ආර්ථික වර්ධනයට දායකත්වය දක්වන්නේ නැහැ. ඊට අමතරව සම්ප්‍රදායික බෝග වන තේ, රබර්වලින් අපට ආදායමක් ලැබෙනවා. පොල්වලින් අප ජාත්‍යන්තරව ආදායමක් උපයන්නේ නැහැ. තේ, රබර් සහ ඊට අමතරව කුරුඳු සහ වෙනත් සුළු අපනයන බෝග මඟින් අප කෘෂි කර්මාන්තය හරහා ආදායම උපයනවා. නමුත් දැන් අප පිළිගත යුතුයි, එය සුදුසු නැහැ, අපේ රට තුළ නිෂ්පාදනය සඳහා අවශ්‍ය කරන පුහුණු ශ්‍රමිකයන් ඒ විවිධ ක්ෂේත්‍ර -ඉංජිනේරු ක්ෂේත්‍රය, ජීව විද්‍යාත්මක කර්මාන්ත ක්ෂේත්‍රය- සඳහා බිහි කර ගත යුතුයි කියන කාරණය. ඒ නිසා මේ පියවර ඉතා හොඳයි.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගුරුවරයෙක්. මම හිතන හැටියට මේ ගරු සභාවේදී අද දින මේ විවාදයට සහභාගි වුණු ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කීප දෙනෙකුම ඔබතුමාගෙන් ඉගෙන ගත් අය. ඒ අතර ඉංජිනේරුවකු වන ගම්පහ දිස්ත්‍රික්කයේ ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාත්, ආණ්ඩු පක්ෂයේ ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මන්ත්‍රීතුමාත් සිටිනවා. ඒ වාගේම ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා කිව්වා, එතුමාත් ඔබතුමාගෙන් ඉගෙන ගෙන තිබෙනවා කියලා. මමත් ඔබතුමාගෙන් භෞතික විද්‍යාව විෂය ඉගෙන ගෙන තිබෙනවා. මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගුරුවරයකු නිසා දන්නවා ඇති, අධ්‍යාපනයට අවශ්‍ය කරන සාධක ගණනාවක් තිබෙන බව. පළමු වැනි සාධකය හැටියට, ඒ විෂය තෝරා ගැනීම පිළිබඳව යම් ආකාරයක විශ්වාසයක් සමාජය තුළ ඇති කළ යුතුයි. ඒ වාගේම ඒ විෂය තෝරා ගන්නා දරුවා පාසලට ගියාම, ඒ විෂය ගැන හොඳින් දන්නා පුහුණු ගුරුවරුන්ගේ සහායත් ඒ දරුවාට පාසල තුළදී අවශ්‍යයි. විශේෂයෙන් තාක්ෂණවේදය විෂය නිසා ඒ සඳහා අවශ්‍ය විද්‍යාගාර පහසුකම් ඇතුළු අනෙකුත් පහසුකම් මෙන්ම ප්‍රායෝගික ක්‍රියාකාරකම් පවා අවශ්‍ය වෙනවා. ඒ සඳහාත් පහසුකම් සූදානම්ව තිබෙන්න ඕනෑ.

මා පානදුරේ නගර ශාලාව ඉදිරිපිට තිබුණු බැනරයක් දැක්කා. ඒ බැනරයේ තිබුණේ, "පානදුර ශාන්ත ජෝන් විද්‍යාලයේ තාක්ෂණවේදය විෂය ඉගැන්වීම මේ වසරේ ආරම්භ වන බැවින් ඒ සඳහා අයදුම් කළ හැකියි" කියන එකයි. බැලූ බැල්මටම මා ඒ ගැන සතුටු වුණත්, දෙවනුව මා කල්පනා කළා, ඒ සඳහා අවශ්‍ය පහසුකම් සහ ගොඩනැඟිලි තිබෙනවාද කියලා. පළමු වතාවට, දෙවැනි වතාවට මේ විෂය ඉගෙන ගන්න ඉදිරිපත් වන දරුවන්ට විඳින්නට සිදු වන අවදානම කුමක්ද කියන එක මා කල්පනා කළා. මෙය, දෙමවුපියන්ට තමන්ගේ දරුවන්ගේ ජීවිතයේ තීරණාත්මක මොහොතක්. උසස් පෙළ පන්තියට මේ විෂය ධාරාවෙන් ඇතුළත් වෙන්න කියලා ඒ දරුවන්ට ආරාධනා කරනකොට, අවශ්‍ය පහසුකම් සනාථ කරලා ඒ අවශ්‍ය ආත්ම විශ්වාසය ඇති කරලා නොතිබුණොත් - දෙමවුපියන් ඒ තීරණය ගන්නේ නැහැ - ඒ දරුවන් අසරණ වෙනවා.

ඉංග්‍රීසි භාෂාවෙන් පහළ ශ්‍රේණිවල සිට ඉහළ ශ්‍රේණි දක්වාම ඉගැන්වීම ඉතා වැදගත් යෝජනාවක් වුණත්, ඇතැම් ප්‍රධාන පෙළේ පාසල්වල පවා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම පිළිබඳ වූ ව්‍යාපෘතිය අසමත් වෙලා තිබෙනවා. ඇතැම් පාසල්වල එය හොඳින් ක්‍රියාත්මක කරනවා. නමුත් ඇතැම් ප්‍රධාන පෙළේ පාසල් පවා එයින් අසමත් වෙලා තිබෙනවා. ඒ අසමත් වුණු කාරණා ගැනත්, ඒ අත්හදා බැලීමට ලක් වෙච්ච දරුවන්ට මුහුණ දෙන්න

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

සිද්ධ වුණු කාරණා ගැනත් අපට හොඳ අවබෝධයක් තිබෙනවා. ගරු මොහාන් ලාල් ග්‍රේරු අධීක්ෂණ මන්ත්‍රීතුමනි, මේ වැඩ පිළිවෙළ සත්‍ය ලෙසම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නම් සමාජය තුළ විශ්වාසයක් ඇති කළ යුතුයි, "ඒ සඳහා සූදානම්" කියලා. ඒ සූදානම පිළිබඳ පණිවුඩය ඉක්මනින්ම සමාජ ගත කළ යුතුයි. දරුවකු පන්තියට එන පළමුවැනි දවසේම, දෙවැනි දවසේම ඒ හැඟීම එම දරුවාට දිය යුතුයි. එසේ නොමැතිව මුල් අවස්ථාවේ දී යම් පසුබෑමක් ඇති වුණොත්, අවිශ්වාසයක් ඇති වුණොත් අනිවාර්යෙන්ම දිගින් දිගටම ඒ තත්ත්වය බලපාන්නට ඉඩ තිබෙනවා.

උසස් පෙළ විභාගයෙන් පසුව විශ්වවිද්‍යාලවලට ඉංජිනේරු විද්‍යාව හැදෑරීම සඳහා හෝ වෙනත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා නොතේරෙන හෝ නොයන සිසුන් වෙනුවෙන්, NVQ කියන සුදුසුකම්වල එක එක මට්ටම් හරහා ඒ වෘත්තීයමය අධ්‍යාපනයට යොමු කිරීම ඉතාම හොඳයි කියලා මා අගය කරනවා. මොකද, උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල අනුව කෙනෙකු විශ්වවිද්‍යාලයට තෝරා ගන්න පුළුවන්. එහෙම නොවෙයි නම්, තමන්ට නිශ්චිත තීරණාත්මක සුදුසුකම් ලැබෙන, ජාත්‍යන්තරව පිළිගත් සුදුසුකම් ලබා ගැනීමේ ක්‍රියාවලියක පළමුවැනි, දෙවැනි පියවර අපි දැන් උසස් පෙළ පන්තියේ දීම සම්පූර්ණ කළාය කියන ඒ විශ්වාසය මත ඒ සිසුන්ට ඉදිරියට යන්නට පුළුවන්. ඒ නිසා හොඳ දේ හොඳයි. හොඳටම හොඳයි. හැබැයි, මෙය අධ්‍යාපන ක්ෂේත්‍රය නිසා, ඒ මූලික විශ්වාසය ඇති වන ආකාරයට අපත්, සමාජයත් දැනුවත් කළ යුතුයි.

ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ සිටියා නම් හොඳයි. නමුත් මා එතුමාට පිළිතුරු දිය යුතුව තිබෙනවා. එතුමා මේ අවස්ථාවේ පාර්ලිමේන්තුව තුළ සිටිනවා ඇති කියලා මා හිතනවා. එතුමා කිව්වා, 1988, 1989, 1990 කාලයේ තරුණ අසහනය ඇති වුණේ, රක්ෂාවක් නොමැතිවීමේ ප්‍රශ්නය නිසාය කියලා. රක්ෂාවක් දුන්නා නම් මොන අසහනයක්වත් නැහැ කියලා එතුමා මේ ප්‍රශ්නය ලඝු කළා. ඒ කාලයේ එතුමාගේ දේශපාලන ක්‍රියාකාරකම් ගැනත් මට මතකය තිබෙනවා; අවබෝධය තිබෙනවා. අප මැරිලා ඉපදුනු අය නොවයි. අප ජීවිතයේ බොහෝ අත්දැකීම් ලබපු අය. ඒ නිසා ඒ කාලයේ එතුමාගේ දේශපාලන ක්‍රියාකාරකම් ගැනත් අපට මතකයි. එතුමාටත් අප මතක ඇති. මූලාසනයේ සිටින ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමනි, අපට ඔබතුමාත් මතකයි. ඔබතුමාටත් අප මතක ඇති.

මේ ජීවිතයේ විවිධ අත් දැකීම් හරහා අප විවිධ තැන්වල සිටිනවා. හැබැයි, ඉතිහාසයේ සැබෑවට වුණ දේ අමතක කළොත් අපට කිසිම විසඳුමක් ලබා ගැනීමට හැකි වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 88-89 කාලයේ රැකියා ප්‍රශ්නයක් තිබුණා. සාධාරණ රැකියා අවස්ථා නොමැතිවීමේ ගැඹුරු ප්‍රශ්නයක් තිබුණා. එවකට මම විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක්. ඒ හැඟීම, විප්ලවීය අදහස්වලට යොමු කරන්නත්, ඒ හරහා මහත් විනාශයක් කරා ජනතාව පොළඹවන්නත් ජනතා විමුක්ති පෙරමුණට අවස්ථාව ලබලා දුන්නා. ජනතා විමුක්ති පෙරමුණ රටේ කාටවත් විමුක්තිය උදා කළේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණ ඔවුන්ට වශී වුණ දරුවන්ගේ විනාශය කරා ඔවුන් අරගෙන ගියා. නමුත් එහෙම කරන්නට පදනම් වෙච්ච සමාජ තත්ත්ව තුළ රැකියා කියන ප්‍රශ්නය එක ප්‍රශ්නයක් පමණයි. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව වූ හැඟීම, තනි පක්ෂ පාලනයක් පිළිබඳව වූ හැඟීම, තමන්ට තීරණ ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව අයිතියක් නැතිකම පිළිබඳව වූ හැඟීම, සීමිත පිරිසක් -ධනවත් පිරිසක්, බලවත් පිරිසක්- සමාජයේ තිබුණු වරප්‍රසාද ඔවුන් වටා ගොනු කර ගැනීම පිළිබඳව වූ හැඟීම ඒ කාලය වන කොට වර්ධනය වෙලා තිබුණා. අදත් ඒ ප්‍රශ්නය එලෙසම තිබෙනවා. ඒක එදාට සියයට 100ක් සමානයි කියලා කියන්න අවශ්‍යතාවක් නැහැ. එය වෙනස්; නමුත් තිබෙනවා. ඒ නිසා මේ රටේ තරුණයන් තුළ තවමත් අසහනය තිබෙනවා. ඒ අසහනය නැති කිරීමට ගත යුතු පියවර අතර එක පියවරක් පමණයි, මෙම තාක්ෂණවේදය පිළිබඳ විෂයය හඳුන්වා දීම.

අනෙක් පියවර වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම රටේ සැබෑවට ස්ථාපනය කිරීමයි. නිදහස් අධ්‍යාපනයෙන් බලාපොරොත්තු වුණු ඒ මූලධර්ම නවීන කාලයට ගැළපෙන ආකාරයට සකස් කළ යුතුයි. මේ සමාජයේ සැබෑ පංගුකාරයන් වන අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවන ව්‍යවස්ථාවෙන්ම සනාථ කරලා තිබෙන ආකාරයට, මේ රටේ ජනතාවගේ විධායක බලය, ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය, ජනතාවගේ අධිකරණ බලයයි මේ තිබෙන්නේ. මේ රටේ පාලකයන් කටයුතු කරන්නේ ජනතාව වෙනුවෙන්ය, ඒ ජනතාවගේ ආණ්ඩුවක් මේ රටේ තිබෙනවා යැයි කියන හැඟීම ඇති කළොත් විතරයි, මේ රටේ බාල, තරුණ, මහලු හැමෝගේම අසහනය නැති කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අධ්‍යාපනය සම්බන්ධයෙන් අලුත් පියවරක් ගන්න මේ මොහොතේ විශ්වාසය පිළිබඳව ඇති ප්‍රශ්නය බරපතළයි. -මා මේ කාරණය කියන්නේ මෙයට බාධා කිරීමේ අරමුණකින් නොවෙයි- ඒ විශ්වාසය ඇති කරන්නට අවශ්‍ය කරන පැහැදිලි කිරීම් සහ පහසුකම් ලබා දෙනු ඇතැයි කියන විශ්වාසයෙන් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ කිසිම රජයකට විසඳන්න බැරි අභියෝග ගණනාවකට අධ්‍යාපනය මුහුණ දීලා තිබුණා. එයින් ඉතාම වැදගත් කාරණය වුණේ, අද කිව්වා වාගේ ටියුෂන් යන්න දරුවන් යොමු කරවපු, කටපාඩම් කරන විභාග මුල් කර ගත් අධ්‍යාපන ක්‍රමයයි. අපි දැනුමට විතරයි තැන දුන්නේ; කෙරුමට තැන දුන්නේ නැහැ. කරන්නෝ නොමැතිවීම නිසා දැනුවත්කමින් හිස් උදුම්මා ගත් උගත්තු ශීත කාමරවල කොළ අත්සන් කිරීමේ ක්‍රියාවලියේ පමණක් නිරත වෙද්දී අපේ රටේ කර්මාන්ත ඇති කිරීමට තිබෙන, අපේ රටේ අලුත් දේවල් හදන්න තිබෙන ඉඩකඩ ඇහිරිලා ගියා. ඒ පසුබිම ඇතුළේ අතිගරු ජනාධිපතිතුමා හිතුවා මේ දේශපාලන තීන්දුව ගත යුතුයි කියලා. අපේ රටේ දරුවෝ -අනාගත පරපුර- දැනුමෙන් සන්නද්ධ වනවා වාගේම කෙරුමෙන්, නිපුණතාවෙන් සන්නද්ධ කිරීම සඳහා එතුමා මේ තීරණය ගත්තා. අපි කොහොමද, මේ සඳහා වැඩ කෙරුවේ, සැලසුම් කෙරුවේ? අද මේ වන කොටත් මේ විෂය මාලාව ඇතුළේ තනි විෂයයන් විධියට මේ තාක්ෂණවේදය තිබුණා. හැබැයි ඒවා ඇඳලා තිබුණේ ඉතාම අසාර්ථක විධියට කලා විෂය ධාරාවට. අපි අලුත් විෂය ධාරා දෙකක් හැදුවා. මෘදු තාක්ෂණය කියලා අපි විෂය ධාරාවක් හැදුවා. ඒ මෘදු තාක්ෂණ විෂයයන් එකතු කර ගෙන ජෛව පද්ධති තාක්ෂණය - Biosystems Technology - කියලා විෂයයක් හැදුවා. ජෛව පද්ධති තාක්ෂණය ඇතුළේ තිබෙනවා, කෘෂි තාක්ෂණය, පසු අස්වනු තාක්ෂණය, ගොවි පොළ තාක්ෂණය, ධීවර සම්පත් පිළිබඳ තාක්ෂණය, ජෛව සම්පත් තාක්ෂණය. මේ ජෛව සම්පත් හා ජෛව පද්ධති ආශ්‍රිතව පරිසර හිතකාමීව, සමාජයේ උන්නතිය සඳහා හා ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා වුවමනා කර්මාන්ත ඇති කිරීමට වුවමනා මූලික දැනුම දෙන නොගැඹුරු, එහෙත් පුළුල් අත් දැකීම් සම්භාරයක් නිපුණතාව සමඟ දරුවාට ලබා දීමේ වැඩ පිළිවෙළක් ඇති වන විධියට ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ විෂය නිර්දේශය අපි නිර්මාණය කෙරුවා.

අනෙක් පැත්තෙන් තාක්ෂණයේ අනෙක් පැත්ත. ඒ තමයි කාර්මික පැත්ත, ඉංජිනේරු පැත්ත. සිවිල් ඉංජිනේරු එහෙම නැත්නම් ඉදි කිරීම් පැත්ත. අනෙක් පැත්තෙන් යාන්ත්‍රික කටයුතු පිළිබඳ ඉංජිනේරු පැත්ත.

අනෙක් පැත්තෙන් විදුලි හා ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ තාක්ෂණය කියන අංශ එකතු කරලා නොගැඹුරු එහෙත් පුළුල් දැනුමක් ලබා දෙන විධියට දෘඪ තාක්ෂණය මුල් කර ගෙන අපි ඉංජිනේරු තාක්ෂණය කියන විෂය නිර්මාණය කළා. ඊට අමතරව අපි මේ වෙනස්කම් ඇති කරන විට දරුවන්ගේ අනාගතය මොන විධියට වෙන්න ඕනෑද කියලා බැලුවා; මොන මාර්ගයේද දරුවන්ට යන්න පුළුවන් වෙන්නේ කියලා බැලුවා. අපි දන්නවා විශ්වවිද්‍යාල පද්ධතිය ඇතුළේ මේ දක්වා තිබුණේ විද්‍යාව විතරයි කියලා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විද්‍යාව කියන්නේ මූල ධර්මය. ඒ මූල ධර්මය යොදවා ගෙන හදපු මයික්‍රෝෆෝනය -යකඩ කට- මෙතැන තිබෙනවා. මේක තුළ ක්‍රියාත්මක වන විද්‍යාත්මක මූල ධර්මයට අපි කියනවා, විද්‍යුත් චුම්බක ප්‍රේරණය කියලා. එය සොයා ගත්තේ මයිකල් ෆැරඩේ. ඒ විද්‍යුත් චුම්බක මූල ධර්මය යොදලා සිය දහස් ගණනක් උපකරණ නිපදවලා තිබෙනවා. විද්‍යාවේ එක මූල ධර්මයයි, නමුත් හදලා තිබෙන උපකරණ බොහොමයි. අන්න තාක්ෂණය. මේ මයික්‍රෝෆෝනය කියන්නෙත් තාක්ෂණය. අර cellular phone එකෙත් මේ මූලධර්මය තිබෙනවා. එතැනත් ඒ තාක්ෂණය. ප්‍රත්‍යාවර්තධාරා ජනකයේත්, ඒ කියන්නේ generator එකේත්, අපට විදුලිය සපයන උපකරණයේත් මේ මූල ධර්මය තිබෙනවා. මේ විවිධ උපකරණ තමයි තාක්ෂණය කියන්නේ. මේ තාක්ෂණය තමයි මුළු ලෝකය පුරා පැතිරී තිබෙන සියලු නිෂ්පාදන කර්මාන්ත ඇතුළේ හරය වෙලා තිබෙන්නේ. අපි මොකද කළේ? අපේ විශ්වවිද්‍යාල එකකවත් තාක්ෂණය පිළිබඳ පීඨයක් නැහැ. එකකවත් තාක්ෂණ දෙපාර්තමේන්තුවක් නැහැ. විද්‍යාපීඨ විතරයි තිබෙන්නේ. මූල ධර්මය විතරයි උගන්වන්නේ. දැනුම විතරයි දෙන්නේ. කෙරුමෝ හදන්න අපේ පසුබෑමක් ඇති වෙලා තිබුණා. කරන්නෝ හදන්න, ඒ විද්‍යාව යොදලා ලෝකයට ඕනෑ වන, මිනිසුන්ගේ ජීවන මට්ටම ඉහළට ගෙන යන්න පුළුවන් වන බඩු භාණ්ඩ ආදිය හදන, ආර්ථිකයට උදවු කරන පරපුරක් හදා ගන්න අපට බැරි වුණා. අපි මේ සියලු ආයතන සමඟ කථා කළා. යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සමඟ කථා කළා. මගෙන් ඇහුවා අනෙක් පැත්තට ගිහිල්ලා සන්තෝෂ වෙන්න පුළුවන් දෙයක් කර ගන්න පුළුවන් වුණාද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා අධ්‍යාපන අමාත්‍යාංශයේ විතරක් නොවෙයි යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේත් අධීක්ෂණ මන්ත්‍රීවරයෙක් විධියට කාර්ය භාරයක් පවරලා මාව ඇතුළු කළේ මේ දෙක සම්බන්ධ කරලා මෙතෙක් කල් අධ්‍යාපන ක්‍රමය ඇතුළේ අපට හදා ගන්නට බැරි වුණු නිපුණතා සංවර්ධනය, කෙරුම හදා ගන්නයි.

21 වන ශත වර්ෂයේ අධ්‍යාපනය පිළිබඳව Jacques Delorsගේ පොතේ තිබෙනවා දැන ගන්න ඉගෙන ගන්න, ඒ වුණාට මදි, කරන්නත් ඉගෙන ගන්න ඕනෑ කියලා. "Learning to know, learning to do, learning to live together and learning to be" කියන්නේ අධ්‍යාපනයේ කුලුනු හතර. මෙහි ඉතා වැදගත් කුලුනක් වන කරන්න පුළුවන් විය යුතු වීම, -කිරීම පිණිස- අධ්‍යාපන පද්ධතිය ඇතුළට ගෙන යන්න හඳුන්වලා දෙන්න, වැඩ කිරීමේ වැදගත්කම දරුවන්ට කියලා දෙන්න, දහඩියේ සුවඳ හඳුනන, මහ පොළොවේ පය ගහලා වැඩ කරන්න පුළුවන් අලුත් දේවල් හිතන්න පුළුවන්, අලුත් දේවල් කරන්න පුළුවන්, නව නිර්මාණ තනන්නට පුළුවන් ජාතියක් හදන්න එතුමා පියවර ගත්තා. ඒ සඳහා පෙරමුණේ ගමන්කරුවෙක් විධියට ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා මේ අභියෝගය බාර ගත්තා. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා මේ අභියෝගය බාර ගත්තා. අපි මේක ගරු එස්.බී. දිසානායක ඇමතිතුමා ළඟට ගින ගියා. එතුමා කිව්වා අපේ විශ්වවිද්‍යාල පද්ධතියේ ඇති විශ්වවිද්‍යාල 17ම තාක්ෂණ පීඨ ඇති කරනවා කියලා මූල ධර්මයක් විධියට පිළිගත්තා. B.Tech උපාධි ඇති කරනවා, තාක්ෂණයෙන් තොර විද්‍යාවකින් ඵලක් නැහැ. එහෙම නම් අපි තාක්ෂණ පීඨ ඇති කරනවා. එහෙම නැත්නම් අඩුම ගණනේ විද්‍යා හා තාක්ෂණ පීඨ - Science and Technology Faculties - අපේ විශ්වවිද්‍යාල ඇතුළේ හදනවා කියලා. මේ විධියට අපි විශ්වවිද්‍යාල ඇතුළට තාක්ෂණය ගෙන ගියා.

2016 වන විට අනිවාර්යයෙන්ම අපි බලාපොරොත්තු වෙනවා මේ කර්තව්‍යය සම්පූර්ණ කිරීමට. ඒ සඳහා දැනටමත් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සියලු වැඩ කටයුතු කරලා ඉවරයි. තට්ටු 8ක මහල් ගොඩනැඟිල්ලක් හදලා තාක්ෂණ විෂයයට උපාධි අපේක්ෂකයින් 450ක් ඇතුළත් කර ගැනීම සඳහා වැඩ කටයුතු දැනටම සැලසුම් කරලා ඒ සඳහා වුවමනා කරන යෝජනා බාර දීලා ඉවරයි. මේ විශ්වවිද්‍යාල දහහතේම මෙය කෙරෙනවා. එතකොට මේ දරුවන්ට ඒ පැත්තෙන් යන්න පාර තිබෙනවා. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා කිව්වා ඇත්තටම විශ්වවිද්‍යාල විද්‍යායතන - university colleges - 25ක් මේ රටේ හැදෙනවා කියලා. මේ අවුරුද්දේ 09ක් හැදෙනවා. ඉතිරි ටික ලබන අවුරුද්දේ හැදෙනවා.

දරුවන් 7,500ක් ඒවාට ඇතුළත් කර ගන්න පුළුවන්. එක පැත්තකින් NVQ හතරෙන් එන දරුවන්, තව පැත්තකින් තාක්ෂණවේදය හදාරා, මේ පාඨමාලාව හදාරා සමත් වන දරුවන් කියන ඒ හැමෝම අන්තිමට යන්නේ වසර හතරක පාඨමාලාවකින් කාර්මික පුහුණුව සහිතව industry එකේ හොඳ පුහුණුවක් -හොඳ training එකක්- එක්කයි. ඒ අයට තාක්ෂණවේදී උපාධිය තිබෙනවා; B.Tech උපාධිය තිබෙනවා. එතකොට තමුන්නාන්සේලාට පෙනෙනවා ඇති මේක ඉතා හොඳට සැලසුම් කරපු විෂය මාලාවක්ය කියන එක. ඒ වාගේම, මේකට සල්ලි තිබෙනවාද, මේකට කොයි තරම් මුදලක් අයින් කරලා තිබෙනවාද කියා තමුන්නාන්සේලා ඇහුවා. මේ වැඩසටහන ගැන දැනුම් දීපු ගමන් ආසියානු සංවර්ධන බැංකුවේ නිලධාරින් ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට මොකද කිව්වේ? "මේක පටන් ගන්න තිබුණේ අද නොවෙයි, මීට අවුරුදු 20කට ඉස්සෙල්ලා. අපි මේකට ආයෝජනය කරන්න කැමැතියි. අපි මේකට උදවු කරන්න කැමැතියි" කියා ඒ අය කිව්වා. පළමුවන අවුරුදු කිහිපය ඇතුළත ඩොලර් මිලියන 200ක ආධාර මුදලක් අපට ලැබී තිබෙනවා. ඒ ඩොලර් මිලියන 200න් මුලින්ම පටන් ගන්න පාසල් 233ට - වැඩිම වුණොත් මේ ප්‍රමාණය 250ක් වේවි - ඩොලර් මිලියනයකට ආසන්න ප්‍රමාණයක් ආයෝජනය කරන්න අපට පුළුවන්. මේ වනකොටත් ඒවාට වුවමනා විද්‍යාගාර නිර්මාණය කරලා ඉවරයි. ඒවායේ සටහන් ඇඳලා ඉවරයි. ගෙනෙන්න ඕනෑ උපකරණවල specifications හරිගස්සා ඉවරයි. අගෝස්තු මාසයේ අපි මේවා හදන්න පටන් ගන්නවා. මාස 6ක් ඇතුළත අපි මේවායේ වැඩ අවසන් කරන්න බලාපොරොත්තු වනවා. වැඩිම වුණොත් මාස 8ක් ගත වේවි. මේ දරුවන්ට වැඩ කරන්න, පුහුණු වෙන්න අවශ්‍ය පරීක්ෂණාගාර, වැඩ පොළවල් අපි මේ භූමිය මත හදනවා කියන එක මා භය නැතුව, විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කරනවා.

ඒ විතරක් නොවෙයි, අපේ රටේ මෙවැනි පාසල් 400ක් තිබෙනවා. එයින් පාසල් 250යි අපි තෝරා ගන්නේ. කාර්මික විද්‍යාල හා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ පුහුණු මධ්‍යස්ථාන 400ක් තිබෙනවා. ළඟම තිබෙන පුහුණු මධ්‍යස්ථානයට අපි මේ දරුවන් ගෙන යනවා. ඒ අයට ප්‍රවාහන පහසුකම් සපයන්න අපි බලාපොරොත්තු වනවා. සතියකට එක දවසක් ඒ තැන්වල මෘදු තාක්ෂණය හා දෘඪ තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට අපි මේ අය යොමු කරනවා. ඇයි, මේ අයට tuitionවලින් ගොඩ එන්න බැරි වන්නේ? ඉංජිනේරු තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය යන මේ මූලික විෂයයන් දෙක සඳහා සිද්ධාන්තවලට ලැබෙන්නේ ලකුණු 75යි. ඉහළ ලකුණු අරගෙන මේ විවෘත වෙලා තිබෙන අංශවලට දරුවා ඉදිරිපත් වන්න නම්, තරග කරන්න නම් අර ලකුණු 25 ඉතා වැදගත් වනවා. ඒ ලකුණු 25 ලැබෙන්නේ ප්‍රායෝගික වැඩවලටයි. සන්තත ඇගැයීම් ක්‍රමයක් හරහා අන්තිමේදී විභාග දෙපාර්තමේන්තුව කරන සුවිශේෂ ඇගැයීමකින්, සම්පිණ්ඩිත ඇගැයීමකින් ලකුණු 25ක් ලැබෙනවා. ප්‍රායෝගික වැඩවලටයි දරුවන්ට ඒ ලකුණු හම්බ වෙන්නේ. එතකොට tuition පන්තියට ගිහිල්ලා කට පාඩම් කරපු යුගයට අද මේකෙන් අභියෝගයක්

[ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා]

එල්ල වෙනවා. එහෙම නම් මේක tuition පන්තියෙන් කර ගන්න පුළුවන් වැඩක් නොවෙයි. දැනුම තිබෙන අය හදන්න පුළුවන් වුණාට, කට පාඩම් කරන්න පුළුවන් අය හදන්න පුළුවන් වුණාට, පහ වසරේ ශිෂ්‍යත්ව විභාගයට දෙක වසරේ ඉඳලා tuition දීලා ළමයාගේ මොළය අකුළා දමපු සමාජයක් තුළ අලුතින් හිතන්න පුළුවන්, ප්‍රායෝගික වශයෙන් අලුතින් වැඩ කරන්න පුළුවන් මිනිසුන් හදා ගන්න පුළුවන් විධියට හරියටම යොමු වුණු පාඨමාලාවක් අපි පටන් ගෙන තිබෙනවා. ඒ නිසා tuition පැත්තෙන් ගිහින් දරුවන්ට මේකෙන් ගොඩ එන්න ලැබෙන්නේ නැහැ. මේක ඉතා නිවැරැදිව සැලසුම් කරලා, නිවැරැදි අනාගතයක් කරා මේ දරුවන් ගෙන යන්න පුළුවන් වන විධියට ලොකු විශ්වාසයකින් යුක්තව පටන් ගත්තු වැඩක්. ගුරුවරුන් පුහුණු කළාද කියා තමුන්නාන්සේලා ඇහුවා. මේ වනකොට අපි 320ක් පුහුණු කරලා ඉවරයි. යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයෙන් කළ ඒ හැම පුහුණු පාඨමාලාවකටම ගිහින් මමත් පැයක් කථා කළා. ඒ අය මේ අංශයේ විශේෂඥයෝ. ඒ අය තමයි මුලින් යන්නේ.

ඊට අමතරව මා කිව්වා, මේ විධියට නැතුව 2005 ඉඳලා තාක්ෂණ විෂයයන් කලා විෂයයන්වලට එල්ලලා තිබුණාය කියා. නමුත් ඒක සාර්ථක වුණේ නැහැ. හැබැයි ඒවාට උගන්වපු ගුරුවරුන් 1,000කට කිට්ටු ප්‍රමාණයක් මේ පද්ධතිය තුළ අද නිකරුණේ ඉන්නවා. අපි ඒ අය ගෙන්වලා ඒ අයව පුහුණු කරන්න පටන් ගත්තා. ඒ විතරක් නොවෙයි, කෘෂිකර්මය පිළිබඳ උපාධි තිබෙන අය, ජීව විද්‍යාව පිළිබඳ උපාධි තිබෙන අය මේ කාර්යය ඉතා උනන්දුවෙන් භාර ගත්තා. අපි එවැනි අය 350ක් ගෙන්නුවා. අද පාසල්වලින් එවැනි ගුරුවරු ඇවිල්ලා ඉල්ලනවා, මේ පාඨමාලාව අපට දෙන්නය; මේ පුහුණු වීම් හරහා අපට මේක කරන්න දෙන්නය; මේක තමයි අපි අධ්‍යාපනයෙන් බලාපොරොත්තු වුණු දේ කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
එම නිසා අපි දැඩි ලෙස විශ්වාස කරනවා, ඉතා හොඳින්, කැප වීමෙන් වැඩ කරන්න පුළුවන් ගුරුවරුන් සමූහයක් මේ සඳහා අපට නිර්මාණය කර ගන්න පුළුවන්ය කියා. ඒ පුහුණු වීම් දැන් ආරම්භ කරලා තිබෙනවා. මේ වනකොට විෂය නිර්දේශ හදලා ඉවරයි. ඒ විෂය නිර්දේශ මෙතැන තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම ගුරු අත් පොත්වල මූලික කොටස් හදා දැනටමත් පාසල්වලට බෙදා දීලා ඉවරයි. පිටුපසින් ඉඳ ගෙන අපි මේ සියලු කටයුතු නියාමනය කරනවා; අධීක්ෂණය කරනවා. විපක්ෂය වෙනුවෙන් කථා කරපු සියලු මන්ත්‍රීවරුන්ට අපි ඉතාමත් ස්තුතිවන්ත වෙනවා.

එතුමන්ලා ඉතාම ධනාත්මකව කථා කෙරුවා. යම් විවේචන තිබුණත් ඒවා සාධාරණයි කියලා මා හිතනවා. ඒවා අපේ ඇස් අවදි කරන, අපේ ධෛර්ය ඉස්මතු කරන, අප විසින් කළ ඉටු යුතු මේ ජාතික ක්‍රියාවලියේ වගකීම පිළිබඳව අපට තව තවත් පාඩම් කියා දෙනවා ඇති. ඒ නිසා මා ඔවුන්ට ඉතා ගෞරවයෙන් ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ කලා විෂය හදාරන උසස් පෙළ දරුවන් ප්‍රමාණය සියයට 52යි. අනෙක් අතට විශ්වවිද්‍යාලවල සිටින ප්‍රමාණය සියයට 36ක්. විශ්වවිද්‍යාලවල ඉන්න විසිතුන්දහසක් දරුවන්ගෙන් අටදහසකට ආසන්න ප්‍රමාණයක් හදාරන්නේ කලා උපාධිය. කලා විෂයන් හොඳයි; කලා ක්ෂේත්‍රය හොඳයි. හැබැයි එයින් බිහි වන මෙච්චර උපාධිධාරීන් සංඛ්‍යාවක් අපේ රටට අවශ්‍ය නැහැ. ඉල්ලුමක් නැහැ; ඔවුන් රැකියාගත කරන්න බැහැ. ඒ නිසා මේ සමස්ත ක්‍රියාවලියේදී මේ විෂය මාලාවට දරුවන්ට අවතීර්ණ වෙන්න හොඳ ප්‍රවර්ධනයක් ඕනෑ. දරුවන් මේක දැන ගන්න ඕනෑ. ඒ නිසා අපි විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා, තමුන්ගේ ගම් නියම්ගම්වල, තමුන්ගේ පළාත්වල, තමුන්ගේ කොට්ඨාසයේ දරුවන් මේ ගැන දැනුවත් කරන්නය කියලා. අද මේකට අපි තෝරා ගන්නේ ගණිතය පිළිබඳ විශේෂඥයෝම නොවෙයි. මේකට අපි තෝරා ගන්නේ විද්‍යාව පිළිබඳ විශේෂඥයෝම නොවෙයි. ගණිතයෙන් අවම සුදුසුකම තිබෙන, එහෙම නැත්නම් ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථයක්, විද්‍යාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ඇතිව සාමාන්‍ය පෙළ විභාගය සමත් වෙලා තිබුණොත් මේ විෂය මාලාව හදාරන්න පුළුවන්. මොකද, උසස් පෙළේදී ඔවුන් ගණිතයෙන් හා විද්‍යාවෙන් තවදුරටත් පෝෂණය කරන නිසා ඔවුන්ට ඒ අභියෝගවලට මුහුණ දෙන්න පුළුවන්කම ලැබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක ඉතා නිවැරදිව සැලසුම් කර, දූරදක්නා නුවණින් යුක්තව ස්ථාපනය කරන ලද ඉතා ස්ථාවර පාඨමාලාවක් වෙන බව සඳහන් කරමින් මේ සඳහා උර දුන් අපේ ප්‍රධාන අමාත්‍යවරු තිදෙනා ඇතුළු ඒ දුක් විඳපු සියලු දෙනාට මේ අවස්ථාවේදී මගේ ගෞරවය හා ස්තුතිය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ජීවිත කාලය තුළ මා වැඩියෙන්ම සතුටු වන දවස වෙන්නේ ලබන සඳුදා දින. එනම්, 15වැනිදා. මොකද, මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් දැනුම කේන්ද්‍රීය සංවර්ධන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට දරුවන්ට නිපුණතාව ලබා දෙන තාක්ෂණික විෂය ධාරාව ජාතික පාසල් පද්ධතියට හඳුන්වා දීලා ඉගැන්වීමේ ක්‍රියාවලිය ආරම්භ වන දිනය එය වන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහස් අධ්‍යාපනයේ නිර්ව්‍යාජ දරුවකු ලෙසත්, මේ රටේ අධ්‍යාපනය ලබන උසස් පෙළ අවධියේ තුන්ලක්ෂයකට ආසන්න දරුවන් ප්‍රමාණයකට වඩා හොඳ අධ්‍යාපනයක් ලබා දීම සඳහා උගුරට ලේ රස දැනෙනතුරුත්, මේස් බැනියමට දාඩිය උරනතුරුත් පංචස්කන්ධයෙන් මහන්සි වුණ කෙනකු ලෙසත් නිදහස් අධ්‍යාපනයේ ණයෙන් කොටසක් මේ රටේ උප නූපන් පරම්පරාවලට ගෙවන්න පුළුවන්කම මේ පිංකම තුළින් මට ලැබෙනවා කියා මා හෘදයාංගමව විශ්වාස කරනවා. ඒ අවස්ථාව මටවත්, මේ සඳහා ඉතාම විශාල දායකත්වයක් සැපයූ අපේ ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාටවත්, අපේ ගරු එස්.බී. දිසානායක ඇමතිතුමාටවත්, මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමාටවත්

ලැබෙන්නේ නැහැ, අපේ රටේ රාජ්‍ය නායකයා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා නොවුණා නම්. මගේ පෞද්ගලික, අවංක විශ්වාසයේ හැටියට අපි කාටවත් සසර වසනා තාක් කල් අධ්‍යාපනයේ මෙවැනි වෙනසක් කරන්න හම්බ වෙන්නේ නැහැ, රටේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා නොවුණා නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහස් අධ්‍යාපනය මේ රටට හඳුන්වා දුන් සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමා ප්‍රථම අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී සඳහන් කළා, නිදහස් අධ්‍යාපන පනත මඟින් අධ්‍යාපනය දුප්පතුන්ගේ නිත්‍ය උරුමයක් බවට පත් කරනවා කියලා. ඒ අවස්ථාවේදී කන්නන්ගර චින්තනයේ කිසි විටෙක තිබුණේ නැහැ, විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයකින් සහතික පතක් දීලා දරුවකු සමාජගත කරන්න.

එතුමා මධ්‍ය විද්‍යාල 54ක් පිහිටෙව්වා. එස්.බී. දිසානායක ඇමතිතුමා බිහි වුණ පොරමඩුල්ල මධ්‍ය විද්‍යාලය, පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිතුමිය බිහි වුණ ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලය, විමල් වීරවංශ ඇමතිතුමා බිහි කරපු තිස්ස මධ්‍ය මහා විද්‍යාලය, ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා බිහි කරපු හොරණ තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලය, චම්පික රණවක ඇමතිතුමා බිහි කරපු හොරණ තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලය යනාදී වශයෙන් මට ලැයිස්තුවක් කියන්න පුළුවන්. මෙවැනි දරු පරපුරක් මධ්‍ය විද්‍යාලවලින් බිහි කළා. හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයේ තමයි මා අධ්‍යාපනය ලැබුවේ. එතුමා අපේක්ෂා කළේ ගුණ, නැණ, බල, සුව සපිරි විශ්වයටම සම්පතක් විය හැකි දරුවන් බිහි කිරීම සඳහා වැඩ ලෝකයට සරිලන නිපුණතාව සහිත දරුවෙකු සමාජගත කරන්නයි. පැරැණි මධ්‍ය විද්‍යාල ගැන දන්න සියලු දෙනා දන්නවා, කන්නන්ගර චින්තනය තිබුණු පාසල් තුළ විද්‍යා, වාණිජ, කලා අංශ එක්ක වඩු වැඩ, මැටි වැඩ, ලෝහ වැඩ, යකඩ වැඩ, මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව, ඉලෙක්ට්‍රෝනික් වැඩ, විදුලි වැඩ කියන මේ සියල්ල තිබුණු බව. එපමණක් නොව, ඒ සඳහා අවශ්‍ය ගුරුවරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් බඳවා ගනු ලැබුවා. නමුත් අවාසනාවකට නිදහස් අධ්‍යාපනයේ මූලික චින්තනය මේ බ්‍රිතාන්‍ය අනුකරණවාදී මානසිකත්වයෙන් යුතු අය විසින් මරා දැම්මා. එය නැවත වතාවක් නිදහසින් පස්සේ පණ ගැන්වීම සඳහා උත්සාහයක් දැරුවා. 1970 ගණන්වලදී ආචාර්ය අල්හාජ් බදිඋද්දීන් මහ්මුද් අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් සිටියදී HNCE කියන විභාග ක්‍රමය යටතේ ප්‍රාග් වෘත්තීය අධ්‍යාපනය රටේ ක්‍රියාත්මක වුණා. කන්නන්ගර චින්තනය යළි උපද්දවීම සඳහා යම් කිසි උත්සාහයක් දරනු ලැබුවා. නමුත් 1977 දී විවෘත වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමය අතිගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විසින් රටට හඳුන්වා දෙන අවස්ථාවේදී දේශපාලන තීන්දුවක් ගත්තා, මේ තිබුණ සම්පූර්ණ විභාග ක්‍රමය වෙනස් කරලා නැවත වතාවක් London GCE (O/L), London GCE (A/L)වලට සමාන්තරව අපොස (සා.පෙ) හා අපොස (උ.පෙ) විභාග දෙක නැවත ඇති කරන්න ඕනෑය කියලා. එය සම්පූර්ණ දේශපාලන තීන්දුවක්. මේ තීන්දුවෙන් පසුව අප බලාපොරොත්තු වුණේ කුමන හෝ ආකාරයකින් දරුවා විභාගවලින් සමත් කරවීම පමණයි. ඒ නිසා සමස්ත ලංකාවේ දරුවන්ගේ සහ දෙමව්පියන්ගේ ජීවිත, ආකල්ප, සිතුම් පැතුම්, ජන වහර, ධර්මතා සියල්ල විභාග තුනකට සීමා වුණා. සමහර දෙමව්පියන්ට පහේ ශිෂ්‍යත්වය, අපොස (සා.පෙ) හා අපොස (උ.පෙ) විභාග ත්‍රිවිධ රත්නය වාගේ. තුන්තරා බෝධිය වාගේ පහේ ශිෂ්‍යත්වය, අපොස (සා.පෙ) හා අපොස (උ.පෙ)විභාග. ත්‍රෛලෝක්‍යෙකතිලක වාගේ වුණා පෙළක් අයට, පහේ ශිෂ්‍යත්වය, අපොස (සා.පෙ) හා අපොස (උ.පෙ) විභාග.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 17ක් එක්සත් ජාතික පක්ෂය විසින් විවිධ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ක්‍රියා මාර්ග අනුගමනය කළත්, 1995 වන විට අපොස (සා.පෙ) විභාගයට වාඩි වුණු දරුවන්ගෙන් සියයට 15.9 අපොස (සා.පෙ) විභාගය සමත් වුණේ. විභාග දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව සියලුම අවුරුදුවල සියයට 20ක්වත් අපොස (සා.පෙ) විභාගය සමත් වෙන්නේ නැහැ. දරුවෝ සියයක් අපොස (සා.පෙ) විභාගයට ගිහිල්ලා, 15 දෙනෙකු, 16 දෙනෙකු, 20 දෙනෙකු විභාගය සමත් වුණත්, සියයට 80කට අපොස සාමාන්‍ය පෙළවත් නැති, යන එන මං නැති, කිසිදු නිපුණතාවක් නැති දරුවෝ පිරිසක් වශයෙන් සමාජගත වනවා. ඔවුන් ජීවිතය අපේක්ෂා කරන භද්‍ර යෞවනයේ පොපියන චමත්කාරය සහිත අවුරුදු 15,18, 20ක් වැයසැති දරුවෝ. ඔවුන්ට ඔවුන්ගේ කියන ජීවිතයක් ගොඩ නඟා ගන්න ඕනෑ. රක්ෂාවක්; ජීවනෝපායක් හොයා ගන්න ඕනෑ. විවාහයක් වෙන්න ඕනෑ. කුටුම්භයක් ඇති වෙන්න ඕනෑ. ජීවිතය හොයා ගෙන ඔවුන් ගියා. ඔවුන්ට ජීවිතය මුණ ගැහුණේ නැහැ. මේ පිළිබඳ විශාල සමාජ කතිකාවතක් අප කුඩා කාලයේ ඉඳලා ඇති වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට මතකයි, මා පුංචිම අවධියේ චිත්‍රපටයක් බැලුවා. ඒ මා චිත්‍රපට නිෂ්පාදකයෙක් වෙන්න කලින්. මගේ මතකයේ හැටියට ඒ චිත්‍රපටයේ නම "වල්මත් වූවෝ".

මගේ මතකය නිවැරැදි නම් ඒ චිත්‍රපටියෙන් කිව්වේ මෙවැනි කථාවක්. ඈත ගම්මානවල දෙමව්පියෝ දහසකුත් එකක් බලාපොරොත්තු යටතේ තමන්ගේ ඉඩම් උකස් කරලා දරුවෝ විශ්වවිද්‍යාලයට යවනවා. මේ කථාවේ තරුණයෝ තුන් දෙනෙක් කලා උපාධිය ලබා ගෙන විශ්වවිද්‍යාලයෙන් පිට වුණා. සිරිල් වික්‍රමගේ කියන ප්‍රතිභා පූර්ණ නළුවා තමයි එම චිත්‍රපටියේ ප්‍රධාන චරිතය සඳහා රංගනය ඉදිරිපත් කළේ. තාත්තා උකස් කරපු ගේ දොර සිත්න වත්තය යන අවස්ථාවේදී රක්ෂාවකුත් නැතිව අනෙක් බලාපොරොත්තු සියල්ලම සුන් කර ගෙන මේ තමුන්ට උගන්වන්න උකස් කරපු නිවස තිබෙන ඉඩමේ ඔප්පුව බේරා ගැනීම සඳහා උකස්හිමියා වන මුදලාලි ළඟට ඔහු ගියා. ඒ අවස්ථාවේදී ඇති වූ අරගළයකදී පිහි ඇනුමක් වෙලා එකී ඔප්පු හිමියා මිය යාමේ ඛේදවාචකය තමයි එම චිත්‍රපටියෙන් කිව්වේ.

ඒ කාලයේ ඇති වුණේ වල්මත් වන අධ්‍යාපනයක්. ඒ වල්මත් වූ අධ්‍යාපනය තුළින් අපි කැමැති වුණත්, අකමැති වුණත් මේ රටේ ඉතිහාසය ලියලා තිබෙන්නේ ලේ වලින්. පුරා දශක තුනක් යකඩ ගැටෙන අමිහිරි ශබ්දය, උණ්ඩයේ අමිහිරි සුවඳ, සංස්කෘතික අපගමනය, සදාචාරාත්මක පිරිහීම, මනුස්සකමේ දරුණු නාය යාම, දුක වේදනාව, මර ළතෝනිය කියන ඒ සියල්ල අප වින්දා. එයට වග උත්තරකරුවෙකු බවට පත් වුණා අධ්‍යාපනය. අද වන විට එදා වාගේ අපොස සාමාන්‍ය පෙළ විභාගය සමත් වන්නේ සියයට 15ක්, 16ක් නොවෙයි. අපි ඇති කරනු ලැබුවා වූ අධ්‍යාපනයේ ගුණාත්මක වෙනස්කම් රාශිය නිසා විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය වුණත් මේ වන විට සාමාන්‍ය පෙළ විභාගයෙන් සියයට 65ක් සමත් වනවා. සියයට 65ක් අපොස සාමාන්‍ය පෙළ විභාගය සමත් වන කොට 118,000ක් ගණිතය අසමත් වනවා. 85,000ක් විද්‍යාව අසමත් වනවා. විෂයයන් නවයම අසමත් 11,100ක් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි තත්ත්වයක් තුළ අපේ රටේ උසස් පෙළට තේරී සිටින දරුවෝ ටිකෙනුත් ගිය වර්ෂයේදී විද්‍යා අංශයෙන් උසස් පෙළ අධ්‍යාපනය ලැබුවේ දරුවෝ 103,000යි. මේ රටේ Point Pedro සිට දෙවුන්දර තුඩුවට යනකම් වෛද්‍යවරුන්, ඉන්ජිනේරුවන්, විද්‍යාඥයින්, ගණිතඥයින්, නව නිපැයුම්කරුවන්, පර්යේෂකයින්, විද්‍යාත්මක චින්තනයක් ඇති අය බිහි වීම සඳහා අධ්‍යාපනය ලැබුවේ 103,000යි. ජීවනෝපාය වශයෙන් වාණිජ අංශයේ, සේවා අංශයේ රැකියා අවස්ථා බහුලව තිබෙනවා. බැංකු, රක්ෂණ, ප්‍රවාහන, ගබඩාකරණය, සන්නිවේදනය, සංචාරක, අළෙවිකරණය, කළමනාකරණය වැනි ක්ෂේත්‍රවල අධ්‍යාපනය ලැබුවේ 122,000යි. ගිය අවුරුද්දේත් අපොස උසස් පෙළ විභාගයට කලා අංශයෙන් 235,000ක් පෙනී සිටියා. මේ 235,000ක් වන මනුෂ්‍ය ජීවිත ප්‍රමාණය ගැන මේ පාර්ලිමේන්තුව ප්‍රශ්න කළේ නැහැ. සියයට 6ක් සියයට 10ක් අධ්‍යාපනයට වෙන් කරන්න කියලා කියන කිසි කෙනෙක් මේ මුදල වෙන් කරන්නේ කුමන මානව සම්පතක් නිර්මාණය කිරීම සඳහා ද කියලා ප්‍රශ්න කළේ නැහැ.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ 235,000ක දරුවන්ගෙන් කලා උපාධිය හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලයට යන්නේ 8,000යි. අපි ඒ 8,000 ප්‍රමාණය 10,000 දක්වා වැඩි කළත් සෑම වර්ෂයකදීම 225,000ක් කලා අංශයෙන් ඉගෙනුම ලබා සමාජගත වනවා. ඒ දරුවෝ ඉගෙන ගෙන තිබෙන විෂයයන් මොනවාද? පෙරදිග සංගීතය, සිංහල භාෂාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, ඉතිහාසය. සියලු සම්පත් දීලා අවුරුදු දෙකක් මේ දරුවෝ ඉගෙන ගන්නේ මේ ටිකයි. අවුරුදු දෙකක් ඉතිහාසය ඉගෙන ගෙන ඊට පස්සේ කලා උපාධිය ගන්න විශ්වවිද්‍යාලයට යන්නේ නැහැ. මොකක්ද රක්ෂාව? පෙරදිග සංගීතය ඉගෙන ගෙන විශ්වවිද්‍යාලයට ගියේ නැහැ. මොකක්ද රක්ෂාව? දේශපාලන විද්‍යාවත් එහෙමයි. අඩු තරමෙන් දේශපාලන විද්‍යාව ප්‍රගුණ කරපු කී දෙනෙක් මේ උත්තරීතර සභාවේ සාමාජිකයෝ ලෙස ඉන්නවාද? එහෙමත් නැහැ. ඒ විෂයයන් වැදගත්. යම් කිසි පිරිසක් ඒ විෂයයන් අත්‍යවශ්‍යයෙන් හැදෑරිය යුතු වනවා. නමුත් එදා වල්මත්වූවන්ට වාගේම; කලා උපාධිය ලබා ගත් 8,000ක පිරිස උපාධි සහතිකය අරගෙන බණ්ඩාරනායක සම්මන්ත්‍රණශාලාවෙන් එළියට එනකොට ඉස්සරහා ගේට්ටුව ළඟ වෙනම සංවිධානාත්මක දේශපාලන පිරිසක් ඉන්නවා, රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංගමයේ පෝරමය අතට දෙන්න.

එදා ඉඳන් දියවූ දියවූ රක්ෂා දියවූ! කඩවූ කඩවූ දේපළ කඩවූ! මරවූ මරවූ මිනිස්සු මරවූ! කියන එකෙන් තමයි අපේ රටේ අපේක්ෂා භංග වෙච්ච, ජීවිතය නැති වෙච්ච, අධ්‍යාපනයෙන් ජීවිතය නුදුන්නු පරම්පරාව ඉතිහාසයේ සනිටුහන් කරලා තිබෙන්නේ. ඒක ජපානයට වුණේ නැහැ. ඒක චීනයට වුණේ නැහැ. ඒක දකුණු කොරියාවට වුණේ නැහැ. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ තත්ත්වය නිවැරදිව හඳුනා ගත්තා. දේශපාලනඥයකු ලෙස එතුමා මේ ප්‍රායෝගික අත් දැකීම ලැබුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනඥයන් වූ අපි කාගේත් හෘදය සාක්ෂිය ඒක දන්නවා. ඉරිදා සෙනසුරාදා දවස්වලට අම්මලා දරුවෝ අරගෙන අප හමු වන්නට එන්නේ මොනවා කියලාද? පසු ගිය සුමානයේ මගේ ළඟට ආවා පෙරදිග සංගීතය "ඒ" සාමාර්ථය ලබා ගත් දරුවෙක්. විභාගයකට මහන්සි වෙලා දරුවකුට "ඒ" සාමාර්ථයට වඩා ඉහළ සාමාර්ථයක් ගන්න බැහැ. ඒ දරුවාට සිංහල භාෂාවට "ඒ" සාමාර්ථයක් තිබෙනවා. විභාගයකට මහන්සි වෙලා දරුවකුට ඊට වඩා සාමාර්ථයක් ගන්න බැහැ. ඊළඟට ඉතිහාසයට "ඒ" සාමාර්ථයක්. "ඒ" සාමාර්ථ තුනයි. ඉල්ලා සිටියේ පාසල් කම්කරු රක්ෂාවක් දෙන්න කියා. වෙන රක්ෂාවක් ඉල්ලුවේ නැහැ. මම මොනරාගල දිස්ත්‍රික්කයේ ඇතිමලේට විද්‍යාලයට ගියා මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරය විවෘත කරන්න. එහිදී දැරියක් මට ලිපියක් ඉදිරිපත් කළා. සුමේධා ජයසේන ඇමතිතුමිය සාක්ෂි දරයි, මම ඒ ලිපිය සභාවට කියෙව්වා. ඒ ලිපිය දුන්නු තරුණිය එතැන හිටියා. මේ ලිපියේ තිබුණු හැටියට ඒ තරුණිය පෙරදිග සංගීතයට "ඒ" සාමාර්ථයක්, සිංහල භාෂාවට "ඒ" සාමාර්ථයක්, භූගෝල විද්‍යාවට "සී" සාමාර්ථයක් ලබා ගෙන තිබෙනවා. Z-score ලකුණු ගණන තිබුණා. සමස්ත ලංකා නර්තන තරගාවලියෙන් පළමුවැනියා වෙලා තිබෙනවා. දහම් පාසල් තරගවලින් පළමුවැනියා වෙලා තිබෙනවා. එම ලිපියේ සඳහන් කර තිබුණේ ඇයට කුමන හෝ රැකියාවක් දෙන්න කියලායි. ඒ තරුණිය ඇතිමලේ. මේ රටේ ලක්ෂ ගණන් දරුවන්ගේ ජීවිතය පිළිබඳ කථාවයි මේ කිව්වේ. පළමුවන ශ්‍රේණියේ සිට ඉගෙන ගෙන පහේ ශිෂ්‍යත්වය කරලා අපොස සාමාන්‍ය පෙළ කරලා අපොස උසස් පෙළ කරලා, හැම අවුරුද්දේම 225,000 බැගින් පසු ගිය අවුරුදු 20ට වල්මත් වූ, අතරමං වූ, ජීවිතය නොදුන්නු අධ්‍යාපනය මඟින් ලක්ෂ 25ක් මනුෂ්‍ය ජීවිත එළියට දමා තිබෙනවා. මේ සඳහා යම් කිසි වෙනසක් ඇති කරන්න ප්‍රබුද්ධ සංවාදයක් මේ රටේ ඇති වුණේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා අපිට කථා කරලා කිව්වා, නිදහස් අධ්‍යාපනයේ දරුවෝ ලෙස මේ රටේ දරු පරම්පරාව වෙනුවෙන් ඔවුන්ට ජීවිතය දෙන, නිපුණතාවය දෙන අධ්‍යාපනයක් ලබා දෙන්න කියා. ඒක මුළු ලෝකයම පිළිගන්නා සත්‍යයක්.

2012 ගෝලීය නියාමන වාර්තාවේ - EFA Global Monitoring Report -2012 එකේ - නිර්දේශ මම ඔබතුමාට කියවන්න කැමැතියි. එහි මෙන්න මේ විධියට සඳහන් වෙනවා:

> "සියලුම යෞවන යෞවනියන්ට සිය දියුණුව සලසා ගැන්ම උදෙසා කුසලතාවල අවශ්‍යතාව මෙම **සියල්ලන්ට අධ්‍යාපනය ගෝලීය නියාමන වාර්තාවෙහි** දස වන මුද්‍රණයෙන් පෙන්වා දෙයි. වාර්තාව හෙළි කරන අන්දමට, තමන්ට අවශ්‍ය කුසලතා නොමැතිව පාසලින් බැහැර වන මිලියන 200 පමණ තරුණ පරපුරක් ලොව පුරා විසිර සිටිති. නාගරික දිළිඳු ප්‍රජාවන්හි හෝ දුර බැහැර ග්‍රාමීය ප්‍රජාවන්හි ජීවත්වන සහ විශේෂයෙන් තරුණ කතුන් බොහෝ දෙනා රැකියා විරහිතව හෝ අඩු වැටුපට වැඩ කරමින් ගත කරති. සිය විභවයන් සාක්ෂාත් කර ගැනීම සඳහා මොවුනට දෙවන අවස්ථාවක් දීම අවශ්‍යය.
>
> විශ්වාසයෙන් යුතුව වැඩ ලෝකය වෙත පිය නැඟීමට හැකියාව මඟින් තරුණ පිරිසට වඩාත් හොඳ ජීවන තත්ත්වයක් රජය විසින් ලබා දිය හැකි ආකාරය **යෞවන පිරිස සහ කුසලතා අධ්‍යාපනය වැඩට යෙදවීම** කෘතියෙන් පෙන්වා දෙයි. අලුතින් සම්පත් රැස් කිරීම සහ ඒවා වඩාත් කාර්යක්ෂම ලෙස යොදා ගත හැකි ආකාරය පිළිබඳව රජයත්, ආධාර ආයතනවල සහ පුද්ගලික අංශයෙහි භූමිකාව හුවා දක්වමින් සියල්ලන්ට අධ්‍යාපනය ලබා දීමේ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා මූල්‍ය ආධාරවල වර්තමාන තත්ත්වය එම කෘතිය තුළ හඳුනාගෙන ඇත.
>
> රටවල් සහ පාලිත ප්‍රදේශයන් 200කට වඩා සියල්ලන්ට අධ්‍යාපනය ලබාදීමේ ඉලක්ක හය ළඟා වන අයුරු මෙම වාර්තාවෙන් නියාමනය වන්නේය. 2015 වන විට එම ඉලක්කයන් වෙත අවසාන වශයෙන් ළඟාවීමට ලඟි ලඟියේ කටයුතු කිරීමත් නොවුණහොත් ප්‍රගතිය නැවතීමට ඉඩ තිබෙන බව එය පෙන්වා දෙයි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෙවර ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ නිපුණතා සංවර්ධනයේ ඇති වැදගත්කම පිළිබඳ ඉතා පැහැදිලි විශේෂ සටහනක් ඇතුළත් වී තිබෙනවා. එම විශේෂ සටහන හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අ.පො.ස.(උ.පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හැදෑරීමේ සියලු භිය සැක අහිමි වන, මේ වැඩ පිළිවෙළ පිළිබඳ විස්තරාත්මක හා සංක්ෂිප්ත විස්තරයක් සඳහන් වන සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය තුනෙන්ම ප්‍රකාශිත අධ්‍යාපන අමාත්‍යාංශයේ "අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීම" නමැති කෘතියත් එහි තිබෙන ජාතික වැදගත්කම සලකා හැන්සාඩ් වාර්තාවේ කොටසක් ලෙස මුද්‍රණය කිරීම පිණිස මම **සභාගත*** කරනවා.

අතිගරු ජනාධිපතිතුමා නිදහස් අධ්‍යාපනයේ දරුවෝ ලෙස අපට මේ වගකීම භාර දුන්නාට පස්සේ ජාතික අධ්‍යාපන කොමිසම, ජාතික අධ්‍යාපන ආයතනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය තින්දුවකට ඇවිල්ලා, ලිඛිත ගිවිසුම් අත්සන් කරලා තමයි අපි මේ තාක්ෂණික විෂය ධාරාවේ විෂයයන් හඳුනා ගත්තේ. එහිදී අපි මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් යුත් කණ්ඩායම රැස් වෙලා ප්‍රථමයෙන්ම වැඩ ලෝකයට මේ විශ්වය තුළ වඩාම ඵලදායී තාක්ෂණවේදී දරුවෙක් නිර්මාණය කරන්න

---

***** ***කථාව අවසානයේ පළ කර ඇත.***
* *உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
* *Produced at end of speech.*

අවශ්‍ය වන විෂයයන් තුනක් අලුතින් හඳුන්වලා දුන්නා. ඉංජිනේරු තාක්ෂණයට, සිවිල් ඉංජිනේරු -ඉදි කිරීම් අංශය හා සම්බන්ධිත- යාන්ත්‍රික ඉංජිනේරු -ලොරි, බස්, කාර්, වෙනත් යන්ත්‍ර සූත්‍ර උපකරණ පිළිබඳව- පිළිබඳ පුහුණුව අයත් වනවා. ඊට පස්සේ විදුලි ඉංජිනේරු. මේක ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ විෂයයක්. එහෙම නැත්නම් ජෛව පද්ධති තාක්ෂණය. කෘෂි කර්මය, පසු අස්වනු තාක්ෂණය, ගොවිපළ කළමනාකරණය, ආහාර තාක්ෂණය, කෘෂි නිෂ්පාදනවල අගය ඉහළ නැංවීම- පිළිබඳ විෂයයක්. ඊළඟට තාක්ෂණය සඳහා විද්‍යාව - Science for Technology - ඉතිරි විෂයය වෙන්නේ කලා හෝ වාණිජ අංශවල තිබෙන විෂයයක්. ගෘහ ආර්ථික විද්‍යාව වෙන්න පුළුවන්, භූගෝල විද්‍යාව, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව, මාධ්‍ය අධ්‍යයනය, ගණකාධිකරණය, චිත්‍ර කර්මය වෙන්න පුළුවන්, එවැනි විෂයයක් තෝරා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ගුරුවරුන්ගේ හිඟය පිළිබඳව කථා කළා. තුන්වැනි විෂයය සඳහා කිසිම ගුරුවරයෙකුගේ හිඟයක් නැහැ. දැනට කලා හා වාණිජ අංශවල ඉගෙනුම ලබන උපාධිධාරී ගුරුවරුන්ට එම විෂයය උගන්වන්න පුළුවන්. දෙවැනි විෂයය සඳහා ගුරුවරුන්ගේ කිසිම ප්‍රශ්නයක් නැහැ. මක් නිසාද යත්, විද්‍යා උපාධිධාරීන්ට විද්‍යාව විෂයය සඳහා තාක්ෂණය විෂය නිර්දේශයේ තිබෙන මූලධර්ම ටික උගන්වන්න පුළුවන්. ඒ සඳහා අවශ්‍ය සියලුම හිඟ ගුරුවරු බඳවා ගැනීම සඳහා 6වැනි දා 22,000ක් උපාධිධාරීන් සහභාගී වුණු විභාගය පවත්වලා තිබෙනවා. මේ නිවාඩු මාසය අවසන් වෙන්න කලින් අ.පො.ස. (උ.පෙළ) පන්තිවල වාණිජ, විද්‍යා, තාක්ෂණික අංශයේ ගුරු හිඟය පියවන්න අවශ්‍ය කටයුතු යොදලා තිබෙනවා. අපි ඉංජිනේරු තාක්ෂණය හා ජෛව පද්ධති තාක්ෂණය සඳහා කැබිනට් අනුමැතිය ඇතිව යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ පුහුණුව ලත් උපදේශකවරුන්ට මසකට රුපියල් 10,000ක ගමන් වියදමක් යටතේ ඔවුන්ගේ සේවය ලබා ගන්න පුහුණු කිරීමේ කටයුතු කරලා ඒ අය ලබා දීලා තිබෙනවා. එතකොට අස් වීමේ සහතිකය දීලා එළියට දාන දරුවෝ වෙනුවට ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට මේ විෂය ඉගෙන ගන්නා සියලුම දරුවන්ට මෙම විභාගය සමත් වුණත්, නුනත් නිපුණතා සහතිකයක් ලැබෙන NVQ 3 ලැබෙනවා. ඒ නිසා ප්‍රථම වතාවට අපේ රටේ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා සහතිකයක් පාසල් දරුවන්ට පාසල් කාලය අවසානයේ ලබා දීමේ ඓතිහාසික වැදගත් කාර්ය භාරය මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ඉෂ්ට කරලා තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේ මතක් කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෙම පාඨමාලාව ඉතාම සාර්ථක ලෙස නිම කරන දරුවන්ට විශ්වවිද්‍යාලය තුළ දැනට පවතින වෘත්තීය අංශයේ පාඨමාලා 40ක තිබෙන උපාධිය ලබා ගැනීම සඳහා අවස්ථාව තිබෙනවා. ඊට අතිරේකව අද ගරු එස්.බී. දිසානායක ඇමතිතුමා සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ලිඛිතව අපට පොරොන්දු වෙලා තිබෙනවා, 2016 වෙන කොට ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ විද්‍යා අංශය, - Science Faculty එක- විද්‍යා හා තාක්ෂණික අංශය - Science and Technology Faculty - බවට පරිවර්තනය කරන බව. අපේ විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පමණක් අලුතින්ම තාක්ෂණ පීඨයක් පටන් ගන්නවා. ඒ තාක්ෂණ පීඨයට පමණක් B.Tech - Bachelor of Technology - උපාධිය සඳහා 450ක් බඳවා ගන්නවා.

2016 දී මේ පාඨමාලාව හදාරන්න දළ වශයෙන් දරුවන් 2,000කට පමණ ජාතික විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළු වීමේ අවස්ථාව තිබෙනවා. ඊට පස්සේ විශ්වවිද්‍යාල විද්‍යාතනවල තව දරුවන් 7,500කට අවස්ථාව තිබෙනවා. German Technical Training Institute, UNIVOTEC ආදී වෙනත් උසස් තාක්ෂණික ආයතනවලට ඇතුළු වීමේ අවස්ථාව තිබෙනවා. මීට වඩා ජීවිතය පිළිබඳ අවස්ථාවන් තිබෙන විෂය ධාරාවක්ද අපි මේ දරුවන්ට ලබා දෙන්නේ කියන ප්‍රශ්නයයි ඔබ විසින් ප්‍රශ්න කළ යුතුව තිබුණේ. අධ්‍යාපනයට කරන වියදම වැඩි කරලා, කිසිම ඵලදායි නිෂ්පාදනයකට එකතු වන්නේ නැති, නිකම්ම නිකම් දරුවෝ බිහි කරනවා වෙනුවට හිතනවාට වඩා වැඩිපුර යමක් හිතන්න පුළුවන්, පෙනෙනවාට වඩා වැඩිපුර යමක් දකින්නට පුළුවන්, ඇසෙනවාට වඩා වැඩිපුර යමක් අහලා මේ ලෝකයට අලුත් අගයක් එකතු කරන්නට පුළුවන් මානව ප්‍රාග්ධනයක් බවට මේ දරුවෝ පත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාව කිසිම ගෘහ සේවිකාවක් පිට රටට යවන්නේ නැහැ. ඇයි? ඔවුන්ට පුහුණු ශ්‍රමය තිබෙනවා. අද මේ පුහුණු ශ්‍රමය පිළිබඳව ඩලස් අලහප්පෙරුම ගරු ඇමතිතුමා සඳහන් කළ පරිදි, විශ්වය තුළ තිබෙන ඉල්ලුම සම්පූර්ණ කරන්නේ නැතුව ඉන්න අවධියක මේ තාක්ෂණික විෂය ධාරාව හදාරන සියලු දරුවන්ට අනාගතය හා ජීවිතය පිළිබඳව සහතිකයක් ලැබෙනවා. මෙපමණ කල් ලංකාවේ අධ්‍යාපනයෙන් දුන්නේ, සහතික තුනක්. නමුත් මේ තාක්ෂණවේදී විෂය ධාරාව මඟින් අපි දරුවන්ට ජීවිතය දෙනවා. ඒ නිසා දේශපාලන වශයෙන් කිසිම වාසියක් හෝ ප්‍රයෝජනයකට වඩා උපනූපන් පරම්පරාවල අනාගතය නිවැරදිව පෙළ ගස්වන්න අධ්‍යාපනයේ ඇති කළ දැවැන්තම හැරවුම ලෙසයි තාක්ෂණ විෂය ධාරාව මේ 15වැනි දා අපි ඉගැන්වීමට පටන් ගන්නේ කියන එක මා මේ ගරු සභාවට මතක් කරන්න කැමැතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විනාඩි දෙකකින් අවසන් කරනවා.

හිරෝෂිමාවට බෝම්බ දාලා ජපානය විනාශ වුණු අවස්ථාවෙන් පසුව, අපිට නිදහස ලැබෙන කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජපානයේ ඒකපුද්ගල ආදායම අපට වඩා ඩොලර් 2කිනුයි වැඩිය තිබුණේ. ජපානය අධ්‍යාපන ක්‍රමය වෙනස් කළා. ඔවුන් පාඩම් තුනක් කියලා දුන්නා.

පළමුවන එක, උපන්න මිනිසෙකු ලෙස තමන් සියලුම මිනිසුන්ට ගරු කරන්න කියන එකයි. මිනිසුන්ට ආදරය කරන්න. පාසල් දරුවාට කියා දුන් පාඩම ඒකයි. අදත් ඕනෑම ජපන් ජාතිකයකු මිනිසෙකු දැක්කාම නැමිලා bow කරනවා. ඒ පළමුවැනි පාඩමයි. දෙවැනි පාඩම, සතා සිවුපාවා ඇතුළු පරිසරයට ආදරය කරන්න කියන එකයි. හරිත නගරයක් ඇති කරන්න. ඔවුන් ගස් සිටෙව්වා මිසක් ගස් කැපුවේ නැහැ. ඒ දරුවෝ සතා සිවුපාවාට හා ගහ කොළට ආදරය කළා. තුන්වන පාඩම පාසල් ශිෂ්‍යයන් පාසල තුළත්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලය තුළත්, ගොවීන් ගොවි පොළ තුළත්, කම්කරුවන් කම්හල තුළත් වැඩි වැඩියෙන් වැඩ කරන්නය කියන එකයි. ඒ පාඩම් තුන ඔවුන්ට කියා දුන්නා. මේ පාඩම් තුනෙන් ජපානය ආසියාවේ ආශ්චර්යය බවට පත් වෙලා ලෝකයේ මහා කාර්මික බලවතෙකු බවට පත් වුණා. චීනය, කොරියාව, තායිලන්තය හා සිංගප්පූරුව යන ඒ අවට සියලු රාජ්‍යයන්ට වුණෙත් එයයි. අපි පස්සට ගියා නම් ගියේ නිපුණතා රහිත අධ්‍යාපන ක්‍රමයක් දරුවන්ට ලබා දීමෙනුයි. ඒ නිසා මහින්ද චින්තන ඉදිරි දැක්මට පින් සිද්ධ වන්න අතිගරු ජනාධිපතිතුමා ඇතුළු මේ සඳහා උර දුන්නු, වචනයෙන් හෝ සහය දුන්න ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ සියලු දෙනාම, සියලුම මිනිසුන්, දරුවන්ට ආදරය කරන අය කළේ මෙ ලෝ වශයෙන් කීර්තියක්; පර ලෝ වශයෙන් පින්කමක්. ඒ පින්කම තුළින් මේ රටේ අනාගතයේ උපදින දරුවෝ විශ්වයට සම්පතක් වන, තමන් හැදූ වැඩූ දෙමව්පියන්ට ගෞරවයක් හා අභිමානයක් වන, රටටම වාසනාවක් වන මානව ප්‍රාග්ධනයක් බවට පත් කර ගන්න අපි එකතු වෙලා වැඩ කරමු කියන ප්‍රාර්ථනයෙන්, සැමට සුබ අනාගතයක් වේවා කියලා මගේ වචන කීපය අවසන් කරනවා.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තබන ලද ලියවිලි:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள் :*
*Documents tabled:*

**Selected Schools for New Technological A/L Stream**

| Province | Selected Schools | | | | |
|---|---|---|---|---|---|
| | National | Provincial | Sinhala | Tamil | Total |
| 1.Western | 24 | 26 | 49 | 01 | 50 |
| 2.Central | 21 | 14 | 25 | 10 | 35 |
| 3.Southern | 26 | 09 | 33 | 02 | 35 |
| 4.Nothern | 06 | 12 | 01 | 17 | 18 |
| 5.Eastern | 09 | 11 | 05 | 15 | 20 |
| 6.North Western | 15 | 09 | 21 | 03 | 24 |
| 7.North Central | 05 | 15 | 20 | 00 | 20 |
| 8.Uva | 17 | 04 | 18 | 03 | 21 |
| 9.Sabaragamuwa | 15 | 04 | 18 | 01 | 19 |
| **Total** | **138** | **104** | **190** | **52** | **242** |

**Selected National Schools for New Technological A/L stream**

| CensusNo | Name | Address | Province | District | Electorate | Students | Medium |
|---|---|---|---|---|---|---|---|
| 00023 | KOTAHENA CENTRAL COLLEGE | MAHA VIDYALA MAHAWATHA,COLO | 1.Western | Colombo | Colombo Central | 771 | Sin |
| 00051 | GOTHAMI B.V. | TEMPLE RD.,COL-10 | 1.Western | Colombo | Borella | 3,144 | Sin |
| 00066 | DEVI B.V. | SRI JAYAWARDANAPURA MW.,COL- | 1.Western | Colombo | Colombo East | 2,797 | Sin |
| 00078 | LUMBINI V. | HAVELOCK TOWN,COL-05. | 1.Western | Colombo | Colombo West | 2,783 | Sin |
| 00131 | KUDABUTHGAMUWA SRI RAJASINGHE V. | KUDABUTHGAMUWA, MULLERIYAW | 1.Western | Colombo | Kolonnawa | 1,098 | Sin |
| 00248 | SRI SUBHUTHI M.M.V. | BATTARAMULLA | 1.Western | Colombo | Kaduwela | 1,250 | Sin |
| 00250 | BOMIRIYA M.M.V. | KADUWELA | 1.Western | Colombo | Kaduwela | 3,201 | Sin |
| 00283 | SEETAWKA M.M.V. | AVISSAWELLA | 1.Western | Colombo | Awissawella | 2,543 | Sin |
| 00316 | RAJASINGHE CENTRAL COLLEGE | HANWELLA | 1.Western | Colombo | Awissawella | 2,658 | Sin |
| 00418 | PILIYANDALA M.M.V. | PILIYANDALA | 1.Western | Colombo | Kesbewa | 3,376 | Sin |
| 00457 | MAHINDA RAJAPAKSHA COLLEGE | PITIPANA, HOMAGAMA | 1.Western | Colombo | Homagama | 1,538 | Sin |
| 01028 | D.S.SENANAYAKA | MIRIGAMA | 1.Western | Gampaha | Mirigama | 1,781 | Sin |
| 01083 | BANDARANAYAKA M.M.V | VEYANGODA | 1.Western | Gampaha | Mirigama | 3,088 | Sin |
| 01136 | BANDARANAYAKA COLLEGE | GAMPAHA | 1.Western | Gampaha | Gampaha | 4,510 | Sin |
| 01137 | RATHNAWALI BALIKA V. | COLOMBO ROAD, GAMPAHA | 1.Western | Gampaha | Gampaha | 3,764 | Sin |
| 01228 | SIYANE NATIONAL SCHOOL | PALUGAMA,DOMPE | 1.Western | Gampaha | Dompe | 537 | Sin |
| 01336 | AL MUBARAK M.M.V. | MALWANA | 1.Western | Gampaha | Biyagama | 1,693 | Tam |
| 01379 | SRI PANGNANDA NATIONAL SSHOOL | RADDOLUWA, KOTUGODA. | 1.Western | Gampaha | Katana | 2,014 | Sin |
| 01502 | SENERATH PARANAVITHANA NATIONAL M.V | UDUGAMPOLA | 1.Western | Gampaha | Minuwangoda | 1,294 | Sin |
| 02003 | ST JOHN'S M.V. | PANADURA | 1.Western | Kalutara | Panadura | 2,131 | Sin |
| 02083 | TAXILA M. M. V. | AGURUWATHOTA ROAD , HORANA | 1.Western | Kalutara | Horana | 4,315 | Sin |
| 02133 | BULATHSINGHALA M.M.V. | BULATHSINGHALA | 1.Western | Kalutara | Bulathsinhala | 2,709 | Sin |
| 02181 | ANANDA SASTRALAYA | MATUGAMA | 1.Western | Kalutara | Matugama | 3,042 | Sin |
| 02282 | BERUWALA D.S. SENANAYAKE M.M.V | BEUAWALA | 1.Western | Kalutara | Beruwala | 736 | Sin |
| 03011 | K/HATARALIYADDA CENTRAL COLLEGE | HATARALIYADDA. | 2.Central | Kandy | Galagedara | 1,047 | Sin |
| 03048 | ALAWATHUGODA C C | ALAWATHUGODA | 2.Central | Kandy | Harispattuwa | 775 | Sin |
| 03075 | NUGAWELA CENTRAL COLLEGE | NUGAWELA CENTRAL COLLEGE NU | 2.Central | Kandy | Harispattuwa | 2,261 | Sin |
| 03169 | RANASINGHE PREMADASA N.S | HASALAKA | 2.Central | Kandy | Teldeniya | 866 | Sin |
| 03184 | K/TELDENIYA NATIONAL SCHOOL | TELDENIYA | 2.Central | Kandy | Teldeniya | 1,622 | Sin |
| 03263 | MADINA MUS.C.C | MADAWALA BAZAAR | 2.Central | Kandy | Pathadumbara | 1,848 | Tam |
| 03382 | PUSHPADANA GIRLS' COLLEGE | KANDY | 2.Central | Kandy | Kandy | 2,530 | Sin |
| 03406 | SWARNAJOTHI NATIONAL SCHOOL | KIRIBATHKUMBURA | 2.Central | Kandy | Yatinuwara | 1,017 | Sin |
| 03441 | D.B.WIJETHUNGA NATIONAL SCHOOL | DASKARA MURUTHAGAHAMULA | 2.Central | Kandy | Udunuwara | 688 | Sin |
| 03488 | WICKRAMABAHU NATIONAL SCHOOL | GAMPOLA | 2.Central | Kandy | Gampola | 1,226 | Sin |
| 03553 | ANURUDDHA KUMARA NATIONAL SCHOOL | NAWALAPITIYA | 2.Central | Kandy | Nawalapitiya | 856 | Sin |

**Selected National Schools for New Technological A/L stream**

| CensusNo | Name | Address | Province | District | Electorate | Students | Medium |
|---|---|---|---|---|---|---|---|
| 03617 | HINDU NATIONAL COLLEGE | NUWARAELIYA ROAD,PUSSELLAWA | 2.Central | Kandy | Gampola | 989 | Tam |
| 03648 | AL-MANAR CENTRAL COLLEGE | HANDESSA | 2.Central | Kandy | Udunuwara | 976 | Tam |
| 04003 | RANGIRI DAMBULLA CENTRAL COLLEGE | DMBULLA | 2.Central | Matale | Dambulla | 2,544 | Sin |
| 04093 | SRINAGA N.S. | NAULA | 2.Central | Matale | Laggala | 1,486 | Sin |
| 04175 | ST THOMAS COLLEGE | MATALE | 2.Central | Matale | Matale | 2,453 | Sin |
| 04263 | AJMEER NATIONAL SCHOOL | ELKADUWA ROAD UKUWELA | 2.Central | Matale | Rattota | 842 | Tam |
| 05001 | GAMINI N.S | NUWARAELIYA | 2.Central | Nuwara Eliya | N'eli-Maskeli | 1,433 | Sin |
| 05071 | CP/KOT/GAMINI DISSANAYAKE NATIONAL S | NEW TOWN, KOTHMALE | 2.Central | Nuwara Eliya | Kotmale | 1,152 | Sin |
| 05111 | SRI SUMANGALA.N.S. | NILDANDAHINNA | 2.Central | Nuwara Eliya | N'eli-Maskeli | 1,190 | Sin |
| 05428 | PORAMADULLA N S | PORAMADULLA, RIKILLAGASKADA | 2.Central | Nuwara Eliya | Hanguranketa | 3,083 | Sin |
| 06068 | KARANDINIYA M.M.V. | KARANDENIYA | 3.Southern | Galle | Karandeniya | 3,088 | Sin |
| 06141 | ANANDA M.M.V | ELPITIYA | 3.Southern | Galle | Bentara-Elpitiy | 2,754 | Sin |
| 06180 | G/NELWA NATIONAL SCHOOL | NELUWA GALLE | 3.Southern | Galle | Hiniduma | 2,307 | Sin |
| 06218 | G/NAGODA ROYAL COLLEGE | NAGODA,GALLE | 3.Southern | Galle | Hiniduma | 1,258 | Sin |
| 06317 | SRI SUMANGALA M.V. | NALAGASDENIYA, HIKKADUWA | 3.Southern | Galle | Rathgama | 1,091 | Sin |
| 06318 | DEVAPATHIRAJA COLLEGE. | RATHGAMA. | 3.Southern | Galle | Rathgama | 2,158 | Sin |
| 06457 | KATHALUWA CENTRAL COLLEGE | KATHALUWA,AHANGAMA | 3.Southern | Galle | Habaraduwa | 555 | Sin |
| 06459 | BATEMULLA NATIONAL SCHOOL | IMADUWA GALLE | 3.Southern | Galle | Habaraduwa | 1,870 | Sin |
| 06497 | MALHARUSSULHIYA NATIONAL SCHOOL | H.K.EDMOND MAWATHA,GALLE | 3.Southern | Galle | Galle | 872 | Sin |
| 07017 | KEERTHI ABEWICKRAMA NATIONAL SCHOO | DENIYAYA ROAD,MORAWAKA | 3.Southern | Matara | Deniyaya | 1,685 | Sin |
| 07146 | NARANDENIYA M.M.V. | NATIONAL SCHOOL,KAMBURUPITIY | 3.Southern | Matara | Kamburupitiya | 1,964 | Sin |
| 07225 | DEIYANDARA NATIONAL COLLEGE | DEIYANDARA. | 3.Southern | Matara | Hakmana | 1,796 | Sin |
| 07258 | SIDDHARTHA COLLEGE | WELIGAMA | 3.Southern | Matara | Weligama | 2,077 | Sin |
| 07283 | ARAFA CENTRAL COLLEGE | WELIGAMA | 3.Southern | Matara | Weligama | 1,110 | Tam |
| 07309 | MATARA CENTRAL COLLEGE | RAHULA ROAD,MATARA | 3.Southern | Matara | Matara | 3,672 | Sin |
| 07406 | RASSANDENIYA M.R. N.S. | MATARA | 3.Southern | Matara | Matara | 240 | Sin |
| 08001 | H/WALASMULLA NATIONAL SCHOOL | WALASMULLA | 3.Southern | Hambantota | Mulkirigala | 3,210 | Sin |
| 08038 | RAJAPAKSHA CENTRAL COLLEGE | WEERAKATIYA | 3.Southern | Hambantota | Mulkirigala | 4,182 | Sin |
| 08073 | H/TANGALLE BOYS NATIONAL SCHOOL | TANGALLE | 3.Southern | Hambantota | Tangalla | 1,079 | Sin |
| 08074 | H/TANGALLE BALIKA VIDYALAYA | TANGALLE | 3.Southern | Hambantota | Tangalla | 2,720 | Sin |
| 08144 | H/GETAMANNA VIJAYA NATIONAL SCHOOL | GETAMANNA,BELIATTA | 3.Southern | Hambantota | Beliatta | 468 | Sin |
| 08229 | H/DEBARAWEWA M.M.V | DEBARAWEWA,TISSAMAHARAMA. | 3.Southern | Hambantota | Tissamaharamaya | 2,607 | Sin |
| 08275 | THERAPUTTHA N. V | WADURUPPA ROAD, AMBALANTOTA | 3.Southern | Hambantota | Tangalla | 2,204 | Sin |
| 08276 | ST.MARY'S COLLEGE | HAMBANTOTA | 3.Southern | Hambantota | Tissamaharamaya | 1,239 | Sin |
| 08280 | ZAHIRA N.S. | HAMBANTOTA | 3.Southern | Hambantota | Tissamaharamaya | 616 | Tam |

**Selected National Schools for New Technological A/L stream**

| CensusNo | Name | Address | Province | District | Electorate | Students | Medium |
|---|---|---|---|---|---|---|---|
| 08339 | RUHUNU VIJAYABA NATIONAL SCHOOL | SITINAMALUWA, BELIATTA | 3.Southern | Hambantota | Beliatta | 3,680 | Sin |
| 09166 | MANIPAY HINDU COLLEGE | MANIPAY | 4.Nothern | Jaffna | Vaddukkodai | 968 | Tam |
| 09269 | J/NELLIADY MADHYA MAHA VIDYALAYAM | KARAVEDDY | 4.Nothern | Jaffna | Uduppiddy | 1,194 | Tam |
| 09353 | CHAVAKACHCHERI HINDU COLLEGE | KANDY ROAD SANKATHTHANAI CHA | 4.Nothern | Jaffna | Chavakachcheri | 2,266 | Tam |
| 09416 | JAFFNA HINDU COLLEGE | JAFFNA HINDU COLLEGE, JAFFNA | 4.Nothern | Jaffna | Nallur | 2,375 | Tam |
| 09465 | J/VEMBADY GIRLS' HIGH SCHOOL | 1ST CROSS STREET JAFFNA | 4.Nothern | Jaffna | Jaffna | 2,140 | Tam |
| 13111 | MADUKANDA NATIONAL SCHOOL | MADUKANDA VAVUNIYA | 4.Nothern | Vavuniya | Vavuniya | 417 | Sin |
| 14018 | BT/BC/ODDAMAVADY CENTRAL COLLEGE(N | ODDAMAVADY | 5.Eastern | Batticaloa | Kalkudah | 1,752 | Tam |
| 14022 | BT/BC/VALAICHENAI ANNOOR MAHA VIDYAL | VALAICHENI | 5.Eastern | Batticaloa | Kalkudah | 1,049 | Tam |
| 14145 | BT/BC/KATTANKUDY CENTRAL COLLEGE | 322,BEACH ROAD,NEW KATTANKUD | 5.Eastern | Batticaloa | Batticaloa | 2,482 | Tam |
| 15161 | KM/ST/SAMMANTHURAI.M.M.M.VID(NATIONA | KM/ST/SAMMANTHURAI.M.M.VID(N.S | 5.Eastern | Ampara | Samanturai | 2,823 | Tam |
| 15200 | ZAHIRA COLLEGE (N/S) | ZAHIRA COLLEGE ROAD,AAINTHAM | 5.Eastern | Ampara | Kalmunai | 2,549 | Tam |
| 15231 | AKKARAIPATTU MUSLIM CENTRAL COLLEGE | AKKARAIPATTU | 5.Eastern | Ampara | Samanturai | 1,437 | Tam |
| 15248 | ADDALAICHNAI MMV | MAIN STREET ADDALAICHENAI | 5.Eastern | Ampara | Pothuvil | 2,354 | Tam |
| 15290 | SRI RAMAKRISHNA COLLEGE | NATIONAL SCHOOL AKKARAIPATTU | 5.Eastern | Ampara | Pothuvil | 1,290 | Tam |
| 16175 | T/MU/MUTUR CENTRAL COLLEGE | KNOX ROAD MUTUR | 5.Eastern | Trincomalee | Mutur | 1,079 | Tam |
| 17001 | PARACKAMABAHU NATIONAL SCHOOL | POLGAHAWELA | 6.North Western | Kurunegala | Polgahawela | 1,837 | Sin |
| 17234 | S.B.HERATH M.M.V. | GANEWATHTHA,NIKADALUPOTHA. | 6.North Western | Kurunegala | Hiriyala | 1,299 | Sin |
| 17265 | MAYURAPADA M.M.V. | NARAMMALA | 6.North Western | Kurunegala | Dambadeniya | 3,192 | Sin |
| 17464 | J.R.JAYAWARDANA.M.M.V | DUMMALASURIYA | 6.North Western | Kurunegala | Bingiriya | 390 | Sin |
| 17489 | KULIYAPITIYA CENTRAL COLLAGE | KULIYAPITIYA | 6.North Western | Kurunegala | Kuliyapitiya | 3,525 | Sin |
| 17522 | SANDALANKAWA M.M.V. | SANDALANKAWA | 6.North Western | Kurunegala | Katugampola | 1,627 | Sin |
| 17613 | S.W.R.D.BANDARANAYAKE M.M.V. | HETTIPOLA | 6.North Western | Kurunegala | Panduwasnuwara | 2,014 | Sin |
| 17663 | KEKUNAGOLLA MUS.M.M.V. | KEKUNAGOLLA | 6.North Western | Kurunegala | Kuliyapitiya | 2,101 | Tam |
| 17708 | MAHAWA VIJAYABA N.S. | MAHAWA. | 6.North Western | Kurunegala | Yapahuwa | 2,848 | Sin |
| 17767 | PERAKUMPURA.N.S. | TRACK3,SOLEPURA. | 6.North Western | Kurunegala | Galgamuwa | 555 | Sin |
| 17838 | MAHASEN NATIONAL SCHOOL | NIKAWERATIYA | 6.North Western | Kurunegala | Nikaweratiya | 2,626 | Sin |
| 17867 | SRI PARACKRAMA NATIONAL SCHOOL | KOBEIGANE | 6.North Western | Kurunegala | Nikaweratiya | 1,314 | Sin |
| 18073 | ZAHIRA NATIONAL SCHOOL | PUTTALAM | 6.North Western | Puttalam | Puttalam | 1,573 | Tam |
| 18199 | ANANDA NATIONAL SCHOOL | COLOMBO ROAD,CHILAW | 6.North Western | Puttalam | Chilaw | 3,619 | Sin |
| 18218 | SENANAYAKE NATIONAL SCHOOL | MADAMPE | 6.North Western | Puttalam | Chilaw | 1,922 | Sin |
| 19001 | MAITHIPALA SENANAYAKE M.M.V. | MEDAWACHCHIYA | 7.North Central | Anuradhapura | Medawachchiya | 2,940 | Sin |
| 20001 | MINNERIYA N.S. | HINGURAKGODA | 7.North Central | Polonnaruwa | Minneriya | 1,315 | Sin |
| 20002 | ANANDA BALIKA N.S | HINGURAKGODA | 7.North Central | Polonnaruwa | Minneriya | 1,924 | Sin |
| 20035 | MEDIRIGIRIYA N.S. | MEDIRIGIRIYA | 7.North Central | Polonnaruwa | Medirigiriya | 2,656 | Sin |

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

**Selected National Schools for New Technological A/L stream**

| CensusNo | Name | Address | Province | District | Electorate | Students | Medium |
|---|---|---|---|---|---|---|---|
| 20069 | ROYAL CENTRAL COLLEGE | POLONNARUWA | 7.North Central | Polonnaruwa | Minneriya | 3,148 | Sin |
| 21026 | MAHIYANGANA NATIONAL SCHOOOL | MAHIYANGANAYA | 8.Uva | Badulla | Mahiyangana | 3,409 | Sin |
| 21071 | KANDEGEDARA M.M.V | KANDEGEDARA-HALIELA | 8.Uva | Badulla | Wiyaluwa | 553 | Sin |
| 21105 | MEEGAHAKIULA NATIONAL SCHOOL | MEEGAHAKIULA | 8.Uva | Badulla | Wiyaluwa | 554 | Sin |
| 21125 | PASSARA M.M.V. | PASSARA | 8.Uva | Badulla | Passara | 1,328 | Sin |
| 21173 | BADULLA M.M.V | BADULLA | 8.Uva | Badulla | Badulla | 3,796 | Sin |
| 21234 | VISHAKA BALIKA M.M.V | BANDARAWELA | 8.Uva | Badulla | Bandarawela | 1,593 | Sin |
| 21276 | SRI JANANANDA NATIONAL SCHOOL | KADURUGAMUWA,DIYATHALAWA | 8.Uva | Badulla | Haputale | 560 | Sin |
| 21277 | WALHAPUTHENNA M.M.V | WALHAPUTHENNA,HALDUMMULLA | 8.Uva | Badulla | Haputale | 708 | Sin |
| 21311 | WELIMADA M.M.V. | WELIMADA | 8.Uva | Badulla | Welimada | 1,992 | Sin |
| 21464 | SARASWATHY CENTRAL COLLEGE | MAHIYANGANA ROAD BADULLA | 8.Uva | Badulla | Badulla | 802 | Tam |
| 21511 | PASSARA TAMIL M.V. | PASSARA | 8.Uva | Badulla | Passara | 1,256 | Tam |
| 22001 | MO/WELLASSA N.S. | HEWELWELA-BIBILE | 8.Uva | Monaragala | Bibile | 1,283 | Sin |
| 22005 | MO/MEDAGAMA N.S. | MEDAGAMA-BIBILE. | 8.Uva | Monaragala | Bibile | 1,254 | Sin |
| 22069 | MAHANAMA M.M.V. | MONARAGALA | 8.Uva | Monaragala | Monaragala | 1,836 | Sin |
| 22111 | NISHSHNAKA M.M.V. | BADLKUMBURA | 8.Uva | Monaragala | Monaragala | 2,077 | Sin |
| 22146 | MO/MALWATTAWALA M.M.V. | WELLAWAYA | 8.Uva | Monaragala | Wellawaya | 1,603 | Sin |
| 22149 | MO/DUTUGEMUNU M.M.V. | BUTTALA | 8.Uva | Monaragala | Wellawaya | 1,887 | Sin |
| 23001 | EHELIYAGODA M.M.V | EHELIYAGODA | 9.Sabaragamuwa | Ratnapura | Eheliyagoda | 3,025 | Sin |
| 23061 | SUMANA BALIKA VIDYALAYA | RATHNAPURA | 9.Sabaragamuwa | Ratnapura | Rathnapura | 3,501 | Sin |
| 23092 | SIVALI CENTRAL COLLAGE | HIDELLANA,RATHNAPURA | 9.Sabaragamuwa | Ratnapura | Rathnapura | 3,080 | Sin |
| 23123 | GANKANDA CENTRAL COLLEGE | PELMADULLA | 9.Sabaragamuwa | Ratnapura | Pelmadulla | 2,197 | Sin |
| 23209 | BALANGODA ANANDA MAITHRIYA M.M.V. | BALANGODA. | 9.Sabaragamuwa | Ratnapura | Balangoda | 2,803 | Sin |
| 23247 | RAHULA M.M.V. | GODAKAWELA | 9.Sabaragamuwa | Ratnapura | Rakwana | 1,726 | Sin |
| 23319 | KARAVITA CENTRAL COLLEGE | KARAWITA UDA KARAWITA | 9.Sabaragamuwa | Ratnapura | Kalawana | 1,440 | Sin |
| 23400 | KALAWANA NATIONAL SCHOOOL | KALAWANA | 9.Sabaragamuwa | Ratnapura | Kalawana | 2,106 | Sin |
| 23431 | KOLONNA M.M.V | KOLONNA | 9.Sabaragamuwa | Ratnapura | Kolonnawa | 785 | Sin |
| 24042 | DR.N.M.PERERA M.M.V. | YATIYANTOTA | 9.Sabaragamuwa | Kegalle | Yatiyantota | 1,345 | Sin |
| 24066 | DEHIOWITA NATIONAL SCHOOL | DEHIOWITA | 9.Sabaragamuwa | Kegalle | Ruwanwella | 1,176 | Sin |
| 24112 | SIRISAMAN M.M.V. | JINADASA MAWATHA DERANIYAGAL | 9.Sabaragamuwa | Kegalle | Deraniyagala | 1,424 | Sin |
| 24158 | PINDENIYA VIDYACKKRAWARTHI M.M.V | PINDENIYA ATALA | 9.Sabaragamuwa | Kegalle | Galigamuwa | 947 | Sin |
| 24321 | PINNAWALA M.M.V | RABUKKANA | 9.Sabaragamuwa | Kegalle | Rambukkana | 2,882 | Sin |
| 24381 | RIVISANDA M.M.V | USSAPITIYA | 9.Sabaragamuwa | Kegalle | Aranayaka | 2,470 | Sin |

**Selected Provincial Schools for New Technological A/L stream**

| CensusNo | Name | Address | Province | District | Electorate | Student | Medium |
|---|---|---|---|---|---|---|---|
| 00002 | MODARA ANANDA M.M.V. | MODARA,COL-15. | 1.Western | Colombo | Colombo North | 1,004 | Sin |
| 00093 | S.DE.S.JAYASINGHE M.M.V. | KARAGAMPITIYA, DEHIWELA | 1.Western | Colombo | Dehiwala | 1,150 | Sin |
| 00113 | KOTHALAWALAPURA M.V. | RATMALANA | 1.Western | Colombo | Rathmalana | 367 | Sin |
| 00158 | HEWAVITHARANA M.V. | RAJAGIRIYA RD., RAJAGIRIYA. | 1.Western | Colombo | Kotte | 1,090 | Sin |
| 00170 | SRI SUNANDOPANNADA NAVODYA M.V. | EGODAUYANA,MORATUWA | 1.Western | Colombo | Moratuwa | 432 | Sin |
| 00317 | SIRIPIYARATHANA CENTRAL COLLEGE | PADUKKA | 1.Western | Colombo | Awissawella | 2,879 | Sin |
| 00319 | BOPE RAJASINGHE M.V. | BOPE, PADUKKA | 1.Western | Colombo | Awissawella | 657 | Sin |
| 00349 | HOMAGAMA CENTRAL COLLEGE | COURTS ROAD, HOMAGAMA. | 1.Western | Colombo | Homagama | 2,375 | Sin |
| 00351 | WETHARA MAHA VIDYALAYA | POLGASOVITA | 1.Western | Colombo | Homagama | 392 | Sin |
| 00398 | MAHARAGAMA M.M.V. | GAMMANA RD., MAHARAGAMA. | 1.Western | Colombo | Maharagama | 1,080 | Sin |
| 00404 | MAHAMAYA B.V. | PEPILIYANA RD., NUGEGODA. | 1.Western | Colombo | Maharagama | 1,357 | Sin |
| 00419 | DHARMARAJA MAHA VIDYALAYA | MAMPE, PILIYANDALA | 1.Western | Colombo | Kesbewa | 1,038 | Sin |
| 01086 | URAPOLA M.M.V. | URAPOLA | 1.Western | Gampaha | Attanagalla | 1,550 | Sin |
| 01188 | KIRILLAWALA M.M.V | KIRILLAWALA , KADAWATHA | 1.Western | Gampaha | Mahara | 2,905 | Sin |
| 01189 | BUTHPITIYA M.V. | BUTHPITIYA | 1.Western | Gampaha | Mahara | 305 | Sin |
| 01226 | KIRINDIWELA M.M.V. | KIRINDIWELA | 1.Western | Gampaha | Dompe | 2,137 | Sin |
| 01293 | BIYAGAMA M.M.V. | BIYAGAMA | 1.Western | Gampaha | Biyagama | 1,068 | Sin |
| 01303 | SRI SUMANGALA M.V | ERIYAWETIYA , KELANIYA | 1.Western | Gampaha | Kelaniya | 953 | Sin |
| 01424 | SRI GNANODAYA M.M.V | DIVULAPITIYA | 1.Western | Gampaha | Divulapitiya | 1,481 | Sin |
| 01544 | BATUWATTA M.V. | RAGAMA | 1.Western | Gampaha | Ja-Ela | 964 | Sin |
| 02041 | WEVITA MAITHREE M.V. | WEVITA BANDARAGAMA | 1.Western | Kalutara | Bandaragama | 1,369 | Sin |
| 02087 | PALANNORUWA M.M.V. | GONAPOLA JUNCTION | 1.Western | Kalutara | Horana | 1,490 | Sin |
| 02140 | REMUNA M.V. | ANGURUWATOTA | 1.Western | Kalutara | Bulathsinhala | 265 | Sin |
| 02250 | KATUKURUNDA DHARMAPALA M.V. | KATUKURUNDA, KALUTARA | 1.Western | Kalutara | Kalutara | 931 | Sin |
| 02320 | MIHINDU M.M.V. | AGALAWATTA | 1.Western | Kalutara | Agalawatta | 1,543 | Sin |
| 02358 | COLVIN R DE SILVA M.V. | ITTAPANA | 1.Western | Kalutara | Agalawatta | 813 | Sin |
| 03214 | A.RATHNAYAKE M.M.V. | WALALA, MENIKHINNA | 2.Central | Kandy | Kundasale | 1,673 | Sin |
| 03313 | HEWAHETA C C | THALATHUOYA | 2.Central | Kandy | Hewaheta | 1,334 | Sin |
| 03354 | BERREWAERTS COLLEGE | AMPITIYA | 2.Central | Kandy | Kandy | 1,540 | Sin |
| 03385 | PERADENIYA CENTRAL COLLEGE | PERADENIYA | 2.Central | Kandy | Kandy | 1,053 | Sin |
| 03494 | NILLAMBE MAHA VIDYALAYA | NILLAMBE | 2.Central | Kandy | Gampola | 684 | Sin |
| 03613 | KATHIRESAN CENTRAL COLLEGE | KOTMALE ROAD,NAWALAPITIYA | 2.Central | Kandy | Nawalapitiya | 1,166 | Tam |
| 04062 | GALEWELA C.C. | GALEWELA | 2.Central | Matale | Dambulla | 1,784 | Sin |

Selected Provincial Schools for New Technological A/L stream

| CensusNo | Name | Address | Province | District | Electorate | Student | Medium |
|---|---|---|---|---|---|---|---|
| 04119 | NAMINIOYA CENTRAL COLLEGE | WILGAMUWA, MATALE. | 2.Central | Matale | Laggala | 977 | Sin |
| 05002 | SUMANA C C | TALAWAKELLE | 2.Central | Nuwara Eliya | N'eli-Maskeli | 612 | Sin |
| 05171 | HOLBROOK.T.M.V | AGRAPATANA | 2.Central | Nuwara Eliya | N'eli-Maskeli | 1,244 | Tam |
| 05255 | CP/HZ/NORWOOD T.M.V | NORWOOD | 2.Central | Nuwara Eliya | N'eli-Maskeli | 1,082 | Tam |
| 05313 | RAGALA TAMIL MAHA VIDYALAYA | HALGRANOYA | 2.Central | Nuwara Eliya | Walapane | 1,138 | Tam |
| 05378 | HOLY TRINITY CENTRAL COLLEGE | NUWARAELIYA | 2.Central | Nuwara Eliya | N'eli-Maskeli | 1,844 | Tam |
| 05533 | CAMBRIDGE COLLEGE | KOTAGALA | 2.Central | Nuwara Eliya | N'eli-Maskeli | 643 | Tam |
| 06002 | SIDDHARTHA M.M.V | BALAPITIYA | 3.Southern | Galle | Balapitiya | 464 | Sin |
| 06034 | BATAPOLA M.M.V | BATAPOLA | 3.Southern | Galle | Ambalangoda | 1,609 | Sin |
| 06262 | SHANTHA ANTHONY'S(NAVODYA)M.V | BADDEGAMA | 3.Southern | Galle | Baddegama | 1,084 | Sin |
| 06396 | KALAHE SRI SUMANGALODAYA MAHA VIDYALA | KALAHE WANCHAWALA | 3.Southern | Galle | Akmeemana | 1,307 | Sin |
| 06399 | RICHARD PATHIRANA COLLAGE | ULUVITIKE,GALLE | 3.Southern | Galle | Galle | 711 | Sin |
| 07051 | BERALAPANARHARA M.V. | BERALAPANATHARA | 3.Southern | Matara | Deniyaya | 912 | Sin |
| 07113 | MALIDUWA M.V. | A | 3.Southern | Matara | Akuressa | 203 | Sin |
| 07193 | METHODIST M.M.V | METHODIST M.M.V HAKMANA | 3.Southern | Matara | Hakmana | 1,083 | Sin |
| 07373 | RADAMPOLA SRI SUMANGALA M.M.V | RADAMPOLA URUGAMUWA | 3.Southern | Matara | Dewinuwara | 483 | Sin |
| 09029 | J/VELANAI CENTRAL COLLEGE | VELANAI WEST VELANAI | 4.Nothern | Jaffna | Kayts | 770 | Tam |
| 09065 | VADDU HINDU COLLEGE | SITHANKERNI | 4.Nothern | Jaffna | Vaddukkodai | 933 | Tam |
| 09216 | J/VAYAVILAN MADHYA MAHA VIDYALAYAM | VAYAVILAN | 4.Nothern | Jaffna | Kankasanturai | 1,029 | Tam |
| 09223 | J/SRI SOMAS KANDA COLLEGE | PUTTUR | 4.Nothern | Jaffna | Kopay | 1,114 | Tam |
| 09333 | METHODIST GIRLS HIGH SCHOOL | POINT PEDRO | 4.Nothern | Jaffna | Point-Pedro | 1,162 | Tam |
| 10001 | KN KILINOCHCHI CENRAL COLLEGE | A9.ROAD, ANANTHAPURAM WEST, KILINOCHCHI | 4.Nothern | Kilinochchi | Kilinochchi | 1,162 | Tam |
| 10002 | KILINOCHCHI HINDU COLLEGE | JEJANTHINAGAR KILINOCHCHI | 4.Nothern | Kilinochchi | Kilinochchi | 1,007 | Tam |
| 11024 | ERUKKALAMPIDDY MUSLIM MADHYA MAHA VID | ERUKKALAMPIDDY, MANNAR. | 4.Nothern | Mannar | Mannar | 437 | Tam |
| 11034 | MURUNKAN MV | NANATTAN | 4.Nothern | Mannar | Mannar | | Tam |
| 12046 | ODDUSUDDAN MAHAVIDYALAYAM | VITHTHIYAPURAM ODDUSUDDAN | 4.Nothern | Mulaitivu | Mulathivu | 493 | Tam |
| 13072 | V/CHEDDIKULAM MAHA VIDYAYAM | CHEDDIKULAM. | 4.Nothern | Vavuniya | Vavuniya | 804 | Tam |
| 13081 | VAVUNIYA AL-IQBAL VIDYALAYAM | SOODUWENTHAPULAVU VAVUNIYA | 4.Nothern | Vavuniya | Vavuniya | 595 | Tam |
| 14036 | BT/KK/KIRAN MAHA VIDYALAYAM | KIRAN | 5.Eastern | Batticaloa | Kalkudah | 921 | Tam |
| 14045 | BT/KK/VANTHARUMOOLAI MATHIYA MAHA VIDY | SITTANDY-1 | 5.Eastern | Batticaloa | Kalkudah | 2,171 | Tam |
| 14106 | BT/HINDU COLLEGE | BT/HINDU COLLEGE, BATTICALOA | 5.Eastern | Batticaloa | Batticaloa | 1,007 | Tam |
| 14180 | BT/PD/KALUTHAVALAI MAHA VIDYALAYAM | KALUTHAVALAI | 5.Eastern | Batticaloa | Paddirippu | 930 | Tam |

Selected Provincial Schools for New Technological A/L stream

| CensusNo | Name | Address | Province | District | Electorate | Student | Medium |
|---|---|---|---|---|---|---|---|
| 14225 | BT/PALUGAMAM KANDUMANY MAHA VIDYALAY | THIRUPALUGAMAM | 5.Eastern | Batticaloa | Paddirippu | 808 | Tam |
| 15079 | POLWATHTHA M.V. | POLWAGA JANAPADAYA, AMPARA | 5.Eastern | Ampara | Ampara | 1,065 | Sin |
| 15120 | MEDAGAMA M.V. | "C" | 5.Eastern | Ampara | Ampara | 929 | Sin |
| 16062 | ABAYAPURA M.V. | ABAYAPURA, TRINCOMALEE. | 5.Eastern | Trincomalee | Trincomalee | 592 | Sin |
| 16082 | VIPULANANDA COLLEGE. | KANDY ROAD,TRINCOMALEE. | 5.Eastern | Trincomalee | Trincomalee | 1,025 | Tam |
| 16119 | AGBOPURA MAHA VIDYALAYA | AGBOPURA KANTHALE | 5.Eastern | Trincomalee | Seruwila | 411 | Sin |
| 16124 | KANTALE CENTRAL COLLEGE | KANTALE | 5.Eastern | Trincomalee | Seruwila | 1,016 | Sin |
| 17055 | SIR JOHN KOTHALAWALA M.M.V. | DODAMGASLANDA | 6.North Western | Kurunegala | Dodangaslanda | 1,491 | Sin |
| 17100 | POTHUBOWA M,V, | MAWATHAGAMA | 6.North Western | Kurunegala | Mawatagama | 792 | Sin |
| 17169 | SANGABODHI M.M.V. | AWLEGAMA | 6.North Western | Kurunegala | Wariyapola | 1,562 | Sin |
| 17298 | UDABADALAWA SUDARSHNA M.V. | MASPOTHA | 6.North Western | Kurunegala | Kurunegala | 1,211 | Sin |
| 17333 | HIZBULLAH CENTRAL COLLEGE | UDAYR LANE,THLIYAGIONNA ,KURUNEGALA | 6.North Western | Kurunegala | Kurunegala | 1,390 | Tam |
| 17710 | BALALLA U.B.WANNINAYAKA.M.V. | BALALLA. | 6.North Western | Kurunegala | Yapahuwa | 1,447 | Sin |
| 18001 | ANAMADUWA M.M.V. | ANAMADUWA | 6.North Western | Puttalam | Anamaduwa | 2,003 | Sin |
| 18271 | WEKADA M.V. | YOGIYANA | 6.North Western | Puttalam | Wennappuwa | 1,132 | Sin |
| 18311 | ST.SEBASTIANS CENTRAL COLLEGE | KATUNERIYA | 6.North Western | Puttalam | Nattandiya | 1,869 | Sin |
| 19045 | KEBITHIGOLLEWA M.M.V. | KEBITHIGOLLEWA | 7.North Central | Anuradhapura | Medawachchiya | 1,676 | Sin |
| 19097 | SAMPATH NUWARA V. | ETHAWETUNUWEWA | 7.North Central | Anuradhapura | Medawachchiya | 380 | Sin |
| 19104 | RUWANWELI M.M.V. | HOROWPOTHANA | 7.North Central | Anuradhapura | Horowpathana | 1,581 | Sin |
| 19182 | WALISINGHA HARISHCHANDRA M.V. | ANURADHAPURA | 7.North Central | Anuradhapura | Anuradhapura-E | 3,933 | Sin |
| 19281 | VIDDYADARSHA MAHA VIDYALAYA | NOCHCHIYAGAMA | 7.North Central | Anuradhapura | Anuradhapura-W | 2,083 | Sin |
| 19296 | THAMBUTHTHEGAMA.M.M.V. | THANBUTHTHEGAMA | 7.North Central | Anuradhapura | Horowpathana | 2,626 | Sin |
| 19297 | THALAWA M.V. | THALAWA | 7.North Central | Anuradhapura | Kalawewa | 1,978 | Sin |
| 19336 | GALNEWA.M.M.V. | GALNEWA | 7.North Central | Anuradhapura | Kalawewa | 1,941 | Sin |
| 19362 | GANTHIRIYAGAMA MAHINDA M.V | IPALOGAMA | 7.North Central | Anuradhapura | Mihintale | 1,645 | Sin |
| 19414 | MIHINTHALE M.V. | MIHINTHALE | 7.North Central | Anuradhapura | Mihintale | 1,194 | Sin |
| 19442 | SRI REWATHA NAWODYA PASALA | MADATUGAMA | 7.North Central | Anuradhapura | Kekirawa | 722 | Sin |
| 20072 | PALUGASDAMANA M.V. | PALUGASDAMANA,POLONNARUWA | 7.North Central | Polonnaruwa | Polonnaruwa | 661 | Sin |
| 20103 | VILAYAYA M.M.V | ARALAGANVILA | 7.North Central | Polonnaruwa | Polonnaruwa | 1,931 | Sin |
| 20176 | BAKAMUNA MAHASEN M.M.V. | BAKAMUNA | 7.North Central | Polonnaruwa | Minneriya | 1,216 | Sin |
| 20219 | WELIKANDA M.V | WELIKANDA | 7.North Central | Polonnaruwa | Polonnaruwa | 853 | Sin |
| 21194 | MALITHTHA MAHA VIDUHALA | MALITHTHA,PATTIYAGEDARA | 8.Uva | Badulla | Hali-Ela | 762 | Sin |

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

**Selected Provincial Schools for New Technological A/L stream**

| CensusNo | Name | Address | Province | District | Electorate | Student | Medium |
|---|---|---|---|---|---|---|---|
| 21254 | DHARMAPALA M.V | BANDARAWELA | 8.Uva | Badulla | Bandarawela | 2,832 | Sin |
| 21377 | JANADIPATHIV | AMBAGAHSDOWA,WELIMADA | 8.Uva | Badulla | Uva-Paranagam | 2,227 | Sin |
| 21408 | HAPUTALE TAMIL MAHA VIDYALAYA | HAPUTALE | 8.Uva | Badulla | Haputale | 1,115 | Tam |
| 24401 | NAGARAGIRI M.V | HEMMATHAGAMA | 9.Sabaragamuwa | Kegalle | Mawanella | 1,614 | Sin |
| 24409 | AL-AZAR MU.M.V. | HIJRAMAGA,HEMMATHAGAMA | 9.Sabaragamuwa | Kegalle | Mawanella | 1,422 | Tam |
| 24493 | SWARNAJAYANTHI M V | KUMARATHUNGA MUNIDASA MAWATHA KEGALLE | 9.Sabaragamuwa | Kegalle | Kegalle | 1,892 | Sin |
| 24579 | DARMASIRI SENANAYAKA M V | THULHIRIYA | 9.Sabaragamuwa | Kegalle | Dedigama | 628 | Sin |

**සභාගතයේ මත තබන ලද ලේඛනය :*
*சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்று :*
*Statement tabled:*

### ශ්‍රම ඵලදායිතාව

ශ්‍රම ඵලදායිතාව 2012 වසරේ දී අඛණ්ඩව ඉහළ ගියේය. එක් ශ්‍රමිකයකු සඳහා වන දළ දේශීය නිෂ්පාදිතය (2002 වසරේ ස්ථාවර මිල ගණන් මත පදනම් වූ) මගින් මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව සමස්තයක් ලෙස, 2012 වසරේ දී රුපියල් 374,900 දක්වා සියයට 7 කින්

**4.15 සංඛ්‍යා සටහන** ප්‍රධාන ආර්ථික අංශ අනුව ශ්‍රම ඵලදායිතාව

| ශීර්ෂය | 2011 | 2012 (අ) |
|---|---|---|
| ස්ථාවර (2002) මිල අනුව ද.දේ.නි. (රු. මිලියන) | 2,863,715 | 3,047,277 |
| කෘෂිකර්මාන්ත | 320,178 | 338,625 |
| කර්මාන්ත | 838,932 | 925,335 |
| සේවා | 1,704,605 | 1,783,318 |
| ශ්‍රම ඵලදායිතාව සේවා නියුක්ත එක් පුද්ගලයකු සඳහා රු. '000 (ආ) | 349.4 | 374.9 |
| කෘෂිකර්මාන්ත | 118.2 | 134.4 |
| කර්මාන්ත | 424.3 | 436.7 |
| සේවා | 485.4 | 511.0 |

(අ) තාවකාලික
(ආ) සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දත්ත ඇතුළත් වේ.

මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**විශේෂ සටහන 8** **තිරසාර සංවර්ධනයක් සඳහා අවශ්‍ය නිපුණතා සහ උසස් තත්ත්වයේ මානව ප්‍රාග්ධනය**

ශ්‍රී ලංකා ආර්ථිකය ඇමෙරිකානු ඩොලර් බිලියන 100ක් කරා ගෙන යමින්, 2016 ට පෙර ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් 4000ක මට්ටම ඉක්මවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ සඳහා අවශ්‍ය පහසුකම් සැලැස්වීමටත් එමගින් වැදගත් ආර්ථික මධ්‍යස්ථානයක් බවට රට පරිවර්තනය කිරීමත් පිණිස රජය විසින් ආර්ථික කටයුතුවල ප්‍රධාන අංග ලෙස කේන්ද්‍රස්ථාන පහක් හඳුනාගෙන ඇත. එනම් නාවික, ගුවන් සේවා, වාණිජ, බලශක්තිය සහ දැනුම සමග සංචාරක කර්මාන්තයයි.

ප්‍රචලිත මැදි ආදායම් වර්ධන උගුලට (Middle Income Growth Trap) හසුවීම වලක්වාලමින්, තිරසාර සංවර්ධනයක් කරා යන ගමනේ දී සම්පූර්ණ කළ යුතු පූර්ව අවශ්‍යතාවයන් කිහිපයක් පවතී. මේවාට අයත් වන්නේ, ආර්ථිකයේ අසමතුලිතතාවයන් අඩු කිරීම සහ සාර්ව ආර්ථික ස්ථායිතාවය පවත්වාගෙන යාම, ඉහළ ආයෝජන මට්ටමක් ළඟාකර ගැනීම, ඵලදායීතාවය වැඩි කිරීම, නිපුණතාව වර්ධනය කිරීම සහ මානව ප්‍රාග්ධනයේ ගුණාත්මක තත්ත්වය වැඩි දියුණු කිරීම යනාදියයි.

ඉහළ ආදායම් මට්ටමක් කරා ගමන් කිරීමේ දී, නිපුණතාවන් සහ මානව ප්‍රාග්ධනය වැදගත් වන්නේ කුමක් නිසාද යන්නට හේතු කිහිපයක් ආනුභවික අධ්‍යනයන් සහ ආර්ථික සාහිත්‍ය තුළින් හඳුනා ගත හැකිය.

(අ) ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු මානව ප්‍රාග්ධනය, ආර්ථිකය මන්දගාමී බවට පත්වීම (Slowdown) සහ මැදි ආදායම් උගුලට හසුවීමට ඇති ඉඩකඩ අඩුකරයි: තිරසාර සංවර්ධනයේ දී ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු මානව ප්‍රාග්ධනය, ආර්ථික වර්ධනයේ මන්දගාමී බව සහ "මැදි ආදායම් උගුල" වලක්වන ප්‍රධාන සාධක අතරින් එකක් බව හඳුනාගෙන තිබේ. අඩුම තරමින් ජනගහනයෙන් ද්විතීයික මට්ටමේ අධ්‍යාපනයක් (ද්විතීයික, විශ්වවිද්‍යාල සහ ඊට ඉහළ) ලබාගෙන ඇති ප්‍රතිශතය වැඩි කිරීම, අනෙකුත් තත්ත්වයන් සමාන වන්නේ යැයි උපකල්පනය කළහොත්, ආර්ථික වර්ධනයේ වේගය අඩුවීමට ඇති සම්භාවිතාව අඩු කරන බව සොයාගෙන ඇත (Eichengreen, Park and Shin, 2013)[1]. නමුත් සාමාන්‍ය පොදු අධ්‍යාපනයට එවැනි බලපෑමක් ඇති කිරීමට හැකි බව සොයාගෙන නැත. මෙම අධ්‍යනයට අනුව, ආර්ථික මන්දගාමීබව මග හැරීම සඳහා "අඩු තත්ත්වයේ" මානව ප්‍රාග්ධනයට වඩා ද්විතීයික හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ මානව ප්‍රාග්ධනය වඩා වැදගත් බව පෙනී යයි. වටිනාකම් දාමයේ පහළ අගය එකතු කළ කර්මාන්තයන්ගේ සිට ඉහළ වටිනාකම් එකතු කරන කර්මාන්ත කරා ගමන් කිරීමට, අවශ්‍ය වන්නේ නිපුණතා සහිත සේවකයන් කියා අපට සිතාගත හැකිය. ඉහළ තත්ත්වයෙන් යුතු මානව ප්‍රාග්ධනය, ව්‍යාපාර සේවා වැනි නවීන ඉහළ අගය එකතු කිරීමේ කටයුතු සඳහා විශේෂයෙන් වැදගත් වේ. තවද, මැදි ආදායම් තත්ත්වයේ සිට ඉහළ ආදායම් තත්ත්වයක් දක්වා කොරියාවේ සාර්ථක සංක්‍රාන්තිය, එහි ද්විතීක අධ්‍යාපනයේ වේගවත් ප්‍රසාරණය තුළින් පැහැදිලි වන අතර, මැලේසියාව හා තායිලන්තය මැදි ආදායම් උගුලට හසුවී ඇති ආර්ථික බවට පත්වීම එම රටවල උසස් මානව ප්‍රාග්ධනයේ හිඟය තුළින් පැහැදිලි වන බව මෙම අධ්‍යනය මගින් තවදුරටත් පෙන්වා දේ.

(ආ) ඉහළ නිපුණතාවන් නවීන සේවා අංශයේ ප්‍රසාරණයට පහසුකම් සපයයි: ලෝක මට්ටමින් ගතහොත් අධ්‍යාපනය හා සේවා සංවර්ධනය අතර ධන සම්බන්ධතාවයක් පවතී (ADB, 2012)[2]. වඩා උගත් ජනගහනයක් සහිත ආසියානු රටවල්වල විශාල සේවා අංශයක් ඇතිවීමට නැඹුරුතාවක් තිබෙන අතර, රටක ජනතාවගේ අධ්‍යාපන මට්ටම ඉහළ යන විට, රටේ සේවා අංශය ද ඒ සමගාමී ප්‍රසාරණය වීමේ නැඹුරුතාවක් තිබෙන බව මෙම වාර්තාව කියා සිටියි. ව්‍යාපාර සේවා සංවර්ධනයට මානව ප්‍රාග්ධනය තීරණාත්මක වන බව සහ ව්‍යාපාර සේවාවලදී ඇමෙරිකාවේ හා අනෙකුත් දියුණු ආර්ථිකවල සාපේක්ෂ වාසිය විස්තර කිරීමට එම රටවල තිබෙන නිපුණතා සහිත සේවක බහුලත්වය සහාය වන බව මෙම වාර්තාව විස්තර කරයි. එසේම, සංවර්ධනය වන ආසියාවේ අඩු අධ්‍යාපන මට්ටම, කලාපයේ සාපේක්ෂ අවාසිය පැහැදිලි කිරීමට උපකාරී වේ. සාම්ප්‍රදායික සේවාවන්ගේ සිට නවීන සේවාවන් දක්වා වූ ආසියාවේ ගමන් වේගය අඩු කිරීමට ආසියානු රටවල පවතින නිපුණතාවන්ගේ හිඟකම බලපාන බව වාර්තාව පෙන්වා දෙයි.

(ඇ) නිපුණතාවන්, ආර්ථික කටයුතුවල කාර්යක්ෂමතාව වැඩි කරයි: නිපුණතාවන්ගේ හිඟය විවිධාකාරයෙන් ආර්ථික ක්‍රියාකාරකම්වලට බලපෑම් කරයි. ඒවා

[1] Barry Eichengreen, Donghyun Park, and Kwanho Shin. 2013, Growth Slowdowns Redux: New Evidence on the Middle-Income Trap, Working Paper No. 18673, National Bureau of Economic Research.

[2] ආසියානු සංවර්ධන බැංකුව. Asian Development Outlook 2012 Update: Services and Asia's Future Growth.

4 මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාව

***[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This annex is also placed in the Library.]*

***සභාමේසය මත තබන ලද පොත :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட புத்தகம்:*
*Book tabled:*

# අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීම

අධ්‍යාපන අමාත්‍යාංශය
2013



**අතිගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය**

තාක්ෂණවේදය විෂය ධාරාව සමාන්‍ය අධ්‍යාපන පද්ධතියට හඳුන්වාදීමේ අවස්ථාවට පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මම සතුටට පත්වෙමි.

පංච මහා කේන්ද්‍රයන් ඇසුරින් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය කරා ගොඩනැගීමට මහින්ද චින්තන ඉදිරි දැක්ම පියවර තබා තිබේ. එහිදී නාවික, ගුවන්, වාණිජ, බලශක්ති සහ දැනුම ජය ගැනීම ඉලක්කගත ය. ඒ සඳහා වන මානව සම්පත ගොඩනැගීම අපට ඇති දැවැන්ත අභියෝගයකි. තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වාදීම එකී අභියෝගය ජය ගැනීම වෙනුවෙන් ගනු ලබන තවත් වටිනා පියවරක් බව මම විශ්වාස කරමි.

විද්‍යා, තාක්ෂණ හා ප්‍රායෝගික අත්දැකීම් භාවිත ඉගෙනුම් ක්‍රමයෙහි වූ හිඩැස රටේ අධ්‍යාපනයේ දී දැවැන්ත පසුබෑමක් විය. තරුණ තරුණියන්ගේ රැකියා වෙළෙඳපොළ සේ ම රටේ සංවර්ධන ක්‍රියාදාමයට ද එය මහත් බාධාවක් විය. දැනුම කේන්ද්‍රීය අධ්‍යාපනයට පරිබාහිරව රටට වඩාත් උචිත අධ්‍යාපන ක්‍රමයක් ප්‍රතිනිර්මාණය කිරීමේ කාර්යයට මහින්ද චින්තනය පියවර තැබුවේ ඒ නිසා ය. ඒ අනුව රටේ තාක්ෂණ සංවර්ධනය පෙරට ගැනීමට තාක්ෂණික නිපුණතා සහ අත්දැකීම් සහිත මානව සම්පත අනාගතයේ අප සතු වෙයි. තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වාදීම ඒ අධ්‍යාපන විප්ලවයේ වැදගත් හැරවුම් ලක්ෂයක් ලෙස මම දකිමි.

නව විෂය ධාරාවක් ලෙස තාක්ෂණ විෂය ධාරාව තෝරා ගන්නා සිසු දරු දැරියන් ප්‍රායෝගික දැනුම ද සමග පෙරට යනු දැකීම අපගේ අපේක්ෂාව ය. සඳහා ඔබ සැමට මාගේ සුබ පැතුම් පිරිනමමි.

මහින්ද රාජපක්ෂ

2013 ජූනි මස 17 වෙනි දින

"ඉහළ ප්‍රමිතියකින් යුත් නිපුණතා සංවර්ධනය, පර්යේෂණ, හා තාක්ෂණ විප්ලවයකට අධ්‍යාපනය සීඝ්‍රයෙන් යොමු කරවමින් අධ්‍යාපනය හා දැනුම රටට උචිත ලෙස ප්‍රතිනිර්මාණය කරමි. ශ්‍රී ලංකාව ලෝකයේ දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට නැවත පත් කරමි"

(මහින්ද චින්තන - පිටු අංක 16)

"மகத்துவமிக்க திட்டமான திறன்கள் அபிவிருத்தி ஆராய்ச்சி மற்றும் தொழில்நுட்ப புரட்சிக்காக கல்வி துறையை உள்வாங்குவதன் மூலம், நாட்டிற்கு ஏற்றவகையில் கல்வியையும் அறிவையும் மீளமைப்பேன். உலகத்தில் அறிவு மிக்கமையமாக இலங்கையை மீண்டும் மாற்றுவேன்"

(மஹிந்த சிந்தனை பக்க இலக்கம் 16)



**හැඳින්වීම**

ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත්කරලීමේ දැවැන්ත ක්‍රියාදාමයට පිවිස සිටින මේ අවස්ථාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය සඳහා තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීම අධ්‍යාපනයේ සුවිශේෂී සන්ධිස්ථානයකි. පසුගිය දශකය තුළ තාක්ෂණික හා සේවා අංශයේ වර්ධනය සහ නාවික, ගුවන්, වාණිජ, බලශක්ති හා දැනුම කේන්ද්‍රීය මානව සම්පත් සංවර්ධනය සඳහා වූ රජයේ සංවර්ධන සැලසුම තාක්ෂණය කෙරෙහි දිශානුගත වී ඇත.

සාමාන්‍ය අධ්‍යාපනයේ දී තාක්ෂණික අංශයෙහි මූලික කාර්යභාරය වනුයේ ද්‍රව්‍ය, මෙවලම් හා තාක්ෂණික ශිල්ප ක්‍රම පිළිබඳ ගවේෂණ මගින් සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය, බෙදාහැරීම හා කළමනාකරණය මෙන් ම ප්‍රායෝගික අත්දැකීම් තුළින් ඉගෙනුම් ක්‍රියාවලිය පෝෂණය කිරීම හා වැඩ ලෝකය සහ තාක්ෂණික ලෝකය හඳුන්වා දීම මගින් අධ්‍යාපනයේ නිම් වළලු පුළුල් කිරීම බව යුනෙස්කෝව හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් නිර්දේශ කර ඇත.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) මට්ටමේ දී තාක්ෂණ විෂය කාණ්ඩය මගින් සියලුම සිසුන්ට වැඩ ලෝකය හා තාක්ෂණික ලෝකය පිළිබඳ මූලික හඳුන්වාදීමක් ඉදිරිපත් කර ඇති නමුත් තවදුරටත් තාක්ෂණවේදය හෝ එම අංශයෙන් තෘතීයික අධ්‍යාපනය හෝ හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන්ට එය ප්‍රමාණවත් නොවේ.

දැනට අ.පො.ස. උසස් පෙළ හදාරණ සිසුන්ගෙන් 22% ක් විද්‍යා හා ගණිත අංශය ද 27% ක් වාණිජ අංශයද 51% ක් කලා අංශය ද තෝරා ගනිති. කලා අංශයෙන් අ.පො.ස. උසස් පෙළ සමත් විශ්ව විද්‍යාල ප්‍රවේශය නොලැබූ විශාල තරුණ පිරිසක් රැකියා වියුක්තියෙන් පෙළෙති. වර්තමානයේ ශ්‍රම වෙළඳපොළෙහි ඉහළ ඉල්ලුමක් පවතින නිපුණතාවලින් යුත් පිරිස් අඩුවීම නිසා කලා උපාධිධාරීන් අතර ද රැකියා වියුක්තිය දක්නට ලැබේ. මෙය රටේ ආර්ථික සංවර්ධනයට ද බලපාන ප්‍රධාන ගැටලුවකි. තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීම මගින් විශ්ව විද්‍යාලයේ දී හෝ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයේ දී තෘතීයික මට්ටමේ අධ්‍යාපනය සඳහා අවශ්‍ය මංපෙත් විවර කරමින් සිසුනට මාර්ගෝපදේශය ලබාදීම අපේක්ෂා කෙරේ. 2016 වර්ෂයේදී අ.පො.ස

4

උසස් පෙළ හදාරණ සිසුන්ගෙන් විද්‍යා, ගණිත හා තාක්‍ෂණවේදය විෂය ධාරා තෝරාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 40% දක්වා වැඩි කිරීම තුළින් කලා විෂය ධාරාව තෝරාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 25% දක්වා අඩුකිරීමට බලාපොරොත්තු වේ.

අ.පො.ස. ( උසස් පෙළ) සඳහා යෝජිත තාක්ෂණවේදය විෂය ධාරාව අලුතින් ම හඳුන්වා දෙනු ලබන වෙනම විෂය ධාරාවක් වන අතර එය තාක්ෂණික හා වැඩ ලෝකයට අදාළ සහාය විෂයවලින් සමන්විත වේ. මෙම විෂය ධාරාව පුළුල් තාක්ෂණික ක්ෂේත්‍ර දෙකක් යටතේ හඳුන්වා දෙනු ලබන අතර සිසුනට "ඉංජිනේරු තාක්ෂණවේදය" හා "ජෛව පද්ධති තාක්ෂණවේදය" යන විෂය දෙකෙන් එකක් තෝරා ගත හැකිවේ. එසේම මෙම විෂය ධාරාවේ දෙවන විෂයය වන "තාක්ෂණය සඳහා විද්‍යාව" මගින් සිසුන් තෝරා ගත් තාක්ෂණික විෂයය සඳහා අවශ්‍ය වන ගණිතය, විද්‍යාව හා තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලධර්ම හැදෑරීමට අවස්ථාව සැලසේ.

තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් සංයෝජනයේ තෙවන විෂයය, අ.පො.ස. (උසස් පෙළ) සඳහා දැනට පවත්නා විෂය දහයක් අතුරින් එක් විෂයයක් වේ.
මේ අනුව විෂය අන්තර්ගතය පහත සඳහන් වේ.

**01. ජෛව පද්ධති තාක්ෂණවේදය හෝ ඉංජිනේරු තාක්ෂණවේදය**
(Biosystems Technology or Engineering Technology)

✶ ජෛව පද්ධති තාක්ෂණය විෂයය, පරිසර ඉංජිනේරු විද්‍යාව, ජීව ක්‍රියාවලි, ඉංජිනේරු විද්‍යාව, ජීව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාව, කෘෂිකර්මය හා ස්වභාවික සම්පත් තාක්ෂණයට සම්බන්ධ විෂය සංකලනයකි. එම නිසා මෙම විෂයය ජෛව පද්ධති සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීමේ ඉංජිනේරුමය විෂයයකි.

මෙම විෂයමාලාව ගොඩනැගීමේදී ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය හා විවිධාංගීකරණය වූ ස්වභාවික සම්පත් පිළිබඳව නිපුණතා හා මූලික අංග ඇතුළත් කර ඇත. මෙමගින් අධ්‍යාපනය ලබන සිසුන්හට අ.පො.ස. (උ.පෙළ) මට්ටමේ දී ම රටෙහි දියුණුව පිණිස සම්පත් භාවිතය පිළිබඳව නිපුණතාව ලැබෙනු ඇත.

✶ ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය, ඉදිකිරීම් තාක්ෂණය, මෝටර් යාන්ත්‍ර විද්‍යාව, විදුලි තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික තාක්ෂණය හා පාරිසරික ගැටලු යන තාක්ෂණවේදවල සංකලනයකි. ඉංජිනේරු තාක්ෂණවේදය යනු තාක්ෂණික පද්ධතිවල ගැටලු නිරාකරණය කිරීම සඳහා ඉංජිනේරුමය දැනුම ලබා දෙන විෂයයකි.

අ.පො.ස. (උ.පෙළ) සඳහා සංවර්ධනය කරන ලද මෙම විෂය මාලාව, ඉංජිනේරු තාක්ෂණයේ මූලිකාංග පිළිබඳ දැනුම හා වෘත්තීය කුසලතා සිසුනට ලබා දෙනු පිණිස සකසා ඇත. එමගින් රටේ සංවර්ධනය සඳහා සම්පත් භාවිතය පිළිබඳව උසස් පෙළ මට්ටමේදී සිසුන් තුළ වෘත්තීය හැකියා වර්ධනයට දායකත්වය ලබාදෙනු ඇත. සිසුන් විසින් ඉංජිනේරු තාක්ෂණවේදයට සම්බන්ධ දැනුම භාවිත කිරීම, කැපවීම හා යොමුවීම බලාපොරොත්තු වේ.

**02. තාක්ෂණවේදය සඳහා විද්‍යාව**
(Science for Technology)

තාක්ෂණවේදය සඳහා විද්‍යාව විෂයයෙහි අන්තර්ගතය, ඉංජිනේරු තාක්ෂණවේදය හා ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයයන්ට ගැළපෙන සේ විද්‍යාව, ගණිතය හා තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රවල විෂය සංකලනයකින් සකස් කර ඇත. මෙම විෂය අන්තර්ගතය මගින් ලැබෙන දැනුමින් තාක්ෂණික පද්ධතියක ගැටලු විසඳීමට අවශ්‍ය විද්‍යාත්මක, ගණිතමය හා තොරතුරු තාක්ෂණික පසුබිම සැපයේ.

**03. පහත දැක්වෙන තෙවන විෂය කාණ්ඩයෙන් එක් විෂයයක්**
(One subject from ten optional subjects)

- ආර්ථික විද්‍යාව
- භූගෝල විද්‍යාව
- ගෘහ ආර්ථික විද්‍යාව
- ඉංග්‍රීසි
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- චිත්‍ර කලාව
- ව්‍යාපාර අධ්‍යයනය
- කෘෂි විද්‍යාව
- ශිල්පීකරණය

අරමුණු :

මෙම විෂය ධාරාව හැදෑරීමෙන්,

- එදිනෙදා ජීවිතයට ප්‍රයෝජනවත් වන තාක්ෂණික කුසලතා සිසුනට ලබා දීම
- තාත්වික ලෝකයේ ගැටලුවලට තාක්ෂණික විසඳුම් සෙවීමේ හැකියාව සිසුන් තුළ වර්ධනය කිරීම
- ශ්‍රම වෙළඳපලට ගැළපෙන කුසලතා සිසුන් තුළ වර්ධනය කිරීම
- ජාතික වෘත්තීය සුදුසුකම් රාමුවට අනුව වෘත්තීය අධ්‍යාපනය සඳහා සිසුන් යොමු කිරීම

යන අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.





7

**අ.පො.ස. උසස් පෙළ සඳහා තාක්ෂණවේදය විෂය ධාරාව ස්ථාපනය කිරීම**

(ආචාර්ය පී.ඒ. පියසිරි, උපකුලපති, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය)

ශ්‍රී ලංකාව පසුගිය වසර 5ක කාලය පුරා 6%කට වැඩි සමස්ත ආර්ථික වර්ධනයක් වාර්තා කර ඇති අතර 2009 සිවිල් යුද්ධය අවසන් වීමෙන් අනතුරුව 2010 සහ 2011 වර්ෂවල වර්ධන අනුපාතය 8% ඉක්මවීය. 2009 වර්ෂයේදී ඇමරිකානු ඩොලර් 2000 ඉක්මවන ඒක පුද්ගල ආදායමක් සාක්ෂාත් කර ගනිමින් ශ්‍රී ලංකාව මධ්‍ය ආදායම් ලබන රටක් බවට පත් වූ අතර එම ප්‍රමාණය 2016 දී ඇමරිකානු ඩොලර් 4000ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මුළු දළ දේශීය නිෂ්පාදිතයෙහි කාර්මික අංශයේ ප්‍රතිශතාත්මක දායකත්වය 2000 වර්ෂයේදී පැවති 27.3% සිට 2010 වන විට 29.4%ක් දක්වා වැඩි වී ඇත.

වැඩිම වර්ධනයක් දළ දේශීය නිෂ්පාදිතයෙහි පෙන්නුම් කරනුයේ සේවා අංශයෙහි වන අතර එය 2000 දී 52.8%ක පැවති අගය 2010 වන විට 57.8% ක ප්‍රමාණයක් දක්වා වූ ප්‍රතිශතාත්මක වැඩි වීමකි. එසේම, කාර්මික හා සේවා අංශවල රැකියා ප්‍රතිශතය 2000 සහ 2010 වර්ෂවලදී වෙන වෙනම ගත් කල පිළිවෙළින් 23.6% සහ 40.3% සිට 24.6% සහ 43.1% දක්වා වැඩි වී ඇත. පසුගිය දශකය පුරා කර්මාන්ත සහ සේවා අංශවල සිදු වූ වර්ධනය සහ ශ්‍රී ලංකාව නාවික, ගුවන්, වාණිජ, බලශක්ති සහ දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට පත්කරලීමේ රජයේ සංවර්ධන සැලසුම සඳහා තාක්ෂණික මුහුණුවරකින් යුතු මානව සම්පත් සංවර්ධනය සිදු කිරීම අවශ්‍ය වේ.

"ද්‍රව්‍ය, මෙවලම්, තාක්ෂණය සහ නිෂ්පාදනය, බෙදාහැරීම හා සමස්තයක් ලෙස කළමනාකරණ ක්‍රියාවලිය, වැඩ ලෝකයට සහ තාක්ෂණික ලෝකයට හඳුන්වා දීමක් ලෙස කටයුතු කිරීම මගින් අධ්‍යාපන සීමා අතික්‍රමණය කිරීම පිණිස සහ ප්‍රායෝගික අත්දැකීම් හරහා ඉගෙනීම් ක්‍රියාවලිය පෝෂණය කිරීම පිණිස" සාමාන්‍ය අධ්‍යාපනය තුළ තාක්ෂණික අධ්‍යාපනය ස්ථාපිත කිරීමේ කාර්යය හඳුනාගැනීම යුනෙස්කෝ සහ ජාත්‍යන්තර කම්කරු සංවිධාන නිර්දේශ (2002) මගින් සිදු කර ඇත.

ඉහළ ද්විතීයික අධ්‍යාපනයෙහි තාක්ෂණික විෂයමාලා හඳුන්වා දෙමින් මෙය බොහෝ රටවල පෙන්වා දී ඇති අතර ආසියානු කලාපයේ සංවර්ධනය වෙමින් පවත්නා රටක් වන මලයාසියාවේ අත්දැකීම අවධානයට ලක් කිරීම වටී. ශ්‍රී ලංකාවෙහි අ.පො.ස. සාමාන්‍ය පෙළ විෂය නිර්දේශයෙහි වෘත්තීය විෂය ගොන්නක් මගින් වැඩ ලෝකයට සහ තාක්ෂණික ලෝකයට ප්‍රවේශයක් සියලුම සිසුන්ට ලබා දෙන නමුත් තෘතීයික අධ්‍යාපනයට හෝ යෝග්‍ය වෘත්තීයක් සොයා ගැනීමට හෝ වැඩිදුර තාක්ෂණික අධ්‍යාපනයක් සඳහා වන මාර්ගයකට හෝ පිවිසීමට අපේක්ෂා කරන්නවුන් සඳහා වන යෝග්‍ය මාර්ග නොපවතී. අ.පො.ස. උසස් පෙළ විෂය ධාරාවන් ලෙස කලා, වාණිජ, විද්‍යාව සහ ගණිතය යන විෂය ධාරා පවතින අතර ශිෂ්‍යයන්ගෙන් බහුතරය කලා විෂය ධාරාව තෝරා ගනිති. මෙම විෂය ධාරා හතර අතරින් එකක් හදාරා, අ.පො.ස. උසස් පෙළ විභාගය සමත්ව විශ්ව විද්‍යාලවලට ප්‍රවේශවන ප්‍රමාණය ඇමුණුම 1ඒ සහ ඇමුණුම 1බී හි දක්වා ඇත. මෙමගින් බහුතරයක් සිසුන් කලා විෂය ධාරාවෙන් උපාධි හැදෑරීමට විශ්ව විද්‍යාලවලට ඇතුළත් වන බව පෙනී යයි. වර්තමානයේ දී අ.පො.ස. උසස් පෙළ සඳහා සිවිල් තාක්ෂණය, යාන්ත්‍රික තාක්ෂණය, විද්‍යුත් තාක්ෂණය, කෘෂි තාක්ෂණය, ජෛව සම්පත් තාක්ෂණය සහ ආහාර විද්‍යාව හා තාක්ෂණය යන තාක්ෂණික විෂය හය, කලා විෂය ධාරාවෙන් ලබා දී ඇති අතර සිසුන්ට එක් තාක්ෂණික විෂයයක් ද වෙනත් කලා විෂය දෙකක් ද තෝරාගත හැකි ය.

පසුගිය වසර පහ පුරාවට අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා එක් එක් තාක්ෂණික විෂයයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව ඇමුණුම 2හි දක්වා ඇත. මෙමගින්, කලා විෂය ධාරාවෙන් ලබා දී ඇති තාක්ෂණික විෂයයක් තෝරාගත් සිසුන් සංඛ්‍යාව ඉතාම අඩු ප්‍රමාණයක් බව පෙනෙන අතර එයට හේතුව වශයෙන් ගුරුවරුන් සහ පහසුකම් නොමැති වීම මෙන් ම විශ්වවිද්‍යාල මට්ටමෙහි දී තාක්ෂණික අධ්‍යාපනය අඛණ්ඩව ලබා ගැනීම සඳහා ස්ථාපිත පාඨමාලා නොමැති වීම පෙන්වා දිය හැකිය. තම උද්‍යෝගය නිසාම තාක්ෂණික විෂය තෝරාගන්නා ශිෂ්‍යයන්ට අන් විකල්පයක් නොමැති ව කලා උපාධිය ලැබීමට සිදු වේ. ශ්‍රම වෙළඳපොළ විසින් ඉල්ලා සිටිනු ලබන ශක්‍යතාව නොමැති වීම හේතුවෙන් කලා උපාධිධාරීන් අතර රටෙහි විරැකියාව පැවතීම රජයේ ප්‍රධාන වශයෙන් සැලකිල්ලට භාජනය වූ කරුණක් මෙන් ම සංවර්ධනයට ද බාධාවකි. රජය විසින් කලා විෂය ධාරාවෙන් රජය විසින් කලා විෂය ධාරාවෙන් අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු කිරීමට ද අනෙකුත් විෂය ධාරාවලින් අධ්‍යාපනය ලබන සංඛ්‍යාව ඉහළ නංවා තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීමට ද සැලසුම් කෙරේ. තාක්ෂණවේදය විෂය ධාරාව මගින් තෘතියික අධ්‍යාපන මට්ටම සඳහා විශ්වවිද්‍යාලවල පාඨමාලා ලබා දීම හෝ තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අංශයෙහි අවස්ථා ලබාදීම හෝ මගින් සිසුනට සිය පළමු රැකියාව සඳහා අවශ්‍ය උපදේශනය ලබාදීම සිදු කෙරේ.

යෝජිත තාක්ෂණවේදය විෂය ධාරාව යනු පැහැදිලිවම උසස් පෙළ දැනට පවතින විෂය ධාරාවලට අලුතින් එක්වන වෙනස් ධාරාවක් බව හඳුනාගත යුතු වේ. මන්ද යත් අවශ්‍ය සහාය විෂයයන් සමඟ පුළුල් තාක්ෂණික පරාසයයක ඉගෙනීම එම විෂය ධාරාවට ඇතුළත් කිරීමය. අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව සහ ජාතික අධ්‍යාපන ආයතනය යන ස්ථානවල පැවති සාකච්ඡාවලින් සිසුන්ට එක් විෂයයක් තෝරාගත හැකි වන පරිදි නාමිකව "ඉංජිනේරු තාක්ෂණය" සහ "ජෛව-පද්ධති තාක්ෂණය" යන පුළුල් තාක්ෂණික විෂය පථ දෙක හඳුනා ගැනීමට හැකිවිය. තෝරාගත් තාක්ෂණික විෂයය ඉගෙනීම සඳහා සෘජුවම සහාය දිය හැකි විද්‍යාව, ගණිතය සහ තොරතුරු තාක්ෂණය යන විෂයවල අවශ්‍ය මූලික දැනුම ලබාදෙන "තාක්ෂණයවේදය සඳහා විද්‍යාව" යනු විෂය සංයුතියෙහි ඇති දෙවන විෂයයයි. සංයුතියෙහි ඇති තෙවන විෂයය වන්නේ දැනටමත් අ.පො.ස. උසස් පෙළ විෂය ධාරාවෙහි අඩංගු විෂය ගොන්නෙන් තෝරා ගනු ලබන එක් විෂයයකි.

ශ්‍රී ලංකාවෙහි ඇති ඇතැම් විශ්වවිද්‍යාල මගින් දැනටමත් තාක්ෂණවේදය විෂය ධාරාව හදාරන සිසුන්ට අයදුම් කළ හැකි තාක්ෂණවේදය විෂය ධාරා සහ ව්‍යවහාරික විද්‍යාවලට අදාළ ඉංජිනේරු විද්‍යාවට පරිබාහිර උපාධි පාඨමාලා පවත්වනු ලැබේ. තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා බඳවා ගන්නා යම් ප්‍රමාණයක සිසුන් සංඛ්‍යාවක් සමඟ මෑත අනාගතයේ දී ම ශ්‍රම වෙළඳපොළ සඳහා ඉල්ලුම සහිත තාක්ෂණික ක්ෂේත්‍රවල උපාධි පාඨමාලා විශ්වවිද්‍යාල මගින් ආරම්භ කළ යුතු බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ පැවති රැස්වීම්වල දී අදහස් දැක්විණ.

පසුගිය දශකය තුළ දී ශ්‍රී ලංකාවේ තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන (TVE) පද්ධතිය සංශෝධනවලට භාජනය වූ අතර ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) රාමුව යටතේ තාක්ෂණික අංශ කිහිපයක ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කර ඇත. ඩිප්ලෝමාධාරීන් සඳහා උපාධි මට්ටම දක්වා දියුණු කරන ලද සුදුසුකම් ලැබීමට වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය ස්ථාපිත කර ඇත. ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා සපයන ආයතන ජාලය රජයේ ප්‍රමුඛතාවක් ලෙස ව්‍යාප්ත කෙරෙන අතර, එබැවින් TVE ක්ෂේත්‍රයෙහි තාක්ෂණවේදය විෂය ධාරාවෙහි සිසුන් සඳහා ද තෘතීයික මට්ටමේ අධ්‍යාපන අවස්ථා පවතිනු ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව මගින් නම් කරන ලද විශ්වවිද්‍යාල විද්වතුන්, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයෙහි විද්වතුන්, තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිසම් සභාවෙහි නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශයෙහි නිලධාරීන් සහ ජාතික අධ්‍යාපන ආයතනයෙහි අධ්‍යාපනඥයන්ගෙන් තාක්ෂණවේදය විෂය ධාරාව සංවර්ධනය සඳහා වන කමිටුව සැදුම් ලද්දේය. සකස් කරන ලද තාක්ෂණවේදය විෂය ධාරාව මගින් සීමිත අමතර සම්පත් සහ ගුරුවරුන් යම් යම් ක්ෂේත්‍රවල පුහුණු කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික නැඹුරුවක් සහිත පුළුල් හා අවබෝධාත්මක ඉගෙනුම් පැකේජයක් ලබාදෙනු ඇත.

තාක්ෂණවේදය විෂය ධාරාව අනුගමනය කරන සහ වැඩිදුර තාක්ෂණික ඥානය අත්කරගන්නාවූත් අත්දැකීම් ලබාගන්නාවූත් සිසුන් විසින් තාක්ෂණික සංවර්ධනයෙන් අප රටේ ඉදිරි ගමනට සහාය දෙන ප්‍රධාන මානව සම්පත් සංචිතයක් ගොඩනැගෙනු ඇත. මෙම අවස්ථාවේ වඩාත් ම වැදගත් වන්නේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කළ හැකි සහ ක්‍රියාවලි කළමනාකරණය කළ හැකි තාක්ෂණවේදීන් නිර්මාණය කිරීමයි. ජනාධිපතිතුමාගේ මාර්ගෝපදේශකත්වය යටතේ, අධ්‍යාපන අමාත්‍යාංශය විසින්, 2013 ජූනි මාසයේ දී තාක්ෂණවේදය විෂය ධාරාව ස්ථාපිත කිරීම සඳහා අ.පො.ස. උසස් පෙළ පංති ආරම්භ කිරීමට සැලසුම් කරනු ලබයි.



**අ.පො.ස. (උසස් පෙළ) සඳහා තාක්‍ෂණවේදය විෂය ධාරාව හඳුන්වාදීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා මාධ්‍යය සඳහා ලබා දුන් සම්මුඛ සාකච්ඡාවෙහි සාරාංශය**

බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය තුළ විශේෂයෙන් සලකා බැලිය යුතු අවස්ථා තුනක් විමර්ශනයට ලක් කළ හැකි වේ. පහත දැක්වෙන එම අවස්ථා අධ්‍යාපනයේ හැරවුම් ලක්‍ෂ්‍ය ලෙස සැලකිය හැකිය.

I. ශ්‍රී ලංකාවේ එතෙක් පැවති සාම්ප්‍රදායික අධ්‍යාපන පද්ධතිය, බ්‍රිතාන්‍ය සම්ප්‍රදායට අනුව හා යටත් විජිත යුගයේ අවශ්‍යතාවලට අනුකූල ව බටහිර ආකෘතියේ අධ්‍යාපන පද්ධතියක් බවට පත් කරනු ලැබීය. සලකනු ලබන කාල වකවානුව තුළ සිදු කරන ලද ප්‍රථම හැරවුම වන මෙම පරිවර්තනය කෙරෙහි දක්වන ලද දේශීය ප්‍රතිචාරය වූයේ, හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා, කර්නල් හෙන්රි ස්ටීල් ඔල්කට්තුමා වැනි විශිෂ්ට අධ්‍යාපනඥයින් විසින් අතිමහත් බහුතරයක් වන දේශයේ නියම උරුමකරුවන්ගේ අධ්‍යාපනය සහතික කරනු වස් බෞද්ධ පාසල් පද්ධතියක් නිර්මාණය කරනු ලැබීමයි.

II. දෙවන හැරවුම වූයේ සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමාගේ නිදහස් අධ්‍යාපන පනත සම්මත කර ගනිමින් අධ්‍යාපනය නොමිලේ ලබා ගත හැකි මධ්‍ය විද්‍යාල පනස් හතරක් නිර්මාණය කිරීමෙන් ඇරඹි අදටත් පවත්වා ගෙන යනු ලබන නිදහස් අධ්‍යාපන ව්‍යාපාරයයි.

III. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ යුගයේ පෞද්ගලික පාසල් රජයට පවරා ගනිමින්, ඇති හැකි අයට විශේෂ

12

වරප්‍රසාදයක් බවට පත් වී තිබූ අධ්‍යාපන අවස්ථා රටේ සෑම පුරවැසියකුගේම අධ්‍යාපනයේ සම අයිතිය තහවුරු කරලීමේ අවස්ථාව තුන්වන හැරවුම් ලක්‍ෂ්‍යය වේ.

මෙම කාලය තුළ ශ්‍රී ලාංකික අධ්‍යාපනය විවිධ ප්‍රමාණාත්මක, ගුණාත්මක හා ව්‍යුහාත්මක වෙනස්කම් රාශියකට ලක් වී තිබෙන අතර, ඒ සඳහා විවිධ ප්‍රයත්න දරා ආසියාතික කලාපයේ හොඳම ප්‍රාථමික අධ්‍යාපනය සහිත රට ලෙස ද සංවර්ධිත රටකට සමාන සාක්‍ෂරතාව සහිත රටක් ලෙස ද වාර්තා ගත වී ඇත.

එහෙත්, විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයෙන් ජනිත කරනු ලැබුවා වූ ආර්ථික, සමාජ දේශපාලන හා සංස්කෘතික අහිතු ඵලවලට නිසි විසඳුමක් නොලැබිණි. එබැවින්, අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් වන දැනුම කේන්ද්‍රීය සංවර්ධන උපාය මාර්ග තුළ ප්‍රාථමික පාසල් පන්දහසක් සංවර්ධනය කිරීමත්, එම පාසල් දරුවන්ට අංග සම්පූර්ණ ද්විතීයික අධ්‍යාපන අවස්ථා සැපයීම සඳහා වූ සියලු භෞතික හා මානව සම්පත් සහිත ද්විතීයික පාසල් දහසක් ප්‍රතිනිර්මාණය කිරීමත්, ඒ පාසල් දහසෙහි තාක්‍ෂණවේදය විෂය ධාරාව ඇරඹීම ඇතුළු අනෙකුත් විෂයානුබද්ධ වෙනස්කම් ඇති කිරීමත්, අධ්‍යාපනය වෙනුවෙන් මෙතෙක් කර ඇති වැඩිම රාජ්‍ය ආයෝජනය තුළින් වර්ෂ 2012-2016 තුළ දී ඇති කෙරෙන මෙම වෙනස ශ්‍රී ලාංකික අධ්‍යාපනයේ හතරවැනි සුවිශේෂ හැරවුමයි.

දැනට පවතින පාසල් පද්ධතිය තවදුරටත් විමර්ශනය කර බැලූ විට 1994ට පෙර අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් 15.9% පමණක් එම විභාගය සමත් වී උසස් පෙළ සුදුසුකම් ලබන තත්ත්වයක් තුළ ඉතිරි 84.1%ක් පමණ කිසිදු අධ්‍යාපන සහතිකයක් නොලබා, කිසිදු වෘත්තීය නිපුණතාවක් නොලබා ශ්‍රමබලකායට එක්වීම අතිවිශාල ඛේදවාචකයක් වූ බව ඉතා පැහැදිලි කරුණකි.

මෙම තත්ත්වය තරමක් යහපත් අතට හැරෙමින් වර්ෂ 2013 වන විට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත්වීමේ ප්‍රතිශතය 65% දක්වා වර්ධනය වී තිබුණ ද උසස් පෙළ සමත් වී උසස් අධ්‍යාපනය හා තෘතීය අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලබන්නන්ගේ තත්ත්වය ද තවදුරටත්

13

අපේ රට දැනුම කේන්ද්‍රීය ආර්ථිකයක් සහිත දේශයක් බවට පත් කිරීමේ ක්‍රියාවලියට දායකත්වය සැපයීම අභියෝගයට ලක් කර ඇත.

මේ අනුව සාමාන්‍ය පෙළ සමත් වැඩි කොටසක් උසස් පෙළට පැමිණිය ද 2010 වන විට විද්‍යා හා ගණිත අංශයෙන් ඉගෙනුම ලැබුවේ 22%ක් පමණි. විද්‍යාඥයන්, ගණිතඥයන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, නව නිපැයුම්කරුවන්, පර්යේෂකයන් හා තාක්ෂණ නිර්මාණකරුවන් බිහිකර ගත හැකි වන්නේ මෙම 22% තුළිනි.

රක්ෂණය, ප්‍රවාහනය, ගබඩාකරණය, සන්නිවේදනය, සංචාරක, කළමනාකරණය, අලෙවිකරණය යන සේවා අංශවල රැකියා බහුල වුවද වාණිජ අංශයෙන් උසස් පෙළ හදාරනුයේ 27%ක් පමණි.

දිගු කාලයක් පුරා ශ්‍රී ලංකාවේ උසස් පෙළ හදාරන සිසුන්ගෙන් 51% කලා අංශයේ අධ්‍යාපනය ලබන අතර මෙය රටට ඉතා ම අහිතකර තත්ත්වයකි. මොවුන්ගෙන් වැඩි පිරිසක් විභාග කේන්ද්‍රීය ව කටපාඩම් කර විශ්වවිද්‍යාලයට තේරී කලා උපාධිධාරීන් බවට පත් වේ. අධ්‍යාපන පද්ධතියට සෑම වසරක දී ම 350,000 පමණ ඇතුළු වුව ද විශ්වවිද්‍යාලවලට පිවිසෙන්නේ 25,000ක් තරම් සුළු පිරිසකි.නමුත් විශ්වවිද්‍යාලවලින් පිටවන කලා උපාධිධාරීන්ට ද රැකියා වියුක්තියට මුහුණ දීමට සිදු වේ.

නව සංවර්ධන උපායමාර්ග තුළ රැකියා අවස්ථා විශාල සංඛ්‍යාවක් ආර්ථිකයේ පවතින නමුත් එම රැකියාවලට සුදුසු කුසලතා හා නිපුණතා සහිත උගතුන් නොමැති බැවින් සේවා වියුක්තියේ ව්‍යුහගත අසමතුලිතතාවක් දක්නට ලැබේ. එබැවින් අපට අවශ්‍ය මානව සම්පත පාසල් පද්ධතියෙන් හෝ විශ්වවිද්‍යාල පද්ධතියෙන් නොසැපයෙන හෙයින් විවිධ අවශ්‍යතා සඳහා ශ්‍රමිකයන් විදේශවලින් ගෙන්වීමට සිදු වේ. එසේ ම අප රටේ නුපුහුණු ශ්‍රමය ගෘහ සේවිකාවන් ලෙස අඩු වැටුපකට වෙනත් රටවල සේවයට ද යොමු වේ. මෙය අධ්‍යාපනයේ පවත්නා විශාල අර්බුදයකි. මෙම තත්ත්වය සලකා බලා අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව 2012 සිට මධ්‍යකාලීන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම ඇරඹිණි. මෙහි දී 2016 වර්ෂය වන විට අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් තුළින් විභාග අසමත් වීමේ ප්‍රතිශතය අවම කිරීමත් සමත් ප්‍රතිශතය 80% තෙක් ක්‍රමයෙන් වැඩි කිරීමත් ප්‍රධාන ඉලක්කය විය.

අ.පො.ස. (උසස් පෙළ) විද්‍යා, ගණිත සහ තාක්‍ෂණවේදය විෂය ධාරා හදාරන ප්‍රතිශතය 21% සිට 40% තෙක් වැඩි කිරීමත් වානිජ විෂය ධාරාව හදාරන ප්‍රතිශතය 27% සිට 35% තෙක් වැඩි කිරීමත්, කලා විෂයයධාරාව හදාරන 51% වන ප්‍රතිශතය අනෙක් ධාරාවලට විතැන් කර 25% තෙක් අඩු කිරීමත්, තොරතුරු තාක්‍ෂණ සාක්‍ෂරතාව 35% සිට 75% දක්වා වැඩි කිරීම ද එකී මධ්‍ය කාලීන සැලැස්මේ අනාගත අධ්‍යාපන අපේක්‍ෂාවයි.

එම සැලැස්මට අනුවම අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ කිහිපයක් ම ඒකාබද්ධව ජාතික අධ්‍යාපන කොමිසම, ජාතික අධ්‍යාපන ආයතනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව, විශ්වවිද්‍යාලවල සහ උසස් තාක්‍ෂණ ආයතනවල සාමූහික ප්‍රයත්නයක් ලෙස ඉහත අපේක්‍ෂා සපුරාලීම සඳහා තාක්‍ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීමට සැලසුම් කර ඇත. මේ අනුව, ද්විතීයික පාසල් 1000ක් ප්‍රතිනිර්මාණය කරමින් ළමා මිතුරු පාසල් 5000ක් සංවර්ධනය තුළින් සමස්ත අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය උදෙසා අවශ්‍ය රාජ්‍ය මැදිහත් වීම මේ වන විට ආරම්භ වී ඇත. මේ අනුව, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් රුපියල් මිලියන 2500ක වියදමින් මූලික භෞතික අවශ්‍යතා සපුරාලීම දැනටමත් සිදු කර ඇත. ද්විතීයික පාසල් 409ක මේ වන විට මහින්දෝදය තාක්‍ෂණ විද්‍යාගාර ඉදි කර ඇති අතර, 2013 වර්ෂය තුළ දී ද්විතීයික පාසල් 1000ක ඉලක්කය සපුරා ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

අධ්‍යාපන පද්ධතියේ ඉහත සඳහන් කරන ලද අභියෝග ජය ගැනීමේත්, දැනුම කේන්ද්‍රීය සමාජයක් බිහි කිරීමේත් අරමුණින් ක්‍රියාත්මකවන 2013-2016 ද්විතීයික පාසල් සංවර්ධන වැඩසටහන අතිගරු ජනාධිපතිතුමාගේ ආශිර්වාදය ලැබූ ප්‍රමුඛතම වැඩසටහනක් වේ.

මෙම වැඩසටහනේ ප්‍රධානතම සංරචකයක් වන්නේ 2012 වර්ෂයේ දී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත් වූ සිසුන් වෙනුවෙන් අ.පො.ස. (උසස් පෙළ) සඳහා තාක්‍ෂණවේදය විෂය ධාරාව අලුතින් හඳුන්වා දීමයි. අ.පො.ස. (උසස් පෙළ) විද්‍යා විෂය ධාරාව සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වුව ද මෙම තාක්‍ෂණවේදය විෂය ධාරාව

හැදෑරිය හැකි වීම වැදගත් ලක්‍ෂණයකි. මෙම වැඩපිළිවෙළ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2013 ජූනි මස 20 වන දින ජාතියට දායාද කෙරේ. ඒ අනුව, පළමු අදියර යටතේ මෙම නව විෂය ධාරාව 2013 ජූලි 15 වන දින සියලු ම මැතිවරණ කොට්ඨාස නියෝජනය කෙරෙන පරිදි මහින්දෝදය තාක්‍ෂණ විද්‍යාගාර සහිත දිවිතීයික පාසල් 1000 අතුරින් තෝරා ගත් පාසල් 200ක ආරම්භ කෙරේ. මෙම විෂය ධාරාව ආරම්භ කෙරෙන 1AB පාසල්, මින් ඉදිරියට 1AB Super පාසල් ලෙස වර්ගීකරණය කෙරේ.

අ.පො.ස. (උසස් පෙළ) පන්තිවල දැනට පවත්නා විෂය ධාරා තුන සඳහා ශිෂ්‍ය සහභාගිත්වය පහත සංඛ්‍යා ලේඛනවලින් දැක්වේ.

**අ.පො.ස.(උසස් පෙළ) එක් එක් විෂය ධාරාව හදාරන ශිෂ්‍ය ප්‍රතිශතය-2012**

| විෂය ධාරාව | ශිෂ්‍ය සංඛ්‍යාව | ශිෂ්‍ය ප්‍රතිශතය |
|---|---|---|
| විද්‍යා | 1,03,160 | 22.4 |
| වාණිජ | 122,049 | 26.5 |
| කලා | 235,791 | 51.1 |

ඒ අනුව ගෝලීය ශ්‍රම බලකායේ නිපුණතා අත්පත් කර ගැනීමට ඍජු දායකත්වයක් ලබා නොදෙන කලා විෂය ධාරාවේ සහභාගිත්වය ඉහළ ප්‍රතිශතයක් ගන්නා බව ද එවැනි අවස්ථා ලබා ගැනීමට සහාය වන විද්‍යා හා වාණිජ විෂය ධාරාවේ ශිෂ්‍ය සහභාගිත්වය 48%ක් බව ද පැහැදිලි වේ.

ශ්‍රී ලංකා ආර්ථිකය බලගන්වනු වස් ශ්‍රම බලකායේ නිපුණතා වර්ධනය කිරීමේ අවශ්‍යතාව 2013 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව ද අවධාරණය කරයි. දැනුම කේන්ද්‍රීය සමාජයක් අරමුණු කර ගත් ද්විතීයික පාසල් දහසක් ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන මඟින්, කලා විෂය ධාරාවට විකල්ප ලෙස නවීන තාක්ෂණික දැනුම ලබා දෙන හා ශ්‍රම බලකායේ රැකියා අවස්ථා සැපයෙන පරිදි නව විෂය ධාරාවක් හඳුන්වාදී ම අවශ්‍ය වේ. මෙම අවශ්‍යතා යටතේ හඳුන්වා දෙනු ලබන තාක්ෂණවේදය නව විෂය ධාරාව මඟින් 2016 වර්ෂය වන විට උසස් පෙළ ශිෂ්‍ය සහභාගිත්වය විද්‍යා හා තාක්ෂණ විෂය ධාරා සඳහා 40%ක්

16

ද වාණිජ විෂය ධාරාව සඳහා 35%ක් ද කලා විෂය ධාරාව සඳහා 25% ක් ද ලෙස වෙනස් කෙරෙනු ඇත.

මෙම විෂය ධාරාව ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය මානව සම්පත නුදුරු අනාගතයේ දී ගුරු පුහුණුව මඟින් සපුරාලීමට සැලසුම් කර ඇත.

ජාතික අධ්‍යාපන ආයතනය විසින් මෙම විෂය ධාරාව පාසල්වලට හඳුන්වාදීමට විෂයමාලා, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සකස්කර අවශ්‍ය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය දැනටමත් ඉටු කර ඇති අතර ගුරු සම්පත් ද පුහුණු කර ගනිමින්, 2016 දී මධ්‍යකාලීන අධ්‍යාපන සංවර්ධන සැලැස්මේ පරිදි මෙම සුවිශාල අධ්‍යාපනික හැරවුම යථාර්තයක් වීම පිණිස අවශ්‍ය විධිවිධාන යොදා ඇති බව විශේෂයෙන් සඳහන් කළ යුතු වේ.

ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රමෝපාය අතර දැනුම කේන්ද්‍රීය සමාජයක ශ්‍රී ලාංකික පුරවැසියන් සාමාජිකයින් බවට පත්කරමින් ආසියාවේ ආශ්චර්යය බවට පත්වීමට අධ්‍යාපනයේ මෑත ඉතිහාසයේ පෙර නොවූ විරූ දායකත්වය මෙම වැඩසටහන තුළින් ලබා දීමට හැකි වනු ඇත.

අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දෙන්නේ ඇයි?



**ගරු මොහාන් ලාල් ග්‍රේරෝ**
**(අධ්‍යාපන අධීක්ෂණ මන්ත්‍රී)**

**ඔබත් දක්ෂයෙක් ...**

අම්මලා තාත්තලා දරුවන් ඉස්කෝලේ එවන්නේ හොඳට ඉගෙන ගන්නයි. ළමා කාලයේදී ගොඩක් දේවල් අපි ඉගෙන ගන්නවා. ඒත් හැමෝටම අ.පො.ස. සාමාන්‍ය පෙළ ඉහළ ප්‍රතිඵල ලැබෙන්නේ නෑ. විභාග ඉහළින්ම පාස් වුණේ නැති බොහෝ අය පසුව විවිධ රැකියාවල දක්ෂයන් වෙලා තියෙනවා. වෘත්තීය පුහුණු ආයතනවල, කාර්මික විද්‍යාලවල පාඨමාලා හදාරන බොහෝ අය ඉතා දක්ෂ ශිල්පීන් වෙනවා. සමහරු ඉතාම දක්ෂ විදියට වැඩිදුර ඉගෙනගෙන උපාධි, පශ්චාත් උපාධි ලබනවා. තවත් සමහරු ඉතා ධනවත් ව්‍යාපාරිකයෝ වෙලා තියෙනවා. එහෙම ධනවත් වූ ව්‍යාපාරිකයන් තමුන්ගේ ආයතනවල වැඩ කරන්නට වෛද්‍යවරුන්ට, ආචාර්ය මහාචාර්යවරුන්ට රැකියා ලබාදෙන අවස්ථාත් තියෙනවා.

මෙහි දී වැදගත් වෙන්නේ අපේ නියම දක්ෂතාවලින් සමහරක්, උදාහරණ විදිහට දෑත් දෙපා සමායෝජනය කර නිවැරදිව හා පිරිසිදුව වැඩක් කිරීමේ හැකියාව (චාලක බුද්ධිය), කණ්ඩායම් නායකයකු වීමේ සමාජ කුසලතාව (අන්තර් පුද්ගල බුද්ධිය), තමා ගැන විනිශ්චය කිරීමේ හා සිතීමේ බුද්ධිය (පුද්ගල ඇතුළාන්ත බුද්ධිය), ස්වභාව ධර්මයට අනුගත වෙමින් ඒ අනුව සිතීමේ හා වැඩ කිරීමේ බුද්ධිය (ස්වභාව ධර්මය පිළිබඳ බුද්ධිය) ආදී විවිධ බුද්ධි ඇතුළු තවත් අංශ සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළ විභාගවලින් මැනීමට නොහැකි බව තේරුම් ගැනීමයි. විද්‍යාවට, ගණිතයට හා භාෂාවට පිකක් අඩු ලකුණු තිබුණත් දරුවකුගේ සැඟවුණු දක්ෂතා කරළියට ගන්න බැරිවීම අපේ අධ්‍යාපන ක්‍රමයේ තිබුණු ලොකු අඩුවක්.

**නියම වෙනසක් ...**

න්‍යායික බුද්ධියට අමතරව "කිරීමේ" හැකියාව ඇති බොහෝ ශ්‍රී ලාංකීය දරුවන්ට අතිශයින් වැදගත් වන පරිවර්තනයක් ළඟදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වුණා. ඒ තමයි උසස් පෙළට තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීම.

**ගණිතයට, විද්‍යාවට සම්මාන ඕන නෑ ...**

දරුවකුට සා.පෙළ ගණිතය හා විද්‍යාව ඇතුළුව විෂය හයක් (මව් භාෂාව සමත් ව තිබිය යුතු වේ), ඕනෑම විෂය තුනක් සඳහා සම්මාන තුනක් සහිතව සමත් වුණොත් උ.පෙළ සඳහා තාක්ෂණවේදය විෂය ධාරාව තෝරා ගන්න පුළුවන්. සා.පෙළ ප්‍රතිඵල වගේම මෙතන දී විශ්වාස කරන්නේ දරුවකුගේ සැඟවුණ දක්ෂතා ගැනයි.

ඇත්තටම සම්මත විශ්වවිද්‍යාලයකට ගිහින් ලබා ගන්නා න්‍යායික දැනුමත් එක්ක සසඳන කොට ඊට නොදෙවෙනි න්‍යායික දැනුම පමණක් නොව, දෑතේ පුහුණුවත් එක්ක හිතන්න විතරක් නෙමෙයි "කරන්නත්" පුළුවන් නියම මිනිසකු, නියම කාන්තාවක වෙන්න මේ තාක්ෂණවේදය විෂය ධාරා මාර්ගය පාවිච්චි කරන්න පුළුවන්. පිකක් කැපවීම තිබුණොත් කලකදී උපාධි, පශ්චාත් උපාධි ලබාගෙන මහාචාර්යවරයකු වෙන්නත් පුළුවන්. හැබැයි බිත්තියට ඇණයක්වත් ගහන්න බැරි මහාචාර්යවරයකු නම් නොවෙයි. වැඩත් දන්න, සිද්ධාන්තත් දන්න, දහඩියේ වටිනාකමත් දන්න නියම මිනිහෙක්. හැබැයි මේක රෝස මල් අතුරපු සෙල්ලම් මාවතක්ම නොවෙයි.

**වැඩ ලෝකයට ඇතුළු වෙන්න තාක්ෂණය හා නිපුණතාව අවශ්‍යයි**

මේ මාර්ගය පටන්ගන්නේ පොඩි වෙනසකුත් එක්ක. අපි සිද්ධාන්ත ඉගෙනගන්න ගමන්ම වැඩ ලෝකය ගැනත් ඉගෙන ගන්නවා. ඒක තමයි මානව සංහතියේ ලෞකික අභිවෘද්ධියට තිබෙන නියම ලෝකය. ඉතින් අපි පිකෙ පිකෙ වැඩ කරන්නත් ඉගෙන ගන්නවා. මේ පාර හදලා තියෙන්නේ දෙපැත්තකට බෙදෙන විදිහට. ඒ ඔබේ දක්ෂතා අනුව තෝරා ගත් එක පාරක යන්නයි.

**පාරවල් දෙක මේ විදිහයි ...**

අවම සුදුසුකම්

(1) ගණිතය, විද්‍යාව ඇතුළුව සා.පෙළ විෂය 6ක් සමත් වීම (මව් භාෂාව සමත් වී තිබිය යුතුයි)
(2) ඕනෑම විෂය තුනකට සම්මාන ලබා ගැනීම

**(1) ඉංජිනේරු තාක්ෂණය**
සිවිල්, යාන්ත්‍රික හා විදුලි තාක්ෂණ විද්‍යා මූලධර්ම හා පුහුණුව.
**(2) තාක්ෂණය සඳහා විද්‍යාව**
රසායන, භෞතික, ජීව විද්‍යා හා ගණිතය ආශ්‍රිත තාක්ෂණයට අවශ්‍ය මූලධර්ම හා පුහුණුව.
**(3) නිර්දේශ කරනු ලබන විෂය 10 ක් අතුරින් තෝරාගත් විෂයය.**

**(1) ජෛව පද්ධති තාක්ෂණය**
ආහාර, පසු අස්වනු, කෘෂි, ජෛව සම්පත් තාක්ෂණ මූලධර්ම හා පුහුණුව.
**(2) තාක්ෂණය සඳහා විද්‍යාව**
රසායන, භෞතික, ජීව විද්‍යා හා ගණිතය ආශ්‍රිත තාක්ෂණයට අවශ්‍ය මූලධර්ම හා පුහුණුව.
**(3) නිර්දේශ කරනු ලබන විෂය 10 ක් අතුරින් තෝරාගත් විෂයය.**

නිර්දේශ කරනු ලබන විෂය දහය පහත දැක්වෙයි. මේ දහයෙන් ඔබට කැමති ඒ වගේම ඔබේ පාසලේ උගන්වන විෂයයක් ඔබට තෝරා ගන්න පුළුවන්.

(1) ආර්ථික විද්‍යාව
(2) භූගෝල විද්‍යාව
(3) ගෘහ ආර්ථික විද්‍යාව
(4) ඉංග්‍රීසි
(5) ගිණුම්කරණය
(6) සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
(7) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
(8) චිත්‍ර කලා
(9) ව්‍යාපාර අධ්‍යයනය
(10) කෘෂි විද්‍යාව

20

මුලින් පාසල් 200 ක පමණයි ...

මේ විෂය ධාරාව මුලින්ම පටන් ගන්නේ ඉස්කෝල 200 ක විතරයි. හැබැයි ඔබේ ඡන්ද කොට්ඨාසයට අනිවාර්යයෙන් එක පාසලක් ලැබෙනවා. ඉතින් මේ විෂය ධාරාව තෝරා ගත්තොත් උසස් පෙළ හදාරන්න ළඟම තිබෙන තාක්ෂණවේදය විෂය ධාරාව උගන්වන පාසලට යන්න වෙනවා. පසුව මේ පාසල් සංඛ්‍යාව වැඩි වේවි.

ඉංජිනේරු තාක්ෂණවේදය හා ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය දෙක සඳහා සිද්ධාන්ත වගේම ප්‍රායෝගික පුහුණුව හා නිපුණතා සංවර්ධනයත් ඇතුළත් වෙනවා. ප්‍රායෝගික වැඩ සඳහා ළඟම තිබෙන වෘත්තීය පුහුණු ආයතනයට හෝ කාර්මික විද්‍යාලයට යවනවා. ඒක ඉතාම සතුටින්, උද්යෝගයෙන් කරන්න පුළුවන් ඉගෙනුම් කොටසක්. පන්ති කාමරේ හිරවෙලා කළුලෑල්ලම බලාගෙන ඉන්නේ නැතිව වෙනස් තැනක, වෙනස් පරිසරයක, වෙනස් උපදේශකවරු එක්ක අපිට හොඳ, රටට හොඳ, අනාගතයට හොඳ වැඩක් ඉගෙන ගන්න පුළුවන් වෙන එක මොනතරම් සතුටක් ද? මේ වැඩවලට වෙනම ලකුණුත් ලැබෙනවා.

අනෙක් විෂය දෙක පාසලේදීම උගන්වනවා. ඒවාටත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් තියෙනවා.

අධ්‍යාපන අමාත්‍යාංශය පමණක් නොවෙයි...

මේ විෂය ධාරාව සැලසුම් කළේ හා ක්‍රියාත්මක කරන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය විතරක් නොවෙයි. මේ සඳහා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයත් හරි හරියට දායක වෙනවා. තාක්ෂණ විෂයයට ගුරුවරුන් සපයන්නෙත්, ප්‍රායෝගික කටයුතු සඳහා වෘත්තීය පුහුණු ආයතන පහසුකම් ලබා දෙන්නෙත්, ප්‍රායෝගික ලකුණු ඇස්තමේන්තු කරන්නෙත් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය මඟින්. ඉතින් දරුවාට ලැබෙන්නේ මේ අමාත්‍යාංශ දෙකේම ඉහළම වටිනාකම්වල එකතුවක්.

විභාගයෙන් අසාර්ථක වුණත්... ජීවිතේ අසමත් වෙන්නේ නෑ...

යම් හේතුවකින් තාක්ෂණ විෂය ධාරාව තෝරාගත් ශිෂ්‍යයෙක් උසස් පෙළ විභාගයෙන් අසාර්ථක වුණාය හිතමු. ඒත් ඒ දරුවා ජීවිතෙන් අසමත් වෙන්නේ නෑ. ඒ මොකද ලබා ගන්න ප්‍රායෝගික දැනුම අනුව නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබෙන ජාතික වෘත්තීය සුදුසුකම් තුන්වන මට්ටම [NVQ III] මේ දරුවන්ට ලැබෙනවා. NVQ III සහතික පත්‍රය සමඟ සුදුසු රැකියාවකට යන්නත් ලේසියි. එහෙම නැත්නම් NVQ IV ලබා ගන්න කාර්මික විද්‍යාලයකට හෝ පුහුණු ආයතනයකට බැඳුනාම මාස දහඅටකින් NVQ IV සහතිකය ලබා ගත හැකියි. ඊට පස්සේ කෙළින්ම විශ්වවිද්‍යාල විද්‍යායතනයකට (University College) බැඳුනාම තාක්ෂණවේදී (B.Tech) උපාධිය ලබා ගන්න පුළුවන්. මේ විදිහට යන්න පුළුවන් පාරවල් ගොඩයි. බැරිය කියලා කම්මැලිකමේ ඉන්නේ නැතිව "පුළුවන්... කරමු" කියලා දරුවන් ශක්තිමත් කරන්න. තාක්ෂණවේදය විෂය ධාරාව තෝරාගන්න හැමෝවම උනන්දු කරන්න.

චෝදනාව අහෝසියි...

"වසරකට දරුවෝ ලක්ෂ තුනහමාරක් පාසල් පද්ධතියෙන් ඉවත් වෙනකොට විශ්ව විද්‍යාල යන්නේ විසිතුන්දාහක් පමණයි. ඒකෙනුත් සියයට තිස් පහක් (35%) කලා උපාධියට. කලා උපාධිධාරීන්ට රැකියා නෑ. රටේ තියෙන රැකියාවලට මිනිස්සු නෑ. ඉතිරි දරුවන්ට යන කල දසාව මොකක්ද?" අපේ අධ්‍යාපනයට තිබුණු ලොකුම චෝදනාව මේකයි.

දැන් මේක වෙනස් වෙනවා. දැන් ගඟ ගලන්නේ.. මල් පිපෙන්නේ.. සා.පෙළ A 9 ක්, උ.පෙළ A 3 ක් ගන්න දරුවන්ට විතරක් නොවෙයි. දැනුමයි කෙරුමයි දෙකම තියෙන, ඊටත් වඩා උත්සාහය, ධෛර්යය හා කැපවීම තියෙන නියම ලංකා පුත්‍රයින්ට අලුත් පාරක් හදලා දීලා තියෙනවා. අපේ දරුවන්ට අලුතෙන් ඉර පායනකොට මේ පාර හදලා දීපු ඔක්කෝම මාමලාට නැන්දලාට පිං සිද්ධ වෙනවා. කඨා වපුරමින් සීත කාමරවල කාලය ගත කරන නිකමුන් වෙනුවට මහපොළොවේ පය ගහලා වැඩ කරන ධෛර්යවන්ත මනුස්ස සමාජයක් හැදුවාම ලංකාව නියම දැනුම් කේන්ද්‍රයක් බවට පත් වේවි. ඒ හීනය හැබෑ වෙනකං අපි වැඩ කරනවා...

විභාග තක්සේරුව මේ විදිහයි...

වසර දෙක අවසන් වුනාම විෂය තුනටම සිද්ධාන්ත විභාගයක් තියෙනවා. හැබැයි ඉංජිනේරු තාක්ෂණය හා ජෛව පද්ධති තාක්ෂණය කියන විෂයවල සිද්ධාන්ත සඳහා ලැබෙන්නේ ලකුණු සියයට හැත්තෑ පහක් (75%) විතරයි. ඉතිරි සියයට විසි පහ (25%) ලැබෙන්නේ පුහුණු ආයතනයේ දී කළ වැඩ සඳහායි. එතකොට මේක දැනුම විතරක් නෙමෙයි "කෙරුවාවත්" මනින විෂය ධාරාවක්. හොඳට ලකුණු ගත්තොත් දරුවා පොතේ ගුරෙක් විතරක් නෙමෙයි හොඳ කෙරුමෙක්. නියම මිනිහෙක්; නියම ගැහැණියක් වෙනවා.

ඉතිං ඊට පස්සේ, සාර්ථකත්වය සඳහා තෝරා ගන්න පාරවල් ගොඩයි.

- මේ විෂය ධාරාවෙන් ඉහළින් උ.පෙළ සමත් වුණොත් ඔබට සම්මත විශ්වවිද්‍යාලවලට බැඳිලා තාක්ෂණවේදී උපාධිය හදාරන්න පුළුවන්. ඒ සඳහා වසර 2015 වෙනකොට සෑම විශ්ව විද්‍යාලයකම තාක්ෂණ විද්‍යා පීඨයක් අරඹන්න විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව තීරණය කරලා ඉවරයි. ඉතිං ඔබටම ඇරුණු විශ්වවිද්‍යාල තාක්ෂණ පීඨ ඇති වෙනවා.
- විෂය ධාරාව සමත් සිසුන්ට යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය අලුතෙන් ආරම්භ කරන විශ්වවිද්‍යාල විද්‍යායතනවලට (University College) ඇතුළු වෙන්නත් පුළුවන්. ඒ පාඨමාලාවෙන් ඩිප්ලෝමාව, උසස් ඩිප්ලෝමාව හා උපාධිය යන සුදුසුකම් තුනක්ම වසර හතරක දී ලබා ගන්න පුළුවන්. ඒ වැඩ ලෝකය පිළිබඳව නියම දැනුමක් හා පුහුණුවකුත් එක්කයි.
- එහෙමත් නැත්නම් රත්මලාන ලංකා-ජර්මානු තාක්ෂණ ආයතනයේ, ඔරුගොඩවත්ත රථ වාහන තාක්ෂණ ආයතනයේ නැත්නම් කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ඉගෙනුම හා පුහුණුව ලබන්න පුළුවන්. මේවායේ ඉගෙන ගත්ත බොහොම දෙනෙක් අද මෙරට හා පිටරටවල ඉහළම මට්ටමේ වේතන ලබන දක්ෂ තාක්ෂණවේදියෝ, නැත්නම් ඉංජිනේරුවෝ.



வாழ்த்துச்செய்தி

கல்வித்துறையில் உயர்தர வகுப்பிற்குத் தொழிநுட்பவியற் துறையை அறிமுகப்படுத்துவதை முன்னிட்டு இந்த வாழ்த்துச்செய்தியை அனுப்புவதில் பெருமகிழ்ச்சியடைகிறேன்.

கப்பற்துறை,விமானத்துறை, வர்த்தகம், சக்திவலு மற்றும் அறிவியல் துறையில் பிராந்தியத்தின் கேந்திர நிலையமாக அபிவிருத்தி செய்வதன் மூலம் இலங்கையை ஆசியாவின் ஆச்சரியமாக ஆக்குவதற்கு மஹிந்த சிந்தனை நடவடிக்கையெடுத்துள்ளது. இந் நோக்கத்திற்காகத் தேவையான மனித வலுவைக் கட்டியெழுப்புவதே இன்று எமக்கு முன்னுள்ள மிகப்பெரும் சவாலாகும். உயர்தர வகுப்புப் பாடத்திட்டத்தில் தொழிநுட்பவியல் துறையை அறிமுகம் செய்வது இச்சவாலுக்கு முகங்கொடுப்பதற்காக எடுக்கப்பட்டுள்ள ஒரு முக்கிய நடவடிக்கையாகும்.

தற்போதைய கல்வி முறைமையை விஞ்ஞானம் ,தொழிநுட்பவியல் மற்றும் நடைமுறை அனுபவம் ஆகியவற்றுக்குள்ள வரையறைகள் பாரியதோர் பின்னடைவிற்கு இட்டுச்செல்கின்றன.இது பாரம்பரிய கல்வி முறைமைகளுக்குள் மட்டுப்பட்டிருந்த நிலைமையைத் தாண்டிச்செல்லும் எமது தேவைகளுக்கான மிகவும் பொருத்தமான ஒரு கல்வி முறைமையைக் கட்டி எழுப்புவதற்கு மஹிந்த சிந்தன முன்மொழிவு வழி வகுத்தது. இதன் மூலம் நாட்டில் தொழிநுட்பவியல் முன்னேற்றத்திற்கான தொழிநுட்பவியல் திறமைகளையும் அனுபவத்தையும் கொண்ட மனிதவளத்தை நாம் எதிர்காலத்தில் பெற்றுக்கொள்ள முடியும். உயர்தர வகுப்புப் பாடத்திட்டத்தில் தொழிநுட்பவியல் துறையை அறிமுகம் செய்வது முன்னேற்றத்திற்கான திருப்புமுனையாகும்.

தொழிநுட்பவியல் பாடத்துறையைத் தெரிவு செய்யும் மாணவர்கள் எதிர்காலக் கல்வித் தேவைகளுக்கு உதவுகின்ற சிறந்த பிரயோக அறிவுடன் முன்னேறிச் செல்வார்கள் என நாம் எதிர்பார்க்கிறோம். கல்வித்துறையின் முன்னேற்றத்திற்காகச் செய்யப்பட்டிருக்கும் இந்த முக்கிய அறிமுகப்படுத்தல் நடவடிக்கை முழுமையாக வெற்றிபெற எனது வாழ்த்துக்கள்.

மஹிந்த ராஜபக்ஷ

## அறிமுகம்

இலங்கையை ஆசியாவின் ஆச்சரியமிக்கதாக மாற்றியமைக்கும் பாரிய செயற்பாடுகளில் ஈடுபட்டுள்ள வேளையில் பொதுக் கல்வி முறைமைக்காக தொழிநுட்ப பாடவிதானத்தை அறிமுகப்படுத்துவது கல்வியின் விஷேட அம்சமாகும்.

கடந்த தசாப்தத்திற்குள் தொழிநுட்பம் மற்றும் சேவைப் பிரிவின் விருத்தி உட்பட கடல், வான், வர்த்தக, மின்சக்தி மறறும் அறிவினைக் கேந்திரமாக கொண்ட மானிட வள விருத்திக்காக அரசின் அபிவிருத்தித் திட்டங்கள் தொழிநுட்பத் தொடர்பில் திசைப்படுத்தப்பட்டுள்ளன.

பொதுக்கல்வியின் தொழிநுட்ப துறை தொடர்பிலான அடிப்படை பணிகளாக அமைவது பொருள், கருவிகள் மற்றும் தொழிநுட்ப கலைகள் தொடர்பான ஆய்வுகள் மூலம் முழுமையான உற்பத்தி செயற்பாடுகள், விநியோகம் மற்றும் முகாமைத்துவத்தை போன்ற பிரயோக அணுகுமுறை கொண்ட கற்றல் கற்பித்தல் ஊக்குவித்தல் மற்றும் வேலை உலகை மற்றும் தொழிநுட்ப உலகினை அறிமுகப் படுத்துவதன் மூலம் கல்வித்துறை சார் செயற்பாடுகளை விருத்தி செய்வதற்காக யுனேஸ்கோ மற்றும் சர்வதேச தொழிலாளர் அமைப்பினால் பரிந்துரைகள் மேற்கொள்ளப்பட்டுள்ளன.

க.பொ.த (சா.த) மட்டத்தில் தொழினுட்ப பாடத் தொகுதியினூடாக சகல மாணவர்களுக்கும் வேலை உலகம் தொழினுட்ப உலகம் தொடர்பான அறிமுகப்படுத்தல் ஏற்படுத்தப்பட்டிருப்பினும் மேலும் தொழிநுட்பவியல் அல்லது அத்துறையில் மூன்றாம் நிலைக் கல்வியைத் தொடர்வதற்கான எதிர்பார்ப்புள்ள மாணவர்களுக்கு இவை போதுமானதல்ல.

தற்போது க.பொ.த (உ.த) இல் விஞ்ஞான கணிதபிரிவில் 22 வீதமானோரும் வர்த்தக பிரிவில் 27 வீதமானோரும் கலைப்பிரிவில் 51 வீதமானோரும் கற்கின்றனர். உயர்தர கலைப்பிரிவில சித்தியடைந்தும் பல்கலைக்கழக அனுமதி கிடைக்காத அநேகர் வேலைவாய்ப்பின்றி உள்ளனர்.

தற்போது ஊழியர் சந்தையின் கேள்விகளுக்கு ஏற்றவாறு தேர்ச்சிகள் கொண்டோர் குறைவதனால் கலைப்பட்டதாரிகளுக்கிடையே வேலையில்லா பிரச்சினைகள் காணப்படுகின்றது. இது நாட்டின் பொருளாதார அபிவிருத்திக்கு பாரிய பிரச்சினையாகும். தொழிநுட்பவியல் பாடவிதானத்தினை அறிமுகப்படுத்துவதன் மூலம் பல்கலைக்கழகத்தில் அல்லது தொழிநுட்பத்தில் மற்றும் தொழில்சார் கல்வியின் போது மூன்றாம் நிலை கல்விற்காக தேவையான வழிகாட்டல்கள் மாணவர்களுக்கு வழங்கப்படுகின்றன. 2016ம் ஆண்டில் க.பொ. த (உ.த) விஞ்ஞான கணிதபிரிவில் 40 வீதமானோாரக அதிகரிப்பதற்கும் கலைப்பிரிவில் 25 வீதமானோராக குறைப்பதற்கும் எதிர்பார்க்கப்படுகின்றது

க.பொ.த (உ/த) இற்காக உத்தேச தொழிநுட்பவியல் பாடவிதானம் தனியான பாடவிதானம் என்பதுடன் அது தொழிநுட்ப மற்றும் வேலை உலகுக்குரிய துணைப் பாடங்களை கொண்டமைந்துள்ளன. இப்பாடவிதானம் விரிவான தொழிநுட்பத்துறையின் கீழ் அறிமுகப்படுத்தப் பட்டுள்ளதுடன் மாணவர்களுக்கு பொறியியல் தொழிநுட்பவியல் மற்றும் உயிரியல் தொழிநுட்பவியல் ஆகிய பாடங்களில் இரண்டில் ஒன்றை தேர்ந்தெடுக்க முடியும். அத்துடன் இப்பாட விதானத்தில் இரண்டாவது பாடமான தொழிநுட்பத்துக்காக விஞ்ஞானம் என்ற மாணவர்கள் தேர்ந்தெடுத்த தொழிநுட்ப பாடவிதானத்துக்குத் தேவையான கணிதம், விஞ்ஞானம், தகவல் தொழிநுட்பம் தொடர்பான மூன்று அம்சங்ளை தொடர்வதற்கு சந்தர்ப்பங்கள் வழங்கப்படுகிறது.

இப்பாட கலப்பின் மூன்றாவது பாடம் க.பொ.த (உ/த) இற்காக தற்போது அமுலில் உள்ள பாடங்களின் ஒரு பாடமாகும்.

இதற்கமைய பாட உள்ளடக்கம் கீழே குறிப்பிடப்பட்டுள்ளது.

(1) பொறியியல் தொழிநுட்பவியல் **(Engineering Technolgy)**

பொறியியல் தொழினுட்பமானது நிருமாணிப்புத் தொழினுட்பம், போக்குவரத்துச் சாதன தொழினுட்பவியல், சுற்றாடல் பிரச்சினைகள் ஆகிய துறைகள் சார்ந்ததாகும். பொறியியல் தொழினுட்பமானது, தொழினுட்ப முறைமைகளில் ஏற்படும் பிரச்சினைகளுக்கு தீர்வு காணத்தக்க பொறியியல் கூறாகும்.

இந்த உயர்தர வகுப்புக்களுக்கான பாடத்திட்டம் உயிர் முறைமைகள் பாடம் தொடர்பான திறன்களை மாணவர்கள் பெற்றுக் கொள்ளும் வகையில் வடிவமைக்கப்பட்டுள்ளது. நாட்டிலுள்ள வளங்கள் தொடர்பான திறன்களுடன் கூடிய தொழிற்ற தகைமைகளைப் பெற்றுக் கொள்ளத் தக்கதாக மாணவருக்குக் கறப்பித்தலை மேற்கொள்வது பயன்மிக்கதாகும். இதன் மூலாக மாணவரது ஆர்வம், ஊக்கம், ஆய்ந்தறியும் திறன் ஆகியன மேம்படும்.

உயிர்முறைமைகள் தொழினுட்பம்
**(Biosystems Technology)**

உயிர்முறைமைகள் தொழினுட்பமானது சூழலியற் பொறியியல், உயிரியல் பதப்படுத்தற் பொறியியல், உயிர்மருத்துவப் பொறியியல், விவசாயம் ஆகிய தொழினுட்பங்களை அடக்கியதாகும். ஆகவே உயிர்முறைகள் தொழினுட்பவியலானது, இத்துறையிலுள்ள பிரச்சினைகளுக்கான தீர்வுகளை வழங்குவதும் பொறியியல் மற்றும் பிரயோக பொறியியல் ஆகியவற்றின் உப பிரிவாகவும் அமைந்துள்ளது.

இந்த உயர்தர வகுப்புக்களுக்கான பாடத்திட்டம் உயிர்முறைமைகள் பாடம் தொடர்பான திறன்களை மாணவர்கள் பெற்றுக் கொள்ளும் வகையில் வடிவமைக்கப்பட்டுள்ளது. நாட்டிலுள்ள வளங்கள் தொடர்பான திறன்களுடன் கூடிய தொழிற்றகைமைகளைப் பெற்றுக்கொள்ளத் தக்கதாக மாணவருக்குக் கறப்பித்தலை மேற்கொள்வது பயன்மிக்கதாகும். இதன்மூலாக மாணவரது ஆர்வம், ஊக்கம், ஆய்ந்தறியும் திறன் ஆகியன மேம்படும்.

02 தொழிநுட்பவியல் விஞ்ஞானம்
03 மூன்றாவது பாடப்பிரிவின் ஒரு பாடம்

- பொருளியல்
- புவியியல்
- மனைப்பொருளியல்
- ஆங்கிலம்
- தொடர்புசாதனம் மற்றும் ஊடக கற்கை
- தகவல் மற்றும் தொடர்புசாதன தொழிநுட்பம்
- சித்திரம்
- வர்த்தகக்கல்வி
- விவசாயம்
- கணக்கியல்

நோக்கம்.

01. நாளாந்த வாழ்வுக்கு பயன்படுத்தப்படும் தொழிநுட்ப திறமைகளை மாணவர்களுக்கு வழங்குதல்.
02. உண்மையான உலகில் பிரச்சினைகளுக்கு தொழிநுட்ப தீர்வுகளை காண்பதற்கான இயலுமைகளை விருத்தி செய்தல்.
03. ஊழியர் சந்தைக்கு ஏற்றவாறு திறமைகளை வழங்குதல்.
04. தேசிய தொழிற் தகைமை கோட்பாட்டிற்கமைய தொழிற் கல்விக்காக மாணவர்களை ஈடுபடுத்தல்.

28

## க.பொ.த. உயர்தரபொதுக் கல்விக்காக தொழில்நுட்பப் பாடவிதானத்தினைத் தாபித்தல்

(கலாநிதி டீ.ஏ. பியசிறி, உப வேந்தர்,தொழில்சார் தொழில்நுட்பப் பல்கலைக்கழகம்)

இலங்கையில் கடந்த ஐந்து வருடங்களாக 6 % இற்கு மேற்பட்டபொருளாதார விருத்தி காணப்படுவதுடன் 2009 ஆம் ஆண்டில் யுத்தம் முடிவுக்குக் கொண்டு வரப்பட்டதைத் தொடர்ந்து 2010 மற்றும் 2011 ஆம் ஆண்டுகளில் பொருளாதார வளர்ச்சி விகிதாசாரம் 8%ஐத் தாண்டியுள்ளது. 2009 ஆம் ஆண்டில் 2000 அமெரிக்க டொலரைத் தாண்டும் தனிப்பட்ட வருமானத்தை எட்டி இலங்கை நடுத்தர வருமானத்தினைப் பெறும் மாற்றம் பெற்றுள்ளதுடன், அத்துடன் 2016 ஆம் ஆண்டில் 4000 அமெரிக்க டொலர் வரை அதிகரிக்கும் என எதிர்பார்க்கப் படுகின்றது. மொத்ததேறிய உள்நாட்டு உற்பத்தியில் கைத்தொழில் துறையின் பங்களிப்பு 2000 ஆம் ஆண்டில் 27.30 சதவீதம் தொடக்கம் 2010 ஆம் ஆண்டில் 29.4 வரை அதிகரித்துள்ளது. கூடுதலான வளர்ச்சியில் தேறிய உள்நாட்டு உற்பத்தி கணிக்கப்படுவது சேவைத்துறை எனப்படுவதுடன் அது 2000 ஆம் ஆண்டில் 52.8 சதவீதமாகக் காணப்பட்ட பெறுமதி 2010 ஆம் ஆண்டில் 57.8 சதவீதம் வரையான விகிதாசாரமாக அதிகரித்துள்ளது. அத்துடன், தொழில்நுட்பமற்றும்

சேவைப் பிரிவின் தொழில் வாய்ப்பு விகிதாசாரம் 2000 மற்றும் 2010 ஆண்டுகளில் தனித்தனியாக நோக்கும் போது 23.6 மற்றும் 40.3 தொடக்கம் 24.6 மற்றும் 43.1 வரை அதிகரித்துள்ளது. கடந்த தசாப்தத்தில் கைத்தொழில் மற்றும் சேவைத் துறையில் ஏற்பட்ட வளர்ச்சி மற்றும் இலங்கையின் கடல்,வான்,வர்த்தக,மின்சக்தி மற்றும் அறிவுக் கேந்திரமாக மாற்றியமைப்பது அரசின் அபிவிருத்தித் திட்டங்களுக்காக உட்பட்டவாறு வள விருத்திகளை மேற்கொள்வது அத்தியவசியமாகும்.

பொருட்கள், கருவிகள், தொழில்நுட்பம மற்றும் உற்பத்தி விநியோகமும் முழுமையாக முகாமைத்துவச் செயற்பாடுகளும் வேலை உலகு உட்பட தொழில் நுட்ப உலகிற்கு அறிமுகப்படுத்த நடவடிக்கைகள் எடுப்பதன் மூலம் கல்வியின் எல்லைகளுக்கு அப்பால் செல்லல் மற்றும் பிரயோக அனுபவத்தினைப் பெற்றுகற்றல் செயற்பாடுகளை வலுவூட்டவதற்கும் பொதுக் கல்வியில் தொழில்நுட்பக் கல்வியினைத் தாபிக்கும் செயற்பாடுகளை இனங்காண்பது யுனெஸ்கோ உட்பட சர்வதேச தொழிலாளர் அமைப்புக்களின் பரிந்துரைகள் (2002) மூலம் மேற்கொள்ளப்படுகின்றது. உயரிய இடைநிலைக் கல்வியின் தொழில்நுட்பப் பாடவிதானத்தினை அறிமுகப்படுத்துவதன் மூலம் இது அநேகமான நாடுகளில் அமுல் படுத்தப்பட்டுள்ளதுடன் ஆசிய வலயத்தில் அபிவிருத்தியடைந்துவரும் நாடுகளான மலேசியாவின் அனுபவங்கள் தொடர்பில் கவனம் செலுத்துவது மிக முக்கியத்துவம் வாய்ந்ததாகும். இலங்கையில் க.பொ.த. (சா.த.) பாடவிதானத்தில் தொழில்சார் பாடவிதான வழிகாட்டிகளை சகல மாணவர்களுக்கும் வழங்கி வேலை உலகிற்கு மற்றும் தொழில் நுட்பஉலகிற்கான பிரவேசத்தினை வழங்குகின்ற போதிலும் மூன்றாம் நிலைக் கல்விக்கு அல்லது பொருத்தமான தொழிலை இனங்காண்பதற்கு அல்லது மேலதிக தகவல் தொழில் நுட்பக் கல்விக்கான பிரவேசங்களை எதிர்பார்ப்பதற்காகப் பொருத்தமானசெயற்பாடுகள் ஆகும்.

க.பொ.த. உயர்தரப் பாட விதானமாக கலை, வர்த்தகம்,விஞ்ஞானம் மற்றும் கணிதம் ஆகிய பாடவிதானங்கள் வழங்கப்படுவதுடன் மாணவர்களில் பெரும்பான்மையானோர் கலைப் பாடத்தினைத் தேர்ந்தெடுக்கின்றனர். க.பொ.த. உயர்தரப்பரீட்சைகள் இப்பாடவிதானங்கள் நான்கின் ஊடாகத் தொடர்ந்து க.பொ.த. (உ.த.) பரீட்சையில் சித்தியடைந்து பல்கலைக்கழங்களுக்கு பிரவேசிக்கும் எண்ணிக்கை இணைப்பு-A மற்றும் இணைப்பு-B இல் குறிப்பிடப்பட்டுள்ளது. இதன் மூலம் பெரும்பான்மையான மாணவர்கள் கலைப் பாடவிதானப் பட்டத்தினைத் தொடர்வதற்கு இணைந்து கொள்வதாக இனங் காணப்பட்டுள்ளது. தற்போது 6 தொழில்நுட்பப் பாடங்கள் அறிமுகப் படுத்தப்பட்டுள்ளதுடன் அதில் சிவில் தொழில் நுட்பம், கைத்தொழில் தொழில்நுட்பம், இலத்திரனியல் தொழில் நுட்பம்,விவசாய தொழில் நுட்பம்,உயிரியல் தொழில்நுட்பம் மற்றும் உணவுத் தொழில் நுட்பம் ஆகிய பாடவிதானங்கள் வழங்கப் பட்டுள்ளதுடன் மாணவர்களுக்கு ஒரு தொழில் நுட்பப் பாடம் ஏனையவற்றுக்காக இரு கலைப் பாடங்களையும் தேர்ந்தெடுக்க முடியும். கடந்த ஆண்டு பூராகவும் க.பொ.த. உயர்தரப் பரீட்சைக்கு அவ்வத் தொழில் நுட்பப் பாடங்களுக்குத் தோற்றியுள்ள மாணவர்களின் எண்ணிக்கை இணைப்பு - 2 இல் குறிப்பிடப்பட்டுள்ளது. இதன் மூலம்



கலைப் பாடவிதானத்தின் ஊடாக வழங்கப்பட்டுள்ள தொழில்நுட்பப் பாடத்தினை தேர்ந்தெடுக்கப்பட்ட மாணவர்களின் குறைந்த அளவு தொடர்வதாக இனங் காணப்பட்டுள்ளதுடன் இதற்குப் பிரதான காரணம் ஆசிரியர்கள் மற்றும் வசதிகள் இன்மையினைப் போன்று பல்கலைக்கழக மட்டத்தில் தொழில் நுட்பக் கல்வியினை தொடர்ச்சியாக மேற் கொள்வதற்கான இடம் இன்மையாகும். தமது ஆர்வம் காரணமாக தொழில்நுட்பப் பாடத்தினைத் தேர்ந்தெடுக்கும் மாணவர்களுக்கு வேறு மாற்று நடவடிக்கைகள் இன்மையினால் கலைப் பட்டத்தினைப் பெறவேண்டிய நிலை காணப்படுகின்றது.

ஊழியச் சந்தையின் கேள்விகளுக்கு ஏற்றவாறு தகைமைகள் இன்மையினால் கலைப் பட்டதாரிகளுக்கு இடையே வேலையில்லாப் பிரச்சினை காணப்படுவதுடன் இதனை அரசாங்கம் விசேடமாகக் கருத்திற் கொண்டுள்ளதுடன் இது அபிவிருத்திக்கும் தடையாகஅமைந்துள்ளது. அரசினால் கலைப் பாடவிதானத்தினைத் தொடரும் மாணவர்களின் எண்ணிக்கையினைக் கிரமமாகக் குறைக்கவும், ஏனைய பாடவிதானங்களில் மாணவர்களின் ஆர்வத்தினை அதிகரிக்கும் வகையில் தொழில்நுட்பப் பாடவிதானத்தினை அறிமுகப்படுத்தவும் திட்டமிடப்பட்டுள்ளது. தொழில்நுட்பப் பாடவிதானத்தின் மூலம் மூன்றாம் நிலைக் கல்வி மட்டத்திற்காக பல்கலைக்கழகங்களில் உரிய இடங்களைவழங்குதல் அல்லது தொழில் நுட்பமற்றும் தொழில்சார் கல்வி,பயிற்சிப் பிரிவுகளில் சந்தர்ப்பத்தினை வழங்குதல் மூலம் மாணவர்களுக்கு முதல் தொழிலுக்காக ஆலோசனைகளும் இதன் மூலம் வழங்கப்படுகின்றன.

உத்தேசத் தொழில் நுட்பப் பாடவிதானத்தின் மூலம் தெளிவாகஉயர்தரப் பாடவிதானம் மாற்றமானது என இனங்காண வேண்டியதுடன் தேவையான துணைப் பாடங்களுடன் விரிவான தொழில் நுட்பக் கற்றலுக்காகவும் சூழலை உருவாக்கு வதற்காக கல்வி அமைச்சு, பல்கலைக்கழக மானியஆணைக்குழுச் சபை மற்றும் தேசியகல்வி நிறுவகம் ஆகிய இடங்களில் இடம்பெற்ற கலந்துரையாடல்கள் மூலம் மாணவர்களுக்கு ஒரு பாடத்தினைத் தேர்ந்தெடுக்க முடிவதுடன் பெயரளவில் பொறியியல் தொழில்நுட்பம் மற்றும் உயிரியல் தொழில் நுட்பம் ஆகியவிரிவான தொழில்நுட்பப் பாடப்பிரிவுகளில் இனங்காண முடிகின்றது. தேர்ந்தெடுக்கப்பட்ட தொழில்நுட்பப் பாடத்தினைக் கற்பிப்பதற்காக நேரடியாக உதவி வழங்கக் கூடிய விஞ்ஞான,கணிதமற்றும் தகவல் தொழில்நுட்பம் ஆகிய பாடங்களில் தேவையான அடிப்படை அறிவினை வழங்கும் தொழில்நுட்பத்துக்கான விஞ்ஞானப் பாடங்களின் உள்ளீடுகளில் உள்ள இரண்டாவது பாடமாகும். உள்ளீட்டில் காணப்படும் மூன்றாவது பாடமாக அமைவது ஏற்கனவே க.பொ.த. உயர்தரப் பாடவிதானத்தில் அடங்கும் பாடப் பிரிவுகளில் ஒன்றைத் தேர்ந்தெடுப்பதாகும்.



இலங்கையில் உள்ள ஒரு சில பல்கலைக்கழகங்களினால் ஏற்கனவே தொழில்நுட்பப் பாடவிதானத்தினைத் தொடரும் மாணவர்களுக்கு விண்ணப்பிக்கக் கூடியவாறு தொழில்நுட்பப் பாடவிதானம் மற்றும் பிரயோக விஞ்ஞானத்திற்குரிய பொறியியல் பாடத்துக்குப் புறம்பானபட்டப் பாடநெறி நடாத்தப்படுகின்றது. தொழில்நுட்பப் பாடவிதானம் மற்றும் சேர்த்துக் கொள்ளப்படும் குறிப்பிட்ட அளவு மாணவர்களுடன் எதிர்காலத்தில் ஊழியச் சந்தைக்குத் தேவையான தொழில்நுட்பத் துறைசார்ந்த கேள்வியினை நிவர்துவதற்காகபட்ட பாடநெறியினை பல்கலைக்கழகங்கள் மூலம் ஆரம்பிக்க வேண்டு மென பல்கலைக்கழக மானிய ஆணைக்குழுச் சபையில் இடம்பெற்ற கூட்டத்தின் போது கலந்துரையாடப்பட்டது. கடந்த தசாப்தத்தில் இலங்கையில் தொழில் நுட்பம் மற்றும் தொழில்சார் கல்வி (TEB) முறைமையினை சீர்திருத்துவதற்கு உட்படுத்தப்படுவதுடன் தேசிய தொழில்சார் தகைமை (NVQ) கோட்பாட்டின் கீழ் தொழில்நுட்பப் பிரிவுகளில் டிப்ளோமா மற்றும் உயர் டிப்ளோமா பாடநெறிகள் அமுல்படுத்தப் பட்டுள்ளது. டிப்ளோமா தாரர்களுக்காக பட்டமட்டம் வரை விருத்தி செய்யப்பட்டவாறு தகைமைகளைப் பெறுவதற்கு தொழில்சார் தொழில்நுட்பப் பல்கலைக்கழகங்கள் தாபிக்கப்பட்டுள்ளன. டிப்ளோமா மற்றும் உயர் டிப்ளோமா பாடநெறிகளினை நடாத்தும் நிறுவன வலையமைப்பு அரசின் பிரதான செயற்பாடாக விரிவுபடுத்தப்படுவதுடன் இதன் மூலம் TVEதுறையில் தொழில்நுட்பப் பாடவிதானத்தினை மாணவர்களுக்காக மூன்றாம் நிலைமட்டத்திலான கல்விக்கான சந்தர்ப்பம் காணப்படுகின்றது.

பல்கலைக்கழகமானிய ஆணைக்குழுச் சபையினால் பெயரிடப்பட்டுள்ள பல்கலைக்கழகங்களின் புத்திஜீவிகள்,தொழில்சார் தொழில்நுட்பப் பல்கலைக்கழகங்களின் புத்திஜீவிகள், மூன்றாம் நிலைமற்றும் தொழில்சார் கல்விஆணைக்குழுச் சபையின் உத்தியோகத்தர்கள், கல்வி அமைச்சின் உத்தியோகத்தர்கள் மற்றும் தேசியகல்வி நிறுவகத்தின் கல்வியியலாளர்கள் (இணைப்பு- 3) ஆகியோர் தொழில் நுட்பப்பாட விதானத்தினை விருத்தி செய்வதற்கான குழுவில்

அடங்குகின்றனர். தயாரிக்கப்பட்ட தொழில்நுட்பப் பாடவிதானத்தின் மூலம் வரையறுக்கப்பட்டுள்ள வளங்கள் மற்றும் ஆசிரியர்களை அவ்வத் துறைகளில் பயிற்றுவிப்பதற்காக அமுல்படுத்த வேண்டிய பிரயோக ரீதியிலான செயற்பாடுகள் கொண்ட விரிவான மற்றும் விளக்கமான கற்கைத் துறைகள் வழங்கப்படுகின்றது. தொழில்நுட்பப் பாட விதானத்தினைத் தொடரும் மற்றும் மேலதிக தொழில்நுட்ப அறிவினை எட்டி அனுபவங்களைப் பெறும் மாணவர்களினால் தொழில்நுட்பத் துறையில் விருத்தியின் முன்னேற்றத்திற்கு ஒத்துழைப்பு வழங்கக் கூடிய மானிடவளங்கள் உருவாகின்றன. இச்சந்தர்ப்பத்தில் பொருட்கள் மற்றும் சேவையினைவழங்கக் கூடியமற்றும் செயற்பாடுகளைமுகாமைத்துவப்படுத்தக்

கூடிய தொழில் நுட்பவியாலளர்களை உருவாக்கவும் இதன் மூலம் வாய்ப்புக் கிடைக்கின்றது. ஜனாதிபதியின் வழிகாட்டலுடன் கல்வி அமைச்சினால் 2013 ஜுன் மாதத்தில் தொழில்நுட்பப் பாட விதானத்தினை க.பொ.த. உயர்தரவகுப்புக்களில் ஆரம்பிக்கத் திட்டமிடப்பட்டுள்ளது.



க.பொ.த (உ.த) தொழினுட்ப பாடத்துறையில் அறிமுகம் செய்தல் தொடர்பாக கௌரவ. கல்வி அமைச்சர் பந்துல குணவர்தன ஊடகத்துக்கு வழங்கிய நேர்காணலின் சுருக்கம்

காலனித்துவ யுகம் தொடக்கம் இலங்கை கல்வி தொடர்பாக விசேடமாக கவனத்தில் கொள்ள வேணடிய விடயங்களை பின்வரும் முன்று வகையில் பகுப்பாய்வு செய்வதுடன் அவற்றை கல்வி முன்னேற்றத்தின் திருப்பு முனைகளாக கருத்தில் கொள்ளலாம்.

1. பிரித்தாணிய சம்பிரதாயத்துக்கேற்ப காலனித்துவ யுகத்தின் தேவைக்கேற்ப இலங்கையில் இருந்த மரபு ரீதியான கல்வி முறைமை மேலைத்தேய மாதிரி கல்வி முறைமையாக உருவாக்கப்பட்டமை.ஹிக்கடுவை / சுமங்கல தேரர் சேர். அநாகரிக தர்மபால கேர்ணல் ஹென்றி ஸ்டில் ஹொல்டெ காட் அவர்கள் போன்ற சிறந்த கல்வியியலாளர்கள் மூலம் பெரும்பான்மையானோருக்கு தேசத்திற்கான உரிமையாளர்களுக்கு கல்வியை சான்றுபடுத்துவதற்ாக பௌத்த பாடசாலை முறைமை நிர்மாணிக்கப்பட்டமை ஒரு பேறாக கருத முடியும்.

2. இரண்டாவது திருப்புமுனையாக சி.டபிள்யு. டபிள்யு. கன்னங்கரா அவர்களின் இலவசக் கல்வி சட்டமூலம் அனுமதிக்கப்பட்டு கல்வி இலவசமாக வழங்கப்படக்கூடியவாறு மத்திய கல்லூரிகள் 54 நிர்மாணிக்கப்பட்டு இயங்கி வருகின்றமையையும்

3. கௌரவ.பிரதமர் சிறிமாவோ பண்டாரநாயக்கா அவர்களின் யுகத்தில் தனியார் பாடசாலைகள் அரசினால் பொறுப்பேற்கப்பட்டபின் வசதிபடைத்தோருக்கு மட்டும் வரப்பிரசாதமாக இருந்த பல கல்வி வாய்ப்புகள ஏனைய பிரஜைகளுக்கும் வழங்கப்பட்டமையை 3வது திருப்புமுனையாக கொள்ளலாம்.

கல்வியில் பல்வேறு அளவு ரீதியிலான பண்புரீதியிலான கட்டமைப்பு ரீதியிலுமான மாற்றங்கள் நிகழ்ந்திருப்பதுடன் அதற்காக பல முயற்சிகள் மேற்கொள்ளப்பட்டு ஆசிய பிராந்தியத்தில் சிறந்த ஆரம்பக் கல்விக்கான நாடாக அபிவிருத்தி அடைந்த நாடொன்றிற்கு சமமாக எழுத்தறிவு கொண்ட நாடாக திகழ்கின்றுத.

எனினும் பரீட்சை மையக்கல்வி முறைமையை உருவாக்கி பொருளாதார சமூக அரசியல் மற்றும் கலாச்சாரம் மூலமாக ஏற்படுத்தப்பட்ட எதிர்மறையான பெறுபேறுகளுக்கான உரிய தீர்வுகள் கிடைக்கவில்லை. அதனால் மேன்மை தங்கிய ஜனாதிபதி அவர்கள் பதவியேற்ற பின்னர் விசேடமாக பயங்கரவாதத்தை ஒழித்தபின் அறிவு மைய அபிவிருத்தி உத்தியை தீர்மானித்து அதன் மூலம் ஆரம்ப பாடசாலைகள் 5000 தை போசிப்பதற்காக சகல பௌதிக மனித வளங்களுடன் கூடிய இடைநிலைப்பாடசாலைகள் 1000த் தினை புனர்நிர்மாணம் செய்வதற்கும் அப்பாடசாலைகளில் தொழில்நுட்ப பாடத்துறை உட்பட ஏனைய பாடங்கள் தொடர்பான மாற்றங்களை ஏற்படுத்துவதன் மூலமும் கல்விக்காக இதுவரை செலவு செய்துள்ள கூடிய அரச முதலீட்டினை செய்வதன் மூலம் 2012-2016 வரையிலான காலப்பகுதியில் உருவாக்கப்படும் இம்மாற்றம் இலங்கையின் கல்வித்துறையின் விசேட 4வது திருப்புமுனையாகும்.

தற்போதுள்ள பாடசாலை முறைமையை மேலும் நோக்கின் 1994 க்கு முன் க.பொ.த (சா.த) பரீட்சையில் 15.9 வீதமான மாணவர்கள் சித்தி பெற்று க.பொ.த (உ.த) கற்றதுடன் எஞ்சிய 84.1 வீதமானோர் எவ்வித கல்விச்சான்றிதழ் தொழில் சான்றிதழின்றி காணப்பட்டனர்.



இந்நிலைமை 2013 இல் க.பொ.த (சா.த) சித்தி அடையும் சதவீதம் 65 ஆக அதிகரித்திருப்பினும் உயர்தரத்தில் சித்தி அடைந்து உயர் கல்வியிலும் மூன்றாம் நிலைக் கல்வியைத் தொடர்வதற்கு தகைமை பெறுவோர் மற்றும் அறிவுமைய பொருளாதார அபிவிருத்தியடைந்த நாடாக்குவதற்கான செயற்பாட்டுக்கு பங்களிப்பு வழங்குவது சவாலாக உள்ளது.

இதன்படி சாதாரண தரம் சித்தி பெற்று அதிகமானோர் க.பொ.த உயர் தரத்திற்கு தகுதி பெற்றிருப்பினும் 22 வீதமானோரே கணித விஞ்ஞான பிரிவில் கற்கின்றனர். இவர்களிலிருந்தே விஞ்ஞானிகள், கணிதவியலாளர்கள் ,வைத்தியர்கள் பொறியியலாளர்கள் மற்றும் தொழினுட்பவியலாளர்களை உருவாக்க வேண்டியுள்ளது

காப்புறுதி, போக்குவரத்து, களஞ்சியப்படுத்தல், தொடர்பாடல் ,சுற்றுலா, முகாமைத்துவம் விற்பனை போன்ற சேவைப்பிரிவுகளில் தொழில் வாய்ப்புகள் அதிகமாக இருப்பினும் உயர்தரத்தில் வர்த்தககப்பிரிவில் 27 வீதமானோரே கற்கின்றனர்.

நீண்டகாலமாக இலங்கையில் உ.த கற்போரில் 51 வீதமானோர் கலைப்பிரிவில் கற்பது நாட்டிற்கு மிகவும் பொருத்தமற்றதொன்றாகும். இவர்களில் அதிகமானோர் பரீட்சை மையமான மனனஞ் செய்தல் முறையில் கற்று பல்கலைக்கழகம் சென்றோராவர்.வருடந்தோறும் 350000 பேர் பாடசாலைகளில் சேர்த்துக்கொள்ளப்பட்ட போதிலும 25000 என்னும் குறைந்தளவினரே பல்கலைக்கழகம் செல்கின்றனர். அத்துடன் வெளியேறும் கலைப்பட்தாரிகள் வேலையில்லாத பிரச்சினைக்குள்ளாகின்றனர்.

புதிய அபிவிருத்தி வேலைத்திட்டங்களுக்கு திறன் தேர்ச்சி கொண்டோர் இல்லாதிருப்பதாக அறியக்கூடியதாக உள்ளது . இத்தகையோரை வெளிநாடுகளிலிருந்து அழைத்துக் கொள்கின்ற அதே சந்தர்ப்பத்தில் எமது நாட்டிலுள்ள பயிற்சியற்ற பளுமிக்க வேலைசெய்வோர் வெளிநாடுகளுக்கு சென்று குறைந்த

சம்பளத்தில தொழில் செய்கின்றனர். இது எமது கல்வி முறைமையிலுள்ள பிரச்சினையாகும்.

இந் நிலைமையைக் கருத்தில் கொண்டே அதி மேதகு ஜனாதிபதி அவர்கள் 2012 இலிருந்து இடைக்கால அபிவிருத்தி திட்டத்தினை நடைமுறைப்படுத்தி உள்ளார். இங்கு சித்தி பெறுவோரின் சதவீதத்தை 80 வீதமாககுவது பிரதான குறிக்கோளாகும்.

1000 இடைநிலைப்பாடசாலைகளினக.பொ.த (உ.த) விஞ்ஞான கணித தொழினுட்ப பாடத்துறைக்கான பெறுபேறுகள் 21 வீதத்திலிருந்து 40வீதம்வரை அதிகரிப்பதற்கும் வர்த்தக பாடத்துறைக்கான 27 சதவீதத்தை 35 வீதமாக அதிகரிப்பதற்கும் கலைப் பாடத்துறையின் 51வீதத்தை 25 வீதமாக குறைத்து ஏனைய பாடத்துறைகளில் பெறுவதற்கும் தகவல் தொழினுட்ப எழுத்தறிவு 35 வீதத்திலிருந்து 75வீதமாக அதிகரிப்பது எதிர்கால கல்வியின் இலக்காகும். கல்வி அமைச்சு, உயர் கல்வி அமைச்சு , இளைஞர் அலுவல்கள் மற்றும் திறன்கள் அபிவிருத்தி அமைச்சு உட்பட மேலும் சில அமைச்சுகளும் இணைந்து தேசிய கல்வி ஆணைக்குழு, தேசிய கல்வி நிறுவகம் , பல்கலைக்கழக மானிய ஆணைக்குழு ,பல்கலைக்கழகங்கள் உயர் தொழினுட்ப நிறுவனங்களின் இணைந்த பங்களிப்புடன் மேற்குறிப்பிட்ட இலக்கை அடைவதற்காக தொழினுட்ப பாடத்துறை அறிமுகப்படுத்தப்படுகிறது.

இதற்கமைய 1000 இடைநிலைப் பாடசாலைகளை புனரமைப்பு செய்வதுடன் 50000 ஆரம்ப பாடசாலைகளை சிறுவர் நேயப் பாடசாலைகளாக அபிவிருத்தி செய்வதனூடாக அனைத்து மட்டத்திலும் கல்வி அபிவிருத்தி ஏற்படுத்த அவசியமான அரசாங்கத்தின் பங்களிப்பு இதுவரையில் கிடைக்கப் பெற்றுள்ளது இதற்கமைய பொருளாதார அபிவிருத்தி அமைச்சு மூலம் 2500 மில்லியன் செலவில் பாடசாலைகளுக்கான பௌதிக வளங்கள் வழங்கப்படடு தரமுயர்த்தப்பட்டுள்ளன. 409 இடைநிலை பாடசாலைகளில் மகிந்தோதய தொழினுட்ப மூடங்கள் அமைக்கப்பட்டிருப்பதுடன் 2013 இல் 1000 இடை நிலைப் பாடசாலைகளின் தேவைகள் பூர்த்தி செய்யப்படுவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படடுள்ளன. பாடசாலைக்கல்வி முறைமையில் மேற்குறிப்பிட்ட சவால்களை வெற்றிக்கொள்வதுடன் அறிவு சார்ந்த சமூகத்தை உருவாக்கும் நோக்கில் 2013-2016 இடைநிலைப்பாடசாலை அபிவிருத்தி வேலைத்திட்டம் அதி மேதகு ஜனாதிபதி அவர்களின் அனுசரனை கிடைக்கப்பெற்ற நிகழ்ச்சித்திட்டம் ஆகும்.

இந்நிகழ்ச்சித்திட்டம் முக்கியமாக 2012 ல் கபொ.த (சா.த) பரீட்சையில் சித்தி அடைந்த மாணவர்களுக்கு க.பொ.த (உ.த) தொழினுட்ப பாடத்துறையை வழங்குவதாகும். க.பொ.த (உ.த) விஞ்ஞாத்துறைக்கு தகுதி பெறாத மாணவர்களும் இத்துறையில் கற்க கூடியதாக உள்ளமை இத்துறையின் சிறப்பம்சமாகும் இந்நிகழ்ச்சித் திட்டம் அதிமேதகு ஜனாதிபதி அவர்களின் தலைமைத்துவத்தின் கீழ் 2013 ஜீன் 20ந் திகதி மக்களுக்காக வழங்கப்படவுள்ளது இதற்கமைய முதற்படியாக இப்புதிய பாடத்துறை 2013 ஜீலை 15 ல் சகல தேர்தல் தொகுதிகளும் உள்ளடங்களாக 1000 இடைநிலைப் பாடசாலைகளில் தெரிவு செய்யப்பட்ட 200 பாடசாலைகளில் ஆரம்பிக்கப்படவுள்ளது இத்துறை ஆரம்பிக்கப்படும் 1AB பாடசாலைகள் எதிர்காலத்தில் 1AB சுபர் பாடசாலைகளென வழங்கப்படும்.

க.பொ.த (உ.த) இல் தற்போது 3 துறைகளிலும் கற்கும் மாணவர் தொகை சதவீதம்

| துறை | மாணவர் தொகை | சதவீதம் |
|---|---|---|
| விஞ்ஞானம | 103160 | 22.4 |
| வர்த்தகம | 122049 | 26.5 |
| கலை | 235791 | 51.1 |

இதற்கமைய ஊழியர் சந்தை கேள்விகளுக்கு குறைந்தளவு பங்களிப்பு வழங்கும் கலைப்பட்டதாரிகள் கூடிய சதவீதத்திலும் கணித விஞ்ஞான வர்த்தக துறை சார் பட்டதாரிகள் 48 வீதத்திலும் உள்ளனர்.அறிவு கேந்திரமாகக் கொண்ட இடைநிலைப்பாடசாலைகள் அபிவிருத்தி செய்யும் வேலைத்திட்டத்தில் கலைப்பிரிவுக்கு மாற்றுத்திட்டமாக நவீன தொழினுட்ப துறை அறிமுகப்படுத்தப்படுகின்றது. இலங்கையின் பொருளாதார வளர்ச்சியில் தேர்ச்சி மட்டத்தை அதிகரிப்பது அவசியம் என 2013 ம் ஆண்டிற்கான இலங்கை மத்திய வங்கியின் ஆண்டறிக்கையில் குறிப்பிடப்படடுள்ளது.

2016 இல் க.பொ.த (உ.த) விஞ்ஞான கணித பிரிவில் 40 வீதமானோரும் வர்த்தக பிரிவில் 35 வீதமானோரும் கலைப்பிரிவில் 25 வீதமானோரும் கற்பதற்கு அவசிமான மனித வளம் குறைவாக உள்ளதால் தற்போது சேவையிலுள்ள ஆசிரியர்களுக்கு பயிற்சிகள் வழங்கப்படவுள்ளது. தேசிய கல்வி நிறுவகத்தின் மூலம் இப்பாடதுறையை பாடசாலைகளுக்கு அறிமுகப்படுத்துவதற்காக பாடத்திட்டம் ஆசிரிய வழிகாட்டல் கையேடு தயாரிக்கப்பட்டு நடைமுறைபடுத்தலுக்கான முறைகள் நிறைவடைந்திருப்பதுடன் ஆசிரிய

வழவாலரகளை பயிற்றுவித்ததன் பின்னர் 2016 இடைக்கால கல்வி அபிவிருத்தி திட்டத்திற்கமைய கல்வி திருப்பு முனையின் யதார்த்தத்தை அறியக் கூடியதாக இருக்கும் என்பது விஷேடமான அம்சமாகும் இலங்கையின் அபிவிருத்தி உபாயங்களில், அறிவு மையமான சமூகமாக இலங்கை மக்கள் சமூத்தை மாற்றி ஆசியாவில் ஆச்சரியமாக்குவதற்கு கல்வி வரலாற்றில் இதற்கு முன்னர் நடை முறைப்படுத்தப்படாத இவ் வேலை திட்டத்தின் ஊடாக வழங்க கூடியதாக உள்ளது.

39

க.பொ.த உயர் தரத்தில் தொழில்நுட்பப் பாடத்துறையை அறிமுகப்படுத்துவது ஏன்?



கௌரவ மொஹன் லால் கிரேரு
(கல்வி மேற்பார்வை பா.உ)

நீங்கள் திறமையானவர்

பெற்றோர்கள் பிள்ளைகளை பாடசாலைக்கு அனுப்புவது நன்றாகக் கல்வியினைப் பெற்றுக் கொள்வதற்காகும். சிறு வயது பராயத்திலே அநேக விடயங்களைக் கற்றுக் கொள்கின்றோம். ஆனாலும் எல்லோரும் க.பொ.த. சாதாரண தர பரீட்சையில் உயர் பெறுபேறு பெறுவதில்லை. பரீட்சையில் திறமையாகச் சித்திபெறாதோர் பலர் பின்னர் பல்வேறு தொழில்களில் வெற்றியடைந்தவர்களாகத் திகழ்கின்றனர். தொழில் பயிற்சி நிறுவனங்கள் மற்றும் தொழில் நுட்பக் கல்லூரிகளில் பாடநெறிகளை மேற்கொண்டவர்கள் சிறந்த வினைஞர்களாகின்றனர். மேலும் சிலர் தொடர்ந்து கற்று பட்டங்களையும் பட்டப்பின் பட்டங்களையும் பெற்றுக் கொள்கின்றார்கள். மேலும் சிலர் செல்வந்த வணிகர்களாக விளங்குகின்றார்கள். அவ்வாறான தனவந்தர்கள் தமது நிறுவனங்களில் வைத்தியர்களுக்கும் கலாநிதிகளுக்கும் பேராசிரியர்களுக்கும் வேலை வாய்ப்புக்களை வழங்குகின்றார்கள்.

இதன்போது முக்கியமாகக் கருதப்படுவது நமக்கான திறமைகளில் சிலவற்றை (உதாரணமாக அவயவங்களை சரிவரப் பாவித்து சரியாகவும், நேர்த்தியாகவும் வேலை செய்யவும் ஆற்றல் (இயக்க அறிவு), குழுக்களில் தலைவராகின்ற சமூகத்திறன், தன்னைக்குறித்து தீர்மானமெடுக்க சிந்திக்கும் அறிவு (உள்ளார்ந்த அறிவு) இயற்கையோடு இணைந்து அதற்கேற்பச் சிந்தித்து செயற்படும் அறிவு (இயற்கை தர்மங்கள் குறித்த அறிவு) போன்ற அறிவு வகைகளில் இணையும் ஏனைய அறிவுப் பிரிவுகள்ஸ சாதாரண தர அல்லது உயர்தரப் பரீட்சையில் அளவிட முடியாதென்பதாகும். விஞ்ஞானம், கணிதம்

40

மற்றும் தாய்மொழி பாடங்களில் புள்ளிகள் சில குறைந்தாலும் பிள்ளைகளில் ஒளிவு மறைவாக இருக்கும் ஆற்றல்களை வெளிக்கொணர முடியாமலிருப்பது எமது கல்வி உலகத்தில் காணப்படும் பெருங் குறைபாடாகும்.

உகந்த மாற்றம்

கோட்பாட்டு அறிவினை விட "செய்தல்" ஆற்றல் உள்ள இலங்கை மாணவர்களுக்கு ஏற்றதாக கல்வித் துறையில் தற்போது முக்கியமான மாற்றம் ஏற்பட்டுள்ளது. அதுதான் க.பொ.த. உயர்தரப் பிரிவுக்கு தொழில்நுட்பப் பாடத்துறையை அறிமுகம் செய்ததாகும்.

கணித விஞ்ஞான பாடங்களில் திறமைச் சித்தி தேவையில்லை

மாணவரொருவர் சாதாரண தரத்தில் கணிதம் மற்றும் விஞ்ஞானம் உள்ளிட்ட ஆறு பாடங்களில் யாதும் மூன்று பாடங்களில் திறமைச் சித்திகள் பெற்றிருந்தால் க.பொ.த. உயர்தர வகுப்புக்காக தொழில்நுட்ப பாடத்துறையை தெரிந்து கொள்ள முடியும். சாதாரண தரத்தின் பெறுபேறுகளை விட மாணவர்களில் பொதிந்துள்ள ஆற்றல் மீது இதன் போது அதிக நம்பிக்கை வைக்கப்படுகின்றது.

உண்மையில் அங்கீகரிக்கப்பட்ட பல்கலைக் கழகங்களில் பெற்றுக்கொள்ளும் கோட்பாட்டு அறிவோடு ஒப்பிடும் போது அதற்கு இணையான அறிவோடு கைப்பயிற்சி கொண்டு சிந்திப்பதோடு மட்டுமல்லாமல் செயற்படவும் கூடிய சரியான ஆணாகவும் பெண்ணாகவும் திகழ்வதற்கு இந்த தொழில்நுட்பப் பாடத்துறையை தெரிவு செய்துகொள்ள முடியும். மேலும் சற்று அர்ப்பணிப்பு இருப்பின் காலக்கிரமத்தில் பட்டம், பட்டப்பின் பட்டங்களைப் பெற்று பேராசிரியர்களாக விளங்க முடியும். ஆனால் சுவரில் ஆணி அடிக்கக் கூட முடியாத பேராசிரியர்களாக அல்ல. அவர்கள் வேலையும் தெரிந்த, கோட்பாடும் தெரிந்த வியர்வையின் பெறுமதியும் அறிந்த சிறந்த மனிதர்களாவர்.

41

ஆனால் இதனை பெற்றுக்கொள்வது ரோசாப் பூக்கள் தூவப்பட்ட விளையாட்டு வீதியூடு செல்வதாக அல்ல.

தொழில் உலகத்துள் நுழைய தொழில் நுட்பமும் தேர்ச்சித் திறனும் தேவை

இந்தப் பாதை ஆரம்பமாவது சிறிது மாற்றத்தோடு கூடியதாகவாகும். நாம் கோட்பாடுகளை கற்றுக் கொள்வதோடு வேலை உலகம் குறித்தும் கற்றுக் கொள்வோம். அது மனித குலம் வாழ வேண்டிய சிறப்பான உலகத்தை உருவாக்கும். ஆகவே நாம் கொஞ்சம் கொஞ்சமாக வேலை செய்ய கற்றுக் கொள்வோம். இந்தப் பாதை இரண்டு விதமாகப் பிரியக் கூடியதாக அமைக்கப்பட்டுள்ளது. உங்களின் திறமைக்கேற்ப அவற்றிலொன்றைத் தேர்ந்தெடுத்துக் கொள்ள முடியும்.

பாதைகள் இரண்டும் இவ்வாறானவை

குறைந்தளவு தகைமை

(1) கணிதம், விஞ்ஞானம் மற்றும் தாய்மொழி உள்ளிட்ட ஆறு பாடங்களில் சித்தியடைந்திருத்தல்
(2) யாதும் மூன்று பாடங்களில் திறமைச் சித்தி பெற்றிருத்தல்

பாடத்துறை (அ)

(1) பொறியியல் தொழில்நுட்பம் குடிசார், இயந்திரம் மற்றும் மின்னியல் தொழில்நுட்பங்களின் கோட்பாடுகளும் பயிற்சிகளும்
(2) தொழில்நுட்பத்துக்கான விஞ்ஞானம் இரசாயனம், பௌதீகம், உயிரியல் மற்றும் கணிதம் போன்ற தொழில்நுட்பங்களுக்குத் தேவையான கோட்பாடுகளும் பயிற்சிகளும்
(3 விதந்துரைக்கப்பட்ட பத்துப் பாடங்களில் தெரிந்தெடுத்துக்கொள்ள வேண்டிய ஒரு பாடம்

பாடத்துறை (ஆ)

(1) உயிர்த்தொகுதி தொழில்நுட்பம் உணவு, அறுவடைக்குப் பின், விவசாயம், உயிர் வள தொழில்நுட்பங்களின் கோட்பாடுகளும் பயிற்சிகளும்
(2) தொழில்நுட்பத்துக்கான விஞ்ஞானம் இரசாயனம், பௌதீகம், உயிரியல் மற்றும் கணிதம் போன்ற தொழில்நுட்பங்களுக்குத் தேவையான கோட்பாடுகளும் பயிற்சிகளும்
(3) விதந்துரைக்கப்பட்ட பத்துப் பாடங்களில் தெரிந்தெடுத்துக்கொள்ள

42

விதந்துரைக்கப்பட்ட பத்துப் பாடங்கள் பின்வருவனவைகளாகும். இப்பாடங்களில் நீங்கள் விரும்புகின்ற உங்கள் பாடசாலையில் கற்றுக் கொடுக்கப்படும் பாடங்களைத் தெரிசெய்துகொள்ள முடியும்.

(1) பொருளியல்
(2) புவியியல்
(3) மனைப்பொருளியல்
(4) ஆங்கிலம்
(5) கணக்கீடு
(6) தொடர்பாடலும் ஊடகக் கற்கையும்
(7) தகவல் தொடர்பாடல் தொழில்நுட்பம்
(8) சித்திரம்
(9) வணிகக்கல்வி
(10) விவசாயவிஞ்ஞானம்

ஆரம்பத்தில் 200 பாடசாலைகளில் மாத்திரமே

இந்தப் பாடத்துறை முதன் முதலாக 200 பாடசாலைகளில் மாத்திரமே ஆரம்பிக்கப்பட விருக்கின்றது. ஆனால் உங்கள் தேர்தல் தொகுதியில் கட்டாயமாக ஒரு பாடசாலை பெற்றுக் கொடுக்கப்படும். எனவே இந்தப் பாடத்துறையை தேர்ந்தெடுப்பின் உயர்தரக் கல்வியைத் தொடர்வதற்கு அருகில் உள்ள தொழில்நுட்பப் பாடத்துறை வழங்கும் பாடசாலைக்குச் செல்ல வேண்டும். பின்னர் பாடசாலைகளின் எண்ணிக்கை அதிகரிக்கும்.

பொறியியல் தொழில்நுட்பம் மற்றும் உயிர்த்தொகுதி தொழில் நுட்பம் ஆகிய பாடங்களுக்கு கோட்பாடு மாத்திரமன்றி பிரயோகப் பயிற்சி மற்றும் தேர்ச்சி விருத்திகளும் உள்ளடங்கி உள்ளன. பிரயோகச் செயற்பாடுகளுக்காக அருகில் உள்ள தொழிற்பயிற்சி நிறுவனத்துக்கோ அல்லது தொழில்நுட்பக் கல்லூரிக்கோ செல்ல வேண்டும். அது மிக்க மகிழ்வோடு உற்சாகத்துடன் மேற்கொள்ளக் கூடிய கற்றலின் ஒரு பகுதியாகும். வகுப்பறைக்குள் சிறைப்பட்டு கரும்பலகையை பார்த்துக்

43

கொண்டிருக்காமல் மாறுபட்ட இடத்தில் மாறுபட்ட சூழலில் மாறுபட்ட பயிற்றுவிப்பாளர்களோடு நமக்கு உகந்த நாட்டுக்கும் உகந்த வருங்காலத்துக்கும் உகந்த வேலையொன்றைக் கற்றுக் கொள்வது என்பது எத்துணை மகிழ்ச்சிக்குரியதாகும். இந்த வேலைகளுக்கும் தனியாக புள்ளிகள் பெற்றுக்கொள்ளப்படும்.

ஏனைய இரண்டு பாடங்களும் பாடசாலையில் கற்றுக் கொடுக்கப்படும். அவற்றுக்கும் பிரயோகச் செயற்பாடுகள் இருக்கின்றன.

கல்வி அமைச்சு மட்டுமல்ல

இந்தப் பாடத்துறையானது திட்டமிடப்பட்டு நடைமுறைப்படுத்தப்படுவது கல்வி அமைச்சினால் மட்டுமல்ல. இதற்காக இளைஞர் அலுவல்கள் மற்றும் திறன் விருத்தி அமைச்சும் அதிகளவில் உதவியளிக்கின்றது. தொழில்நுட்பப் பாடத்துக்கு ஆசிரியர்களை வழங்குதல், பிரயோகச் செயற்பாடுகளுக்காக தொழிற்பயிற்சி நிலையங்களில் வசதிகளைப் பெற்றுக் கொடுத்தல், பிரயோகச் செயற்பாடுகளுக்குப் புள்ளிகளைத் திட்டமிட்டு வழங்குதல் என்பன இளைஞர் அலுவல்கள் மற்றும் திறன் அபிவிருத்தி அமைச்சின் ஊடாகவாகும். இது பிள்ளைகளுக்காக இரு அமைச்சுக்களாலும் வழங்கப்படும் பெறுமதியான அம்சங்களின் ஒன்றிணைப்பாகும்.

பரீட்சைக் கணிப்பீடு இவ்வாறானதாகும்

இரண்டு வருடங்கள் பூர்த்தியடைந்ததும் மூன்று பாடங்களுக்கும் கோட்பாடு அறிவுக்கான பரீட்சை நடாத்தப்படும். ஆனால் பொறியியல் மற்றும் உயிர்த்தொகுதி தொழில்நுட்பப் பாடங்களுக்கு கோட்பாடுகள் சார்ந்த பரீட்சைகளில் பெற்றுக்கொள்ளப்படும் புள்ளிகள் நூற்றுக்கு எழுபத்தைந்து (75%), எஞ்சிய இருபத்தைந்து (25%) புள்ளி பெற்றுக் கொடுக்கப்படுவது பயிற்சி நிறுவனங்களில் மேற்கொண்ட வேலைகளுக்காகும். எனவே இது அறிவோடு மாத்திரமன்றி செய்ததையும் அளவீடு

44

செய்யும் பாடத்துறையாகும். நன்றாகப் புள்ளிகளைப் பெற்றால் புத்தகப் பூச்சிகளாக அல்லாமல் சிறந்த வினைஞர்களாகவும் சிறந்த நபர்களாகவும் திகழ முடியும்.

பின் அதற்குப் பின்-. வெற்றிக்காக தேர்ந்தெடுக்கப்படும் பாதைகள் அதிகம்

(A) இந்த பாடத்துறைக்குள் உயர் தரத்தில் சிறப்பாக சித்தியடைந்தால் உங்களுக்கு அங்கீகரிக்கப்பட்ட பல்கலைக்கழகத்தில் அனுமதிபெற்று தொழில் நுட்பவியல பட்டப்பாட நெறியைத் தொடர முடியும். அதற்காக 2015 ஆம் ஆண்டாகும் போது அனைத்துப் பல்கலைக்கழங்களிலும் தொழில் நுட்பவியற் பீடத்தை ஆரம்பிக்க பல்கலைக்கழக மானிய ஆணைக்குழு தீர்மானித்து விட்டது.

(B) பாடத்துறையில் சித்திபெற்ற மாணவர்களுக்கு இளைஞர் அலுவல்கள் மற்றும் திறன்விருத்தி அமைச்சினால் புதியதாக ஆரம்பிக்கப்படும் தொழில்நுட்பப் பல்கலைக்கழகக் கல்லூரிகளுக்கு (University College) உள்வாங்கிக் கொள்ளப்பட முடியும். அங்கு நான்கு வருடங்களில் டிப்ளோமா, உயர் டிப்ளோமா மற்றும் பட்டப்படிப்பு போன்ற தகைமைகளை பெற்றுக்கொள்ள முடியும். அது தொழில் உலகம் தொடர்பான சிறந்த அறிவோடும் ஆற்றலோடும் கூடியதாகும்.

(C) அப்படியல்லாவிட்டால், இரத்மலானை இலங்கை ஜேர்மன் தொழில்நுட்பக் கல்லூரியில், உருகொடவத்தை மோட்டார் வாகன தொழில்நுட்ப நிலையத்தில் அல்லது கட்டுநாயக்க பொறியியல் ரொழில்நுட்ப நிறுவனத்தில் கல்வியையும் பயிற்சியையும் பெற்றுக்கொள்ள முடியும். இவற்றில் கற்றுக்கொண்ட அநேகர் இன்று நமது நாட்டிலும் வெளிநாடுகளிலும் உயர்மட்ட அபிமானம் பெற்ற தொழில்நுட்ப வியாலளர்களாகவோ அல்லது பொறியியலாளர்களாகவோ திகழ்கின்றார்கள்.

45

பரீட்சையில் தோல்வியானாலும்....... வாழ்க்கையில் தோல்வி இல்லை

யாதுமொரு காரணத்தால் தொழில்நுட்பப் பாடத்துறையை தெரிந்தெடுத்து பரீட்சையில் தோல்வி அடைகின்றாரென்றால் அம்மாணவர் வாழ்க்கையில் தோல்வி அடைந்தவராகக் கருதப்படமாட்டார். ஏனெனில் அவர் பெற்றுக் கொண்டுள்ள பிரயோக அறிவுக்கு ஏற்ப திறன் விருத்தி அமைச்சினால் வழங்கப்படும் தேசிய தொழில் தகைமை (NVQ III) மூன்றாம் மட்டம் இம் மாணவருக்குக் கிடைக்கும். NVQ III சான்றிதழோடு பொருத்தமான தொழிலுக்குச் செல்வது இலகுவானதாகும். அவ்வாறின்றேல் NVQ IV பெற்றுக கொள்வதற்காக தொழில் நுட்பக் கல்லூரி அல்லது பயிற்சி நிலையத்தில் அனுமதி பெற்று பதினெட்டு

மாதங்களில் NVQ IV சான்றிதழைப் பெற்றுக்கொள்ள முடியும். அதன்பின் நேரடியாக பல்கலைக்கழகக் கல்லூ ரியில் (University College) இணைந்து கொண்டால் அங்கு தொழில்நுட்பப் பட்டத்தைப் (B.Tec.) பெற்றுக்கொள்ள முடியும். எனவே மேற்குறிப்பிட்டவாறு செல்லக்கூடிய பாதைகள் அதிகம். முடியாதென்று சோம்பலாக இருப்பதைவிட்டு "முடியும்........ செய்வோம்"எனக் கூறி மாணவர்களை வலுப்படுத்துங்கள். தொழில் நுட்பப் பாடத்துறையை தெரிந்தெடுக்க அனைவருக்கும் விழிப்புணர்வை ஏற்படுத்துங்கள்.

குற்றச்சாட்டு காலாவதியானது

"வருடத்துக்கு மூன்றரை இலட்ச மாணவர்கள் பாடசாலைத் தொகுதியில் இருந்து விலகும் போது பல்கலைக்கழகத்துக்குச் செல்வோர் தொகை இருபத்து மூவாயிரம் மாத்திரமே. அவர்களிலும் நூற்றுக்கு முப்பத்தைந்து (35%) வீதமானவர்கள் கலைப்பட்டத்துக்கு அனுமதிக்கப்படுகின்றார்கள். கலைப் பட்டதாரிகளுக்கு தொழில்கள் இல்லை. நாட்டில் இருக்கும் தொழிலுக்குத் தேவையான ஆட்களில்லை. எஞ்சிய

46

மாணவர்களின் தலைவிதி என்ன?" என்பதே கல்வி அமைச்சின் மீது வைக்கப்படும் குற்றச்சாட்டாகும்.

தற்போது இது மாற்றமடைகின்றது. தற்போது நதிகள் பாய்வது"பூக்கள் பூப்பது" சாதாரண தர வகுப்பில் 9A உயர்தர வகுப்பில் 3A பெறும் மாணவர்களுக்கு மாத்திரமல்ல. அறிவு, செய்கை ஆகிய இரண்டுங்கொண்ட அதற்கு மேலாக முயற்சி, தைரியம் மற்றும் அர்ப்பணிப்பும் கொண்ட இலங்கையின மைந்தர்களுக்கு புதிய பாதை ஏற்படுத்திக் கொடுக்கப்பட்டுள்ளது. எமது பிள்ளைகளுக்கு புதிய உதயத்துக்கு வழிசமைத்து அனைத்து மாமாமார்களுக்கும் அத்தைமார்களுக்கும் புண்ணியம் கிடைக்க வேண்டும். குளிர்பதனப்பட்ட அறைகளுக்குள் கதையளந்து காலங்கழிப்பதை விட பெருநிலத்தே கால்வைத்து வேலை செய்யும் திடமுள்ள மனித சமூகத்தை உருவாக்கினால் இலங்கை அறிவுக் கேந்திரமாகும். அந்த கனவு பலிதமாகும் வரை நாம் செயற்படுவோம்......

47



**Message from His Excellency the President**

I am pleased to send this message to mark the introduction of Technology Stream for General Certificate of Education Advanced Level.

The Mahinda Chintana has taken action to make Sri Lanka the wonder of Asia by developing it as the Naval, Aviation, Commerce, Power and Knowledge Hub in the region. The major challenge before us today is to build the human resources necessary for this purpose. Introduction of Technology Stream to the G.C.E. Advanced Level is an important step being taken to meet this challenge.

The limitations in Science, Technology and practical experience in the current educational system leads to a major setback. This is what led to the Mahinda Chintana proposal to build and educational system more suited to our needs, which goes beyond the confines of the conventional knowledge systems. Accordingly, we will in future have human resources with the Technological skills and experience for the progress of Technology in the country. The introduction of Technology Stream to the G.C.E.Advanced Level is a major turning point towards such progress.

We look forward to the students who choose the Technology Stream to step ahead with good practical knowledge that will serve future educational needs. I wish every success to this important introduction for the progress of education.

Mahinda Rajapaksa

17th June 2013

48

## Introduction

Introducing the Technology stream to the general education system is a landmark in the education at a time when the process has been started to turn Sri Lanka as the miracle of Asia. During the last decade the growth in the Technological and Services sector and, naval, air, commerce, energy and the development planning of the government for knowledge centered human resource development has been directed towards technology.

It has been recommended by the UNESCO and the World Labour Organization that the major task of the technical sector in the general education is to deliver and manage the production process through the exploration of the material, tools and technical methods and nurture the learning process with the help of practical experiences and widen the opportunities of the education by introducing the world of work and the technological world.

Though a basic introduction to the world of work and technological world has been given for all the students at the G.C.E. (Ordinary Level) under the Technological Subjects, it is not adequate for the students who expect to follow Technical and Vocational or Tertiary education further.

Presently out of the total numbers of the students who study G.C.E. (Advance Level ), 51% of the students represents the Arts stream, 27% of the students represents the Commerce stream and 22 % of students selected Science subjects. Many young people, who passed the G.C.E. (Advanced Level) but were not qualified enough to enter the university, suffer from unemployment. A form of unemployment can be seen among



the degree holders in the Arts Stream as there is a dearth of skilled candidates in the labour market today. This is a major problem that affects the economic development of the country. It is expected to provide the guidance for students by opening the required avenues for the education in the University or Technical and Vocational Education at the tertiary level by introducing the Technological Stream. It is expected to increase the percentage of the number of students, who select to fallow the G.C.E (A/L) in the streams of science , Mathematical and Technological up to 40% and decrease the percentage of the students, who select the Arts Stream up to 25% by 2016.

The proposed Technological Stream for the G.C.E. (Advanced Level) is a different and newly introduced one and it consists of the assisting subjects relevant to the technological and world of work. This Stream is introduced under two wide technological fields and the students can select one subject out of the two "Engineering Technology" and "Biosystems Technology". Further, students have the opportunity of studying the fundamentals of Mathematics, Science and Information Technology required for the selected technological subject through the "Science for Technology" which is the second subject of this stream.

The third subject which belongs to the Technological Stream is one selected subject out of the ten subjects prescribed for the G.C.E. (Advanced Level) now.

Accordingly, given below is the subject content.



**01. Biosystems Technology or Engineering Technology**

✶ Biosystems Technology subject is an amalgamation of Environmental Engineering, Bio Processes Engineering, Bio-Medical Engineering, Agriculture and Natural Resources.

In developing this curriculum the competencies and the basic elements of Sri Lankan bio-diversity and the diversified natural resources have been included. This helps the students to acquire a competency on how to use natural resources for the development of the country at the G.C.E. (Advanced Level) itself.

✶ The Engineering Technology subject is an amalgamation of Civil Technology, MechanicalTechnology, Electrical Technology, Electronic Technology and Environmental Issues. Engineering Technology is a subject which provides the knowledge in order to resolve the problems of the technological systems.

✶ The curriculum developed for the G.C.E. (Advanced level) has been formulated to provide the students with the basic elements of the Engineering Technology and the Vocational Skills. This will contribute to develop the vocational skills in the students to utilize the resources for the development of the country at the G.C.E. (Advanced Level).

**02. Science for Technology**

The content of the subject "Science for Technology" is prepared as a combination of Science, Mathematics and Information Technology and also to be compatible with the subjects Engineering Technology and Biosystems Technology. Knowledge gained through the content of the subject provides scientific, mathematical and information technological background to solve problems in a technological system.



**03. One subject from Ten Optional Subjects**

- Economics
- Geography
- Home Economics
- English
- Communication and Media Studies
- Information and Communication Technology
- Art
- Business Studies
- Agricultural Science
- Accounting

**Objectives:**

By studying in this stream, the objectives given below are to be achieved.

- Providing the students with technological skills useful for day-today life
- Improving the ability of finding technological solutions to the problems in real world
- Developing skills in students suitable for labour market
- To direct students for professional education according to national vocational requirement frame

## Establishment of Technology Stream in General Education at G.C.E. Advanced Level

Dr. T.A. Piyasiri, Vice Chancellor, UNIVOTEC

Sri Lanka has recorded an average overall economic growth rate of over 6% during the past five year period and with the ending of civil complicit in 2009, the growth rates in 2010 and 2011 had been over 8%. Sri Lanka became a middle income country with per capita income exceeding US $ 2000 in 2009 and it is expected that this would rise to US $ 4000 in 2016. Local and foreign investment is expected to increase in the medium term. The share of the industrial sector in total GDP has increased from 27.3 in 2000 to 29.4 percent in 2010. The services sector has grown the fastest from 52.8 percent in 2000 to 57.8 percent in 2010 in GDP contribution. Similarly, the employment share of industry and services sectors increased from 23.6 and 40.3 percent to 24.6 and 43.1 respectively between 2000 and 2010. Growth of industry and service sectors in the past decade and the government's development plan to make Sri Lanka the Naval, Aviation, Commercial, Energy and knowledge hub demands the human resources development which is technologically oriented.

UNESCO and ILO Recommendations (2002) identify the purpose of initiation to technological education within general education as"to broaden educational horizons by serving as an introduction to the world of work, and the world of technology and its products through the exploration of materials, tools, techniques, and the process of the production, distribution and management as a whole, and to enrich the learning process through practical experience." This is demonstrated by many countries by introducing technology streams in the upper secondary education and the experience of Malaysia, as a developing country in the Asian region, is noteworthy. The basket of the vocational subjects at the G.C.E. Ordinary Level in Sri Lanka offered to all



students provides some initiation to world of work and the world of technology but adequate avenues are not available for those who wish to pursue further technologically oriented education either to enter tertiary education or to find an appropriate employment.

The streams of studies offered at the G.C.E. Advanced Level are Arts, Commerce, Science and Mathematics and the majority of students follow Arts stream. Data on number of students enrolling to these four streams, passing the G.C.E. Advanced Level examination and getting admission to the universities is given in Annex 1a and 1b. This shows that the majority of students enroll for degree courses from the Arts Stream. Six technology subjects offered at present, Civil Technology, Mechanical Technology, Electrical Technology, Agro Technology, Bio ResourceTechnology andFood Science and Technology are offered in the Arts Stream and the students can select one technology subject and two other subjects in the Arts Stream. Number of students appeared for each technology subject at G.C.E. A/L examination over the last five years is given in Annex 2. This shows that the technology subjects offered in the Arts Stream had been chosen by a smaller number of students and it attributes to lack of teachers and facilities and the absence of avenues to continue technological education at the university level. The students who followed technology subjects because of their enthusiasm in technology have no option but to pursue an Arts degree.

Unemployment among arts graduates due to absence or lack of competencies demanded by the labour market is a major concern of the government and a hindrance to the development effort. Government plans to progressively reduce the number of students in the Arts Stream while increasing the numbers in other existing streams and introducing a Technology Stream. The Technology stream is to provide avenues for tertiary level education in the universities or in the Technical and Vocational Education and Training sector or to provide necessary guidance for the student to find his first job.



The proposed Technology stream is to be distinctly identifiable as a separate stream at the Advanced Level and is to include learning in a broad technology area with necessary supporting subjects. Discussions held at the Ministry of Education, University Grants Commission and National Institute of Education led to the identification of two broad technology areas, namely; 'Engineering Technology' and 'Biosystems Technology' from which the students can select one subject. The second subject in the combination is 'Science for Technology' which will provide necessary fundamentals of science, mathematics and information technology to directly support the learning of the chosen technology subject. The third subject of the combination is a one selected from a basket of subjects already offered in the G.C.E. Advanced Level.

Several universities in Sri Lanka already offer degree courses in technological areas and in applied sciences, other than engineering, for which the technology stream students will be able to apply. It was opined at the meetings held at the University Grants commission that the universities must commence undergraduate courses in technology areas demanded by the labour market in the near future to enroll significant number of students from the technology stream. The Technical and vocational Education (TVE) system in Sri Lanka has undergone reforms in the past decade and offer Diploma and Higher Diploma courses in several technological areas under the National Vocational Qualifications (NVQ) framework. The University of Vocational Technology has been established to provide qualification upgrading to degree level for diploma holders. The network of institutions providing diploma and higher diploma courses are expanding as a matter of government priority and therefore, tertiary level education opportunities will also be available for technology stream students in the TVE sector.

The committee for the development of the Technology Stream comprised of academics from universities nominated by the University Grants Commission, academics from the University of Vocational Technology, officials of the Tertiary and Vocational Education



Commission, officials of the Ministry of Education and educationists of the National Institute of Education. The Technology stream formulated will provide a broad and comprehensive learning package with a practical bias which is implementation with limited additional recourses and teachers trained in particular fields. Studentsfollowing the technology stream and acquiring further technological knowhow and experience will form the major human resource pool that will take our country forward in technological development. Technologists who are capable of producing products and services and managing the process are the need at this hour. The Ministry of Education, under the guidance of H.E. the president, plans to establish Technology Stream and commence G.C.E. Advanced Level classes in June 2013.

## Why the Technology Stream is introduced ...

**Hon. Mohan Lal Grero**
**Monitoring M.P. - Education, Ministry of Education**

**You too are Talented**

Parents send their children to schools to be educated well. We learn many things during our childhood. But every one of us does not get higher G.C.E. (O/L) results. Many of those didn't pass the examinations have flourished in various jobs/careers later on. Most of the individuals become well talented at vocational training institutes, technical colleges etc. Some individuals follow education courses further on and obtain degrees, post graduate degrees etc. Some of these business personalities have sometimes given occupations to doctors, lecturers, professors etc. in their own institutions.

The important thing to understand in these circumstances are that some of our inborn talents/true talents cannot be measured in G.C.E. O/L or A/L examinations [ eg. the ability to do a work accurately and clean by coordinating hands and legs (kinaesthetic intelligence), the knowledge to judge, and think about oneself (Interpesonal intelligence), the social talents to be a group leader (Intrapersonal intelligence), the knowledge to think and act according to the environmental conditions (Intelligence on environment) etc.] The inability to stage the hidden talents of a child although there were lower marks for Science, Mathematics and Language is a grave mistake of our education system.



**A True Change...**

Recently one of the most important changes occurred in favour of most Sri Lankan children with the talent of "doing" apart from the theoretical knowledge is the introduction of technological subject stream to the G.C.E. A/L curriculum.

**No need of credits to Mathematics and Science...**

A child passed in six subjects including Mathematics, Science and Laguage at G.C.E. O/L with credits for any three subjects can follow the Technology stream.

Actually, compared with the theoretical knowledge obtained from a recognized university, this technology stream can create a real man/woman with not only "thinking" ability but also a man /woman with a "performing" ability with skills to do the work themselves. Little more dedication can produce even a professor by obtaining a degree or a post graduate degree but, not a professor who cannot even nail a wall, but a real life man who knows work and theory as well as the value of humanity. But this is not a bed of roses.

**Technology and Talents / Skills to enter the World of Work...**

This path opens with a slight change. We learn the theory along with the world of work, which is the real world with the secular development of the human kind. So we learn the world of work step by step. This is a path with two directions. You can proceed along one path according to your talents/skills.



These are the two paths.

**Minimum Qualifications**

(1) Pass six subjects at the G.C.E. (O/L) including Mathematics, Science and Laguage
(2) Possess three credits for any three subjects

**Subject Stream "A"**

**(1) EngineeringTechnology**
Theory and training of Civil, Mechanical and Electrical Technological sciences
**(2) Science for Technology**
Theory and training required for Chemistry, Physics, Biology, IT and Mathematics
(3) Subject selected from 10 recommended subjects.

**Subject Stream "B"**

**(1) Biosystems Technology**
Concepts and training of Food Post harvest, Agriculture and Bio Resource Technologies
**(2) Science for Technology**
Theory and training required for Chemistry, Physics, Biology, IT and Mathematics
(3) Subject selected from 10 recommended subjects.

The ten subjects recommended are as follows. You can select a subject you like, and also the subjects taught in your school.

(1) Economics
(2) Geography
(3) Home Economics



(4) English
(5) Accounting
(6) Communication and Mass Media Studies
(7) Information and Communication Technology
(8) Art
(9) Business Studies
(10) Agricultural Science

**Only 200 schools initially...**

This subject stream initiates only in 200 schools at the begining. Your electorate will definitely get one of those schools. Therefore if this subject stream is selected, you have to go to the nearest school where these subjects' streams are taught. This number of schools will be increased.

The subjects, Engineering Technology and Biosystems Technology include theory and practical training as well as skills development. The students will be sent to the closest Vocational Training Institute or Technical College for practical work/ activities. It is enjoyable and that can be done with happiness and enthusiasm. It is such an interesting part of education instead of staring at the blackboard in the classroom. We can learn what is good for us and the country as well as to the future with the help of different avenues and environment. Also marks are given to these works.

Other two subjects will be taught in the school itself. They too have activities.

**Not Only the Ministry of Education...**

Not only the Ministry of Education planned and implement this subject stream. Also the Ministry of Youth Affairs and Skills

Development equally contributes to this. The Ministry of Youth Affairs and Skills Development is the body supplying teachers for technology subjects and render vocational training facilities to practical training and evaluate the students' practical activities and practical marks. Therefore, the child gets the total of values from both Ministries.

**The Way of Assesment...**

At the end of two years, a theoretical examination will be held for all three subjects. But 75% of marks will only be given for theory part of the subjects ie,. Engineering Technology and Bio Systems Technology. The remaining 25 % of marks is given for the work done at the Training Institute. Therefore, this is not only a subject stream evaluating the knowledge, but also the "ability". If the child scores higher he's not only a book – worm, but also a genius, a real human being.

**Thereafter.... Many roads to be choosen for your success**

(a) If you pass the G.C.E. A/L examination with higher passes through these subject stream, you can enter a recognized university and study the Bachelor of Technology degree. The University Grants Commission has already decided to initiate a Faculty of Science and Technological Studies in each and every University by year 2015 for the said purpose.

(b) Also the students who pass this subject stream can enter the University Colleges that are to be newly initiated by the Ministry of Youth Affairs and Skills Development. The Diploma, Higher Diploma and Degree are the three qualifications that can be obtained in four years time by following this course. That is with a real knowledge and training about the world of work.

61

(c) Otherwise, Education and Training in Lanka-German Technical Institution (German Tech) - Rathmalana, Technical Institution at Orugodawatta or Engineering Technological Institution - Katunayaka can be obtained. Most of those obtained the Training/Education from these institutions are talented technologists, or Engineers drawing top most salaries locally and internationally.

**Life is not failed ... even if failed in the examination...**

Let's think, somehow a student failed in the G.C.E. A/L examination in the Technology Stream. However, that child will not be failed in the life, that is because these students would get the level III of National Vocational Qualification (NVQ- III) from the Ministry of Skills Development for their practical knowledge obtained.

It is easy to get a job with this NVQ III certificate. Otherwise NVQ –IV can be obtained if enrolled to a Technical College or a Training Institute providing NVQ –IV. Therefore Bachelor of Technology degree ( B.Tech) can be obtained when enrolled to a University College. So, there are many paths, one can tread on. Without being unable, think you "can and do" and give strength to the children. Encourage everyone to select the Technical Stream.

**Accusation Finished...**

"Only twenty three thousands enter the University when three and a half lakhs of children annually desert school system. Even from that, only 35% goes to follow the Arts Degree. There are no jobs to those Arts graduates. There are no human resources to the prevailing jobs in the country." "What will happen to the rest of our children?" This was the major accusation towards our education.

62

Now it changes. Now happiness is not only to the children obtained 9 A's at G.C.E. O/L or 3 A's at G.C.E. A/L. There is a **new path** to each and every Sri Lankan child with both knowledge and skills as well as those with courage, endeavour and dedication. All those participated in the planning and implementation of this new stream will be paid gratitude when our children tread on this new path. Sri Lanka will truly be a centre for knowledge when a courageous society is created.

63

**තාක්ෂණවේදය විෂය ධාරාවේ විෂය අන්තර්ගතය**
**(Subject Content of Technnology Stream)**

**ජෛවපද්ධති තාක්ෂණවේදය**
**(Biosystems Technology)**

- ජෛවපද්ධති තාක්ෂණය හැඳින්වීම (Introduction to Bioystems technology)
- ජල විද්‍යාව හා කාලගුණ විද්‍යාව (Hydrology and meteorology)
- පාංශු ජල සම්බන්ධතා (Soil and hydro relationship)
- ආහාර ආරක්ෂණය හා රෙගුලාසි (Food safety and regulations)
- පසු අස්වනු තාක්ෂණය (Post – Harvest Technology)
- ආහාර ඇසුරුම්කරණය හා ලේබල් කිරීම (Food packing and labeling)
- ජලයේ ගුණාංග (Water quality)
- ආහාර නිෂ්පාදනය (Food formulations)
- සත්ව නිෂ්පාදන තාක්ෂණවේදය (Animal production technology)
- පැළෑටි සංරක්ෂණය (Plant protection)
- ජලය පොම්ප කිරීම (Water lifting)
- බිම් මැනීම (Surveying)
- ඉලෙක්ට්‍රොනික විද්‍යාව හා ජෛව පද්ධති සඳහා ඒවායේ භාවිතය (Electronic & instrumentation in Biosystems technology)
- ව්‍යාපෘතිය (Project)

**ඉංජිනේරු තාක්ෂණවේදය**
(Engineering Technology)

- ඉංජිනේරු තාක්ෂණය (Introduction to Engineering Technology)
- මූලික මෝටර් යාන්ත්‍ර විද්‍යාව (Basic Automobile Technology )
- මූලික විදුලි තාක්ෂණය සහ නිවාස වයරින් කිරීම (Basic Electric Technology / House Wiring)
- මූලික ගොඩනැගිලි ඉදිකිරීමේ තාක්ෂණවේදය (Basic Building Construction Technology)
- මූලික නිෂ්පාදන තාක්ෂණය එකලස් කිරීමේ ශිල්ප ක්‍රම (Basic Manufacturing Technology /assembly)
- යාන්ත්‍රික ඇඳීම් (Engineering Drawing)
- ඒකක හා මිනුම් ( Units and Measurements)
- චලනය හා බල සම්ප්‍රේෂණ අංග (Motion and Power Transition Elements )

64

| | |
|---|---|
| ▪ තාක්ෂණික කටයුතුවලදී සෞඛ්‍යය හා ආරක්ෂාව | Health and Safety for Technology |
| ▪ විද්‍යුත් යන්ත්‍ර හා බල පද්ධති | Electric machines and power systems |
| ▪ මූලික ඉලෙක්ට්‍රොනික විද්‍යාව හා භාවිතය | Basic Electronics and Applications |
| ▪ ගෘහස්ථ ජල සම්පාදනය හා ස්වස්ථතාව (සනීපාරක්ෂාව) | Domestic Water supply and Sanitation |
| ▪ තරල යන්ත්‍ර | Fluids Machines Pumps, Tureens |
| ▪ ඉංජිනේරු සම්මත (ප්‍රමිති) | Engineering Standards and Quality assurance systems |
| ▪ බිම් මැනුම් | Surveying |
| ▪ ඇස්තමේන්තු (නිමානය කිරීම හා සැකසීම) | Estimating and Preparation |
| ▪ ව්‍යවසායකත්වය හා කළමනාකරණය | Entrepreneurship and Management |


**තාක්ෂණවේදය සඳහා විද්‍යාව (Science for Technology)**

| | |
|---|---|
| ▪ ක්ෂුද්‍ර ජීවී විද්‍යාව | Microbiology |
| ▪ ජීව රසායන විද්‍යාව | Biochemistry |
| ▪ අමුද්‍රව්‍ය හා කර්මාන්ත | Materials and Industries |
| ▪ ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය | Recycling of Plastics |
| ▪ සෙරමික්, වීදුරු හා නැනෝ තාක්ෂණය හැඳින්වීම | Introduction of Ceramics, Glass and Nano Technology |
| ▪ කාර්මික රසායන විද්‍යාව හා ශ්‍රී ලංකාවේ රසායනික කර්මාන්ත | Industrial Chemistry/ Chemical based Industries in Sri Lanka |
| ▪ මූලික ගණිත සිද්ධාන්ත පුනරීක්ෂණ | Revision of basic mathematics |
| ▪ ත්‍රිකෝණමිතිය | Trigonometry |
| ▪ ජ්‍යාමිතිය | Geometry |
| ▪ මූලික කලනය | Introductory calculus |
| ▪ විස්තරාත්මක සංඛ්‍යානය | Descriptive Statistics |
| ▪ දෛශික හැඳින්වීම | Introduction to vectors |
| ▪ බලය | Force |
| ▪ දෘඩ වස්තුවල සමතුලිතය | Equilibrium of rigid body |
| ▪ ව්‍යාවර්තය | Torque |
| ▪ පීඩනය | Pressure |
| ▪ නිව්ටන්ගේ නියම | Newton's Laws |
| ▪ ගුරුත්වාකර්ෂණය | Gravitation |

65

| | |
|---|---|
| ▪ භ්‍රමණ චලිතය | Rotational Motion |
| ▪ පරිගණක මෘදුකාංග යෙදවුම් | Computer Software Applications |
| ▪ අන්තර් ජාලය/ ඊ මේල් | Internet/ Email |
| ▪ දෘඩාංග පිළිබඳ මූලධර්ම | Fundamentals of Hardware |
| ▪ මූලික මෙහෙයුම් පද්ධති හා මෙහෙයවීම | Basic operation systems and administration |
| ▪ අමුද්‍රව්‍යවල ගුණ | Properties of material |
| ▪ තරල ගුණ | Fluids |
| ▪ ඉලෙක්ට්‍රොනික විද්‍යාව | Electronics |
| ▪ විද්‍යුත් චුම්බකත්වය | Electromagnetism |
| ▪ තාපය | Heat |
| ▪ තරංග | Waves |

**Future Opportunities...**




66

Ananex 1 (a)

**G.C.E (A/L) Examination - 2005-2010 Performance of School Candidates ( Freshers) - Stream Wise**

| Year | Stream | Total | | |
|---|---|---|---|---|
| | | | Qualified for University Entrance | |
| | | Number Sat | Number | % |
| 2005 | Bio Science | 17,020 | 5,592 | 32.86 |
| | Physical Science | 13,384 | 4,554 | 34.03 |
| | Commerce | 40,038 | 22,580 | 56.40 |
| | Arts | 49,683 | 30,085 | 60.55 |
| | **Total** | **120,125** | **62,811** | **52.29** |
| 2006 | Bio Science | 16,815 | 5,549 | 33.00 |
| | Physical Science | 13,053 | 4304 | 32.97 |
| | Commerce | 40,763 | 25,335 | 62.15 |
| | Arts | 48,782 | 30,739 | 63.01 |
| | **Total** | **119,413** | **65,927** | **55.21** |
| 2007 | Bio Science | 17,784 | 6,201 | 34.87 |
| | Physical Science | 12,469 | 4,167 | 33.42 |
| | Commerce | 38,376 | 23,500 | 61.24 |
| | Arts | 52,457 | 34,258 | 65.31 |
| | **Total** | **121,086** | **68,126** | **56.26** |
| 2008 | Bio Science | 18,928 | 6,696 | 35.38 |
| | Physical Science | 13,814 | 4,680 | 33.88 |
| | Commerce | 36,772 | 23,621 | 63.26 |
| | Arts | 59,048 | 40,353 | 68.34 |
| | **Total** | **128,562** | **74,990** | **58.33** |
| 2009 | Bio Science | 17,954 | 6,912 | 38.05 |
| | Physical Science | 12,950 | 4,287 | 33.10 |
| | Commerce | 35,037 | 21,195 | 60.49 |
| | Arts | 60,201 | 39,039 | 64.85 |
| | **Total** | **126,142** | **71,433** | **56.63** |
| 2010 | Bio Science | 18,816 | 7,309 | 38.84 |
| | Physical Science | 14,938 | 5,419 | 36.28 |
| | Commerce | 38,515 | 22,528 | 58.49 |
| | Arts | 69,241 | 44,569 | 64.37 |
| | **Total** | **141,510** | **79,825** | **56.41** |

Source - Department of examination

## Ananex 1 (b)

**NUMBER OF CANDIDATES QUALIFING AND ADMITTED TO HIGHER EDUCATIONAL INSTITIONS FOR UNDERGRADUATE STUDIES**
**( Acadamic Years 2007/2008- 2010/2011)**

| Year of G.C.E (A/L) | | 2007 | | | 2008 | | | 2009 | | | 2010 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Year of Admission | | 2007/2008 | | | 2008/2009 | | | 2009/2010 | | | 2010/2011 | | |
| Subject Stream | | No Qualified | No Admitted | Percentage | No Qualified | No Admitted | Percentage | No Qualified | No Admitted | Percentage | No Qualified | No Admitted | Percentage |
| Arts | Total | 56917 | 6307 | 11.08 | 65235 | 6693 | 10.26 | 62676 | 6841 | 10.91 | 72800 | 7064 | 9.70 |
| | Female | 41860 | 4854 | 11.60 | 47956 | 5179 | 10.80 | 46246 | 5360 | 11.59 | 54282 | 5587 | 10.29 |
| Commerce | Total | 37861 | 4357 | 11.51 | 36707 | 4337 | 11.82 | 33202 | 4583 | 13.80 | 35581 | 4876 | 13.70 |
| | Female | 21326 | 2429 | 11.39 | 20215 | 2388 | 11.81 | 18148 | 2521 | 13.89 | 19597 | 2790 | 14.24 |
| Physical Science | Total | 10018 | 4241 | 42.33 | 10408 | 4493 | 43.17 | 10164 | 4467 | 43.95 | 12657 | 4455 | 35.20 |
| | Female | 3056 | 1090 | 35.67 | 3096 | 1111 | 36.59 | 3069 | 1091 | 35.55 | 3882 | 1178 | 30.15 |
| Biological Science | Total | 16625 | 5164 | 31.06 | 17886 | 5323 | 29.76 | 19242 | 5656 | 29.39 | 21478 | 5621 | 26.17 |
| | Female | 10826 | 3211 | 29.66 | 11655 | 3339 | 28.65 | 12736 | 3559 | 27.94 | 14601 | 3660 | 25.07 |
| Total | Total | 121421 | 20069 | 16.53 | 130296 | 20846 | 16.01 | 125284 | 21547 | 17.20 | 142516 | 22016 | 15.45 |
| | Female | 77068 | 11584 | 15.03 | 82862 | 12017 | 14.50 | 80199 | 12531 | 15.62 | 92362 | 13215 | 14.31 |

The number Candidates include school and private both (unvercity Grant Commision)

## Ananex 2

**Number of students appeared for each technology subject at G.C.E A/L examination**

| YEAR | Subject | No Sat | A | % | B | % | C | % | S | % | A+B+C+S | % | F | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2007 | Civil Technology | 90 | – | – | 7 | 7.78 | 50 | 55.56 | 31 | 34.44 | 88 | 97.78 | 2 | 2.22 |
| | Mechanical Technology | 93 | 1 | 1.08 | 8 | 8.6 | 53 | 56.99 | 30 | 32.66 | 92 | 98.92 | 1 | 1.08 |
| | Elect.&info.Technology | 62 | – | – | 5 | 8.06 | 26 | 41.94 | 30 | 48.39 | 61 | 98.39 | 1 | 1.61 |
| | Food Technology | 31 | – | – | 5 | 16.13 | 16 | 51.61 | 7 | 22.58 | 28 | 90.32 | 3 | 9.68 |
| | Agro Technology | 12 | – | – | 2 | 16.67 | 4 | 33.33 | 6 | 50 | 12 | 100 | – | – |
| | Bio Resource Technology | 128 | 1 | 0.78 | 7 | 5.47 | 58 | 45.53 | 57 | 44.53 | 123 | 96.09 | 5 | 3.91 |
| 2008 | Civil Technology | 76 | 0 | 0.003 | 3 | 3.95 | 18 | 23.68 | 50 | 23.68 | 71 | 93.42 | 5 | 6.58 |
| | Mechanical Technology | 83 | 1 | 1.2 | 15 | 18.07 | 32 | 38.55 | 31 | 37.35 | 79 | 95.18 | 4 | 4.82 |
| | Elect.&info.Technology | 29 | 5 | 17.24 | 7 | 24.14 | 14 | 48.28 | 2 | 6.9 | 28 | 96.55 | 1 | 3.45 |
| | Food Technology | 53 | 5 | 9.43 | 3 | 5.66 | 12 | 22.64 | 18 | 33.96 | 38 | 71.7 | 15 | 28.3 |
| | Agro Technology | 41 | 1 | 2.44 | 3 | 7.32 | 18 | 43.9 | 9 | 21.95 | 31 | 75.61 | 10 | 24.39 |
| | Bio Resource Technology | 129 | 3 | 2.33 | 15 | 11.63 | 48 | 37.21 | 37 | 28.68 | 103 | 79.84 | 26 | 20.16 |
| 2009 | Civil Technology | 62 | 0 | 0 | 2 | 3.23 | 16 | 25.81 | 32 | 51.61 | 50 | 80.65 | 12 | 19.35 |
| | Mechanical Technology | 104 | 0 | 0 | 13 | 12.5 | 30 | 28.85 | 43 | 41.35 | 86 | 82.69 | 18 | 17.31 |
| | Elect.&info.Technology | 67 | 2 | 2.99 | 5 | 7.46 | 26 | 38.81 | 19 | 28.36 | 52 | 77.61 | 15 | 22.93 |
| | Food Technology | 57 | 0 | 0 | 8 | 14.04 | 25 | 43.86 | 19 | 33.33 | 52 | 91.23 | 5 | 8.77 |
| | Agro Technology | 106 | 0 | 0 | 10 | 9.43 | 22 | 20.75 | 53 | 50 | 85 | 80.19 | 21 | 19.81 |
| | Bio Resource Technology | 137 | 0 | 0 | 2 | 1.46 | 50 | 36.5 | 67 | 48.91 | 119 | 86.86 | 18 | 13.41 |
| 2010 | Civil Technology | 125 | 11 | 8.8 | 23 | 18.4 | 46 | 36.8 | 41 | 32.8 | 121 | 96.8 | 4 | 3.2 |
| | Mechanical Technology | 175 | 2 | 1.14 | 14 | 8 | 70 | 40 | 73 | 41.71 | 159 | 90.86 | 16 | 9.14 |
| | Elect.&info.Technology | 164 | 3 | 1.83 | 20 | 12.2 | 59 | 35.98 | 68 | 41.76 | 150 | 91.41 | 14 | 8.54 |
| | Food Technology | 123 | 0 | 0 | 2 | 1.63 | 43 | 34.96 | 50 | 40.65 | 95 | 77.24 | 28 | 22.76 |
| | Agro Technology | 210 | 0 | 0 | 14 | 6.67 | 63 | 30 | 81 | 38.57 | 158 | 75.24 | 52 | 24.76 |
| | Bio Resource Technology | 174 | 3 | 1.72 | 11 | 6.32 | 44 | 25.29 | 75 | 43.1 | 133 | 76.44 | 41 | 23.56 |

Source - Department of examination

***[මෙම පොත පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த புத்தகம் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This book is also placed in the Library.]*

***එකල්හි වේලාව අ. භා. 7.30 වුයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී. පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2013 ජූලි 12 වන සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 7.30 மணியாகிவிடவே தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார். அதன்படி பாராளுமன்றம், 2013 யூலை 12, வெள்ளிக்கிழமை பி.ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 7.30 p.m.,* MR. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*
*Adjourned accordingly until 1.30 p.m. on Friday, 12th July, 2013.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.